

# සංස්කෘතික අපරාධ විද්‍යාව

සංස්කරණය

මහාචාර්ය නෙරංජි විජේවර්ධන

සහාය සංස්කරණය

පමුදි දිසානායක
මිතුල කුමානායක
ධනුෂ්ක වීරසිංහ

# සංස්කෘතික අපරාධ විද්‍යාව

**සංස්කරණය**

**මහාචාර්ය නෙරංජී විජේවර්ධන**

**සහාය සංස්කරණය**

**පමුදි දිසානායක**

**මිතුල කුමානායක**

**ධනුෂ්ක වීරසිංහ**

**ලිපි සම්පාදනය**

2016/2017 අධ්‍යයන වර්ෂයේ සංස්කෘතික අපරාධ විද්‍යාව

**(Cultural Criminology) විෂය ඒකකයට සමගාමීව, විෂය හැදෑරූ උපාධි අපේක්ෂක අපේක්ෂිකාවන්ය.**

# සංස්කෘතික අපරාධ විද්‍යාව

## *විද්‍යුත් සඟරාව (E- Journal)*

ප්‍රථම මුද්‍රණය බු.ව. 2565 ව්‍ය.ව. 2022

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ISSN 2961-5097

ප්‍රකාශනය : අපරාධවිද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය, මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

How to Cite –

Wijewardene, BVN; Dissanayake, DMPV; Weerasinighe, DN; Kumanayaka, BM. (2022). Cultural Criminology. Department of Criminology & Criminal Justice, Faculty of Humanities & Social Sciences, University of Sri Jayewardenepura.

විජේවර්ධන, බීවීඑන්; දිසානායක, ඩීඑම්පීවී; වීරසිංහ, ඩීඑන්; කුමානායක, බීඑම්. (2022). සංස්කෘතික අපරාධ විද්‍යාව. අපරාධවිද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය, මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

මෙම විද්‍යුත් සඟරාව, මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ, අපරාධවිද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශයේ 2016/2017 අධ්‍යයන වර්ෂයට අයත් විද්‍යාර්ථයින් විසින් සංස්කෘතික අපරාධ විද්‍යාව යන විෂය ඒකකයට අයත් විෂය අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා සම්පාදනය කරන ලද්දකි. ශ්‍රී ලංකාව තුළ අපරාධ විද්‍යාව විෂය ක්ෂේත්‍රයේ, සංස්කෘතික අපරාධ විද්‍යාව විෂය ඒකකය සඳහා රචනා වූ ග්‍රන්ථයන් අතර දෙවන ප්‍රයත්නය මෙය වේ. මෙම සඟරාවේ පළ වී ඇති ලිපි මඟින් ප්‍රකාශ වන අදහස් පිළිබඳව අපරාධවිද්‍යා හා අපරාධයුක්ති අධ්‍යයනාංශයේ 2016/2017 අධ්‍යයන වර්ෂයට අයත් විද්‍යාර්ථයින් විසින් වගකීම දරනු ලබන අතර එහි අක්ෂර වින්‍යාසය, පද බෙදීම, ආදිය යෙදීම ඒ ඒ ලේඛකයාගේ අභිමතය පරිදි සිදු කරන ලදී.

**ප්‍රධාන සංස්කාරක**

මහාචාර්ය නෙරංජි විජේවර්ධන

**සහාය සංස්කරණය**

පමුදි දිසානායක

ධනුෂ්ක වීරසිංහ

මිතුල කුමානායක

**ප්‍රකාශනය**

අපරාධවිද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**ලිපි සැකසීම හා සෝදුපත් බැලීම (සිංහල)**

චමත් ගුණරත්න

එරංග චානක

ශානිකා තාඹුගල

ඉමේෂා සෙව්වන්දි

**ලිපි සැකසීම හා සෝදුපත් බැලීම (ඉංග්‍රීසි)**

සක්බෝ දිසානායක

ඉසිවරි චන්ද්‍රසේකර

**කවර නිර්මාණය**

පැතුම් හපුතන්ත්‍රි

පිදුම,

ගිලිහෙන පෙර දවසෙ

අහුලපු මිනිස් කම්

වැළලෙන හෙට දවසට

පරිස්සමට ගෙන යන්න

අපි එක්ක වෙසෙන

අප්‍රේම මිනිසුන් ගැන

සියුම්ව සෙයා යන්න

පන්නරය වූ සැමට....

## කතුවරුන්ගෙන්

මානව සමාජය හා සංස්කෘතිය අතර පවත්නා අවියෝජනීය බැඳීම එකම කාසියක දෙපැත්තක් බව අමුතුවෙන් කිව යුතු කරුණක් නොවේ. එකී සංස්කෘතිය නැමති පුද්ගල මනෝභාවයන් අරක් කොටගත් සාරධර්ම පද්ධතිය සමාජ පාලන අවියක් වශයෙන් ක්‍රියාත්මක වන ආකාරය නිරික්ෂිත කරුණකි. එලෙස සංස්කෘතිය යතුරක් කොට ගනිමින් පුද්ගල හැසිරීම් අභිප්‍රේරණය කොට සමාජයට විවර කිරීම හෝ අඟුලුලෑම තුල වූ පුද්ගල ජීවිතයේ සංස්කෘතිය හා බැඳි විවිධ දිශානතීන් නිර්මාණය වී පවතී.

සෙසු විෂයන් හා සමගාමීව අපරාධ විද්‍යා විෂය ක්ෂේත්‍රයට දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු කාල සීමාව තුල සංස්කෘතිය හා බැඳි පුද්ගල අපරාධකාරීත්වය, ඊට තුඩු දෙන හේතූන්, එම තත්වයන් පාලනය හා නිවාරණය අරඹයා සංස්කෘතික අපරාධ විද්‍යාව වශයෙන් නවාංගයක් එක් විය. මෙහිදී අප සංස්කෘතිය යන්නට නිර්වචන එක් කරමින්, දිනෙන් දින ගෝලීයකරණයට ලක්ව වෙනස්වන සමාජය තුළට එක්වන නවාංග, වියැකී යන පූර්වාංග සේම තවමත් එලෙසින්ම පවත්නා වූ සංස්කෘතිකාංග පුද්ගල අපරාධකාරීත්වයට සපයන පිටුබලය මෙහිදී විමර්ශනාක්ෂියට බඳුන් කරනු ලැබේ.

තවමත් නැඹුල් විෂය ක්ෂේත්‍රයක් වශයෙන් හඳුනාගනු ලබන සංස්කෘතික අපරාධ විද්‍යා විෂය අධ්‍යයනය අරඹයා නිර්මිත සාහිත්‍ය මූලාශ්‍රයන්හි පවතින්නා වූ රික්තකය යම්තාක් හෝ දුරට පිරවීම අරඹයා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අපරාධවිද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශයේ 2016/2017 අධ්‍යයන වර්ෂයේ අවසන් වසර සිසුන්ගේ සාමූහික ප්‍රයත්නයක අවසන් ඵලය මහාචාර්ය නෙරංජි විජේවර්ධන මහත්මියගේ මඟපෙන්වීම තුළින් මෙලෙස දොරට වඩිනු ලැබේ.

**ස්තුතියි.**

**2016/2017 අපරාධවිද්‍යා හා අපරාධ යුක්ති විද්‍යාර්ථයින්**

**2022/10/17 වන දින, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේදී ය.**

## පෙර කියැවීම

සංස්කෘතික අපරාධ විද්‍යාව විෂය පරාසය ආවරණය කරමින් ශ්‍රී ලාංකේය සමාජය තුළ පැවති රික්තය ආමන්ත්‍රණය කිරීම සඳහා 2018 වර්ෂයේ දී සංස්කෘතික අපරාධ විද්‍යාව නමින් පළ වූ මාගේ ප්‍රථම කෘතියෙන් පසුව ඉතා ඉක්මණින් තවත් කෘතියක් එම විෂය ක්ෂේත්‍රයට සමගාමීව එළි දැක්වීමට ලැබීම සුභවාදී සලකුණකි. වර්තමාන ලෝකයේ අපරාධ ස්වභාවයන්, අපරාධ රටාවන්, අපරාධ නිසා හිංසනයට පාත්‍රවූවන් පිළිබඳ වූ ස්වභාවයන් මෙන්ම අපරාධ යුක්ති ක්‍රියා පටිපාටීන් සම්බන්ධයෙන් ද එකින් එකට සමපාත නොවන විවිධතා නිරීක්ෂණය වේ. එවන් ප්‍රස්තුත විශ්ලේෂණයට ලක් කරන අපරාධ විද්‍යාඥයින්, මනෝ විද්‍යාඥයින්, සමාජ විද්‍යාඥයින් සහ අනෙකුත් කණ්ඩායම් බොහෝවිට ඒවා විශ්ලේෂණයේ දී, ඒවා පිටුපස ඇති සංස්කෘතික කාරණාවන්හි ඍජු හා වක්‍ර බලපෑම අනුසාරයෙන් ද තම අවධාරණයන්ට ගනිමින් අර්ථකථනයන් ඉදිරිපත් කර තිබේ. ඇතැමුන් ට අනුව අපරාධ යුක්ති ක්‍රියාපාටි යාන්ත්‍රණය තුළට සංස්කෘතියේ නිලීන බලපෑම, බලපෑම් කිරීම හේතුවෙන් යම් උදාසීන හෝ මන්දගාමී තත්ත්වයක් ඇතිවී තිබේ යැයි තර්ක කරති. නිදර්ශනයක් ලෙස ශ්‍රී ලාංකේය සමාජයේ මරණීය දණ්ඩනය ක්‍රියාත්මක කිරීම, ගබ්සාව සම්බන්ධයෙන් නීති ගෙන ඒම, සමලිංගික සේවනය, ගණිකා වෘත්තිය නීතිගත කිරීම යන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ඇති වී ඇති විවිධ මතවාද සියුම්ව විශ්ලේෂණය කළහොත්, ඒ තුළ ඇති සංස්කෘතික පිළිබිඹුව මනාව ට පසක් වේ. එවැනි වාතාවරණයන් තුළ එම යාන්ත්‍රණය මන්දගාමී යැයි ඇතැමුන් නඟන තර්ක එකහෙළා ප්‍රතික්ෂේප කළ නොහැකි බව සත්‍යයකි. අනෙක් පසෙන් සමකාලීන සමාජයේ ළමයින්ට, කාන්තාවන්ට සිදුවන අපරාධ පමණක් නොව පුද්ගලයින්ගේ සෞඛ්‍යාරක්ෂාව සම්බන්ධයෙන් එනම් ප්‍රමිතියෙන් බාල කරන ලද ආහාර ද්‍රව්‍ය විකිණීම වැනි දේවල් තුළින් අතීතයේ රොබට් නොක්ස්, ඊ. ආර්. රීච්, ජෝන් ඩොයිලි වැනි විදේශීය සංචාරකයින් මහත් පැසසුමට ලක් කළ ගාම්භීර ලාංකීය සංස්කෘතියේ පැවති ආගන්තුක සත්කාර සහ අනෙකුත් චාරිත්‍ර විධීන් පවා වර්තමාන සමාජය තුළ අභියෝගයට ලක්වී තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස ආහාරවල ප්‍රමිතිය රැක ගැනීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වැනි විවිධ ආයතන හා ඒවාට සම්බන්ධ නීති සම්පාදනය කිරීමට සිදුවී ඇත්තේ මෙම වණික් සංස්කෘතික තුළ ගොඩනැඟී ඇති කූඨ උපාය උපක්‍රමයන් නිසාය. එක පැත්තකින් සංස්කෘතියේ බලපෑම තුළ නිතිමය යාන්ත්‍රණය උදාසීන බවක් දරනවා සේම තවත් පැත්තකින් සංස්කෘතියේ බලපෑම නීතියේ යාන්ත්‍රණය පුළුල් ව විවිධ සමාජ ප්‍රපංචයන් අළලා නව්‍ය දැනුම, නව්‍ය නීති, නව්‍ය පාලන ක්‍රමවේද නිර්මාණය කිරීමට දායක වි තිබේ. සැබවින් ම සංස්කෘතික අපරාධ විද්‍යාවේ අරුමය වන්නේ එයයි. සංස්කෘතික අපරාධ විද්‍යාත්මක විෂය දැනුම සමාජයට අවැසි යැයි අප තර්ක කරන්නේ මේ නිසාය. කෙටියෙන් ම කිවහොත් අතීත සමාජයේ වැරදිකරුවන් බන්ධනාගාරගත කිරීම තුළින් පළි ගැනීම, දඬුවම් කිරීම වැනි අරමුණු සාධනය කිරීම ඉලක්ක වුව ද කාලයාගේ ඇවෑමෙන් ඒවා තවදුරටත් සමාජ අවශ්‍යතාවය පරිපූර්ණ කිරීමට තරම් සමත් නොවන බව සනාථ කරනු ලැබුවේ වරදකරුවන් කෙතරම් බන්ධනාගාරගත කර දඬුවම් දුන්න ද ඔවුන් පුනර් වරදකාරීත්වයට යොමුවීම හරහා ගොඩනැගෙන විවිධ අපරාධකාරී උප සංස්කෘතීන් තුළිනි. මෙම සංස්කෘතික කැළඹවීම හා අසාර්ථකභාවය නිසාම පසුකාලයේ පුනරුත්තාපනය වැනි අලුත් ප්‍රවේශ වෙත යොමු වූ අතර, සමකාලීන සමාජයේ ඉන් එහාට ගොස් නිර්මිත පරිසරය සකස් කිරීම තුළින් අපරාධ නිවාරණයට අවශ්‍ය මානසික සංකලනය ඇති කිරීම ඉලක්ක කරගනිමින් තිබේ. ඒ සඳහා CPTED (Crime Prevention Through Environmental Design) වැනි නව්‍ය සංකල්ප හරහා දුගීකමේ උප සංස්කෘතිය, නාගරික,

පැල්පත්, මුඩුක්කු උප සංස්කෘතීන්, යාචක උප සංස්කෘතීන් වැනි උප සංස්කෘතීන්වලට එදිරිව නවීන ජීවන විලාසිතාවලට එවැනි කණ්ඩායම් හුරු කරවීමට දරණ උත්සාහය තුළින් ද පිළිබිඹු වන්නේ සංස්කෘතියේ නව්‍ය ප්‍රවේශ ලෝකයේ සමකාලීන අවශ්‍යතාවයන් විද්‍යාත්මකව විශ්ලේෂණය කිරීම හරහා භාවිතයට ගන්නා බවය.

උක්ත වටිනාකම් හා වැදගත්කම් රැසක් පූර්ණය කරන සංස්කෘතික අපරාධ විද්‍යාත්මක විෂය පථය පිළිබඳ වූ දැනුම, අධ්‍යයන, පර්යේෂණ හැකිතාක් සමාජය තුළ ව්‍යාප්ත වීම අවශ්‍ය වූවකි. මෙම සංස්කෘතික අපරාධවිද්‍යා විද්‍යුත් සඟරාව එම අභිප්‍රායේ දෙවන මල්ඵල ගැන්වීමයි. මෙහි විශේෂත්වය වන්නේ අන්තර්ගතයෙහි සඳහන් සියළු ලිපිවල ලේඛක ලේඛිකාවන් බවට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ, මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයෙහි (2016/2017) අධ්‍යයන වර්ෂයෙහි අපරාධවිද්‍යා හා අපරාධ යුක්තිය විශේෂවේදී උපාධිය හැදැරීමට යොමුවුණ (සිංහල මාධ්‍ය හා ඉංග්‍රීසි මාධ්‍ය) විද්‍යාර්ථයින්ගේ සොයාගැනීම් හා දැනුම ගවේශණය කිරීම් යටතේ සම්පාදිත වීමයි. ඊටත් වඩා අනෙක් විශේෂත්වය වන්නේ කොවිඩ් වසංගතය හේතුවෙන් ලාංකීය සමාජයේ සියළු අධ්‍යාපන ධාරාවන් නුපුරුදු online අධ්‍යයන ප්‍රවේශයකට හුරුකරවීමට යොමුවූ කාලවකවානුවක මෙවැනි අභියෝගයක් සම්පූර්ණ කිරීමට පෙරමුණ ගැනීමයි. අපරාධවිද්‍යා හා අපරාධ යුක්තිය උපාධියේ අවසන් වසර විෂය ධාරාව යටතේ සම්පාදනය කළයුතු වූ සංස්කෘතික අපරාධ විද්‍යාව විෂය අවශ්‍යතාවය පෙරදැරි කරගෙන එහි විෂය දැනුමට පරිබාහිරව ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ මෘදු කුසලතා හා සංවර්ධනය කිරීම සඳහා අභියෝගාත්මක කාලවකවානුවක වුව ද, සතුටුදායක මට්ටමින් ඉගැන්වීම් ක්‍රමවේද භාවිතා කිරීමත්, ඒවායේ ප්‍රතිඵල අත්විඳීමත් තුළ විෂයභාර ආචාර්යවරිය වශයෙන් මා හට නිරාමිස සතුටක් පවතී. සෑම කළු වළාවකම රිදී රේඛාවක් ඇතැයි ජනප්‍රවාදයේ එන මතවාදය තවදුරටත් සත්‍යයක් බවට පත් කිරීමට ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් කළ ඉදිරිපත් කිරීම්, නිර්මාණය කළ වාර්ථාමය කෙටි චිත්‍රපට පමණක් නොව ඔවුන් සහයෝගයෙන් දැනුම ගවේශණය කර මෙලෙස එළිදක්වන්නට යෙදුන ලිපි සංග්‍රහය ද ඒ තුළ අත්විඳි ප්‍රතිඵලයන් ය. මේ කාර්යය හුදෙක්ම මාගේ මඟපෙන්වීමෙන් පමණක් සම්පූර්ණ නොවන බව මා දනිමි. ඒ සඳහා එම මඟපෙන්වීම නොපසුබස්නා උත්සහයෙන් කාර්යය අවසන් වන තුරු ඉටු කිරීමට කැපවෙන ශිෂ්‍ය කණ්ඩායමක්ද සිටිය යුතු වේ. මෙම 2016/2017 අධ්‍යයන කණ්ඩායම එම අභියෝගයේදී දැක්වූ ධනාත්මක ප්‍රතිචාරය හුදෙක්ම මෙවන් නිර්මාණයක් එළිදැක්වීමට හේතුවූ බවට නොරහසකි. එහිදී තමන්ට ලැබුණු මාතෘකා යටතේ සාරගර්භ ලිපි පෙළක් නිර්මාණය කළ ලේඛක, ලේඛිකාවන් වන එම විද්‍යාර්ථයින්ටත් මෙම කටයුත්ත අවසන් මොහොත දක්වා අත් නොහැර විද්‍යුත් සඟරාවක් ලෙස එළිදැක්වීමට ඇපකැප වූ සහය සංස්කාරකවරු වන මිතුල, පමුදි, ධනුෂ්ක යන විද්‍යාර්ථයින්ද, එමෙන්ම ලිපි සැකසීම, කවර නිර්මාණය සහ සෝදුපත් බැලීමය යන කාර්යයන් වලදී සහය වූ පැතුම්, චමත්, එරංග, සක්බෝ, ශානිකා, ඉසිවරි, ඉමේෂා යන කණ්ඩායමටත් ස්තුතිවන්ත වන අතර විශේෂයෙන් මෙම කාර්යයේදි කරුණු සොයා බලා මෙය අධ්‍යයනාංශ ප්‍රකාශනයක් ලෙස එළිදැක්වීමට මඟපෙන්වූ හිටපු අධ්‍යයනාංශ ප්‍රධාන මහාචාර්ය සුනිල් රාජනෙත්ති මහතා ඇතුළු ආචාර්ය මණ්ඩලයටත් ස්තුතිය ප්‍රකාශ කරමි. මීට ඉහතදී හිංසිතවේදය විෂය යටතේ අපරාධ වින්දිතයෝ නමින් ප්‍රකාශයට පත් කළ 2015 අධ්‍යයන වර්ෂයේ විද්‍යාර්ථයින් විසින් නව්‍ය දැනුම සොයායන්නවුන් උදෙසා තම යුතුකම, වගකීම විෂයානුබද්ධ රික්තකයන් අළලා සම්පාදනය කර තබා යාමට සමත් වූහ. ඊට සමගාමීව 2016/2017 වර්ෂය නියෝජනය කළ, මෙහි ලිපි සපයා ඇති අපරාධවිද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශයේ විද්‍යාර්ථයින් තවත් පියවරක් ලෙස මෙවැනි කටයුත්තකට සහයෝගයෙන් ඒකරාශී වීම ආරම්භයේ තව දිගුවක් ලෙස සනිටුහන් කිරීමට හැකිවීම පිළිබඳ ඔවුන්ට ප්‍රශංසාවක් හා ගෞරවයක් හිමිවිය යුතුය. අපරාධවිද්‍යා විෂය පථය ලංකාවට හඳුන්වාදුන් දිවංගත ජ්‍යෝෂ්ඨ මහාචාර්ය නන්දසේන රත්නපාල අපගේ ගුරු අස්මදාචාර්යවරයාගේ සිහිනය වූයේ ඔහු රෝපණය කළ විසල් රුක යට තව බොහෝ පැළ රෝපණය වීමය. ඒ සිහිනයට යම් බඳු හෝ සැබෑවක් මෙවැනි නිර්මාණයක් වීම එක්වනු නොවනුමානය.

අපරාධවලින් තොර සමාජයක් රටක පුරවැසියන්ට උරුම කරලීම සඳහා ඒ වෙනුවෙන් කළහැකි සුළු හෝ කර්තව්‍යයක් තිබේනම් දෙවරක් නොසිතා ඒ වෙනුවෙන් පෙරමුණ ගැනීම මෙම විෂය හදාරණ සහ මෙම විෂය උගන්වන සියළු දෙනාගේම මහත් වූ වගකීමකි. ඒ වෙනුවෙන් දායක වීමට හැකිවීම සංතෘෂ්ටියට හේතුවක් බව සටහන් කරමින් මෙවැනි රික්තයන් කේන්ද්‍ර කර ගනිමින් තව නිර්මාණ බොහෝ සෙයින් ඇති වේවා යැයි වූ ප්‍රාර්ථනය සමඟ මෙම කාර්යය මෙවැනි වූ මට්ටමකින් නිමාකළ සියළු ලේඛක, ලේඛිකාවන්ට සුභාශිංසනය එකතු කරමි.

**ස්තුතියි.**

**මහාචාර්ය නෙරංජි විජේවර්ධන**
**අපරාධවිද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය**
**මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
2022/10/17

**කර්තෘ නාමාවලිය**

## 1. ‘අපරාධය’ සංස්කෘතික අපරාධ විද්‍යාවේ ඇසින් (ආරාධිත ලිපිය)

ආසියානු මානව හිමිකම් කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක, ජ්‍යෙෂ්ඨ නීතිඥ බැසිල් ප්‍රනාන්දු

## 2. සංස්කෘතිය, සංස්කෘතික අපරාධ විද්‍යාව හා සංස්කෘතික අපරාධ විද්‍යාවේ ඉතිහාසය

එල්. සී. එම්. ද සිල්වා

ඒ. ඒ. එස්. ඩබ්ලිව්. පෙරේරා

ඒ. ඒ. කරන්නාගොඩ

## 3. සංස්කෘතික අපරාධ විද්‍යා දැනුම සමාජගත කිරීමේ වැදගත්කම

පී. එන්. කල්හාරි

ටී. ඒ. ඒ. එම්. තෝලංගආරච්චි

එච්. කේ. එස්. ටී. විජේසේකර

## 4. සංස්කෘතික විකාශය සමඟ ඇතිවන අපරාධවල ප්‍රවණතා

එම්. ඩී. සී. පීරිස්

ඊ. අයි. චාමර

ඩබ්. ඩී. සී. පුෂ්පකුමාර

## 5. සංස්කෘතිය, අපරාධ පාලනය හා නිවාරණය

එච්.එම්.ඩී. චාමරිකා

ජී.ඒ. ඉරෝෂණී

එම්. කේ. එස්. සුපුනිකා

## 6. සංස්කෘතික විසරණය සහ අපරාධ

බී. එම්. කුමානායක

ඒ. එම්. එස්. එන්. අබේකෝන්

එම්. එම්. එස්. පී. දිසානායක

**7. සංස්කෘතික ගැටුම සහ අපරාධ**

ඩී.එම්.පී.වී. දිසානායක

එස්.ඩී. හන්සිකා

ඊ.ඩී.අයි.පී. වීරක්කොඩි

**8. Culture Conflict and Criminal Justice**

N.D.D.N. Weerasinghe

R. H. I. B. Chandrasekera

K.B.D.M.K.S. Dissanayake

**9. සමාජ වෙනස්වීම, අපරාධ හා වින්දිතභාවය**

ඩබ්ලිව්.ආර්.ඩී.ටි බණ්ඩාර

එම්.කේ.සී මදුෂිකා

එන්.ඩී.ඒ ධනංජලී

**10. සංස්කෘතිය සහ පෞරුෂත්වය සංකල්පයන් සමාජයේ අපරාධ ත්වරණය කෙරෙහි සිදුකරනු ලබන බලපෑම පිළිබඳ අධ්‍යයනය**

ටී. ඒ. ශානිකා තාඹුගල

අයි.කේ.එස්.එම්.ජී.පී.එම්. විජේරත්න

එම්.සි.එස්. වර්ණකුලසූරිය

**11. Gender-based violence and culture**

P. N. H.Dias

D. A. T. Bandara

R. D. T. Rajapaksha

**12. විවිධ සංස්කෘතීන් මත වෙනස් වන අපරාධ**

ඩී. එම්. ඩී. එල්. සංජීවනී

ආර්. ඩී. අයි. එම්. රාජපක්ෂ

ඩබ්. එම්. එච්. රුවන්තිකා

**13.ආගමික සංස්කෘතිය හා අපරාධ නිවාරණය**

එම්.එස්.එස්. කුමාර

ටී.එච්. විශාර

**14.සංස්කෘතික අපරාධ විද්‍යාව ශ්‍රී ලංකාවේ ඓතිහාසික සංස්කෘතිය හා බැඳුන අපරාධ හා අපරාධ නිවාරණය**

එච්.පී. නිවන්ත

ජේ. ඒ. එරංග චානක

සී.එස්. ගුණරත්න

**15.විවෘත ආර්ථිකයෙන් පසු සංස්කෘතික පරිණාමය අපරාධ ඇතිවීම කෙරෙහි බලපෑ ආකාරය**

එන්.එස්. අබේගුණවර්ධන

එන්. ආර්. අයි. ඩී. නිලවීර

**16.බහු ජනවාර්ගික සංස්කෘතීන් පදනම් කරගෙන ශ්‍රී ලාංකීය සමාජය තුළ අපරාධ ප්‍රභවය වීමට බලපවත්නා තත්ත්වයන්**

ආර්.එම්.සී.යූ.බී රණතුංග

එල්.පී.වනසිංහ

**17.The Victimization Nature of Social Media Culture in Sri Lanka**

A.A.H.N. Amarathunga

N.G.A.S. Napawala

G.N.K. Madushanka

**18.COVID 19 වසංගතයත් සමඟ වෙනස් වූ සංස්කෘතික පරිසරයෙහි අපරාධ වල නව්‍යතාවය**

අයි. ඩී. අයි. සෙව්වන්දි

වී. ජී. එම්. සෙව්වන්දි

ඒ. එම්. ඒ. ප්‍රසාදනී

**පටුන**

කතුවරුන්ගෙන් vi

පෙර කියැවීම vii

කර්තෘ නාමාවලිය x

පටුන xiii

ආරාධිත ලිපිය xv

**පළමු කොටස (සංකල්පීය විග්‍රහය)** **xxii**

1. සංස්කෘතිය, සංස්කෘතික අපරාධ විද්‍යාව හා සංස්කෘතික අපරාධ විද්‍යාවේ ඉතිහාසය 1

2. සංස්කෘතික අපරාධවිද්‍යා දැනුම සමාජගත කිරීමේ වැදගත්කම 8

3. සංස්කෘතික විකාශය සමඟ ඇතිවන අපරාධවල ප්‍රවණතා 15

4. සංස්ෘතිය, අපරාධ පාලනය හා නිවාරණය 22

5. සංස්කෘතික විසරණය සහ අපරාධ 30

6. සංස්කෘතික ගැටුම සහ අපරාධ 38

7. Culture Conflict and Criminal Justice 43

8. සමාජ වෙනස්වීම, අපරාධ හා වින්දිතභාවය 52

9. සංස්කෘතිය සහ පෞරුෂත්වය සංකල්පයන් සමාජයේ අපරාධ ත්වරණය කෙරෙහි සිදුකරනු ලබන බලපෑම පිළිබඳ අධ්‍යයනය 60

10. Gender-based violence and culture 70

11. විවිධ සංස්කෘතීන් මත වෙනස් වන අපරාධ 76

12. ආගමික සංස්කෘතිය හා අපරාධ නිවාරණය 82

13. සංස්කෘතික අපරාධ විද්‍යාව ශ්‍රී ලංකාවේ ඓතිහාසික සංස්කෘතිය හා බැඳුන අපරාධ හා අපරාධ නිවාරණය 86

14. විවෘත ආර්ථිකයෙන් පසු සංස්කෘතික පරිණාමය අපරාධ ඇතිවීම කෙරෙහි බලපෑ ආකාරය 98

15. බහු ජනවාර්ගික සංස්කෘතීන් පදනම් කරගෙන ශ්‍රී ලාංකීය සමාජය තුළ අපරාධ ප්‍රභවය වීමට බලපවත්නා තත්ත්වයන් 105

16. The Victimization Nature of Social Media Culture in Sri Lanka 113

17. COVID 19 වසංගතයත් සමඟ වෙනස් වූ සංස්කෘතික පරිසරයෙහි අපරාධ වල නව්‍යතාවය 120

**දෙවන කොටස (න්‍යායාත්මක විග්‍රහය) 131**

1. සාපේක්ෂ සම්බන්ධතා සංස්කෘතික න්‍යාය 132

2. ධර්මතා න්‍යාය (ප්‍රතිමාණක න්‍යාය) 134

3. ලෝරන්ස් කොල්බර්ග්ගේ සදාචාරාත්මක සංවර්ධනය පිළිබඳ න්‍යාය 136

4. Conflict Theory of Culture 139

5. නවීකරණ න්‍යාය 143

6. සමාජ ක්‍රියා න්‍යාය 147

7. Scapegoat Theory 149

8. සාමය ඇති කිරීමේ න්‍යාය 153

9. ඓතිහාසික භෞතිකවාදී න්‍යාය 156

10. නව පරිණාමවාදි න්‍යාය 159

11. මැක්ලූහන්ගේ සන්නිවේදන න්‍යාය 161

12. සංස්කෘතික පෞරුෂවාදී න්‍යාය 163

**ආරාධිත ලිපිය**

## ''අපරාධය'' සංස්කෘතික අපරාධ විද්‍යාවේ ඇසින්.

ලිඛිත නීතියට අනුව බලන විට ලංකාවේ අපරාධය යන සංකල්පය ඉතා පැහැදිලිව නිර්වචනය කොට ප්‍රකාශයට පත් කොට ඇත. අපරාධයක් නම් නීතිය විසින් අපරාධයක් යැයි ප්‍රකාශයට පත්කොට දඬුවමකට භාජන කරන ක්‍රියාවකි. අපරාධ ප්‍රකාශයට පත්කිරීම ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය හා ලංකාවේ ව්‍යවස්ථාදායකය විසින් විටින් විට පනවනු ලබන පණත් මගින් සිදු කර ඇත. එම අපරාධ පිළිබඳව පරීක්ෂණ කිරීමේ අත් නොහැරිය හැකි වගකීමක් අපරාධ පරීක්ෂකයන් වෙත පැවරෙන අතර ඔවුන් ක්‍රියා කලයුතු ආකාරය අපරාධ නඩු විධිවිධාන පනත මගින් ප්‍රකාශයට පත් කොට ඇත. අපරාධයක් සිදු වුණාද නැද්ද යන්න තීන්දු කරන්නේ සාක්ෂි මත ය. සාක්ෂි යනු මොනවාද යන්න නීතිය මගින්ම සාක්ෂි ආඥා පනත තුළින් නිර්මාණය කොට ඇත. ඉහත සඳහන් කළ සියලු නීති දීර්ඝ කාලයක් තිස්සේ අධිකරණය විසින් අර්ථකථනයට භාජනය කොට ඇත. එසේ කරනු ලබන අර්ථකථනයන් ද නීතියේම කොටසක් වෙයි.

ලංකාවේ මෙම අපරාධ පිළිබඳ නීතිය පදනම් වී ඇත්තේ ද කොමන් ලෝ (The Common law) හෙවත් පොදු නීති යනුවෙන් හඳුන්වනු ලබන බ්‍රිතාන්‍යයේ කාලාන්තරයක් තිස්සේ වර්ධනය වී පසුව රට රටවල් ගණනාවක් විසින් පිළිගෙන ඇති නීති සම්ප්‍රදාවකි. නෛතික වශයෙන් තත්ත්වය එසේ වුවත් ප්‍රායෝගිකව බලන කල නීතිය අපරාධ පිළිබඳව ලිඛිතව සඳහන් කර ඇති ආකාරයට හා ඒ පිළිබඳ ව ක්‍රියා කිරීමට පමුණුවා ඇති විදා විධාන, සමාජය තුළත්, ජන ජීවිතය තුළත් පිළිබිඹු වන්නේ කෙසේදැයි බලන කල ලිඛිතව කර ඇති නිර්වචනයන් හා පැහැදිලි කිරීම් ඇත්තෙන්ම සමාජය තුළින් අපරාධ සලකන ආකාරය අතර සංසන්දනය කිරීමේදී විශාලතම පරතරයක් පෙනෙන බව කාට වුවත් පෙනෙන දෙයකි. මෙම පරතරය හඳුනා ගැනීම තුළින් කොතෙක් දුරට අපරාධය පිළිබඳව නිල වශයෙන් පවතින අර්ථකථනයන් හා සමාජ ජීවිතයේ ජන මනස තුල අපරාධ පිළිබඳව ඇති වටහා ගැනීම් අතර පවතින වෙනස්කම් හඳුනා ගත හැකි වේ.

අපරාධ නීතිය ක්‍රියාත්මක වන්නේ නීතියේ ආධිපත්‍යය හා නීතිය මත පාලනය යන ප්‍රධාන සම්ප්‍රදායන් යටතේය. එම සම්ප්‍රදායට අනුව අපරාධයක් යනු අනිවාර්යයෙන්ම දඬුවම් ලැබිය යුතු වරදකි. මේ නිසා අපරාධ යන්න කොපමණ ප්‍රමාණයකට අපගේ සම්ප්‍රදාය තුළ බැහැර කළ යුතු ක්‍රියාවන් නිර්වචනය කිරීමේදී වැදගත් ද යන්න පැහැදිලි වේ. දඬුවම් කිරීම මගින් අදහස් කරන්නේ එම වරද සමාජයට විරුද්ධව කරනු ලද වරදක් සේ සැලකීමය. එම නිසා සමාජයට එම වරදට දඬුවම් කිරීමේ අයිතිය පමණක් නොව යුතුකමක්ද පවතින බවය. ඒ පිටුපස ඇති අදහස නම් අපරාධවලට දඬුවම් නොකරන්නේ නම් යම් සමාජයකට ස්ථාවර හා සාමකාමී සමාජයක් වශයෙන් පැවතීමට බැරි බවය. එම නිසා අපරාධ දුරස්ථ කිරීම හුදෙක් අපරාධ වාචිකව හෙළා දැකීමේ මට්ටමික නොනැවතී ඒවාට දඬුවම් කිරීමේ සම්ප්‍රදාය ඇති කොට ඇත. කෙනකුගේ නිදහස කාලයකට ඔහුට අහිමි කොට දැමීමට තරමට අපරාධ බරපතළ වරදක් සේ රටේ පවතින නීති සම්ප්‍රදාය විසින් සලකනු ලබයි.

එම බැහැරවීම් කරවීම සඳහා සංස්ථාවන් නිර්මාණය කොට ඇත. අපරාධ පරීක්ෂණ කාර්යයෙන් පොලිසියට පවරා තිබෙන්නේ මෙම අපරාධ වැළැක්වීම ඉතාමත් අවශ්‍යය ම කොටසක් වශයෙනි. අපරාධයට දඬුවම් කිරීම අනිවාර්යය වන්නා සේ අපරාධ පරීක්ෂණ කිරීමද අනිවාර්ය වේ. අපරාධයක් වශයෙන් සැලකිය යුතු වරදක් පරීක්ෂණය කරනවා ද නැද්ද කියා තීරණය කිරීමේ අයිතියක් පරීක්ෂණය කිරීමේ යෙදෙන සංස්ථාවට නිගමනය කළ නොහැක. තමන් වෙත වාර්තා වන සියලුම අපරාධ ඔවුන් විසින් පරීක්ෂණයට භාජන කළ යුතුමය. පරීක්ෂණයෙන් පසු එවැනි වරදක් සිදු වූවායැයි ඔප්පු කිරීමට තරම් සාක්ෂි ඇත්නම් ඒ පිළිබඳව නඩු පැවරීම ද අනිවාර්යම කටයුත්තකි. මේ වගේ අපරාධ මගින් අපරාධ පරීක්ෂණය හා පරීක්ෂණයකින් පසු සාක්ෂි ඇති යයි ඔප්පු වන අපරාධ පිළිබඳ නඩු පැවරීම අනිවාර්යයෙන් කළයුතු වගකීමක්ය යන්න ලංකාවේ නෛතික සම්ප්‍රදායේ අතිශයින් වැදගත් කොටසක් සේ පවතී.

එහෙත් ලංකාවේ ජන මනස තුල මෙවැනි බරපතළ කාර්යයක් කිරිම සම්බන්ධයෙන් ඉතා පැහැදිලි අවබෝධයක් නොපවතින බව ලෙහෙසියෙන් නිරීක්ෂණය කළ හැකිය. මෙයින් පෙනී යන්නේ ලංකාව තුළ අපරාධය පිළිබඳව පවතින ලිඛිත නීතියත් රටේ ජන ජීවිතයට සම්බන්ධ වූ සංස්කෘතික ජීවිතයක් තුළ අපරාධය පිළිබඳව සලකන ආකාරයක් සම්බන්ධයෙන් විශාල ගැටලුවක් හා පරස්පර විරෝධයක් පවතින බව පෙනී යයි.

අපරාධ නීති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විශාල දියුණුවක් ලබා ඇති රටවල් දෙස බැලීමේදී අපට පෙනී යන්නේ එම රටවල සංස්කෘතිය හැඩගැසීමෙහිලා, අපරාධ නීතිය හා එය ක්‍රියාත්මක කිරීම කොතෙක් දුරට බලපා ඇත්ද යන කරුණය. මෙය දහසකුත් උදාහරණ මගින් පෙන්වා දිය හැකිය. ලිංගික අපරාධ නීතිය ඇත්තෙන්ම ක්‍රියාත්මක වන රටවල අපට දැකිය හැකි කරුණක් නම් විශේෂයෙන්ම කාන්තාවන්ගේ නිදහස එයින් රැකෙන ආකාරයි. අපරාධ නීතිය හොඳින් ක්‍රියාත්මක වන රටක කාන්තාවෝ දිනයේ ඕනෑම වෙලාවක රාත්‍රිය ද ඇතුළුව ඔවුන්ගේ කටයුතු සඳහා බියෙන් තොරව යාම් ඒම් කරති. රැකියාව සඳහා හෝ අධ්‍යාපනය සඳහා හෝ වෙනත් සමාජ කටයුතු සඳහා ඔවුහු එසේ නිදහසේ කටයුතු කරන්නේ නිසියාකාරව ක්‍රියාත්මක කරන අපරාධ නීතිය පවතින නිසාත් තමන්ට ඒ මගින් විශාල ආරක්ෂාවක් තිබේය යන අදහස ඔවුන්ගේ සිත් තුළ පවතින නිසාය. තමන්ගේ සමානාත්මතාවය හා නිදහස තම රටේ පවතින නීතිය හා නීතිය ක්‍රියාත්මක කිරීමේ සම්ප්‍රදාය තුළින් රැකෙන බව වටහාගන්නා කාට වුවත් තමන්ගේ කටයුතුවල අනවශ්‍ය බියකින් තොරව කටයුතු කිරීමට පුළුවන්කමක් ඇතිකර ගනියි.

අපි පුද්ගලික ක්ෂේත්‍රයෙන් පිටට ගොස් ව්‍යාපාරික ජීවිතය දෙස බැලුවහොත් අපට පෙනී යන්නේ සියලුම ව්‍යාපාර ක්‍රියා කිරීම සම්බන්ධයෙන් ද අපරාධ නීතිය ක්‍රියාත්මක වන බව ය. යම් කොන්තරාත්තුවක් ලබා ගැනීමේ දී තිබිය යුතු ටෙන්ඩර් පටිපාටිය මෙන්ම කොන්ත්‍රාත්තුවක් ක්‍රියා කිරීම කෙරෙහි බලපාන සියලුම කරුණු ද අවසාන වශයෙන් තීන්දු වන්නේ එම් කරුණු ඉටු කිරීමට අපොහොසත් වන අවස්ථාවන්හිදී අපරාධ නීතිය මැදිහත්වීම තුළින් එම අනීතික කඩකිරීම් වලට දඬුවම් කිරීම්ට හැකි බව එම කොන්ත්‍රාත්තු වලට එකඟ වන පුද්ගලයන් තුල පවතින දැනීම නිසාය. මේ ආකාරයට අපි සාමාන්‍ය සේවාවන් පිළිබඳව බැලුවොත් යම් බෙහෙතක් ලබා ලබාගැනීමේදී ඒ බෙහෙතෙහි තිබිය යුතු ප්‍රමිතිය පවතිනවා ද නැද්ද යන්න නිසි ලෙස ප්‍රකාශයට පත් කිරීම එම බෙහෙත් නිපදවන නිෂ්පාදකයන්ගේ යුතුකමක් වන අතර, ඒවා නිසි ලෙස ප්‍රදර්ශනය කිරීම බෙහෙත්

වෙළදාම් කරන වෙළෙන්දන්ගේ යුතුකම වේ. මෙය වැරදි ආකාරයකට කිරීමෙන් හෝ සාවද්‍ය ලෙස වැරදි තොරතුරු මත භාණ්ඩය ප්‍රදර්ශනය කරන්නා අපරාධයක් කරයි. එම අපරාධය දඬුවම් ලැබිය යුතු අපරාධයකි. මේ අනුව ක්‍රියාත්මක වන්නේ නම් රෝගියෙකුට තමන්ට අදාළ බෙහෙත් පිළිබඳව විශ්වාසයකින් යුතුව කටයුතු කළ හැකිය. එසේ නොවුවොත් වැරදි තොරතුරු සපයා වැරදි බෙහෙත් වෙළදාම් මගින් රෝගී තත්ත්වයන් වඩාත් උග්‍ර කිරීම්ද මරණ පවා සිදු වීමද ඇතිවිය හැකිය.

මේ නිසා ඉතා පැහැදිලිව පෙනී යන්නේ අපරාධ වල බැරෑරුම්කම තේරුම්ගත් සමාජයක් හා එම සමාජයේ සංස්කෘතික ජීවිතය තුළ ආරක්ෂාව සහිත බව පිළිබඳ විශ්වාසයක් සෑදීම අතර ඉතා ගැඹුරු සම්බන්ධයක් පවතින බවය. පොහොසත් සංස්කෘතියක ප්‍රධානම ගතිගුණයක් නම් සමාජයේ කෙරෙන කටයුතු හා ගනුදෙනු විශ්වාසයකින් යුතුව කර ගැනීමට හැකිය යන විශ්වාසය එම සමාජය තුළ පැවතීමයි. අපරාධ නීතිය නිසි ලෙස ක්‍රියාත්මක වන්නේ නම් ස්වභාවිකවම එවැනි දැඩි විශ්වාසයක් සමාජයට සම්බන්ධව මෙන්ම තමන් ඇසුරු කරන්නා වූ සමාජයේ අනිත් සාමාජිකයන් සම්බන්ධයෙන් ද, ස්වාභාවිකවම ඇතිවන බවය. එවැනි විශ්වාසයක් යම් සමාජයක් තුළ බිඳී තිබෙන්නේ නම් එයට හේතුව සොයන කළ එම සමාජය තුළ අපරාධ නීතිය ක්‍රියාත්මක කරන ආකාරය සම්බන්ධයෙන් සොයා බැලිය යුතුව ඇත.

යම් සමාජයක් තුළ ප්‍රචණ්ඩත්වය පිළිබඳව ඇති අදහස් මෙන්ම ක්‍රියාකලාපයන් ද සැලකීමේදී ද අත්‍යාවශ්‍ය වන්නේ එම සමාජය තුළ අපරාධ නිර්වචනය කිරීම මෙන්ම අපරාධ නීතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කොපමණ සාර්ථකත්වයක් පවතිනවා ද නැද්ද යන්නයි. අපරාධ නීතිය හොඳින් කියා ක්‍රියාත්මක වන රටවල් දැඩි ප්‍රචණ්ඩ ක්‍රියාවන් මර්දනය කර ගැනීමට හා ඉතා විශාල වශයෙන් අඩු කර ගැනීමට වාතාවරණයක් ස්වභාවිකව ම නිර්මාණය කරගනී. යම් ගැටලු ඇති වූ විට සාකච්ඡා මගින් ඒවා විසඳා ගැනීමත් විවිධ සමතයන් කරා එළඹීමත් එවැනි සමාජයක් තුළ දැකිය හැකි ගුණාංගයන්ය. එහෙත් එසේ සාමකාමී විසඳුම් ලබා නොහැකි තත්ත්වයක් පවතින්නේ නම් එය පසු විපරම් කර බැලුවහොත් පෙනී යනු ඇත්තේ එම සමාජය තුළ අපරාධ නිර්වචනය කිරීම මෙන්ම ක්‍රියාත්මක කිරීම් සම්බන්ධයෙන් ද විශාල ප්‍රශ්න පවතින බවය.

මෙයින් පෙන්නුම් කරන්නේ අපරාධ පිළිබඳව නිසි නිර්වචනයන් නිතරම නිර්මාණය කර ගැනීම, ඒවා පිළිබඳව පරීක්ෂණ ක්‍රියාදාමය නිසි ලෙස කිරීම හා ඒ පිළිබඳව අවශ්‍ය නඩු පැවරීම් ආදි ක්‍රියාමාර්ග කිරීම හුදෙක්ම නෛතික කර්තව්‍යයක් පමණක් නොව එය ඉතා වැදගත් සංස්කෘතික ගති ගුණයක් බව ය. සාධනීය අපරාධ මර්දනය කිරීමේ විධික්‍රමයක් නැති සමාජයක් තුළ පොහොසත් සංස්කෘතියක් පැවතීමට බැරිය. අපරාධය හා සංස්කෘතිය එකිනෙකට ගැටෙයි. එමෙන්ම අපරාධ මර්දනය යෙදෙන්නාගෙ කර්තව්‍යය වැඩි දියුණු සංස්කෘතියක් පවත්වාගෙන යෑම සඳහා අත්‍යාවශ්‍ය කොන්දේසියක් වේ. එම කටයුත්ත පැහැර හැරීමක් සිදු වන්නේ නම් එම සමාජය තුළ විශාල ප්‍රමාණයක සංස්කෘතික අර්බුදයක් සිදුවෙයි. ලංකාව මහා පරිමාණව සංස්කෘතික ගැටලු වලට මුහුණ දෙන මෙවැනි කාලයක දී ලංකාවේ අපරාධ නීතිය හා එය ක්‍රියාත්මක වන ආකාරය කොතෙක් දුරට ලංකාවේ සංස්කෘතික පරිහානියට හේතු වී ඇත්ද යන්න සොයා බැලීම ඉතාම වැදගත්ය. මේ පිළිබඳව කෙරෙන ගවේෂණ හා හැදෑරීම් රටකට විශාල සේවයක් වනු ඇත.

ලංකාව සම්බන්ධයෙන් මෙහිදී සැලකිය යුතු තවත් අංශයක් ඇත. එනම් ලංකාවේ අපරාධ වශයෙන් බොහෝ දුරට සලකනු ලබන්නේ පුද්ගලයන් අතර ඇතිවෙන ප්‍රචණ්ඩ ක්‍රියාවන් සම්බන්ධයෙනි. මිනී

මැරීම, ස්ත්‍රී දූෂණය, හොරකම ආදී දේට පමණක් අපරාධ සංකල්ප හා අපරාධ මර්දන ක්‍රියා යෙදී තිබීම ලංකාවේ සංස්කෘතිය වර්ධනය වීමට විශාල බාධාවක් සේ පවතී. මන්ද යත් වර්තමාන ලෝකය තුළ වැඩි ප්‍රමාණයක් අපරාධ සිදුවන්නේ ප්‍රසිද්ධ ජීවිතය තුළදී ය. එනම් ප්‍රසිද්ධ සංස්ථාවන් ක්‍රියා කරන ආකාරය තුළිනි. රටක මූල්‍ය ක්‍රමය නීත්‍යානුකූලව නොකෙරෙන්නේ නම් එම ක්‍රමය තුළ වංචාවට හෝ දූෂණයට විශාල ඉඩකඩක් තබා තිබෙන්නේ නම් ඒ රටේ ආර්ථික සංවර්ධනයට මෙන්ම සමාජ සංවර්ධනයට ද එම කරුණ බලපායි. මේ අනුව ප්‍රසිද්ධ ජීවිතයේ කටයුතු සියල්ල කෙරෙහිම නීතිය ක්‍රියාත්මක කෙරෙන තත්ත්වයක් පවතින සමාජයක එම කටයුතු නිසි ලෙස කෙරෙනවාය යන්න හා එයින් ඉටු විය යුතු සේවය රටවැසියාට ලැබෙනවා යන අදහස ඇති කර ගැනීම සාධාරණය. එය එසේ නොවන්නේ නම් රට පුරාම ඇති අර්බුද හා ගැටීම් ව්‍යාපාර ක්ෂේත්‍රය තුළ ද සිදුවෙයි. ව්‍යාපාර පාලනය ද කරනු ලබන්නේ අවසාන වශයෙන් අපරාධ නීතිය තුළිනි. ව්‍යාපාරික ජීවිතයේ සමහර දේ කිරීමට බැරි එසේ කළහොත් සමාජයේ දඬුවමට පත්වෙනවාය යන අදහස නිර්මාණය කරන්නේ ඒ පිළිබඳව අපරාධ නිර්වචන කිරීමෙන් හා ඒ අපරාධ නිසිලෙස පරීක්ෂා කොට ක්‍රියාත්මක කිරීම් තුළිනි.

ඒ අනුව රටක සංවර්ධනය කෙරෙහි අපරාධ නීතිය ඉතා ප්‍රබල සේවයක් ඉටු කරයි. අපරාධ නීතිය නිසි ලෙස ක්‍රියාත්මක නොවන අවස්ථාවල දී තරගකාරිත්වය එහි සීමාවන් ඉක්ම යමින් එකිනෙකාට හිරිහැර වෙන ආකාරයට කිරීමට වඩා බලවත් අයට හැකිවීම නිසා, සමාජය තුල අර්බුද වඩ වඩාත් වැඩි වෙයි. මේ නිසා අපරාධ යන සංකල්පය හුදෙක් පුද්ගලික ව එකී එකිනෙකාට සිදුවන අපරාධ පමණක් නොව ප්‍රසිද්ධ ජීවිතය තුළ හා විවිධ සංස්ථා කටයුතු සම්බන්ධයෙන් බලපෑම් දක්වාම වර්ධනය කර කර ගැනීම තුළින්, දියුණු රටවල් එම ක්‍රියාවලින් ස්ථාවර ආකාරයකින් පවත්වාගෙන යෑමට වාතාවරණය නිර්මාණය කරගෙන ඇත. එවැනි වාතාවරණයක් නිර්මාණය කර ගැනීමට ලංකාවට තවම බැරි වී ඇත.

ලංකාවේ සාමාන්‍යයෙන් මහජනතාව තුළ නීතිය පිළිබඳව තවමත් ඇත්තේ විශාල සැකයෙකි. නීතිය දුර්වලයාට පමණක් බලපාන බවත් බලවතුන්ට නීතිය බල නොපාන බවත් යන සංකල්පය අතීතයේ සිට වර්ධනයය වී ඇති අතර එය බිඳීමක් නූතන කාලයේදී දැකගත නොහැකි වී ඇත. අපරාධ නීතිය වඩාත්ම බලපෑ යුත්තේ වඩා බලවත් පුද්ගලයන් හා සංස්ථාවන් කෙරෙහිය. මන්දයත් පොදුවේ සමාජය කෙරෙහි බලපාන විශාල අපරාධ කිරීමේ හැකියාව ඇත්තේ එවැනි බලවත් කණ්ඩායම් වලටය. බලවතා නීතිය තුළ රඳවා ගැනීම අත්‍යවශ්‍ය කරුණක් වේ. එය කරනු ලබන්නේ අපරාධ නීතිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම තුළිනි.

ඒ අනුව ලංකාවේ සංස්කෘතිය පිළිබඳව සලකා බැලීමේදී අපරාධ නීතිය නිසි ලෙස වර්ධනය කර ගැනීමට නොහැකි වීම පිළිබඳව ගැටලුව සංස්කෘතික ගැටළුවක් සේ දැකිය යුතු ව ඇත. එම දර්ශනය මත පිහිටා අපරාධ නීතිය පිළිබඳව වර්තමාන ලෝකයේ ඇති වඩා දියුණු අදහස් ලංකාව තුළද පැලපැදියම් කිරීම් තුළින්, විශේෂයෙන්ම දේශපාලනයේ සිට ආර්ථික, සමාජ දියුණුව ආදී සියලුම කටයුතු සම්බන්ධයෙන් අපරාධ නීතිය නිසිලෙස ක්‍රියාත්මක කිරීමට සැලැස්වීම තුළින්, ලංකාව බලා බලාපොරොත්තු වන ආර්ථික ප්‍රගතිය පමණක් නොව සමාජ ස්ථාවරත්වය ද ඇති කර ගත හැකිය. මෙම මුලෝපායෙන් තොරව හුදෙක්ම නිෂ්පාදනය හෝ වෙනත් මාර්ගවලින් පමණක් රටක සංවර්ධනය ඇති කරගත හැකි යැයි සිතීම බලවත් මිත්‍යාවකි.

**පොලිස් නිලධාරියා නීතිය හා සංස්කෘතිය**

ලංකාවේ පොලිස් නිලධාරියාගේ කාර්යභාරය පිළිබඳව මහා පරිමාණ සැකයන් හා නොපැහැදිලිකම් නිතරම සමාජ සාකච්ඡාවල දී ප්‍රකාශයට පත් වේ. පොලිස් නිලධාරීන්ගේ කටයුතු පිළිබඳ විවේචනයක් නතිරන්තරව මෙන් මාධ්‍ය හා සමාජ සාකච්ඡාවලදී ඇසෙන්නට ලැබෙයි.මෙම විවේචනයන් තුලින් නිතර මතුවන ප්‍රශ්න මෙසේ සඳහන් කළ හැකියි. පොලිස් නිලධාරීන්ගේ බලතල පිළිබඳව පැහැදිලි අවබෝධයක් ජනතාව තුළ ඇත්තේ නැත. පොලිස් නිලධාරීන්ට කළ හැක්කේ මොනවාද කළ නො හැක්කේ මොනවාද යන කරුණු පිළිබඳව නොපැහැදිලි කමක් පැවතීමට හේතුවක්ව ඇත්තේ පොලිස් නිලධාරීන් අතින් කෙරෙන බොහෝ කටයුතු අතර විශාල පරස්පර විරෝධයක් පවතින නිසාය. මෙම පරස්පර විරෝධයන්ගේ මූලයන් හුදෙක්ම පොලිස් නිලධාරීන්ගේ වරද නිසාම ඇතිවන ඒවා නොවන්නට පුළුවන. මෙම විවිධ පරස්පර විරෝධයන්ගේ මූලයන් අද පොලිසිය සංස්ථාවක් හැටියට පත් වී තිබෙන තත්ත්වය නිසා ඇති වී තිබෙන්නටත් බොහෝ දුරට ඉඩ කඩ ඇත. මේ අනුව එක් අතකින් පොලිස් සංස්ථාව තුළින් නීතිය ක්‍රියාත්මක කර ගැනීම පිළිබඳව විශාල ගැටලු මතු වී තිබෙන අතර, අනිත් අතට විවිධ නිලධාරීන්ගේ කටයුතු වල පවතින පරස්පර විරෝධතාවයන් නිසා ද පොලිසියේ කාර්යභාරය පිළිබඳව විශාල නොපැහැදිලිකමක් හා අප්‍රසාදයක් ඇති බව පෙනෙන්නට තිබෙයි. පොලිසිය සංස්ථාවක් වශයෙන් නිර්මාණය වී දැනට අවුරුදු එකසිය 150කට වැඩි කාලයක් ගත වී ඇත. ඒ කාලයේ මුල් අවධිය බොහෝ දුරට පොලිසිය පිළිබඳව සංකල්පයක් රට තුළ ගොඩනගා ගැනීමේ ප්‍රයත්තයක් එකල යටත් විජිත පාලකයන් විසින් ගන්නා ලද පියවර වලින් සිදු කෙරුණි. බ්‍රිතාන්‍යයේ මව් රට කර ගත් යටත්විජි තුළද බ්‍රිතාන්‍යහි පැවති පොලිස් සේවයට සමාන සංස්ථාවක් ඇති කිරීම සඳහා ප්‍රයත්තයක් පටන් ගන්නා ලදී.

පොලිසියක් නිර්මාණය කර ගැනීමේ මුල් කාලයේ දී ඇති වූ ගැටලු වලට ප්‍රධාන හේතුවක් වූයේ ඒ කාලය වන තෙක් වර්තමාන පොලිස් ක්‍රමය වැනි ක්‍රමවේදයක් ලංකාවේ ඒ දක්වා නොතිබුනේය. මේ නිසා පොලිස් නිලධාරීන් වශයෙන් මුලින් බඳවා ගන්නා ලද ලාංකිකයන් අතර මෙම සංකල්ප ඇති කිරීමටත් ඒවාට අනුව ඔවුන්ගේ හැසිරීම හැඩගස්වා ගැනීමත් සඳහා විශාල උත්සාහයක් පැවති බව පෙනෙයි. විසිවන ශතවර්ෂයේ මැද භාගය වන විට මෙම සංස්ථාව මෙසේ පුහුණු කිරීම් අංශයෙන් සැලකිය යුතු දියුණුවක් ලබා තිබුණි. පොලිස් නිලධාරියා නීතිය ක්‍රියාත්මක කරවන්නෙකු පමණක් බවත් ඔහු කරන සියලු රාජකාරියන් නීතියට අනුකූලව කල යුතු බවත් යන සංකල්පය මේ වන විට පොලිස් සංස්ථාව තුළ බොහෝ දුරට ස්ථාවර වී පැවතිණ. පොලිසිය වනාහි ඉහල සිට පහලට සංවිධානය වී ඇති සංස්ථාවකි. පහළ නිළධාරීන්ගේ ක්‍රියා කලාපය මුළුමනින් ඉහළ නිලධාරීන්ගේ අධීක්ෂණය හා මඟ පෙන්වීම යටත්කොට තිබීම මෙවැනි සංස්ථාවක ඇති ප්‍රධානම ලක්ෂණයකි. මෙම කටයුත්ත කිරීමට සඳහා ඉහල පොලිස් නිලධාරීන් පුහුණු කරවා ගැනීම සඳහා ද විශාල කාලයක් ගත විය. මුලින් මෙම ඉහළ නිලධාරීන්ගේ තනතුරු දරන ලද්දේ බ්‍රිතාන්‍යයෙන් පැමිණි නිලධාරීන් විසිනි. ක්‍රමයෙන් මෙහි වෙනස්වීම් ඇති වෙමින් ලංකාවේම නිලධාරී මෙම තනතුරු වලට පත් කර ගැනීමත් සිදුවිය. පොලිස්පතිවරයාගෙන් පටන්ගෙන නියෝජ්‍ය පොලිස්පතිවරු, ඉන්පසු ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරුන්, හා සහකාර පොලිස් අධිකාරිවරුන් යනුවෙන් මෙම ඉහළ තලය නිර්මාණය වී තිබුණි. එක එක පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වරයා ද මෙම පොලිස් ඉහළ තලයට හා මෙහෙයවන්නන්ගේ තලයට අයිති වූවකි. මොවුන් පදනම් කරගෙන විනයානුකූල පොලීසියක් පවත්වාගෙන යාම සඳහා

ව්‍යායාමය උනන්දුවක් ඇතුව හා විශාල උත්සාහයකින් කරගෙන යන ලදී. නිදහස ලබා මුල් අවුරුදු වලදීත් එම ප්‍රයත්තය ම තවදුරටත් පවත්වාගෙන යන ලදී. පොලිසිය පිළිබඳ විශාල අර්බුදයන් පැන නැගීමට පටන් ගත්තේ සමාජයේ විවිධ ගැටලු හා ආරවුල් පැන නැගීමෙන් පසුව ය. විශේෂයෙන්ම 1956 පසු කාලයේ සමාජය තුළ විවිධ ගැටළු පිළිබඳව විශාල මතවාදයන් හා සමාජ කොටස් අතර ගැටීම් ඇතිවිය. මේවා තුළදී පොලිසිය තමන්ගෙ ක්‍රියාමාර්ගය ඔවුන් නිල වශයෙන් බැඳී සිටි ක්‍රියාමාර්ගයට අනුව කිරීම සඳහා විශාල ප්‍රයත්නයක් දරන ලද බව පෙනෙන්නට ඇත. විශේෂයෙන් ම 1958 ඇති වූ ජාතිවාදී කලබල සමයේ දී පොලිසිය තුළ තමන්ගේ රාජකාරිය පිළිබඳව ඉතා බරපතළ සාකච්ඡාවක් ඇති වූ බව මේ කාලයේදී ලියැවී ඇති පොත පතෙන් හෙළිදරව් වේ. මේ ඉහළ නිලධාරීන් අතර තමන්ගේ රාජකාරිය දේශ දේශපාලනයට යටත් නොවී හා විවිධ ජන කණ්ඩායම් වල බලපෑමට යටත් නොවී නිසි ලෙස නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා පමණක් වැය විය යුතු ය යන මතය පැවතිනි.

පොලිසිය පිළිබඳ විශාල වෙනස්කම් සිදුවීමට පටන් ගන්නේ  විශේෂයෙන් ම 1978 ව්‍යවස්ථාව ඇති වීමත් සමගගය. මෙම ව්‍යවස්ථාව තුළින් විධායක ප්‍රධානියා නීතියට ඉහළින් පිහිටවූ වීම නිසා නීතිය මත පාලනය සංකල්පය දෙදරා ගියේය. පොලිසියට නීතිය රැකීම සඳහාම යොමුවීමට ඉතා බරපතළ තර්ජනයක් වූයේ මෙම විධායක ජනාධිපති ක්‍රමය ඇති වීමෙනි. කෙලින්ම පොලිසිය කටයුතුවලට බලපෑම් කිරීමේ හැකියාව විධායක ජනාධිපතිවරයාට මෙන්ම ඔහුගේ බලය යටතේ ක්‍රියා කළ බොහෝ දෙනෙක් අතට පත්විය. දේශපාලනඥයා පොලිසියේ වැඩ කටයුතුවලට ඇඟිලි ගසනවාය යන මතය බොහෝ දුරට වර්ධනය වූයේ මේ ආකාරයටය. ඊට පසු අවුරුදු හතළිහකට වැඩි කාලයක් තුළ පොලිසිය බොහෝ තර්ජනයට භාජනය වූ සංස්ථාවක් බවට පත් විය. පොලිසියේ රාජකාරිය කිරීමට බාධාවන් දේශපාලනඥයන්ගෙන් පටන් ගත් නමුත්, පසුව එය බොහෝ දෙනෙක් අතරට පතළව ගියේය. මෙය සංස්ථාව තුළ විනය පවත්වාගෙන යාමද විශාල බාධකයක් බවට ද පත්විය. විශේෂයෙන්ම සංවිධානාත්මක අපරාධ වල යෙදෙන්නන් මෙම සංස්ථාවට නිසි ආකාරයට වැඩ කිරීමට තිබූ ඉඩකඩට විවිධ ආකාර වලින් හරස් කපන ලදී. මේ බලපෑම් වලට යටත් වූ පොලිස් නිලධාරීන් ද ඇති විය.

විශේෂයෙන්ම පොලිසිය අපරාධ පරීක්ෂණ පිළිබඳ පැවති සම්ප්‍රදායේ විශාල වෙනස්කම් සිදු වීමට පටන් ගත්තේය. සමහර අපරාධයන් පිළිබඳ පැමිණිලි ලියා ගැනීම පවා ප්‍රතික්ෂේප කරන මට්ටමක් ඇතිවීමට තරම් බලපෑම් පොලිසිය කෙරෙහි යොමු වෙන්නට පටන් ගත්තේ ය. විශේෂයෙන් ම අතුරුදහන් වීම් වැනි සිදුවීම් විශාල වශයෙන් සිදුවන කාලයක් තුළදී එම කරුණු පිළිබඳව කිසිදු හෝ පරීක්ෂණයක් කිරීම වැළැක්වීම සඳහා බොහෝ උත්සහයන් ඇතිවිය. පසුව දේශපාලන වශයෙන් පවතින අපරාධයන් එනම් දේශපාලනඥයන් සම්බන්ධ වී කරනු ලබනවා යැයි කියනු ලබන අපරාධයන් පරීක්ෂණය කිරීමට බාධා ඇති වුණා මෙන්ම, සමහර විට එම පරීක්ෂණ කල පසුත් එම පරීක්ෂණවලට ගත යුතු ක්‍රියාමාර්ගයන් ගැනීමට විශාල වශයෙන් බාධා ඇතිවිය. අද පොලිසිය පිළිබඳව පවතින තත්ත්වය මෙසේය ය. එම තත්ත්වය තුළ රටවැසියා හේතු විරහිතව අත්අඩංගුවට ගැනීමත්, පදනම් විරහිත චෝදනා වලට යොමු කිරීමත්, පුරවැසියන්ට පහරදීම් හා ඔවුන්ගේ මරණ පොලිස් ස්ථානවල සිදු කිරීමත් ආදී දේ පිළිබඳව මහා පරිමාණ සමාජය විවේචනයක් රට පුරාම වර්ධනය විය. එමෙන්ම පොලිසිය බොහෝ දුරට දූෂිත සංස්ථාවක්ය යන අදහස ද සමාජය පුරා පැතිර ගියේ ය. පොලීසියක් වනාහි නීතිය ක්‍රියාත්මක කරවා ගැනීමේ දි පවතින ඉතාම බලවත් සංස්ථාවය. පොලිසිය මත පිහිටා මිස වෙනත්  ආකාරයකින් නීතිය ක්‍රියාත්මක කරවා ගත නොහැකිය. ලංකාවේ අපරාධ නීතිය

ක්‍රියාත්මක කිරීම මුළුමනින්ම රැඳී පවතින්නේ පොලිසියේ හැකියාව දක්ෂතාවය කාර්යක්ෂම භාවය හා ප්‍රඥාගෝචරභාවය යන කරුණු මතම පමණි. එම කරුණු ඉටු කිරීමට එම සංස්ථාවට නොහැකි වේ නම් එය යම් ලංකාව තුළ රාජ්‍යයක් පවත්වාගෙන යාම හෝ ලංකාව රටක් හැටියට පැවතීමට විශාල තර්ජනයක් වෙයි. එම තර්ජනය අද ලංකාවේ පවතී.මේ අනුව ව්‍යවස්ථාවක් නිර්මාණය කරගැනීමට අවස්ථාව මෙම විශාල ගැටලුව නිරාකරණය කර ගැනීමේ අවස්ථාවක් බවට පත් කළ යුතුය. එසේ පත්කර නොගතහොත් එසේ නිර්මාණය කරගන්නා ව්‍යවස්ථාවෙන් කිසිදු සාධනීය ප්‍රතිඵලයක් නොලැබෙනු ඇත. මන්දයත් ව්‍යවස්ථාවක් උපරිම නීතිය වන අතර එම උපරිම නීතිය පවා ක්‍රියාත්මක වන්නේ නීතිය ක්‍රියාත්මක කිරීමේ සංස්ථාව තුළින් පමණක් බැවිනි. පොතක් හැටියට හෝ ලේඛනයක් ලෙස ව්‍යවස්ථාවක් හැදීමත් එම ව්‍යවස්ථාව ක්‍රියාත්මක කරවා ගැනීමත් යන්න කරුණු දෙකකි. ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන්නේ ඒවා ක්‍රියාත්මක කරන සංස්ථා ක්‍රියාත්මක වන තරමට පමණි.

ලංකාවේ දැනට පවතින තත්ත්වය එනම් විධායකය නීතිය ඉහළ සිට හෝ නීතිය නොතකා ක්‍රියා කිරීමට හැකි යන සංකල්පයත් නීතිය ක්‍රියාත්මක කිරීමට බැඳුණු පොලිස් සංස්ථාවක් පවත්වාගෙන යෑම යන කටයුත්තත් යන දෙකම එකට කිරීමට බැරිය. නීතිය ක්‍රියාත්මක කරවා ගත හැකි ආකාරයට ව්‍යවස්ථාව වෙනස් කරගත යුතුය. ව්‍යවස්ථාව නීතිය ක්‍රියා ක්‍රියාත්මක කිරීමට බාධාවක් නොවිය යුතුය. දැනට පවතින ව්‍යවස්ථාව නීතිය ක්‍රියා ක්‍රියාත්මක කරවා ගැනීමට බාධාවකි. මෙම තත්ත්වය නැති කිරීමකින් තොරව ව්‍යවස්ථා සාදා ගැනීම කිසිදු ප්‍රායෝගික වැදගත්කමක් ඇති කරුණක් නොවේ. ඇත්තෙන්ම නීතිය ක්‍රියාත්මක කර ගැනීමේ සංස්ථාවකින් තොරව ව්‍යවස්ථා හදා ගැනීම බොහෝ දුරට තව තවත් රට අගාධයට ඇද දමන හේතුවක් වනවා මිස, එම රට තුළ ස්ථාවරත්වය පවත්වාගෙන යෑමට හේතුවක් නොවනු ඇත.

## ව්‍යවස්ථාව හා සංස්කෘතිය

වර්ථමාන ලෝකයේ සංස්කෘතික හැඩගැස්ම නිර්මාණය කරන ප්‍රධාන සාධකයක් නම් එම රට තුල පවතින ව්‍යවස්ථාව පදනම් වී ඇති සමාජ මූලධර්ම හා දර්ශණවාදයයි. පසුගාමී ව්‍යවස්ථාවක් මගින් රටක සංස්කෘතිය පසු බැස්සවිය හැකි ආකාරය පිළිබඳව ලෝකයේ බොහෝ උදාහරණ ඇත. 1978 ලංකාවේ ජනරජ ව්‍යවස්ථාව වැටෙන්නේ එවනි පසුගාමී ව්‍යවස්ථා නිර්මාණයක් ලෙසය. ලංකාව තුල අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථාවක් ඇති කර ගැනීම මගින්, ලංකාවේ සංස්කෘතිය දැන් මුහුණපා ඇති පරිහාණියෙන් මුදවා ගත හැකිය. එවනි බලවත් සාධනීය සමාජ මූලධර්ම හා දර්ශණවාදයන් තුල පදනම් වූ ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීම මගින් ලාංකීය සමාජයේ සහයෝගීතාව, සමානාත්මතාවය හා සංහිඳියාව, ඇති කර ගත හැකිය. ඒ තුලින් ඇතිවන නිර්මාණශීලිත්වය තුලින් රටේ ආර්ථිකය ශක්තිමත් මෙන්ම ස්ථාවර එකක් බවටද පත් කල හැකිය. ව්‍යවස්ථා නීතිය තුලින් ඇති කර ගත හැකි සංස්කෘතිකමය වෙනස බුද්ධිමතුන් අතර සාස්ත්‍රීය ගවේශණ හා සාකච්ඡා වලට භාජනය විය යුතුය.

**ජ්‍යෙෂ්ඨ නීතිඥ බැසිල් ප්‍රනාන්දු**

ආසියානු මානව හිමිකම් කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක

## පළමු කොටස

# සංකල්පීය විග්‍රහය

# 1. සංස්කෘතිය, සංස්කෘතික අපරාධ විද්‍යාව හා සංස්කෘතික අපරාධ විද්‍යාවේ ඉතිහාසය

**එල්. සී. එම්. ද සිල්වා**

**ඒ. ඒ. එස්. ඩබ්ලිව්. පෙරේරා**

**ඒ. ඒ. කරන්නාගොඩ**

**සංස්කෘතිය හැඳින්වීම**

එදිනෙදා ව්‍යවහාරයේදී සංස්කෘතිය යන සංකල්පය යෙදෙන ආකාරයට වඩා වෙනස්ව එය සමාජ ශාස්ත්‍රවල අධ්‍යයනයට ලක් කෙරේ. සංස්කෘතියක උසස් පහත් බව සැලකිල්ලට ගෙන සාමාන්‍ය ජනතාවත්, ඇතැම් විට ජන මාධ්‍යයත් ඒ සම්බන්ධ අදහස් ඉදිරිපත් කරනු දක්නට හැකිය. එහෙත් සමාජ විද්‍යාඥයා හෝ මානව විද්‍යාඥයා සංස්කෘතිය අර්ථ දක්වන්නේ උසස් හෝ පහත් යන අදහසින් නොව විද්‍යාත්මක පදනමිනි.

සංස්කෘතිය පිළිබඳ 1951 දී ගවේශනාත්මක අධ්‍යයනයක් කළ ඒ. එල් ක්‍රොබර් (Krober) හා ක්ලයිඩ් ක්ලහොන් (Kluckhorn) යන මානව විද්‍යාඥයින් පෙන්වා දුන්නේ, එම සංකල්පයට එවකට නිර්වචන රාශියක් තිබුණු බවය. මිනිසාගේ චර්යාව කලින් ආවරණය කරගත නොහැකිය. එක් මොහොතක චිත්ත ස්වභාවය තවත් මොහොතක වෙනස් විය හැකිය. සමාජය ගැන කතා කරන විට මෙය තවත් සංකීර්ණ වේ. ඒ නිසා පුද්ගල චර්යාවේ ප්‍රතිමූර්තිය බඳු සංස්කෘතිය පිළිබඳ නිර්වචනයක් ඉදිරිපත් කිරීම පහසු කාර්යයක් නොවේ. කෙසේ නමුත් සංස්කෘතිය අලලා බොහෝ නිර්වචන පළ වී ඇත. ඒ අතර ප්‍රධාන වන්නේ ටයිලර් විසින් ඉදිරිපත් කළ නිර්වචනය වේ.

බ්‍රිතානයේ මානව විද්‍යාවේ පියා ලෙස සැළකෙන ඊ.බී. ටයිලර් තමාගේ "ප්‍රාථමික සංස්කෘතිය" යන ග්‍රන්ථයෙහි සංස්කෘතිය මෙසේ නිර්වචනය කර ඇත. "සංස්කෘතිය යනු සංකීර්ණ ඒකකයකි. එය වෙන්වෙන්ව වටහා ගත නොහැකිය. ඕනෑම ජාතියක, සංස්කෘතිය විවිධ අංගවලින් යුත් නිසා ඒ අංග එකට එක් වූ විට සංකීර්ණ වූවක් බවට පත් වේ. ටයිලර් මීළඟට සංස්කෘතියට යම් යම් විවිධ කොටස් ඇතුළත් වූ බව පවසා ඇත. දැනුම, විශ්වාස, ඇදහිලි, කලාශිල්ප , සදාචාරය, නීතිය, චාරිත්‍ර වාරිත්‍ර මින් සමහර ඒවාය. මීළඟට ටයිලර් සංස්කෘතියට අදාළ අවශේෂ අංග අතර මනුෂ්‍යයාගේ වෙනත් දක්‍ෂතා හෝ ඇති කර ගත් පුරුදු එක් කරයි. ඉහත කී දැනුම ආදී අංගවලට අමතර ව මිනිසාගේ තමන් විසින් ඇති කර ගත් පුරුදු හා දක්ෂතා ඇතිනම් ඒවා ද සංස්කෘතියට ඇතුළු වේ"[1]. මේ සියලු අංග මිනිසා විසින් පහළ කරගනු ලැබුවේ මනුෂ්‍ය සමාජයේ සාමාජිකයෙකු වශයෙනි.

ටයිලර් සංස්කෘතිය විග්‍රහ කළ අන්දම නිසා සංස්කෘතික විග්‍රහයේ ප්‍රධාන අංග තුනක් ඉස්මතු වෙනු දැක ගත හැකිය. ඉන් පළමු වැන්න කාලය පිළිබඳ හැඟීමයි. දෙවැන්න සංස්කෘතිය යනු මිනිසා විසින් ඉගෙන ගනු ලබන්නක් බවය. තම පරිසරයේ ජීවත් වන විටදී කුඩා දරුවා පවා අවට සංස්කෘතිය

[1] Binder, Amy. (2008). The Diversity of Culture www.researchgate.net/publication/270727066-Intraduction-the-Diversity-of-Culture

ඉගෙන ගනී. තෙවනුව සංස්කෘතිය අපගේ චර්යාවන් වලට අවශ්‍ය මගපෙන්වීම සිදුකරයි යන්නය. එම මඟපෙන්වීම අවිධිමත් වූ කල්හි පුද්ගලයන් තුළ අපරාධකාරී චර්යාවන් නිර්මාණය වේ.

මාග්‍රට් මීඩ්, ඒ. ඇල්. ක්‍රෝබර්, රූත් බෙනඩික්ට් "සංස්කෘතිය සමාජීය විද්‍යාවන්වල මධ්‍යගත සංකල්පය" ලෙස හඳුන්වා දී ඇත. 1940 දී රැග්ෆ් ලින්ටන් සංස්කෘතිය හඳුන්වා දී ඇත්තේ "සමාජයේ සාමාජිකයන් විසින් පවරනු ලබන, බෙදා හදාගනු ලබන, ඉගෙනගත් හැසිරීම් රටාව ලෙසය". ක්‍රෝබර් සහ ක්ලහෝන් සංස්කෘතිය ප්‍රවර්ග හතරක් ඔස්සේ පැහැදිලි කරයි. එනම්, විස්තරාත්මක නිර්වචන, ඓතිහාසික නිර්වචන, ප්‍රතිමානාත්මක නිර්වචන, මනෝවිද්‍යාත්මක නිර්වචන යනුවෙනි[2].

සංස්කෘතිය තුළ පවත්නා සුවිශේෂාංග තුනක් ලෙස අවෘත, විවෘත හා ද්‍රව්‍යාත්මක යන අංග පෙන්වාදිය හැකිය. "ආවෘත (Covert) සංස්කෘතිය යනු සංස්කෘතියක අදහස්, විශ්වාස, පුරුෂාර්ථ, ආකල්ප යනාදිය හා සම්බන්ධ වූ චර්යාවන් ය". විවෘත සංස්කෘතියෙ හි චර්යාවන් සමාජ විද්‍යානුකූලව තත්ත්වය, කාර්යයභාරය, ධර්මතා හා සංස්ථා දෙස බැලීමෙන් අවබෝධ කර ගැනීමට හැකිය. ද්‍රව්‍යමය සංස්කෘතිය යනු සංස්කෘතිය හා සම්බන්ධ වූ ද්‍රව්‍යමය දේවල් පිළිබඳ එකතු කරගත් දැනුමයි.

සංස්කෘතියෙහි පොදු කාර්යයන් ත්‍රිත්වයකි. පළමුවෙන් ම සංස්කෘතිය මනුෂ්‍යයාට තමන්ගේ පරිසරයට අනුව සකස් වන්නට ඉඩ ලබා දෙයි. දෙවනුව මනුෂ්‍යයාට අන්‍ය මනුෂ්‍යයන් හා සුවසේ ජීවත් වීමට උපාය මාර්ග හා ක්‍රම සකස් කර දෙයි. සංස්කෘතියේ තුන් වැනි කාර්යය තමා නොදන්නා ලෝකයක් ගැන මනුෂ්‍යයාට විශ්වාස හා ඇදහිලි මඟින් පිළියෙළ කිරීමයි.

සංස්කෘතිය ගැන අදහස් දැක්වීමේ දී උප සංස්කෘතිය (Sub Culture) ගැන ද සඳහන් කළ යුතුය. විශාල හෝ පුළුල් සංස්කෘතියක ජීවත් වන වෙනස් වූ මාදිලියක ජීවන රටාවක් ඇති කොටස් උප සංස්කෘතියක් ඇති අය වශයෙන් හඳුන්වයි. සමාජය තුළ පවතින කල්ලි සහ අපරාධකාරී කණ්ඩායම් තුළ විවිධ උපසංස්කෘතීන් පවතින අතර ඒවායේ සාමාජිකයින් අපරාධ සිදු කිරීමට බියක් නොදැක්වීම ඒකී සංස්කෘතියේ අංගයක් බවට පත් වී ඇත.

සංස්කෘතිය පිළිබඳ අදහස් දක්වන විට තවත් වැදගත් සංකල්පයක් වන්නේ සංස්කෘතික ලැග්ම (Cultural Lag) යන සංකල්පයයි. සංස්කෘතියෙහි සමහර අංග ඉතා වේගයෙන් වෙනස්වී වර්ධනය වන අතර, තවත් අංග වෙනස් නොවී ඒ ආකාරයෙන් ම පවතී නම්, එය සංස්කෘතික ලැග්ම ලෙස හඳුන්වයි. මෙම සංකල්පය ඉදිරිපත් කරන ලද්දේ විලියම් ඔග්බර්න් (Ogbum) නැමැති සමාජ විද්‍යාඥයා ය.

සංස්කෘතිය සම්බන්ධ තවත් වැදගත් සංකල්පයක් ලෙස සංස්කෘතික සමෝධානය (Cultural Integration) පෙන්වා දිය හැකිය. සංස්කෘතියට ඇතුළත් වන විවිධ අංගෝපාංග වන දක්ෂතා, විශ්වාස, ඇදහිලි, චාරිත්‍ර-වාරිත්‍ර, ධර්මතා හා පුරුෂාර්ථ, චර්යාවන් ආදී මේ සියල්ල සංස්කෘතියේ අවශේෂ අංග සමඟ එකිනෙකට බැඳී පවතී.

[2] Brien, M, O. (2005). "What Is Cultural About Cultural Criminology". The British Journal of Criminology (online), Oxford University Press (OUP). https://www.jstor.org/stable/23639210#metadata_info_tab_contents

සංස්කෘතික විසරණය (Diffiusion) යන සංකල්පය ද සංස්කෘතිය පිළිබඳව අදහස් දක්වන විට අවධානය යොමු කළ යුතු සංකල්පයකි. සංස්කෘතික විසරණය යනුවෙන් අදහස් කරන්නේ තමන්ට ආගන්තුක සංස්කෘතියකින් යම් යම් අංග තමන්ගේ සංස්කෘතියට පැමිණ ඒකාබද්ධ වන ආකාරය යි. සංස්කෘතික විසරණය ඇතැම් අවස්ථාවන්වල රටකට ඉතා වාසිදායක ක්‍රියාවලියක් වනු ඇත. උදාහරණයක් ලෙස ජර්මනිය, කාර්මික විප්ලවයේ සාරවත් අංග එංගලන්ත අත්දැකීම් තුළින් ගෙන තම රටේ දියුණුවට යොදා ගත්තේ විසරණයේ ප්‍රතිඵලයක් ලෙස ය.

සංස්කෘතික සම්පර්කය (Acculturation) යන සංකල්පය ද ඉතා වැදගත් ය. යම්කිසි දූර්වල සමූහයක් හෝ සමාජයක්, බලවත් සංස්කෘතියක හෝ සමාජයක බලපෑම යටතට කෙසේ හෝ ආ විට, බලවත් සංස්කෘතියේ අංග ලක්‍ෂණ දූර්වල සමාජයට බලපා ඊට එක් වෙයි. මෙය සංස්කෘතික සම්පර්කය නමින් හැඳින්වේ. විසරණයේ දී සංස්කෘතිය යම් යම් දේ ස්වේච්ඡාවෙන් ඉල්ලා ගන්නා අතර සංස්කෘතික සම්පර්කය බාහිර බලපෑමක් නිසා සිදු වේ.

නූතන සමාජයේ වාණිජකරණය නිසා සංස්කෘතිය තුළ විවිධ වෙනස්කම් සිදු වේ. බටහිර කාර්මික සමාජවල බලපෑම හේතුවෙන් අවශේෂ රටවල මේ වෙනස සිදු වන්නේ ය. සමාජයේ මේ බාහිර බලපෑම් නිසා සිදු වන සංස්කෘතික වෙනස්කම් වටහා ගත යුතුය. මන්ද බොහෝ සංස්කෘතික වෙනස්කම් අපරාධකාරී චර්යාවන් බිහිවීමට ද හේතුවන නිසා ය.

**සංස්කෘතික අපරාධ විද්‍යාව හැඳින්වීම**

සංස්කෘතික අපරාධ විද්‍යාව හරහා සංස්කෘතිය, අපරාධ සහ අපරාධ පාලන ක්‍රියාවලීන්ගේ අභිසාරීකරණය ගැන සැළකිලිමත් වේ. එම නිසාම එය සංස්කෘතික ගතිකතාවයන් සහ තරගකාරී අර්ථයෙන් නිෂ්පාදනය වන සන්දර්භය තුළ අපරාධ සහ එහි පාලනය ස්ථානගත කරයි. සංස්කෘතික අපරාධ විද්‍යාවේ විෂය කාලීන ගැටලු ගණනාවක් පසුකරයි. සංස්කෘතික අපරාධ විද්‍යාව හරහා සිදුකරනු ලබන්නේ, සංස්කෘතිය සහ සංස්කෘතික ක්‍රියාවලීන්ගේ සන්දර්භය තුළින් අපරාධ තේරුම් ගැනීමය. ඒ අනුව අපරාධ විද්‍යාව විෂය ක්ෂේත්‍රය තුළ දැකගත හැකි වැදගත් උප විෂය ක්ෂේත්‍රයක් ලෙස සංස්කෘතික අපරාධ විද්‍යාව (Cultural Criminology) දැක්විය හැකිය.

සංස්කෘතික අපරාධ විද්‍යාව සමාජ විද්‍යාව, අපරාධ විද්‍යාව හා අපරාධ යුක්තිය පිළිබඳ නැගී එන දිශානතියකි. සංස්කෘතික අපරාධ විද්‍යාව මඟින් ගවේශනය කරනු ලබන්නේ සමකාලීන සමාජ ජීවිතය තුළ සංස්කෘතික හා සාපරාධී ක්‍රියාවන්ගේ ඒකාබද්ධ වීම පිළිබඳවය. සංස්කෘතික අපරාධ විද්‍යාව නීතිවිරෝධී උපසංස්කෘතීන්ගේ ශෛලීගත රාමු හා අත්දැකීම්වල ගතිකතාවය විමර්ශනය කරයි. එමෙන්ම ජනප්‍රිය සංස්කෘතික ආකෘති සංකේතාත්මකව අපරාධකරණය කිරීම, අපරාධ හා අපරාධ පාලනය කිරීමේ ගැටලුවට මැදිහත්වීම සිදුකරයි [3].

Ferrel විසින් සංස්කෘතික අපරාධ විද්‍යාවේ ව්‍යවහාරික භාවිතය සිදුකරන ආකාරය පිළිබඳව ද අවධානය යොමුකරමින් පැහැදිලි විග්‍රහයක් සංස්කෘතික අපරාධ විද්‍යාව සම්බන්ධයෙන් සිදුකර තිබේ.

[3] Ferrell, J. (1999). Cultural Criminology. (online). Annual reviews http://www.jstor.org/stable/2235510

නිදසුනක් මඟින් මෙම අර්ථදැක්වීම පැහැදිලි කළහොත් සංස්කෘතික අපරාධ විද්‍යාඥයන් විසින් අපරාධ උප සංස්කෘතීන් සඳහා සාමාජිකයන් බඳවා ගන්නා ආකාරය, ඇඳුම් විලාසිතාවන්හි සුවිශේෂීතාවයන්, කතාබහ සිදුකරන ආකාරයෙහි සුවිශේෂීතාවයන් අධ්‍යයනය කරයි. එමෙන්ම ජනප්‍රිය රූපවාහිනී වැඩසටහන්, චිත්‍රපට, පුවත්පත් වාර්තා මඟින් අපරාධ, අපරාධකරුවන් හා අපරාධ යුක්තිය පිළිබඳ විශේෂිත ප්‍රතිරූපයන් සන්නිවේදනය කරන අතර ඒවා මහජන සංජානනයට බලපාන ආකාරය අධ්‍යයනය කරන බව මෙම චින්තකයාගේ අදහස් මඟින් පැහැදිලි වේ.

Hayward සහ Young දෙදෙනාට අනුව සංස්කෘතික අපරාධ විද්‍යාව යනු, "සංස්කෘතික සන්දර්භය තුළ අපරාධ ස්ථානගත කිරීම හා පාලනය කිරීම වේ". එනම් අපරාධ හා අපරාධ පාලන ආයතන යන ද්විත්වයම සංස්කෘතික නිර්මාණ ලෙස සැලකීමයි. Hayward and Young ගේ අදහස් මඟින් සංස්කෘතික අපරාධ විද්‍යාව සත්‍ය වශයෙන්ම නව දැනුමක් උත්පාදනය කරනවාද යන්න පිළිබඳ පැහැදිලි කරයි. සංස්කෘතිය හා අපරාධ අතර සම්බන්ධතාවය ඉස්මතු කිරීමට මෙම බුද්ධිමතුන් උත්සාහ කර තිබේ[4].

Muzzatti විසින් පෙන්වාදෙන ආකාරයට "සංස්කෘතික අපරාධ විද්‍යාව උත්සාහ කරන්නේ ගැඹුරු අසමාන ලෝකයක යථාර්ථයන් කෙරෙහි අවධානය යොමුකරමින් අපරාධමය සංසිද්ධි ඉහළට හා පහළට ගොඩනැගීමේදී බලය කෙසේ බලපායිද යන්න අවධාරණය කිරීමටය". නීති සකස් කරන්නේ කෙසේද? ඒවා කඩකරනු ලබන්නේ ඇයි? වැනි ක්‍රියාවලීන් ගැඹුරු ලෙස ඇගයුමට ලක්කරයි. ඔහුගේ අදහසට අනුව සංස්කෘතික අපරාධ විද්‍යාවේ කේන්ද්‍රීය ලක්ෂණය නම් සමාජයෙහි විවිධ මට්ටම්වල බලය ක්‍රියාත්මකවන ආකාරය විශ්ලේෂණය කිරීමයි. මෙමගින් බලය සහිත පුද්ගලයන් හා ක්‍රමයෙන් බලය හීනවන විට අපරාධවල ස්වභාවය ද වෙනස්වන බව පෙන්වා දෙයි. උදාහරණයක් වශයෙන් සමාජයෙහි ඉහළ පිළිගැනීමක් සහිත බලයක් සහිත වෘත්තීන්වල නිරතවන පිරිස සුදුකරපටි අපරාධයන්හි නිරත වේ. පහළ පන්තියෙහි පුද්ගලයන් මත්ද්‍රව්‍ය ජාවාරම, ගණිකා වෘත්තිය ආදියෙහි නිරත වේ. මේ ආකාරයට සමාජයෙහි විවිධ මට්ටම්වල අපරාධ ක්‍රියාත්මක වන ආකාරය සංස්කෘතික අපරාධ විද්‍යාව මඟින් විශ්ලේෂණය කරන බව මෙහි අදහසයි.

Wickert (2019) විසින් සංස්කෘතික අපරාධ විද්‍යාව සංස්කෘතික අධ්‍යයනයන් හා අපරාධ පිළිබඳ විවේචනාත්මක න්‍යායන් මත පදනම්ව අපරාධ පාලනය, අපගමනය හා සංසිද්ධි පිළිබඳ සංකේත මැදිහත් ක්‍රියාවලියක් ලෙස විශ්ලේෂණය කරයි. මෙම අදහස මඟින් ද සංස්කෘතික අපරාධ විද්‍යාවට සරල අර්ථදැක්වීමක් සිදුකර තිබේ. එමෙන්ම, Strawman විසින් සඳහන් කරන ආකාරයට "සංස්කෘතික අපරාධ විද්‍යාව නවෝත්පාදනය අපේක්ෂා නොකරයි. නමුත් ශාස්ත්‍රීය ඉදිරි දර්ශනයන් ගොඩනගාගැනීම, පවතින ඉදිරි දර්ශන තහවුරු කරගැනීම, ඒවාට මුහුණදීම සඳහා සමාජ න්‍යායේ නව වර්ධනයන් සමඟ ඒකාබද්ධ කිරීම, නව සමාජ, ආර්ථික යුගයක ලක්ෂණ හා අභියෝග හඳුනාගැනීම සිදුකරනු ලබයි".

[4] Ferrell, J, Hayward, K and Young, J. (2015). Cultural Criminology: An invitation. Sage publication

ජෙෆ් ෆෙරල් විසින් සඳහන් කරන ආකාරයට "සංස්කෘතික අපරාධ විද්‍යාව යනු, අපරාධ සහ අපරාධ පාලනය පිළිබඳ පවතින ගැටලු වටා තාත්වීය, උප සංස්කෘතික හා මැදිහත්වීම් පිළිබඳව අධ්‍යයනය කිරීමයි." මෙහිදී සංස්කෘතිය සහ අපරාධ අතර අන්තර් සම්බන්ධතාවය විශ්ලේෂණය කිරීම සඳහා සංස්කෘතික අපරාධ විද්‍යාත්මක ක්‍රමවේදයන් භාවිතා කරයි. එදිනෙදා ජීවිතයේ ප්‍රචණ්ඩත්වය, කෲරත්වය, වෛරය සහ නින්දාව තුළින් පිරී පවතින්නා සමාජ තල තුළ අපරාධ ව්‍යාප්තිය දක්වයි.

Keith Hayward විසින් දක්වන ආකාරයට "සංස්කෘතික අපරාධ විද්‍යාව ඔස්සේ අපරාධ අධ්‍යයනය සඳහා වූ වෙනස් න්‍යායික, ක්‍රමවේද හා මැදිහත් වීමේ ප්‍රවේශයන් පවති. එසේම අපරාධය සහ එහි පාලනය සංස්කෘතික සන්දර්භය තුළ ඒකාකාරව අධ්‍යයනය කිරීම සංස්කෘතික අපරාධ විද්‍යාව හරහා සිදුවන බව දක්වයි."

සංස්කෘතික අපරාධ විද්‍යාව යටතේදී අධ්‍යයනය කරනු ලබන්නේ, සංස්කෘතිය මගින් ජනනය කරනු ලබන අපරාධ හා අපරාධ මගින් ජනනය කරනු ලබන සංස්කෘතියයි. සංස්කෘතික අපරාධ විද්‍යාව යනු, අපරාධ සංස්කෘතිය කෙරෙහි බලපාන ආකාරය, සංස්කෘතිය අපරාධ කෙරෙහි බලපාන ආකාරය, සංස්කෘතිය අපරාධ යුක්ති ක්‍රමය කෙරෙහි බලපාන ආකාරය, සංස්කෘතිය මගින් අපරාධ පාලනය හා නිවාරණය කරන ආකාරය අධ්‍යයනය කරනු ලබන විෂය ක්ෂේත්‍රය වේ. මෙකී විෂය පථය හරහා සිදුවන්නේ විවිධ සමාජ සංසිද්ධි සහ සමාජ අවස්ථා විවේචනාත්මකව හා සන්සන්දනාත්මකව සංස්කෘතික දෘෂ්ටිකෝණයන් හරහා අධ්‍යයනයට ලක්කිරීමයි.

**සංස්කෘතික අපරාධ විද්‍යාවේ ඉතිහාසය**

සංස්කෘතික අපරාධ විද්‍යාවේ ආරම්භක ඉස්මතු වීම සිදුව ඇත්තේ, 1970 වර්ෂයේ මහා බ්‍රිතාන්‍යයේ පැවති National deviancy conference හිදී "New criminology" නමින් කෘතිය ප්‍රකාශයට පත්කිරීම සමඟ වේ. මෙය බර්මින්හැම් සංස්කෘතික පාසලෙහි විද්වතුන් විසින් එළිදැක්වූ කෘතියකි. මෙමගින් සමකාලීන බලයෙහි ස්වභාවය, සමාජ පන්තිවල සංස්කෘතික හා මතවාදී මානයන්, නීති විරෝධී උප සංස්කෘතීන්, සමාජ හා නීති පාලනය මෙහෙයවන මැදිහත් මතවාද පිළිබඳ විමර්ශනය කර ඇත. "New criminology" කෘතිය එළිදැක්වීම සමඟ සංස්කෘතික අපරාධ විද්‍යාඥයන් තුළ උපසංස්කෘතිය අධ්‍යනය කෙරෙහි උනන්දුක් ඇතිවී තිබේ. නිදසුන් වශයෙන් Hebdige (1979) විසින් රචිත "Book subculture: meaning of style", Hall and Jefferson (1976) විසින් රචිත "Resistance through Rituals", Mcrobbie (1980) විසින් රචිත "Setteling account with subcultures", Willis (1977) විසින් රචිත "Volume lerning to labour: How working class kid working class job" යන ලිපි හා ග්‍රන්ථ පෙන්වාදිය හැකිය. ඉන් අනතුරුව Jack Katz විසින් 1988 දී රචනාකළ "Seductions of crime" යන ග්‍රන්ථය මඟින් අපරාධ සිදුකිරීමේදී තත්ත්වයට විශේෂිත වූ චිත්තවේග හා සංවේදී හැඟීම් ප්‍රධාන භූමිකාවක් ඉටුකරනු ලබන බව පෙන්වාදෙයි. පසුකාලීන සංස්කෘතික අපරාධ විද්‍යාත්මක අදහස් හා න්‍යායන් කෙරෙහි මෙම අදහස් වැදගත් වී ඇත.

බ්‍රිතාන්‍ය තුළ සංස්කෘතික අපරාධ විද්‍යාවේ ආරම්භය සිදුවූ කාල වකවානුවේදීම ඇමරිකානු සමාජ විද්‍යාව මගින් සංස්කෘතික අපරාධ විද්‍යාව කෙසේ වියයුතු ද යන්න පිළිබඳ දෙවන ආරම්භයක්

ලබාදෙන ලදී. අපරාධ හා අපගමනය පිළිබඳ සංකේතාත්මක අන්තර්ක්‍රියාකාරී ප්‍රවේශය මෙහිදී හඳුන්වා දෙන ලදි. මෙකල පශ්චාත් නූතනවාදීන් විසින් ලබාදුන් බුද්ධිමය ප්‍රතිසංවිධානයන් ද සංස්කෘතික අපරාධ විද්‍යාවේ වර්ධනයට බලපා තිබේ. පශ්චාත් නූතනවාදයෙහි රාමුවල පදනම්ව සංස්කෘතික අපරාධ විද්‍යාව සමාජ විද්‍යාත්මක දෘෂ්ටි කෝණයෙන් මුල් බැසගන්නා ලදි.

ඉන් අනතුරුව සංස්කෘතික අපරාධ විද්‍යාඥයන් විසින් අපරාධකරණය කෙරෙහි මාධ්‍ය හා විවිධ විලාසිතා එනම්, මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන්, කල්ලි සාමාජිකයන්, රොක් හා රැප් කලාකරුවන්, ඡායාරූප ශිල්පීන් ආදියෙහි බලපෑම විශ්ලේෂණය කෙරෙහි අවධානය යොමුකර ඇත. Barak (1995) විසින් රචිත "Media, process, and the social construction of crime", Hewitt et al (1995) විසින් රචිත "Crime and the media:The podt modern spettacle", Anderson and Howard (1998) විසින් රචිත "Interrogating popular culture: Deviance, justice and social order", Bailey and Hale (1998) විසින් රචිත "Popular culture, crime and justice වැනි අධ්‍යයන මෙවැනි විශ්ලේෂණයන් කෙරෙහි අවධානය යොමුකර සංස්කෘතික අපරාධ විද්‍යාවේ අභිවෘද්ධිය සඳහා වැදගත් දායකත්වයක් සපයා ඇත.

ඉන් අනතුරුව විද්වතුන් විසින් ප්‍රකාශයට පත්කරන ලද ලිපි හා ග්‍රන්ථ හරහා සංස්කෘතික අපරාධ විද්‍යාව සංවර්ධනය විය. Ferrell (1999) ප්‍රකාශිත "Cultural Criminology" යන ලිපි මඟින් සංස්කෘතික අධ්‍යයනයන්, පශ්චාත් නූතන න්‍යායන්, විවේචනාත්මක න්‍යායන්, අන්තර් ක්‍රියාකාරී සමසමාජ විද්‍යාව, ජනවාර්ගික ක්‍රමවේදයන් හා මාධ්‍ය පෙළ විශ්ලේෂණන් තුළින් සංස්කෘතික අපරාධ විද්‍යාව පැහැදිලි කර තිබේ. එමෙන්ම Ferrell et al (2008) විසින් රචනා කරන ලද "Cultural Criminology an Invitation" ග්‍රන්ථය මඟින් සංස්කෘතික අපරාධ විද්‍යාවේ ඉතිහාසය, න්‍යාය, ක්‍රමවේදය හා අනාගත දිශානතිය පෙන්වාදෙයි. මෙම ග්‍රන්ථයෙහි දෙවන සංස්කරණය සම්පූර්ණයෙන්ම සංශෝධනය කර ඇති අතර එහි වර්තමාන සංස්කෘතික අපරාධ විද්‍යාඥයන් මුහුණදෙන ගැටළු, හරිත සංස්කෘතික අපරාධ විද්‍යාව පිළිබඳ නව කොටස්, ස්ත්‍රී පුරුෂ සමාජභාවයෙහි දේශපාලනය හා සංස්කෘතික අපරාධ විද්‍යාව, සංස්කෘතික අපරාධ විද්‍යාවේ පර්යේෂණ ක්‍රමවේදය යනාදී කරුණු අන්තර්ගතව ඇති අතර මෙම ශාස්ත්‍රීය ලේඛන සංස්කෘතික අපරාධ විද්‍යාවේ විෂය පථය සංවර්ධනයට විශාල දායකත්වයක් සපයා තිබේ[5].

Presdee (2002) විසින් රචනා කරන ලද Cultural Criminology and the Carnival of Crime යන වෙළුම ද සංස්කෘතික අපරාධ විද්‍යාවේ සංවර්ධනයට වැදගත් වී ඇත. Presdee (2002) විසින් මෙම වෙළුම හරහා එදිනෙදා ජීවිතය පුරා ව්‍යාප්ත වී ඇති ප්‍රචණ්ඩත්වය, කෲරත්වය, වෛරය හා නින්දාව වර්තමානයෙහි ඉහළයාම පිළිබඳ අවබෝධයක් ලබාදීමට උත්සාහගෙන ඇත. තවද නර්තන හා සංගීත සංස්කෘතීන් ජනප්‍රිය කිරීමත් සමඟම ජනප්‍රිය සංස්කෘතිය තුළ වෛරය, රිදවීම, නින්දා කිරීම, වෙළඳ භාණ්ඩීකරණය කිරීම යනාදිය ඉස්මතු වූ ආකාරය පෙන්වා දී ඇත.

[5] Larruskain, P. and Frederick, B, J. (2016). Cultural Criminology. (online). John Wiley and sons. Available from: http://www.academia.edu/6774982/culture-criminology

වර්ෂ 2000 න් පසු සංස්කෘතික අපරාධ විද්‍යාවේ පර්යේෂණ ක්‍රමවේදය ප්‍රායෝගික භාවිතය කෙරෙහි දැඩි අවධානය යොමුව තිබේ. ඒ අනුව සංස්කෘතික අපරාධ විද්‍යාඥයන් විසින් අපරාධකාරී චර්යාවල නියුතු පුද්ගලයන්ගේ සංකීර්ණ ආත්මීය කරුණු හෙළදරව් කරගැනීම සඳහා ජනවාර්ගික විද්‍යාවේ පර්යේෂණ ක්‍රම ප්‍රායෝගිකව භාවිතා කිරීමට ආරම්භ කරන ලදී. සංස්කෘතිය හා උපසංස්කෘතිය භාවිතා කරන සංඥා, සංකේත, චාරිත්‍ර වාරිත්‍ර තුළ අන්තර්ගත අපරාධ හා අපගමන චර්යාවන් පිළිබඳව අධ්‍යනය කිරීමට ජනවාර්ගික විද්‍යාවේ පර්යේෂණ ක්‍රමවේද වැදගත් වී ඇත. උදාහරණ ලෙස Ferrell (2006) විසින් රචිත “Exploration of the urban trash scrounger in Fort Worth, Texas”, Martin (2009) විසින් රචිත “Ethnography of a “chav” subculture in Britain” හා Perrone (2010) විසින් රචිත “Ethnographic account of a “club kid” subculture in New York City වැනි අධ්‍යයන ජනවාර්ගික විද්‍යාවේ පර්යේෂණ ක්‍රමවේද උපයෝගී කොටගෙන සිදුකර ඇති සංස්කෘතික අපරාධ විද්‍යාත්මක අධ්‍යයන වේ. මෙම අධ්‍යයන සංස්කෘතික අපරාධ විද්‍යාවේ අභිවෘද්ධියට හේතු වී ඇත.

එමෙන්ම “Instant ethnography” යන සංස්කෘතික අපරාධ විද්‍යාත්මක පර්යේෂණ සඳහා භාවිතා කරන පර්යේෂණ ක්‍රමවේදය ව්‍යවහාරික භාවිතය කෙරෙහි යොමු වීමද වැදගත් වේ. මෙම ක්‍රමය මගින් එදිනෙදා ජීවිතය තුළදී සිදුවන අපගමන හා අයුතු ක්‍රියා ක්ෂණිකව ග්‍රහණය කරගැනීමට නිරීක්ෂකයාට ඉඩ සලසයි. එමෙන්ම සංස්කෘතික අපරාධ විද්‍යාඥයන් ඉන් අනතුරුව දෘශ්‍ය අන්තර්ගත විශ්ලේෂණ (visual content analysis) ක්‍රමවේදය ප්‍රායෝගික භාවිතය කෙරෙහිද යොමුව ඇත. එහිදී වාර්තා චිත්‍රපට, ප්‍රස්ථාර, ඡායාරූප යනාදිය උපක්‍රම වශයෙන් භාවිතා කරයි. නිදසුන් වශයෙන් Keinth Hayward සහ Mike Presdee විසින් 2010 වර්ෂයේදී ඉදිරිපත් කළ “Anthology framing crime: Cultural criminology and image” හා Phil Carney විසින් ඉදිරිපත් කළ “Crime, punishment and the force of photographic spectacle” දැක්විය හැකිය. මෙම ක්‍රමවේදයන්හි වර්ධනය සංස්කෘතික අපරාධ විද්‍යාවේ පර්යේෂණයන් සිදුකිරීමට ඉතා වැදගත් වේ. එමගින් විෂය පථයද සංවර්ධනය වේ[6].

එමෙන්ම අධ්‍යාපනික වැඩසටහන්ද සංස්කෘතික අපරාධ විද්‍යාව සංවර්ධනය වීමට බලපා තිබේ. වර්ෂ 2012 දී යුරෝපා කොමිසම පළමු සංස්කෘතික හා ගෝලීය අපරාධ විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධි වැඩසටහන සඳහා අරමුදල් සපයා තිබේ. සංස්කෘතික හා ගෝලීය අපරාධ විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධි වැඩසටහන යනු යුරෝපීය විශ්වවිද්‍යාල හතරක විද්‍යාර්ථීන්ගේ දැනුම හා අත්දැකීම් ඒකාබද්ධ කර සිදුකල වැඩසටහනකි. එක්සත් රාජධානියෙහි කෙන්ට් විශ්වවිද්‍යාලය, ජර්මනියේ හැම්බර්ග් විශ්වවිද්‍යාලය, නෙදර්ලන්තයෙහි අට්රෙක්ට් විශ්වවිද්‍යාලය, හංගේරියාවේ ලෝරන්ඩ් විශ්වවිද්‍යාලය ඒ අතර වේ. ලොවපුරා අපරාධ යුක්ති විනිශ්චය සංවිධාන, පර්යේෂණ මධ්‍යස්ථාන හා රාජ්‍ය නොවන සංවිධාන යනාදිය ද මෙම වැඩසටහන සමඟ හවුල් වී ඇත. මේ ආකාරයට සංස්කෘතික අපරාධ විද්‍යාවේ විෂය පථය සංවර්ධනය වී ඇති ආකාරය පැහැදිලි වේ.

[6] Presdee, M. (2002). From carnival to the carnival of crime. (online). Available from: http://blogs.kent.ac.uk/culturalcriminology/files/2011/13/presdee-carnival.pdf.

## 2. සංස්කෘතික අපරාධවිද්‍යා දැනුම සමාජගත කිරීමේ වැදගත්කම

**පී. එන්. කල්හාරි**
**ටී. ඒ. ඒ. එම්. තෝලංගආරච්චි**
**එච්. කේ. එස්. ටී. විජේසේකර**

සංස්කෘතික අපරාධ විද්‍යා දැනුම සමාජගත කිරීම තුළින් සමාජයේ අපරාධ විද්‍යාත්මක දැනුම වර්ධනය වීමත් අපරාධ පාලනය කර ගැනීමටත් මනා පිටිවහලක් සපයයි. සංස්කෘතික අපරාධ විද්‍යාත්මක දැනුම සමාජගත කිරීමේ වැදගත්කම අංශ කිහිපයක් යටතේ අධ්‍යයනය කළ හැකිය. ඒ අතර, විෂයානුබද්ධ වැදගත්කම, සමාජීය වැදගත්කම, කාලීන වැදගත්කම පෙන්වා දිය හැකිය. ඒ අනුව මින් එකිනෙක අධ්‍යයනය පහසු වේ.

**සංස්කෘතික අපරාධ විද්‍යාත්මක දැනුම සමාජගත කිරීමේ විෂයානුබද්ධ වැදගත්කම හඳුනා ගැනීම.**

සංස්කෘතික අපරාධවිද්‍යා දැනුම අපරාධවිද්‍යා විෂය ක්ෂේත්‍රය තුළ වැදගත් වන සුවිශේෂී අංශයක් ලෙස හඳුනා ගත හැකිය. එකී දැනුම සමාජගත කිරීම විෂයානුබද්ධ වශයෙන් වැදගත් වන ආකාරය විෂය ක්ෂේත්‍රයේ පැතිකඩ ගණනාවක් ඔස්සේ නිරූපණය කළ හැකි වේ. ඒ අනුව මෙම දැනුම තුළින් අපරාධ විද්‍යාවේ අපරාධ ඇති වීමට බලපවත්නා සුවිශේෂ වූ හේතු සමාජය තුළ හඳුනා ගැනීමටත්, සංස්කෘතීන්ට අනුකූලව නව නීති සම්පාදනය කිරීමටත්, අපරාධ පාලනය හා නිවාරණය සඳහා ද මෙකී දැනුම විෂයානුබද්ධව සුවිශේෂී වැදගත්කමක් උසුලයි.

අපරාධ ඇති වීමට සංස්කෘතියක පවත්නා හේතුන් බලපාන අතර, එකී හේතුන් අපරාධවිද්‍යා විෂය ක්ෂේත්‍රය තුළට රැස්කර ගැනීමට හැකි වේ. එකී දැනුම සමාජගත කිරීම තුළින් අපරාධ කෙරෙහි පවත්නා සමාජාවබෝධය ඇති කිරීමට හැකිවේ. සංස්කෘතික අපරාධ විද්‍යාඥයින් බොහෝවිට මාධ්‍ය, තාක්ෂණය, ජනමාධ්‍ය කෙරෙහි අවධානය යොමු කරමින් අධ්‍යයනය සිදු කරන අතර රූපවාහිනී වැඩසටහන්, ජනප්‍රිය චිත්‍රපටි සහ පුවත්පත් වාර්තා මඟින් අපරාධ, අපරාධකරුවන් සහ අපරාධ යුක්තිය පිළිබඳව විශේෂිත ප්‍රතිරූපයක් සන්නිවේදනය කරන අතර ඒවා මහජන සංජානනයට බලපායි. ජනමාධ්‍ය හරහා ගොඩනැගෙන අපරාධ සංජානනයේ වැරදි අඩුපාඩු නිවැරදි කිරීමටත්, නව සංකල්ප හඳුන්වා දීමටත්, සංස්කෘතික අපරාධ විද්‍යාත්මකව හැකියාව ලැබේ. එහිදී නව මානයන් හඳුනා ගැනීමෙන් සංස්කෘතික අපරාධ විද්‍යා විෂය දැනුමද පුළුල් තලයකට ගෙනයාමටත් නිවැරදි විද්‍යාණුකූල දැනුම සමාජගත කිරීමටත් හැකිවේ. සංස්කෘතිය මඟින් ඇතිවන්නා වූ අපරාධමය තත්ත්වයන් හඳුනාගනිමින් සමාජගත කිරීම තුළින් සමාජය සංස්කෘතිය හේතුවෙන් ඇතිවන අපරාධ පිළිබඳව පුළුල් පරාසයක දෘෂ්ටියකින් බැලීමට යොමුවනු ඇත. ඒ අනුව අපරාධ ඇති වන්නාවූ හේතුන් කෙරෙහි සමාජය තුළ පවත්නා දැනුම පුළුල් වීමෙන් අපරාධ විද්‍යා විෂය ක්ෂේත්‍රයේ සංවර්ධනයට එය හේතු වේ. අපරාධ ඇති වීම තුළින් අපරාධකරුවන් සමාජගතවීමත්, වින්දිතයන් බිහිවීමත් සිදුවන ප්‍රධානම සමාජ ගැටලුවක් වන අතර සංස්කෘතික අපරාධ විද්‍යා දැනුම මඟින් මෙකී සමාජ ගැටළුව වෙනුවෙන් පිළියම් යෙදීමට අවශ්‍ය සංස්කෘතීන්හි නව දැනුම අපරාධ විද්‍යාව වෙනුවෙන් රැස් කරනු ලබයි.

අපරාධ විද්‍යා විෂය ක්ෂේත්‍රය තුළ වැදගත් අංශයක් වන නීති සම්පාදනය උදෙසා සංස්කෘතික අපරාධ විද්‍යා දැනුම සමාජගත කිරීම විෂයානුබද්ධව ප්‍රායෝගිකව වැදගත් වේ. සංස්කෘතීන් මත විවිධ අපරාධවල සුවිශේෂීතාවන් හඳුනා ගැනීමට හැකි වන අතර එකී සුවිශේෂීතාවන්ට අනුකූලව අපරාධ වළක්වා ගැනීම සඳහා නව නීති සකස් කිරීමට සමාජ දැනුවත්භාවය වැදගත් වේ. සමාජය විසින් සංස්කෘතික අපරාධ පිළිබඳ ඇති දැනුවත්භාවය හේතුවෙන් සංස්කෘතිය මත ඇති වන අපරාධ සඳහා නව නීති සමාජගත කිරීම පහසුවේ. සමාජ දැනුවත්භාවයෙන් තොරව එසේ නීති සකස් වුවහොත් නව නීති වෙනුවෙන් සමාජ විරෝධතාවන් මතු වීමට ඉඩ ඇත. එමගින් තවදුරටත් සංස්කෘතික ගැටුම් ඇති වන අතර අපරාධ ඇති වීමට එය හේතු වේ. නීති සම්පාදකයන් ඒ අනුව අපරාධ යුක්ති පද්ධතියේ ක්‍රියාකාරීත්වය සකස් කිරීම උදෙසා සංස්කෘතික අපරාධ විද්‍යා දැනුම සමාජගත කිරීම ඉතාමත් වැදගත් වේ.

සංස්කෘතීන් අතර පවත්නා නොයෙකුත් සිරිත් විරිත්, චාරිත්‍රවිධි, සංස්කෘතිකාංග මත අපරාධ විවිධාංගීකරණයෙන් සිදුවන අතර එකී අපරාධ පාලනය හා නිවාරණය කිරීම උදෙසා සංස්කෘතික අපරාධවිද්‍යා දැනුම සමාජගත කිරීම වැදගත් ය. නිදසුනක් වශයෙන් ඉන්දියාවේ කාන්තා හිංසන වාර්තා වීම, ස්ත්‍රීත්වය මත සිදුවන අපරාධ, ඇෆ්ගනිස්ථානය වැනි මුස්ලිම් සංස්කෘතියක් ඇති රටවල කාන්තාවන් සංස්කෘතිය තුළ වින්දිතභාවයට ලක් වීම හා ත්‍රස්තවාදය පැතිරෙන සංස්කෘතිය තුළ අපරාධ විශාල වශයෙන් සිදු වේ. මෙකී තත්ත්වය හේතුවෙන් සංස්කෘතීන්වල ඇති විශේෂතාවන් හඳුනා ගනිමින් අපරාධ පාලනය හා නිවාරණය සඳහා සුදුසු ක්‍රියාමාර්ග ඇති කිරීමට සංස්කෘතික අපරාධ විද්‍යාත්මක දැනුම සමාජගත කිරීම විෂයානුබද්ධ වශයෙන් වැදගත් වේ. සංස්කෘතික අපරාධ විද්‍යාව තුළින් ගොඩනැගෙන දැනුම අපරාධ විද්‍යා විෂය ක්ෂේත්‍රයේ සෙසු අංශවල දැනුම සංවර්ධනය කිරීම හා න්‍යායන් ගොඩනැගීමට ද මඟපෙන්වයි. ඒ අනුව සංස්කෘතික අපරාධවිද්‍යා දැනුම සමාජගත කිරීම විෂයානුබද්ධව වැදගත් බව පෙනී යයි.

**සංස්කෘතික අපරාධ විද්‍යාත්මක දැනුම සමාජගත කිරීමේ සමාජීය වැදගත්කම.**

සමාජීය වශයෙන් ගත්කල ද සංස්කෘතික අපරාධ විද්‍යාත්මක දැනුම සමාජගත කිරීම වැදගත් වේ. සංස්කෘතියක් තොරව සමාජයට පැවතිය නොහැකිය. සංස්කෘතියක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාව මානව සමාජයට පමණක් අයත් වේ . සංස්කෘතික අපරාධ විද්‍යාත්මක දැනුම සමාජගත කිරීමට හා එහි වැදගත්කම පිළිබිඹු කිරීම සඳහා, සමාජය සහ සංස්කෘතිය අතර බැඳී පවතින අංශ 03 ක ක්‍රියාකාරීත්වය වැදගත් වේ. එම අංශ 03 මෙසේය.

- අදහස් (Ideas )
- ධර්මතා (Norms )
- භෞතික සංස්කෘතිය (Material Culture )

ඉහත අංශ තුන හා බැඳී පවතින සමාජය තුළ ස්ථාපිත සමාජ සංස්ථා වල ක්‍රියාකාරීත්වය සංස්කෘතික අපරාධ විද්‍යාත්මක දැනුම සමාජගත කිරීමේ සමාජීය වැදගත්කමට ප්‍රධාන සාධකයක් බවට පත් වී ඇත. සමාජ සංස්ථා 05 කින් සමාජය නිර්මාණය වී පවතී. එනම්, පවුල් සංස්ථාව, ආගමික සංස්ථාව, ආර්ථික සංස්ථාව, දේශපාලන සංස්ථාව හා අධ්‍යාපන සංස්ථාව වේ. ඉහත සංස්ථාවල ක්‍රියාකාරීත්වය

තුළින් සංස්කෘතිමය අංග හඳුනාගත හැකිය. ඕනෑම සමාජයක් තුළ පවතින අපරාධ වර්ග, වින්දිතභාවයට පත්වන කණ්ඩායම්, අපරාධ යුක්ති ක්‍රියාපටියට අයත් ආයතන සහ අපරාධ පාලනය හා නිවාරණය සම්බන්ධ ක්‍රියාමාර්ග සංස්කෘතික දෘෂ්ටිකෝණයෙන් අධ්‍යයනය කිරීම සංස්කෘතික අපරාධ විද්‍යාව වේ. මෙහි අඩංගු සංකල්ප සංස්කෘතිය සමඟ බද්ධ කොට එම දැනුම සමාජගත කිරීම මගින් සමාජීය වශයෙන් විශාල වැදගත්කමක් ලැබී ඇත. සමාජය හා සංස්කෘතිය බැඳී පවතින හෙයින් අපරාධ වල විවිධත්වයක් ඇත. ලොව කුමන ආකාරයේ සමාජ ක්‍රමයක් ගත් කලද ඇතම් අපරාධ පවතින සංස්කෘතිය සමඟ බැඳී පවතී. නිදසුනක් ලෙස, ඉන්දියාවේ හින්දු උප සංස්කෘතිය තුළ පවතින සති පූජා චාරිත්‍රය පෙන්වාදිය හැකිය. මෙහි දක්වා සති පූජා චාරිත්‍රය, මුස්ලිම් උප සංස්කෘතියේ සිදුවන බාල වයස්කාර විවාහ ආදී චාරිත්‍ර ඒවාට ආවේණික සමාජ තුළ පරම්පරාගතව පැවත එයි. සංස්කෘතික බලපෑම මත සිදුවන චාරිත්‍රානුකූල අපරාධ තුළදී සමාජය නිහඬ පිළිවෙතක් අනුගමනය කිරීම වර්තමානයේ සුලභ කරුණක් බවට පත් වී ඇත. සංස්කෘතිය පදනම් කරගත් අපරාධ පිළිබඳ සමාජයේ ජීවත්වන සියලුම පුද්ගලයන්ගේ අවධානය යොමු කිරීම හා නිවැරදි දැනුමක් ලබා දීම සඳහා සංස්කෘතික අපරාධ විද්‍යාව සමාජගත කිරීම වර්තමානයේ සමාජීය අවශ්‍යතාවක් බවට පත් වී ඇත[7].

වින්දිතභාවය හෙවත් යම් දෙයකට ගොදුරු වීම සමාජයේ බහුලව සිදුවේ. වින්දිතභාවයේ විවිධ ප්‍රභේද පවතින නමුත් ඇතැම් විට පුද්ගලයන් ස්වාභාවික ආපදා වලින් ද වින්දිතයෙක් විය හැකිය. එසේම සමාජය තුළ ජීවත්වන පුද්ගලයන් විවිධ අපරාධ වලට ගොදුරුව වින්දිතභාවයට පත්වෙති. එහිදී බාල, මහලු, වැඩිහිටි ස්ත්‍රීන් හා පුරුෂයන් ආදී විවිධ ජන කණ්ඩායම් පිළිබඳ සංස්කෘතිමය අපරාධ දෘෂ්ටිකෝණයෙන් විමසා බැලීම වැදගත් වී ඇත. ශ්‍රී ලාංකේය සංස්කෘතියෙහි පවතින ජනවාර්ගිකත්වය මත සිදුවන වින්දිතභාවයේ විවිධත්වයක් පවතී. නිදසුනක් ලෙස, මුස්ලිම් සංස්කෘතිය තුළ චර්ම ඡේදනය සිදුවන අතර සිංහල, දමිල සංස්කෘතීන් තුළ එවැනි තත්ත්වයක් දක්නට නැත.

සමාජයේ පවතින හිරි ඔතප්ප මත එවැනි අපරාධ සැඟවීමට උත්සහ කිරීම තුළ තවදුරටත් එවැනි සාපරාධී ක්‍රියා කිරීමට අපරාධකරුවන්ට අනුබල ලැබේ. මෙහිදී සංස්කෘතිමය වශයෙන් ලැජ්ජාව, බිය වැනි සාධක මත සඟවන අපරාධ හා වින්දිතභාවය පිළිබඳ සමාජයේ ජීවත්වන පුද්ගලයන්ට සංස්කෘතික අපරාධ විද්‍යාත්මක දැනුම සමාජගත කිරීම වැදගත් වී ඇත. සමාජය තුළ මෙවැනි වාර්තා නොවන අපරාධ පිළිබඳ කතා කිරීම වර්තමානයේ අවශ්‍යතාවක් බවට පත්ව ඇත. එසේම අපරාධ යුක්ති ක්‍රියාපටිපාටියක ආයතන වන පොලීසිය, අධිකරණය, බන්ධනාගාරය හා පුනරුත්ථාපන ආයතන පිළිබඳව පවතින පුද්ගලයන්ගේ අවබෝධය අවම වේ. එසේම නීතිය මත පාලනය වන ආයතන පිළිබඳ දැනුම ක්‍රමානුකූලව සමාජගත කිරීම අවශ්‍යතාවක් වේ. වර්තමානයේ වංචනික ආයතන හේතුවෙන් මිනිසුන් බහුතරයක් පීඩාවට පත්වේ. එම ආයතන හා නීතිය පිළිබඳ නිවැරදි දැනුම සමාජගත කිරීම මගින් පුද්ගලයන් සමාජීය වශයෙන් අවබෝධයක් ලබයි. නීතිය හා ආයතන වල ව්‍යුහය, කාර්යයභාරය පිළිබඳ සංස්කෘතික වෙනස්කම් ඇතත් එම කරුණු සමාජගත කිරීම තුළ පුද්ගලයන්ගේ ආකල්ප, හැසිරීම හා චිත්තවේග පාලනය විය හැකිය. අපරාධ පාලනය හා නිවාරණය

[7]Ferrell, Jeff. (1997). Cultural Criminology. Article in Annual Review of Sociology. [Online] Available at: <https://www.researchgate.net/publication/228413107_Cultural_Criminology/link/5763a85808ae192f513e45c5/download>.

කිරිමේ දැනුම, උපසංස්කෘතීන් වලට ලබා දීම මගින් සංස්කෘතික අපරාධ විද්‍යාත්මක දැනුම සමාජය තුළ නිර්මාණය වේ. පෞද්ගලිකව තම නිවසේ ආරක්ෂාව සඳහා අපරාධ පාලන උපක්‍රම පිළිබඳ (අගුල්/තාප්ප) දැනුම ලබාදීම තුළින් සමාජයේ සොරකම්, මංකොල්ලකෑම් හා ගෙවල් බිඳුම් අවම කර ගත හැක යන්න නිදසුනක් වශයෙන් පෙන්වා දිය හැකිය.

ලොව සෑම රටකම පවතින අපරාධ, වින්දිතභාවය, අපරාධ යුක්ති ක්‍රියාපටිපාටි ක්‍රම සහ අපරාධ පාලන හා නිවාරණ ක්‍රම පිළිබඳ පුළුල් විද්‍යාත්මක දැනුමක් සෑම සමාජයක් තුළම ජීවත්වන පුද්ගලයන් අවබෝධ කර ගැනීම මඟින් සංස්කෘතික අපරාධ විද්‍යාත්මක දැනුමට සමාජීය වැදගත්කමක් ලැබීම නොඅනුමානය. අපරාධ විද්‍යාව තුළ පවතින සංකල්ප හා විද්‍යාත්මක දැනුම සංස්කෘතිමය දෘෂ්ටිකෝණයෙන් සමාජගත කිරීම මගින් එයට සමාජීය වැදගත්කමක් ආරෝපණය වේ.

**සංස්කෘතික අපරාධ විද්‍යාත්මක දැනුම සමාජගත කිරීමේ කාලීන වැදගත්කම.**

විවිධ රටවල සංස්කෘතීන් දෙස අවධානය යොමු කිරීමේදී අතීතයට සාපේක්ෂව එකී සංස්කෘතීන් තුළ අපරාධ රැල්ලක වර්ධනයක් දැකගත හැකිය. ශ්‍රී ලංකාවට ආසන්නම රට ලෙස ඉන්දියාව දෙස අවධානය යොමු කිරීමේදී ඉන්දියාව යනු, විවිධ සංස්කෘතීන් හා සමාජ වලින් සමන්විත රාජ්‍යයකි. නමුත් පුද්ගල ගෞරවය කෙලෙසීම, ලිංගිකත්වය මත පදනම්ව වෙනස් කොට සැළකීම, දෑවැදි හේතුවෙන් මරණයට පත් කිරීම,ආගමික චාරිත්‍ර මත පීඩාවන්ට ලක් කිරීම වැනි අපරාධවල අනුපාතය ඉහළ යමින් පවතී. ඒ අනුව එයට හේතු ලෙස නීති විශාරදයින් මත පළකරන්නේ සදාචාරාත්මක නොවන හා අත්තනෝමතික, කාලයක පටන් පැවත එන්නා වූ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට නීතිය මඟින් හිඩැස් ඉතිරිකොට පවතින බවයි. ඒ අනුව නීතියේ හිඩැස් ඇති කිරීමට සංස්කෘතිය හේතු සාධක වී ඇත. එසේම ඉන්දියාවේ නීති පද්ධතිය සෑම විටකම පාහේ චාර්ත්‍රානුකූල නීති වලට බලපෑම් කිරීමට සමත් වී නොමැත. ඉහත අපරාධ පාලනය හා නිවාරණයට ව්‍යවස්ථාදායක, විධායක අධිකරණය වැනි ආයතන පවා නීති වෙනස් කිරීමට හෝ සංශෝධනය කිරීමට උත්සාහ නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස අපරාධ සංඛ්‍යාව ද සැළකිය යුතු ලෙස ඉහළ යාම සිදුව ඇත.

විශේෂයෙන්ම ඉන්දියාව තුළ අනෙක් රටවලට සාපේක්ෂව කාන්තාවන්ට එරෙහි අපරාධ ඉහළ යාමක් හඳුනා ගත හැකි අතර කුල භේදය ඉතා දැඩිව ක්‍රියාත්මක වන බව පර්යේෂණ වාර්තා මඟින් අනාවරණය වේ. මේ සඳහා අන්තර්ජාතික මට්ටමෙන් පවා ගිවිසුම් හා සම්මුතීන් කිහිපයක් මෙන්ම මානව හිමිකම් සංවිධාන ද මැදිහත් ව කටයුතු කිරීමට උත්සාහ කළ ද රජය විසින් මෙවැනි අපරාධ අවම කිරීමට උත්සාහ කරන විට සංස්කෘතිය එයට සහයෝගය ලබා දීම වෙනුවට අභියෝග කරනු දැකගත හැකි වේ. ඒ අනුව සංස්කෘතිය මඟින් සම්ප්‍රදායන් හා සාරධර්ම මෙහෙයවීම හේතුවෙන් සංස්කෘතිය තුළින්ම අපරාධ බිහිවන බව හඳුනාගත හැකිය. ඒ අනුව ඉන්දියාව තුළ මෙකී සාම්ප්‍රදායික සංස්කෘතිකමය අපරාධ වැළැක්වීමේ අරමුණෙන් විවිධ නීති පවා සම්පාදනය කොට ඇත. නිදසුන් ලෙස, කුල ක්‍රමය සම්බන්ධව 1989 දී කුල හා ගෝත්‍රික හිංසාවන් වැළැක්වීමේ පනත මෙන්ම ගෘහස්ථ හිංසනය සම්බන්ධයෙන් 1960 වර්ෂයේදී දෑවැදි තහනම් කොට නීති රාශියක් ද සම්පාදනය කර ඇත. නීති අභිබවා සංස්කෘතිය ප්‍රබලව ඉස්මතු වීම නිසා මිනීමැරුම්, සියදිවි නසා ගැනීම්,ගෘහස්ථ හිංසනයන් හා ඒවා වර්ධනය මත ඒවා හදිසි අනතුරු ලෙස ඉදිරිපත් කිරීම් සුලභ වී ඇත. මෙවැනි නීතීන් ඉන්දීය ජනතාව තවමත් ඔවුන්ගේ සංස්කෘතියේ කොටසක් ලෙස භාර ගෙන නොමැත.

විශේෂයෙන් කුල ක්‍රමය තුළ කුලයෙන් පිට විවාහයක් සිදු කර ගැනීමේ දී කාන්තාව මරා දැමීම සිදුකරයි. ඒ අනුව තම ආදරණීයයන්ගේ ජීවිත විනාශ කිරීමට තරම් මිනිසුන් උන්මන්තක තත්ත්වයකට පත් කිරීමට සංස්කෘතිය ශක්ති සම්පන්න වී ඇත. විශේෂයෙන් ඉන්දියාව තුළ නීති සම්පාදනය මෙන්ම අධිකරණයේ ක්‍රියාකාරීත්වයට ද සංස්කෘතික කරුණු හේතු පාදක වේ.

ශ්‍රී ලංකාව දෙස අවධානය යොමු කිරීමේ දී ශ්‍රී ලංකාවේ අතීතයට සාපේක්ෂව සමකාලීන සමාජය තුළ සංස්කෘතිය මත පදනම්ව වෙනස් ආකාරයේ අපරාධ රටාවක් ගොඩනැඟී ඇති බව දැකගත හැකිය. සංස්කෘතිය විවිධ අවස්ථාවන් යටතේ විවිධ වෙනස්කම් වලට බඳුන් වී ඇත. ශ්‍රී ලංකාවේ සමාජ පරිවර්තනය වීමේදී සංස්කෘතිය වෙනස් වීමට බලපාන ලද ප්‍රධාන සාධක වශයෙන් යටත්විජිතකරණය, ගෝලීයකරණය හා නවීකරණය හඳුනාගත හැකි අතර ආගම හා දේශපාලන බලය ද තවත් එක් හේතුවක් විය.

1977 විවෘත ආර්ථික ප්‍රතිපත්තිය මගින් සිදු වූ සමාජ සංස්කෘතියෙහි පරිවර්තනය හේතුවෙන් නව අපරාධකාරී රටාවකින් යුතු සමාජ ක්‍රමයක් බිහි විය. විශේෂයෙන් මෙහිදි සංවිධානාත්මක අපරාධ හා කල්ලි අපරාධ වල ආරම්භය මෙන්ම මත්ද්‍රව්‍ය සම්බන්ධ අපරාධවල ප්‍රවණතාවය ඉහළ යන ලදි. 1980 වන විට සංචාරක කර්මාන්තය දියුණු වීම හා දේශපාලනික වෙනස්වීම් ලාංකේය සමාජය තුළ සංස්කෘතික වශයෙන් අපරාධ ඉහළ යාමට හේතු වී ඇත. 2009 සිවිල් යුද්ධය අවසන් වීමත් සමඟ බරපතල අපරාධ රැල්ල ක්‍රමයෙන් අඩු විය. 2014 වන විට 1998ට සාපේක්ෂව 16.3% ක අඩුවීමක් පෙන්නුම් කළ ද ලිංගික අපරාධ ක්‍රම ක්‍රමයෙන් ඉහළ ගොස් තිබේ. ඒ අනුව සමකාලීන සමාජ සංස්කෘතිය තුළ ස්ත්‍රී දූෂණ අපරාධ සමාජ ප්‍රශ්නයක් බවට පත් ව ඇත. ඊට අමතරව මත්ද්‍රව්‍ය සම්බන්ධ ගැටළු වලට මුහුණ දෙමින් පවතී. බටහිර සංස්කෘතියත්, නව තාක්ෂණයත් මෙම වෙනසට මුල පිරූ බවට හොඳම නිදසුන 2014 දී Sex යන වචනය සෙවූ ලැයිස්තුවේ ශ්‍රී ලංකාවේ නම පළමු ස්ථානය ගැනීමයි. වර්තමානය වන විට ශ්‍රී ලංකාව තුළ ලිංගිකත්වය මත අපරාධ දිනෙන් දින ඉහළ යමින් පවතී. පියා විසින් දියණිය දූෂණය,මව තම දියණිය මුදලට විකිණීම, ළමා දූෂණ ආදී ලිංගික අපරාධ රැල්ලක් වාර්තා වීම ඉහළ යමින් පවතී.

ඇතැම් රටවල ගණිකා වෘත්තිය හා ලිංගික ශ්‍රමිකයන් නීතිගත කර තිබුණ ද ශ්‍රී ලංකාව තුළ සංස්කෘතිමය හේතුමත මෙවැනි දෑ නීතිගත කිරීම තවමත් සිදු වී නොමැත. බොහෝ රටවල ගණිකා වෘත්තිය සමාජ ප්‍රශ්නයක් ලෙස සලකමින් නීතිගත කර ඇති අතර තවත් රටවල ලිංගික ශ්‍රමිකයන් ලෙස එම වෘත්තිය නීති ගත කර තිබෙනුයේ ගණිකාව යනු සමාජ නිෂ්පාදනයක් වන බවත්, අපාරධ විද්‍යාවෙහි සඳහන් වන ආකාරයට ගණිකාව යනු තවදුරටත් ගණිකාවක් නොවන බවත් වේ. මෙහිදී, ශ්‍රී ලංකාව තුළ වර්ධනය වන්නා වූ කාම අපරාධ රැල්ල සමග ලංකාවේ ද ගණිකා වෘත්තිය සම්බන්ධ කාලීන නීති සැකසීම වැදගත් වේ. සමාජයක පුද්ගලයාගේ හැසිරීම් රටාවට පැහැදිලිවම එම සමාජයේ සංස්කෘතිය බලපෑම් කරයි. එය යහපත් හෝ අයහපත් ලෙසට බලපෑම් කරන්නේද? යන්න තීරණය කරන්නේ එම සංස්කෘතියෙහි ලක්ෂණ හා එම බලපෑමට යටත් වන පුද්ගලයන්ගේ සිතිවිලි වේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ සංස්කෘතික සන්දර්භය තුළ ඉතා වින්දිත භාවයට පත්වන සමාජ කණ්ඩායමක් ලෙස සමලිංගික ප්‍රජාව හඳුන්වාදිය හැකිය. ඒ අනුව මෙම සම ලිංගික හිංසනයන් හා සමලිංගික විරෝධ සඳහා බොහෝ දුරට සංස්කෘතික ලක්ෂණ බලපා ඇති බව හඳුනාගත හැකිය. අප රටේ සංස්කෘතිය

තුළ සමලිංගිකත්වය පිළිකුල් කරන අතර ඔවුන් සමාජීය ලෙස කටයුතු කිරීමේදී විවිධ ගැටලුවලට මුහුණ දීමට සිදු වේ. ඒ අනුව සමලිංගික ප්‍රජාවට කායික හා මානසික හිරිහැර දිනෙන් දින ඉහළ යමින් පවතී. ඒ අනුව ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ සංස්කෘතීන් තුළ සමලිංගිකත්වය යනු බරපතල අපරාධයක් ලෙස සළකා ඔවුන්ට සංස්කෘතික විශ්වාස හරහා පීඩාවන් සිදු කිරීමක් දැකගත හැකිය.

ඊට අමතරව ශ්‍රී ලාංකික සංස්කෘතිය තුළ කාන්තාව වින්දිතභාවයට පත්වන අවස්ථාවන් හඳුනාගත හැකි අතර ඒ අතර ගබ්සාව ප්‍රධාන වේ. විශේෂයෙන් දරුගැබ නිරෝගී නොවීම සහ ස්ත්‍රී දූෂණයක් නිසා ගැබ් ගැනීමකට ලක්ව සමාජයේ අතරමංව සිටින ස්ත්‍රීන්ට හා දරුවන්ට දරුවකු බිහිකරන ලෙස බලපෑම් කිරීම කෙතරම් අකාරුණික ද? විශේෂයෙන් ශ්‍රී ලංකාව තුළ ආගමික සංස්කෘතික කරුණු පදනම්ව ගබ්සාවට වැට බැඳීමක්, පිළිකුල් කිරීමක් කිරීමට සිංහල සංස්කෘතිය තුළ උත්සාහ දරයි. මේ පිළිබඳව අවධානය යොමු කිරීමේදී ගණිකා වෘත්තිය තවමත් ශ්‍රී ලංකාව තුළ නීතිගත කර නොමැත. නමුත් ලොව බොහෝ රටවල් ගණිකා වෘත්තිය නීතිගත කර තිබේ. ලොව රටවල් 15කට අධික ප්‍රමාණයක් මෙය නීතිගත කොට තිබේ. සමාජය කාන්තාවට වරද පැටවීමට හුරු වී සිටි. මේ අනුව සංස්කෘතිය අපරාධකරුවන්ගේ හා වින්දිතයන්ගේ බිහිවීමට අනුබල දෙනු ලැබේ. නමුත් ලොව බොහෝ දියුණු රටවල මෙවැනි තත්ත්වයක් දැකිය නොහැකි අතර ඔවුන් ගබ්සාව නීතිගත කර කාන්තා අයිතීන් ආරක්ෂා කරමින් සංස්කෘතිය තුළින් අපරාධ බිහි වීම අවම කොට ඇත. කෙසේ වුද මේ වන විට ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී දූෂණයකට ලක්ව දරු ගැබක් දරා සිටින ස්ත්‍රීන්ට හා ජන්ම විකෘතිතා සහිත කළල දරා සිටින ස්ත්‍රීන්ට ගබ්සාවෙන් අයිතිය ලබාදුන්නද සංස්කෘතිය තුළ එය දැඩි විවේචනයට ලක්වන බව හඳුනාගත හැකිය. මේ සඳහා ආගමික බලපෑම ද බලපා ඇත.

මේවාට අමතරව ඇතැම් සංස්කෘතින් තුළ ජීවත් වන්නන් සංස්කෘතිය හරහා විවිධ ද්වාරකර්ම, චාරිත්‍ර විධි මගින් වින්දිතයින් වන බවව නොදැන සිටී. නිදසුනක් ලෙස, මුස්ලිම් සංස්කෘතියේ සුන්නත් කිරීම දැක්විය හැකිය. කාන්තාරයේ කුසුම නම් කෘතියෙහි එන වාරිස් ඩයරි සංස්කෘතිය හේතුකොටගෙන වින්දිතභාවයට පත් වේ. ඒ අනුව වර්තමානයේද මෙවැනි සංස්කෘතිය මුල් වී අපරාධ කෙතෙක් සිදුවේ ද යන්න නිශ්චිතව කිව නොහැකිය. පවුල් සංස්ථාව තුළ අපරාධ බිහි වීම වර්තමානය තුළ වැඩි ප්‍රවණතාවයක් ගනු ලබන අතර කාම අපරාධ ද බහුල වශයෙන් ඉහළ යමින් පවතී. ඒ අනුව සංස්කෘතික සෝදා පාළුවක් සිදු වෙමින් ඇත. දකුණු ආසියාතික සංස්කෘතිය ඉතා ශිෂ්ටසම්පන්න රටක් ලෙස උදම් ඇනුව ද අද සංස්කෘතිය තුළින්ම අපරාධ බිහි වනු දැකගත හැකිය[8].

ලොව සෑම රටකම කාලයට අනුරූපව නීතිය සංශෝධනය වීම්, යාවත්කාලීන වීම් දැකගත හැකි වුද ශ්‍රී ලංකාව තුළ සංස්කෘතික හේතු මත නීතිය එකතැන පල්වීමක් දැක ගත හැකි අතර මේ හරහා විශාල සමාජ පරිහානියක් ද සිදුවෙමින් පවතී. ඒ අනුව ශ්‍රී ලංකාවේ සිදුව ඇති සෑම අපරාධකම පාහේ සංස්කෘතික කාරණා ගැබ්ව පවතිනු දැකිය හැකිය. ඒ අනුව බොහෝ අපරාධ සඳහා, සංස්කෘතිය මත නීති සම්පාදනයට අපොහොසත්ව ඇත. මේ තත්වය හමුවේ ලිංගික අපරාධ වර්ධනයක් දැකගත හැකිය.

---

[8] Gale.com. (2018). Scholarly Articles on Abortion: History, Legislation & Activism.
https://www.scoopwhoop.com/inothernews/countries-with-legal-prostitution/.

සෑම විටම සංස්කෘතියක් යනු එක තැනක පල් නොවන හා පල් නොවිය යුතු දෙයක් බව පළමුව හඳුනාගත යුතුය. ඒ අනුව සංස්කෘතිය එකතැන පල් වන්නේ නම්, එම සංස්කෘතියෙහි එම සමාජයේ පැවැත්ම පිළිබඳවද ගැටළු පැන නගී. සංස්කෘතිය යන්න සෑම විටම නව අදහස් නීති හෝ බාහිර සංස්කෘතික ලක්ෂණ නිසා වෙනස්කම් වලට බඳුන් වන්නක් බව පැහැදිලිය. ඒ අනුව ශ්‍රී ලංකාව තුළ ද සංස්කෘතිය තුළින් වැට බැඳ ඇති සමාජ ප්‍රශ්න හඳුනා ගෙන ඒවාට පිළියම් යෙදීම කාලීන අවශ්‍යතාවක් වේ. එමඟින් සංස්කෘතිය මුල් වී සංස්කෘතික අපරාධ බිහිවීමේ ප්‍රවණතාවන් මඟහරවා ගැනීමට පිටිවහලක් වන අතර එය කාලීන අවශ්‍යතාවක් බව මේ අනුව ගම්‍ය වේ[9].

[9] Madubhani, I. (2016). *සමලිංගිකත්වය සහ ශ්‍රී ලංකාව තුළ එහි නෛතික භාවය.* [online] Roar.media.

## 3. සංස්කෘතික විකාශය සමඟ ඇතිවන අපරාධවල ප්‍රවණතා

**එම්. ඩී. සී. පීරිස්**

**ඊ. අයි. චාමර**

**ඩබ්. ඩී. සී. පුෂ්පකුමාර**

වර්තමානය වන විට මිනිසුන්ගෙන් බහුතරයක් ජීවත් වන්නේ කාර්මික සමාජවල ය. නමුත් දළ වශයෙන් වසර 12,000 ට පෙර බොහෝ මිනිසුන් ජීවත් වී ඇත්තේ සාපේක්ෂව කුඩා පරිමාණයේ ගෝත්‍ර සමාජවල ය. ඉන්පසුව ක්‍රම ක්‍රමයෙන් දේශගුණික තත්ත්වයන් ස්ථාවර වී ආහාර නිෂ්පාදනය, දඩයම් කිරීම, ආහාර ගැනීමේ ක්‍රම ප්‍රතිස්ථාපනය වී මානව සමාජයන්හි පරිණාමය පුළුල් වීමට පටන් ගත්හ. ස්ථාවර විශාල සමාජයන් බිහිවී කණ්ඩායම් ප්‍රසාරණයත් සමඟ මිනිසුන් ඥාතීන් තෝරාගැනීම සහ නිදහස් වීම යන ක්‍රියාවලීන් හි නිරත විය. මෙසේ සමාජය ඇති කරගන්නා අතර කාලානුරූපව වෛරය මිනිසා තුළ හටගැනීමෙන් කණ්ඩායම් විඛණ්ඩනය සිදුවිය. පසුව ආගම් ඉස්මතු වී ලොව පුරා ව්‍යාප්ත වූ අතර අද වන විට අති මහත් බහුතරයක් ඇදහිලි හා ආගම් සංස්කෘතිය මූලික කරගෙන පවතී. මෙම ආගම් බොහෝවිට දෙවිවරු හා බැඳුණු ගැඹුරු භක්තියකින් යුක්ත චාරිත්‍ර වාරිත්‍ර විදහා දක්වයි.

මෙසේ යුග ගණන් සංවර්ධනය වන සංස්කෘතිය තුළ පෞද්ගලික දේපළ ක්‍රමය පැමිණීමත් සමගම අපරාධ වර්ධනය වූවා යැයි සිතිය හැකිය. ඒ අනුව එක් පාර්ශවයක් බලවත් වූ අතර තවත් පාර්ශවයක් බල හීන විය. ඔවුන් දරිද්‍රතාවයෙන් පෙලුන අතර අධ්‍යාපන, සෞඛ්‍ය, ආර්ථික, දේශපාලන, සමාජයීය වැනි සෑම අංශයකින් ම පිරිහීමකට පත්විය. තවද බලය සහිත රාජ්‍යයන් පිහිටුවා ගන්නා ඇතැම් සමාජයන්හි පුද්ගලයන් තම රාජ්‍යයන් හා සංස්කෘතීන් වර්ධනය කර ගැනීම උදෙසා යුද්ධයන්හි නිරත වන්නට විය. මෙම බල අරගලයන් තුළදී ද බොහෝ ජන කොට්ඨාසයන් පීඩාවට පත්වූ අතර සංස්කෘතියට සාපේක්ෂව අපරාධ රැල්ල ද ඉහළ යාමක් දක්නට ලැබුණි. නූතන රාජ්‍ය සංකල්පයත්, කාර්මීකරණය, නාගරීකරණය වැනි සංකල්පයන් සමගාමීව අපරාධයන් ද සංස්කෘතීන් තුළ වර්ධනය විය. අද වනවිට නූතන තාක්ෂණය ද සංස්කෘතිය තුළ අපරාධ නිර්මාණය වීමට හේතු වී ඇත.

මිහිතලය මත වාසය කරන ජීවීන් අතරින් සංස්කෘතියක් හිමිව පවතින එකම සත්වයා වන්නේ මිනිසාය. එය මිනිසා සතුව ඇති අද්විතීය උරුමයකි. හෝමෝසේපියන් යනුවෙන් හඳුන්වනු ලබන නූතන මානවයා සමඟ සංස්කෘතිය බද්ධ වී ඇත. මෙම මානව වර්ගයාගේ පරිණාමය කවදා කෙසේ සිදුවීද? යන්න නිශ්චිතවම පෙන්වාදීමට සමත් වූවෙකු නොමැත. එසේම සංස්කෘතියේ විකාශය ද කවදා කෙසේ කොතනකදී ආරම්භවූයේද? යන්නත් මෙතෙක් නොවිසුදුණු රහසකි.

කෙසේ නමුත් සංස්කෘතිය මානව පරිණාමය සමඟ බැඳී පවතින බව නොරහසකි. නමුත් සංස්කෘතිය මානව සමාජය ආරම්භයේදී ම හටගෙන මානව පරිණාමයත් සමඟ විකාශය වූ බව පදනම් විරහිත ප්‍රකාශයකි. මානවයන් සංවර්ධිත මට්ටමට පත්වූවාට පසු සංස්කෘතිය යන සංකල්පය හෙමින් හිස ඔසවන්නට ඇතැයි විශ්වාස කෙරේ.

රාජ්‍ය සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරන විට ඒ සඳහා දීර්ඝ ඉතිහාසයක් පවතින බව පෙනේ. මූලිකව ම මානව පරිණාමයෙන් පසුව මිනිසා තම එදිනෙදා කාර්යයන් පහසු කර ගැනීම සඳහා කණ්ඩායම් ඒකරාශී වෙමින් ජීවත් වීමට උත්සාහගෙන ඇත. එහිදී ඔවුන් විසින් මෙම

සාමූහිකත්වය තුළින් ආහාර, නිවාස, ඇඳුම්, පැළඳුම්, ආරක්ෂාව, ලිංගිකත්වය වැනි විවිධ වූ අවශ්‍යතාවන් ඉටුකර ගන්නා ලදී. මෙකී සාමූහිකත්වය තුළ රාජ්‍ය ආරම්භය හට ගන්නා ලදී. මෙකී රාජ්‍ය ක්‍රමයෙන් විකාශය වන්නට විය. ගෝත්‍ර රාජ්‍ය, පෙරදිග රාජ්‍ය, ග්‍රීක රාජ්‍ය, රෝම අධිරාජ්‍ය, වැඩවසම් රාජ්‍යය, නූතන ජාතික රාජ්‍ය වශයෙන් මෙකී රාජ්‍ය විකාශය පෙන්වාදිය හැකිය. එහිදී මූලිකව ම අප විසින් ගෝත්‍ර රාජ්‍ය සංකල්පය තුළ සංස්කෘතියේ විකාශයත් සමඟ අපරාධවල පැවැති ප්‍රවණතා කෙරෙහි යම් අවබෝධයක් ලබාගත යුතුවේ[10].

**සංස්කෘතික විකාශය යුග හා බැඳි අපරාධ.**

ආරම්භක රාජ්‍ය සංකල්පය "ගෝත්‍ර රාජ සංකල්පය" වේ. මෙහිදී මෙම ගෝත්‍රිකයන් අතරින් ශක්තිමත් පුරුෂයෙකු ඔවුන්ගේ නායකයා බවට ඔවුන් පත්කරගෙන ඇත. එසේම ඇතැම් ගෝත්‍ර ඉතිහාසය කෙරෙහි අවධානය යොමු කිරිමේ දී ඇතැම් පර්යේෂකයන් විසින් ප්‍රකාශ කරනු ලබන්නේ ඇතැම් ගෝත්‍ර තුළ සිටින වයස්ගතම පුද්ගලයා ඔවුන්ගේ නායකයා බවට පත්කරගෙන ඇති බව නිරීක්ෂණය වේ. ඇතැම් අවස්ථාවල දී ගෝත්‍ර වල නායකත්වය සඳහා කාන්තාවන් පවා පත් කර ඇත. එකී සමාජයන් තුළ කාන්තාවන් හට ලැබිය යුතු ස්ථානය ලැබී ඇති බවක් ගම්‍ය වේ. මෙම ගෝත්‍ර තුළ ක්‍රමක්‍රමයෙන් ගැටුම් ඇතිවන්නට විය. එහිදී මූලිකවම ලිංගිකත්වය, ආහාර යන සාධක දෙක පදනම් කොට ගෙන විශාල වශයෙන් ගැටුම් ඇතිවිය. එසේම මුල් කාලීනව ඔවුන් විසින් මෙම ගැටුම්වලදී ආයුධ භාවිතා නොකළ අතර පසුකාලීනව ආයුධ භාවිතා කර ඇත. එහිදී ඔස්ට්‍රියාව, සැම්බියාව, චිලී ආදී රාජ්‍යයන් තුළ පසුකාලිනව කරන ලද පර්යේෂණ තුළින් ඔවුන් භාවිත කරන ලද ගල් ආයුධ කිහිපයක් හමුවී ඇත. ඒ අනුව එකී සංස්කෘතිය තුළ ආයුධ භාවිත කළ බව අනාවරණය වේ. එම තත්ත්වය තුළ ඔවුන් වැඩි වශයෙන් අපරාධවලට යොමු වී ඇත. එසේම මෙම ගෝත්‍ර අභ්‍යන්තර ගැටුම් පසුකාලීනව තව තවත් වැඩි වූ අතර මිනීමැරුම් සොරකම් වැනි අපරාධ වැඩිවිය. එසේම පසුකාලීනව ගෝත්‍ර අතර ද යම් යම් ගැටලු ඇතිවිය. එම ගෝත්‍ර අතර ගැටුම් ඉතා දරුණු ගණයේ ගැටුම් වශයෙන් පෙන්වාදිය හැකිය. මෙම ගැටුම් නිසා විශාල වශයෙන් දේපළ හා ජීවිත හානි සිදුවිය. මෙලෙස ගෝත්‍ර යුගය තුළ සිදු වූ ගැටුම් වල ප්‍රතිඵලයක් ලෙස සිදු වූ අස්ථි බිඳුම් සහිත අස්ථි කොටස් සැම්බියානු රාජ්‍ය ආශ්‍රිතව කරන ලද කැණීම් තුළින් හමු වී ඇත. එනම් මෙකී තත්වය තුල දක්නට ලැබෙනුයේ ගෝත්‍ර සංස්කෘතිය තුළ බොහෝ අපරාධ සිදුවී ඇති බවයි.

ගෝත්‍ර රාජ්‍ය ඇති වීමෙන් අනතුරුව ලෝකය ක්‍රම ක්‍රමයෙන් පෙරදිග රාජ්‍ය ක්‍රමය කෙරෙහි නැඹුරු වන්නට විය. එකී විකාශයත් සමඟ සමාජ සංස්කෘතික සාධකයන් ද වෙනස් වන්නට විය. මෙලෙසින් වෙනස් වූ සමාජ හා සංස්කෘතික සාධකයන්ට සාපේක්ෂව අපරාධ වැඩිවිය. මෙකී පෙරදිග රාජ්‍ය ක්‍රමය වෙතට මිනිසුන් පැමිණෙන විට ඔවුන්ගේ සමාජ සංස්කෘතික සාධකයන් තුළ ද යම් දියුණුවක් ඇතිවිය. එනම් මෙම වකවානුව වන විට ස්ථාවර නිවාස, රෙදිපිළි වැනි අත්‍යවශ්‍ය සාධකයන් ඔවුන් විසින්ම

[10] Ignjatović, D. (2018), Culture and crime, (PDF) Culture and crime (researchgate.net)

නිපදවා ගනිමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කර ගැනීම සඳහා උත්සහ ගෙන ඇත. එසේම මෙම අවධිය වන විට පෞද්ගලික දේපළ ක්‍රමය කෙරෙහි මොවුන්ගේ අවධානය වැඩි වන්නට විය[11].

ගෝත්‍රික යුගය තුළ පැවැති "අපි අපේ" යන සංකල්පයට එරෙහිව යමින් පෙරදිග රාජ්‍යයන් වෙත යොමු වන විට "මම මගේ" යන පදනමින් ඔවුන් ජීවත් වන්නට විය. මෙම තත්ත්වය තුළ ඇති වූ පෞද්ගලික දේපළ ක්‍රමය නිසා තවදුරටත් ඔවුන් අතර අරගල සිදුවන්නට විය. එසේම මෙම පර්යේෂකයා විසින් පවසන ආකාරයට සොරකම්, මැරකම්, මිනීමැරුම් වැනි අපරාධ වැඩිවන්නට විය. එසේම පෙරදිග අධිරාජ්‍ය ක්‍රමය වෙතට රාජ්‍ය විකාශය වන විට එහි පාලනය යම් ආකාරයක විධිමත් ස්වභාවයකට පත්වන්නට විය. එකී විධිමත් ස්වභාවය තුළ පාලක හා පාලිත වශයෙන් ප්‍රධාන වශයෙන් පන්තීන් දෙකක් ඇති විය. එකී පන්තීන් දෙක තුළ පැහැදිලි ලෙස වෙනසක් දක්නට ලැබුණි. එනම් පාලක පන්තිය ඉතාම සැපවත් ජීවිත ගතකළ අතර පාලිත පන්තිය ඉතාම පීඩාකාරි ජීවිත ගතකොට ඇත. එම තත්ත්වය තුළ පාලක පංතියට එල්ල වූ දැඩි පීඩනය ඉවසාගත නොහැකි වූ අවස්ථාවේ ඔවුන් විසින් පාලක පන්තියට එරෙහිව අපරාධ සිදු කරන්නට විය. එම තත්ත්වය තුළ සොරකම් මිනීමැරුම් වැනි අපරාධ වැඩි විය. එසේම මෙම අවධිය වන විට පාලක පන්තිය විසින් තම රාජ්‍යයන් අධිරාජ්‍යයක් බවට පත්කර ගැනීම උදෙසා ද ක්‍රියා කොට ඇත. එනම් ඔවුන් විසින් අසල්වාසී රාජ්‍යයන් වලට ආක්‍රමණ එල්ල කරන්නට විය. එකී ආක්‍රමණ තුළ බොහෝ විට සාමාන්‍ය ජනතාව වැඩි වශයෙන් පීඩා විඳින්නට විය. මෙම අවධිය තුළ පැවැති ආයුධ ලෙස දුනු, ඊතල, පොරොව, කඩුව, කිරිච්චි වැනි ආයුධ පෙන්වා දිය හැකිය. එසේම එම සංස්කෘතිය තුළ කාන්තාවට තිබූ ඉඩ ප්‍රස්ථාවන් යම්තාක් දුරකට අවම වන්නට විය. එකී තත්වය තුළ කාන්තාවන් වැඩි වශයෙන් වින්දිතභාවයට පත් විය. එම තත්ත්වය තුළ ගෘහස්ත ප්‍රචණ්ඩත්වය, ස්ත්‍රී දූෂණ, අතවර වැනි අපරාධ සමාජය තුළ උග්‍ර වන්නට විය. එනම් ඉහත උදාහරණ කෙරෙහි අවධානය යොමු කරන විට දක්නට ලැබෙන කරුණක් වන්නේ, ගෝත්‍ර රාජ්‍යන්ට සාපේක්ෂව පෙරදිග රාජ්‍ය යුගය තුළදී ද සංස්කෘතියේ පැවති දියුණු තත්ත්වය නිසා අපරාධ වැඩි වශයෙන් සිදු විය.

මිනොවන් ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසුව ග්‍රීක ශිෂ්ටාචාරය බිහිවිය[12]. ක්‍රිස්තු පූර්ව 2000 පමණ වන විට ග්‍රීක ශිෂ්ටාචාරය ආරම්භ විය. ගම් දියුණු වී නගර බිහිවූ අතර පෞර රාජ්‍යය ලෙස නගර ක්‍රමය හඳුන්වා දී ඇත.  එලෙස පෞර රාජ්‍ය ලෙස ඇතැන්ස්, ස්පාටා, කොරින්, තෙබ්ස් යනුවෙන් පැවත ඇත. මෙම රාජ්‍යයන්ගේ භූමි ප්‍රමාණය කුඩා වූ අතර ජනගහනය සීමිත විය. ගොවිතැන ප්‍රධාන වූ ආර්ථිකයක් තිබූ අතර තිරිඟු, බාර්ලි, මිදි, ඔලිව් ආදිය ප්‍රධාන විය. සත්ව පාලනය ද කෘෂි කර්මාන්තය හා බැඳී පැවත ඇත. ඉන්දියාව, චීනය, ශ්‍රී ලංකාව වැනි රටවල් සමග විදේශ සම්බන්ධතා පවත්වා ඇති අතර ප්‍රතිමා හා ගෘහ නිර්මාණ ශිල්පයෙන් පිළිබිඹු වන්නේ එකල දියුණු ශිෂ්ටාචාරයක් පැවති බවයි. " ග්ලැඩියේටර් සටන් හෙවත් මල්ලවපොර" මෙම යුගයේ පැවත ඇති අතර මෙම සටනින් බොහෝවිට ප්‍රතිවාදියකු මියයයි. ග්‍රීක ඇතන්ස් පාලනය තුළ ජනතාව පන්ති වශයෙන් කොටස් තුනකට බෙදා ඇත.

---

11 Umer. S" (2018). A brief history of human evolution: challenging Darwin's claim, https://ijae.springeropen.com/articles/10.1186/s41257-018-0014-2

12 Norenzayan, A., Shariff, A., Gervais, W., Willard, A., McNamara, R., Slingerland, E., & Henrich, J. (2016). The cultural evolution of prosocial religions. *Behavioral and Brain Sciences*.

එනම් ඇතැන්ස්හි උපත ලැබූ ඉහළ පුරවැසියන්ගෙන් සමන්විත මධ්‍යම පන්තිය, ඇතැන්ස්හි උපත නොලත් පිරිමි පුරවැසියන්ගෙන් සමන්විත වූ පංතිය, වහලුන් හෙවත් පහළ පන්තිය වශයෙනි[13].

ඇතැන්ස් හි පාලකයෙකු වූ 'ඩ්‍රැකෝ' ලිඛිත නීති සංග්‍රහයක් ස්ථාපිත කොට ඇති අතර එය ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීමට ඉවහල් විය[14]. එමෙන්ම මෙම අවධියේ දී රාජ්‍ය නිලධාරීන් විසින් සිදු කරනු ලබන දූෂණ වංචා වැළැක්වීමේ අරමුණින් මෙම ලිඛිත ව්‍යවස්ථාව සම්පාදනය කොට ඇත. තවද වහල් ව්‍යාපාරය අනුව ළමයි හා මිනිසුන් විකිණීම වැනි මිනිස් ජාවාරම ද එකල පැවති අතර වහලුන්ගේ අයිතිවාසිකම් සීමිත විය. වහලුන් නිදහස් කිරීමට සොලෙක් නැමැති පාලකයා කටයුතු කර ඇත. කාසි භාවිතය සඳහා ජනතාව හුරු කිරීමට ග්‍රීක සංස්කෘතිය ඉවහල් වී ඇත.

පැරණි රෝම අධිරාජ්‍යයට වර්තමානයේ ස්කොට්ලන්තය, මොරොක්කෝව හා යුප්‍රටීස් දක්වා වූ විශාල භූමි ප්‍රමාණයක හිමිකම් තිබී ඇත. රෝම සංස්කෘතිය තුළ වර්ධනීයම අවස්ථාව හැඳින්වීමට "රෝම අධිරාජ්‍යය" යන්න භාවිතා කරයි. පළමු අධිරාජයා වූයේ ක්‍රිස්තු පූර්ව 31 ඔගස්ටස්ය. පාලන නගරය වටා ජනජීවිත බැඳී පැවති අතර පැරණි රෝමය තුළ කොළොසියම මෙන්ම නාට්‍ය ශාලා, ගණිකා නිවාස, තැබෑරුම් පැවතුණි. මෙම යුගයේ වංශාධිපතීන් සතුව වහලුන් විශාල වශයෙන් සේවය කොට ඇති අතර ග්‍රාමීය හා නාගරික වංශාධිපතියන් යටතේ වහලුන් සේවය කොට ඇත. මෙයින් ග්‍රාමීය වහලුන්ගේ තත්ත්වය නාගරික වහලුන්ට වඩා පහළ මට්ටමක පැවතුණි.

අපරාධ සඳහා විසඳුම් ද මොවුන් සතු විය. Orestes විසින් තම මව වන Clytemnestra ඝාතනය කිරීමේ සිද්ධිය පිළිබඳව සොක්‍රටීස් විසින් අදහස් දක්වා ඇත. ඒ අනුව රාජ්‍ය කුමන්ත්‍රණ, රාජ්‍ය පැහැරගැනීම් වැනි දේශපාලන අපරාධයන් ද දැකගත හැකිය. තවද ලිංගික ආශාවන් සඳහා කාන්තාවන් යොදාගැනීම, සහෝදර සහෝදරියන් ලිංගිකව හැසිරීම, ස්ත්‍රීයට සාපේක්ෂව පුරුෂයාට සමාජයේ අධික බලතල හිමි වීම නිසා ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, හිංසනය, ලිංගික වධහිංසන ග්‍රීක හා රෝම යුග තුළ දැකගත හැකි විය.

තව ද මෙම සමාජයේ පීතෘ මූලික වූ අතර ඔහුට තම නිවස තුළ සිටින අයකු මරා දැමීමට තරම් බලය හිමිවිය. සෙනෙට් සභික Maximus විසින් ඔහුගේ පුතා මරා දැමූ බව කියවේ. මෙම සංස්කෘතිය තුළ දෙමාපියන් හෝ වෙනත් ඥාතියෙකු ඝාතනය කළ ඕනෑම අයෙකුට දඬුවම් නියම කර ඇත. ඒ අනුව දෙමාපියන් ඝාතනය වැනි අපරාධයන් ද සිදු වී ඇත.

උක්ත පරිදි ග්‍රීක හා රෝම යුගයන් පිළිබඳව සාකච්ඡා කිරීමේ දී එම යුගයන් තුළ අපරාධ ප්‍රවණතා බොහෝමයක් හඳුනාගත හැකිය. සංක්ෂිප්තයක් ලෙස සොරකම, ලිංගික හිංසන, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, රාජ්‍ය කුමන්ත්‍රණ, වෛවාහක ස්ත්‍රී දූෂණ, ව්‍යාභිචාරය, මිනීමැරුම් මෙන්න ස්පාටකස් වැනි කැරලි සහ අපරාධයන් පිළිබඳව අධ්‍යයනය කළ හැකිය. බලලෝභීත්වය, අධිරාජ්‍ය, දේශපාලනය වැනි සංකල්ප නිසා දරුණු යුද්ධ පවා ඇති විය. තව ද මෙකල තිබූ වහල් වෙළඳාම අනුව වංශාධිපතියා

[13]Norenzayan, A., Shariff, A., Gervais, W., Willard, A., McNamara, R., Slingerland, E., & Henrich, J. (2016). The cultural evolution of prosocial religions. *Behavioral and Brain Sciences*.

[14] Norenzayan, A., Shariff, A., Gervais, W., Willard, A., McNamara, R., Slingerland, E., & Henrich, J. (2016). The cultural evolution of prosocial religions. *Behavioral and Brain Sciences*.

හට වහලාගේ ජීවිතය පවා තීරණය කළ හැකි විය. වහලාට සාපෙක්ෂව කාන්තා අයිතිවාසිකම් ඉහළ මට්ටමක පැවතියත් ඇයගේ තත්ත්වය ද එතරම් යහපත් නැති බව පෙන්වාදිය යුතුය.

වැඩවසම් යුගය ලෝක සමාජ හා සංස්කෘතික විකාශයේ වැදගත් අවධියක් පසු කළ යුගයක් වශයෙන් හඳුන්වා දිය හැකිය. ක්‍රි.ව 09 ශත වර්ෂයට අයත් යුගයක් වශයෙන් ඉතිහාසඥයින් මෙය හඳුනාගනු ලබයි. වැඩවසම් යුගය යනු රජුගේ සිට පහළ ම මට්ටමේ ඉඩම් හිමියා දක්වා සියලු දෙනාම ඉඩම් භුක්තිය වෙනුවෙන් ඉටු කරන වගකීම් සමුදායක් එකට බැඳී පවතින සම්පූර්ණ සමාජ සංවිධානයකි. වැඩවසම් ක්‍රමය යුරෝපයට අමතරව විවිධ රටවල්වල විවිධ ස්වරූප වලින් ක්‍රියාත්මක වී ඇත. මේ අනුව වැඩවසම් ක්‍රමයේ පොදු ලක්ෂණ කිහිපයක් දැකගත හැකිය. ඉඩම් හිමියා හා ප්‍රවේණිදාසයා අතර වූ සබඳතාවය, ඉඩම් භුක්ති විඳීම වෙනුවට සේවය සැපයීම, ප්‍රාදේශීය පාලකයන් සතුව පෞද්ගලික හමුදාවක් සිටීම, ප්‍රවේණිදාසයා වෙනුවෙන් ඉටුකළ යුතු යුතුකම් රැසක් ඉඩම් හිමියන් සතුවීම. වැඩවසම් ක්‍රමය තුළ දී ඉඩම් හිමියා හා ප්‍රවේණි දාසයා වශයෙන් කොට්ඨාස දෙකක් වූ අතර එම සමාජයේ බලාධිකාරය දැරුවේ ඉඩම් හිමියා විසිනි. එම ඉඩම් හිමියාට අයත් සුවිසල් ඉඩම් පැවති අතර ඒවායේ ජීවත් වූයේ ප්‍රවේණිදාසයන් ය. එම ඉඩම් භුක්තිය වෙනුවෙන් ප්‍රවේණිදාසයන් ඉඩම් වල සේවය කළ යුතුව තිබුණි. ඉඩම් වල ආදායමෙන් වැඩි ප්‍රමාණයක් ඉඩම්හිමියා සතුවිය. මෙලෙස වූ යාන්ත්‍රණයක් වැඩවසම් ක්‍රමය තුළ දක්නට ලැබුණු අතර එහි සමාජයේ දුක්ඛිත තත්ත්වයක් ප්‍රවේණි දාසයන්ට උරුමව තිබුණි.

සමාජ හා සංස්කෘතික විකාශය ගත්විට වැඩවසම් ක්‍රමයක් තුළ දී එහි සෑම ක්ෂේත්‍රයකම බලය නතු කරගෙන සිටියේ ඉඩම් හිමියන්ය. ඉඩම් හිමියන් මත අධිකරණය, නීතිය, ප්‍රාදේශීය පාලනය හා දඬුවම් නියම කිරීම වැනි කාරණා සම්බන්ධයෙන් බලතල තිබුණි. දේශපාලන ක්ෂේත්‍රය තුළ රජුට වඩා බලතල ඉඩම් හිමියන් සතු විය. ඉඩම් හිමියාට විශාල ඉඩම් ප්‍රමාණයක්, සැලකිව යුතු සේවක සංඛ්‍යාවක්, මහා ධනස්කන්ධයක් මෙන්ම පෞද්ගලික හමුදාවක් ද ඔවුන් සතුව තිබුණි. ඇතැම් අවස්ථාවලදී රජු විසින් බාහිර යුද්ධ කටයුතු සඳහා ඉඩම් හිමියන්ගෙන් හමුදාව මිලට ගැනීමක් ද සිදු වී ඇත. මෙම බලය හමුවේ ප්‍රවේණිදාසයා ඉඩම් හිමියන් මත යැපෙන කොටසක් පමණක් ම විය.

ඉඩම් හිමියන් ආර්ථික වශයෙන් ඉතා බලවත් විය. ඔවුන් සතුව විශාල ධනයක් තිබුණි. ඔවුන්ගේ ඉඩම් වල ජීවත්වන ප්‍රවේණිදාසයන් දිවා රෑ ඒවායේ සේවය කළ යුතුව තිබුණි.ඉන් ලැබෙන අස්වැන්නෙන් වැඩි කොටසක් ඉඩම් හිමියාට දිය යුතුය. ආගමික ක්ෂේත්‍රයේ ද බලය රැඳී තිබුණේ ඉඩම් හිමියන් මතය. පූජක පක්ෂය නියෝජනය කරන ලද්දේ ද ඔවුන් ය. එසේ ම යාග හෝම පුද පූජා පැවැත්වීමට අවසර හිමි  වූයේ ද සමාජයේ ප්‍රභූ පැළැන්තියට පමණි. වැඩවසම් ක්‍රමය හා බැඳී අපරාධ පිළිබඳ අධ්‍යයනය තුළදී වැඩවසම් සමාජ ක්‍රමය තුළ පීඩාවට හා වින්දිතභාවයට පත් වූ පිරිසක් වශයෙන් ප්‍රවේණි දාසයන් හඳුනා ගත හැකිය. ධනේශ්වර පාලන ක්‍රමය හමුවේ ඉන් වෙහෙසට පත් වූ දුප්පත් ජනතාව ගොවි අරගලය  තුළින් ධනවාදී පාලනයට එරෙහි තම විරෝධය මතු කරන්නට විය. නමුත් එම විරෝධතා කෲර ලෙස මර්දනය කරන්නට ඉඩම් හිමියන් කටයුතු කළේ ය. නමුත් සමාජයේ බහුතරය වූයේ නිර්ධන පංතිය වූ හෙයින් ඔවුන් නැවත වරක් ක්‍රියාත්මක වෙමින් පෞද්ගලික යැපීම අඩු කිරීම ආරම්භ කළේය. ධනවාදයට එරෙහි අරගලයන්හි සුවිශේෂී ස්ථානයක් ප්‍රංශ විප්ලවයට හිමිවේ. සූරාකෑම් හා ඒකාධිපති පාලන ක්‍රමයන්ට විරුද්ධව අපරාධ රැල්ලක් සමාජය පුරා දැකගත හැකි විය. එහිදී,

ත්‍රස්තවාදය, රාජ්‍ය ත්‍රස්තවාදය, කැරලි ගැසීම්, කල්ලි අපරාධ, ත්‍රස්ත සංවිධාන, කොල්ලකෑම්, මනුෂ්‍ය ඝාතන, විප්ලව, යුද්ධය, අවි ආයුධ නිෂ්පාදනය දැකගත හැකි විය.

වැඩවසම් ක්‍රමය තුළ පැවති සමාජ ක්‍රමය අපරාධ ප්‍රවණතා වර්ධනය කිරීමෙහිලා ආභාෂය ලබාගත් බව පැහැදිලි ය. සමාජයේ පුද්ගලයාට නිසි තැන නොලැබීම හේතුකොටගෙන එම අහිමි වීම් නිසා පුද්ගලයන්ගේ නැගීසිටීම් අපරාධ මූලික කරගෙන ආරම්භ වී ඇත. මෙහි ආභාෂය සමාජය පුරා ව්‍යාප්ත වීමත් සමඟ සමාජයේ ද පුද්ගලයාට එරෙහි හා දේපල වලට එරෙහි ව තම පෞද්ගලික එදිරිවාදිකම් මත අපරාධ සිදු කිරීමට පුද්ගලයන් පෙළඹී ඇත. සමාජ සංස්කෘතික සාරධර්ම පසෙකලා අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කර ගැනීමට මිනිසුන් අපරාධ කරයි. මේ අනුව සමාජ ක්‍රමය තුළ පවතින විවිධ අඩුපාඩුකම් වලට සාපේක්ෂව සාපරාධී චර්යා ද නිරායාසයෙන් ඇතිවන බව හඳුනාගත හැකිය.

නූතන යුගය වශයෙන් සලකනු ලබන්නේ 15 සිට 18 වන සියවස දක්වා වූ කාල පරිච්ඡේදයයි. නූතන යුගයේදී විද්‍යාව, දේශපාලනය, ආගම හා දර්ශනය විශාල දියුණුවක් ලැබූ අතර එය එකල සමාජය හැඩගැස්වීමේ බලවේගයක් විය. එසේම යුරෝපීයයන් විසින් නව ගොඩබිම් සොයා ගැනීම විද්‍යාත්මක විප්ලවය හා රෙපරමාදු ප්‍රතිසංස්කරණ හේතුවෙන් විශාල තාක්ෂණික දියුණුවක් ද එකල සමාජයේ ඇති විය. වර්තමාන ලෝකයේ ප්‍රබෝධය සඳහා බොහෝ සෙයින් ඉවහල් වූ යුගයක් වශයෙන් නූතන යුගය පෙන්වාදිය හැකිය. නූතන යුගයේ පොදු ලක්ෂණ කිහිපයක් දැකගත හැකිය.

- ගෝලීයකරණය
- දර්ශන සහ චින්තන විප්ලවය
- දේශපාලන ප්‍රබෝධය
- ආර්ථික සහ සමාජ ප්‍රබෝධය
- ආගමික ප්‍රතිසංස්කරණ
- කලාව දියුණු වීම
- ප්‍රචණ්ඩත්වය වර්ධනය වීම
- කාර්මීකරණය
- ධනේශ්වර විප්ලවය

මෙහිදී විද්‍යාත්මක විප්ලවය හා කාර්මීකරණය නිසා නව සොයාගැනීම් රැසක් ඇති වූ අතර සමාජ ප්‍රබෝධයක් ද ඇතිවිය. පුද්ගලයා පිළිබඳ නව දෘෂ්ටිවාදයක් ඉදිරිපත්වීම නිසා අයිතිවාසිකම්, නිදහස, නීතිය, ප්‍රජාතන්ත්‍රවාදය හා සමානාත්මතාවය යන සංකල්ප සමාජයේ ඇති විය. එසේම වෙළඳාම මූලික කරගනිමින් පෘථිවි තලය පුරා මිනිසා සංක්‍රමණය වන්නට පටන් ගැනීම නිසා ලෝකය පුරා ආගම්, දර්ශන ව්‍යාප්ත වූවා සේම නව ගොඩබිම් සොයාගැනීම යටත්විජිත නිර්මාණය කරන්නට මඟ පෑදුවේය.

මෙලෙස නූතන යුගය සෑම සමාජයක ම දේශපාලන, ආර්ථික, සමාජයීය, ආගමික හා සංස්කෘතික අංශයන් හි ප්‍රබෝධයක් ඇති කිරීමට හේතුවක් විය[15]. නූතන යුගයේ සමාජ හා සංස්කෘතික විකාශය තුළ ඇති වූ ප්‍රබෝධය දේශපාලන ක්ෂේත්‍රය තුළ නව ගොඩබිම් සොයාගැනීමත් සමඟ යටත් විජිත සඳහා නීති පද්ධතිය හඳුන්වා දීම, අපරාධ යුක්ති පද්ධතිය නිර්මාණය වීම හා නව දේශපාලන සංකල්ප

[15] Snajdr, E.(2014).Culture and Crime, https://www.cambridge.org/core/books/abs/international-crime-and-justice/culture-and-crime/09DB96559DFA72F767680DB504A47920

හඳුන්වා දීම සිදු විය. මෙහිදී දේශපාලන ක්ෂේත්‍රය තුළ දේශපාලනික වශයෙන් සිදුකරන ලද නැගීසිටීම් ද දැකගත හැකි වේ. එයට චින්තන හා දර්ශනවාදය දැඩිව බලපාන ලදී.

ආර්ථික වශයෙන් ප්‍රබල පරිවර්තනයක් සමාජය තුළ ඇති විය. වෙළඳාම්වාදය හේතුකොටගෙන ගොඩබිම් මාර්ග හා නැව් මාර්ග හරහා වෙළඳුන් සංක්‍රමණය වීම නිසා ආගමික හා සංස්කෘතික විකාශය සිදුවිය. එසේ ම වෙනත් රටවල විදේශිකයන් පදිංචි වීම නිසා ජනවාර්ගිකත්වය, ජාතිවාදය හා ආගම්වාදය වැනි මතවාදයන් නිර්මාණය වීම සිදුවිය. නූතන යුගය තුළ ආර්ථිකය තීරණය වූයේ වත්කම් මතය. තමාට හිමි නිශ්චල හා චංචල දේපළ, වත්කම් වල මිනුම් දණ්ඩ විය. නමුත් පසුකාලයේ මුදල් හා බැංකු ක්‍රමය ආරම්භ වීම හරහා මුදල් භාවිතයට පුද්ගලයන් යොමු වූ අතර ආගමික වශයෙන් කලවම් වූ ජාතීන් හා සංස්කෘතීන් දැකගත හැකි වූ අතර ඒ හේතුවෙන් සමාජයේ පුද්ගල කණ්ඩායම් අතර බෙදුම්වාදය ව්‍යාප්ත වීම සිදු විය[16].

නූතන යුගය හා බැඳී අපරාධ ප්‍රවණතා නූතන යුගය තුළ විසංවිධානකාරී සමාජ ක්‍රමයක් නිර්මාණය කිරීමට හේතු විය. එහිදී ජනගහනය වැඩිවීම, දේපළ පිළිබඳ ආරවුල් හා අසීමිත වුවමනා නිසා පුද්ගලයා දැඩි ලෙස පීඩාවට පත්ව සිටියේය. පෙර පැවති නිදහස් සමාජ වටපිටාව හා යැපුම් ආර්ථිකය වෙනුවට සමාජයේ විරැකියාව වැඩි විය. දුප්පතුන්ගේ ප්‍රමාණය ධනවතුන්ට සාපේක්ෂව වැඩි විය. මේ හේතුවෙන් නගර පිරී ඉතිරී යන ලෙස මුඩුක්කු, පැල්පත් නිවාස බහුල විය. ඒ අනුව මෙලෙස පීඩාවට පත්වූ ජනතාව තම අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කර ගැනීමට යාමේදී විවිධ දුෂ්කරතා මතු වූ අතර එයට විකල්ප වශයෙන් ඔවුන් අපරාධකරණයට යොමු විය. එහිදී, මංකොල්ලකෑම්, මිනී මැරුම්, වංචා කිරීම්, අපරාධ කල්ලි නිර්මාණය වීම, පැහැරගැනීම්, ළමා අපයෝජන, ස්ත්‍රී දූෂණ, සොරකම, අවි ආයුධ නිෂ්පාදනය හා භාවිතය, මත්ද්‍රව්‍ය ජාවාරම හා මත්ද්‍රව්‍ය භාවිතය තාක්ෂණික අපරාධ වැනි අපරාධ වර්ධනය විය.

මේ අනුව පුද්ගලයන් ඉච්ඡාභංගත්වයට පත්වීම හා කළකිරීම නිසා අපරාධවලට යොමු වනවා මෙන්ම ඇතැම් ලාභ ප්‍රයෝජන තකා අපරාධ සිදු කරයි. මේ ආකාරයට දුගී භාවයට පත්වන පුද්ගලයන් තමාට ආවේණික වූ සංස්කෘතීන් නිර්මාණය කර ගනිමින් ඒ තුල ජීවත් වෙයි. මහා සමාජයෙන් වෙන් වන ඔවුන් පොදු ධර්මතා කඩකොට තමන් විසින්ම සකසා ගත් සංස්කෘතියට අනුගත වේ. එම නිසා පොදු ධර්මතා බණ්ඩනය වන ඕනෑම ආකාරයේ ක්‍රියාවක් සිදු කිරීම හා ඔවුන් අනුගමනය කරන ඔවුන්ගේ උප සංස්කෘතික කාරණා පිළිපැදීමත් නූතන සමාජ ක්‍රමය තුළ දැකගත හැකිය.

[16] Kenneth, B. N. (2006). New Explorations in Culture and Crime: Definitions, Theory, Method.

## 4. සංස්කෘතිය, අපරාධ පාලනය හා නිවාරණය

**එච්.එම්.ඩී. චාමරිකා**

**ජී.ඒ. ඉරෝෂණී**

**එම්. කේ. එස්. සුපුනිකා**

අපරාධ හා සම්බන්ධ සෑම සංකල්පයක ම පාහේ අධ්‍යයනයේ මූලික පරමාර්ථය වන්නේ, අපරාධ පාලනය හා නිවාරණයයි. අපරාධ පාලනය යන්න තුළින් අදහස් වන්නේ කිසියම් අපරාධයක් සිදුවීමෙන් පසු ගනු ලබන ක්‍රියාමාර්ගයන් ය. බොහෝ විට මේ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග අපරාධ යුක්ති ක්‍රියා පටිපාටිය හා සම්බන්ධ විධිමත් ක්‍රියාමාර්ගයන්ය. අපරාධ නිවාරණය යන්නෙන් අදහස් වන්නේ, යම් කිසි අපරාධයක් සිදු වීමට පෙර එය වළක්වා ගැනීමයි. එනම් වළක්වා ගැනීම යනු, සිදු නොවීමට කටයුතු සැලසීම යන්නයි. අපරාධ පාලනය හා නිවාරණය අපරාධ යුක්ති ක්‍රමයට පමණක් සීමා වන්නක් නොවන අතර සමස්ත සමාජයටම විවෘත වන්නක් වේ. මේ අයුරින් සමාජයේ පවතින අපරාධ පාලනය හා නිවරණය සඳහා පුළුල් කාර්යභාර්යක් ඉටු කරන මානව සමාජයේ අනිවාර්ය අංගයක් ලෙස සංස්කෘතිය හඳුන්වාදිය හැකි ය. ලන්ඩනයේ Barnet සහ Southgate විශ්ව විද්‍යාලයේ මානව විද්‍යාඥයෙකු වන Cristina De Rossi ට අනුව "සංස්කෘතිය යන්නට ආගම, ආහාර, අඳින පළඳින ආකාරය, භාෂාව, විවාහය, සංගීතය, හරි හෝ වැරදි ලෙස විශ්වාස කරන දෑ, ඉඳ ගන්නා ආකාරය, ආගන්තුකයන්ට සත්කාර කරන ආකාරය සහ තවත් මිලියනයක් දෑ සංස්කෘතියට ඇතුළත්ය"[17]. මේ අනුව සංස්කෘතිය යනු සමාජයක් තුළ එකතුව පවතින අනේකවිධ අංගෝපාංග රාශියක එකතුවක් ලෙස සැලකිය හැකිය. අපරාධ පාලනය හා නිවාරණය සඳහා නෛතිකමය වශයෙන් බොහෝ ක්‍රියාමාර්ගයන් පැවතුන ද සමාජය තුළ දිනෙන් දිනම අපරාධ සිදුවීම් ඉහළ යනු ලැබේ. මේ තුළ සමාජයේ අපරාධ බිය ඉහළ යන අතර ඒ හේතුවෙන් අතීතයේ පටන් පැවති අවිධිමත් අපරාධ පාලන නිවාරණ ක්‍රම පිළිබඳ සමාජය තුළ පුද්ගලයින් නූතනය වන විටත් සැලකිලිමත් වනු ලැබේ.

සමාජයක ක්‍රියාත්මක වන සංස්කෘතිය සහ සමාජ සම්මතයන් යනු, නිශ්චිත සංස්කෘතික හෝ සමාජ කණ්ඩායමක් තුළ පවතින නීති හෝ අපේක්ෂාවන් ය. සංස්කෘතික අගනාකම් තුළ යෝග්‍ය නොවන හා නුසුදුසු හැසිරීම් පිළිබඳ සමාජ සම්මතයන් ලබාදීම සිදු කරනු ලබයි. එම සංස්කෘතික හා ඊට අදාල සමාජ සම්මතයන් සමාජයක් තුළ පවතින්නේ සියලු දෙනා ම ඒ සඳහා අනුගත වීමට කැමතිය, යන විශ්වාසය මතවේ. සමාජමය වශයෙන් අප්‍රසාදයට හෝ දඬුවමට ලක්වේ යැයි යන ආකල්පය සහ ඒ තුළ ඇති වන වරදකාරී හැඟීම් හේතුවෙන් පුද්ගලයින් සමාජ සම්මතයන් උල්ලංඝණය කිරීමට පසුබට වේ. නූතනයේ ක්‍රියාත්මක වන අයුරින් අපරාධ පාලනය හා නිවාරණය සඳහා පැහැදිළි හා නිශ්චිත අපරාධ යුක්ති ක්‍රියා පටිපාටියක ක්‍රියාකාරීත්වයක් අතීත සමාජයේ නොවූ අතර අන් අය තමා පීඩාවට පත් කරවන පුද්ගල හැසිරීම් නියාමනය සඳහා සමාජ පාලන ක්‍රම සෑම සමාජ ක්‍රමයකම යොදා ගන්නට විය. සෑම සමාජයක ම පුද්ගලයින් අපරාධ පාලනය හා නිවාරණය පිළිබඳ සවිඥානික වන අතර එය විධිමත් හා අවිධිමත් ලෙස දෙයාකාර වේ. නීතිය හෝ සංස්කෘතිය මගින් හෝ සම්මත කර ගන්නා ලද

[17] Zimmermann, K. A., (2017, July 13). *What is Culture*. livescience.https://www.livescience.com

ක්‍රියාවන් ධර්මතා වන අතර, සමාජයේ ක්‍රියාත්මක වන සංස්කෘතිය තුළ සාවද්‍ය ලෙස සම්මත කර ගන්නා ක්‍රියා තහංචි වේ. මෙම ක්‍රියාවන් සමාජය තුළ පවත්නා සංස්කෘතිය අනුව වෙනස් වුවද ඒවාහි පොදු ලක්ෂණ ද හඳුනාගත හැකිය. නූතන සමාජයේ කුඩාම සමාජ ඒකකය වන්නේ පවුලයි. ඕනෑම පුද්ගලයෙකු අයත්වන සමාජයේ පවත්නා සමාජ ක්‍රමයට හා සංස්කෘතියට අනුව හැඩ ගැසීමේ ආරම්භය සිදු වන්නේ පවුල තුළිනි. පවුල හා සම්බන්ධ ප්‍රධානම සංස්කෘතිකාංගයක් ලෙස විවාහය හඳුනාගත හැකි ය. ස්ත්‍රී දූෂණ, ළමා අපයෝජන වැනි අපරාධයන් නිවාරණයේ මූලික කාර්යය ඉටු කරන්නේ පවුල මගිනි. පවුල තුළම ගොඩනගා ගන්නා රීතීන් හා සීමාවන් මෙහිදි වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ සිංහල බෞද්ධ පවුල් සංස්කෘතියේ ගෞරවය ආරක්ෂා කිරීම, අතීතයේ සිටම පැවත එන සංස්කෘතික ධර්මතාවකි. නිදසුනක් ලෙස, මුලින්ම කාන්තාවක් නීතී රීතී වලට යටත් වන්නේ පවුල තුළින් වන අතර පවුල විසින් කාන්තාව කෙරෙහි යොමු කරන අවධානය පවුලේ ප්‍රධාන රාජකාරියක් වේ. සංස්කෘතියට අනුව සමාජානුයෝජනයට ලක් වීමේ දී හැසිරීම ස්වභාවිකව ම නියාමනයට ලක් කරනු ලැබේ.

බහු සංස්කෘතික සමාජ ක්‍රමයක් පවතින ශ්‍රී ලංකාවේ ආගම් කිහිපයකට අයත් ජනතාව ජීවත් වේ. පුද්ගලයන්ගේ ප්‍රධානම සංස්කෘතිකාංගයක් වන්නේ ආගමයි. අපරාධ නිවාරණයේ ප්‍රමුඛ කාර්යභාර්යයක් ආගම මගින් සිදුකරන අතර පුද්ගල අභ්‍යන්තරයේ ආත්ම දමනය කිරීමක් ආගම මගින් ඇති කරයි. වනචාරී ලෙස ජීවත් වූ මිනිසා සත්ව ලෝකයෙන් වෙන් කොට හඳුනා ගැනීමටත් සාමකාමී හා සදාචාරවත් හැසිරීම් ගොඩ නැංවීමටත් ආගම මගින් පුළුල් කාර්යභාර්යක් ඉටු කරයි. බුදු දහමට අනුව දඬුවම සම්බන්ධයෙන් පවතින විශ්වාසයක් වන්නේ, 'කර්ම විපාක හා පුනර්භවයයි' පංචශීල ප්‍රතිපත්තිය බෞද්ධයෙකුගේ මූලික හැසිරීම් පද්ධතිය වන අතර ඊට විරුද්ධව යම් පුද්ගලයෙකු ක්‍රියා කරයි නම් කර්මය තුළින් නිසි දඬුවම් ලබා දෙන බව බෞද්ධ විශ්වාසයයි. හින්දු, කතෝලික, මුස්ලිම් ආදි වශයෙන් පවත්නා අනෙකුත් ආගම්හි ද සහජීවනය, එක්සත් බව, සාමකාමී බව ආදිය කුඩා කල සිටම ආගමික සංස්කෘතිකානුකූලව හුරු කරනු ලැබේ. විශේෂයෙන් කුඩා කළ සිටම දහම් අධ්‍යාපනය ලබා දීම තුළ පුද්ගල හැසිරීම් පාලනයේ නියාමකයා වශයෙන් ආගම ක්‍රියා කරනු ලැබේ. ඒ අනුව නිවැරදි සමාජානුයෝජනය, සදාචාර අධ්‍යාපනය, මූලික අවශ්‍යතා ඉටුවන සාධාරණ සමාජයක්, මානසික දුර්වලතා පිළිබඳ අවබෝධයක් ලබාදී අපගාමී පෞරුෂත්වයන් වෙනස් කිරීම සහ මනුෂ්‍යභාවයේ අගය වටහා දීම තුළින් අපරාධ නිවාරණය කෙරෙහි ආගම මගින් මහත් පරිචයක් දරනු ලැබේ.

සංස්කෘතික ගති ලක්ෂණ හා භාවිතයන් අනුගමනය කිරීමේ දී මිනිසුන් දැනුවත්ව හෝ නොදැනුවත්ව ඔවුන්ගේ සංස්කෘතියට අනුව ජීවත් වන අතරම නීතිගරුක අයුරින් හැසිරීම පවත්වා ගැනීමට පුහුණුවක් නිරායාසයෙන් ම ලබනු ලැබේ. මිනිසාට සමාජය තුළ නීතියෙන් සහ සංස්කෘතියෙන් බැහැරව කටයුතු කිරීමට නොහැකිය. මිනිසාගේ නීතිගරුක හැසිරීම් සහතික කිරීම සඳහා ජීවිත කාලය පුරාවටම සිදු කරන සංස්කෘතික ක්‍රියාකාරකම්හි ඵලදායිතාව වැදගත් වේ. පුද්ගලයින් අපරාධ සඳහා යොමු වීමට මානසික වශයෙන් පවතින දුර්වලතාවන් හේතු වනු ලැබේ. සංස්කෘතික අඟනාකම් තුළ පවතින්නා වූ ලලිත කලාවන්, සාහිත්‍යයන්, සෞන්දර්යාත්මක භාවිතයන් සහ සංස්කෘතියක් තුළ දක්නට ලැබෙන විවිධාකාර විනෝදාස්වාදයන් පුද්ගල මානසිකත්වයන්හි ආතතිය කළමනාකරණය සඳහා උපයෝගාවක්

වනු ලැබේ. මේ තුළ මානසික වශයෙන් හැසිරීම පාලනය කිරීමක් සිදුවනු ලැබේ. මේ ලෙස පවතින සංස්කෘතිය සමකාලීන සමාජයේ සෑම සමාජ කොට්ඨාසයකම පාහේ අපරාධ පාලන නිවාරණ කාරකයක් වන බව සමස්ත සමාජය කෙරෙහි අවධානය යොමු කිරීම තුළ හඳුනාගත හැකිය.

සමකාලීන සමාජය සංස්කෘතික වශයෙන් විවිධත්වයක් උසුලන අතර, දියුණු සංස්කෘතික විවිධත්වය විවිධ ඓතිහාසික හා සමාජ ක්‍රියාවලින්හි ප්‍රතිඵලයක් විය හැකිය. මෙම විවිධත්වය අපරාධ යුක්ති පද්ධතිය ක්‍රියාකාරීභාවයට මෙන්ම කාර්යක්ෂමභාවයට ද බලපානු ලබයි. මෙම සංස්කෘතික විවිධත්වයත්වය හා ඒ තුළින් පැන නගින්නා වූ අපරාධ සඳහා හේතු සාධක වූ ඓතිහාසික සංසිද්ධීන් ත්‍රිත්වයකි[18].

- 15 වන සියවසේදී ආරම්භ වූ ස්වදේශික ජනපදකරණය
- අප්‍රිකාව හා ආසියාව තුළ යුරෝපීය යටත් විජිතකරණය
- දෙවන ලෝක යුද්ධයෙන් පසුව සිදු වූ සංක්‍රමණ

මේ තුළ සිදු වූ සංස්කෘතික විවිධත්වය අපරාධ සඳහා හේතු වී ඇත. 15 වන සියවස තුළ යුරෝපීයන් ආරම්භ කල යුරෝපීය ජනපදකරණ ක්‍රියාවලිය හා යටත්විජිතකරණය හේතුවෙන් ලෝකය පුරා විවිධ ප්‍රදේශවල ස්වදේශික ජනතාවගේ සංස්කෘතිය හා යුක්ති පද්ධතිය විනාශ වීම හා වෙනත් රටවලට සංක්‍රමණිකයින් ගලායාම නිසා ජනගහනයේ විවිධාංගීකරණ, සංස්කෘතික විවිධතා හා අපරාධ වර්ධනය විය. කැනඩාව, ඇමරිකාව, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය වැනි රටවල සිදු වූ යටත් යටත්විජිතකරණ ක්‍රියාවලිය හේතුවෙන් ජනතාවගේ ජීවිතවල වෙනස්කම් සිදු වූ අතර සෑම අපරාධයකටම යම් ආකාරයකට සංස්කෘතිය බලපෑම් කරනු ලබන බවත් එකී සංස්කෘතිය විසින්ම එම අපරාධ මැඩලීම සඳහා විවිධාකාර වූ ක්‍රමෝපායන් අනුගමනය කරනු ලබන බවත් ලෝකයට අවබෝධ විය. මෙකී තත්තත්වය යටතේ ජාත්‍යන්තර ප්‍රජාවගේ හා බටහිර ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයේ අවධානය වැඩි වශයෙන් යොමු වූයේ අපරාධ පාලනය, නිවාරණය හා සංස්කෘතිය වෙතය.

වර්තමානයේ දී ස්ත්‍රී-පුරුෂභාවය විකෘති කිරීම්, විවිධ විවාහ සම්ප්‍රදාය පදනම් කරගත් වෙනස් හැසිරීම් හා සම්බන්ධ අපරාධ ජාත්‍යන්තර මානව හිමිකම් හා මාධ්‍ය වාර්තාවන්හි අරමුණ වී ඇත. එසේම සංස්කෘතිය, අපරාධ පාලනය හා නිවාරණය සමඟ සම්බන්ධ කිරීමට මානව හිමිකම් සංවිධාන උත්සාහ දරණ අතර සංස්කෘතියේ වැදගත්කම හා සංස්කෘතිය හා අපරාධ නිවාරණය අතර අන්තර් ක්‍රියාකාරීත්වය කෙරෙහි අවධානය යොමු වී ඇත.

ලොව පුරා විසිරී පවතින විවිධ ලක්ෂණ දරණ සංස්කෘතීන් වෙත අවධානය යොමු කිරීමේ දී පෙනී යන වැදගත් කරුණක් වන්නේ එකී සංස්කෘතීන්හි ගැබ් ව පවතින සංස්කෘතික කාරණා හේතුවෙන් අපරාධ පැනනැගී ඇති බවත්, ඇතැම් සංස්කෘතීන් විසින්ම එම අපරාධ නිවාරණය සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇති බවත්ය. අපරාධ පාලනය හා නිවාරණයෙහි සංස්කෘතිකමය වශයෙන් පිළිගත හැකි ක්‍රමවේදයක් මේ සෑම රටකම පාහේ දැකිය හැකිය. සංස්කෘතිය, අපරාධ පාලනය හා

[18] Ozbilgin, M. F., & Syed, J. (2010). *Managing Cultural Diversity In Asia*. https://www.researchgate.net/publication/220028561

නිවාරණය පිළිබඳව අදහස් දක්වන විවිධ පර්යේෂකයන් ප්‍රකාශ කරන්නේ "ප්‍රජා විඥානය සංස්කෘතික කණ්ඩායම් වල ගනුදෙනු ශක්තිමත් කිරීම, ඒකාබද්ධ කිරීම් වලින් මිනිසුන් එකට බැඳී සිටීම සිදු වන විට අපරාධ අවම මට්ටමකට පත් කළ හැකි බවයි. සංස්කෘතිය, අපරාධ පාලනය සහ නිවාරණය නයිජීරියානු ප්‍රජාව ඇසුරින් මැනවින් හඳුනාගත හැකිය. එම ප්‍රජාව තුළ සාපරාධී හැසිරීම් නිවාරණය හා පාලනය කිරීම් සඳහා ඥාති සබඳතා හා පුළුල් පවුල් පද්ධතියක් නිර්මාණය කිරීමට සෑම විටම කටයුතු කරනු ලබයි. ඔවුන් අයත් සංස්කෘතික කණ්ඩායම තුළ එම කණ්ඩායමේ නායකයා බොහෝ විට වැඩිමහල් පිරිමි පුද්ගලයෙක් වන අතර ඔහු ආදර්ශමත් චරිතයක් වී ප්‍රජාවේ අන් අයට ආදර්ශයක් සපයයි. එමඟින් එකී සංස්කෘතික කණ්ඩායම බලාපොරොත්තු වන්නේ ප්‍රජාව තුළින් මතු විය හැකි අපරාධකාරී චර්යාවන් පාලනය හා නිවාරණය කිරීම වේ.

නැගෙනහිර නයිජීරියාවේ ඉග්බෝ (Igbo) සංස්කෘතික ජන කොට්ඨාශ තුළ සෑම පෙළපත් පද්ධතියක්ම භෞමික වශයෙන් ඥාතීන් පදනම් කරගත් පවුල් වලින් සමන්විත වේ. සෑම පවුල් ඒකකයක්ම ආර්ථික වශයෙන් ස්වාධීන කුටුම්බයකින් සමන්විත වන අතර සෑම නිවසක්ම නිවසේ ප්‍රධානියාගේ බලය පිළිගෙන ඇත. මෙම නායකයාට චාරිත්‍ර වාරිත්‍ර, සදාචාරාත්මක අයිතිවාසිකම් හා නීතිමය බැඳීම් පවතී. මේ චාරිත්‍ර වාරිත්‍ර සමාජීය හා නෛතික කාරණාවන්ගෙන් මිදී අපගාමී චරිත ලක්ෂණ පෙන්නුම් කරන සාමාජිකයන්ගේ සුභ සාධනය සඳහා ප්‍රජාවේ නායකයා කටයුතු කරයි. මෙම ප්‍රජාව අපරාධ පාලනය කිරීමේ නිවැරදිම ක්‍රමය ලෙස සලකනු ලබන්නේ ආගම වේ. මොවුන්ගේ සංස්කෘතිය තුළ ආගම අනිවාර්ය අංගයක් වන අතර ඒ හරහා පුද්ගල ජීවිතයේ සෑම හැසිරීමක්ම පාලනය කර අපරාධ මතු වීමට ඇති ඉඩකඩ අවම කරන බව විශ්වාස කරනු ලබයි[19].

ඩුර්කයිම් ආගම සලකන ලද්දේ පූජනීය දේවල් වලට සාපේක්ෂව විශ්වාසයන් හා පිළිවෙත් ඒකාබද්ධ කිරීමේ පද්ධතියක් ලෙස ය. විශ්වාසයන් සහ භාවිතයන් සදාචාරාත්මක ප්‍රජාවක් තුළට එකතු වන අතර ආගම අන්‍යෝන්‍ය බැඳීම් ඇතිකර නීතිරීති ස්ථාපිත කිරීමෙන් අපරාධ නිවාරණය සිදුකරනු ලබයි. ඩුර්කයිම් ප්‍රකාශ කරනුයේ යුක්තිය, අව්‍යාජභාවය හා යහපත්භාවය පිළිබඳ මූලධර්ම හෝ ශික්ෂා පද පෞද්ගලිකව හෝ ප්‍රසිද්ධියේ ඉගැන්විය යුතු බව හා එසේ නොමැති වුවහොත් අපරාධ සිදු වී මානව වර්ගයා සෝචනීය තත්ත්වයකට පත් වන බවයි. ආගම පුද්ගලයාගේ සංස්කෘතිය හා පවුල් සබඳතා පාලනය කරන බවත්, ආගම යන්නෙන් අදහස් කරනු ලබන්නේම සාමූහිකත්වය බවත්, අප්‍රිකානු සමාජය අවධාරණය කරයි. එසේ අවධාරණය කරනු ලබන්නේ ආගම තුළින් පුද්ගල සංස්කෘතිය හා වටිනාකම් නීත්‍යානුකූල කරන අතර, අන් පුද්ගලයන් ප්‍රිය කළ යුතු පුද්ගලයෙකු නිර්මාණය වන හෙයිනි.

එසේම අප්‍රිකානු කලාපීය සංස්කෘතිය තුළ "ශාප'' (Cursed) ඉතා ප්‍රබල අපරාධ නිවාරණ කාරකයක් වශයෙන් හඳුනාගත හැකිය. මිනිසුන් සමාජ නීතිරීති ගරු නොකර බිණ්ඩනය කළහොත් ශාපයකට ලක්වේය යන විශ්වාසය තුළ අපරාධ නිවාරණයක් සංස්කෘතිය තුළ සිදු වන බව විශ්වාස කරයි. ඔවුන් ශාපයන්ට බිය වූයේ සංස්කෘතික හා සමාජ නීති රීති කඩ කිරීම හා පැහැර හැරීම හේතුවෙන් අසනීප, හදිසි මරණ හෝ වෙනත් බියක් ඇතිවේ යැයි යන විශ්වාසය මතය. එසේම මෙම සමාජය තුළ

[19] Ayuk., & Achu, A. (2013). traditional methods of crime control and community security in odukpani Local government area of cross river state. *IOSR Journal Of Humanities And Social Science (IOSR-JHSS).* Volume 14. P.P 61-66, www.Iosrjournals.Org

භාවිතයට ගැනෙන තවත් අපරාධ පාලන ක්‍රමවේදයක් වන්නේ ඔවුන් ජීවත් වන විවිධ ප්‍රජාවන්හි පොලිසිය ලෙස ක්‍රියාකරන සුපරීක්ෂාකාරී කණ්ඩායම් රඳවා තැබීමය. ඒ හරහා අපරාධ මැඩ පැවැත්වීමට හා දඩුවම් ලබා දීමට කටයුතු කරනු ලබයි. අප්‍රිකානු සංස්කෘතිය තුළ අපරාධ පාලනය හා නිවාරණය සඳහා වැදගත් කාර්යයක් Ekpri Àkàtà යන තනතුර විසින් සිදු කරනු ලබයි. මෙම තනතුර විසින් තම සංස්කෘතික සදාචාරාත්මක පාරිශුද්ධභාවය පවත්වා ගැනීම පිළිබඳ සැළකිළිමත් වේ. මෙම තනතුර අයත් පුද්ගලයා ආත්මය ලෙස සලකන අතර එමගින් සමාජය තුළ සිදු වූ ඕනෑම ආකාරයක අපරාධ හා අපකීර්ති පිළිබඳ සොයා බලා අපරාධ සිදුකරන පුද්ගලයින් හෙළිදරව් කිරීම හා ඔවුන් නිවැරදි කිරීම්වලට ලක් කිරීම සිදු කරයි[20].

එකී තත්ත්වය ආසියානු කලාපය වෙත ගමන් කිරීමේදී දක්නට ලැබෙන්නේ, දකුණු ආසියානු කලාපය ජනවාර්ගික, දේශපාලන හා භාෂාමය වශයෙන් ඛණ්ඩනය වී සිටිය ද මෙම කලාපයේ ජනතාව පොදු සංස්කෘතික හා සදාචාරාත්මක දෘෂ්ටියක් මගින් එකතු වී ඇත. සංගීතය, නැටුම්, චාරිත්‍ර වාරිත්‍ර, පරමාදර්ශ ආදිය මෙම කලාපය තුළ සමානාත්මතාවක් උසුලයි. විශේෂයෙන් දකුණු ආසියාතික රටවල සංස්කෘතිය අපරාධ පාලනය හා නිවාරණය පිළිබඳ අධ්‍යයනයේ දී ජනවාර්ගික බෙදීම් හා ආගම් දෙස අවධානය යොමු කළ යුතුය. මෙම කලාපයේ ඇති විශාලතම සංස්කෘතික රටාවක් වන්නේ සමානාත්මතා පරමාදර්ශය සහ කුල පද්ධති අතර වෙනස ය. සමානාත්මතා පරමාදර්ශය යනු, සෑම කෙනෙකුටම සමාන වටිනාකමක් ඇති අතර කිසිවකු අන් අයකුට වඩා උසස් ලෙස උපත නොලබන බවයි. කුල ක්‍රමය මීට ප්‍රතිවිරුද්ධ අදහසක් ලබා දෙන අතර ඉන් උපතේදීම මිනිස්සුන්ට සමාජ ස්ථාවරත්වයක් හිමිවිය. විශේෂයෙන්ම ඉන්දියාවේ කුල අර්බුදය සමාජ ධුරාවලියක් ලෙස පවතින අතර මිනිසුන්ගේ ජීවිත වලට මෙම කුල ක්‍රමය හා ආගමික සංස්කෘතිය බලපෑමක් එල්ල කරන ලදී. දකුණු ආසියානු සමාජයට ආවේණික සමාජ හා සංස්කෘතික ලක්ෂණවලින් සමන්විත වන අතර අනෙක් අතට යටත්විජිතකරණය හා ගෝලීයකරණය නිසා ඇති වූ ගතික ලක්ෂණ වලින් සමන්විත වීම නිසා සමාජ සංස්කෘතික ද්විරූපතාවක් මෙම කලාපයෙන් පෙන්නුම් කරයි.

දකුණු ආසියානු ප්‍රජාව තම සංස්කෘතිකමය කාරණා හේතුවෙන් වින්දිතභාවයට පත්වන බව දක්වන එක්සත් ජාතීන්ගේ සංවිධානය ගෘහස්ථ හිංසනය, ලිංගික හිංසනය පිළිබඳ ජනවාර්ගික විශේෂිත ලේඛන වලට අනුව 2017 වසරේ දකුණු ආසියාතික කාන්තාවන් 208 කගේ නියැදියකින් 21%ක් තම සමීප සහකරු අතින් ශාරීරික හා මානසික හිංසනයට මුහුණ දී ඇත්තේ ද, දකුණු ආසියාතික කාන්තාවන් 1577කගේ නියැදියකින් 20%ක් ගෘහස්ථ හිංසනයට හා ලිංගික හිංසනයට ලක් වී ඇත්තේ ද මෙම සංස්කෘතික සාධක හේතුවෙන්ය[21].

කාන්තාවන් හා දැරියන් ඇඳුම් පැළඳුම් භාවිතයේදී හා පිරිමි පාර්ශවයන් සමග ගනුදෙනු කිරීමේදී සංස්කෘතිකමය වශයෙන් විවිධ නීතිරීති පනවා ඇත. තම ශරීරය නිරාවරණය වන පරිදි ඇඳුම් භාවිතා කිරීම නොකළ යුතු බවත්, එසේ සිදු කිරීමෙන් සමාජයේ අනවශ්‍ය අවධානයට පාත්‍ර වීම අවම කිරීම

[20] Ayuk., & Achu, A. (2013). traditional methods of crime control and community security in odukpani Local government area of cross river state. *IOSR Journal Of Humanities And Social Science (IOSR-JHSS).* Volume 14. P.P 61-66, www.Iosrjournals.Org
[21] Asian pacific institute. (2017). *Fact sheet Domestic and Sexual Violence in south asian Communities.* https://www.api-gbv.org/resources/dvfactsheet-southasian

මගින් ස්ත්‍රී දූෂණ හා ලිංගික අපයෝජන නිවාරණ වේ යැයි අපේක්ෂා කරනු ලැබේ. නමුත් මෙම රටවල කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය, ගෞරව ඝාතන (Honor Killing), දැවැදි අපරාධ ආදිය වර්ධනය වී ඇත්තේ ද ඔවුන්ටම ආවේණික සංස්කෘතිකමය කාරණා හේතු කොට ගෙන වේ[22]. 1980 ජුනි මාසයේ දී පිලිපීනයේ කාන්තා නීතිඥ සංගමය මගින් දකුණු ආසියාවේ ඉදිරිපත් වූ වාර්තා සලකා බලා වෙනස් කොට සැලකීමේ නීතියක් මෙම රටවල නැති බවත් එය සිදුවන්නේ නීති මගින් නොව සංස්කෘතිය මගින් බවත්, සංස්කෘතිය මගින් අපරාධ පාලනය හා නිවාරණය මුවාවෙන් අපරාධ සඳහා මග පෙන්වන බවත් දැක්වීය.

ඉන්දියාව, පාකිස්ථානය ආදී රටවල වැඩි වශයෙන් පවුලේ ගෞරවය උදෙසා ඝාතන සිදු වන නමුත් එය සංස්කෘතිකමය වශයෙන් අපරාධ පාලනය හා නිවාරණය සඳහා ඉවහල් වන බවට තර්කයක් එකී සංස්කෘතිය අනුගමනය කරන්නෝ ගෙන එති. 2020 වසර තුළ පමණක් පන්ජාබ් පොලිස් වාර්තාවලට අනුව කාන්තාවන් 237ක් ගෞරව ඝාතනයට ලක්වී ඇති අතර ඔවුන් එකී තත්ත්වය සාධාරණීකරණය කරන්නේ තම සංස්කෘතියට අනුව පවුලේ සාමාජිකයන්ගේ කැමැත්තට විරුද්ධව විවාහ වීම හෝ කුලයෙන් බැහැරව විවාහ වීම අපරාධයක් බවත් එවැනි අපරාධ සමාජය තුළ සිදු නොවීම සඳහා මෙවැනි ඝාතන සිදුකරන බවත් ය[23]. එසේම ඉන්දියාවේ Khap Panchayath යන ආයතනය හරහා මෙම සංස්කෘතිය බණ්ඩනයට එරෙහිව ගෞරව ඝාතන සිදු කරනු ලබන අතර ඉන්දීය රජය විසින් 2011දී නීති කෙටුම්පත් හරහා "Khap Panchayath" යන ආයතනය තහනම් කර ඇත.

එසේම හවායි ජාතිකයන් එකිනෙකා අතර සමඟිය ඇතිකර ගැනීමට විවෘත ගැටුම්වලින් වැළකීම සඳහා වූ සමාජ අන්තර් ක්‍රියා ශෛලීන් භාවිතා කරයි. එය (Ho'oponopono) "අඛණ්ඩ මනාපය" ලෙස හඳුන්වන අතර එම ක්‍රියාවලිය ක්‍රියාත්මක වන්නේ පවුලක් තුළ සුළු වශයෙන් ඇතිවන ගැටුම්, අපරාධ හා සමාජ ප්‍රශ්න දක්වා වර්ධනය වීමට පෙර එම අපරාධ පළමු අදියරේදීම එනම් පවුල තුළදීම නිවාරණය කර ගැනීමට ය[24].

මෙකී තත්ත්වය ඇමෙරිකාව ආදී සංවර්ධිත රටවල් වෙත ගමන් කිරීමේ දී වෙනස් ආකාරයක් හඳුනාගත හැකිය. එනම් ආසියාතික හා අප්‍රිකානු රටවලට සාපේක්ෂව දියුණු සංස්කෘතියක් හිමි ඇමෙරිකාව ආදී රටවල අපරාධ පාලනය හා නිවාරණය සඳහා භාවිතා කරනු ලබන්නේ විධිමත් හා කාර්යක්ෂම ක්‍රමෝපායන්ය[25].

මේ ආකාරයට විවිධ සංස්කෘතීන්ට අයත් විවිධ රටවල හා කලාපයන් තුළ තම සංස්කෘතින්ට ආවේණික අපරාධ නිවාරණ ක්‍රියාවලිය හැඩ ගැසී ඇති ආකාරය අවබෝධ කරගත හැකි අතර ඇතැම් අවස්ථාවල අපරාධ නිවාරණය සමඟ අපරාධ පාලනය ද ක්‍රියාත්මක වී තිබේ. අපරාධයක් සිදු වූවාට පසුව අපරාධ

---

[22] Niaz, U. (2003). Violence Against women in south Asia countries. *Arch Women's Ment Health* P.179 - 184. DOI 10.1007/s00737-003-0171-9

[23] Government of the Punjab. (2011-2020). *Honor killing reported Cases*. https://punjabpolice.gov.pk/honour-killings

[24] Cottino, A. (2008). Crime Prevention and Control : Western beliefs vs. traditional leagel practices. *International Review of the red cross*. Volume 90. http://international -review-icrc.org

[25] Weil, M. J,. & Lee, H. (2004). Cultural Considerations in understanding family violence among asian american pacific islander families. *Journal of Community Health Nursing*. Volum 21;4. doi:10.1207/s15327655jchn2104_2

යුක්ති පද්ධතිය සමග සිදුවන ක්‍රියාවලිය එනම් අපරාධ පාලනය විෂයෙහි සංස්කෘතිය මඟින් ඇති කරනු ලබන බලපෑම පිළිබඳ තවදුරටත් විමසා බලන කල්හි එය පහත පරිදි හඳුනා ගත හැක. විශේෂයෙන් ම නීති සම්පාදන ක්‍රියාවලියේ දී, දඬුවම් ලබා දීමේදී මෙන්ම පුනරුත්ථාපන ක්‍රියාවලින් වැනි අවස්ථාවලදී සංස්කෘතිය යන සාධකය වැදගත් වේ.

සමාජයකට නීති අවශ්‍ය වන්නේ පුද්ගලයන්ගේ අයිතිවාසිකම් හා නන්වැදෑරුම් නිදහස ආරක්ෂා කිරීම සඳහා ය. මේ සඳහා නීති නිර්මාණය වීමේ දී විවිධ මූලාශ්‍ර බලපානු ලැබීය. නීති නිශ්චිතවම නිර්මාණය වීමට ප්‍රථම සමාජය ක්‍රියාත්මක වූයේ සංස්කෘතික අගනාකම් පද්ධතියක් මතය. මෙකී සංස්කෘතික අඟනාකම් නීති නිර්මාණය වීමේ දී නීතියේ මූලාශ්‍ර බවට පත්විය.

ඒ ඒ සංස්කෘතීන් ආගමේ ස්වභාවය අනුව බොහෝවිට ගොඩනැගී තිබෙන අතර නීතිය හා ආගම අතර සමීප සම්බන්ධතාවයක් පවතී. පැරණි සමාජ බොහෝමයක ආගම නීතිය ද, නීතිය ආගම ද විය. ප්‍රජාව විසින් වැඳුම් පිදුම් කරනු ලැබූ සහ ගෞරවයෙන් පිළිගනු ලැබූ දෙවිවරුන් හෝ දෙවියකු විසින් නීති නිර්මාණය කරනු ලැබූ බවට සලකන ලදි. උදාහරණ ලෙස හින්දු භක්තිකයන්ගේ බොහෝ පරිචයන් අඩංගු "මනු ගේ නීති සංග්‍රහය" බ්‍රාහ්මණ පූජකයන් විසින් සම්පාදනය කර ඇත. තවද ක්‍රිස්තියානි නීතිය ලෙස සලකනු ලබන දස පුරාණ පනත දෙවියන් වහන්සේ විසින් දෙන ලද දෙයක් ලෙස සලකනු ලැබේ. එහිදී නීති නිර්මාණයේ දී හා ඒවා ක්‍රියාත්මක කළ රජු මනුෂ්‍යයෙක් වුවත් එකී තැනැත්තාට යම් ආකාරයකින් දේවත්වයක් ඇතැයි හෝ දෙවියන් වහන්සේ සමග සම්බන්ධයක් ඇති බවට සලකනු ලැබීය. වර්තමානයේ දී වුවද නීතියෙන් වැරදි ලෙස දක්වා ඇති ඇතැම් හැසිරීම් ලෝකයේ ප්‍රධාන ආගම් වල ද බරපතළ වැරැදි ලෙස සලකනු ලබයි. උදාහරණ ලෙස මිනීමැරුම, සොරකම වැනි වැරදි ආගම තුළින් හා නීතිය තුළින් තහනම් කර ඇත. සමහර අවස්ථාවල රටක ආගමේ රීති ඒ රටේ නීති ලෙස පිළිගන්නා රටවල් ඇති අතර උදාහරණ ලෙස සෞදි අරාබිය පාලනය වන්නේ ඉස්ලාම් නීතිය අනුව ය. ශ්‍රී ලංකාවේ වුව ද රටේ සාමාන්‍ය නීතියට අමතරව මුස්ලිම්වරුන් සඳහා ඉස්ලාම් නීතිය පිළිගෙන ක්‍රියාත්මක කිරීම සිදු කරයි.

අතීතයේදී අපරාධකරුවන්ට දඬුවම් ලබාදීමේ ප්‍රධාන අරමුණ වූයේ පලිගැනීම හා විපාක ලබාදීමයි. විශේෂයෙන්ම හමුරාබි නීති සම්ප්‍රදාය අනුව "ඇසට ඇසක්" "දතට දතක්" වැනි සංකල්ප ක්‍රියාත්මක විය. ගෝත්‍රික සමාජ යුගයේ දී ගෝත්‍රයේ සියලුම සාමාජිකයන් ඉදිරියේ අපරාධ පිළිබඳ ප්‍රශ්න කිරීම හා දඬුවම් පැමිණවීමේ සංස්කෘතියක් විය. නමුත් අපරාධ විද්‍යාවේ දියුණුවත් සමග අපරාධ පාලනයට දෙන දඬුවම, පලිගැනීමේ අරමුණින් ඉදිරියට සංවර්ධනය වී අරමුණු හතරක් සහිතව නිර්මාණය වී ඇත. එනම්, විපාක විඳීමට සැළැස්වීම, නිවාරණය, අශක්නුකරණය, පුනරුත්ථාපනය යන අරමුණු සහිතව නිර්මාණය වූ අතර මේ ක්‍රියාවලියේ දී ඒවා ඒ ඒ සමාජයන්ට අනුකූල සංස්කෘතීන් හා බැඳී පවතී.

උදාහරණ ලෙස අපරාධ සඳහා දඬුවම් ලෙස මරණ දඬුවම ක්‍රියාත්මක කිරීමේ දී මේ සඳහා ඒ ඒ රටවල සංස්කෘතීන් විසින් ප්‍රබල බලපෑමක් එල්ල කරනු ලබයි. විශේෂයෙන් ම ශ්‍රී ලංකාව තුළ මරණ දඬුවමට අදාළව එල්ලුම් ගහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධව වරින් වර සමාජ කතිකාවතට භාජනය වී ඇත. නමුත් වර්තමානය වන විටත් එල්ලුම් ගහ ක්‍රියාත්මක නොවන්නේ අපරාධ විද්‍යාත්මක දෘෂ්ටිකෝණය අභිබවා ඇති ලාංකේය සංස්කෘතිය නිසාවෙනි. විශේෂයෙන් ම බෞද්ධ සංස්කෘතිය

අවිහිංසාව ප්‍රිය කිරීමත්, පරපණ නැසීම ප්‍රතික්ෂේප කිරීමත් මේ සඳහා බලපෑම් සිදු කරනු ලබයි. තව ද අපරාධ සඳහා දඬුවම් ලබාදීමේ දී සමාජය තුළ සංස්කෘතික වශයෙන් ගොඩ නැගෙන්නා වූ කොන්දේසි වෙනස් වන විට දඬුවම් ද වෙනස් වේ. උදාහරණ ලෙස අතීතයේ සමලිංගිකත්වය අපරාධයක් ලෙස සලකා එයට දඬුවම් ලබා දුන් ඇතැම් සමාජ අද වන විට සමලිංගිකත්වය පිළිගත් සංස්කෘතිකාංගයක් බවට සමාජය තුළ පත්කරගෙන ඇත.

ශ්‍රී ලංකාවේ බන්ධනාගාරගත සිරකරුවන් පුනරුත්ථාපන ක්‍රියාවලියේ දී ද ශ්‍රී ලාංකේය අනන්‍යතාවය රැක ගනිමින් බහුවාර්ගික සංස්කෘතියට ගරු කරමින් ක්‍රියා කරන අයුරු හඳුනාගත හැකිය. උදාහරණ ලෙස වැලිකඩ බන්ධනාගාරයට ප්‍රවේශ වුවහොත් ප්‍රවේශ දොරටුව ආසන්නයේම බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි, මුස්ලිම් යන ආගමික සම්ප්‍රදායන්ට අනුව ඒ ඒ ආගමික සිද්ධස්ථාන පිහිටුවා තිබෙන අතර සිරකරුවන්ට කැමති ආගමක් ඇදහීමේ නිදහස බන්ධනාගාරය තුළ ලබාදී ඇත. එමෙන්ම විවිධ සංස්කෘතික උත්සව සිරකරුවන් සම්බන්ධ කරගනිමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරයි. එනම් අවුරුදු උත්සව, නත්තල් උත්සවය, වෙසක් පෝය හා සමගාමී ආගමික වැඩසටහන් ආදී වශයෙන් විවිධ සංස්කෘතීන්ට ගරු කරමින් ඒවා සාමකාමී ලෙස සැමරීමට බන්ධනාගාර තුළ අවස්ථාව නිර්මාණය කර දෙනු ලබයි. විශේෂයෙන් ම මහනුවර දළඳා පෙරහැර ආශ්‍රිත කටයුතුවලට පවා සිරකරුවන් යොදා ගත් අවස්ථාවන් හඳුනාගත හැකිය. තරුණ පරපුර මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීම තුළ ශ්‍රී ලංකාවේ සංස්කෘතිය විශාල වශයෙන් විනාශයට ඇදී යන යුගයක බෞද්ධ භික්ෂූන් වහන්සේලා කිහිප නමක්ම විනාශකාරී තත්ත්වයෙන් තරුණයන් මුදවා ගෙන පුනරුත්ථාපනය කිරීමට විවිධ වැඩ පිළිවෙළ සකසන්නට වූයේ අතීතයේ සිටම රට, ජාතිය, සංස්කෘතියට එරෙහිව වන අපරාධ පාලනයට හා නිවාරණයට පූජ්‍ය පක්ෂයේ මැදිහත්වීම සිහි ගන්වමිනි. උදාහරණ ලෙස කුප්පියාවත්තේ බෝධානන්ද හිමියන් දිවයින පුරා පුනරුත්ථාපන මධ්‍යස්ථාන ගණනක් ආරම්භ කරමින් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ තරුණයන් විශාල පිරිසක් සමාජයට යහපත් පුද්ගලයින් ලෙස පුනරුත්ථාපනය කර සමාජගත කිරීමේ කාර්යයේ නිරත වේ. ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති පද්ධතිය තුළ අපරාධ පාලන හා නිවාරණ ක්‍රියාවලිය සංස්කෘතිය හා බද්ධව ක්‍රියා කරන ආකාරය හඳුනාගත හැකිය.

අතීත සමාජයට සාපේක්ෂව නූතන සමාජය තුළ අපරාධ පාලනය හා නිවාරණය සඳහා විධිමත් ක්‍රියා පිළිවෙතක් පැවතිය ද සමාජය තුළ අපරාධ පාලනයේ හා නිවාරණයේ ප්‍රධාන කාරකයක් වශයෙන් සංස්කෘතියේ දායකත්වය බොහෝ සේ උපයෝගී වන බව ඉහත පරිදි හඳුනාගත හැකිය. අපරාධ විද්‍යාවේ එක් සුවිශේෂී පැතිකඩක් වන සංස්කෘතික අපරාධ විද්‍යාවේ පරමාර්ථය වන්නේ ද පවත්නා සංස්කෘතික තත්ත්වයන් ඵලදායි අයුරින් අපරාධ පාලනය හා නිවාරණය සඳහා යොදා ගැනීම පිළිබඳ අවධාරණය කිරීමය.

## 5. සංස්කෘතික විසරණය සහ අපරාධ

**බී. එම්. කුමානායක**
**ඒ. එම්. එස්. එන්. අබේකෝන්**
**එම්. එම්. එස්. පී. දිසානායක**

සංස්කෘතිය යනු, අසීමිත ක්ෂේත්‍රයක් පුරා විහිදී ඇති සංකීර්ණ දෙයකි. පුද්ගල සමූහයක එකතුවෙන් සබැඳි සමාජය තුළ මිනිසාගේ ජීවත්වීමේ ක්‍රමය සංස්කෘතිය ලෙස පෙන්වා දිය හැක. මෙලෙසින් හඳුන්වනු ලැබූ සංස්කෘතිය තුළ එන එක් සුවිශේෂී අංශයක් ලෙස සංස්කෘතික විසරණය පෙන්වාදිය හැකි ය. සංස්කෘතික විසරණය, සංස්කෘතිකමය හා සාමාජීයමය වෙනස්කම්වල මූලික මූලාශ්‍රය ලෙස ද හැඳින්විය හැකිය. විස්ට්ලර් ට (Whistler) අනුව, සංස්කෘතියක් හඳුනාගැනීමේ දී සංස්කෘතික විසරණය හෙවත් සංස්කෘතික ව්‍යාප්තිය යන සංකල්පය වැදගත් වනු ඇත. ඒ අනුව සංස්කෘතියක විසරණය යනු, "එක් සංස්කෘතියක ලක්ෂණ තවත් සංස්කෘතියකට ව්‍යාප්ත වීම ලෙස සරලව පෙන්වාදිය හැකි ය." සංස්කෘතික විසරණය ඉංග්‍රීසි භාෂාව තුළ "Cultural Diffusion" යනුවෙන් හඳුන්වනු ලබයි. රටකින් තවත් රටකට, සමාජ ක්‍රමයකින් තවත් සමාජ ක්‍රමයකට, නගරයකින් තවත් නගරයකට ආදී වශයෙන් විවිධ සංස්කෘතීන් වෙනත් ස්ථානයකට ගලායාම නැතිනම් ව්‍යාප්ත වීම, සංස්කෘතික විසරණය මඟින් සිදුවනු ලබයි. සංස්කෘතික විසරණ ක්‍රියාවලිය මඟින් සංස්කෘතික මූලිකාංග එක් සංස්කෘතියකින් තවත් සංස්කෘතියක් කරා පැතිර යාම සිදුවේ. ජෝර්ජ් මර්ඩොක්ට (George P. Murdock) අනුව, "සංස්කෘතියක් තුළ අන්තර්ගත කරුණුවලින් 90%ක් පමණ ම වෙනත් සංස්කෘතීන් වෙතින් උකහා ගත් දේ වෙති." සංස්කෘතික විසරණය යන්නෙන්, වෙනත් සංස්කෘතියක් තුළින් සංස්කෘතික සාධක උකහා ගැනීම අදහස් වේ. එහිලා මෙකී විසරණවාදයෙන් පැවසෙන්නේ, යම් සමාජයක වූ වෙනසක් හටගනු ලබන්නේ, වෙනත් සමාජයක එවැනි ම වෙනසක් පැනනැඟී එය ආධාර කරගෙන බවයි. සෑම සංස්කෘතික චර්යයාවක්ම එකම මූලයකින් හටගන්නා බව මෙයින් අදහස් වේ. ඒ අනුව, සරලව ම සංස්කෘතික විසරණය යනු, එක් සංස්කෘතියක දක්නට ලැබෙන ලක්ෂණයක් තවත් සංස්කෘතියක් වෙත නිරායාසයෙන් ගලායාම ය. මෙම සංස්කෘතික විසරණය නම් සංකල්පය ප්‍රකට මානව විද්‍යාඥයෙකු වූ ෆ්‍රාන්ස් බෝආස් (Fransc Boas) විසින් හඳුන්වා දෙන ලදී, එහිලා විසරණය යනු, එක් මාධ්‍යයකින් තවත් මාධ්‍යයක් කරා ගමන් කිරීමයි. ගලා යාමයි. සංස්කෘතික විසරණය යනු, එක් සංස්කෘතියකින් තවත් සංස්කෘතියකට, මුල් සංස්කෘතියේ ලක්ෂණ ගමන් කිරීමයි. ලොව කිසිදු සංස්කෘතියක් සියයට සියයක් ශුද්ධ සංස්කෘතියක් නොවන අතර, සෑම සංස්කෘතියකට ම වෙනත් සංස්කෘතියක අංග ලක්ෂණ කා වැදී ඇත. රැල්ෆ් ලින්ටන්ට (Ralph Linton) අනුව, " සංස්කෘතියක අන්තර්ගතයෙන් සියයට අනූවක් පමණම වෙනත් සංස්කෘතියක් වෙතින් ලැබී ඇති අංගයන් වෙති". උදාහරණ ලෙස ආසියාතික රටවලට සාය, කලිසම්, කෝට්, ටයි හා බැනියම් ආදී

ඇඳුම්, රෝම ලන්දේසි නීතිය, නෛතික විවාහ ක්‍රමය, ඉංග්‍රීසි ඇතුළු බටහිර භාෂාවන් හී චවන පෙරදිග සංස්කෘතියට ආරෝපණය වීම පෙන්වා දිය හැකිය.

"සංස්කෘතික ව්‍යාප්තිය යනු, විවිධ සංස්කෘතීන්ගෙන් කොටස් ව්‍යාප්ත වී එකට එකතුවීමයි. මෙම විවිධ සංස්කෘතීන් තුළ සෑම දිනකම මිනිසුන් ආදරය කරන සහ භුක්ති විඳින විවිධාකාර ආහාර, ඇඳුම් පැළඳුම් සහ භාෂා පවා තිබේ"[26]. මෙකී සංස්කෘතික විසරණය ආකාර දෙකක් යටතේ හඳුනාගත හැක. එනම්,

- ස්වභාවික විසරණය (Natural Diffusion)
- සංවිධානාත්මක විසරණය ( Organized Diffusion) යනුවෙන් වේ.

මෙහිදී එක් සංස්කෘතික මධ්‍යස්ථානයක සිට තවත් සංස්කෘතික මධ්‍යස්ථානයක් දක්වා සංස්කෘතිය විසරණය වීම, ස්වභාවික විසරණය ලෙස පෙන්වාදිය හැකිය. මේ සඳහා වැඩි කාලපරාසයක් ගතවන අතර, සංවිධානාත්මක සංස්කෘතික විසරණය සඳහා එතරම් කාලයක් ගත නොවේ. සංවිධානාත්මක සංස්කෘතික විසරණය යුද්ධ, ආක්‍රමණ, යටත්විජිතවාදය ආදී තත්ත්වයන් මඟින් සිදුවනු ලබයි. එනම්, ශ්‍රී ලංකාවේ අතීතයේ පැවති යටත්විජිතකරණය සංවිධානාත්මක ලෙස සංස්කෘතික විසරණය වූ සුවිශේෂී අවස්ථාවක් ලෙස පෙන්වා දිය හැකිය. එහිදී රෝම ලන්දේසි නීතිය ඇතුළු විවිධ නීති ක්‍රමයන්, විවාහ ක්‍රම, කතෝලික ආගම ව්‍යාප්ත වීම, විවිධ දේශපාලන හා පාර්ලිමේන්තු සම්ප්‍රදායන් ලක්දිව පාලන සංස්ථාවට එක්වීම, ධනවාදී ආර්ථික ක්‍රමයන් මෙන්ම විවිධ අධ්‍යාපන ක්‍රමවේදයන් ආදී බොහෝ ආගන්තුක සංස්කෘතික සාධකයන් ශ්‍රී ලංකාවට ගලා ඒම නැතිනම් ව්‍යාප්ත වීම සිදුවිය.

එහිලා මෙම සංස්කෘතික ව්‍යාප්තිය හෙවත් සංස්කෘතික විසරණයේ ප්‍රධාන ප්‍රභේද 6කි.

- ස්ථාන මාරු විසරණය (Relocation Diffusion)
- පුළුල් කිරීමේ ව්‍යාප්තිය (Expansion Diffusion)
- බෝවෙන ව්‍යාප්තිය (Contagious Diffusion)
- ධූරාවලි ව්‍යාප්තිය (Hierarchical Diffusion)
- උත්තේජක විසරණය (Stimulus Diffusion)
- වැරදි ලෙස ව්‍යාප්ත වීම හෙවත් දුස්සානුගත/ දුස්සමාහිත විසරණය (Maladaptive Diffusion)

[26] *Cultural Diffusion*. (2019, January 29). District of Columbia Public Library. https://www.dclibrary.org/node/62675

මෙම සංස්කෘතික විසරණයේ ප්‍රභේදයන් සම්බන්ධයෙන් වර්ෂ 1897 දී ලියෝ ෆ්‍රොබේනියස් (Leo Frobenius) විසින් මූලික අදහස් පළ කර ඇත. ඒ අනුව, ඉහත දැක්වූ සංස්කෘතික විසරණයේ ප්‍රධාන ආකාර පිළිබඳව වැඩි දුරටත් පහත පරිදි විමසිය හැකිය.

### 1. ස්ථාන මාරු විසරණය (Relocation Diffusion)

ස්ථාන මාරු විසරණය යනු මිනිසුන් ලොව පුරා සංක්‍රමණය වීමේ දී සිදුවන සංස්කෘතීන් ව්‍යාප්ත වීම හා මිශ්‍ර වීම ලෙසින් හඳුන්වාදිය හැකිය. විශේෂයෙන් ම ලොව පුරා සංස්කෘතීන් ව්‍යාප්ත වීමට සංක්‍රමණය ප්‍රධාන හේතුවක් වී ඇත. නිදසුනක් වශයෙන්, 19 වන සියවසේ දී අයර්ලන්තයේ සිට ඇමරිකා එක්සත් ජනපදයට අයර්ලන්ත ජාතිකයින් සංක්‍රමණය වීම, බොස්ටන් වැනි නගරවල ඇමරිකානු – අයර්ලන්ත සංස්කෘතියේ වර්ධනයට හේතු විය.

ඒ අනුව, සංස්කෘතීන් එක් ජාතියකින් තවත් ජාතියකට සංක්‍රමණය වන විට එක් සංස්කෘතියක පවතින දෙයක් අනෙක් සංස්කෘතිය විසින් බොහෝ විට උකහා ගනී, එයින් අදහස් කරන්නේ, එලෙස යමක් උකහා ගත් සංස්කෘතියේ ලක්ෂණ ව්‍යාප්ත නොවන බවයි. ඒ වෙනුවට මිනිසුන් නව සංස්කෘතියට අනුවර්තනය වේ. සාමාන්‍යයෙන් ඔවුන් පදිංචි වූ නව ස්ථානයේ තමන්ගේම සංස්කෘතියක් තහවුරු කර ගත හැක්කේ, එක් ස්ථානයක සිට ප්‍රමාණවත් සංක්‍රමණිකයින් සංඛ්‍යාවක් නව ස්ථානයකට පැමිණි විට පමණි. මෙම අවස්ථාව හඳුන්වාදිය හැක්කේ, යම් සංස්කෘතියක් තවත් සංස්කෘතියකට අනුකලනය වනවාට වඩා යම් සංස්කෘතියකට ඒකාබද්ධ වීම ලෙසිනි. මෙයින් අදහස් කරන්නේ, සංස්කෘතියක් නව සමාජයක කොටසක් වී, නව සමාජය සමඟ අන්තර්ක්‍රියා කරන අතරම තමන්ගේම අනන්‍යතාවයක් පවත්වාගෙන යන බවයි.

### 2. පුළුල් කිරීමේ ව්‍යාප්තිය (Expansion Diffusion)

පුළුල් කිරීමේ ව්‍යාප්තිය යන්නෙන් අදහස් කරන්නේ, සංස්කෘතික අදහසක් ආරම්භ වූ තැනක සිට ව්‍යාප්ත වන නමුත්, එකී සංස්කෘතිය ආරම්භ වූ තැනම එහි මුල් ස්වරූපය ශක්තිමත්ව පවතින බවයි. උදාහරණයක් වශයෙන්, හොලිවුඩ් චිත්‍රපට එක්සත් ජනපදයේ තවමත් ජනප්‍රිය වී ඇති නමුත්, ඒවා යුරෝපය හා අනෙකුත් ජාතීන් දක්වා ව්‍යාප්ත වී තිබේ.

යමක් විශාල වීම ගැන කතා කිරීමට ප්‍රසාරණය යන යෙදුම භාවිත කෙරේ. ඒ අනුව, මෙම පුළුල් කිරීමේ ව්‍යාප්තිය පිළිබඳව සඳහන් කරන විටදී, යම් සමාජයක් තුළ ජනප්‍රිය වෙමින් පවතින සංස්කෘතික අයිතමයක් (අදහසක්, නර්තන ක්‍රමයක් හෝ විලාසිතාවක්) තවත් සංස්කෘතියක් විසින් වැඩි දියුණු කරමින් ප්‍රසාරණය කරමින් භාවිත කිරීම. නිදසුනක් වශයෙන්, 70 දශකයේ බෙල් බොටම් ජීන්ස් සහ 2000 දශකයේ මුල් භාගයේ කෙට්ටු ජීන්ස් ජනප්‍රිය වීම.

### 3. බෝවන ව්‍යාප්තිය (Contagious Diffusion)

බෝවන ව්‍යාප්තිය යනු, පුද්ගලයන් එකිනෙකා අතර සිදුකරන අන්තර් ක්‍රියාකාරීත්වය තුළින් අදහස් ව්‍යාප්ත වීම ලෙසින් අදහස් කෙරෙන, ඉහත සඳහන් කරන ලද පුළුල් කිරීමේ ව්‍යාප්තියේම උප අංශයක් ලෙසින් පෙන්වාදිය හැකිය. මිනිසුන් අන්තර් ක්‍රියා කරන විට, ඔවුන් සමඟ කටයුතු කරන පුද්ගලයින්ගේ සංස්කෘතිය ඔවුන් භාර ගන්නා අතර, ඒ ඔස්සේ සංස්කෘතිය ව්‍යාප්ත වේ. මෙම ව්‍යාප්තිය මිනිසුන් අතර පැතිරෙන වෛරසයකට සමානය. උදාහරණයක් වශයෙන්, යම් පුද්ගලයෙක් වීඩියෝ පටයක් නරඹා එය තවකෙකු සමගින් බෙදා ගනී. එලෙස එය බෙදා ගන්නා සෑම අයෙකුම එය නැරඹීමට සහ එක් පුද්ගලයෙක් තවත් අයෙකු සමඟ එය බෙදා ගන්නා විට අදාල වීඩියෝව ලොව පුරාම ව්‍යාප්ත වේ. එපරිද්දෙන් සංස්කෘතිය ද ව්‍යාප්ත වන බව මෙම ප්‍රභේදය ඔස්සේ පැහැදිලි කරයි.

### 4. ධූරාවලි ව්‍යාප්තිය (Hierarchical Diffusion)

සමාජයේ ප්‍රසිද්ධ හෝ බලවත් පුද්ගලයින් විසින් සංස්කෘතික අදහසක් හුවමාරු කර ගැනීමේ දී මෙම ධූරාවලි ව්‍යාප්තිය සිදු වේ. සංස්කෘතිය සමාජයේ ඉහළ සිට පහළට ව්‍යාප්ත වී ඇත. අතීතයේ දී රජවරුන්ගේ හා බිසෝවරුන්ගේ විලාසිතා, මනාපයන්, ආචාරශීලී බව සමාජය පුරා ව්‍යාප්ත විය. එසේම, වර්තමානයේදී ද, වෙළඳ නාම බොහෝ විට සමාජය තුළ එය විලාසිතාවක් බවට පත් කිරීම සඳහා තම අදහස් හෝ නිෂ්පාදන ව්‍යාප්ත කිරීම සඳහා බලපෑම් කිරීමට යොදා ගනු ලබයි. ධූරාවලි ගත ව්‍යාප්තිය පිළිබඳ ඓතිහාසික උදාහරණයක් ලෙස, අරගොන් හී ෆර්ඩිනන්ඩ් සහ කැස්ටිල් හී ඉසබෙලා සමඟ විවාහ වීම දැක්විය හැකිය. ඔවුන්ගේ විවාහය නිසා කැස්ටිල් සහ අරගොන් රාජධානි එකම රාජධානියක් බවට ඒකාබද්ධ විය. ඔවුන් සමාජයේ ඉහළින්ම සිටි බලවත් පුද්ගලයින් වූ හෙයින්, සංස්කෘතික අනන්‍යතාවයෙන් යුත් රාජධානි දෙකම එක රාජධානියක් බවට ඒකාබද්ධ කිරීමට සාර්ථකව සමත් වූහ.

### 5. උත්තේජක විසරණය (Stimulus Diffusion)

උත්තේජක විසරණය සිදුවන්නේ, සංස්කෘතියක් එහි මුල් ස්ථානයේ සිට ව්‍යාප්ත වන විට එය වෙනස් වීම හේතුවෙනි. එම සංස්කෘතිය මුල් ස්ථානයේ එලෙසම පැවතීමට හෝ නොවීමට ඉඩ ඇතත්, අදාළ සංස්කෘතිය තවදුරටත් ව්‍යාප්ත වන තරමට එය වෙනස් වේ. නිදසුනක් වශයෙන්, රොක් සංගීතයේ ව්‍යාප්තිය ගත් විට ස්කැන්ඩිනේවියාවේ දී බර ලෝහ (Heavey Metal) නම් අංශය ප්‍රබල වර්ගය බවට පත් වූ අතර, ග්‍රාමීය ඇමරිකාවේදී එය, ග්‍රාමීය සංගීතය ලෙසත්, එක්සත් ජනපදයේ වයඹ දිග පැසිෆික් කලාපයේ ග්‍රන්ජ් රොක් (Grunge Rock) බවටද පත් විය. මෙම සියල්ලම රොක් සංගීතයේ උප ප්‍රභේදයන් වන නමුත් විවිධ ප්‍රදේශයන් වල එය ව්‍යාප්ත වන විට මුල් රොක් සංගීතය සඳහා විවිධ අනුවාදයන් ඉදිරිපත් විය. මෙම උත්තේජක විසරණය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේ දී සඳහන් කළ යුතු විශේෂ කරුණක් නම්, හයිපර්ඩිෆියුෂන්වාදීන් (Hyperdiffusionists) නමින් හැඳින්වෙන

න්‍යායවාදීන් කණ්ඩායමක් විශ්වාස කරන්නේ, ප්‍රථමයෙන් එකම සංස්කෘතියක් තිබූ අතර, පසුව ලෝකය පුරා මිනිසුන් ව්‍යාප්ත වූ විට සංස්කෘතියටද විවිධ අංශයන් එකතු වී එය වෙනස් වූ බවයි.

**6. වැරදි ලෙස ව්‍යාප්ත වීම හෙවත් දුස්සානුගත/ දුස්සමාහිත විසරණය (Maladaptive Diffusion)**

සංස්කෘතියක් ප්‍රයෝජනවත් හෝ අදාළ යැයි නොපෙනෙන නව ප්‍රදේශවලට ව්‍යාප්ත වන විටත්, එය වෙනස් නොවන විටත් වැරදි ව්‍යාප්තිය සිදු වේ. එය එක් ප්‍රදේශයක හොඳින් ක්‍රියාත්මක විය හැකි නමුත් තවත් සමාජයකට එය නුසුදුසු විය හැකිය. නිදසුනක් වශයෙන්, හිම සහිත ප්‍රදේශ වල මිනිසුන් හිම වල පාපන්දු ක්‍රීඩා කරයි. නමුත් එය අදාල කාලගුණය සඳහා වැරදි ක්‍රීඩාවක් සේ තවත් සංස්කෘතියකට පෙන්වාදිය හැකිය. (සමහර විට ඔවුන් හිම මත ලිස්සා යා යුතුය), නමුත් ඔවුන් ක්‍රීඩාවේ ප්‍රායෝගික බව නොසළකා විනෝදයෙන් එය වැළඳ ගනී.

මෙකී ප්‍රභේද වල ව්‍යාප්තිය සිදු වන්නේ කෙසේද යන්න සොයා බැලීම ද වටී. සැවේජ් (Saweg) ට අනුව, එය සිදු වන ප්‍රධාන ආකාර තුනකි. ඒ සඳහා, යටත්විජිතවාදය, ආගම සහ අධ්‍යාපනය යන අංශ මඟින් එකී සංස්කෘතික ව්‍යාප්තිය වඩාත් පහසු වී ඇත[27]. ඒ අනුව, ප්‍රධාන වශයෙන් සංස්කෘතික විසරණය සිදු වන ආකාර පහත පරිදි පෙන්වාදිය හැකිය.

- **ඍජු විසරණය**

ඍජු විසරණය සිදුවන්නේ, සංස්කෘතීන් දෙකක් බලහත්කාරයකින් තොරව එකිනෙකාගේ කැමැත්තෙන්, එකිනෙකාගේ මැදිහත් වීමෙන් යම් සංස්කෘතියකට හුරු වීම හේතුවෙනි. මෙය ස්වභාවිකව සිදු වේ,

- **බලහත්කාරයෙන් ව්‍යාප්තිය**

බලහත්කාරයෙන් ව්‍යාප්තිය සිදුවන්නේ, යමෙකු හෝ පිරිසක් විසින් තවකෙකුගේ හෝ තවත් පිරිසකගේ කැමැත්තට පටහැනිව වෙනත් සංස්කෘතියක ගති ලක්ෂණ ඇති කර ගැනීමට ඉඩ සැළැස්වීමෙනි.

- **වක්‍ර ව්‍යාප්තිය**

වක්‍ර ව්‍යාප්තිය සිදු වන්නේ, සංස්කෘතියක් එක් තැනක සිට තවත් තැනකට ව්‍යාප්ත කරන අතරමැදියෙකුගේ දායකත්වයක් සහිතව බෙදා ගත් විට ය. මේ අනුව, ඉහත සඳහන් කළ ආකාරයෙන් හඳුනාගත් සංස්කෘතික විසරණය, අපරාධ ඇති වීම සඳහා කරනු ලබන බලපෑම සම්බන්ධයෙන් පහත ආකාරයෙන් විමසා බැලිය හැකි වේ.

[27] Drew, C. (2021, February 23). *The 6 Types of Cultural Diffusion (AP Human Geography) (2021)*. Helpfulprofessor.com. https://helpfulprofessor.com/types-of-cultural-diffusion/

එහිලා සංස්කෘතියක් යම් සංස්කෘතියක සිට තවත් සංස්කෘතියක් කරා විසරණය වීම තුළින් විවිධ වූ සමාජ අංගයන් සහ සමාජ නවීකරණයන් සිදු වූ බව මෙහිදී පැහැදිලි වන කරුණකි. සංස්කෘතික විසරණය තුළින් ධනාත්මක සංස්කෘතික සාධකයන් ව්‍යාප්ත වූවා සේම සමාජ විරෝධී ලෙස පවතිනු ලබන ඇතැම් සාධකයන් ද, මෙකී සංස්කෘතික විසරණය සමඟින් සිදු වන බව පෙන්වා දිය යුතු වේ [28]. එහිලා බොලීවියාවේ පදිංචි ව සිටි ස්පාඤ්ඤ ජාතිකයෙකු වූ ඇන්ටෝනියෝ ද ලියොන් පිනෙලෝ (Antonio de Leon Pinelo) නැමැත්තා විසින් රචිත "පැරයිසෝ එන් එල් නුඑවෝ මුන්ඩෝ" (Paraiso en el Nuevo Mundo) නම් ග්‍රන්ථයේ සඳහන් කර ඇත්තේ, ඒඩන් උයන (Garden of Eden) සහ මිනිසා මැවීම සිදු වූයේ වර්තමාන බොලිවියාවේ බවත්, ලෝකයේ සෙසු රටවල් ද ජනාවාස වී ඇත්තේ සංක්‍රමණයන් හේතුවෙන් බවත්ය. එහිලා සංස්කෘතික විසරණයට අදාළව පෙර සඳහන් කරන ලද හයිපර්ඩිෆියුෂන්වාදීන් (Hyperdiffusionists) විසින් ඉදිරිපත් කළ, ලොව සෑම සංස්කෘතියක්ම එකම සංස්කෘතියක් තුළින් ගොඩ නැගී ඇති බව පැහැදිලි කරනු ලබන කදිම නිදර්ශකයකි.

ඒ අනුව, මෙම සංස්කෘතික විසරණය යනු, අනවරත ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙසින් පෙන්වා දීම අතිශෝක්තියක් නොවනු ඇත. එහිදී යම් සංස්කෘතියක ගැබ්ව ඇති යහපත් ලක්ෂණ පමණක් නොව අයහපත් හා අපගාමී චර්යයාවන්ද වෙනත් සංස්කෘතීන් මගින් ශීඝ්‍රයෙන් ගලා යාම ආයාසයකින් තොරව සිදු වනු ඇත. මෙහිදී අපරාධ සඳහා පේ්‍රරණයන් ගෙන දෙනු ලබන බොහෝ සාධකයන් එක් සංස්කෘතියක සිට තවත් සංස්කෘතියක් කරා නිරායාසයෙන් ගලා යනු ලබයි.

මිනිසුන් යම් සමාජයක සිට තවත් සමාජයකට නැතිනම් යම් දේශයක සිට තවත් දේශයකට සංක්‍රමණය වීම අතීතයේ සිටම සිදු වූ තත්ත්වයක් ලෙස පෙන්වා දිය හැකිය. මෙහිදී ද යම් දේශයක සිට හෝ යම් සමාජයක සිට මෙලෙස මිනිසුන් සංක්‍රමණය වීම තුළ එකී සමාජයේ හෝ දේශයේ තිබූ සංස්කෘතිය තවත් සමාජයකට, සංස්කෘතියකට, හෝ දේශයකට ගලා යෑම සිදු වනු ලබයි. එහිදී සංස්කෘතියක විසරණයක් සිදුවනවා යන්න අමුතුවෙන් කිව යුතු කරුණක් නොවේ. මාෆියා කල්ලි මෙන්ම සංවිධානාත්මක අපරාධ කල්ලි මුල් කාලීනව චීනය, ජපානය මෙන්ම ඉතාලියේ සිසිලියාව මුල් කරගනිමින් මූලබීජ වපුරන්නට විය. මෙකී ප්‍රදේශයන් තුළ අපරාධකාරී සමාජ සංස්කෘතියක් බිහි වී තිබූ අතර සිසිලියානු වැසියන් වෙනත් දේශයන් කරා සංක්‍රමණය වීමත් සමඟ පෙර කී සංස්කෘතික ලක්ෂණයන් ද ඔවුන් සමඟ අනෙකුත් සමාජ ක්‍රමයන් වෙත විසරණය වන්නට විය.

නිදසුනක් වශයෙන් ඇමරිකාව තුළ ‘‘පුංචි ඉතාලිය’’ වශයෙන් හඳුන්වනු ලබන ප්‍රදේශය තුළ මෙලෙස සංක්‍රමණය වූ පිරිස් බොහෝ ප්‍රමාණයක් පදිංචි වන්නට විය. එහිදී ඇමරිකාව තුළ සංවිධානාත්මක අපරාධයන් බිහිවීමට බල පෑ එක් හේතුවක් ලෙස මෙය පෙන්වා දිය හැකිය. ඒ අනුව, මිනිසුන් සංක්‍රමණය වීම තුළින් යම් සංස්කෘතියක පවත්නා වූ අපරාධකාරී චර්යයාවන් මෙන්ම, මිනිසා තුළ පවතින සමාජ විරෝධී චර්යාවන් ද එක් සංස්කෘතියක සිට තවත් සංස්කෘතියකට ගෙන යන බව මෙහිදී

[28] Coşkun, G. (2021). Cultural Diffusion Theory And Tourism Implications. *International Journal of Geography and Geography Education*. https://doi.org/10.32003/igge.811722

පැහැදිලි වේ. එතුළින් යහපත් සංස්කෘතියක් පැවති සමාජයක් වෙතටද අපරාධකාරීත්වයක් ඇතිවීමට යම් ප්‍රේරණයක් සිදු වනු ඇත.

අද්‍යතනය වන විට පවතින තාක්ෂණයේ දියුණුවත් සමඟින් මෙම සංස්කෘතීන් තවත් සංස්කෘතියකට ගලා ඒම වේගවත් වී තිබේ. විවිධ සංස්කෘතීන් තුළ කලාව ආශ්‍රය කර ගනිමින් සිදු කරනු ලබන ඇතැම් නිර්මාණ එම සංස්කෘතිය තුළ සාමාන්‍ය කරුණක් වුවද ඇතැම් සංස්කෘතීන් සඳහා නොගැළපෙන තත්ත්වයන් ඇති කරනු ලබයි. ඇතැම් සංස්කෘතීන් ආශ්‍රය කරගනිමින් බිහි වන චිත්‍රපට ආශ්‍රිත කලා නිෂ්පාදනයන්, වෙනත් සංස්කෘතියකට අහිතකර පණිවුඩයක් ලබා දීම සිදු කරනු ලබයි. එහි ගැබ් වී ඇති ප්‍රචණ්ඩත්වය, කෲරත්වය හා ම්ලේච්ඡත්වය ආදී තත්ත්වයන් පෙන්නුම් කරනු ලබන සිදුවීම් යම් සමාජයක පුද්ගලයින් හට අපරාධ කිරීම සඳහා යම් උත්තේජනයක්, ප්‍රේරණයක් ලබා දීමට හේතුවක් විය හැකිය.

නිදසුනක් වශයෙන් ඇතැම් බටහිර රටවල් තුළ නිර්මාණය කරනු ලබන චිත්‍රපට මෙන්ම බොහෝමයක් දමිළ චිත්‍රපට ආදිය තුළ වැඩි වශයෙන් මෙම ප්‍රචණ්ඩත්වය, කෲරත්වය ගැබ්ව තිබේ. ඒ තුළ පවතින අනිත් සංස්කෘතීන් සඳහා නොගැළපෙන සමාජ චර්යාවන් එනම්, අවි ආයුධ භාවිතයන් හා අපරාධ සිදුකිරීම සඳහා කරනු ලබන ඇතැම් ක්‍රියාවන් ආදිය තවත් සංස්කෘතික සමාජයක් තුළ අපරාධකාරී නැඹියාවක් ඇති කිරීම සඳහා බලපානු ලබයි. උදාහරණ ලෙසින් යාපනයේ ප්‍රදේශ ගණනාවක භීෂණය වපුරන ''ආවා'' කල්ලියේ සාමාජිකයින් වන බහුතරයක් තරුණයින් මේ ආකාරයේ ක්‍රියාවන් සඳහා පෙළඹීමට හේතු වී ඇත්තේ, දකුණු ඉන්දීය දමිළ චිත්‍රපට වෙතින් ලද උත්තේජනයන් බව අනාවරණය වී ඇත. ඇතැම් සංස්කෘතීන් තුළ පවතිනු ලබන මත්ද්‍රව්‍ය භාවිතා කිරීම ආදී ගොදුරු විරහිත අපරාධකාරී ස්වභාවයන් මෙලෙස වැඩි වශයෙන් වෙනත් සංස්කෘතීන් ශීඝ්‍රයෙන් වැළඳ ගැනීම නිසාවෙන් සිදු වන බව පැහැදිලි වේ. එහිලා ඉහත කරුණු අනුව, සංස්කෘතික විසරණය හේතුවෙන් විවිධ වූ අපරාධමය ක්‍රියා ද ව්‍යාප්ත වන  බව පෙන්වා දිය හැකිය. එහිලා බහුල වශයෙන්, කාන්තා හිංසනය, ප්‍රචණ්ඩත්වය මත්ද්‍රව්‍ය භාවිතය, අවි, ආයුධ භාවිතය, පරිගණක තාක්ෂණය අනිසි ලෙස භාවිතය, යනාදී අපරාධමය ක්‍රියා, සංස්කෘතික විසරණයත් සමඟ ඇතිවන බව පෙන්වා දිය හැකිය.

මේ පිළිබඳව වැඩි දුරටත් අධ්‍යයනය කිරීමේ දී, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් මෙම සංස්කෘතික විසරණය හා ඒ ආශ්‍රිත අපරාධ පිළිබඳවද විමසා බැලිය හැකි වේ. උදාහරණ ලෙසින්, මෙරට සිංහල, දෙමළ, මුස්ලිම් යනාදී විවිධ ආගම්, භාෂාවන්, ජාතීන්ගෙන් සම්මිශ්‍රිත වූ සංස්කෘතියක්, මෙරට තුළ අතීතයේ ක්‍රියාත්මක වුවද යුරෝපා ආක්‍රමණ වලින් පසු බටහිර සංස්කෘතික ලක්ෂණ ශීඝ්‍රයෙන් මෙරටට පැමිණෙන්නට වූ බවත්, එහිදී මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රධාන වශයෙන්ම මෙරටට යුරෝපය වෙතින් පැමිණි බවත් පෙන්වා දිය හැකිය. මත්ද්‍රව්‍ය භාවිතය හා වර්තමාන ශ්‍රී ලංකාවේ සමාජ හා සංස්කෘතික තත්ත්වය සම්බන්ධයෙන් විමසා බැලීමේ දී ප්‍රධාන වශයෙන්ම මත්ද්‍රව්‍ය භාවිතය හා ඇබ්බැහිය හේතුවෙන් අපරාධ රාශියක් සිදුවන බව පෙන්වාදිය හැකිය. ප්‍රධාන වශයෙන්ම ලෝකයේ සෙසු රාජ්‍යයන් හි මෙන්ම ශ්‍රී ලංකාව තුළ ද සිදු වන අපරාධකාරී චර්යයාවන් වන ස්ත්‍රී දූෂණ, ළමා අපචාර, ළමා අපයෝජන, මනුෂ්‍ය ඝාතන, පහරදීම්, යනාදී අපරාධ මෙම මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් බහුලව සිදු වන අපරාධ ලෙසින්

හඳුනාගත හැකි වේ. මෙවැනි අපරාධ වර්තමානය වන විට ප්‍රචලිත වී ඇත්තේ, යුරෝපයේ පැවති සංස්කෘතික ලක්ෂණ මෙරටට පැමිණීමත් සමඟින්ය. එනම්, දුම්වැටි, මද්‍යසාර යනාදී අහිතකර දේ පැමිණීම තුළින් මෙම අපරාධමය ක්‍රියා සිදුවන බව දැක්විය හැකිය. මෙහිදී එකී කරුණු පමණක් නොව, සංස්කෘතික විසරණය හේතුවෙන් අනන්‍ය වූ අපරාධ සංස්කෘතියක් ඒ ඒ රාජ්‍යයන් තුළ බිහි වී ඇති බවද පෙන්වා දිය යුතුය. මේ පිළිබඳව අධ්‍යයනය යොමු කිරීමේ දී අරාබිකරයේ ඇතැම් රාජ්‍යයන් හී ක්‍රියාත්මක වන නීති රීති පාකිස්ථානය, ඇෆ්ගනිස්ථානය, වැනි දකුණු ආසියානු කලාපයට විසරණය වීම හෙවත් ව්‍යාප්තිය තුළින් කාන්තා හිංසනය ආශ්‍රිත අපගාමී ක්‍රියා බහුල වශයෙන් සිදුවන බව පෙන්වා දිය හැකිය. එමෙන්ම ළමා අපචාර බහුල වීමටද මෙකී කරුණු හේතු වන බව සඳහන් කළ යුතුය. එම කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේ දී ශ්‍රී ලංකාවේ මුස්ලිම් සංස්කෘතිය තුළ ද කාන්තා හිංසනය, බාල වයස් විවාහ යනාදී අපගාමී චර්යාවන් දැකගත හැකිය. ඒවා අරාබි, මුස්ලිම් රටවල් තුළින් මෙරටට පැතිරී ඇති බව මනාව පැහැදිලි වේ. එසේම මාර්ටින් වික්‍රමසිංහයන්ගේ විවිධ කෘති පිළිබඳව අවධානය යොමු කිරීමේ දී ප්‍රධාන වශයෙන් ම සංස්කෘතික විසරණය හා ඒ ඔස්සේ අපරාධමය ක්‍රියා සිදුවීමට බලපෑ හේතු පිළිබඳව ඔහු විසින් වැඩි දුරටත් දක්වා ඇත. ඒ පිළිබඳව කරුණු දැක්වීමේ දී,

- සත්ව සන්තතිය – 1934
- පුරාණ ස්ත්‍රීන්ගේ ඇඳුම – 1947
- සිංහල ලකුණ – 1948
- බුදු සමය හා සමාජ දර්ශනය – 1948

යනාදී කෘතීන් තුළ වික්‍රමසිංහ ශූරීන් පෙන්වා දෙනු ලබන්නේ, සංස්කෘතියේ පැතිරීම නැතිනම් විසරණය පිළිබඳවයි. එහිදී සිංහල ලකුණ යන කෘතිය තුළින් ඔහු දක්වා ඇත්තේ, බටහිර සංස්කෘතියේ ආභාෂය සමඟින් මෙරට දුම්වැටි භාවිතය, මත්ද්‍රව්‍ය භාවිතය යනාදී ක්‍රියාවන් ශ්‍රී ලාංකික සංස්කෘතියට අනුගත වී ඇති බවයි[29]. ඒ අනුව, ඉහත සඳහන් කරුණු ඔස්සේ ප්‍රධාන වශයෙන් ම සංස්කෘතික විසරණය හේතුවෙන් අපරාධමය ක්‍රියා සිදුවන බව මනාව පැහැදිලි වේ. එහිදී ශ්‍රී ලංකාව තුළ ට පැමිණි විවිධ සංස්කෘතික බලපෑම් තුළින් ඉහතින් සදහන් කරන ලද, මත්ද්‍රව්‍ය භාවිතය, මත්ද්‍රව්‍ය වෙළඳාම, කාන්තා හිංසනය, පරිගණක අපරාධ, වැනි අපගාමී චර්යයාවන් සහ අපරාධමය ක්‍රියා බහුල වශයෙන් සිදු වන බව දැක්විය හැකිය. එනම් විවිධ සංස්කෘතීන් වෙතින් නිරායාසයෙන් ගලා එන විවිධ සංස්කෘතික ලක්ෂණ හේතුවෙන් එය වැළඳගත් සංස්කෘතිය තුළ අපරාධමය ක්‍රියා වර්ධනය වන බවය. එනම්, සංස්කෘතික විසරණය හා අපරාධ අතර යම් පැහැදිලි සහ-සම්බන්ධතාවයක් පවතින බව ඉහත සඳහන් කරන ලද සියලුම කරුණු ආමන්ත්‍රණය කිරීමේ දී මනාව පැහැදිලි වේ.

---

[29] Amarasekara, D. (n.d.). මාර්ටින් වික්‍රමසිංහයන්ගේ කෘති වල සමාජ මානව විද්‍යාත්මක ලක්ෂණ. Cutt.ly. Retrieved October 5, 2021, from https://cutt.ly/9EVmfRF

## 6. සංස්කෘතික ගැටුම සහ අපරාධ

**ඩී.එම්.පී.වී. දිසානායක**
**එස්.ඩී. හන්සිකා**
**ඊ.ඩී.අයි.පී. වීරක්කොඩි**

ගැටුම සමාජයේ සෑම ස්ථරයක ම හඳුනාගත හැකි පොදු සමාජ සංසිද්ධියකි. එය සමාජය තුළ පවත්නා නෛසර්ගික ගුණාංගයක් වන බහුවිධතාවයේ ප්‍රතිඵලයක් ලෙස හැඳින්විය හැකි ය. නොගැලපෙන අරමුණු, හිඟ සම්පත් හෝ ඒවා ලබා ගැනීමට අවශ්‍ය බල ප්‍රභවයන් සඳහා කණ්ඩායම් හෝ පුද්ගලයින් විසින් තරග කිරීම සරලව ගැටුම් වශයෙන් හඳුන්වාදිය හැකි ය. ගැටුම් ඇති වීමට බලපාන සාධක කිහිපයක් ලෙස දේශපාලනය, ආර්ථිකය, ආගම මෙන් ම, සංස්කෘතිය ද හඳුන්වාදිය හැකි ය[30]. මේ අනුව ගත් කළ සංස්කෘතික ගැටුම වශයෙන් හැඳින්විය හැක්කේ එක් සංස්කෘතියක් හා තවත් සංස්කෘතියක් අතර පවත්නා ගැටුම වේ. මෙහි දී උදාහරණ වශයෙන් මහා සංස්කෘතිය හා උප සංස්කෘතීන් අතර පවතින ගැටුම පෙන්වා දිය හැකි ය. තෝස්ටන් සෙලීන් (Thomstan Sellin) විසින් සංස්කෘතික ගැටුම නිර්වචනය කරනු ලබන්නේ, සංස්කෘතීන් දෙකක් අතර නැතහොත් පරම්පරා දෙකක් අතර භෞතික හා අභෞතිකව සිදු ව ඇති පරස්පරතාවයක් වශයෙනි[31].

ඕනෑම සමාජයක් තුළ සංස්කෘතික ගැටුම් නිර්මාණය වීම සඳහා හේතුකාරක කිහිපයක් පවතී. එම හේතූන් අතර, සංස්කෘතික ගැටුමෙහි ප්‍රධාන සාධකයක් වශයෙන් මානව කේන්ද්‍රණවාදය හඳුන්වාදිය හැකිය. මෙම මානව කේන්ද්‍රණවාදි අදහස් තුළින් සංස්කෘතික සට්ටනයක් නිර්මාණය වීමට පසුබිම සැලසේ. මෙහි ඓතිහාසික විකාශය පිළිබඳ විමසීමේදී ''මානව කේන්ද්‍රණවාදය'' යන පදය ග්‍රීක භාෂාවේ එන "Ethos" සහ "Kentron" යන පදයෙන් බිඳී ආවකි. මෙහි දී "Ethos" යන්නෙන් ජාතිය, මානව යන අදහස ද "Kentron" යන පදයෙන් කේන්ද්‍රය යන්න ද අර්ථවත් කරයි. සමාජීය විද්‍යා ශබ්දකෝෂයට අනුව, "තමාගේ සමාජය හෝ සංස්කෘතිය උසස් යැයි සැලකීමේ ප්‍රවණතාවය සහ අනෙක් සමාජයන් හා සංස්කෘතීන් විනිශ්චය කරනු ලබන ප්‍රමිතිය" මානව කේන්ද්‍රණවාදය වශයෙන් හඳුන්වා ඇත. "මානව කේන්ද්‍රණවාදය" (Ethnocentrism) පදය ප්‍රථම වරට භාවිත කරන ලද්දේ 19 වන සියවසේ දී පෝලන්ත සමාජ විද්‍යාඥයකු වූ ලුඩ්විග් ගම්ප්ලොවිච් විසිනි. ඉන් පසුව මානව කේන්ද්‍රණවාදයේ වර්ධනය සිදු වූයේ, 1906 වසරේ දී සමාජ විද්‍යාඥයකු වූ විලියම් ග්‍රැහැම් සම්නර් විසිනි. ඔහු එමගින් අදහස් කරන ලද්දේ "කණ්ඩායම් තුළ සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීමේ මාධ්‍යයක් සහ බාහිර කණ්ඩායම් කෙරෙහි විරෝධතාවය ප්‍රවර්ධනය කිරීමේ මාධ්‍යයක්" වශයෙනි. එහි දී ඔහුගේ "ෆෝල්ක්වේස්" (Folkways) නැමැති ග්‍රන්ථයේ මෙම මානව කේන්ද්‍රණවාදය බොහෝවිට උඩගුකම, නිෂ්ඵල භාවය තමන්ගේ ම කණ්ඩායම උසස් ලෙස විශ්වාසය සහ බාහිර පුද්ගලයන් කෙරෙහි පිළිකුලට

[30] Avruch, K. (2018). Cross-Cultural Conflict.
[31] Gelfand, M., & Brett, J. (2004). The Handbook of Negotiation and Culture. Stanford University Press.

හේතුවන බව ඔහු සඳහන් කරන ලදී. ඉන්පසු ටී.ඩබ්ලිව් ඇඩෝර්නෝගේ "ඒකාධිපති පෞරුෂ න්‍යාය" (1950), ඩොනල්ඩ් ටී. කැම්බල්ගේ "යථාර්ථවාදී කණ්ඩායම් ගැටුම් න්‍යාය" (1972) සහ හෙන්රි ටජ්ෆෙල්ගේ "සමාජ අනන්‍යතා න්‍යාය" (1986) ඇතුළු ව න්‍යායන් කිහිපයක් හරහා මානව කේන්ද්‍රණවාදය ශක්තිමත් කරන ලදී[32].

මෙය ලෝකය දෙස ස්වකීය සංස්කෘතියක දෘෂ්ටිකෝණයෙන් බැලීමේ ප්‍රවණතාවකි. මානව කේන්ද්‍රණවාදය කොටසක් නම් ස්වකීය ජාතිය, ජනවාර්ගික හෝ සංස්කෘතික කණ්ඩායම ඉතා වැදගත් යැයි හෝ එම සංස්කෘතියේ සමහර හෝ සියලු ම අංගයන් අනෙක් කණ්ඩායම්වලට වඩා උසස් යැයි විශ්වාස කිරීම ය. මානව කේන්ද්‍රණවාදය පිළිබඳ අධ්‍යයනයේ දී ආචාර්ය නිව්ටන් බෙනට් විසින් හඳුන්වාදෙනු ලැබූ "බෙනට් ආකෘතිය" වැදගත් වේ. මෙම ආකෘතිය හරහා මානව කේන්ද්‍රණවාදයේ අවධීන් ත්‍රිත්වයක් විග්‍රහ කරන අතර, ඔහු වසර ගණනාවක් අන්තර් සංස්කෘතික වැඩමුළු, පන්ති, උපාධි පාඨමාලා තුළ තමා නිරීක්ෂණය කළ සිසුන්ගේ අත්දැකීම් ආශ්‍රයෙන් සහ මනෝ විද්‍යාවේ, නිර්මාණාත්මකවාදය සංකල්ප යොදා ගනිමින් ඔහු අදියර හයක් යටතේ මෙම ආකෘතිය නිර්මාණය කර ඇත. මෙම අදියර හය අතුරින් පළමු අදියර තුන මානව කේන්ද්‍රීය අවධීන් වශයෙන් ඔහු හඳුන්වන ලදී.

එහි පළමුවන අදියර නම් "ප්‍රතික්ෂේප (Denial)" කිරීමයි. මෙහි දී විවිධ සංස්කෘතික පසුබිම්වලින් මිනිසුන් කායිකමය හා සමාජමය වශයෙන් හුදෙකලා වීම පිළිබිඹු කළ හැකි ය. ඔවුන් සම්පූර්ණයෙන් ම ජනවාර්ගිකවාදීන් වේ. මෙම අවධියේ දී, මිනිසුන් තමන් නිවැරදි යැයි විශ්වාස කරන අතර වෙනස් වූ අනෙක් අය "ව්‍යාකුල" යැයි විශ්වාස කරමින් තම වටිනාකම් පද්ධතිය අන් අය මත පැටවීමට පෙළඹෙති.

දෙවන අදියර "ආරක්ෂාවයි (Defense)". මෙහි දී යම් යම් සංස්කෘතික වෙනස්කම් පවතින බව පුද්ගලයකු පිළිගත් නමුත් එම වෙනස්කම් ඔහුගේ හෝ ඇයගේ ආත්ම විඥානයට තර්ජනයක් වන හෙයින් එම වෙනස්කම්වලට එරෙහිව පුද්ගලයා ආරක්ෂාව ගොඩනඟා ගනී. එමෙන්ම ආරක්‍ෂක අවධියේ සිටින මිනිසුන් තමන්ගේ ම සංස්කෘතියේ සාමාජිකයන් සමඟ එක් ව සිටින අතර, වෙනත් සංස්කෘතීන්හි සාමාජිකයින් සමඟ සම්බන්ධතා පැවැත්වීමෙන් වැළකෙති.

බෙනට් හඳුන්වා දුන් මෙම ආකෘතියෙහි තුන්වන අදියර නම් "අවම කිරීමයි (Minimization)". මෙම අවදියෙන් සිටින ඕනෑම පුද්ගලයෙකු සංස්කෘතික වෙනස්කම් පිළිගන්නා නමුත් ඒවා සුළු කොට සැලකීම මෙහි විශේෂතාවය වේ[33].

මානව කේන්ද්‍රණවාදයට පෙළඹීමට බලපාන ලද හේතු පිළිබඳ සාකච්ඡා කිරීමේ දී සංස්කෘතීකරණය හේතුවෙන් පුද්ගලයන් තම පාර්ශවය කෙරෙහි ගැඹුරු පක්ෂපාතීත්වයක් දක්වන අතර, සම්මතයන් අනුගමනය කිරීමට හා ආශ්‍රිත සාමාජිකයින් සමඟ සබඳතා වර්ධනය කර ගැනීමට වැඩි අවකාශයක්

[32] Tropp, L., & Pettigrew, T. (2005). Differential Relationships Between Intergroup Contact and Affective and Cognitive Dimensions of Prejudice.
[33] Bennett, T. (2017). Creating a Culture: How school leaders can optimise behaviour.

පවතින්නේ ය. සංස්කෘතිකකරණයට සම්බන්ධව ජනවාර්ගික කේන්ද්‍රණවාදය පරම්පරාගත ගැටලුවක් වශයෙන් හඳුන්වනු ලැබේ. පක්ෂපාතිත්වය තුළින් තම පාර්ශවයෙහි අනුමැතිය වඩා හොඳින් වර්ධනය වන නමුත් අනෙකුත් සංස්කෘතීන් සමඟ ඇති සීමිත අන්තර් ක්‍රියාකාරකම් තුළින් සංස්කෘතික වෙනස්කම් කෙරෙහි අවබෝධයක් සහ ඇගයීමක් ඇති වීම වැළකීම හරහා ජනවාර්ගික කේන්ද්‍රවාදය වර්ධනය වීම දැකගත හැකි ය. එමෙන්ම මීට අමතරව, තර්ජනය සහ ආරක්ෂාව කණ්ඩායම් අතර සමානකම සහ කණ්ඩායම් වෙනස සරල කිරීමට සහ නොදැනුවත්කමට නැඹුරු වීම, සමාජ සාධක, පරිණාමීය සාධක සහ ස්වයං උසස් කිරීම යන සාධකයන් මානව කේන්ද්‍රණවාදය තීව්‍ර කිරීමට දායකවන සාධක වශයෙන් හඳුන්වා දිය හැකි ය.

මානව කේන්ද්‍රණවාදය සමඟ පවතින ඉතිහාසයේ ඛේදජනකම සංසිද්ධිය වශයෙන් යුදෙව් ජාතිකයන් ඝාතනය පෙන්වා දිය හැකි ය. හිට්ලර් විශ්වාස කරන ලද්දේ, යුදෙව්වන් මෙන් ම, වෙනත් ජාතීන්ට අයත් මිනිසුන් ඔහුගේ ජනවාර්ගිකත්වයට වඩා පහත් බවත්, ජීවත් වීමට සුදුසු නැති බවත් ය. එමඟින් දහස් ගණන් අහිංසක මිනිසුන් ඔහු කඳවුරුවල දී ඝාතනය කරන ලදී. ඔහු සැමවිට ම සිතන ලද්දේ තම ජාතිය අන් ජාතීන්ට වඩා නිර්මල හා ශ්‍රේෂ්ඨ බව ය[34]. එමෙන්ම අධිරාජ්‍යවාදය ද මානව කේන්ද්‍රණවාදය සඳහා කදිම නිදසුනකි. අප්‍රිකාව, ඇමරිකාව, ඉන්දියාව, ශ්‍රී ලංකාව වැනි ලෝකයේ සෙසු ප්‍රදේශ ඔවුන්ගේ නො දියුණු ස්වභාවයන් නිසා පාලනය කළ යුතු යැයි යුරෝපා රටවල් විශ්වාස කළ අතර, ඔවුන් උසස් ශිෂ්ට සම්පන්න සහ අනෙක් රටවලට වඩා දියුණු යැයි විශ්වාස කරන ලදී. එමනිසා මෙම රටවලට සංවර්ධනය කිරීමට උපකාර කිරීම සඳහා ඔවුන්ට එම රටවල් සිය ග්‍රහණයට ගන්නා ලදී. මානව කේන්ද්‍රණවාදය ත්‍රස්තවාදයට පදනම වී ඇත. මෙහි දී ශ්‍රී ලංකාවේ 2019 වසරේ සිදු වූ පාස්කු ප්‍රහාරය සිදුවීමට පසුබිම සැලසෙන්නේ ද අන්තවාදී අදහස් තුළිනි. අන්තවාදී අදහස් තුළ තමන්ගේ ජාතිය උසස් ලෙස සැලකීම හා අනෙක් සියලු ජාතීන් ප්‍රතික්ෂේප කිරීම තුළින් නූතන ත්‍රස්තවාදීන් බිහිවීමට පසුබිම සැළසෙන්නේ ය. එමෙන්ම සිනමාපට හරහා ද සුළු වශයෙන් වාර්ගික අර්බුද මතු කරයි. චිත්‍රපටවල ජනවාර්ගික කේන්ද්‍රවාදය පිළිබඳ තවත් උදාහරණයක් නම් ද "ගෝඩ් ෆාදර්" නම් ජනප්‍රිය චිත්‍රපටයයි. කතාව සකස් වූ කාලයට ගැළපෙන පරිදි වාර්ගික අපචාර, අප්‍රිකානු-ඇමරිකානුවන් පිළිබඳ වෙනස් කොට සැලකීම් සහ ඉතාලි ප්‍රජාව තුළ නිරූපණය වන පුරුෂ ආධිපත්‍යය ජනවාර්ගිකවාදය සඳහා උදාහරණ වේ. එමෙන්ම ඇමරිකානු සමාජයේ පවතින කළු සුදු වර්ගවාදී ගැටුම් තත්ත්වයන් තුළ ද මානව කේන්ද්‍රණවාදී අදහස් පදනම් වී ඇත. මේ සඳහා 2019 වසරේ කළු ජාතිකයකු වන ජෝර්ජ් ෆ්ලොයිඩ් සුදු ජාතික පොලිස් නිලධාරියකු විසින් මරාදැමීම උදාහරණ වශයෙන් පෙන්වාදිය හැකි ය.

මේ ආකාරයට මානව කේන්ද්‍රණවාදය හරහා සංස්කෘතිය තුළ සංස්කෘතික ගැටුම් නිර්මාණය වන අතර, ඒ හරහා බොහෝ පුද්ගලයන් අපරාධකාරී චර්යාවන්ට නැඹුරුවීමක් දැකගත හැකි ය. ඊට සාපේක්ෂව ම අපරාධ වින්දිතයන් ප්‍රමාණයක් සමාජය තුළ මානව කේන්ද්‍රණවාදය හරහා බිහි වේ. මෙලෙස බිහිවන සංස්කෘතික ගැටුම සඳහා ප්‍රතිකාරයක් වශයෙන් සංස්කෘතික සමෝධානය බිහි වී ඇත.

[34] Magilow, D., & Sinnreich, H. (2021). The Holocaust and New World Slavery: A Comparative History. *Holocaust and Genocide Studies*.

යම් සංස්කෘතියක මිනිසුන් තමන්ගේ සංස්කෘතිය හා ආකල්ප හා චාරිත්‍ර වාරිත්‍ර වැනි සංස්කෘතියක හරය අනුගමනය කරන අතර ම, වෙනත් සංස්කෘතීන් සමඟ ඒකාබද්ධතාවය පවත්වාගෙන ජීවත් වීම සංස්කෘතික සමෝධනය වශයෙන් හඳුන්වා දිය හැකි ය. සංස්කෘතික ඒකාබද්ධතාවයේ තවත් පැතිකඩක් නම් වෙනත් සංස්කෘතීන්ට අයත් පුද්ගලයින් තමන්ගේ ම සංස්කෘතියේ අංග නව සංස්කෘතියට හඳුන්වා දීම ය. එමෙන්ම සංස්කෘතික සමෝධානය වශයෙන් සංස්කෘතීන් දෙකක් හෝ කිහිපයක් මිශ්‍ර වීම වශයෙන් ද නිර්වචනය කළ හැකි ය. එය සිදු වන්නේ එක් පුද්ගලයෙක් හෝ කණ්ඩායමක් තම සංස්කෘතිකාංග ඉවත් නොකර වෙනත් කණ්ඩායමක පුරුදු හා විශ්වාසයන්ට අනුවර්තනය වූ විට ය. තව ද සංස්කෘතීන් කිහිපයක් එකිනෙකට සම්බන්ධ වූ විට එය බහු සංස්කෘතික සමාජයක් ලෙස හඳුන්වනු ලැබේ. රැකියා ස්ථාන, විවාහ, සහ ප්‍රජාවන් වැනි විවිධ අවස්ථාවල දී සංස්කෘතික එකමුතුව සිදු විය හැකි ය. සංස්කෘතික සමෝධානය පිළිබඳ අදහස් ඉදිරිපත් කළ පෝල්ගේ ආදර්ශය විස්තර කිරීමේ දී, ඔහු සංස්කෘතික ඒකාබද්ධතාව අත්විඳීමේ දී ඔහු ඇමරිකානු සංස්කෘතියේ හරය අනුවර්තනය වී තමාගේ ම සංස්කෘතිය රැකගත් අතර, ඔහු එය හඳුන්වන්නේ පැවැත්මේ මෙවලමක් ලෙස ය.

ඕනෑම අවස්ථාවක කළු සුදු අවස්ථා ද්විත්වයන් හමුවන අතර, සංස්කෘතික සමෝධානයේ ද එලෙස යහපත් ප්‍රතිඵල මෙන් ම අයහපත් ප්‍රතිඵල ගැබ්ව පවතී. මෙහි ඇති වැදගත් ම වාසිය නම් එය මානුෂීය වටිනාකම් ප්‍රවර්ධනය කිරීම සහ ලාභදායිතාව සමඟ ඵලදායිතාව ඉහළ නැංවීමට අවස්ථාව හිමිවීම ය. එමගින් බොහෝ කුසලතා ඇති කරන අතර, නව්‍ය අදහස් එකිනෙකා අතර හුවමාරු කිරීමට අවස්ථාව හිමි වේ. එමෙන්ම වර්තමාන විශ්වගම්මාන සංකල්පය ප්‍රමුඛ ලෙස ඔප්නැංවීම මෙකී සංස්කෘතික සමෝධානය හරහා සිදු වේ. එහි දී අනෙක් සංස්කෘතිය කෙරෙහි පවතින ආවේගශීලී ප්‍රතිපත්ති සහ ප්‍රතික්ෂේප කිරීම් අවම වන අතර, ඕනෑම සංස්කෘතියක් සම ස්ථානයේ සිට සාමයෙන් ක්‍රියා කිරීමට අවැසි වපසරිය නිර්මාණය වේ. සංස්කෘතික සමෝධානයේ පවතින එක් අවාසියක් නම් එක් එක් සංස්කෘතියෙන් සංස්කෘතියට පවත්නා අගනාකම්හි පවතින විවිධත්වයයි[35]. උදාහරණයක් වශයෙන් හින්දු සංස්කෘතිය තුළ ගවයා ශුද්ධ වස්තුවක් ලෙස සලකන අතර, මුස්ලිම් සංස්කෘතිය තුළ ගවයා, එළුවා පූජා කිරීම සිදු වේ. මෙහි දී සංස්කෘතික අගනාකම්හි පවත්නා විවිධත්වය හේතුවෙන් යම් අවාසිසහගත තත්ත්වයක් මතු වුව ද, සමස්ථයක් වශයෙන් සංස්කෘතික ඒකාබද්ධතාවය වර්තමානයේ බෙහෙවින් වැදගත් සංකල්පයක් වශයෙන් හඳුන්වාදිය හැකි ය[36].

මෙහි දී ප්‍රධාන වශයෙන් ම සංස්කෘතික ගැටුම තුළින් පැන නගින්නා වූ අපරාධකාරීත්වය පාලනය කිරීමක් සංස්කෘතික සමෝධානය හරහා සිදු වේ. මෙහි දී යම් ආකාරයක සංස්කෘතික සමෝධානය අපරාධ පාලන හා නිවාරණ ක්‍රමවේදයක් ලෙස හඳුන්වා දිය හැකි ය. බොහෝවිට මිනිසුන්ගේ ප්‍රචණ්ඩකාරී හැසිරීමට මූලික වන්නේ මානව කේන්ද්‍රණවාදී අදහස් ය. මෙම සංස්කෘතික සමෝධානය හරහා එවැනි මානව කේන්ද්‍රණවාදී අදහස් ප්‍රතික්ෂේප කර ඒ සඳහා සමානාත්මතාව අගය කිරීම සිදු වේ. එමගින් සමාජය තුළ ජාතිවාදී අරගලයන් හෝ සංස්කෘතික අරගලයන් අවම වීම සිදු වන්නේ ය.

[35] Minturn, L. (1983). Ethnocentrism in Cross- Cultural Research; and What to do about it. Behavior Science Research.

[36] Mounsey, S. (2007). Ethnocentrism and attitudes to cultural diversity and immigration: A review; ethnocentrism and attitudes to cultural diversity and immigration in Western Australia.

සුළුතර කණ්ඩායම් අත්විදින අත්දැකීම් හරහා ඔවුන් ඔවුන්ගේ උප සංස්කෘතීන් හා මහා සංස්කෘතිය අතර ගැටුම් නිර්මාණය කර ගන්නා අතර, මෙම ගැටුම පළමු පරම්පරාවට සාපේක්ෂ ව දෙවන පරම්පරාවේ ආවේගශීලී භාවය ඉහළ මට්ටමක පවතින බව ය. එමෙන්ම ප්‍රධාන සංස්කෘතික කණ්ඩායම හා සුළුතර සංස්කෘතික කණ්ඩායම් විසින් ඔවුන් ඔවුන්ට ආවේණික වූ මානයක් ඔස්සේ ඔවුන්ගේ සංස්කෘතිය දෙස බැලීම හරහා ද අපරාධ අනුපාතය වැඩි වීම දැකගත හැකිවන බව ය[37]. මෙහි දී දැකගත හැකි වන්නේ සංස්කෘතික ගැටුමක පළමු පරම්පරාවට සාපේක්ෂ ව දෙවන පරම්පරාව තුළ ආවේගශීලීත්වය වර්ධනය වන බව ය. නමුත් මෙම තත්ත්වය සමනය කිරීමට පවතින සංකල්පයක් වශයෙන් සංස්කෘතික සමෝධානය පෙන්වාදිය හැකි ය. එහි දී යම් සංස්කෘතියක් තවත් සංස්කෘතියකට ගෞරව කිරීම තුළින් සහ මහා සංස්කෘතිය සුළු සංස්කෘතීන් හරහා ඒකාබද්ධතාවෙන් යුතුව ක්‍රියා කිරීම හරහා සංස්කෘතික ගැටුම අවම වීමක් දැකගත හැකි ය. මේ සඳහා ගෝලීය වශයෙන් උදාහරණ රැසක් පෙන්වාදිය හැකි ය.

තිරසාර සංවර්ධනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී සුළු ජාතීන්ගේ සංස්කෘතික සමෝධාන කාර්යභාරය පරීක්ෂා කිරීම සඳහා බෝල්කන් ප්‍රදේශය ආශ්‍රයෙන් කරනු ලැබූ පර්යේෂණයට අනුව සංස්කෘතික සමෝධානය සඳහා අවශ්‍ය පළමු සාධකය නම් වෙනත් සංස්කෘතීන් කෙරෙහි උනන්දුවක් දැක්වීමට නැඹුරුතාවයක් ඇති වටිනාකම් පද්ධතියක් තිබීමයි. මෙහි මූලික හරය වන්නේ සංස්කෘතික හා සදාචාරමය දැක්ම අන් අය සමඟ කෙතරම් අවංක භාවයකින් හුවමාරු කර ගන්නේ ද යන්නයි. එමෙන්ම මොවුන් අනෙක් සංස්කෘතීන් හා බැඳී පැවතීම ඔවුන්ගේ ජීවන තත්ත්වය මත දැඩි ලෙස රඳා පවතින ක්‍රියාවලියක් වන බවත්, සමාජය තුළ දරිද්‍රතාවය ඉහළ යාම හරහා ජාතිකවාදී හා ජාතිවාදී ව්‍යාපාරවල නැඟීම උත්තේජනය කරන බව ද, එමඟින් ඒකාබද්ධ වීමේ ක්‍රියාවලිය සංස්කෘතික හුදකලාව වෙත යොමු කෙරේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් සුළු ජාතීන්ට හිමි සම ස්ථානය අහිමි වන බව ඔහුගේ නිගමනය වී ඇත[38].

මේ අනුව ගත් කල සමාජය තුළ සංස්කෘතික ගැටුම සිදුවීමට බලපානු ලබන ප්‍රධානතම සාධකය වශයෙන් මානවකේන්ද්‍රණවාදය හඳුන්වාදිය හැකිය. එහිදී මානව කේන්ද්‍රණවාදය හේතුවෙන් සංස්කෘතික සමාජය තුළ ගැටුම් නැතහොත් අපරාධකාරී චර්යා ඇති වන බව පෙනී යයි. අතීතයේ සිටම වර්තමානය දක්වා සමාජය තුළ ඇතිවන අපරාධයන්ගෙන් බොහෝ අපරාධයන් ඇතිවීමට හේතු වී ඇත්තේ මෙම මානව කේන්ද්‍රණවාදයයි. තම ජාතිය උසස් බව සිතීම හා අන්‍ය ජාතීන් පහත් කර සැලකීම හරහා බොහෝ අපරාධයන් මෙන්ම පුද්ගල වින්දිතභාවයට ද එය හේතුවක් වී ඇත. මේ අයුරින් ඇතිවන ගැටුම්කාරී තත්ත්වයන් සමනය කිරීම සඳහා සංස්කෘතික සමෝධානය භාවිතා කරනු ලැබේ. මෙය අපරාධ නිවාරණ ක්‍රමවේදයක් වශයෙන් ද හැඳින්විය හැකිය. එනම් සමාජය තුළ මතුවීමට ඉඩ තිබෙන සංස්කෘතික ගැටුම්කාරී තත්ත්වයන් මෙම සමෝධානය හරහා අවම වීමක් දැකගත හැක. එමඟින් සමාජයේ ජීවත්වන සියලු දෙනා එක සමාන අයුරින් සිතන අතර එමඟින් ගැටුම් අවම වේ.

[37] Anderson-Levitt, K. (2012). Complicating the concept of culture. *Comparative Education*.
[38] Danchev, A. (2008). Problems Of Cultural
Intergration In Transition Societies- Case Study Of Bulgaria.

# 7. Culture Conflict and Criminal Justice

**N.D.D.N. Weerasinghe**
**R. H. I. B. Chandrasekera**
**K.B.D.M.K.S. Dissanayake**

## Introduction

Culture consists of patterns of and for behavior acquired and transmitted by symbols. The essential core of culture consists of traditional ideas and their attached values. Culture is the characteristic of a group of people defined by everything such as language, religion, lifestyle, etc. Even though different people in various societies have diverse cultures, they also have some similarities. Culture is more important for all the things we do in the world. The beliefs create religion, wars, the way of, life and many challenges. The first thing which is to be defined is that, the culture and why it is important in work-life.

Schein (1990) defines culture in managerial terms as "how people feel about the organization, the authority system and the degree of employee involvement and commitment"; he continues, adding that culture can be viewed as a widely held, shared set of values, beliefs, and ideas[39]. According to the research paper done by Antonio Lebron quotes "culture refers to society and its way of life". It is defined as a set of values and beliefs, or a cluster of learned behaviors that we share with others in a particular society, giving us a sense of belongingness and identity.

Conflict is defined as a clash between individuals arising out of a difference in thought process, attitudes, understanding, interests, requirements, and even sometimes perceptions. A conflict results in heated arguments, physical abuses, and definitely loss of peace and harmony. Conflict has been a feature of human society since time immemorial. Disputes that arise may be organized around social class[40]. Conflict is simply define behavior by which individuals differ in their emotions, thoughts, or acts. Collins (1995) emphasizes that the conflict is a "serious disagreement and debate over something important" and therefore a "serious discrepancy between two or more views, ideas or desires". In general, conflicts are considered the root cause of disputes.

---

[39] Lebrón, Antonio. "What Is Culture?" Merits Research Journal, vol. 1, pp. 126–33

[40] MURSHED, S. M. (2002). Conflict, Civil War and Underdevelopment: An Introduction. Journal of Peace Research, 39(4), 387–393.

In the context of conflicts, those can occur between two or more subcultures. This is due to the contradictions in their behavior. Rituals that are considered virtuous in one culture may be adverse in another. In a particular culture, adultery can be acceptable whereas, it may be rejected by another. Some subcultures can act as anti-social culture, challenging the main culture. A subculture has the ability to subjugate the mainstream culture and propagate more strongly over that mainstream culture. Cultural values are considered to be anti-denial culture, following a culture that is antithetical to the mainstream culture. The language patterns were inherent in the sub-culture group clash with the foremost culture when making values and lifestyles. Conflicts between groups, both traditional and modern, in culture are also considered cultural conflicts.

The cultural conflict that, when one group's legal standards are extended to places where they were previously unknown may be expected to lead to violations of those norms by people living in the subject area. Accordingly, cultural conflict is a conflict of conduct norms, that such conflict may arise because of a process of group differentiation within a cultural system or area, or as a result of contact between norms drawn from different cultural systems or areas[41]. Accordingly, when ethnic groups are representing several cultures in the same society, conflicts arise due to cultural incompatibilities. For example, the cow, a sacred animal of the Hindus in Indian society, is killed by Muslims in the same society for their food. Based on this, there is animosity towards Muslims among Hindus.

As a result of the cultural conflict, criminal behaviors and deviant behaviors are occurring in society. With the criminal behaviors and deviant behaviors, laws are made by the society. Patrick Devlin famously argued that the law should be used to enforce the norms of a society's culture. "Society means a community of ideas; without shared ideas on politics, morals, and ethics no society can exist... If men and women try to create a society in which there is no fundamental agreement about good and evil they will fail; if having based it on common agreement, the agreement goes, the society will disintegrate. For society is not something that is kept together physically; it is held by the invisible bonds of common thought… A common morality is part of the bondage. The bondage is part of the price of society; and mankind, which needs society, must pay its price"[42].

[41] Selin, T. (1938). Culture Conflict and Crime. American Journal of Sociology, 44(1), 97–103

[42] Post, Robert. "Law And Cultural Conflict." Chicago-Kent Law Review, vol. 78:485, 2003, pp. 486–503.

In consequence of its innate role in protecting the values and national identity, criminal law can be contravened with the culture. If culture is seen as a social scheme conveying implicit or explicit patterns of behaviors, the law should be considered one of the most binding and broad agencies able to influence actions. The law is frequently used by the government or society as a tool of social engineering and to govern the society. Accordingly, there is a considerable discrepancy between using the law to enforce the culture. With the law enforcement in various societies, a conflict would begin as a root cause of culture.

In cultural conflict situations, cultural minorities that act according to their cultural norms, values, and worldviews may be accused of committing crimes because the criminal law reflects the dominant groups' norms, values, and worldviews. The argument that cultural practices should not be recognized if they limit individual liberties or gender discrimination has been criticized for being based on value judgments of minority cultures, promoting one culture over other cultures, and presuming that Western values are superior to other cultures. For instance, it was argued that the idea of human rights is not based on universal concepts but lies in Western and liberal perceptions. Likewise, it is problematic to limit cultural relativism based on the liberal idea of the harm principle because the definition of “harm” is culturally relativistic.

In addition to that, the behavior of criminal justice is often in conflict with each other and the society. A society's decision to punish offenders may vary depending on its culture. Diverse views can exist in a single culture with the context of punishments. For example, Middle East countries usually apply Shariya law in the criminal justice system. According to that law, anyone can be punished without considering other cultures. As a result of that, cultural conflicts have emerged. In a case study from Italy, Muslim father was accused of child abuse for battering his daughter in order to reinforce rules put forth in the Quran. The defendant argued that criminal law should have considered his cultural values before charging him. He denied the existence of mens rea on account of a cultural factor; he argued that battering is considered to be a means of education in his culture [43].

Regarding the fact, the cultural conflict is highly affected by criminal law and the criminal justice system. Accordingly, an act that is prohibited by law as an offense in one culture is a value or virtue in another culture, leading to a conflict of interest in the administration of justice. For example, in Sri Lanka, it is legal to marry only one woman or one man. But Muslim law

[43] Muzzica, R., Tamborra, T. L., Amarelli, G. (2015). Emerging cultural conflicts in Italy: A challenge for criminal law. International Journal of Sociology and Criminology, 4, 141 - 153.

allows a Muslim man to marry four women. Due to this, there is a cultural conflict between the religions and the legal provisions. The most notable conflicts occur when courts are confronted with cultural offenses.

**Law Enforcement and Culture Conflict**

Culture is man's medium; there is not one aspect of human life that is not touched and altered by culture [44]. Edward Hall in his book "Beyond Culture" states that culture includes one's personality, how people express themselves, the way they think, move, solve their problems, and in much broader terms how the cities are planned out, transportation systems function, economic and government systems planned and functioned, etc. He emphasizes that the culture has an impact on each of our movements, behavior, and the tiniest concern.

As Hall states, "the complexity of culture can best be explained by comparing it to an iceberg. The tip of the iceberg represents the external or conscious part of culture language, customs, food, etc. The portion that lies beneath the water's surface, which makes up by far the larger part of the iceberg, corresponds to the internal or subconscious aspects of culture. This includes beliefs, thought patterns. and world views shared by all people in the same social group" [45].

As cultural diversity broadens and people from different cultural backgrounds interact with each other sharing common amenities, they tend to notice the differences in each culture and compare those values with the values of their own. This involves some aspects of the concept of ethnocentrism where people mentioned above are motivated to become more aware of their own culture and pay more attention to one's own culture seeing how other cultures different from their own.

For example, where a set of Africans are put in a community of entirely white people, the Africans are more likely to become aware of their own culture, looks, color, and values of their own rather than trying to adapt to the culture of the white community. And in contrast, the white community would realize how their own culture differs from that of the Africans. Similarly, a Sri Lankan community living in a particular European country would tend to notice their own cultural differences from that of the European community and they would become

[44] Hall, E. T. (1989). *Beyond culture* (Anchor Books ed). Anchor Books.
[45] Weaver, G., Pitter, G. E., & Colvard, A. L. (1992). *Focus on Cultural Diversity—Law Enforcement in a Culturally Diverse Society*. 11.

more aware of their own culture and would be more likely to celebrate their differences and pay more attention to it than never.

In order to carry out a diligent law enforcement procedure in a culturally diverse environment, it is necessary to identify the nature of the culture in a particular society. Since the cultural diversity is much broader than one could expect, the law enforcement procedure could often bump into cultural barriers that would lead to cultural conflicts hence would result in failure to implement certain laws that would obstruct the cultural values of a part of the society.

The conflict that arises when one group's legal standards are extended to places where they were previously unknown may be expected to lead to violations of those norms by people living in the subject area [46]. It is considered that denying culture and obscuring the effects that it can have on human talents can be as destructive and potentially dangerous as denying evil[47]. Therefore, it is important that the law enforcement procedures consider the cultural disparities and the measures that could be taken to minimize culture conflict as a result of implementation and enforcement of laws.

Customs are considered a major source of common law (English Common Law). Customs and morals play a huge role in shaping up a culture. The law commonly understands itself as enforcing "the common sense of the community, as well as the sense of decency, propriety and morality which most people entertain" [48]. As Robert Post elaborates Sir Patrick Devlin's argument, the arm of a cohesive preceding culture, which is the ultimate source of society's identity and authority, is thus portrayed as the law [49, 50.] In Enforcement of Morals Sir Devlin emphasizes, "It cannot say, for example, that murder and theft are prohibited because they are immoral or sinful. The State must justify in some other way the punishments which it imposes on wrongdoers and a function for the criminal law independent of morals must be found" [51]. The state or the law-making authority come into play when it is necessary to establish one law in a country despite cultural disparities.

[46] Sellin, T. (1938). Culture Conflict and Crime. *American Journal of Sociology*, *44*(1), 97–103.
[47] Hall, E. T. (1989). *Beyond culture* (Anchor Books ed). Anchor Books.
[48] COMMONWEALTH of Pennsylvania V. RANDALL, 133 A.2d 276 (Supreme Court of Pennsylvania Pa. Super. Ct 1957).
[49] Post, R. (2003). Law and Cultural Conflict. *SSRN Electronic Journal*. https://doi.org/10.2139/ssrn.396860
[50] Rostow, E. V. (1960). The Enforcement of Morals. *The Cambridge Law Journal*, *18*(2), 174–198.
[51] Devlin, P. (1965). *The enforcement of morals*. Oxford University Press.

In addition to enforcing ambient cultural norms, law also serves two other tasks. To begin with, the government frequently employs law as a weapon of social engineering to achieve politically acceptable goals. Second, law can be utilized to modify and revise culture. Law is more than a mirror of pre-existing cultural norms; it is also a medium that both instantiates and establishes culture. All of these diverse cultural interactions can and do be performed by law [52]. In the case of the family, for example, when it imposes parental obligations that reflect traditional family roles, the law reinforces prior cultural norms. Illegitimacy, adoption, maintenance, and abortion have all been addressed by the law in attempt to alleviate and reduce the customary stigma associated with them.

In addition to customs and norms, religion is another major aspect that constitutes culture. Where the religion centered cultural values contradict with the law enforcement, could also contribute to this long going issue between law enforcement and culture conflict [53]. The religious pressure groups often try to challenge the liberal expression of the separation of religion and state. It is one of the basics of liberalism in political science that religion should not be involved in the lawmaking process. However, most Asian countries act contrary to this concept. For example, Sri Lanka from its constitution itself declares that it is a Buddhist state. The law-making authority would always go for instructions of the religious leaders and would take their opinions into consideration when making laws. On the other hand, it is evident that some of these religious interventions are obstructing the development of a country economically as well as socially. Few of the major concerns with regard to their associated laws at the moment are abortion, prostitution, use and sale of liquor, casinos etc. Although the religious intervention related to these concerns are somewhat justifiable in certain aspects within the mindset of an Asian, in the Western world which appreciates liberalism, they have been given freedom to make decisions by each individual at their own interest. For example, abortion law has given freedom to either keep a baby or to abort if the mother’s conditions are not suitable to bear a child, use and sale of liquor is up to a person’s interest while in Sri Lanka there are many restrictions exist in obtaining a liquor permit to sell alcoholic beverages, casinos are recognized as a source of income to the country etc.

[52] Mezey, N. (2003). Law as Culture. In A. Sarat & J. Simon (Ed.), *Cultural Analysis, Cultural Studies, and the Law: Moving Beyond Legal Realism* (pp. 37-72). New York, USA: Duke University Press. https://doi.org/10.1515/9780822384755-002

[53] Harding, S. (2003). *Law and Cultural Conflict: Introduction*. *78*, 7.

However, it is necessary that law enforcement develops cultural empathy in order to minimize cultural conflicts that arise in the process of law making and enforcement.

**Impact of Cultural Conflict on Criminal Justice**

When cultural conflict comes through the criminal justice system, the statement of Dr. Weaver is important. “The criminal justice community needs to weave cross-cultural awareness into all aspects of law enforcement training” [54]. According to that, this shows how important cultural conflict is to criminal justice. Further, culture mainly affects criminal justice. The criminal justice system exists according to the cultures of different societies. For example, how a society decides to punish offenders may vary depending on its culture.

- “Eye for an Eye”—equal retribution for a wrong.
- “Just Desserts”—appropriate punishment to occur sometime in the future. This can include the offender’s being assaulted or killed while in jail or prison.
- “Lock the door and throw away the key”—a conservative view that sees the need to be “tough on crime.”
- “Rehab for everyone”—a liberal view that wants to reform the system to better address the needs of the offender and society [55].

Accordingly, these types of criminal justice are different from one culture to another culture according to their norms and values. With regard to these concepts cultural conflicts are emerging.

It is crucial to recognize that cultural diversity and criminal law interact on two levels. First, there are debates concerning what should be criminalized, such as whether cultural minorities should be protected from laws that would otherwise make their traditional behaviors or practices illegal. Second, there are concerns about the rules for assigning blame and determining punishment for individuals who have allegedly broken the law, as well as whether members of cultural minorities should be able to use “cultural evidence” or a “cultural defense” as a justification or other means of avoiding (full) liability.

[54] Gladis, Dr. Stephen D. “Law Enforcement.” United States Department of Justice , vol. 61, 1992
[55] Priest, L., Lawrence, F., Delaney, R., Smith, D., & Bynum, R. (n.d.). *Philosophy of Punishment, Justice, and Cultural Conflict in Criminal Justice*. Police Chief. https://www.policechiefmagazine.org/philosophy-punishment-justice-cultural-conflict-criminal-justice/

These two sets of questions pose very different challenges. Answers to the first question are based on forward-thinking thoughts about the type of society we want to live in and the types of interactions we want to allow or forbid. The second question, on the other hand, has a strong backwards-looking aspect, where people want their standards for determining responsibility and punishment to reflect the actual blameworthiness of the specific individual being prosecuted for a specific conduct in the past [56].

While there are valid reasons for criminalizing the possession of narcotics in the future, the fact that some indigenous American cultures have long used peyote in religious rites may provide a valid justification to exclude them from this legal necessity. The existence of discussions regarding exemptions, however, does not negate the point: it is unavoidable that criminal law in modern multi-ethnic countries, in pursuit of valid forward-looking purposes, will outlaw some actions that have been part of some groups' habits. For instance, in Sri Lanka prostitution, drugs, casino are not legalized because of the culture.

Law is "perennially implicated in cultural conflict", as Robert Post so clearly states in his article. It does not, and cannot, exist independently from the cultures that create it. It would be a folly, though, to disregard it as purely a cultural extension. Law, which is a powerful tool with analytic frameworks and affirmative capacities., "constitutes the very culture in whose service it purports to act." [57]. Professor Nancy Kim argues that defendants from cultural minority groups are treated unfairly because the criminal law fails to account for cultural differences when defining the mental elements of crimes [58].

Laws, by their very nature and in all of their forms, whether judicial or legislative generated, cannot be neutral. Legal choices that mediate between opposing cultural viewpoints and legal judgments are always culturally significant. According to Post, "the responsibility of interpreting cultural values" is part of legal analysis. As a result, neutrality appears to be an inappropriate starting point for discussions on the legal management of cultural differences.

For example, there are child marriages that are adapted to certain tribal societies and these conditions are child sex offenses but under those social conditions, they do not condemn such

[56] Sarah Harding, Law and Cultural Conflict: Introduction, 78 Chi.-Kent L. Rev. 479 (2003). Available at: https://scholarship.kentlaw.iit.edu/cklawreview/vol78/iss2/2
[57] Post, R. (2003). Law and Cultural Conflict. *SSRN Electronic Journal*. https://doi.org/10.2139/ssrn.396860
[58] Nunn, K. B. (2006). *New Explorations in Culture and Crime: Definitions, Theory, Method*. 19.

acts as wrongdoing. For example, in active Muslim child marriages in Sri Lanka, the Muslim tradition states that a girl under the age of 12 can be married off with the permission of a special religious judge called Kwai. But it can be interpreted under the statutory rape of women under the common law of Sri Lanka. However, according to Muslim culture, it is not a punishable offense. In such cases, cultural conflicts develop in the administration of criminal justice.

In addition to that, culture clashes with the criminal laws and societal values emerged cultural conflict in criminal justice. For example, in America, in recent years, the courts have faced such "clash of culture" problems more frequently. A Nigerian insurance salesman in Houston, accused of child abuse, received probation after he argued that putting pepper in the abrasions of a child was acceptable discipline in Nigeria. Also, a Vietnamese family avoided child abuse charges after authorities determined that a boy's wounds were caused by caogio, a folk remedy for curing headaches by massaging the back and shoulders with the serrated edge of a coin [59]. Accordingly, with cultural clashes the conflicts between criminal justice and culture emerged.

Therefore, in conclusion we could identify that punishment philosophy is ingrained in criminal justice culture and society. Many people hold strong opinions on punishment, which impact the actions and decisions of criminal justice officials, legislators, and police officers.

"Somehow, we've gotten the idea that we are different, and we have put up an imaginary boundary based on the demographics of the world…we put up all these imaginary lines and the world is not like that…All they (barriers) keep us from doing is what we really need to do to be productive".

For many years, there has been a social barrier between the criminal justice system and the community. Authorities have made some progress, but they are still having difficulties. To accomplish fairness and justice while minimizing cultural conflict in criminal justice, educational institutions, government authorities, law enforcement agencies, and the community must unite and work together.

[59] Choi, C. (1990). Application of a Cultural Defense in Criminal Proceedings. *UCLA Pacific Basin Law Journal*, *8*(1). https://doi.org/10.5070/P881021963

# 8. සමාජ වෙනස්වීම, අපරාධ හා වින්දිතභාවය

ඩබ්ලිව්.ආර්.ඩී.ටී බණ්ඩාර
එම්.කේ.සී මදූෂිකා
එන්.ඩී.ඒ ධනංජලී

මැක් අයිවර් ට අනුව සමාජ වෙනස්වීමක් යනු පවත්නා මනුෂ්‍ය සබඳතා වල වෙනස්වීම යි[60]. වර්ෂ 1920 දී පමණ යුරෝපයේ ආර්ථිකය කඩා වැටීම නිසා බැංකු හා මූල්‍ය ආයතන බිඳවැටීම, ව්‍යාපාර කඩාවැටීම උකස් ආයතන බිඳ වැටීම හා ජනතාවට ඔවුන්ගේ රැකියා නොමැති වීම ආදී විශාල වෙනස්කම් ගණනාවක්ම ඇති විය. මෙම තත්ත්වය හේතුවෙන් ඇතිවන සදාචාර ප්‍රමිති බිඳවැටීම අපරාධවිද්‍යා ක්ෂේත්‍රයට පුළුල් ලෙස බලපෑම් කර ඇත. ප්‍රංශ සමාජ විද්‍යාඥයකු වූ එමිල් ඩූර්කයිම් විසින් 1897 දී ප්‍රකාශයට පත්කරනු ලැබූ සියදිවි නසා ගැනීම කෘතිය තුළින් අනෝමීයත්වය ලෙස අර්ථ දක්වා ඇත[61]. ඔහුගේ අධ්‍යයනයේ දී, සියදිවි නසා ගැනීමේ හැසිරීම නියාමනය සඳහා අවශ්‍ය සමාජ ප්‍රමිති බිඳවැටීම හේතුවෙන් සියදිවි නසා ගැනීමක් ඇති වූ බව විශ්වාස කළේය. ඩූර්කයිම් විසින් ඉදිරිපත් කරන ලද අනෝමීය න්‍යාය සමාජ විද්‍යාත්මක වශයෙන් වැදගත් වන අතර මෙම න්‍යාය ගුරුකොටගෙන Strain Theory හරහා අපරාධ විද්‍යාත්මක වශයෙන් වැදගත් වන කරුණු ගණනාවක් ඉදිරිපත් කිරීමට රොබට් කේ මර්ටන් විසින් "සමාජ න්‍යාය හා සමාජ ව්‍යුහය" යන කෘතිය 1957 දී ඉදිරිපත් කරයි[62]. නිශ්චිත සමාජ සංස්කෘතික සන්දර්භය තුළ සමාජ වෙනස් වීමත් සමඟ අපරාධකාරිත්වය හා වින්දිතභාවය ස්ථාපිතවීමේ දී අනෝමිය සංකල්පය මූලික වේ.

සමාජ වෙනස්කම් විශේෂයෙන්ම සමාජ ආයතනවල වෙනස්වන කාර්යභාර්ය සහ සමාජ සැකසුම් වල ගතික ස්වභාවය මානව හැසිරීම්වලට කෙසේ බලපාවිද? යන්න තේරුම් ගැනීමට අනෝමිය සංකල්පය උපකාරි වේ. අනෝමීයත්වය යනු, ප්‍රතිමාන විරහිතභාවයයි. එනම් සාරධර්ම හා ප්‍රතිමාන වල බිඳවැටිමකි. අනෝමීය න්‍යායේ කේන්ද්‍රීය මූලධර්මය වන මිනිස් හැසිරීම් පදනම් වී ඇත්තේ මිනිස් අරමුණු හැඩගස්වන සම්මතයන් හා මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පිළිගත හැකි මාධ්‍යයන් මතය. මර්ටන් යෝජනා කරන පරිදි ඉලක්ක කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම හෝ ඩූර්කයිම් තර්ක කරන පරිදි පෞද්ගලික ආශාවන් සඳහා ප්‍රමාණවත් සදාචාරාත්මක රෙගුලාසි හේතුවෙන් මෙම අරමුණු සහ ඒවායේ විධි අතර අසමතුලිතතාවක් ඇති වූ විට අනෝමීයත්වය හටගනී. කාර්මික විප්ලවය තුළ ජීවත් වූ ඩූර්කයිම් මුලින්ම දුටු සමාජ හා මානසික වෙනස්කම් සඳහා ආනුභවිකත්වයක් එක් කිරිම සඳහා අනෝමිය සංකල්පය වර්ධනය කළේය. ඔහු සමාජ පරිවර්තනයේදී ආර්ථික හා දේශපාලන වාතාවරණයන්හි වේගවත් වෙනස්කම් පවත්නා සැකසුම් බිඳවැටීමට දායක වන බව

[60] Dmore,W,E. (1960). A Reconsideration of Theories of Social Change. *Amarican Sociological Review, 25(6), 810-818*. https://www.jstor.org/stable/2089978
[61] Barnes,J,A. (1996). Durkheim's Division of Labour in Society. *Royal Anthropological Institute of Great Britain and Ireland, 1(2), 158-175*. https://www.jstor.org/stable/2796343
[62] Merton,R,K. (1938). Social Structure and Anomie. *American Sociological Review, 3(5), 672-682*. https://www.jstor.org/stable/2084686

පවසයි. සදාචාරමය සංස්කෘතිමය බාධක නිසා පුද්ගල ආශාවන් ඉටු කරගැනිමට නොහැකි වූ විට සහ සමාජය නවීකරණය කිරීමේදී ප්‍රමාණවත් ලෙස ව්‍යුහාත්මක බාධක ඇති නොවන විට අනියම් හැසිරීම දෙසට පුද්ගලයන් තල්ලු කරනු ලැබේ.

සමාජ හා සංස්කෘතික ව්‍යුහයේ ප්‍රධාන අංග දෙකක් ඇති බව මර්ටන් තර්ක කරයි. එනම් සමාජයීය වශයෙන් වටිනා අරමුණු සහ එවැනි අරමුණු සාක්ෂාත් කර ගැනීමට පිළිගත හැකි ක්‍රමයයි. සමාජයේ සියලුම සාමාජිකයන් විසින් සංස්කෘතිමය වශයෙන් අර්ථ දක්වා ඇති සහ බෙදා හදා ගන්නා මෙම අරමුණු බොහෝවිට ගෞරවය හා සම්බන්ධ වේ. විසිවන සියවසේ මැද භාගයේ ඇමරිකානු සමාජය තුල "ඇමරිකානු සිහිනයේ" පරිභෝජනය කැදරකම හා භෞතික වාදය විසින් මූල්‍යමය සාර්ථකත්වය ලබා දීම නිසා සමාජය අරමුණු හා මාධ්‍යන් අතර පවතින නොගැලපීම හේතුවෙන් අනෝමීයත්වය ඇති වෙන බවට මර්ටන් පවසයි. සමාජ වෙනසත් සමග ඇතිවූ නව සමාජ ක්‍රමය සමහර කණ්ඩායම් කෙරෙහි සැලකිය යුතු පිඩනයක් එල්ල කරන්නේ කෙසේද යන්න අවබෝධ කරගැනීමට හැසිරීම් හා සංසන්දනය කරන ලදි. නිශ්චිත අරමුණු මත තැබූ අසමාන මානසික ආතතිය හේතුවෙන් මිනිසුන්ට අවසරලත් ක්‍රම නොසලකා හැර ඒ වෙනුවට අවශ්‍යතා සඳහා වෙනත් ක්‍රම ලුහුබැද යා හැකිය. ඉලක්ක පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සහ එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නීත්‍යානුකූල ක්‍රම මත පදනම්ව තනි පුද්ගලයන්ට ප්‍රතිචාර කිහිපයක් ලබා ගත හැකි බවත් වඩාත් පොදු ප්‍රතිචාරය වන්නේ අනුකූලතාවය බව මර්ටන් පැහැදිලි කරයි. මාධ්‍යයන් සහ අරමුණු යන දෙකම පිළිගත් විට අනුකූලතාවය සිදුවේ. අනෙක් අතට අරමුණු සහ මාධ්‍යයන් දෙක ම ප්‍රතික්ෂේප වූ විට පසුබැසීම, කැරැල්ල, චාරිත්‍රවාදය සහ නවෝත්පාදනයන් යන අනුගත කිරීම යන හතර අපගමනය වේ[63]. මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන්, මානසික ව්‍යාධින්ගෙන් පෙලන්නන් පසුබැස යන්නන් වන අතර, සමාජයේ අරමුණු සහ මාධ්‍ය දෙකම ප්‍රතික්ෂේප කිරීමට හෝ පිළිගැනීම කැරැල්ලට ඇතුළත් වේ. එයට පවත්නා සියලුම ප්‍රමිති වෙනස් කිරීම හා නව සමාජවල සමාජ පිළිවෙලක් සඳහා ආශාවක් ඇති වේ. චාරිත්‍රනුකූලවාදය විස්තර කරන්නේ සංස්කෘතික අරමුණ කෙරෙහි මිනිසුන්ගේ කැපවීමක් නැති වුවත් මාධ්‍යයන් සමග දැඩි බැඳීමක් පවත්වාගෙන යන අවස්ථාය. චාරිත්‍රානුකූලවාදීන් සමාජය අපේක්ෂාවන්ට අනුකූල වන නමුත් පොදු අපේක්ෂාවන් අතහැර දැමීම නිසා අපගමනයක් ලෙස සැළකේ. අවසාන වශයෙන් නවෝත්පාදනයන් සිදුවන්නේ මිනිසුන් එකම සංස්කෘතික වටිනාකම් වෙත ඇදී ගියත් ඒවා සාක්ෂාත් කර ගැනීම සඳහා නිත්‍යානුකූල උපක්‍රම අත්හැරිය විට ය.  මර්ටන් පවසන පරිදි නීත්‍යානුකූල නොවන ලෙස ගැළපීම සිදු වන්නේ සමාජයේ සියලුම සාමාජිකයන් සඳහා එකම ඉලක්ක තබා ඇති නමුත් පංති ව්‍යුහයන් නිසා එවැනි ඉලක්ක සඳහා අසාර්ථක ප්‍රවේශයක් ලබා දෙන නිසාය.  එකම ජයග්‍රහණය ලබාගැනීමට උගන්වන නමුත් ඒවා සාක්ෂාත් කර ගැනීමට ආයතනික බාධක වලට මුහුණ දෙන ජනගහනය මූල්‍යමය සාර්ථකත්වය එක් කර ගැනීම සඳහා අපරාධ විකල්ප මාර්ග ලෙස තෝරාගනී.

[63] Lau, T. F. T. (2020). The Concept of Anomie in Explaining Crime. *Bellarmine Law Society Review*, *11*(1). https://ejournals.bc.edu/index.php/blsr/article/view/12829

1994 දී Messner සහ Rosenfeld විසින් හඳුන්වා දෙන ලද ආයතනික අනෝමීය න්‍යාය (Institutional Anomie theory - IAT) සමාජ වෙනස අධ්‍යයනයේ දී වඩාත් කැපී පෙනෙන න්‍යායකි[64]. සංස්කෘතිය හා සමාජ ව්‍යුහය අතර අන්තර් සම්බන්ධතාව තවදුරටත් පැහැදිලි කරමින් ධනපති වෙළඳපොළ ආර්ථික අපගාමීත්වයට හේතු වන බව දක්වති. අපරාධ සහ ඇමරිකානු සිහිනය තුළ මෙස්නර් සහ රොසෙන්ෆෙල්ඩ් තර්ක කරන්නේ, ආර්ථිකමය නොවන සමාජ ආයතන වලින් දුර්වල පාලනයන් සමඟ මූල්‍යමය අංශය සුරක්ෂිත කිරීම සඳහා සංස්කෘතික හා ව්‍යුහාත්මක වශයෙන් බලපෑම් ඇති කරන බවත් උසස් ආර්ථික අපරාධ ප්‍රවර්ධනය කරන බවත්ය.

**සමාජ වෙනස්වීම අපරාධ වින්දිතභාවය හා සංස්කෘතිය**

කාර්මිකරණය සංලක්ෂිත වූයේ තාක්ෂණික වෙනස්කම් වලින් පමණක් නොව නාගරීකරණය, වැඩ වර්ජනය, බලශක්ති බලමුළු ගැන්වීම සහ වාණිජකරණය සමඟ සමාජ ආර්ථික හා සංස්කෘතික වෙනස්කම්වලින් ය. එහි ප්‍රතිඵලයක් ලෙස යාන්ත්‍රික සහයෝගීතාවයෙන් සංරක්ෂිතව වූ ප්‍රාථමික සමාජය ඩූර්කයිම් දුටු ඓන්ද්‍රීය ඒකාබද්ධතාවයෙන් මුල් බැසගත් සංකීර්ණ සමාජයකට මාරුවිය. කාර්මික විප්ලවය මගින් දැඩි ලෙස වෙනස් වූ ශ්‍රම බෙදීමක් ඇති වුණු නමුත් සමාජයේ සාමාජිකයන් අසමාන ලෙස ධනය රැස් කිරීමට පටන් ගැනීමත් සමඟ සමාජ අසමානතාව උත්සන්න විය. මේ අනුව එමිල් ඩූර්කයිම් තර්ක කරන්නේ මෙම සංකීර්ණ තත්ත්වය යටතේ සමාජ සහයෝගීතාවය වෙනුවට විෂමජාතීයභාවය මුල් බැස බැස ගත් බවත් විවිධ පුද්ගලයන්ගේ අන්තර් සමාජ සහජීවනය රඳා පවතින බවත්ය.

නූතන කාර්මික සමාජයක් තුළ සමාජ අසමානතාවය, පවුල් ගැටලු, ආර්ථික අර්බුද සහ අධික ලෙස ද්‍රව්‍යමය භාණ්ඩ පරිභරණය දක්නට ලැබෙන බව ඩූර්කයිම් සඳහන් කරයි. ඔහු සඳහන් කරන පරිදි සමාජය ශීඝ්‍රයෙන් නවීකරණය වීමත් සමඟ ම නව සදාචාර නියමයන්ට පවතින ආකෘති ඉක්මනින් ප්‍රතිස්ථාපනය කළ නොහැකි බවයි. ඒ හා සමාන ආකාරයකින් ඔහුගේ කාලයේ අද්විතීය සමාජ ආර්ථික තත්ත්වයක් විස්තර කිරීමට අනෝමීයත්වය භාවිතා කරන ලදි. මර්ටන් strain theory හරහා ඇමරිකානු සිහිනයේ මූලික මතවාදයක් ලෙස පරිභෝජනය, තණ්හාව සහ භෞතික වාදය පිළිබඳ වටිනාකම විවේචනය කිරීමක් ලෙස සැලකිය හැකිය. වෙහෙස මහන්සි වී වැඩ කිරීමෙන් ඕනෑම කෙනෙකුට සාර්ථකත්වය ළඟාකර ගත හැකි අවස්ථාවක් ලෙස ඇමෙරිකා එක්සත් ජනපදය පිළිබඳ චිත්‍රයක් (ඇමරිකානු සිහිනය) සිතුවම් කළේය.

උතුරු චිකාගෝහි අධික අපරාධ සහිත ප්‍රදේශ පිළිබඳව අපරාධ විද්‍යාඥ ලෝමන් ගේ අධ්‍යයනය ගත් විට ඔහු තර්ක කරන්නේ ඇමරිකානු සිහිනයෙන් සමාජයේ සියලුම සාමාජිකයන් පෝෂණයවන අතර නුපුහුණු ශ්‍රමිකයන් සහ අඩු ආදායම් ලාභීන් සඳහා ඇති සීමිත වෘත්තිය දියුණුව අවස්ථා සැබෑ මූල සාර්ථකත්වයේ අපේක්ෂාවන් අඩු කරන බවයි. අපරාධ බහුල ප්‍රදේශවල අධ්‍යාපනික හා ආර්ථික සම්පත් හිඟකම හේතුවෙන් මෙම කණ්ඩායම්වල සාමාජිකයන්ට නීත්‍යානුකූල මාර්ගයෙන් සාර්ථකත්වය ළඟා කරගැනීම දුර්ලභ විය. විවිධ ප්‍රවේශයන් මෙම ජනගහනය මත පීඩනයක් ඇති කරන අතර

[64] Bernburg,J.G. (2002). Anomie, Social Change and Crime. A Theoretical Examination of Institutional-Anomie Theory. *The British Journal of Criminology, 24(4), 729-742.* https://doi.org/10.1093/bjc/42.4.729

සංවිධානාත්මක අපරාධ වැනි නීත්‍යානුකූල නොවන ක්‍රම අනුගමනය කිරීමට පොළඹවයි. අනෝමිය සංකල්පය බටහිර ලෝකයෙන් පිටත සමාජ ඓතිහාසික සන්දර්භයන් සඳහා ද අදාළ වේ.

1978 වෙළඳපළ ඉලක්ක කරගත් ආර්ථික ප්‍රතිසංස්කරණ වලින් පසු චීනය අපරාධ අනුපාතය ඉහළ යෑම විශ්ලේෂණය කිරීමේ රාමුවක් ලෙස චීන අපරාධ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති ලින්ඩා ෂාවෝ විසින් "ආයතනික විෂමතා න්‍යාය" භාවිතා කළේය. එම වසරේදීම චීනයේ ප්‍රතිසංස්කරණ හා විවෘත කිරීමේ කාලයේ ආරම්භ වූ අතර ප්‍රතිසංස්කරණ පළමු දර්ශකය තුළ සමස්ත අපරාධ අනුපාතය ඉහළ ගිය අතර බරපතල අපරාධ අනුපාතයේ දස ගුණයකින් වැඩිවිය. ප්‍රචණ්ඩකාරී අපරාධ, දේපළ අපරාධ හා සුදු කරපටි අපරාධ ක්‍රමාණුකූලව ඉහළ ගිය අතර නිදසුනක් ලෙස 1981 සිට 2002 දක්වා කාලය තුළ කොල්ලකෑම් අපරාධ 17 ගුණයකින් වැඩි විය. චීනය වෙළඳපොළ ආර්ථිකය හදිසියේ වෙනස්වීම හා ව්‍යවසායකත්වයේ වටිනාකම් පෞද්ගලික ආර්ථික සාර්ථකත්වය සහ ධනය[65] වර්ධනය කිරීම සඳහා රජය විසින් මෙහෙයවනු ලබන සංස්කෘතිමය වෙනස සමාජයීය වශයෙන් වටිනා ඉලක්ක නැවත අර්ථ දැක්වූ බව ෂාවෝ ප්‍රකාශ කරයි. ධනේශ්වර ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වාදීමෙන් පසු සාමූහිකවාදී සංස්කෘතියකින් සැලකිය යුතු ලෙස වෙනස්වීමත් සිදු වූ අතර එමගින් මූල්‍ය ජයග්‍රහණ පුද්ගල වටිනාකම මනින මිනුමක් බවට පත්විය. කෙසේ වෙතත් වෙරළබඩ නාගරික ප්‍රදේශයන්හි ආර්ථික දියුණුව වඩාත් සංකේන්ද්‍රණය වීමත් සමඟ ග්‍රාමීය සංක්‍රමණික සේවකයින් ඔවුන්ගේ සමාජ සුභසාධනය වැඩසටහන්වලින් බැහැරවීම හේතුවෙන් වැඩි වශයෙන් අධික බරක් දැරීමට සිදුවිය.

අධ්‍යාපනය නොමැතිකම නිසා සහ අතිත් වැඩකිරීමේ වෘත්තිකයන් අවදානමට ඉදිරියට යා හැකි බැවින් මෙම සේවකයින් සුරාකෑමට ලක්විය. ෂාවෝ තර්ක කරන්නේ ග්‍රාමීය සංක්‍රමණික සේවකයින් සාර්ථකත්වය ලබා ගැනීමට නීත්‍යණුකූල ක්‍රමයක් නොමැතිකම අපරාධ දිරිමත් කිරීමට සහ සාහසික හා දේපළ අපරාධවල ඉහළ යාම සඳහා බලපෑ බවයි. මධ්‍යම හා ඉහළ පන්තියේ පුරවැසියන් රජයේ නිලධාරීන්ගේ දූෂණ ක්‍රියාවලියේ යෙදීම නිසා පීඩාවට පත් විය. අඩු වැටුප් ලබන රාජ්‍ය නිලධාරීන්, පක්ෂපාතික නොවන සාමාජිකයන් නව ආර්ථික ප්‍රතිපත්ති තුළින් ධනය රැස් කිරිම සිදුකරන අතර එමගින් සුදු කරපටි අපරාධ සඳහා බලපෑමක් ඇතිවිය. චීනයේ මාක්ස්-ලෙනින්වාදී දේශපාලන මතවාදය සහ ධනේශ්වර මූලධර්ම අතර මතවාදී ගැටුම් ඉහළ පහළ පන්ති දෙකේම වෛරය ඉස්මතු කිරිම චීනයේ සමාජ සංක්‍රාන්ති කාලය පුරාවටම අපරාධ ඉහළ යාමට හේතු විය.

සමාජය යනු විවිධ ආයතන, හර පද්ධතීන්, පුද්ගල හැසිරීම් රටාවන් ආදිය පෙරටු කොට ගනිමින් ගොඩනැගුණා වූ මහා ජීවියෙකි. මෙකී සංකීර්ණ සමාජය තුළ පවතින විවිධ වූ සංසිද්ධීන් හේතුවෙන් සමාජය තුළ නව සංධිස්ථානයන් නිර්මාණය වීමට හේතුවේ. සමාජය තුළ මිනිසුන් ක්‍රියා කරන්නේ සහ සිතන්නේ පොදුවේ බෙදාගත් නිර්වචන සහ සම්ප්‍රදායන් පදනම් කරගෙනය. මර්ටන් දක්වන ආකාරයට සමාජ අසමතුලිතතාවය හේතුවෙන් අනෝමීය බව හටගනී. ඩුර්ක්හයිම් අදහස් කරන්නේ අනෝමීය යනු කාර්මික වශයෙන් වැරදි ලෙස සංකල්පිත සංස්කෘතික අරමුණුය. ඇමරිකානු සමාජ විද්‍යාඥයින් විසින් අවධාරණය කරන්නේ, කාර්යයන් ඉටු කර ගැනීම සඳහා ඇති මාධ්‍ය ප්‍රමාණවත් නොවීම අනෝමීය ලෙස හඳුන්වන බවයි. මෙසේ හඳුනාගන්නා අනෝමීය බව තුළින් ඇති වන

[65] Brenburg, J. G. (2002), Anomie, Social Change and Crime. A Theoretical Examination of Institutional-Anomie Theory, *The British Journal of Criminology*, Volume 42, Issue 4, 729–742, https://doi.org/10.1093/bjc/42.4.729

අවිධිමත්භාවයන් හේතුවෙන් සමාජය තුළ අපරාධකාරී චර්යා රටාවන් ඉස්මතු වේ. පුද්ගලයින් තම ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට යාමේදී ඇතිවන විෂමතා හේතුවෙන් සියදිවි නසා ගැනීමට පෙළඹෙන බව අනෝමීය න්‍යායෙන් දක්වයි. කෙසේ වෙතත් ඩුර්ක්හයිම්ගේ සාකච්ඡාවට අනෝමීය සියදිවි නසා ගැනීම් පමණක් නොව ඉවත් නොවූ වෙළඳපොළ ආර්ථිකය පිළිබඳ පොලනිගේ සංකල්පය තුළින් සොයා බලයි[66]. එහිදී ආර්ථික නොවන ආයතන විසින් වෙළඳපොළ ආර්ථිකය පාලනය නොකිරීම නිසා ත්‍රස්තවාදය මතුවන බව අවධාරණය කරයි. ත්‍රස්තවාදය තුළ බිහිවන වින්දිතයින් ගණන ඉතා ඉහළ වේ[67]. ධනවාදී වෙළඳපොළ ආර්ථිකයේ ස්වභාවය තුළ විෂම සංස්කෘතික සදාචාර ප්‍රභවයන් ඇතුළත් වන බව දක්වයි. මෙහිදී වෙළඳපොළ ආර්ථිකය අසාමාන්‍ය ලෙස බලවත් වූවිට ආර්ථික නොවන ආයතන වලට සාපේක්ෂව අනෙකුත් ආයතන වල සාමාන්‍ය ක්‍රියාකාරීත්වයට බාධා ඇති කරයි. තරඟකාරීත්වයේ වෙළඳපොළ වටිනාකම් සහ භෞතික වාදය අපරාධ වලට හේතුවේ. අනෝමීය යනු එක් අර්ථයක් නොමැත්තකි. එහිදී අනෝමීය යනු ඉලක්කවල අසීමිතභාවයයි. හැඟීම් යනු තෘප්තිමත් කළ නොහැකි සහ පතුලක් නොපෙනෙන ආගාධයකි.

ආයතනික අනෝමීය න්‍යාය යටතේ ප්‍රචණ්ඩ හා දේපළ අපරාධ යන බරපතල කොල්ලකාරී අපරාධ සඳහා අදාළ වේ. මෙහිදී ආයතනික අනෝමීයත්වය දේපළ අපරාධ සඳහා ඍජුවම අදාළ වන බව විද්වතුන් තර්ක කරයි. සමාජ ව්‍යුහය පුරා අවස්ථා බෙදා හැරීමේ දී සමාන අවස්ථා ලබාදෙන බවට දුන් පොරොන්දු ඉටු කිරීමට අපොහොසත් වීම නිසා ගැටලුකාරී තත්ත්වයන් ඇති විය. ආර්ථිකය වෙනත් සමාජ ආයතනයන් විසින් නියාමනය නොකළහොත් සහජයෙන්ම බාධා ඇති කරයි. ආර්ථික නොවන ආයතන මගින් වෙළෙඳපොළ ආර්ථිකය නියාමනය නොකළහොත් වෙළෙඳපොළේ මූලධර්ම සමාජය යටත් කරගනිමින් සමාජයේ ප්‍රමුඛ මූලධර්ම බවට පත්වේ. නොබැඳි ආර්ථිකයක් යනු, සමාජ සම්මතයන් විසින් දුර්වල ලෙස පාලනය වීමයි. එහිදී ඉලක්ක සපුරා ගැනීමේ මාධ්‍යයන් පාලනය කරන දුර්වල සම්මතයන් ඇත. අනෙකුත් සමාජ ආයතන වලින් වෙළෙඳපොළ ආර්ථිකය විසංයෝජනය කිරීම මත එක් අතකට නොබැඳි වෙළෙඳපොළ ආර්ථිකයක් සමාජයේ අනෙකුත් සියලුම අංශ ජනපදකරණය කරයි. එමගින් සංස්කෘතිය තුළ ආර්ථික චේතනාවන් කෙරෙහි දැඩි අවදානයක් යොමු කරයි. ඕනෑම යමක් ඕනෑම වියදමකින් සාක්ෂාත් කරගැනීමට යාමේදී තම සම සාමාජිකයාද තරඟකරුවෙකු වේ. සාර්ථකත්වය සමස්ත සමාජයටම බලපාන අතර එහි මිනුම් දණ්ඩක් වන මුදල් නියමක් නොමැති තත්ත්වයක් කරා යාම සමාජ සත්‍යයකි. මෙම මුදල් මූල බීජය කොට ගනිමින් පුද්ගලයන් ක්‍රියා කරයි. එහිදී තම ක්‍රියාවලීන් කෙසේ හෝ ඉටු කර ගැනීමට අවශ්‍ය වන්නා වූ මුදල් නැමති සාධකය කෙසේ හෝ උපයා ගැනීමට යාම මත පුද්ගලයින් අපරාධකාරී චර්යා රටාවන්ට යොමු වේ. මර්ටන් අවධානය යොමු කරන්නේ විශ්වීය අරමුණු වල සහ සදාචාරය සහ අසමානතාවය අතර ඇති විෂමතාවය පිළිබඳවයි. විෂම සම්මතයන් සහ අරමුණු සංස්කෘතිය විචලනය වන රටාවන් බවට පරිවර්ථනය කරයි. මිනිසුන්ගේ වෛෂයික කොන්දේසි අසමාන ලෙස බෙදා හැරීමේ කාර්යභාර්යය පිළිබඳ මර්ටන් දක්වයි. මිනිසුන්ගේ අරමුණට සංස්කෘතිය නොගැළපීම නිසා නවීකරණය කිරීමට පීඩනයක් ඇති කරයි. සමහර සංස්කෘතික තත්ත්වයන් සමඟ සංයෝජනයෙන් විෂමතාවයක් හා ඉහළ අපගමනයක් ජනනය කරයි.

[66] Davies, P., Francis, P., Greer C. Victims, Crime And Society: An Introduction, Victims, Crime And Society, Second Edition, London: Sage. Https://Uk.Sagepub.Com/En-Gb/Eur/Victims-Crime-And-Society/Book239275

අපරාධ සමාජයේ සාමූහික විඥානය කම්පනයට පත් කරන බව ඩුර්ක්හයිම් පවසයි. එය සමාජයේ සියළුම සාමාජිකයන්ගේ මූලික අරමුණයි. එම සාර්ථකත්වයට යන ගමනේදී ඇතිවන බාධාවන් සමනය කොට ගනිමින් ක්‍රියා කිරීම වැදගත්ය. නැතහොත් එය අපරාධයක මූලාරම්භය වේ යැයි නිගමනය කළ හැකිය.

සමාජ විපර්යාසය සර්ව සම්පූර්ණ නොවැළැක්විය හැකි සංසිද්ධියකි. ප්‍රාථමික දඩයම් කිරීමේ හා රැස් කිරීමේ අවධියේ සිට ගෙවතු වගා, කෘෂිකාර්මික, කාර්මික, නූතන සහ සමකාලීන පශ්චාත් නූතන සමාජය දක්වා මානව සමාජය පරිණාමය වී ඇත. පරිසරය, තාක්ෂණය, සංස්කෘතිය, පෞරුෂය, දේශපාලන, ආර්ථික, ආගමික, මතවාදය, ජනගහන විපර්යාස වැනි සංකීර්ණ අන්තර් ක්‍රියාකාරීත්වයන්ගෙන් යුත් සමාජ හා සංස්කෘතික වෙනස්කම් ඇති කිරීමට සමත් සාධක බවට පත්විය. සමාජය තුළ සමාජයීය හා සංස්කෘතික වෙනස්කම් ඇති කිරීමට බලපාන කරුණු කිහිපයකි. තාක්ෂණය, සංස්කෘතිය සහ සමාජය හැඩගස්වයි. අන්තර්ජාල තාක්ෂණය නූතන සමාජයේ සමාජ ව්‍යුහයේ කොටසක් වී ඇත. ඒ සමඟ සමාජ සංස්ථාවන්ට ද විශාල බලපෑමක් එල්ල වී තිබේ. මෙයට ප්‍රධාන හේතුව වන්නේ, ශ්‍රවණ මාධ්‍යට වඩා දෘශ්‍ය මාධ්‍ය ප්‍රබල වීමයි. අනෙක් අතට නූතන මිනිසුන් වැඩි වශයෙන් මිනිසුන් අතර සම්බන්ධතා පවත්වන්නේ අවම වශයෙනි. ඇතැම්විට එම සබඳතාද තාක්ෂණය හරහා සිදු වේ. මෙවන් තත්ත්වයන් තුල තාක්ෂණය භාවිතා කරමින් අන්තර්ජාලය හරහා සෑම සමාජයක ම සංස්කෘතිය විකෘති වී ඇති අතර එම සමාජයට ආරෝපිත සංස්කෘතිය ගලපා ගැනීමට නොහැකිව අපරාධ සිඳු වේ. ඩුර්කයිම්ට අනුව ඓන්ද්‍රීය සමාජයන් හී මෙම තත්ත්වය නොවැළැක්විය හැකි තත්ත්වයකි. ඒ තුල පුද්ගල අපරාධකාරීත්වය ඉහළයන අතර වින්දිතයින් ත්‍රිත්වයම ඉහළ යන ආකාරය දැකගත හැකිය.

ජනතාවගේ අවශ්‍යතා වන සමාජ පහසුකම්, සමානාත්මතාවය, සමාජ සාධාරණත්වය යනාදිය වෙනස්කම් වලට ලක් වීම තුල ජනතාවගේ අරගල දේශපාලන සංස්ථාව වෙනස් කිරීමට දායක වේ. මර්ටන්ට අනුව විප්ලවවාදින් සමාජ වෙනස අපේක්ෂාවෙන් පසු වන්නන්ය. මෙහි දී බොහෝවිට ජනතාවගේ අපේක්ෂා ඉටු කර ගැනීමට විප්ලවයන් සහ අරගලයන්ට යොමු වේ. බොහෝ විට ජනතා අපේක්ෂා ඉටු නොවී දේශපාලන සංස්ථා විසින් තම බලය අවභාවිතා කරමින් අපරාධ සිදු කරන ආකාරයක් දැකගත හැකි වේ. උදාහරණ ලෙස ලංකාවේ 78 කැරැල්ල තුළ රජයේ ක්‍රියාකාරිත්වය තුළින් ඒ බව පැහැදිලි වේ.

සමාජයේ සාමාජිකයින්ගේ ආකල්ප හා වටිනාකම් වෙනස්කම් මඟින් සම්ප්‍රදායන්, සංස්කෘතිය සමඟ බැඳුණු ආකල්පයක් සැමවිටම සමාජ වෙනස්කම් ඇති කිරීමට සමත් වේ. ආගම සමාජ වෙනස් කිරීමේ කාරකයකි. ජනතාවගේ අබිං ලෙස කාල් මාක්ස් ආගම හඳුන්වා තිබේ. නූතනයේ ආගමික සංස්ථාවේ කාර්ය භාර්යන් මඟ හැරියාම, ආගම තුළට ආගමික නායකයින්ගේ මත, ආශාවන් ඉටු කර ගැනීමට ආගමික භක්තිකයින් යොදා ගැනීම දැකගත හැකිවේ.ඩුර්කයිම් විසින් ඉදිරිපත්කරන පරහිතකාමී සියදිවි නසා ගැනීමේ දී තමා අයත් සමූහයේ අපේක්ෂා සාධනය වෙනුවෙන් ජීවිත කැපකරන ආකාරයක් දැකගත හැකි වේ. මෙමඟින් විශාල මිනිස් සංහාරයන් සිදු වේ. උදාහරණ ලෙස තලේබාන් සංවිධානයේ

ක්‍රියාකාරිත්වය හඳුනා ගත හැකි වේ. නූතනය වන විට ආගමික අන්තවාදීන් අපරාධ වින්දිතයින් ලෝකය පුරාම බිහි කරමින් ඇති බව පැහැදිලි වේ[68].

අපරාධ සිදු කිරීමේ ව්‍යාප්තිය අඛණ්ඩව ආරක්ෂාව සහ සමාජ ප්‍රාග්ධනය බාදනයට හේතු වී තිබේ. නාගරීකරණය වැනි සමාජයේ විශේෂ තත්ත්වයන් නිසා සමාජ පාලනය දුර්වල වන අතර සමාජ විර්යාසය වැඩි කරයි. අනෝමියත්වය, සංස්කෘතික ගැටුම් සහ අක්‍රියතා යනුවෙන් අසංවිධානාත්මක වර්ග තුනක් මෙහි දැකගත හැකි වේ. නාගරීකරණය සමාජයේ පවුල, දේශපාලනය, ආර්ථිකය, අධ්‍යාපනය, ආගම යන සංස්ථාවන්ට එල්ල කල බලපෑම සුලු පටු නොවේ. සරල සමාජ සංකීර්ණ සමාජ බවට පත්වීමේ දී ගැටලු උත්සන්න වේ. රැකියා සඳහා නගරයට ඒකරාශී වන ජනතාව පෙර පැවති විස්තෘත පවුල් ක්‍රමයෙන් මිදී න්‍යෂ්ටික පවුල් බවට පත් වීම හරහා සමාජ වෙනස් වීම හා සංස්කෘතියට විශාල බලපෑමක් එල්ල වී තිබේ. මව පියා දෙදෙනාම රැකියාවේ යෙදීම නිසාම දරුවන් කෙරෙහි අවධානය අවම  වීම හා ඥාතීන්ගෙන් දුරස්වීම හේතුවෙන්  රැකවරණය ද අහිමි විය. මෙම තත්ත්වය නිසා  දරුවන් නිවෙස් තුළ හුදෙකලා වීම මගින් අනෝමියත්වයට පත් වේ. ඇතැම් විට දරුවන් ආත්මීය සියදිවි නසා ගැනීමේ තත්ත්වයක් ද දැකගත හැකි වේ. අනෙක් අතට තාක්ෂණයේ දියුණුවත් සමඟ දරුවන් නොයෙකුත් අපරාධ වලට ගොදුරු බවට පත්වන අතර වින්දිතයින් බවට ද පත් වේ. පවුලේ කාර්යය මඟහැරී යාම තුළ අපරාධකාරීත්වයක් හා වින්දිත බවක් නිතැතින්ම නිර්මාණය වේ. මව විදේශගත වීම තුළ දරුවන් අපරාධ ගොදුරක් බවට පත්වීම ලංකාවේ නූතන ප්‍රවණතාවයකි. සමාජ ගතිකත්වය සමඟ පවුල් සංස්ථාව ද යම් යම් වෙනස්වීම්වලට බඳුන් විය. කාර්මීකරණය, නාගරීකරණය, නවතාක්ෂණ නිපැයුම් යනාදිය නිසා පුද්ගලයා පවුල සමඟ පැවැති ග්‍රහණයන් බොහෝදුරට ලිහිල් වෙමින් පවතී. මේ තත්ත්වය තුළ වැඩි වශයෙන් අපරාධ වින්දිතයින් නිර්මාණය වේ. දෙමාපියන් රැකියා ගතවීම, බිරිඳ විදේශ ගතවීම වැනි කරුණු මඟින් සැමියා මතට ඇබ්බැහි වීම,  දරුවන් අනාරක්ෂිත වීම වැනි තත්ත්වයන් දැකගත හැකි වේ. මෙවැනි දරුවන් බොහෝ විට ලිංගික අපරාධකරුවන්ගේ ගොදුරු බවට පත් වේ. පවුලේ කාර්යයන් නිසි ලෙස ඉටු නොවීමත්, සංකීර්ණ සමාජකරණයට පවුල හසුවීම යන කරුණු හරහා අපරාධ වින්දිතයින් බිහිවීම මෙන්ම වර්ධනයටද පවුල් සංස්ථාවේ වෙනස් වීම බලපා ඇත.

ආර්ථික සංස්ථාව හා දේශපාලන සංස්ථාව අතර අවියෝජනීය බැඳීමක් පවතී. මැක්ස් වේබර්ගේ නිලබලවාදී සංකල්පය මගින් සමාජ බල තුලනය ඉදිරිපත් වේ. මෙකී නිලබල ක්‍රමය දේශපාලන සංස්ථාව මත ගොඩ නැගෙන අතර මිනිසාගේ උපතේ සිට මරණය දක්වා නිල බලය භාවිතා කිරීම දැකගත හැකි වේ. අතීතයේ රාජාණ්ඩු හා ඒකාධිපති පාලනය තුළ අපරාධකරුවන්ගේ වින්දිතයින් බවට ජනතාව පත්ව ඇත. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම බිහිවීම හරහා වෙනස්ම අකාරයේ නිලබල ක්‍රමයක් හා අපරාධ රටාවක් නිර්මාණය වී තිබේ. කෙතරම් ප්‍රජාතන්ත්‍රවාදී රටක වුවත් බලය ඇත්ත වශයෙන්ම ඇත්තේ තෝරාගත් විශේෂ කණ්ඩායමක් අත බව සමහරු තර්ක කරති. බලය ඇති පිරිස් දේශපාලන බලය අල්ලා ගැනීමට අපරාධ සිදු කරයි. ලංකාවේ මත්ද්‍රව්‍ය අපරාධ, සංවිධානාත්මක අපරාධ පිටුපස

[68] Berjburg,J,G. (2002). Anomie, Social Change And Crime.A Theoretical Examination of Institutional-Anomie Theory. *British Journal of Criminology,42(4),729-742*. https://www.researchgate.net/journal/British-Journal-of-Criminology-1464-3529

දේශපාලන බලය සැඟව තිබේ. යුද්ධය ද දේශපාලන අවශ්‍යතාවයකි. මේ අනුව බලන කල දේශපාලන අවශ්‍යතාවන් මත අපරාධ වෙමින් වින්දිතයින් බිහි වේ. විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හරහා විශාල ගැටලු ප්‍රමාණයක් නිර්මාණය කර ඇත. බහු ජාතික සමාගම් ස්වකීය ලාභය උපයා ගැනීමට ව්‍යාපාරික කටයුතු ලොව පුරා ව්‍යාප්ත කර ඇත. මෙම තත්ත්වය මත පූර්ණ කාලීන රැකියාවල සුරක්ෂිත බව අවම වී තිබේ. කොටස් වෙළඳපොළ ගනුදෙනු සම්බන්ධයෙන් නීති අහෝසි කර දැමීම හා විවෘත ආර්ථික ප්‍රතිපත්තිවල ප්‍රතිඵල ලෙස තරඟකාරීත්වය හමුවේ ආණ්ඩුවලට තමන් පාලනය කරනු ලබන රටවල ආර්ථිකය හසුරුවා ගත නොහැකි වී තිබේ. ධනවාදය ලොව ලොකුම අපරාධකරුවා ද වී සිටී. දිනපතා ලොවපුරා දරුවන් 2200ක් කුස ගින්නේ තබා මරා දමන්නේ ධනවාදය විසිනි. සෑම තත්පර 4කට වරක් කුසගින්න හා පහසුවෙන් සුවකළ හැකි රෝග නිසා දරුවකු මරා දමන්නේ ධනවාදය විසිනි. ඒ අනුව ධනවාදය අපරාධකරුවන් නිර්මාණය කර තිබේ. මහා අපරාධකාරීත්වය යුද්ධයෙන්, ලෙඩරෝගවලින්, විෂ මත්ද්‍රව්‍යවලින් දිවිනසා ගැනීමට බලකිරීමෙන් ධනවාදය විසින් ලොව පුරා මරා දමන මිනිසුන් සංඛ්‍යාව මිලියන ගණනකි. අනෝමියත්වය යනු, ඉලක්කවල අසීමිතභාවයයි. හැඟීම් යනු තෘප්තිමත් කළ නොහැකි සහ පතුළක් නැති ආගාධයකි. අසීමිත ආශාවන් හා ඉලක්ක කරා ගමන් කරන මිනිසාට සාධාරණත්ව, සමාජ සංස්කෘතියේ මායිම් නොපෙනෙන අතර විෂම ක්‍රියා හරහා තම තත්ත්වය, බලය, ධනය වැඩි කර ගැනීමට උත්සාහ දැරීමත් සමඟ අපරාධකාරීත්වයේ වර්ධනයත් සමඟ වින්දිතයින් රැසක් බිහි වේ. නූතනයේ පුද්ගලයාගේ ආර්ථික මට්ටම රැකියාව මත තීරණය කිරීම නූතන ප්‍රවණතාව බවට පත්ව තිබේ. විවාහය වැනි තත්ත්වයන් තුළ දී මෙය ප්‍රබල බලපෑමක් කරන අකාරය දැකගත හැකි වේ. රැකියාව මත පදනම් වූ අපරාධ ප්‍රමාණය තවදුරටත් වර්ධනය වීම කෙරෙහි වෙනස් වෙමින් පවතී. පවතින රැකී රක්ෂා අපරාධ සඳහා අවස්ථාවක් හා අනුබලයක් ලබා දී තිබේ. ඒ අනුව සුදු කරපටි අපරාධ ඉහළයාම දැකගත හැකිය. ශ්‍රම විභජනයද අපරාධ වින්දිතයින් බිහි වීමට මඟ පාදයි. මේ අනුව ආර්ථිකය තුළින් විශාල අපරාධ වින්දිතයින් නිර්මාණය කරන බව පැහැදිලි වේ. සමාජ අපගමනය හා අපරාධකරුවන් අතර අන්තර් සබඳතාවයක් පවතී. ඒ තුළ අපරාධ වින්දිතයින් බිහිවීම නොවැළැක්විය හැකි සමාජ ප්‍රපංචයක් බවට පත්ව තිබේ.

මෙලෙස සමාජ වෙනස්වීම සමාජ විද්‍යා ක්ෂේත්‍රය තුළ ඉතා ප්‍රබලව සාකච්ඡා කෙරෙන මාතෘකාවකි. සමාජ විද්‍යාව බිහි වන්නේද සමාජ වෙනස් වීමේ ප්‍රතිඵලයක් ලෙසය. සමාජ වෙනස්වීම හේතුවෙන් ඇතිවන සදාචාර ප්‍රමිති බිඳවැටීම අපරාධවිද්‍යා ක්ෂේත්‍රයට පුළුල් ලෙස බලපෑම් කර ඇත. මෙම ලිපිය සම්භාව්‍ය හා සමකාලීන සිද්ධාන්තයන් ඇසුරින් සමාජ වෙනස්වීම, සමාජ වෙනස්කම් වල බලපෑම අධ්‍යයනය කරමින් අපරාධ පිළිබඳ පුළුල් පරාසයක අවබෝධයක් ලබා දෙයි. විශේෂයෙන් සමාජ වෙනස්වීම, සදාචාර ප්‍රමිති බිඳවැටීමට හරහා දේපළ අපරාධ, සාහසික අපරාධ, සංවිධානාත්මක අපරාධ සහ සුදු කරපටි අපරාධ යනාදියට කුමන ආකාරයේ බලපෑමක් ඇති කරයිද? ඒ තුළින් ජනිත වන අපරාධකාරීත්වය හා වින්දිතභාවය ස්වරූපය සම්භාව්‍ය හා සමකාලීන න්‍යායන් මගින් සවිස්තරාත්මකව පැහැදිලි කිරීම් ලබාදේ.

## 9. සංස්කෘතිය සහ පෞරුෂත්වය සංකල්පයන් සමාජයේ අපරාධ හැසිරීම කෙරෙහි සිදුකරනු ලබන බලපෑම පිළිබඳ අධ්‍යයනය

ටී. ඒ. ශානිකා තාඹුගල

අයි.කේ.එස්.එම්.ජී.පී.එම්. විජේරත්න

එම්.සී.එස්. වර්ණකුලසූරිය

සංස්කෘතිය යන්න විවිධ ආකාරවලින් අර්ථ දැක්විය හැකිය[69]. සමාජයක හෝ නුහුරු නුපුරුදු ජනවාර්ගික කණ්ඩායමක දක්නට ලැබෙන සමාජ සංවිධාන ව්‍යුහය ලෙස සංස්කෘතිය හැඳින්විය හැක[70]. සමාජ ආචාර විධි පද්ධතියක් සමඟ හුරු පුරුදු ලෙස සංස්කෘතිය ද අර්ථ දැක්විය හැක [71]. සංස්කෘතිය යන්නෙන් අදහස් කරන්නේ යම් තැනක හෝ වේලාවක කලාත්මක නිෂ්පාදන තත්ත්වයක් ඇති වීමයි[72]. සංස්කෘතීන් විවිධයන් අතර උසස් සංස්කෘතියක් සහ පහත් සංස්කෘතියක් , ජනප්‍රිය සංස්කෘතියක් සහ පාරභෞතික සංස්කෘතියක් ඇත[73].

අපරාධ, සංස්කෘතිය යන මෙකී සංකල්පයන් හා සසඳා බැලීමේදී ඊට සමගාමීව වැදගත් සංකල්පයක් ලෙස පෞරුෂය හඳුනා ගත හැකිය. Personality යන ඉංග්‍රීසි වචනයෙන් අර්ථවත් වන එය පර්සෝනා යන ලතින් වචනයෙන් බිඳී ආවකි. පර්සෝනා යනු, වෙස්මුහුණු නැතහොත් තමන් අනුන්ට දිස්වෙන ආකාරය යන්නයි[74]. පෞරුෂය යනු යම්කිසි පුද්ගලයෙකුගේ චර්යාව පිළිබඳ සියලු විස්තර විභාග සැපයීමට තරම් අතිශය ප්‍රමාණවත් සංකල්පීයකරණයයි[75]. එමෙන්ම පෞරුෂය යනු පුද්ගලයෙකුගේ ගති ලක්ෂණ වල අනන්‍ය රටාවයි[76].

පෞරුෂය සංකල්පය පිළිබඳ සඳහන් කිරීමේදී සිග්මන් ෆ්‍රොයිඩ්, ඇඩ්ලර්, ඕල්පෝර්ට්, කැටෙල්, ඩ්රේගර්, අයිසෙන්ක්, සික්නර් බන්ඩුරා, මාස්ලෝ, කාල් රොජර්ස්, ගෝල්ඩ්ස්බර්ග්, යන මනෝවිද්‍යාඥයින් වැදගත් වේ.

---

[69] Nelson, C., Lawrence, G., Paula, T., Cultural Studies: An Introduction, In Cultural Studies 1, ) 4Lawrence Grossberg Et Al. Eds., .(1992

[70] Marshall, P., & Koenig, K. Accounting For Culture In A Globalized Bioethics, 32J.L. Med. & Ethics 252, 260 .(2004)

[71] Ilhyung Lee, In Re Culture: The Cross-Cultural Negotiations Course In The Law School Curriculum, 20Ohio St. J. On Disp. Resol. 375, 387N. .(2005) 52

[72] Naomi Mezey, Approaches To The Cultural Study Of Law: Law As Culture, 13Yale J.L. & Human. 35, 41 .(2001)

[73] Gans, R. (1999). *Popular Culture And High Culture*. New York: Basic Books.

[74] Nunn, K. (2006). New Explorations In Culture And Crime: Definitions, Theory, New Explorations In Culture And Crime: Definitions, Theory, Method. *University Of Florida Levin College Of Law University Of Florida Levin College Of Law Uf Law Scholarship Repository Uf Law Scholarship Repository Uf*. Retrieved From Http://Scholarship.Law.Ufl.Edu/Facultypub/105.

[75] Mcclelland, D.C. (1951). Personality. Ny: William Sloane Associates

[76] Coleman, W. (1960). Book Reviews : Personality By J. P. Guilford. New York: Mcgraw-Hill Book Company, 1959. Pp. Xiii 562. Educational And Psychological Measurement, 20(2), 403–405. Https://Doi.Org/10.1177/001316446002000225

මේ අනුව මෙම පෞරුෂය සංකල්පය, සංස්කෘතිය සමඟ පවතින සබඳතාවය සමගින් සමාජයේ සිදුවන සාපරාධී තත්වය කෙබඳුද? යන්න පිළිබඳව පූර්ව පර්යේෂණ විශ්ලේෂණයෙන් මෙම ලිපිය නිර්මාණය කර ඇත.

ලොව ප්‍රථම වරට පෞරුෂය පිළිබඳ අධ්‍යයනයන් සිදු කළ අමෙරිකානු ජාතික මනෝවිද්‍යාඥ G.W. ඕල්පෝර්ට් විසින් 1937 දී "පෞරුෂය පිළිබඳ මනෝවිද්‍යාත්මක ප්‍රවේශයක්" යන ග්‍රන්ථය මඟින් දේවධර්මවාදී, දර්ශනවාදී, නීතිවේදී, සමාජවිද්‍යාත්මක මෙන්ම මනෝවිද්‍යාත්මක අර්ථකතනයන් සඳහන් නිර්වචන 50 ක් පමණ හඳුන්වා දී ඇත[77].

N. K. Tharshini, Fauziah Ibrahim, Mohammad Rahim Kamaluddin , Balan Rathakrishnan සහ Norruzeyati Che Mohd Nasir විසින් සිදු කරන ලද අධ්‍යයනය ඇසුරෙන් පුද්ගල පෞරුෂ ගති ලක්ෂණ සහ අපරාධකාරීත්වය අතර සම්බන්ධය පිළිබඳ ක්‍රමානුකූල සමාලෝචනයක් යනුවෙන් රචිත පර්යේෂණ පත්‍රිකාව වෙත අවධානය යොමු කිරීමේදී එහි සමාජ හා පාරිසරික සාධක වලට අමතරව පුද්ගල පෞරුෂ ගති ලක්ෂණ වැරදි හැසිරීම් සමඟ සංකීර්ණ ලෙස සම්බන්ධ වී ඇත[78].

මේ අනුව මෙම ලිපියෙහි අරමුණ වනුයේ පුද්ගල පෞරුෂ ලක්ෂණ සහ අපරාධකාරී ස්වභාවය අතර සම්බන්ධය සමාලෝචනය කිරීමයි. Sage, Web of Science, APA PsycNet, Wiley Online Library, සහ PubmMed Databases තුළ අපරාධ හැසිරීම් ඇති පුද්ගල පෞරුෂ ගති ලක්ෂණ අතර සම්බන්ධය පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා ක්‍රමානුකූල සමාලෝචනයක් මෙහිදී සිදුකර ඇත. මෙහි ප්‍රතිඵල අනුව සාපරාධී ක්‍රියාවන් සඳහා දායක වන පුද්ගල පෞරුෂ ලක්ෂණ 3 ක් දක්වයි. ඒවා නම් , මනෝ ව්‍යාධිය, අඩු ස්වයං පාලනය හා දුෂ්කර ස්වභාවය යි. පුද්ගල පෞරුෂ ලක්ෂණ සහ අපරාධකාරී ස්වභාවය අතර ඇති සම්බන්ධය ගැඹුරින් අවබෝධ කර ගැනීම සඳහා අපරාධ හැසිරීම්වල කැපී පෙනෙන අවදානම් සාධකයක් ලෙස පෞරුෂත්වයේ මානය කෙරෙහි වැඩි අවධානයක් මෙහිදී යොමු කෙරේ. පෞරුෂය, පෞරුෂත්ව ලක්ෂණ, පුද්ගල පෞරුෂය, වැරදි හැසිරීම්, අපරාධ සහ සමාජ විරෝධී හැසිරීම්, යන සංකල්පයන් පිළිබඳව තවදුරටත් තොරතුරු අධ්‍යයනය සඳහා Sage හි පළකර ඇති පර්යේෂණ පත්‍රිකා , Web of Science, APA PsycNet, Wiley Online Library, PubMed, විද්‍යා වෙබ්, මනෝවිද්‍යා වෙබ් අඩවි වෙත පිවිස කරුණු ගවේෂණය කරමින් සමස්තයක් වශයෙන් අපරාධ හා සම්බන්ධ අධ්‍යයනයන් ද අපරාධ විද්‍යා ක්ෂේත්‍රයේ සාහිත්‍යයට එකතු කරමින් පෞරුෂ ගති ලක්ෂණ අපරාධ ක්‍රියාවල යෙදීමේ අවදානම වැඩි කරනුයේ කෙසේද? යන්න පිළිබඳ පාඨකයාගේ අවබෝධය වැඩි දියුණු කිරීමට පර්යේෂකයා උත්සහ දරා ඇත.

---

[77] Allport, G. W. (1937). Personality: A psychological interpretation. New York, Henry Holt

[78] Tharshini, N., Ibrahim, F., Kamaluddin, M., Rathakrishnan, B., & Che Mohd Nasir, N. (2021). The Link between Individual Personality Traits and Criminality: A Systematic Review. *International Journal Of Environmental Research And Public Health*, *18*(16), 8663. doi: 10.3390/ijerph18168663

ගැට්නර් සහ වෙනත් අය (2016)[79], මෙන්ම නයිජල් සහ වෙනත් අය (2018)[80], විසින් සිදු කරන ලද සැලකිව යුතු ආනුභවික පර්යේෂණ මඟින් යෝජනා කළේ මනෝ චිකිත්සාව යනු, අපරාධ හැසිරීම් පිළිබඳ ශක්තිමත් පුරෝකථනය කරන්නෙකු වන අතරම ප්‍රධාන වශයෙන් ප්‍රචණ්ඩත්වය කෙරෙහි අවධානය යොමු කරන බවයි.

තවද මෙම අධ්‍යයනය අනුව මනෝවිද්‍යාත්මක වැරදිකරුවන් අතර ඇති ප්‍රචණ්ඩත්වය මානසික රෝගයේ බලපෑමට ලක්වන ලක්ෂණ මඟින් බෙහෙවින් තීරණය කළ හැකි බව බොහෝ විද්වතුන් එකඟ වෙති. මෙහි දැක්වෙන පරිදි ගොට්ෆ්‍රෙඩ්සන්ගේ සහ හිර්චිගේ සමාජ පාලන න්‍යාය මත පදනම්ව, අවම ස්වයං පාලනය මඟින් පුද්ගලයෙකු විවිධ ආකාරයේ සමාජ විරෝධී හැසිරීම් වල යෙදීමට මඟ පාදයි.

මෙහි කතෘට අනුව වරදකරුවන් නොවන පුද්ගලයින් හා සසඳන විට අපරාධ සිදු කරන පුද්ගලයින් අඩු සමාජශීලී මෙන්ම වඩාත් ආක්‍රමණශීලී, සංවේදීතාව සොයන, ස්නායු භාවය සහ මනෝ විකාර මානයන් සඳහා වැඩි නැඹුරුතාවයක් සහිත වූවෝ වෙති. එමෙන්ම ජෝන්ස් සහ වෙනත් අය (2016)[81], සහ කුන්හා සහ වෙනත් අය (2018)[82], එක් එක් පෞරුෂත්වයන්, අපරාධ, ලිංගික, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, වයස, භූගෝලීය පිහිටීම නියෝජනය කරන බව සොයා ගත්හ.

අපරාධකාරී හැසිරීම කෙරෙහි පුද්ගල පෞරුෂය කෙසේ බලපෑම් කරන්නේද? යන්න මෙවැනි අධ්‍යයනයන් තුළින් මනාව අවබෝධ වේ. තවද, සංකීර්ණ පෞරුෂ තත්ත්වයන් එසේත් නැත්නම් වෙනස්වන සුළු මනෝ ස්වභාවයන් අපරාධ හැසිරීම්වල ප්‍රධාන පුරෝකථනය කරන්නෙකු ලෙස මෙහි දක්වා ඇත. එයට ප්‍රධාන වශයෙන් සමාජ විද්‍යාත්මක තත්ත්වයන් සහ සංවේදනය සෙවීම, නාර්සිස්වාදය, මැකියාවේලියානුවාදය සහ සමාජ ලිංගික දිශානතිය වැනි පුද්ගල ස්වභාවයන් හේතු විය හැකිය.

මෙම අධ්‍යයනයේ පරමාර්ථය යම්තාක් දුරට ශාස්ත්‍රීය වුවත් සාපරාධී හැසිරීම් වල යෙදීම සඳහා සැලකිය යුතු අවදානම් සාධක කිහිපයක් පැහැදිලිව හඳුනා ගැනීමෙන් නිගමනයට එළඹී ඇත. මෙහි දැක්වෙන පරිදි  අවදානමට ලක්විය හැකි පෞරුෂත්ව ලක්ෂණ ඇති සියලුම පුද්ගලයින් වරදකරුවන් හෝ වැඩිහිටි වැරදිකරුවන් වීමේ ඉහළ අවදානමක් නොමැත. එම නිසා  අපරාධ යුක්ති පද්ධතිය තුළ කටයුතු කරන්නන්  සාපරාධී පුද්ගලයින් හඳුනා ගැනීමට  තක්සේරු කිරීමේ ක්‍රම විවිධාංගීකරණය කර ගැනීම අත්‍යවශ්‍ය වේ. එමෙන්ම එම තක්සේරුවේ ප්‍රතිඵලයට ගැලපෙන නිසි ප්‍රතිකාර ක්‍රම අනාගතයේ

---

[79] Gatner, D.T.; Blanchard, A.J.E.; Douglas, K.S.; Lilienfeld, S.O. Psychopathy in a multi-ethnic world: Investigating multiple measures of psychopathy in Hispanic, African American, and Caucasian offenders. J. Assessment (2016), 34, 206–221.

[80] Nigel, S.M.; Dudeck, M.; Otte, S.; Knauer, K.; Klein, V.; Böttcher, T.; Maaß, C.; Vasic, N.; Streb, J. Psychopathy, the big five and empathy as predictors of violence in a forensic sample of substance abusers. J. Forensic Psychiatry Psychol. 2018, 29, 882–900.

[81] Jones, D.N.; Hare, R.D. The mismeasure of psychopathy: A commentary on Boddy’s PM-MRV. J.Bus. Ethics 2016, 138, .588–579

[82] Cunha, O.; Braga, T.; Goncalves, R.A. Psychopathy and intimate partner violence. J. Interpers. Violence ((2018, 11, .19–1

අපරාධ අනුපාතය අවම කිරීම සඳහා යොදා ගැනෙන අපරාධ පාලනය සහ නිවාරණය කිරීමේ පියවරයන් ප්‍රවර්ධනය කිරීම සඳහා වැදගත් වේ.

මෙම අධ්‍යයනය තුළින් මනෝභාවය, අවම ස්වයං පාලනය සහ සංකීර්ණ පෞරුෂ තත්ත්වයන් වැනි ප්‍රධාන පෞරුෂත්ව ලක්ෂණ ප්‍රාථමික හෝ ද්විතීයික දත්ත උපයෝගී කරගනිමින් මැනිය හැකි බව පෙන්වා දෙන අතරම මෙමගින් යෝජනා කරනුයේ අපරාධයේ අවදානම අවම කිරීම අරමුණු කරගත් මැදිහත්වීම් මුල් ළමාවිය අවධියේදී ආරම්භ විය යුතු බවයි. මන්ද යොවුන් වියේ පසුවන්නන් සාමාන්‍යයෙන් වයස අවුරුදු 15 සම්පූර්ණ වීමෙන් පසු අපරාධ කටයුතුවල නිරත වීමට පටන් ගන්නා නිසාවෙනි. එපමණක් නොව, ස්ත්‍රීපුරුෂ සමාජභාවය නොසලකා පෞරුෂ ගති ලක්ෂණ හඳුනා ගැනීම මඟින් ළමයින්, අවදානම් සහිත තරුණයින් සහ නව යොවුන් වියේ පසුවන කණ්ඩායම් සඳහා සුදුසු වැළැක්වීමේ උපාය මාර්ග ආරම්භ කිරීම ඉතා වැදගත් වන බව මෙහිදී නිගමනය කර ඇත. සමාජ නොගැලපීම මත පෞරුෂත්වයේ බලපෑම යනුවෙන් පර්යේෂණ අධ්‍යයනයක් "දකුණු මිචිගන් ප්‍රාන්ත බන්ධනාගාරයේ" සහකාර නියෝජ්‍ය පාලකයා වශයෙන් මෙන්ම, මිචිගන්හි දණ්ඩන පද්ධතිය තුළ විවිධ වෘත්තීය තනතුරු හෙබවූ "Vernon Fox" විසින් සිදු කර ඇත[83].

ඔහුගේ පර්යේෂණ පත්‍රිකාව තුළ සඳහන් කරන පරිදි පුද්ගලයෙකුට ක්‍රියා කළ හැකි සමාජ ප්‍රදේශය බොහෝ දුරට රඳා පවතින්නේ අදාළ පුද්ගලයාගේ ආක්‍රමණශීලී බව, කැදරකම, ආරක්ෂාව සහ සාමාන්‍ය පෞරුෂය මත ය. පෞරුෂයට තමා ජීවත් වන සමාජ පසුබිම තුළ නිසි පරිදි ක්‍රියා කිරීමට නොහැකි වූ විට සමාජ නොගැලපීම සිදු වේ.

සමාජ ගැලපීම් පිළිබඳ ගැටළුව, පෞරුෂය හිතකර පරිසරයක් තුළ තැබීම හෝ සමාජ පරිසරය තුළ එය නිසියාකාරව ඒකාබද්ධ කළ හැකි පරිදි පෞරුෂත්වයේ වෙනසක් ඇති කිරීමේ ගැටලුවක් බවට පත්වේ. දකුණු මිචිගන් ප්‍රාන්ත බන්ධනාගාරයේ එන සියලුම සිරකරුවන් සමඟ නිතරම සම්මුඛ සාකච්ඡා සිදුකරමින් සහ නවක පිරිමින් බොහෝ දෙනෙක් කාර්යාල දොරටුව තුළින් පැමිණෙන විට ඔවුන්ගේ අපරාධ වල ස්වභාවය පිළිබඳව ආත්මීය තක්සේරුවක් සිදු කරමින් මෙම අධ්‍යයනය ෆොක්ස් විසින් සිදුකර ඇත.

මෙම ආත්මීය ස්වයං ඇගයීම් පදනම් වී ඇත්තේ පරීක්ෂකයාට ආත්ම විශ්වාසය හෝ අනාරක්ෂිත බව, ආධිපත්‍යය හෝ යටත් වීම, දැඩි බව හෝ හුදෙකලාව සහ ඒ හා සමාන පෞරුෂ ලක්ෂණ පිළිබඳ විවරණයන් පදනම් කරගෙන බව පෙනේ. මෙම අධ්‍යයනයේ පරමාර්ථය වී ඇත්තේ අපරාධකරුවන් අතර මැනිය හැකි පෞරුෂ ගති ලක්ෂණ වල සමාජීය නොවන අනුකූලතා ක්ෂේත්‍රයන්හි වෙනස්කම් තිබේද නැද්ද යන්න සොයා බැලීමයි.

අපරාධ යන්නෙන් පෞරුෂත්ව වර්ගයක් සොයාගෙන නොමැත. පෞරුෂය ස්ථාවර ද නැත. නමුත් සංකීර්ණ හා ගතික වන නිසාවෙන් එය මැනීමට අපහසුය. බොහෝ සාධක පෞරුෂය මත රඳා පවතී.

[83] Fox, V. (1952). The Influence of Personality on Social Non-Conformity. *The Journal Of Criminal Law, Criminology, And Police Science*, *42*(6), 746. doi: 10.2307/1139678.

"මෙට්ෆෙසෙල් සහ ලෝවෙල්"[84] විසින් අපරාධ නැඹුරුව, බුද්ධිය, ශාරීරික ලක්ෂණ, ජාතිය සහ ජාතිකත්වය වයස, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ පෞරුෂ ලක්ෂණ ඇතුළුව වෙනත් සාධක සමඟ සම්බන්ධ අධ්‍යයන මාලාවක් සමාලෝචනය කර ඇත. පෞරුෂ සාධක සම්බන්ධයෙන් ගත් කල, සාහිත්‍යය තුළ පෞරුෂය වැදගත් යැයි සලකන නමුත්, සාපරාධී පෞරුෂයක්, නිශ්චිතව දැක්වීමට නොහැකි තරම් සීමා වී ඇති බව ඔවුහු සොයා ගත්හ.

1945 ජනවාරි 1න් අවසන් වූ මාස හය තුළදී දකුණු මිචිගන් ප්‍රාන්ත බන්ධනාගාරයට ඇතුළු වූ සියලුම පිරිමින් 1235 දෙනෙකු මොහුගේ අධ්‍යයනය සඳහා යොදා ගත් අතර ඔවුන් සියළුදෙනාම ඔවුන් වරදකරුවන් කොට දඬුවම් නියම කර ඇති අපරාධ අනුව වගුගත කර මොහුගේ පර්යේෂණ අධ්‍යයනය සිදුකර ඇත. මෙම අධ්‍යයනයෙන් ඇඟවෙන්නේ වඩාත් විචක්ෂණශීලී එක් එක් ප්‍රක්ෂේපණ තාක්ෂණයන් උපයෝගී කර ගනිමින් මෙම ප්‍රදේශය තුළ කළ දැඩි පර්යේෂණ ප්‍රතිඵලදායක වී ඇති බවයි.මෙහිදී මිනීමැරුම්, කොල්ලකෑම්, සමලිංගික ස්වභාවයේ ලිංගික අපරාධ සහ පහරදීම් සඳහා දඬුවම් නියම වූ මිනිසුන්ගේ අහිතකර රටාවන්ට සාපේක්ෂව වංචනිකයින්ගේ හා කොල්ලකරුවන්ගේ සාපේක්ෂ වාසිදායක රටාව කැපී පෙනේ. පුද්ගලයන්ට එරෙහිව අපරාධ සිදු කළ කණ්ඩායම දේපල වලට එරෙහිව අපරාධ සිදු කළ අයට වඩා ස්වයංපෝෂිත බව, සමාජ තත්ත්වයන් පාලනය කිරීමේ අඩු හැකියාව සහ සමාජ සම්බන්ධතා කෙරෙහි වැඩි ගෞරවයක් දැක්වීය.

සාහසික අපරාධකරුවන්ගේ කණ්ඩායම අවිහිංසාවාදී අපරාධකරුවන්ට වඩා සෑමවිටම පහත් මට්ටමක පැවතුනද සංඛ්‍යානමය වශයෙන් වැදගත් වීමට ප්‍රමාණවත් නොවීමෙන් පෙනෙන්නේ මෙම පර්යේෂණය අර්ධ වශයෙන් හා ප්‍රමාණවත් ලෙස පිළිබිඹු නොවන යම් ගුණාත්මක වෙනසක් පවතින බවයි. මෙම අධ්‍යයන වල සොයා ගැනීම් අනුව පෙනී යන්නේ සමහර අවස්ථාවලදී පෞරුෂ ව්‍යුහය අනුකූලතාව වඩාත් දුෂ්කර වන සමාජ ප්‍රදේශය තීරණය කළ හැකි බවයි.

පෞරුෂය යනු, සමාජ බලපෑම් සහ ස්වාභාවික අවශ්‍යතා හෙවත් ජීව විද්‍යාත්මක අවශ්‍යතා අතර අන්තර්ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් වන හෙයින් යම් සංස්කෘතියකට අනුවර්තනය වීමට හැකි වන පරිදි පෞරුෂය හැඩ ගැස්වීම සඳහා ක්‍රියා කරන සමාජ බලවේග පිළිබඳ නිවැරදි තක්සේරුවකින් නිරීක්ෂණය කළ හැකි බව පුරෝකථනය කළ යුතුය. පෞරුෂය හැඩ ගැස්වීම නිරීක්ෂණය කර පුරෝකථනය කළ හැකි නම්, අනෙක් අතට ජීව විද්‍යාත්මක සීමාවන් තුළ පෞරුෂත්වයේ පරිණතභාවය පාලනය කිරීම සඳහා සමාජ බලවේග හෝ පරිසරය හැසිරවිය හැකි බව පෙනේ. සමාජයීය හා සමාජ විරෝධී පෞරුෂත්වයන් වැරදි ලෙස සකස් කර ගැනීම සහ වැළැක්වීම වැඩෙන දරුවා තුළ මූලික අවශ්‍යතාවයක් වන බව මෙහි අවසානයේදී නිගමනය කර ඇත.

වත්මන් සමාජයේ අපරාධකාරී චර්යාවන් ශීඝ්‍ර වර්ධනයක් දැකගත හැකිය. අපරාධ කෙරෙහි පෙළඹීම සඳහා බලපාන බොහෝ සාධක ගණනවක් ඇත. ආර්ථික සාධක, දේශපාලනික සාධක මෙන්ම සමාජ

[84] Metfessel, M., & Lovell, C. (1942). Recent literature on individual correlates of crime. *Psychological Bulletin, 39*(3), 133–164. https://doi.org/10.1037/h0053765.

සංස්කෘතික සාධකද හේතු වේ. සංස්කෘතිය හා බද්ධව ඇති වන අපගාමී පෞරුෂ ලක්ෂණ පුද්ගල සාපරාධීත්වය සඳහා මුල් වන ආකාරය පිළිබඳ සාකච්ඡා කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ.

ඉමැනුවෙල් බාන්ට් පෞරුෂය හා බැඳුණු අපගාමීත්වය මෙසේ විස්තර කරයි. "දුෂ්ට බව ප්‍රචණ්ඩත්වය ආදී මානසික හා චර්යාත්මක ලක්ෂණ අපගාමී පෞරුෂත්වයේ දක්නට ලැබේ" යනුවෙන්ය. ඩේවිඩ් හියුම් දක්වන්නේ "කිසියම් මිනිස් ක්‍රියාවක් සමාජයට ප්‍රයෝජනවත් වෙන්නේ නම්, එය සදාචාරාත්මක සංස්කෘතියක් වේ. එසේ නොවන්නේනම් එය දුශ්චරිතාත්මක සංස්කෘතියක් වේ. සදාචාර විරෝධී, සමාජ අසම්මත ක්‍රියාවන් සහිත පුද්ගලයා සොම්නස ලබා ගැනීම සඳහා සංස්කෘතිය තුළ පවතින සමාජ අසම්මත ක්‍රම භාවිත කරනු ලැබේ".

ඉහත නිර්වචන අනුව පැහැදිළි වන්නේ, පෞරුෂයේ ගතිකත්වය එහි සංවර්ධනයට මඟපාදන බවයි. අසංවර්ධිත පෞරුෂයන් සංවර්ධිත පෞරුෂයන් කරා පමුණුවනු ලබන්නේ ගතිකත්වය පදනම් කරගෙනය. ළමාවියේ අධික ලැජ්ජාශීලී දරුවන් පසු කලෙක සමාජානුයෝජනය වන්නේද, කුඩාකල කලහකාරී වූවන් පසු කලෙක සාමකාමී වන්නේද, ජීවත්වන සංස්කෘතික පරිසර පද්ධතිය පදනම් කරගෙනය[85]. මිනීමරුවෙකු බවට පත් වූ අංගුලිමාල පවා පසු කලෙක උසස් පෞරුෂ හිමිකරුවෙකු බවට පත්වූයේ මෙම ගතිකභාවය සංස්කෘතිය තුළින් උරුම කරදීම තුළින්ය. එහෙයින් අයෙකුගේ යහපත් පෞරුෂය හෝ බිඳ වැටුණු පෞරුෂය සාධකයන්, ජීවත්වන සංස්කෘතිය අනුව වෙනස් වන බව මෙතුළින් ගම්‍ය වේ.

මනා වූ සංස්කෘතියක් තුළ සමාජානුයෝජනය වන පුද්ගලයා තුළ යහපත් භූමිකාවන් නිර්මාණය වන අතර සමාජානුයෝජනයේදී ඔහු කිසිවිටකත් කිසිවිටෙක අන්තර් පුද්ගල ගැටලු වලට මුහුණ නොදෙයි. එහෙයින් සමාජගතව සිදු කරන සියලු ක්‍රියාවන්හිදී මනාව පෞරුෂයේ ප්‍රබලතාවය ස්වයං ජනිත ශක්තියක් බවට පත් කරයි. ජෝන්ලොක් මිනිසා තුළ අපගාමී පෞරුෂය ගොඩනැගෙන ආකාරය සංස්කෘතික සාධක සමඟ මනාව අර්ථ දක්වා ඇත. ඔහුට අනුව "මුල්ම සමාජය අසහනයෙන් ප්‍රචණ්ඩ බවින් තොර යුක්ති ගරුක සමකාමී එකක් විය. මුදලේ උපතත් සමඟ ඇති වූ සංස්කෘතිය හේතුවෙන් මිනිසා අසහනයට පත්වන්නට විය". මෙම අපගාමී පෞරුෂත්වය හේතුවෙන් සමාජ සංස්කෘතිය තුළ අපරාධකාරී ක්‍රියාවන් වර්ධනය වන බව ඔහුගේ මතය විය. සොරේන් කියකිගාඩ් ලෞකික ජීවිතයේ ප්‍රධාන කරුණු දෙකක් ලෙස සලකා ඇත්තේ ඉච්ඡාභංගත්වය හා සන්තාපයයි.

නූතන සමාජයේ වැඩි වශයෙන් අපරාධ ඇති වන්නේ ඉච්ඡාභංගත්වය සමඟ වෛරය මිශ්‍ර වූ විටය. මේ තත්ත්වය තවත් වර්ධනය වන්නේ මෙම තත්ත්වය පරිහානියට පත් වූ සංස්කෘතියක් සමඟ බද්ධ වූ විටදීය. විවිධ සංස්කෘතීන්ගේ බලපෑම මත පුද්ගල පෞරුෂ සාධක නිර්මාණය කරන්නේ කෙසේද යන්න සහ ඒ තුළින් ගොඩනැගෙන සාපරාධීත්වය පිළිබඳ කැලිෆෝනියාවේ මනෝවිද්‍යා දෙපාර්තුමේන්තුව 2002 දී අධ්‍යයනයක් සිදු කර තිබේ. මෙම අධ්‍යයනය තුළ පෙන්වා දෙන්නේ ඓතිහාසික යුද්ධ, විප්ලව, සංක්‍රමණයන් මුල් කරගෙන ඇති වූ සංස්කෘතික වෙනස්කම් හේතුවෙන්

[85] Carducci, B. (2009). *The Psychology of Personality* (2nd ed., p. 736). John Wiley & Sons.

ප්‍රචණ්ඩත්වය ගොඩනැගෙන බවයි. මෙම වෙනස්කම් හේතුවෙන් පුද්ගල සමාජානුයෝජනය වෙනස් වන අතර එතුළින් ප්‍රචණ්ඩත්වය ගොඩනැගෙන බවයි.

මෙම වෙනස්කම් මඟින් සංස්කෘතිය තුළ ඉච්ඡාභංගත්වය, චිත්තවේගී කැළඹීම්, විඳදරා ගත නොහැකි වීම, ආවේග පාලනයෙන් තොර වීම, ලිංගික අපරාධ වැනි සාපරාධී ක්‍රියා ඇති වන්නට විය. මානසික අවපීඩනය හා ඉච්ඡාභංගත්වය ආදියෙහි ප්‍රතිඵලයක් ලෙස අපගාමී පෞරුෂ ලක්ෂණ පුද්ගලයා තුළ ඇති වන බව අධ්‍යයන ප්‍රතිඵල තුළින් තහවුරු කරනු ලැබේ. එම තහවුරු කිරීම් වලට විවිධ රටවල සංස්කෘතීන් (ඉන්දියවේ සංස්කෘතිය, ජපාන සංස්කෘතිය, ඇමරිකානු සංස්කෘතිය) උදාහණයට ගෙන ඇත[86].

තවද, 2009 දී, Richard C Howard, Nick Huband, Conor Duggan යන මනෝවිද්‍යාඥයින්ගේ මූලිකත්වයෙන් සිදු කරන ලද අධ්‍යයනයද මෙහිදී වැදගත් වේ[87]. බොහෝ හැසිරීම් වල පෞරුෂය ප්‍රධාන සාධකයක් වන අතර ඉන් එකක් නම් අපරාධ හැසිරීමයි. මෙම අධ්‍යයනය තුළ සංස්කෘතිය තුළින් ඇති වන පෞරුෂ ආබාධ සාපාරාධීත්වය ඇති කරන ආකාරය ප්‍රජා කණ්ඩායම් 244 ක් යොදා ගනිමින් විශ්ලේෂණයක් සිදු කර තිබේ. ඉහළ කෝපය හා ආවේගශීලී බව සහිත සංස්කෘතියක ජීවත් වන පිරිසගේ අනාත්මික ගති ලක්ෂණ අපරාධ වලට ප්‍රතිලෝමව බලපාන ආකාරය අධ්‍යයන ප්‍රතිඵල තුළ විග්‍රහ කර තිබේ. සමාජ විරෝධී පෞරුෂ ආබාධයන් ජීවත් වන සමාජ සංස්කෘතිය තුළින් ගොඩනැගෙන්නක් වන අතර ඔවුන් බොහෝ විට නීතිය උල්ලංඝනය කරමින් අපරාධකරුවන් බවට පත් වේ. මෙහිදී පෞරුෂ ආබාධ සහිත වැඩිහිටියන් ජීවත් වන පරිසර පද්ධතිය ඇසුරු කරන දරුවන් ද එම හැසිරීම් වලට අනුගත වීම තුළින් සාපරාධීත්වය ඇති වන අයුරු මෙම අධ්‍යයනය තුළින් පෙන්වා දෙයි.

එහිදී දරුවන් විසින් දේපල විනාශ කිරීමටත්, රැවටිලිකාරකම් කිරීමටත්, සතුරුකම් කිරීමටත්, අනුකම්පාවෙන් තොරව කටයුතු කිරීමටත් පෙළෙඹේ. සමාජ විරෝධී පෞරුෂ ආබාධ ජීවිතාන්තය දක්වා පැවතිය හැකි වුවද පුද්ගලයා සතු වූ විනාශකාරී හා සාපරාධී හැසිරීම යහපත් සංස්කෘතිය සමඟ බද්ධ වීමෙන් එම තත්ත්වය පාලනය කල හැකි බවත් ප්‍රතිවිපාක අවම කරගත හැකි බවත් අධ්‍යයන තුළින් තහවුරු කරනු ලැබේ.

මේ ආකාරයෙන් පුද්ගලයා ජීවත් වන සංස්කෘතිය තුළින් ඇති කරන අපගාමී පෞරුෂය මුල් කරගෙන සමාජයට අපරාධකරුවන් බිහිවීම ඉවත් කිරීමට නිරෝගී හා සුවදායී පෞරුෂයක් ඔවුන් තුළ නිර්මාණය කළ යුතුය. පුද්ගලයින් ජීවත් වන සංස්තෘතිය තුළ "තුලිත පෞරුෂයක් "නොමැතිනම් තවදුරටත් විකෘති චර්යා රටාවන් සහිත පෞරුෂයකින් ඔවුන් කටයුතු කරනු නොලැබේ. මෙහිදී පුද්ගලයාගේ පෞරුෂය ධනාත්මක හා සුබවාදී ලෙස ගොඩනැගිය යුතුය. බොහෝ පුනරුත්ථාපන මධ්‍යස්ථාන තුළ අපරාධකරුවන් සතු පෞරුෂ ගැටලු හඳුනාගෙන චර්යාත්මක හා ප්‍රජානන ක්‍රම උපයෝගී කරගනිමින්

[86] Harry.T., Eunkook, M.S.(2002). Cultural Influences on Personality.Annual Review of Psychology 53(1):133-60

[87] Richard.C.H., Nick.H., Conor.D. (2009). Exploring the Link Between Personality Disorder and Criminality in a Community Sample. Journal of Personality Disorders 22(6): 589-603

සංස්කෘතිය තුළ යහපත් පෞරුෂයක් ගොඩනැගිය යුතු වේ. සුබවාදී පෞරුෂයන් සංස්කෘතීන් තුළ ඇති කිරීමට විවිධ විසඳුම් ඉදිරිපත් කළ යුතු අතර වෘත්තීමය ප්‍රතිකාර සමාජගත කිරීමත්, කුසලතා වර්ධනය කිරීමත්, ඉලක්ක ගොඩ නැගීමත් ආදිය තුළින් සාපරාධී පෞරුෂ ගතිලක්ෂණ සංස්කෘතිය තුළින් ඉවත් කල හැකි වේ.

අපරාධකරුවන් තුළ "මනෝසමාජීය සාදක වල කාර්යභාර්ය ඉන්දියාවේ වැඩිහිටියන්ගේ හැසිරීම" මෙහක් සිකන්ද් ආචාර්ය රාම් මනෝහර් ලොහියා රෝහල, පීජිමර්, නවදිල්ලිය, ඉන්දියාවේ ක්‍රයිස්ට් විශ්ව විද්‍යාලය තුළ සිදු කරන ලද පර්යේෂණයක් වේ[88].

වසර ගණනාවක් පුරාවට ඉන්දියාවේ වාර්ෂිකව සිදු කෙරෙන අපරාධ සංඛ්‍යාවේ අඛණ්ඩ වර්ධනයක් දක්නට ඇති බවත් මෙම ලිපියේ අරමුණ වූයේ මනෝවිද්‍යාත්මක හා සමාජීය සාධක ගැන සොයා බැලීමයි .ඉන්දියානු සන්දර්භය තුළ අපරාධ හැසිරීම් වර්ධනයට දායක වීම. වත්මන් පර්යේෂණ සඳහා, සමගාමී මිශ්‍ර පර්යේෂණ සැලසුම භාවිතා කරමින් අපරාධ වාර්තාවක් ඇති පුද්ගලයින් 20 දෙනෙකු තෝරා ගන්නා ලදී .අරමුණ සඳහා නියැදි ලබා ගැනීමට අපරාධ වාර්තාවක් නොමැති පුද්ගලයින් විස්සක් වයස, ස්ත්‍රී පුරුෂ භාවය මත සහ සමාජ ආර්ථික තත්ත්වය මත යොදා ගැනීමයි. අයිසෙන්ක් පෞද්ගලිකත්ව ප්‍රශ්නාවලිය සංශෝධනය කරන ලද්දේ ඒවා මත ය.

අර්ධ ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණය අපරාධ හැසිරීමට දායක වූ සමාජ සාධක අවබෝධ කර ගැනීම සඳහා අපරාධ වාර්තාවක් ඇති පුද්ගලයින් හය දෙනෙකු සඳහා ගෙන ඇත. එහිදී සැලකිය යුතු වෙනසක් නොමැති බව ප්‍රතිඵල වලින් හෙළිවිය. කණ්ඩායම් දෙක අතර බාහිරකරණය, ස්නායු රෝග, මනෝ විකාර සහ බොරු ලකුණු කිරීමේ පෞරුෂත්ව ලක්ෂණ, සමාජ සහයෝගය නොමැතිකම, අධ්‍යාපනය සහ දැනුවත් කිරීම කෙරෙහි අඩු අවධානයක් යොමු කිරීම, මූල්‍යමය බාධාවන් වැනි විවිධ සමාජ සාධක සහ ඇතැම් පෞද්ගලික ලක්ෂණ බහුලව දක්නට ලැබුණි.

තවද, පෞරුෂයේ අන්තර් ක්‍රියාකාරී බලපෑමක් සහ පාරිසරික සාධක ස්ථාපිත කර ඇත. පුද්ගලයෙකුට මැදිහත් වීමක් ලබා දීම සඳහා වූ ආදර්ශයක් ද යෝජනා කෙරිණි .මෙම පර්යේෂණය තුළින් තවදුරටත් තහවුරු කරගත් සාධක නම් සාපරාධී හැසිරීම් ඇති වීම සඳහා ස්නායු රෝගවාදය සහ මනෝ විකාරවාදය වැනි පෞර්ෂ සාධක මූලික වන බවත් මීට අමතරව අපරාධ ඇති කිරීම කෙරෙහි සංජානනය නැමති සාධක මූලික වන බවත් පෙන්වා දෙන ලදී. මීට අමතරව මෙම පර්යේෂණය තුළදී මනෝ විද්‍යාත්මක සාධක වලට අමතරව සමාජීය සාධක ප්‍රමුඛත්වයක් ගන්නා බව පෙන්වා දෙන ලදී.

එහිදි සමාජ ආර්ථික තත්ත්වය , අධ්‍යාපනය, රැකියාව නැමති සාධක තුළින් මිනිසුන්ගේ අරමුණු සහ ඔවුන් අතර ඇති ගැටුමේ ක්‍රියාවක් හේතුවෙන් අපරාධ වර්ධනය විය හැකි බවත් අවබෝධ කරගත් සාධකයක් විය. මෙම පර්යේෂණය තුළ දී සංස්කෘතික අපගමනයේ න්‍යායන් තවදුරටත් අපගමනය කොට ඇත. මෙම පර්යේෂණයේ මූලික අරමුණු බවට පත්ව ඇත්තේ ද, අපරාධකරුවන් සිටින පුද්ගලයින්ගේ පෞර්ෂත්වය වෙනස අවබෝධ කර ගැනීමත්, අපරාධ හැසිරීමේ දී සමාජ සාධක වල

[88] Sikand, M., & Reddy, K. (2017). Role of Psychosocial Factors in Criminal Behaviour in Adults in India. *International Journal of Criminal Justice Sciences (IJCJS)*, *12*(0973-5089), 22. doi: 110.5281/zenodo.345701

කාර්යය අවබෝධ කර ගැනීමත් වේ. මෙකී අරමුණු සඵල කර ගැනීමේදී පර්යේෂණය තුළ අවබෝධ කරගත් දෑ නම්, පවුල් සහයෝගය නොමැති බව, පියා නොමැතිකම, ගෘහ පරිසරය, දුර්වල අසල්වැසි තත්ත්වයන්, ලේබල් කිරීම වැනි තත්ත්වයන් පුද්ගලයන් තුළ ඍණාත්මක බලපෑම , අඩු සමාජ අර්ථික තත්ත්වය අපරාධ හැසිරීම සඳහා පුද්ගලයාට බලපා ඇති බව තහවුරු වීමයි.

බොහෝ දුරට පර්යේෂණය තුළින් ගම්‍ය වී ඇති කරුණ නම් අපරාධ හැසිරීම සඳහා පුද්ගල පෞර්ෂ සාධක වලට වඩා සමාජ ආර්ථික සාධක බලපා ඇති බවයි. තවද තරුණයින් තුළ ප්‍රචණ්ඩකාමිත්වය වර්ධනය වීමට පෞරුෂත්වයට සාපේක්ෂව සමාජ ආර්ථික සාධක මූලික වී ඇති බව පර්යේෂණයෙන් තහවුරු සත්‍ය වේ. යමෙකු ජීවත්වන ප්‍රජාව අසංවිධාන වීම තුළ සාපරාධී හැසිරීම වර්ධනය වන බව ගම්‍ය වූ කරුණ වේ. ඒ අනුව මෙම පර්යේෂණ පත්‍රිකාව තුළ අවසාන වශයෙන් තහවුරු වන්නේ පෞරුෂත්වය සාපරාධි හැසිරීමට ප්‍රමුඛ ලෙස බල නොපවතින බවයි. එයට සැබෑ ලෙසම සංස්කෘතිකමය තත්ත්වය බලපාන බව පර්යේෂණය තුළින් තහවුරු වන සත්‍යක් වේ.

පෞරුෂත්ව ලක්ෂණ සහ බාල අපරාධ පන්ජාබ්, පකිස්ථානය ආසියා කවුසර්ෆ, මසූඩ් නදීම්, මෙම පර්යේෂණය සිදු කොට ඇත[89]. බාලවයස්කාර අපරාධ, දැන් ගෝලීය වෙමින් පවතින දිනයක් බවට පත් වී ඇත .

පුද්ගල අපරාධකාරීත්වය සංවර්ධනය වෙමින් පවතින රටවලට ප්‍රබල ලෙස බලපෑම් එල්ල කරයි. පෞද්ගලික ගති ලක්ෂණ පිළිබඳව වර්තමාන පර්යේෂණ තුළින් ඒ පිළිබඳව පැහැදිළි වේ. පෞරුෂත්ව ලක්ෂණ සහ බාල වයස්කාර අපචාර අතර සම්බන්ධය සහ වරදකරුවන් හා වරදකරුවන් නොවන බාලවයස්කරුවන් අතර සම්බන්ධ අධ්‍යයනය කිරීම මෙහි දී සිදු කරනු ලබයි. අධ්‍යයනය ස්වභාවයෙන්ම විස්තරාත්මක වේ. නියැදිය සහභාගිවන්නන් 240 දෙනෙකුගෙන් සමන්විතය. (ඔවුන්ගෙන් අඩක් වරදකරුවන්) සහ අරමුණක් ඇති නියැදීමේ තාක්ෂණය යොදන ලදි.

උප පරිමාණයන් හතරක් පෞරුෂ ගති ලක්ෂණ මැනීම සඳහා මිනසෝටා අධ්‍යාපනය, පවුලේ ප්‍රමාණය සහ පවුල් සැකසීම විය. දත්ත SPSS (සංඛ්‍යානමය වශයෙන් ) T-Test භාවිතයෙන් ප්‍රමාණාත්මකව විශ්ලේෂණය කරන ලදි. Multifaceted පෞරුෂ ඉන්වෙන්ටරි භාවිතා කරන ලදී.

මෙම න්‍යාය තුළින් සමාජ ඉගෙනුම් න්‍යාය සපරාධී හැසිරීම කෙරෙහි ප්‍රබල ලෙස බලපාන බවත් බාල අපරාධකරුවන් සම්බන්ධව ගත් කල මෙම පර්යේෂණයේ දී තහවුරු කර ඇත්තේ, පෞරුෂය හා ගති ලක්ෂණ යම් ආකාරයට සම්බන්ධතාවක් පවතින බවයි. මීට අමතරව මෙම පර්යේෂණය තුළින් බාලාපරාධකරුවන් අපරාධකාරී තත්ත්වයන්ට යොමු වීමට හේතු සාධක කිහිපයක් හඳුනා ගෙන ඇත. එනම්, විෂාදය හා එතුළ ගොඩනැගෙන අනාගතය පිළිබඳ බලාපොරොත්තු සුන්වී යාමේ හැඟීම, මානසික අවපීඩන තත්ත්වයන් ආත්ම විශ්වාසය නොමැතිකම යන තත්ත්වය, භින්නෝන්මාදය

[89] Kausar, A., Nadeem, M., Rasheed, M., Amin, F., Fahd, S., & Usman, M. et al. (2015). Personality Traits and Juvenile Delinquency in Punjab, Pakistan. *International Conference On Business, Economics, Management And Behavioral Sciences*. doi: ICBEMBS'2012)

මනෝභාවී තත්ත්වයන් හදුනාගැනීමට හැකි වී තිබේ. මෙම පර්යේෂණය සිදු කර ඇත්තේ බන්ධනාගර තුළ නිසාවෙන්ම යම් යම් සීමාවලට නතු වීමට ඔවුනට සිදු වී ඇත. මූලික දෑ නම් වරදකරුවන් සමඟ කටයුතු කිරීමේ අපහසුතාවයයි.

මෙහි නිගමනය ලෙස සමාජ සංස්කෘතික සාධකයන් පෞරුෂය ඍනාත්මක ලෙස වර්ධනය වීමට බලපා ඇති බව ගම්‍ය වේ. ඒ සඳහා පර්යේෂකයින් යෝජනා කරනු ලබන්නේ පෞරුෂය ධනාත්මකව වර්ධනය වීමට සංස්කෘතිකත්වය හා සමගාමී අධ්‍යාපන රටාවක් මෙම පරිසර රාමුව තුළ වර්ධනය විය යුතු බවයි. මෙම පර්යේෂණ පත්‍රිකා දෙක පිළිබඳව කෙටි අර්ථපූර්ණයක් ඉදිරිපත් කරන විට, මෙම පර්යේෂණ පත්‍රිකා 2 තුළින් එක් අදහසක් ගම්‍ය කරනු ලබයි. එනම්, පුද්ගල සපරාධී ක්‍රියාකාරිත්වයට සැබෑ ලෙසම පෞරුෂත්වය අභිබවමින් සංස්කෘතික සාධක රෝපණය වී ඇති බවයි. විශේෂයෙන්ම සංස්කෘතික සාධක ඍණාත්මක තත්ත්වයන් වර්ධනය වීම තුළ පුද්ගල පෞරුෂ රටා හීන වී පුද්ගලයන් අපරාධ කිරීමට හේතුවන බව මෙම පර්යේෂණ පත්‍රිකා අධ්‍යයනය කිරීමෙන් තහවුරු විය.

මිනිසා සමාජයට අනුකූල ලෙස ජීවත්වීමට හුරු කරවන ක්‍රියාවලිය සමාජානුයෝජන ක්‍රියාවලිය වශයෙන් හැඳින්විය හැකි අතර ජීවත් වන සංස්කෘතික සාධක අනුව පුද්ගලයාගේ පෞරුෂත්වය නිර්මාණය වේ. මිනිසාගේ ආක්‍රමණකාරී හැසිරීම ජීවත් වන සමාජයට අනුගතව ඇති වන නිර්මිතයකි. යහපත් වූ සමාජ සංස්කෘතික ලක්ෂණ පුද්ගලයා ප්‍රචණ්ඩකාරී පෞරුෂත්වයෙන් මුදවා ගන්නා අතර අගතිගාමී සංස්කෘතීන් පුද්ගලයා තුළ ආක්‍රමණශීලී පෞරුෂයයක් නිර්මාණය කරයි. මෙලෙස ඇති වන ආක්‍රමණශීලී පෞරුෂත්වය සමාජය තුළ කලහ ඇති කිරීමට හේතුවක් වන අතර එය ජීවත් වූ සංස්කෘතික පරිසරයද ඍජු බලපෑමක් එල්ල කරයි.

# 10. Gender-based violence and culture

**P. N. H. Dias**
**D. A. T. Bandara**
**R. D. T. Rajapaksha**

Gender-Based violence refers to harmful acts directed at an individual based on their gender. It is rooted in gender inequality, the abuse of power, and harmful norms. And it is another pattern of human rights violence as well. According to the United Nations refugee agency, one in every three women will be subjected to sexual or physical assault at some point in their lives and the threat of gender-based violence for women and girls increases considerably during displacement and times of crisis. As a result, this remark shows how serious the problem of gender-based violence is. Gender-based violence, unlike other forms of violence, is quite widespread in all social institutions. A lot of theories regarding gender-based violence have been produced by representing different subjects.

**Theoretical explanations of gender-based violence**

Psychological theories

- Object theory - it explains that humans are motivated from their earliest beginnings by a need for meaningful interactions with others, who are referred to as objects in the theory.
- Psychodynamic theory - gender based violence is generated because of early childhood experiences and the psychological and moral development of an individual.
- Psychopathological theories - due to the mental disabilities gender-based violence can happen.

Economic theories

- Resource theory - use economic status to control opposite and same gender parties by showing wealth of a person.
- Maxims theory - gender based violence can be generated as a result of social classes divided by the economic nature of the society.

- Neoliberalism – how the combination of political system and economic system generates gender-based violence.

Sociological and cultural theories

- The theory of femicide – relationship between patriarchal structures and gender-based violence.

- Control theory – gender-based violence are generated because of spreading dominance and power towards the opposite gender.

**Cultural Impact on Gender-Based Violence**

The concept of gender is based on social as well as cultural factors. Accordingly, Anthropologist, Edwin S. Segal (2004) has clarified "Gender is taken to refer to a culturally based complex of norms, values, and behaviours that a particular culture assigns to one biological sex or another" [90]. It emphasized that the gender represents a set of cultural factors that transfer a culture on a biological basis and thus determine gender.

The influence of cultural factors on gender can be identified as positive and negative, and gender-based violence can be spotted as the most negative outcome. Gender-based violence is also one of the gravest violations of human rights. United Nations General Assembly (1993) has defined gender-based violence as, "violence that is directed against a person based on their gender or sex, including acts that inflict physical, mental or sexual harm or suffering, threats of such acts, coercion and other deprivations of liberty"[91]. It implies that any physical, mental, or sexual suppression or harassment, or deprivation of liberty based on one's sexuality or gender is gender-based violence. Accordingly, cultural impact on gender-based violence can be elaborated on males and females as well as the LGBTQ [92] community, because those people are developing and can be recognized as the 'third gender' [93]. Therefore, the cultural impact of gender-based violence on each of these communities or gender groups can be clarified as follows.

[90] Segal E.S., "Cultural Construction of Gender", University of Louisville, 2004, p. 1.
[91] United Nations, "Declaration on the Elimination of Violence against Women", Geneva, 1993, p. 1.
[92] LGBTQ – Lesbian, Gay, Bisexual, Transgender and Queer or Questioning.
[93] Segal E.S., "Cultural Construction of Gender", University of Louisville, 2004, p. 4.

Many societies in the world today are male-dominated societies and cultures. This situation is because of the men have been assigned by the culture to feed the family, based on their physical strength. As previously mentioned, culture has made this transfer to men, and many cultures believe that men should always be earners and women and children should be dependents. In the reminiscence of ancient and modern cultures, it can be identified that certain cultures are matriarchal, but even within those cultures, it is difficult to identify the violence against men. For example, the Mosou culture of Tibet, has a matriarchal culture and matrilineal society but the men are independent but have been the earner of their partners [94].

Although, there are limited pieces of evidence of violence against men on cultural grounds which are known as surgical forms, like male circumcision. And all these practices can still be seen, especially in Islamic culture, as well as in African tribal cultures. Nevertheless, some studies have shown that men are more prone to violence due to the impact of culture. According to the WHO's "Violence Prevention the Evidence" report (2009), "traditional beliefs that men have a right to control or discipline women through physical means makes women vulnerable to violence by intimate partners…" [95]. Thus, it is clear that men are perpetrating violence against women under the impact of culture. From all these elements it is conspicuous that there isn't violence against the men on cultural grounds or impacts and the violence against the other genders perpetrated based on cultural impact on men.

In the study of gender-based violence and cultural impact, women are momentous, because they are violence against women is the most pervasive human rights violation in the current world [96]. It is a well-rooted fact that the role of women should be to give birth to children, take care of them and do house duties [97]. Also, some cultures believe that women are there to fulfil men's sexual desires and facilitate them. For example, the Islamic culture and some African tribe cultures [98]. Cultural impact to the violence against women can be elaborated on in three aspects, "Sexual violence, Physical Violence, and Psychological Violence" [99].

[94] Walsh, E.R., "From Namu to Najie; Tourism and the Reshaping Mosou Identity", Skidmore College, 2021.
[95] World Health Organization, "Violence Prevention the Evidence", Geneva, 2009, p. 6.
[96] United Nations," Gender-based Violence", UNFPA, Geneva, 2021.
[97] Thebaud, S., Kornich, S., Ruppanner, L., "Good Housekeeping, Great Expectations, Gender and Housework Norms", Sage Journals, 2019.
[98] Adamczyak, A., Hayes, E.B, "Religion and Sexual Behaviour: Understanding the Influence of Islamic Cultures and Religions Affiliation for Explaining Sex Outside Marriage", American Sociological,, 2012.
[99] United Nations, "Handbook for the Protection of Internally Displaced Problems, 2010.

Under the physical violence against women, domestic violence is the embodiment. Due to the cultural beliefs like women should be dependent on men and cultural practices like patriarchy, women have to be subjected to various forms of physical abuse, which can be ended by death.[100] According to United Nations, the Middle East and North Africa region have the highest rates of violence against women and that region is completely dominating by the Islamic culture [101].

Under the sexual violence against women, can be revealed that some cultures neglect women's sexual rights and still men dominating all the privileges of sexual desires [102]. Also, some mutant traditions like, female circumcision, excision or clitoridectomy, and infibulation or pharaonic circumcision can be seen among African cultural groups as well as some Islamic cultures [103]. In psychological violence, some traditional practices and beliefs can be revealed. For example, some beliefs of Hinduism discriminate against women as adulterated, some Hindu people still neglect the birth of girls due to that. As well as, in Islamic culture and some African tribal cultures some rules that make women mentally distressed. According to the United Nations (2020), women are also mentally distressed by the domestic violence and household duties which they have as a cultural legacy. Some cultures of India follow some strict rules on marriages and those rules make them more inconvenient, and if it is not they have to be a victim of 'honor killings'[104].

LGBTQ community is a group of people who are unable to identify as straight or cisgender [105]. This community has their own culture and lives as a separate community. Some people and cultures are neglecting these LGBTQ communities and unleashing violence on them. That can happen as neglect, sexual exploitation, physical harassment, or mental depression. In the study of unleashing the violence on LGBTQ people, it can be identified that many eastern cultures neglect and make them victimize. For example, 78 countries have banned homosexuality and the majority of it is in Asia including Sri Lanka [106]. Islamic culture is strictly against the LGBTQ community. For example, homosexuality considering as a criminal offence [107]. China

[100] United Nations, "Handbook for the Protection of Internally Displaced Problems, 2010.
[101] World Health Organization, "Violence against Women", www.who.int, 2021.
[102] Riyani, I., "Research on Women Sexuality in Islam", Australia, 2014.
[103] United Nations, "Gender-based violence against women and girls", Geneva, 1995.
[104] Lawctopus.com, "Violence against Women and Children and Criminal Justice", 2021
[105]US government, "LGBT', engage.youth.gov, 2021.
[106] Hrc.org, "Fatal Violence against the Transgender and Non-confirming community 2021", 2021.
[107] Riyani, I., "Research on Women Sexuality in Islam", Australia, 2014

is the country that holds the largest LGBTQ population in the world, but they discriminate against the LGBTQ people and it can usually end with imprisonment.

All these factors confirm that the interpretation of gender is based on cultural factors, and both men and women, as well as LGBTQ people, face different forms of violence based on different beliefs and practices that exist in different cultures.

**Gender and law**

Law is a set of rules which can governed the country. There have several sources of laws such as legislation, case law, customs, international law, religion. There are general laws and personal laws in Sri Lanka. Personal laws include Tesawalamai law, Muslim law, and Kandyan law. Customs and practices influence for those all the laws. Customs is the most considerable source of the law. In primitive society, customs and laws are the same that means both two cannot distinguish in this society. Hence, all people respect their customs. If someone neglected those customs they were expelled from society. Those customs are significant in modern societies too such as Roman-Dutch Law originating from Roman law and Germanic customs. Further, Tesawalamai law and Muslim law also origin through their customs. Therefore, laws origin according to the variety of customs. In this chapter, we will consider how the law affects the gender.

The personal law of Muslims, the husband has huge rights with regards to divorce. But there are not enough rights for women as much as men under Muslim Law. There are several types. Those are, "Mubarat and Talaq". If both parties agree to divorce that is called Mubarat. But it requires the consent of the husband. This Mubarat cannot be implemented without the consent of the husband. Moreover, since they are divorced by mutual consent, neither party is required to pay. Gender inequality can also be identified through this. Mubarak is implementing it by mutual consent. But mostly considers the will of the husband. It can be identified as gender inequality. Those Muslim laws are also shaped by their culture. Gender inequality can be identified through this mentioned Muslim law.

In Islamic law, the term Talaq is a husbands' right regarding getting a divorce. After announcing this term Talaq to his wife means that he divorced her. The husband should have the desire to pronounce Talaq to give notice to Qazii after Qazi should attempt to solve this problem. If this attempt does not work for them within 30 days, the husband must pronounce this term Talaq in front of the Quazi and two witnesses. Also, the husband can pronounce talaq in front of the

Quazi without his wife and then inform the wife. There is faskh divorce for women, where she can apply this if husband is cruel. But once this Talaq divorce is pronounced, the wife cannot apply for fake divorce. There is a divorce named khul. The wife cannot apply for this divorce without the husband's consent and participation. This law is also based on gender. According to this, females become pressured because there are more divorce rights to the husband than the wife.

The personal law of Tesawalamai is applicable for Tamil people in Jaffna province. Under this law, one cannot inherit all the property. They can inherit only joint property. Under the Thesawalamai law, Tamil women in Jaffna cannot gain full control over their property without the consent of their husbands if they get married. That also creates a difficult situation for the wife.

According to "Section 3 of Married Women's Property Ordinance No.18 of 1923", Whenever a woman marries, after the commencement of this Ordinance, a man of a different race or nationality from her own, she shall, subject to the provisions of section 3 of the Jaffna Matrimonial Rights and Inheritance Ordinance, and of the Kandyan Marriage and Divorce Act, be taken to be of the same race or nationality as her husband for all the purposes of this Ordinance, so long as the marriage subsists and until she marries again.

According to"Article 12(2) of the Constitution of Sri Lanka"**,** all persons are equal before the law and are entitled to the equal protection of the law. Hence, men and women should have equal rights for everything. But there are some gender inequalities that can be identified through the aforesaid points. According to those facts, gender inequality is created by personal laws.

# 11. විවිධ සංස්කෘතීන් මත වෙනස් වන අපරාධ

**ඩී. එම්. ඩී. එල්. සංජීවනී**

**ආර්. ඩී. අයි. එම්. රාජපක්ෂ**

**ඩබ්. එම්. එච්. රුවන්තිකා**

ලෝකයේ ගතිකත්වයේ මැවුම්කරු ලෙස සංස්කෘතිය (Culture) අර්ථගැන්විය හැකිය. යම් රටකට ආවේණිකත්වයක් ලබා දෙන්නේ එරට සංස්කෘතිය මගිනි. මෙම සංස්කෘතික විවිධත්වය මත එයටම ආවේණික අපරාධ රටාවක් ගොඩනැගී ඇත. ලාංකීය සංස්කෘතිය තුළ වාර්ගිකත්වය, කුල විභේදනය, පුරුෂාධිපත්‍ය යන සාධක ඉහළින්ම පවතින අතර විවිධ උප සංස්කෘතින් ද පවති. මේ විවිධත්වය මත ගොඩනැගුණු අපරාධ රටාවක් ශ්‍රී ලංකාව තුළ හඳුනාගත හැකි ය. එමෙන් ම ලෝකයේ රටවල් වල පවතින ස්වභාවයන් අනුව සංස්කෘතිය ගොඩනගා ගෙන ඇති අතර ඉන්දියාව, ඉරානය, දකුණු සුඩානය, ඇමරිකා එක්සත් ජනපදය වැනි රටවල් තුළින් මේ විවිධත්වය කැපී පෙනෙන අතර මේ නිසාම එම රටවල් වලට ආවේණික අපරාධ රටාවන් හඳුනාගත හැකි ය.

ශ්‍රී ලාංකික සංස්කෘතිය බහු වාර්ගික සහ බහු ආගමික රටක් වන අතර මේ සංස්කෘතික විවිධත්වය නිසාම ශ්‍රී ලංකා සංස්කෘතිය තුළ වාර්ගික ගැටුම් වරින්වර ඇතිවේ. එය සමාජය මුසපත් කරමින් අපරාධකාරී වාතාවරණයක් කරා ගෙන යාමට සමත් වී තිබේ. ප්‍රධාන වශයෙන් ම සිංහල, දෙමළ සහ මුස්ලිම් යන ප්‍රධාන ජන කොටස් ත්‍රිත්වය අතර මෙකී තත්ත්වය ඉස්මතු වේ. මෙම ජනවාර්ගිකත්වය මත ඇති වූ ගැටුමක් ලෙස 1983 සිට 2009 දක්වා පැවති දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය නමින් සිංහල ජාතීන්ට එරෙහිව ඇති කළ සිවිල් යුධ අරගලය දැක්විය හැක. එම සිවිල් ගැටුම් තිස් වසරක් පුරා පැවති අතර යුද්ධය අවසන් වූයේ විශාල වශයෙන් මනුෂ්‍ය ඝාතන ඇති කරමින්, දේපළ විනාශ කරමින් හා අයිතිවාසිකම් කඩ කරමින් ය.

සිංහල හා දෙමළ පමණක් නොව මුස්ලිම් සංස්කෘතිය තුළ ද අපරාධකාරී වාතාවරණයන් ගොඩනැගී ඇති බව ශ්‍රී ලංකා ඓතිහාසික කරුණු විමසීමෙන් ප්‍රත්‍යක්ෂ වේ. 2014 වර්ෂයේ ප්‍රදේශ කිහිපයක පැතිර ගිය සිංහල මුස්ලිම් ගැටුම් වලින් සිව් දෙනෙකු ජීවිතක්ෂයට පත්ව තවත් විස්සකට ආසන්න පිරිසක් තුවාල ලැබීම නිදසුන් ලෙස දැක්විය හැකි ය. මෙහි දී එක් ජාතියකට තම සංස්කෘතිය තුළ අනන්‍යතාවය ගොඩ නගා ගැනීමට යාමේ දී විවිධ ගැටුම් ඇති වී විවිධ අපරාධ සිදුවේ.

ශ්‍රී ලංකා සංස්කෘතිය තුළ කුල ක්‍රමය වර්තමානයේ එතරම් වැදගත් සාධකයක් නොවූව ද අතීතයේ දී ශ්‍රී ලංකාව තුළ කුලය පදනම් කරගෙන ප්‍රචණ්ඩ අරගල ගොඩනැගුණි. 1960 ගණන් වල දී යාපනයේ කෝවිල් වලට ඇතුලු වීම සම්බන්ධව ගොඩනැගුණු ප්‍රචණ්ඩ අරගලය නිදසුන් වේ[108]. ශ්‍රී ලංකාව තුළ සිංහල කුල ක්‍රමය, ශ්‍රී ලාංකික දෙමළ ජනයා අතර ඇති හින්දු කුල ක්‍රමය හා ඉන්දියානු දෙමළ ජනයා තුළ ඇති හින්දු කුල ක්‍රමය ආදි වශයෙන් කුල ක්‍රම ත්‍රිත්වයක් හඳුනාගත හැකි ය. මෙම ප්‍රධාන කුල තුනට අමතරව ඒවායේ තවත් කුල බෙදීම් පවති. මෙම කුල ක්‍රමය ජාතිකත්ව හැඟීම් වර්ධනය වීමට ,

[108] සිල්වා, කේ ටී., පරමසෝති, ටී., සිවප්‍රතාශම්, පී.පී. (2009). කුලෙන් තොරද කුල අන්ධ ද?.https://idsn.org

කුල අසාධාරණකම් සිදු වීමට ද හේතු වී තිබේ. මෙම අසාධාරණකම්වලට එරෙහිව නැගී සිටීමට යාමේ දී මනුෂ්‍ය ඝාතන, පහරදීම්, ප්‍රචණ්ඩ අපරාධ ආදිය සිදුවේ.

දකුණු ආසියාතික රටක් වන ශ්‍රී ලංකාව තුළ ද පුරුෂාධිපත්‍ය සංස්කෘතිය කැපී පෙනේ. මේ නිසාම ගෘහය සහ සමාජය තුළ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, කාන්තා හිංසනය, ආදි අපරාගාමී චර්යාවන් සිදුවේ. සමාජය සහ සංස්කෘතිය අතර අවියෝජනීය සම්බන්ධයක් පවතින අතර යම්කිසි සමාජයක ජීවත් වන සාමාජිකයන්ගෙන් බහුතරය විසින් දුන නියම කර ගත්තා වූ ජීවන රටාව ප්‍රධාන සංස්කෘතිය හෙවත් මහා සංස්කෘතිය වේ. එම මහා සංස්කෘතියට බාධාවක් නොවන ආකාරයට මෙන්ම එම මහා සංස්කෘතියෙන් පැහැදිලිව වෙනස් වූ කණ්ඩායමක හැසිරීම් රටාව උපසංස්කෘතිය ලෙස හඳුනාගත හැක. ඒ අනුව උපසංස්කෘතිය යනු, මහා සංස්කෘතිය නැමති කුලකයට අයත් උපකුලකයක් වැනිය.

කිසියම් උප සංස්කෘතියක් බිහි වීම කෙරෙහි අදාළ කණ්ඩායම හෝ සමූහය මහා සමාජයෙන් වෙන්වී පැවතීම, කණ්ඩායමේ සියලු දෙනාම සමාන කාර්යයක නිරත වීම, කණ්ඩායමේ එකිනෙකා අතර අන්තර් ක්‍රියා පැවැත්වීම යනාදී නිර්ණායක බලපානු ලබයි. සමාජවිද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් අවධානය යොමු කිරීමේදී භාෂාව, ආගම, වාර්ගිකත්වය, කුලය, ප්‍රාදේශික විවිධත්වය, අධ්‍යාපනය, රැකියාව, ගිහිපැවදි භේදය, ග්‍රාමීය නාගරික බව සහ ස්ත්‍රී පුරුෂභාවය වැනි සාධක පදනම් කරගෙන විවිධ උප සංස්කෘතීන් බිහිවී ඇති බව විද්‍යාමාන වේ. ඇල්බට් කොහෙන් ගේ (Delinquent Boy) නම් කෘතියේ දක්වන ආකාරයට "උප සංස්කෘතිය යනු එකම සංස්කෘතික රාමුවකට අනුගත වූ එකම සමාන විශ්වාස හා ක්‍රියාකලාපයන් බෙදාහදා ගන්නාවූ පිරිසක් තුළ ඇති වන අන්තර් ක්‍රියාවල ප්‍රතිඵලයක් වශයෙන් බිහි වන්නකි".

ලාංකීය සමාජය ද උප සංස්කෘතීන්ගෙන් අනූන වන අතර, ප්‍රාදේශිය උප සංස්කෘතිය, ජනවාර්ගික උප සංස්කෘතිය, ග්‍රාමීය උප සංස්කෘතිය, නාගරික උප සංස්කෘතිය, වෘත්තීමය උප සංස්කෘතිය, ආගමික උප සංස්කෘතිය නම් වේ. මෙම උප සංස්කෘතීන් ද විවිධත්වය මත තවත් කොටස් ගණනාවකටම බෙදී යන අතර මුඩුක්කු හා පැල්පත් උප සංස්කෘතිය යනු නාගරික වශයෙන් දැක ගන්නා වූ එක් උප සංස්කෘතියකි. අවිධිමත් වූ ආර්ථික කටයුතු වලින් සම්පාදිත වූ මෙය නගරයේ දූර්වල ප්‍රදේශයකි. පුද්ගලයින් මෙම උපසංස්කෘතිය අනුගත වීමත් සමග ප්‍රචණ්ඩකාරීත්වය පෙන්නුම් කරන අතර අපරාධකාරී චර්යාවන් සඳහා වැඩි නැඹුරුවක් දක්වනු ලබයි. අවිධිමත් ආර්ථික කටයුතු වල නිරත වන මොවුන්ගේ ප්‍රධාන ආදායම් මාර්ග වන්නේ මත්ද්‍රව්‍ය ජාවාරම්, මංකොල්ලකෑම් හා ගණිකා වෘත්තියයි. තරුණ විරැකියාව, අඩු අධ්‍යාපන මට්ටම, බාලවයස් විවාහ හා මූලික අධ්‍යාපනය හෝ නොලැබීම හේතුවෙන් බාල අපරාධ, සමාජ විරෝධී ක්‍රියා මෙම සමාජයේ බහුල වේ.

ප්‍රධාන නගර හා පොදු ස්ථාන මූලික කරගනිමින් යාචක උප සංස්කෘතියක් ගොඩනැගී ඇත. බාලවයස් කරුවන්, ආබාධිත පුද්ගලයින් හා කාන්තාවන් බහුල වශයෙන් යොදා ගනිමින් සිගමන් යැදීම සිදු කරන අතර, මෙම උප සංස්කෘතිය තුළ මූල්‍ය පදනම මත අපරාධ ගොඩ නැගී ඇත. කාන්තාවන් හා බාල වයස්කරුවන් යොදා ගනිමින් මංකොල්ලකෑම, සොරකම් කිරීම, තැරැව්කරුවන් මාර්ගයෙන් මහා පරිමාණ මුදල් වංචාද මෙම සංස්කෘතිය තුළ බහුල වේ.මෙම සංස්කෘතිය තුළ කාන්තාවන්ට හා බාල

වයස්කරුවන්ට ආරක්ෂාව හා ස්ථාවරත්වයක් නොමැති වීම හේතුවෙන් බොහෝ කාන්තාවන් ස්ත්‍රී දූෂණ වලට ද බල වයස්කරුවන් ලිංගික අපරාධ වලට ද බහුල වශයෙන් ගොදුරු වේ[109].

උප සංස්කෘතීන් අතර අපරාධකාරී චර්යාවන් වැඩි වශයෙන් පිළිබිඹු වන උප සංස්කෘතියක් ලෙස බන්ධනාගාර සංස්කෘතිය හැඳින්විය හැක. මොවුන්ටම ආවේණික වූ වාග් ශෛලීයක්, හැසිරීම් රටාවක්, හා චර්යයාවලින් සමන්විත වන අතර සම ලිංගික සේවනය, ලිංගික ප්‍රචණ්ඩත්වය හා ලිංගික හිංසනය බහුලවම මෙම සංස්කෘතිය තුළ දැක ගත හැකි වේ.

පාතාල උප සංස්කෘතිය නව අපරාධකරුවන් බිහි කරන්නා වූ සංස්කෘතියකි. මෙම සංස්කෘතිය තුළ අපරාධ හා අපරාධ යන දෙඅංශයම හමු වේ. සමාජය විසින් ප්‍රතික්ෂේප කරන්නාවූ ක්‍රම ප්‍රධාන ආදායම් මාර්ග වන අතර බොහෝ විට සමාජය විසින් ප්‍රතික්ෂේප කරන්නාවූ මෙන්ම සමාජය විසින් විවිධ ලේබල් ගසන්නා වූ සම ජාතීය කණ්ඩායමක් වටා මෙම සංස්කෘතිය නිර්මාණය වී ඇත. මෙම සංස්කෘතිය තුළ සෑම අපරාධයක්ම අඩු වැඩි වශයෙන් දැක ගැනීමට හැකි වන අතර මනුෂ්‍ය ඝාතන, මහා පරිමාණ මත්ද්‍රව්‍ය ව්‍යාපාර, මංකොල්ලකෑම වැනි අපරාධ බහුලවම දැකගත හැකි වේ.

ඇඟළුම් කර්මාන්තශාලා ආශ්‍රිතව උප සංස්කෘතියක් ද ශ්‍රී ලංකාව තුළ දැක ගත හැකි අතර බහුල වශයෙන් අයෝජන කලාප ආශ්‍රිතව මෙය දැක ගත හැකි වේ. රැකියාවක් අපේක්ෂාවෙන් පැමිණෙන තරුණ තරුණියන් ඇඟළුම් කර්මාන්තශාලා ආශ්‍රිත රැකියාවක නිරත වන අතර එම ආයතන වල බලාධිකාරීවරුන් විසින් තරුණියන් හා තරුණ කාන්තාවන් හට විවිධ බලපෑම් සිදු කරන අතර එහි ප්‍රතිඵලය වන්නේ තරුණියන් ලිංගික දූෂණ හා අපයෝජන වලට ගොදුරු වීමයි. එහි අතුරු ප්‍රතිඵලය වන්නේ එම කාන්තාවන් පසු කාලීනව ගණිකා වෘත්තියේ යෙදීම හා ලිංගික සූරා කෑමට ලක්වන අතර සමාජය තුළ නොදැනුවත්ම වින්දිතභාවයට පත් වේ.

ශ්‍රී ලංකාව තුල දැක ගත හැකි තවත් උප සංස්කෘතියක් ලෙස ධීවර උපසංස්කෘතිය දැක ගත හැකි වේ. රැකියාව මත ගොඩනැගුණු මෙම උප සංස්කෘතිය තුළ ඔවුන්ටම ආවේණික වූ වාග් ශෛලීයයක් ද ඇදහිලි හා විශ්වාසයන්ගෙන් ද සමන්විත වේ. රැකියාව මත පදනම් ජීවන රටාව හේතුවෙන් ස්වභාවයෙන්ම ඔවුන් ප්‍රචණ්ඩකාරී වන අතර මෙම සංස්කෘතිය තුළ ද අපරාධ රටාවක් දැක ගත හැකිය. විශේෂයෙන් පරම්පරාවෙන් ධීවර රැකියාව උරුම වීම හේතුවෙන් ප්‍රදේශයේ ආධිපත්‍ය පැතිර වීම හේතු කොට ගෙන මෙම සංස්කෘතිය තුළ පාතාල අපරාධ සංස්කෘතියක් දැකි ගැනීමට හැකි වේ. මෙම සංස්කෘතිය තුළ මත්ද්‍රව්‍ය ජාවාරම් සුලභ වේ[110].

---

109 අමරසේකර සී., වෙල්ගම.ජේ.එම්.ඩබ්. (2020) මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ නේවාසිකයන්ගේ උපසංස්කෘතිය සහ දිළිඳුකම අතර පවතින සම්බඳතාව පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්, සබරගමුව විශ්වවිද්‍යාලය. https://www.researchgate.net

110 De silva Nirekh,(2013),Sri lanka"s Traditional Knowledge and Traditiona Cultural Expressions of Health and Wellbeing. https://www.researchgate.net. [Accessed on3 October 2021]

අත්කම් ශිල්පියා විසින් ඔහුගේ මෙවලම් ආධාරයෙන් අමු ගලක් අලංකාරයෙන් හැඩගැස් වූවාක් මෙන් සමාජය විසින් ම පුද්ගලයකුගේ සමාජීය හා සදාචාර යෝග්‍යතාවය කැටයම් කරයි. සංස්කෘතිය පුද්ගලයා නිවැරදි මාවතකට ප්‍රවර්ධනය කරනතාක් එය වලංගු සංස්කෘතියකි. නමුත් සංස්කෘතීන් සාධාරණ ද නැද්ද යන්න නොසලකා පුද්ගලයාට එක් මාවතක් අනුගමනය කිරීමට බල කළහොත් එම සංස්කෘතිය ප්‍රවර්ධකයෙකු ලෙස නොව නිශේධනයක් ලෙස ක්‍රියා කරයි. ලෝකයේ පවතින විවිධ සංස්කෘතීන් අනුව වෙනස්වන අපරාධකාතරීත්වයන් විමසා බැලීම මේ අනුව වැදගත් වේ.

**ඉන්දියාව**

ඉන්දියාව යනු දැඩි සංස්කෘතික මතවාද පවතින බහු සංස්කෘතවාදී රටක් ලෙස හඳුනාගත හැකි අතර ඉන්දියාව තුළ සිදු වන ගෞරව ඝාතනය, ලිංගිකත්වය මත පදනම් කොට සැලකීම, දෑවැදි මරණ ආදිය සංස්කෘතික සාධක මත පදනම්ව සිදුවන අපරාධ ලෙස හඳුනාගත හැකි ය. එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFA) ඇස්තමේන්තු කර ඇති පරිදි වාර්ෂික ලොව පුරා සිදු කරන ගෞරවනීය ඝාතන සංඛ්‍යාව 5000 ක් පමණ වන අතර රාජ්‍ය නොවන සංවිධානයන්හි වාර්තාවන්ට අනුව එය 20000 ක් පමණ වෙතැයි ගණන් බලා ඇත. ඉන්දියාව තුළ පවතින පුරුෂාධිපත්‍ය මෙම ගෞරව ඝාතනයට අවකාශය සලසාලයි. සංස්කෘතියට නුසුදුසු ඇඳුම් පැලඳුම් ඇදීම, තනිව විවාහ වීමට කැමති වීම, විවාහ ගිවිස ගැනීම ප්‍රතික්ෂේප කිරීම ආදි සංස්කෘතික ප්‍රතිපත්ති කඩ කිරීම ගෞරව ඝාතනයට අවශ්‍ය පසුබිම සලසයි. ඉන්දීය සංස්කෘතිය තුළ පුරුෂාධිපත්‍ය වඩාත් හොඳින් තේරුම් ගැනීමට Suzanne Ruggi (1998)[111] නිර්වචනය වැදගත් වේ. "කාන්තාවන්ගේ කන්‍යාභාවය ඇය වටා සිටින පිරිමින්ගේ වස්තුවක් වන අතර පළමුව ඇගේ පියා හා පසුව සැමියාගේ තෑග්ගක් වේ". ඉන්දියාව තුළ පුරුෂයාට දෑවැදි ලෙස ලැබෙන්නේ ලිංගික දේපළ වන අතර මේ නිසා ස්ත්‍රී දූෂණ බහුලව සිදු වූවත් ඒවා වාර්තා වීම සිදු නොවේ. ඉන්දියාවේ බොහෝ කුල ක්‍රමයන් අනුව තම කුලයෙන් බැහැරව විවාහ වීම සංස්කෘතිමය වශයෙන් තහනම් ය. එය කුලයන් දෙකට අයත් දෙදෙනාටම දඬුවම් ලැබිය හැකි වරදකි. මේ කුල භේදය නිසාම ඉන්දීය උතුරුදිග ප්‍රාන්තයේ 2018 වර්ෂයේ කුල තත්ත්වය පදනම් කරගෙන ප්‍රචණ්ඩ ගැටුම් ඇති විය.

**දකුණු සුඩානය**

වසර පනහක දේශපාලන අරගලයකින් පසු 2011 දී උතුරු සුඩානයෙන් නිදහස ලබාගත් ලොව ලාබාලතම රාජ්‍ය දකුණු සුඩානය වේ. මෙහි සෑම ජනවාර්ගික කණ්ඩායමක් තුළ තවත් උප බෙදීම් පවතියි. දකුණු සුඩානය තුළ අපරාධ හා සිවිල් කටයුතු පිළිබඳ 90%ක්ම තීරණය වන්නේ චාරිත්‍රානුනුකූල නීතිය මගිනි. දකුණු සුඩාන සංස්කෘතිය තුළ ගවයින් වටිනා සම්පතක් ලෙස සලකන හෙයින් ගව සොරකම් අධිකව පවති. පුළුල් ලෙස ආයුධ තිබීම හේතුවෙන් මෙම ගැටුම් ප්‍රචණ්ඩ ගැටුම් දක්වා මාරාන්තික වන අවස්ථා පවති. ගවයින් දෑවැදි ලෙස දීම නිසාත්, දෑවැද්දේ වටිනාකම වැඩි වීම නිසාත්, මිනිසුන් විවාහ සම්පත් රැස්කිරීමේ අරමුණින් මෙලෙස ගව සොරකම් කිරීමට හේතු වේ. විවාහය තුළින්

111 Ruggi, S. (1998).Commodifying Honor inFemale Sexuality.https://merip.org

සුඩානයේ ජීවන රටාව සහ සිරිත් විරිත් වල ස්ථාවරත්ය තහවුරු කරයි. එමෙන් ම සුඩාන සංස්කෘතිය තුළ බහුල වශයෙන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පවතින අතර බිලිං ප්‍රාන්තයේ විනිසුරුවරයාට අනුව ස්වාමි පුරුෂයා තම බිරිඳට පහර දීම පවිත්‍ර කිරීමේ උත්සාහයක් ලෙස සැලකේ. එමෙන් ම දකුණු සුඩානය තුළ පුරුෂයන්ගේ බහු විවාහ එරට සාමාන්‍ය දෙයකි. එමෙන් ම දකුණු සුඩානයේ ඇතැම් දෙමාපියන් විසින් මනාලියගේ දෑවැදි මිලෙන් ප්‍රයෝජන ගැනීම සඳහා ළමා විවාහයන් සිදු කිරීම සාමාන්‍ය දෙයකි. එමෙන් ම දකුණු සුඩානයේ මහා පරිමාණයෙන් වාර්ගික යුද්ධ පවති. ග්‍රාමීය නාගරික වාර්ගික ගැටුම්, ජාතික හා උප ප්‍රාන්ත මට්ටමේ ගැටුම් ආදි වශයෙන් ගැටුම් පවතින අතර 2009 වර්ෂයේ මේ ගැටුම් හේතුවෙන් සිවිල් වැසියන් 1200කට අධික පිරිසක් මිය ගිය අතර පුද්ගලයන් 26000 ක් අවතැන් වූහ [112]. එමෙන් ම දකුණු සුඩානය තුළ ලකුටා වැනි ගෝත්‍රයන් තුළ කාන්තාවන් පැහැරගෙන යාම විවාහ චාරිත්‍රයක් ලෙස සලකන අතර මේ නිසා කාන්තාවන් දැඩි ලෙස ශාරිරික හා ලිංගික හිංසනයන්ට ලක් වීම සිදු වේ.

**ඉරානය**

ඉරාන සංස්කෘතියට අනුව කාන්තාව දුර්වල අයෙකු ලෙසත් කාන්තාව පුරුෂයාගේ දේපළක් ලෙසත් සැලකේ. පුරුෂයාගේ ඥාතීන් විසින් කාන්තාවන් ගෞරවනීය ලෙස ඝාතනය කිරීම අඛණ්ඩ ලෙස සිදු වේ. ඉරානය තුළ බොහෝ විට උසාවි පවත්වාගෙන යන්නේ පූජකයන් විසින්ය. මේ නිසා කාන්තාවන් ලිංගික අතවර වී පැමිණිලි කරත් පූජකයා අපරාධකරුට සහය දක්වීම සිදු කරයි. පවුල් සම්බන්ධ නීතිය ෂරියා නිතීය වන අතර ගැහැණු ළමයින් අවුරුදු 13 වන විට විවහා වීම සිදු වේ. එමෙන් ම බහු විවාහ එරට නීත්‍යානුකූල වන අතර දික්කසාද වීම පුරුෂයාගේ පරමාධිපත්‍ය යටතේ පවති. එමෙන්ම කාන්තාවන් නුසුදුසු ලෙස ඇඳ පැළඳගෙන සිටින විට ඇසිඩ් ආදිය ගැසීම නගර තුළ සිදු වේ. ටෙහෙරානයේ පැමිණිලිකරුවකු දක්වූයේ කාන්තාවන් නිසා සදාචාරය දූෂණය දිරිමත් කරන බවයි[113]. එමෙන් ම කාන්තාවන් සම්බන්ධයෙන් දැඩි නීතිරීති පද්ධතියක් පවතින අතර ඔවුන්ට දැඩි ඇඳුම් පැළඳුම් ඇඳීමට සිදු වේ. ඇඳුම් පැළඳුම් සංග්‍රහය උල්ලංඝනය කිරීම මාස දෙකක සිර දඬුවමක් හා ඩොලර් 25 සිර දඩුවමක් ලැබීමට හේතු වේ. නමුත් මෙම දැඩි අසමාන සංස්කෘතික මතවාද නිසා එරට කාන්තාවන් අරගල කළ අතර 1979 සමාන අයිතිවාසිකම් පදනම්කරගත් විප්ලවය නිදසුන් වේ.

**ඇමරිකා එක්සත් ජනපදය**

එක්සත් ජනපදය තුළ ස්ව ජනතාව මෙන් ම සංක්‍රමණික ජනතාව ද බහුලව ජීවත් වන බැවින් ලෝකයේ සෑම රටකම පාහේ බලපෑමක් ලැබී ඇත. මේ සංස්කෘතික විවිධත්වය මත විවිධ අපරාධකාරීත්වයන් හඳුනාගත හැකිය. මර්ජුවානා වැනි මත්ද්‍රව්‍ය ඇලස්කාව, කැලිෆෝනියාව, කොරලාඩෝ, මැසුචුසෙට්, නෙවාඩා, ඔරිගන් වැනි ප්‍රාන්ත වන විනෝදාත්මක කටයුතු සඳහා භාවිතා කිරීමේ දී නීති ගත කර

[112] Rolandsen.H.Øystein, Breidlid Marie Ingrid,(2012).A Critical Analysis of Cultural Explantation for The Violence in Jonglei State, South Sudan. htttps://www.academia.edu.
[113] Mohmoudi Hoda,2019.Freedom and the Iranian Women's Movment.https://juurnals.sagepub.com

ඇති අතර නමුත් ෆෙඩරල් නීතිය යටතේ මර්ජුවානා නීති විරෝධී මත්ද්‍රව්‍යක් ලෙස දක්වා ඇත. ඇමරිකානු සංස්කෘතිය ලිංගිකත්වය විවෘත මාතෘකාවක් වන අතර ලොව කාමුක දර්ශන වලින් 73% නිෂ්පාදනය කරනු ලබන්නේ එක්සත් ජනපදය විසිනි. මේ විවෘත ලිංගික සංස්කෘතිය නිසාම එරට ළමුන් කුඩා කාලයේ දීම ලිංගික සබඳතා පැවැත්වීමේ සම්භාවිතාව ඉහළ වන අතර මේ නිසා ළමා අපයෝජන, අනිසි ගැබ්ගැනීම්, ස්ත්‍රී දූෂණ වැනි අපරාධයන්ට එය හේතු වේ. ඇමරිකාව තුළ ගිණි අවි භාවිතය සම්බන්ධ සංස්කෘතියක් පවතින අතර මේ නිසාම 2005 කෙන්ටකී ප්‍රාන්තයේ ගිණි අවි ආශ්‍රිත මරණ 541න් 375 ක්ම වෙඩි තබාගැනීම්, සියදිවි නසා ගැනීම්, මිනි මැරුම් 143ක්, අනතුරු 11ක් පොලිසි වෙඩි තැබීම් 90ක් මෙම ගිණි අවි සංස්කෘතිය මත ගොඩනැගුණු අපරාධ ලෙස හඳුනාගත හැකි ය[114]. ඇමරිකාව තුළ සුදු - කළු වර්ණ භේදය වර්තමානයේ ද සුළු වශයෙන් පවතින බව 2020 වර්ෂයේ පොලිස් නිළධාරියකු ස්වකීය අභිමතය පරිදි ඝාතනය කිරීමේ සිද්ධියෙන් මනාව ගම්‍යමාන වේ.

යම් රටක අනන්‍යතාව ගොඩනගන්නේ එරට සංස්කෘතිය මගිනි. ශ්‍රී ලංකාව තුළ බහු සංස්කෘතියක් පවතින අතර ඒ තුළ විවිධ උප සංස්කෘතීන් ද හඳුනාගත හැකි ය. ලාංකීය සමාජය තුළ තවමත් වාර්ගිකත්වය, කුල විභේදනය, පුරුෂාධිපත්‍ය යන සාධක ඉහළින්ම පවතී. මේ නිසාම වාර්ගික ගැටුම්, කුල බෙදීම් හා ඒ නිසාම ගොඩනැගුණු ප්‍රචණ්ඩත්වයන්, පුරුෂාධිපත්‍ය නිසාම ගෘහයේ සිට මහා සමාජ දක්වාම කාන්තාව විවිධ අයුරින් අපරාධ වලට ගොදුරු වීම ආදී සංස්කෘතික ලක්ෂණ අනුව ගොඩනැගුණු අපරාධ චර්යාවන් ලෙස නිගමනය කළ හැකි ය. මහා සංස්කෘතියට අමතරව ලාංකීය සමාජය තුළ උප සංස්කෘතීන් කිහිපයක් ද දැක ගත හැකි වන අතර මුඩුක්කු හා පැල්පත් උපසංස්කෘතිය, යාචක උපසංස්කෘති, බන්ධනාගාර උපසංස්කෘතිය, පාතාල උපසංස්කෘතිය, ඇඟළුම් කර්මාන්ත ශාලා ආශ්‍රිත උපසංස්කෘතිය, ධීවර උපසංස්කෘතිය, වතු ජනාවාස සංස්කෘතිය ආදි වශයෙන් වන අතරම එම උප සංස්කෘතීන්ට ආවේණික අපරාධකාරීත්වයන් ගොඩනැගී ඇතිබව නිගමනය කළ හැකි ය. ලෝකයේ කලාප අනුව රටවල් වල ස්වභාවය අනුව, සංස්කෘතීන් අනුව අපරාධකාරීත්වයේ විවිධත්වයක්, ආවේණිකත්වයක් පවතින බව නිගමනය කළ හැකි ය. ඇමරිකා එක්සත් ජනපදය තුළ අවි ආයුධ භාවිතා කිරීමේ සංස්කෘතිය නිසාම ඊට ආවේණික අපරාධකාරීත්වයන් ගොඩ නැගී ඇත. දකුණු සුඩානය, ඉරානය වැනි රටවල් තුළ දැඩි සංස්කෘතික විවිධත්වයක් පැවතියත් එරට සංස්කෘතීන් විසින්ම අපරාධකාරීත්වය බිහිවීමට අවශ්‍ය පසුබිම ගොඩනගන බව නිගමනය කළ හැකි ය. පුරුෂාධිපත්‍ය මූලික කරගෙන ඉන්දීය සංස්කෘතිය ගොඩනැගී ඇති අතර මේ නිසාම කාන්තාව දැඩිලෙස වින්දිතභාවයට පත් වේ.මේ අනුව සංස්කෘතික සාධක අපරාධ සිදුවීම කෙරෙහි ඍජු හෝ වක්‍ර බලපෑමක් සිදු කරනු ලැබේ.

[114] MD,Lippmann Steven, 2010.Guns:Dangerous,Especially For Suicide and Costy for America. https://www.ncbi.nlm.nih.gov

# 12. ආගමික සංස්කෘතිය හා අපරාධ නිවාරණය

**එම්. එස්. එස්. කුමාර**

**ටී. එච්. විශාර**

ආගමික සංස්කෘතිය හා අපරාධ නිවාරණය සැලකීමේදී ප්‍රථමයෙන්ම ආගමික සංස්කෘතිය හදුනාගැනීමට ප්‍රථම සංස්කෘතිය යනු කුමක්ද? යන්න පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම වැදගත් වේ. ඒ අනුව සංස්කෘතිය යනු,

"සමාජයේ සාමාජිකයකු වශයෙන් මිනිසා විසින් අයත් කර ගන්නා වූත්, ලබා ගන්නා වූත් දැනුම, විශ්වාසය, කලාව, සදාචාරය, දහම් හා වෙනත් හැකියාවන් සමස්ත සංස්කෘතිය වේ." මීට අමතරව සංස්කෘතිය පිලිබඳ කතා කිරීමේදී, සමාජයේ විද්‍යාත්මක එළඹුම, මානව විද්‍යාත්මක එළඹුම, සෞන්දර්යත්මක එළඹුම යනාදි එළඹුම් ඔස්සේ සලකා බලනු ලැබේ.

එමෙන්ම සංස්කෘතියේ ප්‍රධාන කොටස් දෙකකි,

- භෞතික සංස්කෘතිය
- අභෞතික සංස්කෘතිය

මහ සංස්කෘතියේ උප සංස්කෘතියක් ලෙස ආගමික සංස්කෘතිය හදුනාගත හැකිය. ආගමික සංස්කෘතිය යන මාතෘකාව සැලකිල්ලට ගැනීමේදී එයට ලෝකයේ පවතින බොහෝමයක් බෞද්ධ, හින්දු, ඉස්ලාම්, ක්‍රිස්තියානි ආදී විවිධ ආගම් ගණනාවක් පාදක වී තිබේ. ඒ අනුව ලෝකයේ දක්නට ලැබෙන ප්‍රධාන සංස්කෘතීන් බිහිවීමට ආගමික සංකල්ප බලපා ඇත. හින්දු ආගම මත පදනම් වූ උප සංස්කෘතිය තුළ බොහෝ දේවවාදී ආගමික ඉගැන්වීම් දක්නට පුළුවන. ඉස්ලාම් ආගම මෙන්ම ක්‍රිස්තියානි ආගමද ඒක දේව වාදීය. ඔවුන් අදහන්නේ සර්ව බලධාරී දෙවියන් වහන්සේය. තවද මල යකුන් ඇදහීම, පුදපූජා පැවැත්වීම ආදී ආගමික සම්ප්‍රදායන් ද තිබේ.

සෑම ආගමක් ම පොදු ලක්ෂණ 04ක් මත පදනම් ව ඇත.

- ආගමික චාරිත්‍ර විධි
- ආගමික විශ්වාස
- ආගමික සංවිධාන
- ආගමික හැගීම්

මෙම සෑම ලක්ෂණයක්ම රැදී පවතිනුයේ, විශ්වාස, අදහස්, පුද පූජා හා යුතුකම් මතය. ඒ අනුව මෙම විවිධ වූ ආගම්වල ආගමික සංස්කෘතීන් හේතුකොට ගෙන එම සංස්කෘතීන් වලට අනුකූල ව ජීවත් වීම තුළ පුද්ගලයින්ගෙන් සිදු වන විවිධාකාර වූ අපරාධ නිවාරණයට ආගමික සංස්කෘතිය ඍජුවම හෝ වක්‍රව බලපානු ලබයි. මිනිසුන්ගේ ආවේගශීලී හැගීම්, ප්‍රකෝපකාරී හා ප්‍රචණ්ඩකාරී අපරාධ ක්‍රියාවන් මැඩ පවත්වන්නේ රටේ පවතින නීතිය, ආගමික සංස්කෘතිය හා සදාචාරය හේතුවෙනි.

- **බෞද්ධ ආගමික උප සංස්කෘතිය**

බෞද්ධ ආගමික උප සංස්කෘතිය තුළින් විශේෂයෙන් ම බෞද්ධයින් ද ඇතැම් විට අන්‍යාගමිකයින් ද පොදුවේ ලෝකයේ මිනිසුන් බොහෝමයක් අපරාධ වලට පෙළඹීම අඩු වූයේ බෞද්ධ උප සංස්කෘතියට අනුව ජීවත් වීම නිසා ය. ඒ අනුව බෞද්ධ උප සංස්කෘතිය හේතුවෙන් අපරාධ නිවාරණය සිදු වන බව පැහැදිලි ය. බෞද්ධ ආගමික උප සංස්කෘතියේ දැක්වෙන බුදුරජාණන් වහන්සේගේ දේශනා කළ බුද්ධ ධර්මයට අනුව ජීවත් වීම හැකි වේ. බෞද්ධ දර්ශනයේ දැක්වෙන පන්සිල් පිළිපැදීම තුළ මිනිසුන් අපරාධ වලින් ඉවත් වේ.

- පාණාතිපාතා වේරමණී සික්ඛා පදං සමාදියාමී
- අදින්නාදානා වේරමණී සික්ඛා පදං සමාදියාමී
- කාමේසු මිච්චාචාරා වේරමණී සික්ඛා පදං සමාදියාමී
- මුසාවාදා වේරමණී සික්ඛා පදං සමාදියාමී
- සුරාමේරය මජ්ජපමා දට්ඨානා වේරමණී සික්ඛා පදං සමාදියාමී

ඉහත සදහන් ආකාරයට පන්සිල් පද හරහා මිනිසුන් පළමුවන ශික්ෂා පදයෙන් ප්‍රාණයක් ඇති සතුන් මැරීමෙන් වැළකී සිටීම නැමති හිංසාකාරී ක්‍රියාවට යොමුවීම වැළැක්වීමට කටයුතු කරයි. එමගින් මනුෂ්‍ය ඝාතන සිදුකිරිමට පුද්ගලයන් යොමු වීම පාලනය වේ. එමෙන්ම දෙවන ශික්ෂා පදයෙන් මිනිසුන් මංකොල්ල කෑම්, සොරකම් කිරීම වැනි අපරාධවලට යොමු වීම පාලනය කරයි. තුන්වන ශික්ෂා පදයෙන් ස්ත්‍රී දූෂණය, ළමා අපයොජනය වැනි අපරාධ වලට මිනිසුන් යෙද වීම පාලනය කරයි. හතරවන ශික්ෂා පදයෙන් පුද්ගලයින් කේලාම් කීම, බොරුකීම, රැවටීම වැනි අපරාධ සලකා බලන අතර මෙවැනි වාචික වැරදි වචන කතා කිරීම තුළ බරපතල ගණයේ අපරාධ සිදුවිය හැකිය. අවසාන වශයෙන් මිනිසුන් මත්පැන්, මත් ද්‍රව්‍ය වෙළදාමෙන් හා භාවිතා කිරීමෙන් වැළැක්වීමට කටයුතු කරන අතර එම මත්ද්‍රව්‍ය මත්පැන් ආදිය වර්තමානය වන විට විශාල අපරාධ වලට මූල බීජයක් ව ඇති අතර ඒවා නැවැත්වීමට බෞද්ධ උප සංස්කෘතිය හේතුවක් වී ඇත.

මේ අනුව මෙම අනෙකුත් විවිධ මිනිසුන් පන්සල් ආශ්‍රය කරගනිමින් බෞද්ධ උප සංස්කෘතියට අනුව ක්‍රියා කරමින් අපරාධ වලින් වැළකී සිටීමට ක්‍රියා කරයි. ඒ අනුව ආගමික සංස්කෘතිය අපරාධ නිවාරණයට හේතුවක් බව පසක් කරමින් බෞද්ධ උපසංස්කෘතිය නිසා අපරාධ නිවාරණය සිදුවන බව ඉහත පරිදි සඳහන් කල හැකිය.

- **හින්දු ආගමික උප සංස්කෘතිය**

චූලවංශයේ කතා වල සඳහන් වන ආකාරයට ලංකාවේ හින්දු ආගම ව්‍යාප්ත වූයේ චෝල පාණ්ඩ්‍ය කේරල දේශයන්ගෙන් පැමිණි අයගෙන් හා කාලිංග මාඝ වැනි ආක්‍රමණිකයන්ගෙන්ය. ඉන්දියාවෙන් ලැබුණු මෙම දායාදයට දේශීය හිමිකරුවන් වූයේ ද්‍රවිඩ ජනතාවයි. මෙම ආගමේ ග්‍රන්ථ අතර භගවත් ගීතාවට වැදගත් තැනක් හිමි වේ. ශිව ආගමික සම්ප්‍රධාය, විශ්ණු ආගමික සම්ප්‍රදාය මෙහි ප්‍රධාන වන අතර පුල්ලෙයි, පාර්වතී , මුරුගන්, වෛවර් යන දේවවාද පවතී. හින්දු ආගමික යාඥා කිරීම්, කන්නලව්

කිරීම්, පඩුරු බැඳීම, දේව දානය, පූජා කිරීම සිදු කරති. ඔවුන්ගේ විශ්වාසය ශිව දෙවියෝ විවිධ වේශයන්ගෙන් පැමිණ උදව් කරන බවයි. එමෙන්ම මෙම ආගමෙහිද බෞද්ධ පංචශීල ප්‍රතිපත්තියට සමාන ආගමික ඉගැන්වීම් දක්නට ලැබේ.

- ප්‍රාණඝාතය
- සොරකම් කිරීම
- පරදාර සේවනය
- මත්ද්‍රව්‍ය භාවිතය

ප්‍රතික්ෂේප කිරීමේ සමාජ පාලනයක් මෙම ආගමෙහිද අපේක්ෂා කරයි. ඒ අනුව හින්දු ආගමික උප සංස්කෘතිය තුළින්ද අපරාධ නිවාරණයට කටයුතු සිදුවේ. මෙම හින්දු ආගමික ඇදහීම් පිළිබඳව මහචාර්ය සෙනරත් පරණවිතාරණ මහතා සඳහන් කරන පරිදි ක්‍රි.පූ 03 වන සියවසට පමණ පෙර සිට හින්දු ආගමික ඇදහිලි ලංකාවේ පැවතුනි. ඒ අනුව සමාජ මානව විද්‍යාඥයින් සමාජ පාලන කාරකයක් වශයෙන් ආගමික ඉගැන්වීම් පිළිගනිති. හින්දු සංස්කෘතියට ආවේණික වූ ආගම දහම අනුව සෑම හිංදු භක්තිකයෙකුම වයස අවුරුදු 50ක් ගෙවී ගිය පසුව වඩාත් දෙවියන්ට සමීප විය යුතු බව දක්වයි.

ඒ අනුව හින්දු ආගමට අනුව මිනී මැරුම්, මංකොල්ල කෑම්, ස්ත්‍රී දූෂණය, ළමා හිංසනය ආදී විවිධ වූ අපරාධ හින්දු ආගම තුළ ප්‍රතික්ෂේප කරන අතර අපරාධ නිවාරණය සඳහා හින්දු ආගමික උප සංස්කෘතිය විශාල පිටුවහලක් වී ඇත.

කෙසේ නමුත් සමාජයේ බොහෝ පිරිසක් ආගමික සංස්කෘතිය තුළ ජීවත් වුව ද ආගමික ඉගැන්වීම් වලින් පරිභාහිරව විවිධ වූ අපරාධ සිදු කරන බව සමාජයේ දක්නට ලැබේ. ඒ සඳහා විවිධ වූ සමාජයීය පැතිකඩ රාශියක් බලපානු ලැබේ.

- **ක්‍රිස්තියානි ආගමික උප සංස්කෘතිය**

නිල වශයේ ශ්‍රී ලංකාවට කිතු දහම දායාද කෙරුණේ ක්‍රි.ව 1505 දී පෘතුගීසීන් ලංකාවට පැමිණීමත් සමගය. අහම්බෙන් ලංකාවට ගොඩවැදුණු පෘතුගීසීන් දේශය තුල තිබූ කුළුබඩු හා අනෙකුත් වටිනා කියන සම්පත් දැක එය තමන්ට ලැබුණු උපරිම වාසියක් ලෙස සළකා ශ්‍රී ලංකාව යටත් කරගන්නට පෙළඹුනහ. ඉන්පසු ඔවුන්ගේ කිතුණු උපසංස්කෘතිය අධ්‍යාපන ක්ෂේත්‍රයට මෙන්ම සෞඛ්‍ය ක්ෂේත්‍රයටද මුහුවිය. මෙහිදී කිතුණු ආගමික ඉගැන්වීම් හා පල්ලිය ආශ්‍රිතව සියලු කටයුතු සිදු වූ අතර අපරාධ නිවාරණයට ද එය පහසුවක් විය. ඒ අනුව කිතුණු උපසංස්කෘතික අංගයන් සිංහල, ද්‍රවිඩ සංස්කෘතියට එක් වූ බව පහතින් දැක්වෙන දෑ මගින් හදුනාගත හැකිය.

- කුලභේදයේ නුසුදුසු අංග ක්‍රමයෙන් ඉවත් වීම.
- විවාහය හා සම්බන්ධ කිතුණු සිරිත ගරු කරනු ලැබීම.
- ආගමික නාට්‍ය, ගීතිකා, කැරොල් සමාජයට හුරු පුරුදු වීම.
- ඉරිදා විවේක දවසක් ලෙස සලකනු ලැබීම හා ඉරිදා දහම් පාසල් ඇතිවීම.

- නත්තල උත්සවාකාරයෙන් පැවැත්වීම.

මේ අනුව කිතුණු උප සංස්කෘතියට අනුව කුල භේදය නොමැති වීම තුළ ඉහල කුලයේ අයගේ අපරාධ වලට පහල යයි සලකන කුලයෙ අය අපරාධ ගොදුරක් වීම අඩු විය. තවද, විවාහය සම්බන්ධ නීති පල්ලිය ආශ්‍රිත වීම මත ළමා අපචාර, ළමා ලිංගික හිංසනය අඩු වූ අතර ස්ත්‍රී දූෂණය ද අඩු විය. ආගමික නාට්‍ය, ගීතිකා ආදිය තුළ විශාල පණිවිඩයක් සමාජගත කෙරුණු අතර ඒ තුල මිනිසුන් අපරාධ වලට ගොදුරු වීම පාලනය වූ අතර එමගින් අපරාධ නිවාරණයක් ඇති විය. දහම් පාසල් ඇති කිරීම තුළ දහම් අධ්‍යාපනයට දරුවන් යොමු වීමෙන් ළමයින් තුළ හික්මීමක් ඇති වීම තුළ සමාජය පෙරට වඩා ධාර්මික හිංසනකාරී බවින් අඩු සමාජයක් විය. කිතුණු ආගමික සංස්කෘතියේ බලපෑම හේතුවෙන් අපරාධ පාලනය හා නිවාරණය සිදු වූ බව එහි උපසංස්කෘතිය අධ්‍යයනය කිරිම මගින් හඳුනාගත හැකිය.

- **ඉස්ලාම් ආගමේ උප සංස්කෘතිය**

සෞදි අරාබියේ මක්කම මෙම ආගමේ මූලස්ථානයයි. ලංකාවෙ ඉස්ලාම් ආගම අදහන අය මුස්ලිම් ජාතිය වන අතර මොවුන්ගේ නායකයා නබිනායකතුමාය. මහම්මද් නබිනායකතුමා අල්ලා දෙවියන්ගේ දේව දූතයාය. කුරාණය එකම ආගමික ග්‍රන්ථය වේ. ඉස්ලාම් ආගමේ අනිවාර්ය වගකීම් 05 කි.

- කලිමාව
- සලාතය
- සකාතය
- රමළාන්
- හජ්වන්දනාව(සෞදි අරාබි වන්දනාව)

ඉස්ලාම් ධර්මයට අනුව පන්තිභේදය වර්ණභේද නොසලකන අතර, යුක්තිගරුකව සාමකාමීව කටයුතු කල යුතු බවත් කුරාණයේ ඉගැන්වීමයි. පසිදුරන් වැරදි ලෙස පිනවීමෙන් අපාගත වන බවත් දක්වයි. ඉස්ලාමීය ආගමේ ඇඳුම් පැලඳුම් පවා ඉතා සංවරව ඇඳිය යුතු අතර අපරාධවලට පොළඹවන ඇඳුම් පැලඳුම් භාවිතා කිරීම නොකල යුතුය. ඒ අනුව ආගමික ඉගැන්වීම් අනුව අපරාධ වලට නතු වීම පෙළෙඹවීම මෙන්ම අපරාධ වලට ගොදුරුවීම වැළැක්වීමටද ඉස්ලාමීය ආගමික උප සංස්කෘතිය හේතු වී ඇත. සියලු ආගමික සංස්කෘතීන් අපරාධ පාලනයට හා නිවාරණයට හේතු වේ. බෞද්ධ ආගමික උප සංස්කෘතිය තුළිනුත්, හින්දු ආගමික උප සංස්කෘතිය තුළිනුත්, ක්‍රිස්තියානි ආගමික උප සංස්කෘතිය තුළිනුත් හා ඉස්ලාමීය ආගමික උප සංස්කෘතිය තුළිනුත් මිනිසුන් අපරාධ වලට යොමු වීම, අපරාධ වැළැද ගැනීම හා අපරාධ වලට ගොදුරු වීම වැළැක්වීම සඳහා භාවිත කරන ඉගැන්වීම් තුළින් ඉතාමත් සාර්ථකව අපරාධ සිදු කිරීමෙන් තමාටද, අනුන්ටද සිදුවන ඵල විපාක දක්වන අතර එය අවබෝධ කර ගැනීමෙන් මිනිසුන් අපරාධ වලට නතු වීම අවම වීම සිදුවේ. ඒ අනුව ආගමික සංස්කෘතිය මගින් අපරාධ නිවාරණයට බලපෑම් සිදුවන ආකාරය ඉහත පරිදි විග්‍රහ කළ හැක[115].

[115] Religion and Indian philosophy, Etnogeriatrics, Stanford School of Medicine. https://geriatrics.stanford.edu/ethnomed/asian_indian/introduction/religion.html

## 13. සංස්කෘතික අපරාධ විද්‍යාව ශ්‍රී ලංකාවේ ඓතිහාසික සංස්කෘතිය හා බැඳුන අපරාධ හා අපරාධ නිවාරණය

**එච්.පී. නිවන්ත**
**ජේ. ඒ. එරංග චානක**
**සී.එස්. ගුණරත්න**

ශ්‍රී ලංකාව ලොව අනෙකුත් රාජ්‍යයන් හා සළකා බැලීමේදී වසර 2500කට ආසන්න ලිඛිත ඉතිහාසයකට උරුමකම් කීම මත සංස්කෘතික අනන්‍යතාවක් එක හෙළා ඉදිරිපත් කිරීමට හැකියාව ඇත.ඉන්දියාවේ මහා සංස්කෘතික පාරාදීසකට ආසන්නයේ සිටිමින් ඉන් වෙන්ව වෙනම අනන්‍යතාවයක් ගොඩ නගා ගැනීමට හැකියාව ලැබීම මතම ලාංකීය සංස්කෘතිය ලොව සුවිශේෂී සංස්කෘතියක් ලෙස පෙන්වා දිය හැක.නිරන්තරයෙන් දකුණු ඉන්දියානු ආක්‍රමණවරයන්ට ලක් වූවද එම ආක්‍රමණවරයන්ගේ ශේෂයන් සහිතව වූවද දකුණු ඉන්දියාවට හාත්පස වෙනස් ආගමක් භාෂාවක් ජීවන පැවැත්මක් උරුම කර ගැනීම නිසාම ලාංකීය සංස්කෘතිය පිළිබඳ සිදු වූ අධ්‍යයනයන් ඉතාමත් බහුල විය. නමුත් මෙම අධ්‍යයනයන් අපරාධ යන විෂය කෙරෙහි සිදු වී නොමැති තරම්ය. මෙම අධ්‍යයනයේදී ශ්‍රී ලාංකීය ඓතිහාසික සමාජය තුළ සංස්කෘතිය හා බැදුනු අපරාධ හා අපරාධ නිවාරණ ක්‍රමවේදයන් පිළිබඳ අපරාධ විද්‍යාත්මක අධ්‍යයනයකට මුල පිරීමට බලාපොරොත්තු වේ.

යටත් විජිත යුගයට ප්‍රථම ශ්‍රී ලංකාවේ ඉතිහාසය හා සංස්කෘතිය පිළිබඳව අවධානය යොමු කිරීමේදී එහි ආරම්භය පිළිබඳ ගැටලු සහගත වේ. ශ්‍රී ලංකාවේ ජනාවසමය ඉතිහාසය ප්‍රාග් ඓතිහාසික යුගය දක්වා දිව යයි. බලංගොඩ මානවයාගෙන් ඇරඹි හෝමෝසේපියන් බලංගොඩනීස් මානව වර්ගයාගේ නිජබිම වූ ශ්‍රී ලංකාව තුල සාධනීය සංස්කෘතික ඉතිහාසයක් සනිටුහන් වීම පිළිබඳ ලිඛිත සාක්ෂි හමු වන්නේ ක්‍රිස්තු පූර්ව 6වන සියවසින් පසුවය. වංශකතා සාහිත්‍යයට අනුව ආර්යයන් මෙරටට සංක්‍රමණය වීමට ප්‍රථම ලංකාද්වීපය සංවෘත දිවයිනක්ව පැවතුනි. එවකට තිබූ සංස්කෘතිය එතරම් ආචාරශීලී නොවූ අතර එය ආගන්තුකයන් ප්‍රතික්ෂේප කරන හුදෙකලා සංස්කෘතියක් බව අපට මහාවංශයේ විජය කතා පුවත ඔස්සේ අවබෝධ කර ගත හැක. මහාවංශ කතුවරයා දක්වන පරිදි ස්වදේශික කුවේණිය තම්මැණ්ණාවට පැමිණෙන සියළුම නාවිකයන් මංකොල්ල කෑ අතර නෞකා වල සම්පත් භුක්ති විද ඇත. තරමක අපරාධකාරී ස්වභාවයක් ගත් මෙම සංස්කෘතිය ඉන්දීය ආර්යයන්ගේ සම්මිශ්‍රණයත් සමඟ ආචාරශීලී තත්වයකට පත් වූ බව පසු කාලීන විදේශ සබඳතා මත අනාවරණය කර ගත හැක. නමුත් පූර්ව ආර්යය සංස්කෘතිය හුදෙකලා සංස්කෘතියක්මයැයි නිගමනය කල නොහැක.මන්ද විජය පැමිණෙන විටත් කුවේණිය සිටියේ කපු කටිමිනි, වෘත්තීමය වශයෙන් කපු කර්මාන්තය යනු දියුණු සමාජ ක්‍රමයක ලක්ෂණයක් වේ. නමුදු මහාවංශ කතුවරයා පවසන පරිදි විජයාගමනය සිදු වන කාල පරිච්ඡේදයේදී තරමක ම්ලේච්ඡ යක්ෂ ගෝත්‍රිකයන්ගේ සංස්කෘතියක් මෙරට තිබී ඇත. සමූහයේම එකතුවෙන් පැවැත්වෙන විවාහ මංගල්‍ය උත්සව වැනි දෑ ඔවුන් අතර පැවති බවත් එවන් උත්සවයක් විජය පැමිණ ආසන්න දිනෙක "සිරීසවස්ථුපුර යක්ෂ නගරයෙ" පැවති බවත් මහාවංශ කතුවරයා සඳහන් කිරීමට අමතක නොකරයි. එහිදී තවත් වැදගත් කාරණාවක් නම් ප්‍රාග් ඓතිහාසික ලාංකීය සමාජයේ පාවා දීම බරපතල අපරාධයක් ලෙස සැලකූ අතර ඊට දඬුවම

වූයේ ගල්ගසා අතින් පයින් ගසා මරා දැමීමමයි.විජය කුමරුට රාජ්‍ය පාවා දී පසුව විජය රජුගෙන් ප්‍රතික්ෂේප වන කුවේණිය තම ඥාතී යක්ෂයන් හමුවට ගිය අවස්ථාවේ ඇයට එම දඬුවම හිමි විය . ඇය ගෝත්‍රිකයකුගේ අතුල් පහරින් මියගිය බව මහා වංශයේ දැක්වේ[116]. වර්තමානයේ සමහරක් අරාබි සංස්කෘතීන් තුළද ආගම විකෘති කිරීම ජාතිය හා ආගම පවා දීම අනාචාරය වැනි වරදවල් සඳහා ගල් ගසා මරා දැමීමේ දඬුවම් ක්‍රම ක්‍රියාත්මක වේ. ම්ලේච්ඡ යුගයේ සිට පරිණාමීය නොවූ දඬුවම් සංස්කෘතීන් ආර්යය ආභාෂයට පෙර මෙරටද පැවති බවට සාක්ෂි අපට කුවේණියගේ කතාවෙන් අනාවරණය වේ. සංස්කෘතියක් ලෙස සංවර්ධනය වීමේදී මෙම පරිණාමීය නොවූ ක්‍රම මෙරටින් තුරන් විය. පසුකාලීනව මෙරට අපරාධ වශයෙන් අපට හදුනාගැනීමට හැකි වන්නේ සොරකම, අනවසර මුතුපර කිමිදීම, රජුට එරෙහි කැරළි කෝලාහල හා සම්ප්‍රදාය හා බැඳුන විවිධ අපගාමී ක්‍රියාකාරම් වැනි අපරාධ වේ. ඒවායිනුත් සංස්කෘතික වශයෙන් සිදු වූ අපරාධ ලෙස අපට හඳුනාගත හැක්කේ රජුට එරෙහි කැරළි කෝලාහල වේ.එම කැරලි කෝලාහල වලට ප්‍රධානම හේතුව රජුගේ පරපුර හෝ වංශය තනතුරට නුසුදුසු වීමයි. කුලය සියල්ලටම ප්‍රබල ලෙස සැලකූ ඓතිහාසික ලාංකේය සමාජය රජකු වූවද ඊට කුලයෙන් නුසුදුසුස්සෙකු  නම් ඔහුට විරුද්ධ වීමට පසුබට නොවේ. ඊට හොදම උදාහරණයක් ලෙස, කෝට්ටේ යුගයේ සයවැනි පැරකුම් රජුගෙන් පසු රජ වූ "සපුමල් කුමාරයාට (හයවන බුවෙනකබාහු)" විරුද්ධව "පස්දුන් කෝරළයේ කැකුළන්දොළ සිරිවර්ධන ප්‍රතිරාජයන් හා කුරගම හිමියාන්" යන ජන ප්‍රධානීන් කැරළි ගැසීමය. සපුමල් කුමරු කෝට්ටේ ඒකාධිපත්‍ය වෙනුවෙන් යාපනය පවා අතික්‍රමණය කළ විශිෂ්ඨ රණවිරුවෙකු වූවද ඔහු රාජවංශිකයකු නොවීම මත ඔහුට පවා සංස්කෘතිකමය වශයෙන් බලපෑම් එල්ල වීමෙන් පැහැදිළිවන්නේ මෙරට සම්ප්‍රදාය කෙතරම් ප්‍රබලද යන්නයි[117]. ශ්‍රී ලංකාවේ පැවති සංස්කෘතික සම්ප්‍රදාය හා අපරාධ ලෙස හැඳින්වූ මානව ක්‍රියාකාරම් පිළිබඳ හොඳ උදාහරණයක් රොබට් නොක්ස් දක්වයි. වරක් බණ්ඩාර කොස්වත්ත ග්‍රාමයේ නිවසක් තනාගත් නොක්ස් එහි සුදු හුණු ගෑ අතර එහිදී ඔහුට දැනගන්නට ලැබුනේ සුදු හුණු ගෑම රජමාලිගා වලටත් විහාර දේවාල වලටත් පමනක් හිමි වූ වරප්‍රසාදයක් බවත් එය කඩ කිරීම හිස් ගසා දැමීම හෝ කිසිදු තැකීමක් නොකරන කාරනා කෙරෙහිද නෛතිකව දණ්ඩණයන් නියම කරවීමට පැවති අභෞතික සංස්කෘතිය කෙතරම් බලවත් වීද යත් අපට එයින් අනාවරණය කර ගත හැකි වේ.

ශ්‍රී ලාංකීය ඓතිහාසික නීති පද්ධතිය සෘජුවම සංස්කෘතිය හා බැදී පවතින්නක් විය .පෙර සිරිතට අනුව රාජ්‍ය විචාලීම යනු පෙර පැවති සංස්කෘතික සාරධර්ම කඩ නොකරමින් රාජ්‍ය පාලනය කිරීමක් වේ.පෙර සිරිත හෙවත් සංස්කෘතිය කඩ කිරීම වනාහී රජවරුන්ට වූවද දරුණු එල විපාක විඳීමට සිදු වූ කාරණාවක් විය .සරළව සංස්කෘතික අගනාකම් කඩ කිරීම වනාහී අතීත ශ්‍රී ලංකාවේ අපරාධයක්ම විය.වරෙක මහසෙන් රජු විසින් තම ගුරුවරයා වූ සංඝමිත්‍ර හිමිගේ ගුරුහරුකම් ඇතිව මහාවිහාරික ථේරවාදී බුදු දහමට පටහැනිව අභයගිරි හා ජේතවන ආදී විහාර සම්ප්‍රදායන්හි ඉගැන්වූ මාහායාන බෞද්ධ ආදර්ශයන් පිළිපදිමින් පෙර සිරිත කඩ කරමින් රාජ්‍ය පාලනය කළේය. එහි දී එයට විරුද්ධ

[116] Geiger, W. (1912). *The Mahavansha or The Grate Chronicle Of Ceylon.* (W. Geiger, Trans.) New Delhi: Asian educational Services.

[117] දසනායක, ස. (2005). කෝට්ටේ හා සීතාවක යුග. දංකොටුවඃ වාසනා ප්‍රකාශකයෝ.

වූ අමාත්‍යවරුන් හා ජනතාව රජුට විරුද්ධව කැරලි ගැසීම සංස්කෘතිය අවතක්සේරු කිරිමේ දරුණු ඵල විපාකයක ලබා දුන්බවට ඓතිහාසික වශයෙන් ඇති හොදම නිදසුනකි.

එලෙසම ඓතිහාසික නීතිය සම්බන්ධයෙන් වැඩි දුරටත් සොයා බැලීමේදී මහනුවර යුගයේ දෙවන රාජසිංහ රජුගේ සිරකරුවකුව සිටි "රොබට් නොක්ස්" නම් ඉංග්‍රීසී ජාතිකයා විසින් ප්‍රකාශ කල තම ලාංකීය ජීවන අත්දැකීම් අපට බෙහෙවින් ඉවහල් වේ.රොබට් නොක්ස් ප්‍රකාශ කරන පරිදි මහනුවර යුගය වන විට මෙරට ලිඛිත ව්‍යවස්ථාවක් පැවතී නැත. හුදෙක්ම නීතිය වී ඇත්තේ රජුගේ කැමැත්තයි. සමකාලීන යුරෝපීය නීතිය මත බලමින් අවධානය යොමු කරමින් බැලූ කල එය තරමක අත්තනෝමතික පාලනයක් ලෙස සැලකූ නමුදු සමකාලීන ලංකා ඉතිහාසය දෙස විමර්ශනාත්මකව අධ්‍යනය කල හොත් පැවති යුධමය වාතාවරණය තුල ගොඩ නැගුනු සංස්කෘතිය මත විධිමත් නීතියක සළකුණු බලාපොරොත්තු වීමට නොහැකි වීම සාධාරණය.නමුත් ඊට ප්‍රථම ඉතිහාසය දෙස අවධානය යොමු කිරීමේදී අපට විධිමත් නීති ක්‍රමයක සළකුණු වෙස්සගිරිය ශිලා ලේඛනය, මිහින්තලේ ශිලා ලේඛනය සහ වේවැල්කැටිය ශිලා ලේඛනය ආදී පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර ඔස්සේ හදුනාගත හැකි වේ.එම ශිලා ලේඛනමය නීතිය සංස්කෘතිකමය වශයෙන් වැදගත් වන්නේ එහි සඳහන් නීතිය ආගමික සංස්කෘතිය හා එකට බැදී පවතින නීතීන් වන නිසාවෙනි. එහිදී වේවැල්කැටිය වැනි සෙල් ලිපි වල අණාවරණය වන කරුනු මත පැවති අවිහිංසාවාදී සංස්කෘතික සංකල්ප මත අනුරපුර සිව් වන මිහිදු රජු විසින් මිනිසුන් මීමුවන් එළුවන් හා ගවයන් ඝාතනය මරණදඬුවම ලැබෙනා තරමට බරපතළ වරදක් ලෙස නිර්වචනය කර තිබීම මත නීතීය මත පාලනය උදෙසා සංස්කෘතිය කෙතරම් බලපෑවේද යන්න අණාවරනය වේ. එහිම යම් ආර්ථික වටිනාකමක් සහිත එම සතුන් සොරකමකට අත්පා කපා දැමීම, කිහිලි හණ ගැසීම, රත් කල යමර මත සිටුවීම වැනි දඬුවම් නියම කිරීම ඒ බැව් තවදුරටත් සනාථ කරවයි. වේවැල්කැටිය ශිලාලේඛනය පිළිබද වැඩිදුරටත් අවධානය යොමු කිරීමේදී අපරාධ යුක්තිය උදෙසා බලප්‍රදේශමය බෙදා වෙන් කිරීමක් අපට හඳුනාගත හැකි වේ.එහිදී ගම් දහයක ඒකකයක් දසගමක් ලෙස හැදින්වෙන අතර එහි නායක "දසගම් ඇත්තා නොහොත් මුලැදැනියා" එම ප්‍රදේශයේ අපරාධ යුක්තිය භාර නිළධාරියාව කටයුතු කර ඇත. එහිදී තම රාජකාරීමය අපරාධ යුක්ති ක්‍රියා පටිපාටිය නිසි ආකාරව කිරීමට නොහැකි වූ තැන ඒ වෙනුවට දඩ වශයෙන් රන් කලං 150ක් ගෙවීමට සිදු වන ආකාරයද එම ලිපියේ වැඩි දුරටත් සඳහන් වේ[118]. එම ක්‍රමය යම් තරමක සංස්කෘතිකමය පරිණාමයකට පත් වූ ආකාරය අපට මහනුවර යුගයේදී හදුනාගත හැක.දසගම් ඇත්තා මහනුවර යුගයට එන විට විදානේ රාල හා දිසාවේ යන තනතුරු වලට පරිවර්තනය වූ ආකාරය අපට හදුනාගත හැකි වේ[119]. එම තනතුරු වල බලතල වත්මන් ප්‍රාදේශීය ලේකම්වරුන් හා සහකාර පොලිස් අධිකාරීවරුන්ගේ බලතල හා සමාන වන ආකාරය අපට රොබට් නොක්ස් ආදීන්ගේ මූලාශ්‍ර අධ්‍යයනයේදී හදුනාගත හැක. මීට අමතරව සේනාපති, දණ්ඩනායක වැනි අපරාධ යුක්ති ක්‍රියාදාමයේ රජරට නිළධාරීහු මහනුවර යුගයට වන විට අධිකාරම්, කෝරාළ වැනි තනතුරු දක්වා පරිණාමය වීමක් අපට දැක ගත හැකි වේ.

---

[118] Ranawalle.S. (2004). *Inscriptions of Ceylone* (Vol.V Part II). Colombo: The Department Of Archaeology Sri Lanka.

[119] නොක්ස්, ර. (2013). එදා හෙළදිව. (v. කරුණාරත්න, Trans.) කොළඹ: සීමාසහිත ඇම්.ඩී.ගුණසේකර මුද්‍රණකරුවෝ සහ (පුද්ගලික) සමාගම.

අභිලේඛනමය මූලාශ්‍ර ඔස්සේ විධිමත් නඩු ඇසීමේ ක්‍රමවේද පිළිබඳ අපට හඳුනාගැනීමට හැකි වුවද රජරට ශිෂ්ඨාචාරය අභාවයට යාමත් දකුණු ඉන්දීය හින්දු ආභාෂය මත පැමිණි සංස්කෘතිකාංගත් මිශ්‍ර වීමත් සමඟ විවිධ අවිධිමත් යුක්ති ක්‍රමවේද කෙරෙහිද මෙරට වැසියන් යොමු වීම පිළිබඳ අපට තොරතුරු හඳුනාගත හැකිවේ.කන්ද උඩරට රාජධානි සමය වන විට මෙම තත්ත්වය වඩාත් තීව්‍ර වූ අතර ඊට ප්‍රධාන වශයෙන් රාජධානියක් වශයෙන් පැවති හුදෙකලාභාවය හේතු වන්නට ඇත .රොබට් නොක්ස් පවසන පරිදි මෙරට යුක්තිය උදෙසා දිවුරුම් දීමට උණුතෙලේ අත දමා දිවුරුම් දීම වැනි ප්‍රාථමික ක්‍රම උපයෝගීකරගෙන තිබේ. මෙම ක්‍රම සඳහා මූලික වී ඇත්තේ, එවකට මහනුවර පැවති සිව්මහා දේවාල වේ.එහි විශ්වාසී භාවය වැඩි කිරීමට දිවුරුම් බෝධියක් ඉදිරිපිට මෙම කාර්යය කරනු ලැබේ.රාමායණයේදී සීතාවෝ තම විශ්වාසය විශද කිරීමට ගින්නට පැණීමත් මහනුවර යුගයේ තම සත්‍යතාවය ඔප්පු කිරීමට උණු තෙලේ අත දමා දිවුරීමත් අපට එක හා සමාන සංකල්ප ලෙස සැලකිය හැකි වේ.සමකාලීන රාජකීයන්ගේ දකුණු ඉන්දීය විවාහ ඥාති සබදතා නිසා මෙවන් සම්ප්‍රදායන් ශ්‍රී ලාංකීය සංස්කෘතිය තුල මුල් බැස ගැනීමට හේතු වන්නට ඇත.මේ වර්තමාන කාලය තුළදී ද "මලයාලි වශී බන්ධන" වැනි අතීන්ද්‍රිය ක්‍රමවේදයන්ට සෘජුවම දකුණු ඉන්දීය සංස්කෘතික ආභාෂය බලපෑවේය.

ඓතිහාසික ශ්‍රී ලංකාවේ අපරාධ නිවාරණය හා පාලනය පිලිබඳව අවධානය යොමු කිරීමේදී දඬුවම් තුළින් ජනතාවට බලපෑම් කිරීමට අමතරව නිවාරණය උදෙසා සංස්කෘතිය තුළ ජනගතව ඇති සංකල්ප යොදා ගැනීමක් අත්තානි කණු පිළිබදව අවධානය යොමු කිරීමේදී හෙළි වේ. මෙම අත්තානි කණු යම් කිසි දීමනාවක් වෙනුවෙන් සාක්ෂි දරන අභිලේඛනමය මූලාශ්‍රයක් වේ. එහි අපරාධ නිවාරණමය වැදගත්කම නම් එහි යටින්ම බලු කපුටු රුවක් දැක්වීමයි. ඒ තුළින් අදහස් වන්නේ යමෙකු එම දීමනාව හෝ පවරා දීම උල්ලංඝණය කරමින් කටයුතු කලහොත් මතු ආත්මයේ බල්ලන් හා කපුටන් වී උපදින බවයි.බහුතර හින්දු බෞද්ධ ආත්ම සංකල්පය පිළිගත් සංස්කෘතියක් තුල මතු ආත්මය ගැන සඳහන් කරමින් කර ඇති සපථ කිරීම් සමකාලීන සංස්කෘතික ජීවීන්ගේ මනෝභාවයට සෘජුවම බලපෑම් එල්ලකරන්නක් වේ. මේ පිළිබද හොඳම උදාහරණයක් ලෙස අපට "මොරගොඩ ටැඹ" හැදින්විය හැක. එහි සඳහන් වන්නේ ''මේ අත්තානි කණු හින්ද්වන ලදී මේ ආන්නැ උලැඝන කළ කෙනෙක් ඇත්නම් කවුඩු බලු වෙත්වා'' ලෙසයි. එහි අර්ථය නම් මෙහු අත්තානි කණු පිහිටුවා ඇත.එම අණ උල්ලංඝණය කරන්නෙක් වෙත්නම් ඔහු මතු භවයේ බලු කවුඩන් වී උපදීත්වා.... යන්නයි". තරමක ශාපයක් ලෙස ගත හැකි මෙම ප්‍රකාශය එසමයේ ජනතාව නීතිය උල්ලංඝණය කිරීමෙන් වැලකීමට පනවා ඇති නීතියකට වඩා බලවත් වන්නට ඇතැයි විශ්වස කල හැක[120]. ජනගත වූ විශ්වාස, කුලය, සම්ප්‍රදායන්, සිරිත් විරිත් ,ද්වාර කර්ම වැනි විවිධ සංස්කෘතික කාරණා පදනම් කරගනිමින් ඓතිහාසික ශ්‍රී ලංකාවේ අපරාධ අපරාධ යුක්තිය හා අපරාධ නිවාරණය වැනි කාරණා ගොඩ නැගුන ආකාරය අපට එමගින් හඳුනාගත හැකි වේ.

[120] වීජේබණ්ඩාර, ච. (1979). බෞද්ධ ශිෂ්ටාචාරයෙහි ඉතිහාසය. කොළඹ: ඉන්දික ප්‍රකාශකයෝ.

**යටත් විජිත යුගයේ සංස්කෘතිය හා අපරාධ**

ක්‍රි.ව 1453 දි ඔටෝමන් තුර්කින් හා කතෝලික භක්තිකයන් අතර සිදුවූ කුරුස යුද්ධයේ ප්‍රතිඵලයක් ලෙස ඔටෝමන් තුර්කින් විසින් කොන්ස්තන්තිනෝපලය අල්ලා ගැනිම පදනම් කොටගෙන යුරෝපිය ජාතින්ගේ ප්‍රධාන වෙළද මාර්ග ලෙස පැවති කොන්තතිනෝපලය යුරෝපා ජාතින්ට අහිමි විම හේතුවෙන් පෘතුගාල හා ස්පාඤ දේශගවේශකයන් විසින් මුහුදු මාර්ගය ඔස්සේ පෙරදිග පැමිණ අතර පෙරදිගට පැමිණ අතර පෙරදිගට පැමිණි පළමු පෘතුගිසි දේශගවේශකයා වු වස්කෝද ගාමා 1498 දි කැලිකට් වරායට පැමිණි අතර එම අවස්ථාවේදි ඔහුගේ ප්‍රකාශය වන්නේ, අපි ක්‍රිස්තියානුන්, අපි කුළු බඩු සොයා පැමිණියා, මෙම ප්‍රකාශයෙන් අරමුණක් ලෙස ක්‍රිස්තියානි සංස්කෘතිය මෙරට පෙරදිග ස්ථාපිත කිරිමේ ප්‍රයත්නයක් පෘතුගිසින් අතර පැවතින. ඉන් අනතතුරුව 1505 දි ලොරෙන්සෝද අල්මේදා ශ්‍රී ලංකාවට පැමිණිමත් සමග ශ්‍රි ලංකාවේ සංස්කෘතිය සම්මිශ්‍රණ විම ආරම්භ වුහ[121].

ශ්‍රි ලංකාවේ පැවති දකුණු ආසියාතික සංස්කෘතියට යුරෝපානු සංස්කෘතියේ ආභාෂය ආදේශ විම මින් මතු සනිටුහන් විය .ශ්‍රි ලංකා සංස්කෘතියට යුරෝපියානු සංස්කෘතියේ සම්මිශ්‍රණයේ ප්‍රතිඵලය ලෙස සමාජය වෙනස් විම පදනම් කොටගෙන සමාජ ප්‍රපංචය වෙනස් වී සමාජ විරෝධි ක්‍රියා නිර්මාණය වු අතර එම අපරාධ පාලනය හා නිවාරණය සඳහා ශ්‍රි ලංකාවේ පැවති අපරාධ යුක්ති ක්‍රමය යම් යම් වෙනස් විම් සිදු කරමින් ක්‍රියාත්මක කරන ලදි.

පෘතුගිසින් ලංකාවට පැමිණියේ 1505 දි ය. 1597 දි කෝට්ටේ රාජධානිය පෘතුගිසින් යටතට පත්විමත් සමඟ ඔවුන් මෙරට පාලනය වෙත පෙළඹුණි. පරංගින්ගේ පරමාර්ථය වූයේ යටත්විජිතකරණය හා වෙළෙදාම බැවින් ඔවුන් රටේ පාලනය ගැන වැඩි උනන්දුවක් නොදැක්විය තවද ඔවුන්ගේ කාලපරිඡේදය යුද්ධ කටයුතු වලින් ග්‍රහණ වූ බැවින් නව පරිපාලන ක්‍රමයක් ඇති කිරිමට ඉඩක් නොවිය එබැවින් එවකට තිබුණු සිංහල පාලන ක්‍රමය ඒ අයුරින්ම පවත්වාගෙන යන ලදි. යුරෝපානු සංස්කෘතියේ ආභාසය තුලින් පෝෂණය වු සිංහල සංස්කෘතිය පෙර පැවති සාරධර්ම ධර්මතා හා සිරිත් විරිත් හායනය විමේ ගැටලුවක් සමාජය තුල හටගැනිම සිදු විය. එනම් මත්පැන් භාවිතය ,ගව සොරකම , ගිනි අවි භාවිතය වැනි ක්‍රියාවන් පදනම් කොටගෙන සමාජය තුල ධර්මතා විරහිත භාවයක් හටගත් අතර එම අපරාධ හා සමාජ විරෝධි ක්‍රියා පාලනය හා නිවාරණය සඳහා රාජාණ්ඩු සමයේ පත් කොට ලැබු නිලධාරින් යොදා ගැනිමක් පෘතුගිසි සමයේදි දැකගත හැක. එසමයේ සිවිල් පාලනය සහ යුද්ධ කටයුතු සම්බන්ධ ප්‍රධාන නිලධාරියා දිසාපති වේ. මේ සමයේ අද පොලිස් නිලධාරින් විසින් ඉටුකරන රාජකාරි බොහෝමයක් සුළු මුලාදැනින් විසින් සිදු කොට ඇත. මේ යුගය තුළ දිසාවේට තම බල ප්‍රදේශය තුළ අපරාධකරුවන්ට මරණිය දණ්ඩනය නියම කිරිමට පවා බලය තිබු අතර කිසිදු නඩු විභාගයකින් විමර්ශනයකින් තොරව මිනිසුන් මරණයට පත් කිරිමට දිසාපතිට බලය තිබුණු බවට ‘‘රුබේරු’’ නම් පෘතුගිසි ජාතිකයා ද සඳහන් කර ඇත.. පෘතුගිසි යුගය අවසාන භාගයේ දි " අවුවිදෝර්” නමින් හැදින්වුණ විනිශ්චකාරවරයෙකු අධිකරණ කටයුතු සඳහා පෘතුගිසින් විසින් පත්කර ඇත. උසාවිය හමුවට ගෙන එන නඩුවල ප්‍රාථමික විමර්ශනයන් කිරිම ඔහුගේ වගකිම වූ අතර වඩා බරපතල චෝදනා, ඔහු හා පරිපාලනය භාරව සිටි කැප්ටන් ජනරාල් විසින් විමර්ශනය කර ඇත. පසු

[121] දෙපාර්තමේන්තුව, අ. ප. (1997). ශ්‍රී ලංකාවේ ඉතිහාසය - තෙවන කොටස (තුන් වන ed'). අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

කාලෙක කෝට්ටේ සහ මන්නාරම ද අවුවිදෝර්වරුන් රාජකාරි කර ඇති අතර 1638දි පෘතුගිසින් විසින් ගාලූ නගරයේ මහේස්ත්‍රාත් උසාවියක් පිහිටුවා ඇත. පෘතුගිසින් විසින් මුහුදුබඩ ප්‍රදේශ ඔවුන්ගේ අනසකට නතු විමෙන් අනතුරුව පෙර ක්‍රියාත්මක වු උසාවි ක්‍රමය බොහෝ දුරට පවත්වාගෙන ගිය අතර මිට අමතරව අධිකරණ කටයුතුවල ප්‍රධාන වෙනස්කම් දෙකක් සිදු කලහ. එනම්, මල්වානේ අධිකරණයක් හා ජනරාල්වරයකුගේ අධිකරණයක් හෙවත් සේනාධිපති අධිකරණයක් පිහිටුවනු ලැබීය. එහිදි,පෘතුගිසින් විසින් සමාජයේ ඇතිවන්නා වු සමාජ ගැටලු සඳහා අපරාධ යුක්ති ක්‍රමයේ සුලු වෙනස්කම් සිදු කරමින් පාලනය ගෙන ගියහ[122]. පෘතුග්‍රීසීන් විසින් තමන් විසින්ම වෙනස් කර සංස්කෘතික පරිසරය පාලනය උදෙසා තමන්ටම සුදුසු අධිකරණ සංස්කෘතියක් හඳුන්වා දීම අපට මෙම කාලයේදී හඳුනාගැනීමට හැකිය.

ලන්දේසින් 1602 ලංකාවට පැමිණීම සනිටුහන් වු අතර 1958 දි ලක්දිව බටහිර මුහුදු බඩ ප්‍රදේශ වන යාපනය අර්ධද්වීපය ද ලන්දේසින් අනසකට පත් කර ගන්නා ලදි. ලාංකේය මුහුදුබඩ ප්‍රදේශයන්වල දකුණු ආසියාතික සංස්කෘතියේ බලපෑම මත අපරාධ හා සමාජවිරෝධි ක්‍රියාවන් සිදු විය. එවැනි අපරාධ පාලනය හා නිවාරණය සඳහා යුරෝපියානු අපරාධ යුක්ති ක්‍රියාපටිපාටිය ලන්දේසින් විසින් මෙරටට හඳුන්වා දෙන ලදි. මෙහිදි ලන්දේසින් විසින් හඳුන්වා දුන් අපරාධ යුක්ති ක්‍රම ක්‍රියාවලිය සඳහා නිලධාරින් පිරිසක් යොදා ගනු ලැබුහ. එනම් දිසාවේ විසින් සිවිල් හා යුධ අධිකරණ බලතල ක්‍රියාත්මක කළ අතර විධානංශවල සාමය හා නිතිය රැකීම දිසාවේවරුන්ගේ වගකිමක් වුහ . තවද දිසාවේවරුන්, සොරුන් හා අපරාධකරුවන් සිරභාරයට ගෙන පිස්කල් නිලධාරින්ට භාරදිම සිදු කරන ලදි. පිස්කල් නිලධාරීයාගේ වගකීම වුයේ කොළඹ නගරය අධීක්ෂණය කිරිමය. තවද, ලන්දේසින් විසින් මෙරට සංස්කෘතික විසරණ පාදක කොට ගෙන ඇති අපරාධ හා සිවිල් නඩු විභාග කිරිමට හා විසඳිමට උසාවි ක්‍රමයක්ද හඳුන්වා දිම සිදු කරනු ලැබිය. තවද මෙරට අපරාධ යුක්ති පටිපාටිය සඳහා රෝම ලන්දේසි නිතිය හඳුන්වා දිම තුළින් මෙරට යුරෝපියානු සංස්කෘතික ආභාසය පදනම් කොට ගෙන සිදුවූ අපරාධ හා සමාජ විරෝධි ක්‍රියා පාලනයට එය මහත් රුකුලක් වන ලදි. වර්තමානය දක්වා ශ්‍රී ලංකාවේ නීතිය සංවර්ධනය වීමට බලපෑවේ ලන්දේසීන් මෙරටට හඳුන්වා දුන් මෙම රෝම ලන්දේසි නීති සම්ප්‍රදාය වේ.

බ්‍රිතාන්‍යයන් ක්‍රි.ව 1796 සිට ක්‍රි.ව 1815 තෙක් ලංකාවේ මුහුදුබඩ පළාත් පාලනය කළ අතර ක්‍රි.ව 1815 සිට මුළු ලංකාවම තම පාලනයේ අණසකට නතු කර ගත්හ. එතැන් පටන් බ්‍රිතාන්‍යය නමැති යටත්විජිතකාරකයන් විසින් හඳුන්වා දෙන ලද ප්‍රතිපත්ති ලංකාව නමැති යටත්විජිතකරණය ලක් වූ සමාජය කෙරෙහි දීර්ඝ කාලීන බලපෑමක් ඇතිකර තිබේ. ශ්‍රි ලංකාවේ බටහිර සංස්කෘතියක් හා සමාජයක් ප්‍රතිනිර්මාණය විමක්ද මෙහිදි සිදු විය. වසර දෙසීයකට අධික කාලයක් යුරෝපීය ජාතීන් දෙකක පාලනයකට යටත්ව සිටි ජනතාවක් වූ ශ්‍රී ලාංකික මුහුදුබඩ ප්‍රදේශය තරමක සංකර සංස්කෘතික සමාජයක් විය.සංස්කෘතික විසරණය හේතුවෙන් යුරෝපීය ආභාෂයට හැඩ ගැසුණ මෙම සමාජය පාලනයට දේශීය ක්‍රම තව දුරටත් වලංගු නොවන බව ඉංග්‍රීසීන් අවබෝධකර ගත් හ. එම නිසාවෙන්ම සමාජ පාලනය උදෙසා යුරෝපය තුළ භාවිතා කරන ලද පොලිස් සේවය, ශ්‍රේෂ්ඨාධිකරණ ක්‍රමය, ජූරි

[122] දසනායක, ඩ. බ. (2012). සියනෑ කෝරළේ පුරාණ ජනවිත්ති-නිදහසට පෙර ගඟබඩපත්තුව ආශ්‍රිත සමාජ විවරණය (ප්‍රථම ed').

සභා ක්‍රමය, බන්ධනාගාර ක්‍රමය වැනි අපරාධ යුක්ති ක්‍රියාපටිපාටියේ උපක්‍රම මෙරටට හඳුන්වා දුන්හ[123]. ඉංග්‍රීසීන් මෙම ආයතන තනතුරු පිහිටුවීමේදී මෙරට පැවති සාම්ප්‍රදායික සංස්කෘතික සංකල්ප කෙරෙහිද අවධානයක් යොමු කර තිබේ. එහිදී 1806 ආරම්භ කළ පොලිස් විදානේ තනතුර නම් පෙර මෙරට පැවති කෝරාළ විදානේ, වෙල් විදානේ වැනි ග්‍රාමීය ප්‍රාථමික නිලතල වල පරිණාමයක් ලෙස සංවර්ධනය වූවකි. 1866 සැප්තැම්බර් 03 වන දිනය නූතන ශ්‍රී ලාංකීය පොලිස් සේවයේ ආරම්භක දිනය ලෙස නිල වශයෙන් සනිටුහන් විය .නමුත් බ්‍රිතාන්‍යයන් විසින් ගෙන යනු ලැබූ බෙදාවෙන්කොට පාලනය කිරීමේ ප්‍රතිපත්තිය හා මානව කේන්ද්‍රතාවාදී අදහස් නිසා ශ්‍රී ලංකාව තුල 1818 දී හා 1848 දී දරුණු කැරළි ඇති වීමට හේතු වූ නමුදු බ්‍රිතාන්‍ය සමයේ ප්‍රබල සංස්කෘතික ඝට්ටනයකට මග පෑදුනේවන සියවස මුල්භාගයේය[124]. 1915දී ශ්‍රී ලංකාවේ ප්‍රබල සිංහල මුස්ලිම් අන්තර් සංස්කෘතික ගැටුමක් ඇති වීම කෙරෙහිද මෙම බ්‍රිතාන්‍යයන්ගේ බෙදාවෙන්කොට පාලනය කිරීමේ ක්‍රමවේදය ඉවහල් විය.ශ්‍රී ලංකාවේ බහුතර සිංහල බෞද්ධ ජනතාවගේ ආගමික අයිතිවාසිකම් නොතකා තම පාලනයට හිතවත් මුස්ලිම්වරුන්ට වැඩි වරප්‍රසාද දීම මත මෙම 1915 සිංහල මුස්ලිම් ඝට්ටනය ඇති විය[125]. බ්‍රිතාන්‍යයන්ගේ අදූරදර්ශී පාලනය නිසා හට ගත් මෙම ගැටුම වර්තමානය තෙක්ම අළු යට ගිනි පුපුරු සේ වරින් වර දේශපාලනික හා සමාජීය හේතූන් මත පැන නගී.

බටහිර සමාජයේ බලපෑම හේතු කොටගෙන ශ්‍රී ලංකා සංස්කෘතියේ නිර්මාණය වු අපරාධ හා සිවිල් ගැටලූ විසඳිම සඳහා පෙර පැවති බටහිර අධිකරණය ක්‍රමය ගුණාත්මක ලෙස හා විනිවිද භාවයකින් යුක්ත කිරිමට නව අධිකරණ ක්‍රියාවලියක් හඳුන්වා දිම සිදු විය . තවද බටහිර සමාජයේ බලපෑම පදනම් කොට ශ්‍රී ලංකාවේ නිර්මාණ වු අපරාධ නිර්වචනය කිරිමක් බ්‍රිතාන්‍යයන් විසින් සිදු කරනු ලැබිය . 1883 දී ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය හඳුන්වා දීමත් සමඟ නෛතික සංස්කෘතික පෙරළියක් ඇති වූ අතර නව්‍ය අපරාධ විග්‍රහයක්ද ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් හ. 1844 වැලිකඩ බන්ධනාගාරය පිහිටු වීමත් සමඟම ශ්‍රී ලංකාව තුළ නව බන්ධනාගාර උප සංස්කෘතියක් බිහිවීමද බ්‍රිතාන්‍යය සමයේ සිදු විය. එලෙසම තේ අපනයනය නිසා කොළඹ වරාය සංවර්ධනය විය. ඒ ආශ්‍රිත කර්මාන්ත නගරයක් බිහි වූ අතර එහි සේවයට ඉන්දියාවෙන්ද ශ්‍රී ලංකාවේ විවිධ පළාත් වලින්ද පිරිස කොළඹ නගරයට සංක්‍රමණය වූ අතර ඔවුන් නිසාවෙන් කොළඹ නගරය ආශ්‍රිත නාගරික පැල්පත් නිවාස සංස්කෘතියක් (මුඩුක්කු උප සංස්කෘතිය) බිහි විය. මේ උප සංස්කෘතිය තුළ සොරකම්, නීතිවිරෝධී මත්ද්‍රව්‍ය,ගණිකා වෘත්තිය වැනි අපරාධ මෙරට සංවර්ධනය විය. මේ සමගාමීව බ්‍රිතාන්‍ය තේ වතු ආශ්‍රිත ඉන්දීය දමිළ ජනතාවක් මෙරට ජනාවාස වූ අතර ඔවුන්ගේ සංස්කෘතික උරුමයන්ද මෙරටට ආසක්ත වීම මෙම යුගයේදී සනිටුවහන් විය[126]. ඒ අශ්‍රිතව ශ්‍රමය සූරාකෑම, ළමා ශ්‍රමිකත්වය වැනි අපරාධ මෙරට ආරම්භ වී වර්තමානය දක්වා පරිණාමය වෙමින් පවතී. බ්‍රිතාන්‍ය පාලනයට ලැදි ස්වදේශිකයන් නිසාවෙන් කළු සුද්දන්ගේ සංස්කෘතියක් මෙරට සංවර්ධනය වූ අතර එම සංස්කෘතික කණ්ඩායම මෙරට සුදු කරපටි අපරාධ ආරම්භ වීම සඳහා යම් ප්‍රාමාණික දායකත්වයක් දැක් වීය. බ්‍රිතාන්‍ය සංස්කෘතික විසරණයට එරෙහිව ශ්‍රී ලංකාව තුළ ජාතිකවාදී ව්‍යාපාර නන් දෙසින් ආරම්භ වූ අතර ඒ තුළින් මෙරට යම් අවිධිමත් අපරාධ

123 පෙරේරා, ච. (2016). පොලිස් ඉතිහාසය හා ප්‍රජා පොලිස් සේවය. සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.
124 හේවාවසම්, අ. (2002). බ්‍රෝහියර් හඳුනාගත් ලංකාව (පළමු ed). කොළඹ: සූරිය ප්‍රකාශකයෝ.
125 සූසා, ආ. ද. (n'd'). 1915 යුද්ධ නීතිය යටතේ ලංකාවේ දවස් සියයක්. (ජ. එ. සේනානායක, Trans.) කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
126 දෙපාර්තමේන්තුව, අ. ප. (2007). ශ්‍රී ලංකාවේ ඉතිහාසය-සිව්වන කොටස (දෙවන ed.). අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

පාලනයකට මං පෙත් විවර විය. දකුණින් අනගාරික ධර්මපාලතුමා ද උතුරින් ආරුමුගම් නාවලර්තුමාද ගෙන ගිය ස්වදේශීය සංස්කෘතික ප්‍රවර්ධන වැඩ පිළිවෙල මත්පැන් භාවිතය සූදුව වැනි අපගාමී ක්‍රියාකාරකම් වලින් ජනතාව මුදවා ගැනීමට ඉවහල් විය.ඒ සමගාමීව ඇති වූ පංචමහාවාද නිසා ආරම්භ වූ බෞද්ධ ප්‍රබෝධය අද දක්වා බුදු දහම ශ්‍රී ලංකාවේ මූලික නීතියට පදනමක් වීමට ඉවහල් විය.

දකුණු ආසියාතික සමාජ සංස්කෘතියකින් යුක්ත වු ශ්‍රී ලංකාව 1505 සිට 1948 දක්වා වු කාලයක් බටහිර ජාතින්ගේ යටත් විජිතයක් ලෙස පැවතියේය. එම කාලසීමාව තුළදී සමාජ රටාව හා සංස්කෘතිය බටහිර සංස්කෘයෙන් පෝෂණය විය. එමගින් ලාංකේය සංස්කෘතියේ ඇති වු සමාජ හා සංස්කෘතික විපර්යාසයන් ජය ගැනිම සඳහා යුරෝපියානු ජාතිකයන් විසින් අපරාධ පාලනය හා නිවාරණය උදෙසා මෙරට පැවති අපරාධ යුක්ති ක්‍රමයෙහි යම් යම් වෙනස්කම් සිදු කරමින් අපරාධ බන්ධනය කිරිමට යොමු විය. එහිදි යුරෝපිය අපරාධ යුක්ති ක්‍රමයන් මෙරට හදුන්වා දිමක් දැක ගත හැක.

**යටත් විජිත යුගයෙන් පසුව වර්ෂ 1977 දක්වා සංස්කෘතිය හා අපරාධ**

1948 වර්ෂයේ දී ශ්‍රී ලංකාවට නිදහස ලැබීම මෙරට ඉතිහාසයේ වැදගත් සංධිස්ථානයකි .මෙරටට නිදහස ලබා දීම පිළිබඳ කරුණු ඇතුළත් ලංකා ස්වාධීනතා පනත බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදි. එම පනත ක්‍රියාත්මක කිරීම පිළිබඳ විධිවිධාන ඇතුළත් ලංකා ස්වාධීනතා රාජාඥාව 1947 දෙසැම්බර් 19 දින නිකුත් කෙරුණි. 1948 වර්ෂයේ පෙබරවාරි 04 දින සිට එකී විධි විධාන ක්‍රියාත්මක වීමත් සමග ශ්‍රී ලංකාවට නැවත වරක් නිදහස ලැබුණි. ඒ අනුව ශ්‍රී ලංකාව වෙනුවෙන් නීති පැනවීමට හා මෙරට පාලන කටයුතු ගෙන යාමට බ්‍රිතාන්‍ය ආණ්ඩුවට තිබූ බලය අවසන් වී එම බලතල ලංකා ආණ්ඩුවට ලැබුණි. 1948 වර්ෂයේ පෙබරවාරි 10 දින නව පාර්ලිමේන්තුව උත්සවාකාරයෙන් විවෘතකෙරුණු අතර අගමැති ඩී. එස්. සේනානායක මහතා විසින් ඉංග්‍රීසි ධජය පහත හෙළා යළි සිංහ ධජය ඔසවන ලදි[127]. මේ අනුව පෙබරවාරි 04 දින ශ්‍රී ලංකාවේ නිදහස් දිනය බවට පත් විය . එතැන් පටන් ශ්‍රී ලංකාව නිදහස් නිවහල් රාජ්‍යයක් බවට පත්විය. එතැන් පටන් ආණ්ඩුක්‍රමයේ සිට ඩොමීනියම් ආණ්ඩුක්‍රමයක් දක්වා ශ්‍රී ලංකාවේ පාලන ක්‍රමය වෙනස් විය[128]. ඩොමීනියම් පාලනය යටතේ ශ්‍රී ලංකාව තුළ මෙතෙක් පැවති පාලනය, සංස්කෘතිය, අපරාධ හා තවත් කාරණා රාශියක් වෙනස්වීමට ලක්විය. මෙහිදී ප්‍රධාන වශයෙන් වෙනස් වීමට භාජනය වී ඇත්තේ දේශපාලනික වශයෙනි. මේ සමඟ ම ශ්‍රී ලංකාවට ස්වාධීනතා පනත් ඉදිරිපත් කිරීමේ හැකියාව ලැබිණි. ඒ අනුව සම්මත වූ ප්‍රධාන කරුණු 3 කි. පළමු වැන්න වූයේ, ලංකා පාර්ලිමේන්තුවට මෙරට අභ්‍යන්තර කටයුතු, විදේශීය ආරක්ෂක කටයුතු පිළිබඳ නීති පැනවීමේ පූර්ණ අයිතිය ලබාදීමයි. මෙහි දෙවැන්න වූයේ, බ්‍රිතාන්‍ය මහා රජුට හෝ එරට පාර්ලිමේන්තුවට ලංකාව පිලිබඳ නීති පැනවීමේ බලය අහෝසි වීමයි. මෙහි තෙවැන්න වූයේ, බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව පනවන කිසිම නීතියක් ලංකා ආණ්ඩුවේ ඉල්ලීමක් නැති නම් වලංගු නොවීම යන කාරණාය[129] . මෙම කාලවකවානුව අපට සැම අතින්ම සංක්‍රාන්තික සමයක් ලෙස හඳුනාගත හැකි වේ.

[127] *Independent Ceylon*. (N.D.). Retrieved From Britannica: Https://Www.Britannica.Com/Place/Sri-Lanka/Independent-Ceylon-1948-71

[128] *Journey Since Independence 1948 - 1955*. (N.D.). Retrieved From Ministry Of Finance : Http://Oldportal.Treasury.Gov.Lk/Journey-Since-Independence-1948-1955

[129] De Silva, K. M. (1981). *A History of Sri Lanka.* Delhi: Oxford University Press.

කෙසේ වෙතත් මෙම වකවානුව තුළ දේශපාලන ව්‍යුහයේ මූලික දුර්වලතා කිහිපයක් පැවිතිණි. රජය නියෝජනය කරන සම්මුතිය වැලඳ ගනු ලබන්නේ ශ්‍රී ලංකාවේ ජීවත් වූ ජනගහනයෙන් සුළු කොටසක් පමණි. එනම් ශ්‍රී ලංකාව තුළ ජීවත් වූ ඉංග්‍රීසි අධ්‍යාපනය ලැබූ බටහිරකරණයට ලක් වූ ප්‍රභූ කණ්ඩායම්ය . සිංහල හා දෙමළ අධ්‍යාපනය ලැබූ බහුතරයක් වූ පදිංචිකරුවන්ට සහ පාසැල් නොගිය පුරවැසියන්ට මෙම සාරධර්ම අදාළ නොවන සහ තේරුම් ගත නොහැකි ලෙස පෙනුණි . ආගම , භාෂාව සහ කලාව තුළ මූර්තිමත් වූ දේශීය සංස්කෘතිය දිගින් දිගටම නොසළකා හැරීම පාලක ප්‍රභූ පැළැන්තිය හා පාලකයින් අතර බෙදීම් ඇති කරන්නක් බවට පත්විය . මෙම කාරණය මත ශ්‍රී ලංකාව තුළ යම් යම් ගැටලුකාරී තත්ත්වයක් ගොඩනැගීමක් සිදුවිය. එයට හේතුව වූයේ, බටහිරකරණයට ලක්වූ ප්‍රභූ පිරිසකට සියලුම ශ්‍රී ලංකාවේ පාලන බලතල හිමිවීමයි. මෙම වකවානුව තුළ ශ්‍රී ලංකාවේ සමාජය බ්‍රිතාන්‍යන්ගෙන් නිදහස් වූ අවධිය හේතුවෙන් එතෙක් පැවතගෙන එන ලද බටහිර සංස්කෘතිකාංග එළෙසම පැවතගෙන යන ලදී. එමෙන්ම අපරාධවල ද නව ප්‍රවණතාවයක් හෝ අපරාධ යුක්ති ක්‍රමයේ වෙනස්කම් දක්නට නොලැබිණි. එක්සත් ජාතික පක්ෂ රජය විසින් ඉන්දියන් වතු කම්කරුවන්ගේ ඡන්ද අයිතිය අහිමි කළේය. එයට හේතුව වූයේ උඩරට සිංහලයින් තේ වතුවල ජනගහනය තමන්ට තර්ජනයක් වෙතැයි බිය වූ නිසාය. ඉන්දියානු දෙමළ ජනතාව ඊට ඇතුළත් වීමෙන් උඩරට නායකයන් ඡන්දයෙන් පරාජය වෙතැයි උඩරට ජනතාව සිතුහ. මෙම තත්ත්වය පසුකාලිනව ද ජාතිවාදී සංහාර දක්වා වර්ධනය වූ අපරාධ රැල්ලකට මූලාරම්භයක් සැපයීය.

1950 දශකයේ ලංකාවේ ආර්ථිකය රඳා පැවැතුණේ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලකයන් විසින් හුරු කළ වැවිලි භෝග වගාව මතය. ශ්‍රී ලංකාවට විදේශ විනිමය ලැබුණේ ද මේ ආකාරයෙන් සිදුකරන ලද වැවිලි භෝග වගාව තුලින්ය[130]. නමුත් ලෝකය තුළ පැවති තත්වය හා රටේ පැවතියා වූ තත්වය මත රට තුළ හාල් හිගය, සීනි මිළ ඉහළ දැමීම හා රජයෙන් ලබාදුන් වරප්‍රසාද ඉවත් කිරීම යන කාරණා ඇති විය. එහිදී මුල්ම වරට වරායේ සේවකයන් සංකේතාත්මකව වැඩවර්ජනයක් රටේ පවතින තත්ත්වයට විරුද්ධව ගෙන ගිය අතර මහජනතාවද පාරට බසින ලදි.. මෙම අවස්ථාව තුළ රජය බෙහෝ සෙයින් අපහසුතාවයට පත්වූ අතර එය සංස්කෘතියටද බලපෑමක් ඇති කරන ලදී . එහිදී මෙතෙක් පැවති සාමකාමී සමාජය හා සංස්කෘතිය වෙනුවට යම් විප්ලවකාරී ස්වභාවයක් එකල ඇති විය .මෙම පාලනය තුළ පැවති අර්බුදකාරී තත්ත්වය යටතේ මිනිසුන් තුළ රාජ්‍ය විරෝධී මානසිකත්වයක් ඇතිවී තිබිණි. ඒ අනුව මෙහි දිගුවක් ලෙස මෙරට තුළ හර්තාලයක් රජයට විරුද්ධව සිදුකරන ලදී. මෙය ශ්‍රී ලංකා ඉතිහාසයේ කොමියුනිස්ට් දේශපාලනයේ නොමැකෙන මතකයකි. එහිදී අගෝස්තු 11 වනදා හර්තාලය ආරම්භකරන ලදී. කෙසේ වෙතත් මෙහිදී ඩඩ්ලි සේනානායක මහතාට ඉල්ලා අස්වීමට සිදුවිය. මෙම හර්තාලය පසුකාලින මහා වැඩවර්ජන හා විප්ලව සඳහාද පූර්වාදර්ශී ප්‍රවේශයක් ලබා දුන්නේය. ඔහුගෙන් පසු ප්‍රවීන දේශපාලනඥයෙකුවූ ජෝන් කොතලාවල මහතා අගමැති ලෙස පත් විය. එතැන් පටන් ශ්‍රී ලංකාව නැවත සාමාන්‍ය කරනයට ලක් වූවේය. ඔහු ඩී. ඇස් සේනානායක විසින් විචක්ෂණශීලීව පසෙක තැබුණු ජාතික භාෂා ප්‍රතිපත්තිය ඉදිරියට ගෙනාවේය. සිංහල හා දෙමළ භාෂා රාජ්‍ය භාෂා තත්ත්වයට පත්කිරීම සම්බන්ධයෙන් විරුද්ධ වීම නිසා ඔහු දෙමළ සහ සිංහල ජනතාවගේ අවමානයට බඳුන් විය. බණ්ඩාරනායකගේ උදව්කරුවන් වූ ක්‍රියාකාරී බෞද්ධ භික්ෂූන් වහන්සේලාට

[130] Rajapakse, R. P. (2002). *Development of Sri Lanka's economy since Independence in 1948 : Focusing on Trade Balance and exchange rate Movements* (Vol. 5th). Social Systems studies , Ritsumeikan University.

පහර දීමෙන් බෞද්ධ පෙරමුණද අමනාප කර ගත්තේය. මෙය එකල සිදුවූ ප්‍රධානත ම අපරාධයක් ලෙස සැළකිනි. මෙය රාජ්‍ය ත්‍රස්තවාදය ලෙස ද සැලකේ. බන්ඩාරනායක මහතා විසින් මෙතෙක් ශ්‍රී ලංකාව තුළ පැවති ඉංග්‍රීසි භාෂාව වෙනුවට සිංහල පමණක් රාජ්‍ය භාෂාව කළේය. මෙය යම් ජාතිවාදී ගැටලුකාරී තත්ත්වයකට පත්වන්නට විය. එයට හේතුව වූවේ ඉංග්‍රීසීන් තම පාලනය තහවුරුකරගෙන පවත්වාගෙන යාම සඳහා යොදන ලද උපක්‍රමයක් ලෙස එකල රජයේ සේවය සඳහා බඳවාගනු ලැබුවේ ඉංග්‍රීසි භාෂාව භාවිතා කල හැකි පුද්ගලයන් පමණි. එකල උතුරේ දෙමළ ජනතාව හොඳින් ඉංග්‍රීසි අධ්‍යාපනයක් ලබා ඇති නිසා ඔවුන්ට එම රජයේ රැකියා හිමිවූ අතර ඔවුන් රට පුරාම රජයේ සේවකයන් ලෙස සේවය කරන ලදී. නමුත් දකුණේ සිංහළ ජනතාවට ඉංග්‍රීසි අධ්‍යාපනයේ පැවති දුර්වලතා නිසා එම අවස්ථාවන් මගහැරෙන ලදී. බණ්ඩාරනායක මහතාගේ මෙම තීරණයත් සමගම රාජ්‍ය සේවය සිංහල ජනතාව සඳහාද අවස්ථාව ඇති වූ අතර එතෙක් සේවයේ නියතු දෙමළ රාජ්‍ය සේවකයන්ට සිංහල විභාගයකට මුහුණ දීමට සිදුවිය. එහිදී දෙමළ බොහෝ පිරිසගේ රජයේ රැකියා අහිමි වූ අතර ඔවුන්ට නැවත උතුර වෙතයාමට සිදුවිය. එහිදි ඉංග්‍රීසි භාෂාවත් සමඟ පැවති සංස්කෘතියෙන් මිදී සිංහල භාෂාමය සංස්කෘතියක් ගොඩනැගෙන ලදී. එහිදී රජයේ ආයතන වල සිංහල භාෂාව භාවිතයට ගත් අතර අධිකරණ කටයුතු වලදී පවා සිංහල භාෂාව භාවිතය මෙතැන් සිට ආරම්භ කරන ලදී. මෙම නිසාවෙන් ලංකාවේ දමිළ ජනතාවගේ අයිතිවාසිකම් උල්ලංඝණය වූවා යැයි සිතිමට උතුරේ ජනතාව පෙළෙඹුණි. ප්‍රබල සංස්කෘතික ඝට්ටනයක පෙර නිමිති මෙම තීරණ හරහා ක්‍රියාත්මක විය. පී.ජී. පොන්නම්බලම් මහතා විසින් දියත් කරන ලද ජාතිවාදී දේශපාලනය සමඟ ගැටුණු එකම ප්‍රධාන සිංහල නායකයා වූයේ බණ්ඩාරනායකය. දෙමළ ජනතාවට වැඩි අයිතිවාසිකම් දීමේ අරමුණට පී.ජී.පොන්නම්බලම් දැරූ උත්සාහයට ජේ.ආර්.ජයවර්ධන ද විරුද්ධ විය. ජේ.ආර්.ජයවර්ධන ඊට එරෙහිව මහනුවරට පාගමනක් සංවිධානය කළේය. මෙය දෙමළ සුළු ජාතිය අතර එදිරිවාදිකම් අවුළුවන්නක් විය. මෙම වෛරය කැළඹිලි සහිත තත්ත්වයක් කරා යොමු වූ අතර එය උච්චතම අවස්ථාවට පත් වූයේ 1958 දී හර්තාලයක් ඇති වීමෙනි[131]. එහිදී ජාතිවාදී ගැටුම් වල ආරම්භයක්ද මෙම වකවානුව තුළ දැකගත හැකිවිය. එමගින් මෙතෙක් ආරක්ෂාකරගෙන එන ලද ජාතීන් අතර සමගිය යම් පළුදුවීමක් දක්නට ලැබිණි. මෙය ශ්‍රී ලාංකේය සමාජයට හා සංස්කෘතියට බලපානු ලැබුවේය. එයට හේතුව වුවේ මෙතෙක් සමගියෙන් සිටි සිංහල හා දෙමළ ජනතාව අතර යම් මතවාදයකට තුඩුදෙන කාරණයක් මෙමගින් ඇතිවන නිසාවෙනි. වර්ෂ 1959 සැප්තැම්බරයේදී බණ්ඩාරනායක මහතාව පක්ෂය විසින්ම ඝාතනය කරන ලදී. මෙය ශ්‍රී ලංකාවේ දේශපාලනයේ කළු පැල්ලමක් ලෙස බෙහෝ දෙනා සඳහන් කරනු ලැබේ. මෙය ශ්‍රී ලංකාව තුළ මෙතෙක් සිදුවූ බරපතලම අපරාධයක් ලෙස හඳුන්වාදිය හැකිය. එයට හේතුව වූයේ රටේ පාලකයාව මරා දැමීමයි. එමෙන්ම එතුමාගේම පක්ෂයේ සාමාජිකයෙකු හා ප්‍රභල පාක්ෂිකයෙකු වූ සෝමාරාම ස්වාමීන් වහන්සේ තම සිවුර තුල තුවක්කුව සගවා ගෙන ගොස් සිවුරට මුවා කොට මෙතුමාව ඝාතනය කරන ලදී. මෙය මෙකල සාමාජය තුල මහා ගැටලුකාරී තත්වයකට පත්විය. එයට හේතුව වූවේ රටේ පාලකයා මියයාමත් සමග රට අස්ථාවරභාවයකට පත්වීම යන කාරණය නිසාය. එමෙන්ම මෙම ඝාතනය රටේ ගෞරවණීය

131 *Ceylon SriLanka (1948-present)*. (n.d.). Retrieved from University of Central Arkansas: https://uca.edu/politicalscience/dadm-project/asiapacific-region/ceylonsri-lanka-1948-present/

සංස්කෘතික කණ්ඩායමක සමාජිකයකු අතින් සිදු වීමය. මෙකල ශ්‍රී ලාංකේය සමාජය තුල රට තුළ අස්ථාවර ස්වභාවයක් ඇතිවීම හා රට තුළ අපරාධකාරීත්වයේ නව රැල්ලක් ඇති විය.

සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මියගේ පාලනය ශ්‍රී ලාංකේය දේශපාලනය පමණක් නොව ජාත්‍යන්තර දේශපාලනය තුළ ද නෙමැකෙන අවස්ථාවක් මෙන්ම සංස්කෘතිකමය වශයෙන් බලපෑමකට ලක්වූවක් ලෙසද පෙන්වා දිය හැකිය. මෙහිදී ශ්‍රී ලංකාව තුළ මෙතෙක් පැවති පුරුෂ මූලික පාලනයට තිත තබා කාන්තා පාර්ශවය රට තුල පාලකයා ලෙස කටයුතු කිරීම සමාජීය වශයෙන් මෙන්ම දේශපාලනික වශයෙන් ද මහා පන්නරයක් ලැබුවේය. එහිදී දේශපාලනය සඳහා කාන්තා නියෝජනය පිලිබඳව ශ්‍රී ලංකාව තුළ පමණක් නොව ජාත්‍යන්තර වශයෙන්ද අවධානයට ලක්වූවේය. එමෙන්ම මෙම කාරණයත් සමග ශ්‍රී ලංකාව තුළට වැඩි අවධානයක් ජාත්‍යන්තර වශයෙන්ද හිමිවිය. ඇයගේ රජය තව දුරටත් දෙමළ ජාතිය සමග අර්බුද ඇතිකර ගැනීමෙන් වැළකී සිටියේය. එයට හේතුව වූවේ සෑම රජයක්ම පාහේ ජාතිවාදීගැටුම් නිසා දේශපාලනික වශයෙන්, ආර්ථිකමය වශයෙන් හා සංස්කෘතිකමය වශයෙන් බලපෑමක් රට තුළ ඇති වන නිසාවෙනි. සිරිමා - ශාස්ත්‍රී ගිවිසුම ද මෙම වෙනස්කම් වලට පාදක විය. එහෙත් ඇයගේ ජනසතු කිරීමේ ව්‍යාපාර නිසා ආර්ථික අර්බුදය වැඩි විය. මෙම තත්ත්වය තුළ ශ්‍රී ලංකාව තුළ ජීවත් වන ජනතාවට තම එදිනෙදා ජීවිතය පවත්වාගෙන යාම සඳහා අපහසුකාරී තත්ත්වයක් ඇති විය. සමාජය තුළ යම් විසංවිධාන තත්ත්වයක් ගොඩනැගෙන්නට විය. මෙහි ප්‍රධාන වශයෙන්ම බලපෑමට ලක්වූවේ පහළ පංතියේ ජනතාවය. මෙම හේතුව නිසා එම පිරිස් යම් යම් අපරාධකාරීත්වයන්ටද යොමුවීමක් එකල දක්නට ලැබිනි. එදා වේල සඳහා තරඟ වදින දිළිදු සංස්කෘතියක් බිහි විය. මෙය ශ්‍රී ලාංකේය සමාජය තුළ යම් බලපෑමක් ඇතිකිරීමට තුඩුදුන් කාරණයක් බවට පත්විය.

වර්ෂ 1968 දී බණ්ඩාරනායක මහත්මිය ලංකා සම සමාජ පක්ෂය සහ ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය සමග සමගි පෙරමුණ නමින් සංධානගත වී වර්ෂ 1970 දී සමාජවාදී පදනමක් දැමීමේ අපේක්ෂාවෙන් නැවතත් ශ්‍රී ලංකාවේ පාලකයා ලෙස තේරීපත් විය .එතැන් පටන් ආරම්භ වන්නේ අපරාධමය වශයෙන් වැදගත් වන අවධියකි. එයට හේතු වන්නේ විජේවීර ඇතුළු ජනතා විමුක්ති පෙරමුණ එක්ව සංවිධානය කරන ලද 71 අප්‍රේල් කැරැල්ලයි. මෙය ඇතිවීමට ප්‍රධානම හේතුව වූවේ මෙරට ජීවත් වූ තරුණයන්ට අවශ්‍ය කරනා රැකියාවන් අහිමිවීම මත ඇතිවූ තරුණ අසහනය වේ .ඒ අනුව සන්නද්ධ අරගලයෙන් බලයේ සිටින ධනේෂ්වරය පෙරළා දමා රාජ්‍ය බලය අත්පත් කරගැනීමට කටයුතු කරන ලදී. වර්ෂ 1971 අප්‍රේල් 5 වනදා මධ්‍යම රාත්‍රිය වනවිට මෙරට පොලිස් ස්ථාන වෙත ප්‍රහාර එල්ල කිරීමට සැලසුම් සකස් වී තිබුණි. ඔවුන් සැලසුම් කළ පරිදි එදින මධ්‍යම රාත්‍රියේ දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටි පොලිස් ස්ථාන 92කට පහර දෙනු ලැබීය. ඊට පසුදිනම ජනතා විමුක්ති පෙරමුණ මෙරට තුළ තහනම් සංවිධානයක් ලෙසට නම් කිරීමට එවක පැවති රජය පියවර ගත් අතර කැරැල්ල මැඩ පැවැත්වීමට ජාත්‍යන්තර යුද සහායද ඔවුන් අපේක්ෂා කළේය. රටපුරා පොලිස් සහ හමුදා මෙහෙයුම් මගින් කැරැල්ලට සම්බන්ධ වූ සැකකරුවන් 5,000ක් පමණ අත්අඩංගුවට පත්විය. පසුව එවක පැවැති රජය කැරැල්ලට සම්බන්ධ වූ අනෙක් තරුණයින්ට සන්නද්ධ හමුදාවන්ට භාරවීම සඳහා කාලයක් ලබාදුන් අතර ඒ අනුව තරුණයින් 16,000ක් පමණ රජයට භාරවී තිබුණි[132]. මෙම කැරැල්ල මගින් ශ්‍රී ලංකාව තුළ

[132] Arasaratnam, S. (1972). *"The Ceylon Insurrection of April 1971: Some Causes and Consequences." Pacific Affairs 45.*

අපරාධ වල නව ප්‍රවණතාවයක් ඇති විය. එහිදී ආයුධ භාවිතය, රාජ්‍ය දේපළ වලට හානි සිදුකිරීම, ඝාතනයන් සිදුකිරීම හා රජය පලවා හැරීමට ප්‍රජාතාන්ත්‍රවාදී විසඳුමක් වෙනුවට ප්‍රචණ්ඩකාරී විසඳුම් සෙවීමේ ආකාරයක් ශ්‍රී ලංකාව තුළ ඇති විය. මෙය ශ්‍රී ලංකාවේ පවත්නා වූ අපරාධ සඳහා මෙන්ම සමාජීය වශයෙන්ද, ආර්ථිකමය මෙන්ම සංස්කෘතික වශයෙන් ද දැඩි ලෙස බලපෑවේය. මෙම හේතුව නිසා මෙරට ජීවත්වුනු තරුණ ප්‍රජාව මහත් ගැටලුකාරී තත්ත්වයකට පත්වූ අතර දෙමාපියන්ට ද දරුවන් ආරක්ෂා කරගැනීම සඳහා විවිධ ක්‍රමයන් භාවිතා කිරීමට සිදුවිය. මෙම හේතුකාරණා නිසා මෙකල ශ්‍රී ලංකාව තුළ අපරාධමය බිය හා ත්‍රස්තවාදී බියෙන් යුතු සමාජයක් ඇතිවිය[133]. මෙය ශ්‍රී ලංකාවේ සංස්කෘතියට දැඩිලෙස බලපෑමට ලක්විය. තවද මෙතෙක් පැවති ශ්‍රී ලාංකේය සමාජයේ පර්යායයටද මෙය දැඩිලෙස බලපෑමක් ඇති කරන ලදී. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය විසින් දේශීය සම්පත් උපයෝගී කරගෙන ආර්ථිකය දියුණු කිරීම සඳහා කෙමෙන් කෙමෙන් විවිධ ක්‍රියාමාර්ගයන් ගන්නා ලදි. එහි උච්චතම අවස්ථාව වූවේ වර්ෂ 1972 පසුවය. ඒ "අභ්‍යන්තරාවලෝකන ප්‍රතිපත්තිය" රටට හඳුන්වා දීමත් සමගයි[134].

මෙහිදී ආනයනය නවතා දමන ලද අතර දේශීය ගොවිතැන සංවර්ධනය කිරීමට කටයුතු කරන ලදී. නමුත් දේශීය නිෂ්පාදනය රටට ප්‍රමාණවත් නොවීම මත දේශීය නිෂ්පාදන භාවිතා කිරීම පාලනය කරන ලදී . එහිදි හාල් පොල්ල , මිරිස් පොල්ල වැනි ක්‍රමයන් මගින් දේශීය පාරිභෝජනය පාලනයට ලක් කරන ලදී. එමෙන්ම මෙරට හෝටල් තුල සතියකට දින කිහිපයක් පමණක් බත් ලබාදිය හැකි අතර අනෙක් දින වල දේශිය අලභෝග ආහාර සඳහා ලබාදීම කලයුතුව පැවතිණි. හාල් සේරු දෙකක් පමණක් එක් පුද්ගලයෙකුට ගෙනයාමට හැකියාව ලැබුණ අතර එසේ හොරෙන් ගෙනගොස් හෝ ලගතබාගෙන හසුවුවුහොත් දඬුවම් ලබාදීම වැනි කෲර පාලනයක් එකල බණ්ඩාරාණායක මැතිණිය ගෙන යන ලදී. මෙමගින්ද රට තුළ සාමාජීය හා සංස්කෘතිමය වශයෙන් වෙනස්කම් සිදුවිය. මෙකල සාමාජය තුළ අපරාධ වලට යොමුවීමක් දක්නට ලැබුනද සොරකම් කිරීමට පවා දෙයක් සමාජය තුළ එකල නොපැවතිනි. එම නිසා එම අපරාධකාරී හැගීම් පහව යන්නට ඇත. ශ්‍රී ලාංකේය සමාජය තුල ජීවත් වුනු ජනතාවට මෙම අවධිය මහා දුකින් පිරි කාලයක් බවට පාලකයන් විසින් පත්කරන ලදී. මෙවන් දුර්දාන්ත තත්වය නිසාම වර්ෂ 1977 ද ජේ . ආර් . ජයවර්ධන මහතා " ඇට අට දෙන්නම් " යනතේමා පාඨය කොටගෙන ශ්‍රී ලංකාව තුළ පාලකයා බවට පත්විය. එහිදී මැතිණිගේ පාලන අවධියේ පැවති අභ්‍යන්තරාවලෝකන ප්‍රතිපත්තිය නිසා මහජනතාව විදි පීඩාකාරී ජීවිතය හේතුකොටගෙන ජයවර්ධන මහතාට පාර්ලිමේන්තුවේ අධික බහුතර බලයක් ලබාගන්නා ලදී. එහිදී මෙම පීඩාකාරී පාලනයට තිත තබා එතුමා විසින් වර්ෂ 1977 ද විවෘත ආර්ථිකය මෙරටට හඳුන්වාදුණි. ක්‍රි.පූ. 6වන සියවසේ සිට 1977දක්වා ශ්‍රී ලංකාවේ ඉතිහාසය දෙස විමර්ෂනාත්මකව බැලූ කල මෙ රට සෑම කුඩා අනුකුඩා කාරණාවකටම පවා සංස්කෘතිය බලපා තිබේ. ලාංකිකයාට මෙන්ම ලොව සෑම මිනිසෙකුට ම සංස්කෘතියෙන් තොර ජීවිතයක් සිතීමටවත් නොමැති බව අපට ඉන් අනාවරණය වේ.

---

[133] Kearney, Robert N. Janice Jiggins. (1975). "The Ceylon Insurrection of 1971.". *Journal of Contemporary and Comparative Politics*.

[134] Kelegama, S. (2000). *Development in Independent Sri Lanka: What Went Wrong?* . Economic and Political Weekly.

## 14. විවෘත ආර්ථිකයෙන් පසු සංස්කෘතික පරිණාමය අපරාධ ඇතිවීම කෙරෙහි බලපෑ ආකාරය

**එන්.එස්. අබේගුණවර්ධන**
**එන්. ආර්. අයි. ඩී. නිලවීර**

1977 දී ජේ.ආර් ජයවර්ධන මහතා විසින් බලයට පත්වීමෙන් පසු මෙරටට විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දෙන ලදී. අද්‍යතනය වනවිට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වනුයේ මෙකී විවෘත ආර්ථික ක්‍රමය මත පදනම් වූ අර්ථ ක්‍රමයකි. 1977ට පෙර ලාංකේය ආර්ථික ක්‍රමය කෘෂිකර්මාන්තය මූලික කරගත් වැව්ලි ආර්ථිකය මත සිදු වූ සමාජවාදී ලක්ෂණවලින් අනූන වුව ද, විවෘත ආර්ථික ක්‍රමය හඳුන්වා දීමෙන් පසුව එය ලිබරල් ධනවාදී ලක්ෂණවලින් ස්වයංපෝෂිත වූ බැවින්, ධනවාදී වෙළෙඳපොළ අර්ථ ක්‍රමයක් බවට පරිවර්තනය විය. මෙය ලාංකේය සමාජයෙහි සිදු වූ ප්‍රබල සමාජ සංධිස්ථානයකි. එම නිසා මෙරට සමාජීය, ආර්ථික, දේශපාලනමය වශයෙන් සංස්කෘතිකමය විපර්යාසයන් රැසක් ඇති කළ බව ද නොරහසකි. විශේෂයෙන්ම ශ්‍රී ලංකාව තුළ වෙළෙඳපොළ අර්ථ ක්‍රමයක ලක්ෂණ පිළිඹිබු කරමින් මෙම අර්ථ ක්‍රමය තුළ විවිධාකාරයේ වර්ධනයක් හෙවත් ප්‍රවණතාවයක් දැකගත හැකි වුව ද, සංස්කෘතිකමය විසරණය හේතුවෙන් සමාජය තුළ ධනාත්මක මෙන්ම, ඍණාත්මක බලපෑම් ද ඇති විය. එකී නිශේධනාත්මක බලපෑම් හමුවේ මෙරට සමාජ විරෝධී සහ අපරාධමය පසුබිමක් සැකසී සංස්කෘතික පර්යායට විශාල බලපෑමක් එල්ල විය. එම පදනම මත මෙම ලිපිය ලියැවී ඇත.

විවෘත ආර්ථිකයත් සමඟ හටගත් සංස්කෘතික පරිණාමයේ දී ආර්ථික වශයෙන් සිදු වූ වෙනස්වීම් හේතුකොටගෙන ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ ඉහළ වර්ධනයක් ඇති විය. ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ සිදු වූ විවෘතභාවය සංචාරක ව්‍යාපාරයේ දියුණුවට බෙහෙවින් ඉවහල් වූ බව කිවහොත් එය නිවැරදිය. එමනිසා විදේශ ආයෝජකයින්ට ඉඩප්‍රස්ථා සැලසීම, විනිමය සීමා කිරීම වැනි නව ආර්ථික ප්‍රතිපත්ති, සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ව මහත් වෙනසක් ඇති කිරීමට හේතු විය. එනම් මෙකී සංචාරක කර්මාන්තය හරහා මෙරට තුළ ආර්ථිකමය තිරසර බවින් යුක්ත සුබවාදී ලකුණක් පෙන්නුම් කළ ද, මේ හරහා ඇති වූ අහිතකර බලපෑම ද සුළුපටු නොවේ. සංචාරකයින් වැඩි වශයෙන් පැමිණීම හේතුකොටගෙන ලාංකේය සංස්කෘතියට එතරම් උචිත නොවන දෑ ක්‍රමක්‍රමයෙන් ආක්‍රමණය වීමට පටන් ගත්හ. මෙහි දී සංචාරකයින් ඔස්සේ මෙන් ම, සංචාරකයින් වශයෙන් පැමිණෙන "හිපියන්" වැනි අයගෙන් බටහිර රටවලින් රැගෙන එන මත්ද්‍රව්‍ය අප රටට පැමිණීමට පටන් ගත්තේ ය. ඒ තුළින් සංචාරක හෝටල් ආශ්‍රිත සහ වෙරළාශ්‍රිත කලාපයේ මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ සංස්කෘතියක් නිර්මාණය විය. වත්මන් සමාජය එකී මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ සංස්කෘතියක් ආක්‍රමණය කොට අවසන් වී ඇති අතර, එමගින් නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම් කටයුතු වැනි දෑ සමාජ පිළිලයක් බවට පත් වී ඇත. මේ තුළින් ද පුද්ගල මනෝභාවයන් විකෘති වීම, අධික කෝපය හා ප්‍රචණ්ඩත්වය හේතුවෙන් මනුෂ්‍ය ඝාතන, පහරදීම්, ස්ත්‍රී දූෂණ සහ වෙනත් බරපතළ අපරාධ වැනි තත්ත්වයන් ද උත්පාදනය වී ඇති බව හඳුනාගත හැකි ය.

බටහිරකරණය සමඟ ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින් මූලික කොටගෙන රාත්‍රී සමාජශාලා බිහි වූ අතර, එමගින් ද ඊට ආවේණික වූ සංස්කෘතික හානියක් දැකගත හැකි ය. මෙම රාත්‍රී සමාජශාලා මූලික කොටගෙන නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම්, ගණිකා වෘත්තිය, සමලිංගික සේවනය, පහරදීම්,

මනුෂ්‍ය ඝාතන වැනි දෑ සිදු වේ. කොළඹ නගරය තුළ විවෘත ආර්ථිකයේ බලපෑමත් සමඟ ඇතිවුණු සංවර්ධනාත්මක දියුණුව හේතුවෙන් සංචාරක හෝටල් හා ඒ ආශ්‍රිත වෙනත් රැකියා අවස්ථාවන් වැඩි වශයෙන් උදා විය. මේ හේතුවෙන් ග්‍රාමීය ප්‍රදේශවල සිටි තරුණ තරුණියන් රැකියා අවස්ථා උදාවීමත් සමඟ නගරයේ රැකියාවට පැමිණීමෙන් විවිධ අපගාමී චර්යාවන් සඳහා නැඹුරු වීම ස්වභාවයයි. බොහෝ තරුණියන් අඩු ආර්ථික මට්ටම හේතුවෙන් සංචාරක කර්මාන්තයත් සමඟ බද්ධ වී ගණිකා වෘත්තියට පෙළඹී ඇත. එමණක් නොව රැකියා ස්ථානවල දී ලිංගික අතවරයන්වලට සහ වෙනත් හිංසනයන්ට ද ගොදුරු වේ. තරුණයින් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීම හා මත්ද්‍රව්‍ය ජාවාරම් කටයුතු සිදු කිරීම, නීති විරෝධී වෙනත් රැකියා කිරීම, සංවිධානාත්මක අපරාධ කිරීමට යොමු වීම, සොරකම් කිරීම හා මංකොල්ලකෑම වැනි අපරාධ සඳහා පෙළඹී ඇත.

තව ද, විවෘත ආර්ථික ක්‍රමයත් සමඟ ශීඝ්‍රයෙන් දියුණු වූ සංචාරක කර්මාන්තය ආශ්‍රිත ව සමාජ සංස්කෘතිය ක්‍රමිකව විකාශය වීමෙන් වාණිජමය ලිංගික සූරාකෑම්, ලිංගික සංචාරක ව්‍යාපාරයන්, මෙහෙකාර සේවය, දරුවන් විදේශ රටවලට විකිණීම වැනි දෑ ද සිදු වේ. විශේෂයෙන් ම අද්‍යතනය වන විට ළමා ලිංගික සංචාරක ව්‍යාපාරය මෙරට තුළ ඉහළ ප්‍රවණතාවක් පිළිබිඹු වේ. බටහිර සංස්කෘතිය විලාසිතා සංචාරකයින් මාර්ගයෙන් මෙරට පැමිණෙන අතර, එය සංස්කෘතික පරිහානියට හේතුවකි. මන්ද එවැනි විලාසිතා අයහපත් අයුරින් වැළඳ ගන්නා ප්‍රජාව තුළ ඇතිවන්නා වූ විකෘති ආශාවන් තුළින් අනවශ්‍ය ලිංගික හැඟීම් උද්දීපනය වීමෙන් ස්ත්‍රී දූෂණ, ළමා ලිංගික අපයෝජන වැනි සදාචාර හා සමාජ විරෝධී අපරාධ උපස්ථම්භක වන හෙයිනි. මෙලෙස සංචාරක කර්මාන්තය තුළින් රටට ආර්ථිකමය වශයෙන් යහපත් සාධනීය උපකාරයන් රැසක් සිදු වුව ද, සංචාරක කර්මාන්තය තුළින් එල්ල කරන බලපෑම හමුවේ රටේ පවත්නා සභ්‍යත්වය, සදාචාරය හා සාරධර්මයන්ගෙන් පරිපූර්ණ සංස්කෘතිය විසංවිධානය වන බව පැහැදිලි ය [135].

සියවස් ගණනාවක් මුළුල්ලෙහි ම ලාංකේය ආර්ථිකය තුළ මූලිකත්වය හිමි වූයේ කෘෂිකර්මාන්තයට ය. නමුත් විවෘත ආර්ථිකයත් සමඟ අපනයන අවස්ථාවන් රට තුළට පැමිණීම සිදුවිය. එමඟින් කෘෂිකර්මාන්තයට මෙන්ම, අනෙකුත් කර්මාන්තවලට ද අපනයන ආර්ථික අවස්ථා හිමිවිය. නමුත් කල්යත්ම මෙමඟින් කෘෂිකර්මාන්තයට තිබූ ස්ථානය අහිමි වී මූලිකත්වය , කාර්මික අපනයනය වෙත ලැබුණි.

මෙම තත්ත්වය මත කෘෂිකර්මාන්තය තම ජීවනෝපාය කරගත් ජනතාවට ගැටලු රැසකට මුහුණදීමට සිදු විය. පීතෘමූලික සමාජයක් වන ලංකාවේ බොහෝ පියවරුන්ට කුටුම්බය තුළ ආර්ථික අවශ්‍යතාවය ඉටුකර ගැනීමට නොහැකිව, අලාභයන් දරාගත නො හැකි විය. මේ හේතුවෙන් මානසික වශයෙන් පසුබෑමකට සහ ඉච්ඡාභංගත්වයට පත්ව බොහෝදෙනෙක් සියදිවි නසාගැනීම් සිදුකර තිබේ. විවෘත ආර්ථිකයත් සමඟ ඉගෙනීම් අවස්ථා මෙන්ම, නගරාසන්නව රැකියා වර්ධනය වීමක් සිදු වූ අතර, යම්තාක් දුරකට හෝ අධ්‍යාපනය ලැබූ පිරිස් ගමෙහි තිබෙන සියලුම දෑ අතහැර නගරයට පැමිණියේ

[135] Kandewatta, Y., Fernando, A., & Silva, D. (2018). Tourism As An Effective Tool To Stimulate Economic Growth: The Case Of Sri Lanka. Journal Of Tourism Economics And Applied Research, 1(2). Http://Archive.Cmb.Ac.Lk:8080/Research/Bitstream/70130/4680/1/10.Pdf

ය. මෙහි දී බොහෝවිට නගරයේ සිටින අපරාධකාරී හැසිරීම් සහිත පුද්ගලයින් සමග එක් වී ඉක්මණින් මුදල් ඉපැයීම සඳහා සංවිධානය වී අපරාධ කිරීමට යොමු වී තිබේ.

විටෙක ආර්ථික ගැටලුවලට විසඳුමක් ලෙස බොහෝවිට ග්‍රාමීය කාන්තාවන් ගෘහ සේවාවන් සඳහා විදේශගත වන අතර, එය වක්‍රාකාරව අපරාධ රැසකට දොරටු විවර කිරීමක් විය. මව නොමැතිව නිවෙස්වල තනිවන දරුවන් ව ඇතැම් අවස්ථාවල දී මෙහෙකාර සේවයේ යොදවනු ලබයි. නිසි ආරක්ෂාවක් නොමැති වීමෙන් එවැනි දරුවන් ලිංගික අපරාධකරුවන්ගේ මනා ඉලක්ක බවට ද පත් වේ. බොහෝවිට ගැහැණු දරුවන් තමන්ගේ පවුලට ඉතාම සමීප පුද්ගලයින් අතින් දූෂණයට ලක් වේ. බිරිඳ නොමැති මෙවැනි නිවෙස්වල ස්වාමි පුරුෂයා මත්ද්‍රව්‍ය හෝ මත්වතුර භාවිතයට ඇබ්බැහිවූවන් වේ. එම පුද්ගලයින්ගේ ප්‍රචණ්ඩකාරී හැසිරීම් හේතුවෙන් පහරදීම්, මනුෂ්‍ය ඝාතන, මංකොල්ලකෑම් මෙන් ම, අනවශ්‍ය ලිංගික සබඳතා පවත්වාගෙන යාම වැනි අපරාධ ද සිදු වේ. එපමණක් නොව විවෘත ආර්ථිකය හරහා ලංකාවට ගෙන එන භාණ්ඩ අතර ලාංකීය සංස්කෘතියට එතරම් සමීප නොවන බටහිරකරණය වූ අවි ආයුධ ද නීති විරෝධීව කුමන හෝ ක්‍රමයක් මඟින් ලංකාවට පැමිණීම හේතුවෙන් ලාංකීය සමාජය තුළ ප්‍රචණ්ඩකාරී අපරාධ වර්ධනය වීමක් ද සිදු ව තිබේ [136]. අඩු වැටුප් සහ දුෂ්කරභාවය, හේතුකොටගෙන රෙදිපිළි හා ඇඳුම් පැළඳුම්, බෝග, විදේශ රැකියාවල අපනයන අංශ සඳහා, ශ්‍රී ලංකාවේ විවෘත ආර්ථිකය තුළ අපනයනය සඳහා ද කාන්තාවන් විශාල දායකත්වයක් සපයයි. මෙම ක්ෂේත්‍රයන්හි සිටින කාන්තාවන්ගෙන් වැඩි දෙනෙක් වෘත්තිමය රැකියාවන්හි නියුක්ත වෙයි. ඇතැමුන් ගෘහස්ථ රැකියාවන්හි නිරත වන අතර, බොහෝ කාන්තාවන් රැකියා ස්ථානයේ දී කායික, ලිංගික, වාචික වශයෙන් හිංසනයට ලක්වෙමින් මේ ආශ්‍රිත ව ද අපරාධය උත්පාදනය වී තිබේ [137].

විවෘත ආර්ථිකයත් සමග සමාජ සංස්කෘතිකමය වශයෙන් වෙනස්වීමට ලක් වූ තවත් ක්ෂේත්‍රයක් වන්නේ තාක්ෂණික ක්ෂේත්‍රයයි. ගෝලීයකරණයේ ප්‍රතිඵලයක් ලෙස තාක්ෂණය ඉතාම ශීඝ්‍රයෙන් වෙනස්වීමකට ලක් විය. මෙමඟින් ඉතා දියුණු තාක්ෂණයක් ලොවට දායාද විය. ශ්‍රී ලංකාවට ද මෙම නවීන තාක්ෂණය ගෝලීයකරණයේ ප්‍රතිඵලයක් වශයෙන් විවෘත ආර්ථිකය මඟින් දායාද වූවකි. තාක්ෂණික ක්ෂේත්‍රය තුළ ඇති වූ පෙරළිය මඟින් සමාජය තුළ ජනප්‍රිය සංස්කෘතියක් ගොඩනැගුණ අතර, එය ජනතාවගේ කලාත්මක රසාස්වාදයට පමණක් නොව ඔවුන්ගේ දෛනික ජීවිතවලට ද බලපෑමක් එල්ල කරනු ලැබීය. වර්තමාන සමාජය දෙස ඉතාම සැලකිල්ලෙන් බැලීමේ දී පැහැදිලිව පෙනෙන කරුණක් වන්නේ, ලාංකේය මුළුමහත් සමාජයම අද වන විට විද්‍යුත් මාධ්‍ය මඟින් පාලනය කරන බවයි. ජනතාව පරිභෝජනය කළ යුතු ආහාර, පැළඳිය යුතු ඇඳුම්, සනීපාරක්ෂක කටයුතු, කලාකාමීත්වය, ආගමික දර්ශනය හා දේශපාලන මතවාද යන සියල්ලටම විද්‍යුත් මාධ්‍ය තර්ජනයකට හසුව ඇත. එසේම මෙම බලපෑම බටහිරකරණය වූවක් වේ. ලංකාවේ සමාජය බටහිරකරණය වීමට ප්‍රධානතම හේතුව වනුයේ මෙම තාක්ෂණික පෙරළියයි. මෙමඟින් අප රටේ සංස්කෘතියට මෙන්ම, ජනතාවගේ ආකල්පවලට නොගැළපෙන වෙනස්කම් රට තුළ ඇති වූ අතර, එය සමාජයේ විසංවිධානකාරී බවට හේතුවිය. නිදසුනක් වශයෙන්, විවෘත ආර්ථිකයට පෙර ලාංකේය සමාජයේ විලාසිතා මෙන් ම, ඇඳුම් මෝස්තර ද ඉතාම

---

[136] හෙට්ටිආරච්චි, යූ. (2008). 1977න් පසු ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය වෙනස්වීම හා එහි බලපෑම.

[137] Otobe, N. (n.d.). Employment Sector Employment Working Paper No. 138 2013 Globalization, employment and gender in the open economy of Sri Lanka. Retrieved from 10th October 2021 https://www.files.ethz.ch/isn/167483/wcms_212721.pdf

සරල විය. නමුත් තාක්ෂණයත් සමඟ පැමිණි බටහිරකරණ විලාසිතා මෙන්ම, ඇඳුම් මෝස්තර සංකර ඒවා විය. අනෙක් අතට විලාසිතා මෙන්ම, ඇඳුම් මෝස්තර බටහිරකරණය වුව ද එය සමාජය තුළ පිළිගැනීමට අවශ්‍ය ජනතාවගේ ආකල්ප ඊට සමගාමී ව වෙනස්වීමට ලක් නොවීම හරහා යම් ඝට්ටනයක් ඇති වී ඒ ඔස්සේ පුද්ගලයින් අපරාධකාරීත්වය දෙසට ඇදී ගියේ ය. කොට ඇඳුමකින් සැරසී කාන්තාවක් මාර්ගයේ ගමන් කරනවා නම් බොහෝවිට ඇය වාචික හිංසනයට ලක්වනවා මෙන් ම, ඇතැම් අවස්ථාවල දී ඉතාම අවාසනාවන්ත ලෙස ලිංගික අපරාධවලට ද ගොදුරු වේ. අතීතයේ මෙවැනි දරුණු තත්ත්වයක් නො තිබුණ ද අද්‍යතනය වන විට එම තත්ත්වය වෙනස් වී ඇත. එපමණක් නොව ඉහත වෙනස්වීමට ලක්වූවා යැයි සඳහන් කළ සෑම ක්ෂේත්‍රයකම අඩු වැඩි වශයෙන් මෙවැනි අපරාධ සිදු වේ.

විවෘත ආර්ථිකයෙන් පසු තාක්ෂණය තුළ ඇති වූ තවත් පෙරළියක් වන්නේ සමාජ මාධ්‍යයයි. සමාජ මාධ්‍ය අද වන විට මෙරට සමාජයේ අපරාධ වලට හේතු උත්පාදනය කර දෙන මූලාශ්‍රයක් බවට පත්ව ඇත. සමාජ මාධ්‍ය මඟින් පුද්ගලයින්ගේ ආකල්ප වර්ධනයට, පුද්ගලයින්ගේ දියුණුවට මෙන්ම, සමාජයක් ශිෂ්ටසම්පන්න කිරීමට කෙතරම් අවස්ථාවන් තිබුණ ද ඉන් ප්‍රයෝජනය ගනුයේ ඉතාම සුළු පිරිසකි.

බහුතරය තමන්ට මෙන් ම, අනෙක් අයට ද පීඩාවක් වන ලෙස මෙය භාවිත කරයි. තමන්ගේ අතිශය පෞද්ගලික දේවල් පවා කිසිඳු බියක් මෙන් ම, ලැජ්ජාවකින් තොරව සමාජ මාධ්‍ය වෙත මුදාහරින චරිත වර්තමානය වන විට නිර්මාණය වී ඇත. මෙවැනි දේ හරහා ලිංගික ආශාවන් විකෘති ආකාරයෙන් උද්දීපනය වන අතර, එය ලිංගික අපරාධ වර්ධනයට හේතු වේ. එමෙන්ම මෙම සමාජ මාධ්‍ය හරහා පුද්ගල අන්තර් සබඳතාවල විශ්වාසය පළුදු වී අනවශ්‍ය සබඳතාවල පුද්ගලයින් හැසිරීම හේතුවෙන් නිවැසියන් සමඟ පවත්නා සබඳතා බිඳවැටී පිටස්තර පුද්ගලයින් සමීප කර ගැනීමක් සිදුවන අතර, එය ඍජුව හා වක්‍රව මනුෂ්‍ය ඝාතන, සියදිවි නසාගැනීම්, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, ළමා අපයෝජන මෙන් ම, අනවශ්‍ය ගැබ්ගැනීම් වැනි අපරාධ ඇති වීමට බලපාන්නේ ය. තවත් විටෙක මාර්ගගත හිංසනයන් සිදුවන අතර, එවැනි දෑ මඟින් කප්පම් ගැනීම වැනි අපරාධයන් ද සිදු වන්නේ ය.

එසේම විවෘත ආර්ථිකයට පෙර ගම්වල දරුවන් එකට එක්ව පරිසරය සමඟ මුහුවෙමින් කෙළිසෙල්ලම් කළ ද, බටහිරකරණ මුසුවූ තාක්ෂණික දියුණුව සමඟ මෙරටට පැමිණි නවීන උපකරණ මඟින් කුඩා දරුවන්ව තම මිතුරන්ගේ ඇසුරෙන් ඉවත්කර නිවසේ තම කාමරයට වී තනිවම ක්‍රීඩා කරන මට්ටමට ගෙන එනු ලැබීය. එමඟින් සහෝදරත්වය, සාමූහිකත්වය හා පරිත්‍යාගය වැනි හැඟීම්, ආකල්ප දරුවන් තුළින් පහවගොස් ඒ වෙනුවට පරිගණක ක්‍රීඩා මඟින් ලැබෙන ප්‍රචණ්ඩත්වය හා නො ඉවසීම පමණක් ඉතිරි කර ඇති අතර, එයින් ආත්මාර්ථකාමීත්වය පෝෂණය කර තිබේ. මේ හරහා ද බරපතළ පහරදීම් හා ළමා අපචාර ආදී අපරාධ ඇති වේ. තාක්ෂණයේ දියුණු බව හේතුවෙන් ඉතාම සූක්ෂම ලෙස මුදල් වංචා කිරීම වැනි අපරාධයන් ද සමාජය තුළ වර්ධනය වී ඇත. කෙසේ වෙතත් විවෘත ආර්ථිකයත් සමඟ බටහිරකරණය වූ තාක්ෂණය මඟින් ලංකාව තුළ අපරාධකාරී පරිසරයක් නිර්මාණය කිරීමට දායක වී ඇති බව පැහැදිලි ය[138]. විවෘත ආර්ථිකයෙන් පසු ඇති වූ සංස්කෘතික විකාශය ලාංකේය

[138] මහීස්, එම්. (2017). ලාංකේය සිවිල් සමාජය හා ජන සංස්කෘතියේ ගමන් මග, ප්‍රතිමාන, 11 වන වෙළුම.

දේශපාලන සංස්කෘතිය තුළ ද පුළුල් පරිවර්තනයක් ඇති කළේය. විවෘත ආර්ථික ප්‍රතිපත්තියත් සමඟ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙතින් එතෙක් භාවිත කළ කැබිනට් විධායකය, ජනාධිපති විධායකයක් බවට ද පරිවර්තනය විය. මෙය ලාංකේය සමාජ සංස්කෘතික දේශපාලන ඉතිහාසයෙහි එක්තරා සංධිස්ථානයක් වුව ද, සමාජ විසරණයට සරිලන ආකාරයේ ආර්ථික වර්ධනයක් ඇති නොවීමේ ප්‍රතිඵලයක් ලෙස ලාංකේය උගත් තරුණයන් අතර අපේක්ෂා භංගත්වයන් බිහි විය. "සැමුවෙල්. ජී. හංටින්ටන්ගේ" අදහසට අනුව, රැකියා විරහිතවූවන්ගේ අධ්‍යාපනික මට්ටම ඉහළ යන තරමට පරාරෝපණය හෝ අතෘප්තකර පුද්ගලයන්ගේ සංඛ්‍යාව ද ඉහළ යනු ඇත. මේ නිසා පෙරළිකාර චර්යාවන් සමාජයෙහි පිළිබිඹු වේ. තව ද, පරාරෝපණය වූ විශ්වවිද්‍යාල උපාධිධාරීන් විප්ලවයක් උදෙසා සූදානම් වීමේ දී පරාරෝපණය වූ , කාර්මික හෝ ද්විතීයික අධ්‍යාපනය ලැබූ පුද්ගලයන් කුමන්ත්‍රණ සැලසුම් කරන බව මොහුගේ අදහසයි. මෙලෙස ආර්ථික ඌණ සංවර්ධනය හේතුකොටගෙන ශ්‍රී ලාංකික සංස්කෘතික සමාජ සංචලතාවයේ ව්‍යාප්තිය මඟින් සමාජ ඉච්ඡාභංගත්වය නිර්මාණය කොට ඇත. මෙම තත්ත්වයේ ප්‍රතිඵලයක් ලෙස තරුණයින් විශාල වශයෙන් දේශපාලනයට ආදේශ වී, දේශපාලන සහභාගිත්වය ද වර්ධනය වූ අතර, පසුව දේශපාලන පක්ෂ ක්‍රමය වර්ධනය වී මෙරට දේශපාලන සංස්කෘතිය නවීකරණය වීමට පටන් ගත්හ.

ශ්‍රී ලංකාවේ දේශපාලනයෙහි ඌණ සංවර්ධනය පෙන්නුම් කරන ප්‍රධාන සාධකයක් වශයෙන් මැතිවරණ ප්‍රචණ්ඩත්වය සඳහන් කළ හැකි ය. විවෘත ආර්ථිකය ලාංකීය දේශපාලන සංස්කෘතිය කෙරෙහි බලපාන්නට පෙර සිටම සෑම මැතිවරණයකදීම පාහේ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සිදු වුව ද, 1977 සිට මෙම ප්‍රචණ්ඩත්වය සමස්ථ දිවයින පුරාම ව්‍යාප්ත වෙමින් එහි විනාශකාරීභාවය උත්පාදනය වූ බව පැහැදිලිය. මෙහි දී ස්ත්‍රී දූෂණ, මිනීමැරුම් වැනි බරපතළ අපරාධ මෙන්ම, නිවාස කොල්ලකෑම, ගිනි තැබීම, පුද්ගලික දේපළ විනාශ කිරීම, වැනි අපරාධ ද බොහෝමයක් සිදු වී ඇත. විශේෂයෙන්ම පැමිණිලි පත්‍රහසක් පමණ පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ සිදුවීම් පිළිබඳව වාර්තා වී ඇති අතර, 1988 ජනාධිපතිවරණයේ දී පුද්ගලයින් 700ක් මියගොස් ද ඇත. විවෘත ආර්ථිකයෙන් පසු සංස්කෘතික පරිණාමය මෙරට දේශපාලන සංස්කෘතිය මූලික කොටගෙන අපරාධමය තත්ත්වයන් සමාජය තුළ පිළිඹිබු වීමට මෙලෙස උපස්ථම්භක වී ඇත.

1950 දශකයේ මැද භාගයේ සිදු වූ ජන වාර්ගික ප්‍රචණ්ඩත්වයෙහි බලපෑම ද දේශපාලන ප්‍රචණ්ඩත්වයට දායක වූ සාධකයක් ය. 1977, 1979, 1983 වර්ෂවල මහා පරිමාණ වශයෙන් මෙවැනි දෑ සිදු වූ අතර, 1977න් පසුව ප්‍රචණ්ඩත්වයන් වෙනම රාජ්‍ය පිළිබඳ ද්‍රවිඩ සංවිධානයේ ඉල්ලීම් සමඟ සම්බන්ධ විය. දකුණේ දේශපාලන ප්‍රචණ්ඩත්වයට පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩත්වයන් බලපෑ අතර, උතුරේ ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් ද ජන වාර්ගික ප්‍රචණ්ඩත්වය බල පා ඇත. මේ අනුව සමාජ සංස්කෘතික සංචලතාවය සමානරූපීව ආර්ථික හා දේශපාලන වර්ධනයක් නොවීම පිළිබඳ තත්ත්වය දිගුකාලීන වශයෙන් රහසිගතව ආයුධ සන්නද්ධ දේශපාලන ව්‍යාපාරයක් බිහිවීමට ද උපයෝගී වී ඇති බව සඳහන් කළ හැකි ය.

ජේ.වී.පී. යනු ශ්‍රී ලංකාවේ දේශපාලනික ප්‍රචණ්ඩත්වය හා සම්බන්ධ ප්‍රධාන සංවිධානයකි. ආයුධ සන්නද්ධ විප්ලවයක් ඇති කිරීම මඟින් මෙතෙක් බලයේ සිටි රාජ්‍යයන් ඉවත් කර දමා සමාජවාදී රාජ්‍යයක් නිර්මාණය කිරීමේ අරමුණ වෙනුවෙන් ජේ.වී.පී. සංවිධානය විසින් ප්‍රධාන වශයෙන් 1971

වර්ෂයේ කැරැල්ලක් බිහි කළ අතර, එකී කැරැල්ලේ පරමාදර්ශයන් පෙරදැරි කරගෙන 1987-89 කාලයේ දී විවෘත ආර්ථිකයෙන් පසු දෙවන කැරැල්ල දියත් කළේ ය.

බහුලව ත්‍රස්තවාදය භාවිත කරන 1987-89 කැරැල්ල වඩාත් සංවිධානාත්මක හා ව්‍යාප්ත වූවකි. දිවයිනේ දකුණු , උතුරු මැද, මධ්‍යම හා බටහිර පළාතේ ප්‍රබලව ක්‍රියාත්මක වෙමින් ආරක්ෂක අංශයට අයත් 178ක් හා පොලීසියට හා 319ක් මිය ගියහ. ඊට අමතරව යාපනය නගරාධිපති "ඇල්ෆඩ් දූරයප්පා" ඝාතනය කිරීම හා 30,000කට අධික ජේ.වී.පී. සාමාජිකයින් ඝාතනය කළහ. 1977 සිට උතුරු පළාතේ පොලීසිය හා හමුදා අංශයන්ට ප්‍රහාරය එල්ල වූ අතර, අනුරාධපුර හා කොළඹ නගරය ද ත්‍රස්තවාදී පහරදීම් වලට ලක්වීම මෙන් ම, 1984 දී උතුරු හා නැගෙනහිර පළාත් ගම්මානවල හා ජනපදයන්හි වාසය කරනු ලබන සිවිල් ජනතාව ද ඝාතනය කළේ ය. මේ අනුව 1977 විවෘත ආර්ථිකය සමඟ ඇති වූ දේශපාලනික සංස්කෘතිකමය පෙරළිය මෙලෙස සමාජය තුළ මෙවැනි අපරාධකාරී තත්ත්වයන් ඇති කිරීමෙහිලා දායක වී ඇත. උතුරු හා නැගෙනහිර පළාත් සභා පාලනය කරනු ලැබූ ඊ.පී.ආර්.එල්.එෆ් සමඟ ගැටුම් ඇතිවීම, ඉන්දියානු සාම සාධක හමුදා සමඟ එල්.ටී.ටී.ඊ. සංවිධානය ගරිල්ලා යුද්ධ කිරීම සහ 1990 වර්ෂයේ දෙවන ඊළාම් යුද්ධය ආරම්භ වී යාපනේ බලකොටුව, අලිමංකඩ, මාන්කුලම් හා පුනරින් යන ප්‍රදේශවලට ප්‍රහාර දියත් කිරීම සහ ආරක්ෂක අංශයන්හි 11000ක් ද, සාමාන්‍ය වැසියන් හා ගරිල්ලා භටයන් දොළොස් දහසක් මිය ගියේ ය. එමෙන්ම 1985 දී තෙවන ඊළාම් යුද්ධය ආරම්භ වීමත් සමඟ දී කොළඹ මහ බැංකුවට ප්‍රහාර එල්ල කිරීම ඇතුළු ව බෝම්බ ප්‍රහාරයක් දියත් කරමින් විශාල අමානුෂීය ඝාතන සංහාරයක් සිදු කළේ ය. මෙම සංස්කෘතිකමය දේශපාලන ප්‍රචණ්ඩත්වය හේතුකොටගෙන විශාල පිරිසක් ජීවිතක්ෂයට පත් විය. [139].

විශේෂයෙන්ම විවෘත ආර්ථිකයෙන් පසුව ඇති වූ පශ්චාත් යුද කාලයේ දී බරපතළ අපරාධ රැසක් මෙරට සිදු වූ අතර, ඉහළ මට්ටමේ දූෂණවලට අමතරව ආරක්ෂක හා ආරක්ෂක අංශවල සුළු දූෂණ අවස්ථා ද වාර්තා වී ඇත. ආරක්ෂක බලකායේ සාමාජිකයින් සහ පොලීසියේ සාමාජිකයින් සිරගත කිරීමෙන් ආරක්ෂා කර ගැනීම සඳහා අල්ලස් ලබා ගැනීම සහ උතුරේ සහ නැගෙනහිර හමුදා බලකායේ ස්ථාන ශක්තිමත් කිරීම සඳහා ආධාර ලබා ගැනීම සඳහා අල්ලස් ගැනීම් වැනි දෑ මෙකල සිදු විය. විශේෂයෙන් ම මෙකල යුද්ධයෙන් පීඩාවට පත් වූ කාන්තාවන් හා දරුවන්ට එරෙහිව විවිධ ලිංගික අපරාධ සිදු වීම, පැහැරගැනීම් වලට ලක්වීම, ගණිකාවන් විසින් ළමුන් නීති විරෝධී සේවයේ යෙදවීම වැනි ශාරීරික හිංසනමය තත්ත්වයන් ද දැකගත හැකි ය. රැකියා විරහිතභාවය ඉහළ යාම යුධ කාලීන අපරාධ ඇතිවීමට තුඩු දුන්නේ ය. රැකියා විරහිත තරුණයින් නීති විරෝධී අවි ආයුධ ජාවාරම්, මත්ද්‍රව්‍ය ජාවාරම් සිදු කිරීමට ද පෙළඹී ඇත. [140].

නමුත් අද්‍යතනය වන විට උක්ත තත්ත්වයෙන් ඔබ්බට ගොස් මුදල මත යැපෙන ධනවාදී ආර්ථික ක්‍රමයේ අනිසි බලපෑම හේතුවෙන් සමාජයේ සෑම දෙයක් ම දේශපාලනීකරණය වී ඇති බැවින් දේශපාලන සංස්කෘතිය ද පිරිහීමට පත්ව, ඒ වටා බැඳි අපරාධමය රැල්ලක් නිර්මාණය වී තිබේ. අල්ලස්

139 සමරනායක, ජී (2015). ශ්‍රී ලංකාවේ ප්‍රචණ්ඩත්වය, සමාජ සමීක්ෂා සමාජ විද්‍යා ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය, 1 වන වෙළුම.
140 Jayasundara, S. (2017). Lost in transition: linking war, war economy and post-war crime in Sri Lanka. A TWQ journal,3(1), 63-79. https://doi.org/10.1080/23802014.2018.1473046

, දූෂණ වංචා, සංවිධානාත්මක අපරාධ, මත්ද්‍රව්‍ය ජාවාරම්, පැහැර ගැනීම්, මිනීමැරීම් වැනි අපරාධ ඒ අතර මූලික වේ. මෙවැනි ප්‍රචණ්ඩත්වය වැගිරීම් හේතුකොටගෙන ශ්‍රී ලංකාව උෟණ දේශපාලනය සංවර්ධනයක් පෙන්නුම් කරන බව පැහැදිලි වේ.

එමෙන්ම විවෘත ආර්ථික ක්‍රමය සමඟ මෙරට ඇති වූ සංස්කෘතික පරිණාමය රට තුළ ප්‍රචණ්ඩත්වය වගුරවාලමින් අපරාධවලින් අනූන දූෂිත සමාජයක් නිර්මාණය කිරීම උදෙසා කෙතරම් බලපෑමක් සිදු කර තිබෙන බව දැකිය හැකි ය. විවෘත ආර්ථිකයෙන් පසු මෙරට ඇති වූ සංස්කෘතික පරිණාමය අපරාධ විෂයෙහිලා බලපෑ ආකාරය සුවිශේෂී වේ. විවෘත ආර්ථිකය හමුවේ දැඩි ප්‍රකම්පනයකට ලක් වූ මෙරට සංස්කෘතිය විවිධ දිශානතීන් ඔස්සේ ගලා යන්නට විය. මෙකී සාධක අපරාධ කෙරෙහි සෘජුවම බලපෑම් කළහ. පවතින ජරාජීර්ණ වූ ආර්ථික රටාවන් වෙනස් කරමින් මිනිසාට අපරාධවලින් තොර සාමකාමී පරිසර වටපිටාවක , වඩා යහපත්ව ජීවත් විය හැකි සුසංවාදී සමාජ සංස්කෘතියක් කෙරෙහි අවධානය යොමු කිරීමට කාලය එළඹ ඇත.

## 15. බහු ජනවාර්ගික සංස්කෘතීන් පදනම් කරගෙන ශ්‍රී ලාංකීය සමාජය තුළ අපරාධ ප්‍රභවය වීමට බලපවත්නා තත්ත්වයන්

**ආර්.එම්.සී.යූ.බී රණතුංග**

**එල්.පී.වනසිංහ**

අපරාධ හා සංස්කෘතිය සමඟ කටයුතු කිරීමේදී මතු විය යුතු පළමු ප්‍රශ්නය නම් ‘‘සංස්කෘතිය’’ යන යෙදුම සමඟ අප අදහස් කරන්නේ කුමක්ද යන්නයි. සියවස් ගණනාවක් තිස්සේ සංස්කෘතික මානව විද්‍යාඥයින් අතර සංස්කෘතියේ නිර්වචනය විවාදයේ කේන්ද්‍රස්ථානය වී තිබේ. එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය (යුනෙස්කෝ) විසින් ඉංග්‍රීසි මානව විද්‍යාඥ " එඩ්වඩ් බර්නෙට් ටයිලර්" විසින් ලබා දුන් නිර්වචනය සිහිපත් කරමින් සංස්කෘතිය යනු "දැනුම, විශ්වාසයන්, කලාව, සදාචාරය, නීතිය, සිරිත් විරිත් සහ වෙනත් හැකියාවන් ඇතුළත් සංකීර්ණ පද්ධතියකි" විසිවන සියවසේදී, සංස්කෘතිය සඳහා වූ නිර්වචන සහ ප්‍රවේශයන් ගණනාවක සමාජ හා සංස්කෘතික මානව විද්‍යාවේ සහ වෙනත් බොහෝ විෂයන්, විවිධ ප්‍රවණතාවයන් දක්නට ලැබුණි.

වර්තමාන සමාජ ක්‍රමය දෙස අවධානය යොමු කිරීමේදී සමාජ ක්‍රමයේ පරිණාමයත් සමඟ ම අදවන විට සමාජ ක්‍රමයන් අතිශය සංකීර්ණ සමාජ ක්‍රමයන් බවට පත්ව තිබෙන ආකාරය දැකිය හැක. මූලික වශයෙන්ම දේශපාලනික, ආර්ථික, භූගෝලීය, සාමාජීය මෙන්ම සංස්කෘතික හේතු සාධක මත මෙම සමාජ ක්‍රමයන් සාම්ප්‍රදායික රාමුවෙන් ඔබ්බට ගොස් සංකීර්ණත්වය කරා ළඟා වී ඇති ආකාරය අපට බැලූ බැල්මට පෙනෙන කරුණකි. අද වර්තමාන ලෝකයේ සමාජ ක්‍රමයන් බොහෝමයක විවිධ භාෂා, ඇඳහිලි, සිරිත් විරිත් මෙන්ම විවිධාකාරයේ ඇදහීම් ව්‍යාප්ත වූ සමාජ ක්‍රමයක් බවට පත්ව ඇත. මෙම සමාජ ක්‍රමයන්හි දැකිය හැකි විවිධතාවය පදනම් කරගනිමින් සමාජ විචාරකයන් මෙම සමාජය බහුවිධ සමාජයක් වශයෙන් නිර්වචනය කරනු ලබයි. බහු විවිධත්වයකින් යුත් මෙවැනි සමාජයක විවිධ ජනකොටස් ජීවත් වන අතර එලෙස ජීවත් වීමේදී හුදෙක් තම ජනවර්ගයට අයත් විවිධ සාම්ප්‍රදායික සිරිත් විරිත් මෙන්ම චාරිත්‍ර වාරිත්‍රයන් අනුගමනය කිරීමට මෙන්ම ඒවා පවත්වාගෙන යාමට කටයුතු කිරීම සාමාන්‍ය තත්වයකි. මෙම තත්ත්වය තුළ මෙම සමාජය තුළ සංස්කෘතික විවිධත්වයක් ගොඩනැගී තිබෙන බවක් පිළිඹිබු වන අතර එලෙස ගොඩනැගී ඇති බහු විවිධතාවයකින් යුක්ත සංස්කෘතිය බහුසංස්කෘතික සමාජ ක්‍රමයක් වශයෙන් අප හඳුනාගනු ලබයි.

බහු සංස්කෘතික (Multicultural) සමාජ ක්‍රමයක් යන්න සරලව නිර්වචනය කළහොත් "විවිධ ජාතීන්ට හා සංස්කෘතීන්ට අයත් පුද්ගලයින්ගෙන් සමන්විත හෝ ඔවුන් එකිනෙක සම්බන්ධ වූ සමාජ ක්‍රමයක්" වශයෙන් නිර්වචනය කල හැකිය[141]. බහු සංස්කෘතික සමාජ ක්‍රමයක් යටතේ බහුජන වාර්ගික සංස්කෘතියක් ඇති රටක් සඳහා දිය හැකි කදිම නිදසුනක් වශයෙන් ශ්‍රී ලංකාව හඳුනා ගත හැක. මෙරට

141 Longley, R. (2020). What is Multiculturalism definition and theories and examples? Retrieved from 6th October 2021 from https://www.thoughtco.com/what-is-multiculturalism-4689285

සමාජ ක්‍රමය තුළ එතරම් සංකීර්ණ නොවූ බහුසංස්කෘතික පදනමක් පවතින අතර ඉන්දියාව, එක්සත් ජනපදය ආදී රටවල් මෙරටට වඩා සංකීර්ණ බහුසංස්කෘතික අගනාකම් සහිත රාජ්‍යන් වන අතර බහුවාර්ගික සංස්කෘතියක් පවතින සමාජ ක්‍රමයක් සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී මෙම සමාජ ක්‍රමය සම්බන්ධයෙන් නිරීක්ෂණය කළ හැකි ආවේණික ලක්ෂණයන් කිහිපයක් සැකවින් පහත පරිදි ය.

- විවිධ ජනවර්ගයන්,විවිධ ආගමික විශ්වාසයන් දරන පිරිස්,විවිධත්වයක් සහිත භාෂාමය භාවිතයන් සහිත පිරිස් එක් සමාජයක් තුළ සාමූහිකව ජීවත් විම.
- සංස්කෘතික විවිධත්වය පදනම් කරගනිමින් ඊට ආවේණික චාරිත්‍ර, සිරිත් විරිත් සහ ආචාර ධර්මයන් මෙන්ම ඇගයිම් පද්ධතියක් ගොඩනැගීම.
- එක් එක් ජනකොටස් තුළ ප්‍රාදේශීය විවිධත්වයක් දැකිය හැකි වීම.
- ගෝලීයකරණය සහ තාක්ෂණික දියුණුව මත මෙම බහුවාර්ගික සංස්කෘතීන් ලෝකය තුළ ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වීම හා සංස්කෘතීන් අතර සට්ටනයක් හට ගැනීම.

මේ ආකාරයේ ලක්ෂණ ලාංකීය සමාජයේ බහුජනවාර්ගික සංස්කෘතිය තුළින්ද දැකිය හැක්කේය[142].

මෙරට සමාජය හුදෙක් විවිධ සංස්කෘතික අගනාකම් සම්මිශ්‍රණය වූ, විවිධ ජනවාර්ගික කණ්ඩායම් වාසය කරන බහු සංස්කෘතිකත්වයක් සහ බහු ජනවාර්ගීත්වයක් සහිත සමාජ ක්‍රමයක් වශයෙන් හඳුනා ගත හැකිය. මෙම සංස්කෘතික විවිධතාවය මෙරට සමාජ රටාව විචිත්‍රවත් කරන ප්‍රධාන අංගයක් බවට පත් වේ. එනමුත් මෙම සංස්කෘතික විවිධතාවය හේතු කොටගෙන ලාංකේය සමාජ ක්‍රමය තුළ බොහෝමයක් අවස්ථාවන්හිදී සංස්කෘතිකමය කාරණා හේතු කොටගෙන මෙම බහු සංස්කෘතික හා බහු ජනවාර්ගික කණ්ඩායම් අතර සට්ටනයන් ඇති වීම කෙරෙහි මෙම සාධක බලපෑමක් කර තිබෙන බවක් අපට පෙනෙන අතර ඒ අනුව මෙම සට්ටනයන් ඇති වීම කෙරෙහි බලපවත්නා වූ එම සංස්කෘතික කාරණා මොනවාදැයි පැහැදිලි කර ගැනීම වැදගත් වේ.

බහු ජනවාර්ගික සංස්කෘතියක් යටතේ මෙරට සමාජය තුළ මෙම බහු ජනවාර්ගික කණ්ඩායම් අතර ව්‍යාසනකාරී තත්ත්වයන් ඇති වීම සඳහා බලපානු ලැබූ හේතු සාධකයක් වශයෙන් සංස්කෘතික කණ්ඩායම් අතර පැවති වෛරී කථනයන් අපට හඳුනා ගත හැකිය. ඒ යටතේ විවිධ ජනවාර්ගික සංස්කෘතික කණ්ඩායම් වල අනතර්ගත විවිධ ආගමික මතවාදයන් සම්බන්ධයෙන් වෙනත් ජනවාර්ගික සංස්කෘතීන්ට අයත් පිරිස් විසින් සමාජය තුළ ඒ සම්බන්ධයෙන් වෛරී කථනයන් ව්‍යාප්ත කිරීම සිදුකරන්නට විය. මෙම තත්වය මත ජනවාර්ගික සංස්කෘතීන් අතර ගැටීම් ඇති වන්නට විය. මෙයට දිය හැකි හොඳම නිදසුනක් වශයෙන් මෙරට බෞද්ධ සහ මුස්ලිම් ජනවර්ගයන් අතර ඇති වූ සංස්කෘතික ගැටීම හඳුනා ගත හැකිය. මෙය මූලිකවම මෙරට ක්‍රියාත්මක වූ බෞද්ධ අන්තගාමී කණ්ඩායම් විසින් මුස්ලිම් ප්‍රජාව සම්බන්ධයෙන් සහ මුස්ලිම් ව්‍යාපාර සම්බධයෙන් සමාජ මාධ්‍ය ජාලා හරහා ගෙනගිය වෛරී කථනයන් පදනම් කරගෙන සිංහල බෞද්ධයන් සහ මුස්ලිම් ප්‍රජාව අතර

[142] Mvorganizing. (2019). What are the 7 Basic Characteristic of Culture? Retrieved from 7th October 2021 from https://www.mvorganizing.org/what-are-the-7-basic-characteristics-of culture/#What_are_the_7_basic_characteristics_of_culture

සංස්කෘතිකමය ගැටීමක් ඇතිවන්නට ප්‍රධාන හේතු සාධකයක් බවට පත්වන්නට විය. මේ ඔස්සේ සංස්කෘතීන් අතර ප්‍රචණ්ඩකාරී තත්ත්වයක් ඇතිවීම සිදුවන අතර මේ සම්බන්ධයෙන් රජයද නිහඬ ප්‍රතිපත්තියක් අනුගමනය කරනු ලබන්නට විය[143]. මෙම තත්ත්වය මත 2009 වසරෙන් පසුව මෙරට මුස්ලිම් ප්‍රජාව සහ බෞද්ධ ආගමික ප්‍රජාව අතර සබඳතාවය බිඳ වැටෙන්නට විය. එහි ඵල විපාකයන් පිළිබිඹු වූ හොඳම අවස්ථාවක් වශයෙන් මහනුවර දිගන ප්‍රදේශයේ ඇතිවූ සිංහල මුස්ලිම් මත ගැටුම මෙම සංස්කෘතික ගැටීම සඳහා මෑතකාලීනව දිය හැකි හොඳම නිදසුනක් වශයෙන් හඳුනාගත හැක. ශ්‍රී ලංකාව තුළ ප්‍රචණ්ඩත්වය සහ ගැටුම උසිගැන්වීම සඳහා ජනවාර්ගික සහ ආගමික වෙනස්කම් යටතේ මෙම වෛරී කථනයන් හොඳ හේතු සාධකයක් බවට පත්වූ ආකාරය හඳුනාගත හැකි වේ.

ශ්‍රී ලංකාවේ බහුවාර්ගික සංස්කෘතීන් තුළ පවතිනු ලබන ආගමික ඉගැන්වීම් සහ මූලධර්මයන් එම ජන කණ්ඩායම් තුළ අන්තවාදී ගැටීම් ඇතිකරගැනීම සඳහා පෙළෙඹවීමක් ඇති කරනු ලබන්නක් දැකිය හැකිය .නිදසුනක් වශයෙන් 2019 වසරේදී ශ්‍රී ලංකාවේ කිතුනු පල්ලි ඉලක්ක කරගනිමින් සිදු වූ පාස්කු බෝම්බ ප්‍රහාරයේදී එම අන්තවාදී මුස්ලිම් කණ්ඩායම තම ආගමේ මූලික සංස්කෘතික ඉගැන්වීම් බවට පත්වන අල්කුරානයේ ඉගැන්වීම් ඒ සඳහා පාදක කොටගන්නා ලද බවට වාර්තා වේ. එහිදී සහරාන් ඇතුලු පිරිස මෙලෙස මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර වලට ඉදිරිපත් වීම තුළින් මරණින් මතු ජීවිතය තුළ ලබාගත හැකි ලෞකික සැප බලාපොරොත්තුවෙන් මෙම ප්‍රහාර වලට සම්බන්ධ වී ඇති බවට පසුකාලීනව වාර්තාවන්නට විය. එනම් යම් ජනවාර්ගික සංස්කෘතියක් තුළ පවතින්නා වූ ආගමික ඉගැන්වීම් තුළ පුද්ගලයා අපරාධකාරීත්වයට යොමු කරවීමට සමත් වන ආකාරය මේ ඔස්සේ හොඳින් පිළිඹිබු වීය. තවද හින්දු සම්ප්‍රදායන් වල ක්‍රියාත්මක වන බිලි පූජාවන් ආශ්‍රිත අපරාධයන් ශ්‍රී ලංකාවේ හලාවත පිහිටා ඇති මුන්නේශ්වරම් කෝවිල ආශ්‍රයෙන් හඳුනාගත හැකි අතර ඒ සඳහා මොවුන් ප්‍රධාන වශයෙන් ශිව දෙවියන් හා බැඳි සංස්කෘතික ඉගැන්වීම් යොදාගනු ලබන බවක් සඳහන් වේ.අතීතයේදී මේ සඳහා මිනිසුන් යොදාගත්ත ද පවතින නෛතික රාමුව යටතේ අදවන විට මෙම බිලි පූජාවන් සතුන් ඝාතනයන්ට පමණක් සීමා වෙමින් සිදුකරනු ලබන ආකාරය දැකිය හැකිය. මෙය ද බහු ජනවාර්ගික සංස්කෘතීන් තුළ සංස්කෘතික ඉගැන්වීම් පදනම් කොටගෙන පුද්ගලයන් අපරාධකාරීත්වයට යොමුවීමට බලපවත්නා හේතු සාධකයක් වශයෙන් හඳුනාගත හැක.

බහු ජනවාර්ගික සංස්කෘතීන් තුළ පවත්නා ආවේණික සංස්කෘතිමය හර පද්ධතීන් වල අන්තර්ගත සමහර චාරිත්‍ර වාරිත්‍රයන් හේතුවෙන් වර්තමාන සමාජය තුළ සමාජ අපගාමීත්වයක් නිර්මාණය වන බව තොරතුරු වල සඳහන් වේ . මෙම තත්ත්වය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී ඒ සඳහා දිය හැකි හොඳම උදාහරණය බවට පත්වන්නේ (1951) වසරෙ අංක (13) දරණ මුස්ලිම් විවාහ දික්කසාද පනතයි. මෙම පනත තුළ විවාහ වීමේ වයස සහ විවාහ වීම සම්බන්ධයෙන් පවත්නා පුද්ගල කැමැත්ත සම්බන්ධයෙන් කරුණු අන්තර්ගත වේ. මෙම පනත යටතේ යම් අයෙකු මෙම පනතට යටත් වන්නේ නම් එම යටත් වන කාන්තාවන්ට මෙම පනතේ විධි විධාන වලට අනුව විවාහ වීම සඳහා අවම වයසක් නොමැති බවට ගම්‍ය වේ. එනම් මෙම පනත යටතේ වයස අවුරුදු (12) අඩු කාන්තාවක් වුවද පනතේ යටත් කොට පවතින පරිදි අධිකරණ නිලධාරියාගේ නෛතික අවසරය මත පනත යටතේ විවාහ කර

[143] Stewart, J.J. (2014). Muslim-Buddhist Conflict in Contemporary Sri Lanka. *Sage Journals,* https://doi.org/10.1177/0262728014549134

දිය හැකිය[144]. මෙම තත්ත්වය මත මුස්ලිම් සංස්කෘතික බලපෑම මත බාල වයස්කාර දරුවන් විවාහ කර දීමේ අපගාමී තත්ත්වයක් මේ තුළ නිර්මාණය වී තිබෙන බවක් පිළිඹිබු වේ .එමෙන්ම මෙම පනත යටතේ කාන්තාව විවාහ කර දීම තුළ කාන්තාවගේ කැමැත්ත විමසීම යන කාරණය අත්හැර දමා තිබෙන අතර කාන්තාවගේ භාරකරුගේ කැමැත්ත මත එම කාන්තාව අදාළ පුරුෂයාට විවාහ කර දීමේ හැකියාව පවතින බව පිළිඹිබු වනු ලබයි. මෙම කාරණා තුළ මුස්ලිම් සංස්කෘතිය පදනම් කොටගෙන කාන්තාවන් සහ බාල වයස්කාර දරුවන් අවසරයකින් තොරව බලෙන් විවාහ කර දෙනු ලබන තත්ත්වයක් නිර්මාණය වී තිබෙන ආකාරය දැකිය හැකිය. මෙම තත්ත්වය තුළ කාන්තාවගේ කාන්තා අයිතිවාසිකම් මෙන්ම මානව හිමිකම් විභේදනයකට ලක් වේ. එමෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගනිමින් ඇය මුස්ලිම් කාන්තාවක් වීම හේතුවෙන් එයට එරෙහිව ව්‍යුහගත ප්‍රචණ්ඩත්වය නිර්මාණය වන ආකාරය දැකිය හැක. මෙම තත්ත්වය මත මුස්ලිම් ජනවර්ගය තුළ පවත්නා වූ මෙම සංස්කෘතික කාරණා පදනම් කරගනිමින් කාන්තාව සම්බන්ධයෙන් සමාජ අපගාමීත්වයක් නිර්මාණය වේ.

තවදුරටත් ශ්‍රී ලංකාවේ වර්තමාන ව්‍යවස්ථාව මඟින් 1978 කාලයට පෙරාතුව තිබූ සියලුම ලිඛිත හා අලිඛිත නීති විශේෂයෙන්ම ආරක්ෂා කරන අතර, ඒවා ව්‍යවස්ථාවේ ඇති මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය හා නොගැළපුනද එය නොතකා හැර ඇත. එනිසා ව්‍යවස්ථාවේ ඇති වෙනස් ලෙසින් සැළකීම් නොකිරීමේ විධිවිධාන පදනම් කරගනිමින් මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතට සාර්ථකව අභියෝග කිරීමක් සිදුවීමට ඉඩක් නොමැති තරම් ය.

බහු වාර්ගික සංස්කෘතික සමාජ ක්‍රමයක් යටතේ පවතින අනෙකුත් ජනවාර්ගික සංස්කෘතීන් සඳහා භූගෝලීය සීමාවන් තුළ සම තැනක් ලබා නොදීම යන හේතුව පදනම් කොටගෙන මෙම සංස්කෘතීන් අතර සමාජ අපගාමීත්වය නිර්මාණය වීමට ඉවහල් වන සාධකයක් වශයෙන් හඳුනා ගත හැකිය. බොහොමයක් භූගෝලීය සීමාවන් තුළ ව්‍යාප්තව සිටින බහුතර ප්‍රතිශතයක් නියෝජනය කරන ජනවාර්ගික කණ්ඩායම් එම සීමාව තුළ තම ආධිපත්‍ය ව්‍යාප්ත කොටගෙන සිටින තත්ත්වයක් දැකිය හැකිය[145]. මෙම තත්ත්වය සංස්කෘතික සම්පර්කය නිර්මාණය වන අවස්ථාවක් වශයෙන් අපට නිර්වචනය කළ හැකිය. මේ සඳහා දිය හැකි හොඳම උදාහරණයක් ලෙස 2016 වසරේදී ත්‍රිකුණාමලය දමිළ ගම්වාසීන් පිරිසක් විසින් කතෝලික පිරිසකගේ අවමංගල්‍ය චාරිත්‍රයකට බාධා කරමින් එය අදාළ ප්‍රදේශයේ බහුතරයක් ජීවත්වන හින්දු ආගමට අනුව සිදුකර යුතු බවට ඔවුන් යෝජනා කර තිබුණි . එමෙන්ම මේ හා සමාන සිදුවීමක් 2015 වර්ෂයේදී ලුණුගල ප්‍රදේශයේ සිදුවූ අතර එහිදී සිංහල බෞද්ධයින් පිරිසක් කියා සිටියේ අදාළ ග්‍රාමයේ කතෝලික භූමදාන සිංහල බෞද්ධ ක්‍රමයට කළ යුතු බවටය. එනම් එහිදී ඔවුන් ප්‍රකාශ කරන එම භූගෝලීය ප්‍රදේශය තුළ බහුතර ප්‍රතිශතයක් සහිත ජනවර්ගයට අයත් සංස්කෘතික ක්‍රමවේදයට යටත්ව අදාල භූමදාන කටයුතු සිදුකළ යුතු බවටය.

[144] Law net Ministry of Justice' (2016)' Marriage and Divorce Muslim' Retrieved 8th October 2021 from https://www.lawnet.gov.lk/marriage-and-divorce-muslim-4/

[145] Punchihewa, A. G' (2015). Cultural Transformation in Sri Lanka and Its Impact on The Regional Cultural Landscape' *A Journal of Social Science*, *1*(3), 13-27.

භූගෝලීය වශයෙන් සීමාවන්ට යටත්ව මෙලෙස අනෙකුත් සංස්කෘතීන් කෙරෙහි සමතැන ලබා නොදීම යන කාරණාව මත මෙම සන්දර්භය තුළ, භූමදාන චාරිත්‍ර වාරිත්‍රයන් සම්බන්ධයෙන් වන ගැටුම් සහ ආතතීන්, ප්‍රාදේශීය තලයේ නිදන්ගත ප්‍රචණ්ඩත්වයට මූලාශ්‍ර විය හැකි ආකාරය අපට හඳුනා ගත හැක්කේය. මෙලෙස ඇතිවන සංස්කෘතික සම්පර්කය හේතුවෙන් අපගාමී චර්යා රටාවන් ඍජු හෝ වක්‍ර ලෙසට සංස්කෘතිය තුළට ආක්‍රමණය වීම සිදුවන බවක් අපට වටහා ගත හැකිය.

ජනවාර්ගික සංස්කෘතීන් තුළ කුල භේදය මත වෙනස්කොට සැළකීම සහ අසමානතාවය යන පදනම මත අන්තර් සංස්කෘතික බේදයක් ඇතිවීම සිදුවන ආකාරය දැකිය හැකිය. මේ තත්ත්වය මත ඒ ඒ ජනවාර්ගික සංස්කෘතීන් අතර සමාජ අපගාමීත්වය නිර්මාණයට පසුබිම සකස්ව පවතින ආකාරය හඳුනා ගත හැක්කේය. හින්දු සංස්කෘතිය තුළ මෙම කුල භේදය තදින්ම ක්‍රියාත්මක වන ආකාරය දැකිය හැකි අතර ඒ අනුව හින්දු කෝවිල් වල පවත්වන බොහෝමයක් ආගමික කටයුතු වලදී හින්දු භක්තිකයන් අතරින් අඩු කුලේ පිරිස් යැයි සඳහන් කරන අයට හින්දු කොවිල් හී අවකාශය සහ භූමිකාව සීමා කිරීමකට ලක්ව ඇති ආකාරය හඳුනා ගත හැකිවිය. ඒ අනුව ඉහළ කුලයේ පිරිස් වෙත පමණක් කොවිල් හි අධිකාරීත්වය හිමිවීම සහ අඩුකුලයේ හින්දු භක්තිකයන් හට කෝවිල් භූමියට ප්‍රවේශ වීමේ ඉඩකඩ ඇහිරීම නිසා මෙම තත්ත්වය හින්දු සංස්කෘතිය පදනම් කොටගෙන ඔවුනොවුන් අතරම අන්තර් සංස්කෘතික ගැටුම් ඇතිවීම දක්වා ව්‍යාප්තව පවතින ආකාරය දැකිය හැකිය. මෙම තත්ත්වයේ ප්‍රතිඵල ලෙස අද වන විට අඩුකුලේ පිරිස් වෙනුවෙන්ම නිර්මාණය වූ හින්දු කෝවිල් අපට හඳුනාගත හැක[146]. මෙම තත්ත්වය හින්දු සංස්කෘතියට පමණක් ආවේණික වූ තත්ත්වයක් නොවන අතර මෙය බෞද්ධ සමාජය තුළද හඳුනාගත හැකිය. ඒ අනුව බොදු ගොවි කුලය, වරා කුලය, බෙර කුලය, රොඩී කුලය ආදී වශයෙන් වූ කුලයන්ද පවතින අතර එම කුල අතර පවත්නා වූ ඝට්ටනය හේතුවෙන් ඒ ඒ කුලයන් අතර ඇතිවන අපගාමී චර්යාවන් හඳුනා ගත හැකිය. එමෙන්ම මුස්ලිම් සමාජය තුළ පවත්නා ෂියා සහ සුන්නි විභේදනය තුළද අන්තර් සංස්කෘතිමය ඝට්ටනයක් 20 වන සියවසේ සිට හඳුනාගත හැකි වේ. අද ලොව පුරා සිටින දළ වශයෙන් බිලියන 1.6 ක මුස්ලිම් ජනතාවගෙන් සියයට 85 ක් පමණ සුන්නි ජාතිකයන් වන අතර සියයට 15 ක් ෂියා ජාතිකයින් ය. මෙම සංස්කෘතිමය ගැටීම 21 වන සියවස තුළද තවදුරටත් අපට හඳුනා ගත හැකි තත්ත්වයක් බවට පත් වේ. කුලභේදය සහ අසමානතාවය හේතුවෙන් මේ ආකාරයේ සංස්කෘතිමය ගැටීමක් ප්‍රභවය වන බවක් හඳුනා ගත හැකිය.

බහු ජනවාර්ගික සංස්කෘතීන් අතර සංස්කෘතික පදනමක් යටතේ අපරාධ චර්යාවන් නිර්මාණය වීම සඳහා භූගෝලීය වශයෙන් එම ජනවාර්ගික සංස්කෘතීන්ට අයත් භූමි සීමාවන් සම්බන්ධයෙන් පැන නැගෙන ගැටළුකාරී තත්ත්වයන් බලපෑම් කරනු ලබන ආකාරය ප්‍රායෝගික තලය තුළ නිර්මිතය[147]. නිදසුනක් වශයෙන් ලාංකේය සමාජ ක්‍රමය දෙස අවධානය යොමු කිරීමේදී මෙරට බහු ජනවාර්ගික සමාජය තුළ ඒ ඒ ජනවර්ගයන්ට අයත් පූජනීය සහ පුරාවිද්‍යාත්මක භූමීන් සංස්කෘතිමය වශයෙන් සෙසු ජනවර්ගයන් හා ගැටුම් ඇති වීම සඳහා බලපාන සාධකයක් බවට පත් වූ ආකාරය හඳුනා ගත

[146] Sankaran, S., Sekerdej, M., Hecker, U. (2017)' The Role of Indian Caste Identity and Caste Inconsistent Norms on Status Representation. *Front Psychol Journal,8.* 10.3389/fpsyg.2017.00487

[147] Punchihewa, A. G' (2015). Cultural Transformation in Sri Lanka and Its Impact On The Regional Cultural Landscape' *A Journal of Social Science*, *1*(3), 13-27.

හැකිය. බෞද්ධ භික්ෂූන් විසින් ස්ථිරව ප්‍රකාශ කොට සිටියේ, දීඝවාපිය වැනි පූජනීය භූමි විශේෂයෙන්ම බෞද්ධයින්ට අයත් වන බවටයි. එමෙන්ම දඹුල්ල පන්සලට ආසන්නයේ පිහිටා තිබූ මස්ජිද්-උල්-කයිරියා පල්ලියට එරෙහිව වූ මැර ප්‍රහාරයන් (සහ පසුව භද්‍රකාලි කෝවිල බිඳ හෙලීම) සම්බන්ධයේදීද මෙම "පූජනීය" තත්ත්වය අවධාරණය කෙරිණි. 1990 මෙම ඊනියා පූජනීය ස්ථානයන්හි ඇති මුස්ලිම් පුද පූජා ස්ථානයන්ට එරෙහිව සිදුවූ ප්‍රමුඛ සිදුවීමක් වන අතර එසේ වුවත් මෙම ස්ථානයන් සම්බන්ධයෙන් වන නොවිසඳුණු ආතතීන්, අනාගතයේදී සංස්කෘතිමය වශයෙන් ප්‍රචණ්ඩ ක්‍රියා දක්වා ඉහළ යැමේ අවදානම නොනැසී පවතින බව පිළිඹිබු වන බවක් පසක් වේ.

බහුජනවාර්ගික සංස්කෘතින්හි ආගම් හි ආගමික සභාවන්හි නායකයන් විසින් තම ආගමීකරණය සඳහා වෙනත් ආගම් වල සාමාජිකයින් තමා වෙත ආරෝපණය කරගැනීමේ ප්‍රතිපත්තිය හේතු කොටගෙන සංස්කෘතිමය වශයෙන් මෙම විවිධ ආගමික සංස්කෘතීන් අතර මත්භේදයක් ගොඩනැගී තිබෙන ආකාරය පවතින අතර මෙමගින් අන්තර් සහ අභ්‍යන්තර ආගමික ගැටලු පුද්ගලික, සාමාජයීය සහ දේශපාලනික වශයෙන් අහිතකර ප්‍රතිඵලයන් සමාජය තුළ ප්‍රභවය වන ආකාරය හඳුනා ගත හැකිවිය. විශේෂයෙන්ම මන්නාරම, අම්පාර සහ මාතර දිස්ත්‍රික්කයන්හි ධර්ම ප්‍රචාරයේ යෙදෙන කතෝලික පල්ලි හඳුනාගත හැක. යාපනයේ "ඉවැන්ජලික පල්ලි" විසින් සදාචාර සම්පන්න නොවන ආගම්වලට හැරවීම මඟින් දමිළ,කතෝලික සහ හින්දු ප්‍රජාවන් අතර නොසන්සුන්කාරී වාතාවරණයක් ඇති කර තිබෙන තත්ත්වයක් හඳුනා ගත හැකිය. මෙහිදී හින්දු ආගමිකයන් සඳහන් කරන ආකාරයට සිය ප්‍රජා සාමාජිකයන් ඉතාමත් පහසුවෙන් කතෝලික නොවන ඉවැන්ජලික කණ්ඩායම් විසින් ක්‍රිස්තියානි ආගම වෙත හරවා ගැනීම සම්බන්ධයෙන් කැමැත්තක් නොදක්වන වාතාවරණයක් පවතින බවටය. මෙම තත්වය සංස්කෘතිමය වශයෙන් හින්දු ආගමික සහ ක්‍රිස්තියානි ආගමික සංස්කෘතීන් මත ගැටුමක් ඇති වීම් කෙරෙහි හොඳ මාර්ගයක් බවට පත්විය. මෙලෙස කතෝලික ආගම කෙරෙහි විශ්වාසය තැබූ හින්දු භක්තිකයන්ගේ නිදහසට කාරණාව බවට පත්වූයේ හින්දු ආගම තුළ පවත්නා කුලය මත පදනම්ව සිදුවන වෙනස්කම්ය. මෙම වෙනස්කම් සම්බන්ධයෙන් පෙරාතුව ද අප ඉහතින් සාකච්ඡාවට ලක් කරන ලදී. අධ්‍යාපනයේ ඉහළ මට්ටමක් ලබා ගැනීම, මත පදනම්ව බොහොමයක් හින්දු භක්තිකයන් ක්‍රිස්තියානී දහමට නැඹුරු වූ බවක් හඳුනා ගත හැකි අතරම වර්තාමනය තුළ මෙම ක්‍රිස්තියානි ආගමේ දෙවියන්ගේ ප්‍රාතිහාරයන් මඟින් රෝග සුව කිරීම, පෙන්තකොස්ත සභාවන් විසින් ලබාදෙන මූල්‍යාධාර ලබා ගැනීමේ පදනම මත බොහෝමයක් හින්දු භක්තිකයින් කතෝලික දහමට පර්වර්තනය වීමට බලපාන ලද හේතු වශයෙන් සඳහන් කරනු ලබයි. මේ ආකාරයේ හේතුන් මත හින්දු භක්තිකයන් කතෝලික දහමට යොමු වූ නමුත් එය සමාජීය වශයෙන් අන්‍යාගමීකරණය ලෙස හඳුනා ගැනීම මත මෙම ආගමික සංස්කෘතීන් අතර ගැටීමක් නිර්මාණය වීමට එය බලපානු ලබන ආකාරය විද්‍යාමාන කරගත හැකිය.

ශ්‍රී ලංකාවේ ජනවාර්ගිකයන් අතර ඇති වූ සංස්කෘතික පරස්පරතාවය ඇති වීම සඳහා තවත් හේතුවක් වශයෙන් ජාතික මට්ටමකදී භාෂාමය ප්‍රතිපත්තිය යටතේ භාෂාමය ජාතිකවාදයක් ලෙස සිංහල භාෂා ප්‍රතිපත්තිය හේතු සාධකයක් වූ ආකාරය අපට හඳුනා ගත හැකිය[148]. මෙම ප්‍රතිපත්තිය ලාංකේය සමාජ

[148] Thurairajah, K. (2019). Who are we without the war? The evolution of the Tamil ethnic identity in post-conflict Sri Lanka. *Sage journal 20*(3), 564-586. doi.org/10.1177/1468796819846960

ක්‍රමය තුළ පෙර නොවූ ආකාරයේ සංස්කෘතික බිඳ වැටීමක් ඇතිවීම කෙරෙහි හේතු සාධක වන්නට විය. 1950 දශකය පමණ වන විට එය තවදුරටත් පුළුල් වූ අතර එය මෙරට දමිළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය සහ මෙරට හමුදා අතර ජනවාර්ගික සන්නද්ධ ගැටුමක් ඇති වීමට බලපානු ලැබූ සංස්කෘතික හේතු සාධකයක් වශයෙන් හඳුනා ගත හැකිය. මෙලෙස මූල බීජය බවට පත් වූ මෙම සංස්කෘතික පරස්පරතාවය තවදුරටත් වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම සට්ටනය මෙරට තුල 30 වසරක යුද්ධයක් ඇතිවීම සඳහා මංපෙත් විවර කළ බවක් අප කාගේත් මතකයේ පවතින කරුණකි. යථෝක්ත කරුණු අධ්‍යයනය කිරීමේදී ලාංකීය සමාජය බහු සංස්කෘතික මෙන්ම බහු ජනවාර්ගික පදනමක් සහිත සමාජ ක්‍රමයක් වශයෙන් හඳුනා ගත හැක. මෙම විවිධත්වය මත පදනම්ව මෙරට තුළ එකිනෙකට වෙනස් වූ සංස්කෘතික මට්ටම් සමාජය තුළ ව්‍යාප්තව පවතිනු ලබයි. මෙම සංස්කෘතික විවිධත්වය ලාංකීය සමාජය තුළ පැළඳි ආභරණයක් වශයෙන් හඳුනා ගත හැකි වූ නමුත් මෙම විවිධත්වය මත පදනම්ව මෙරට සමාජය තුළ සංස්කෘතිකමය වශයෙන් සට්ටනයන් නිර්මාණය වීමට මෙම තත්ත්වය හේතුවක් වී ඇති බවක් කාලීන ලාංකීය සමාජය දෙස අවධානය යොමු කිරීමේදී පසක් වේ.

සංස්කෘතීන් අතර පවත්නා වෛරී කථනයන්, ආගමික ඉගැන්වීම් සහ මූලධර්මයන්, සංස්කෘතික හර පද්ධතීන්, ආයතනගත වර්ගවාදය, සංස්කෘතීන් අතර පවත්නා කුල භේදය, අන්‍යාගමීකරණය හා භාෂාමය ප්‍රතිපත්තීන් ආදී හේතු පදනම් කොටගෙන මෙරට බහු ජානවාර්ගික සංස්කෘතිය තුළ සංස්කෘතිමය වශයෙන් සට්ටනයක් ඇතිවීම කෙරෙහි මේ හේතු සාධක ඍජු බලපෑමක් කර තිබෙන ආකාරය විද්‍යාමාන වේ. මෙම තත්ත්වය මත මෙරට සමාජ ක්‍රමය තුළ අනෝමීයත්වය නිර්මාණය වීමක් සිදුවන අතර එම තත්ත්වය කරණ කොටගෙන පුද්ගලයන් සමාජ අපගාමී චර්යාවන් කෙරෙහි නැඹුරු වීමක් ඇති බවක් ඉහත සඳහන් කාලීන සමාජ සිද්ධීන් අධ්‍යයනය කිරිමේදී හොඳින් පසක් කරගත හැකිය.

මේ අනුව සංස්කෘතික සාධක පදනම් කොටගෙන ඇතිවන්නා වූ මෙම සමාජ අපගාමී තත්ත්වයන් හේතුවෙන් මෙරට සමාජ පර්යාය බිඳ වැටීමකට ලක්වන ආකාරය හඳුනා ගත හැක. මෙම සංස්කෘතික විභේදනය මත බහු ජනවාර්ගික සංස්කෘතියක් වශයෙන් සමාජ සංවර්ධනය සහ සංස්කෘතික සංවර්ධනය යන දෙඅංශය තුළින්ම ගෝලීයකරණයත් සමඟ දියුණුව කරා ගමන් ගන්නා අනෙකුත් විදේශීය සංස්කෘතීන් මෙන් සංවර්ධනය කරා ගමන් කිරීමට ඇති ඉඩ ප්‍රස්ථාව අහිමි වී ගොස් තිබෙන ආකාරය හඳුනා ගත හැකිය.

නමුත් බහුජනවාර්ගික සංස්කෘතීන් වශයෙන් මෙරට සමාජය තුළ වාසය කරන පිරිස් සංස්කෘතික සමෝධානයකින් යුතුව එනම් සමාජයේ වෙසෙන සියලු සංස්කෘතීන් එකිනෙක වෙනස්කම් හඳුනා ගනිමින් අනෙකුත් සංස්කෘතීන් වලට ගෞරවයෙන් සැළකීම යන පදනම මත ක්‍රියා කිරීමට යොමුවීමෙන් මෙම තත්වය අවම කරගත හැකි බව අපට පසක් කරගත හැක. එනම් සියලු ජනවර්ගයන් මානව කේන්ද්‍රණවාදී අදහස් වලින් තොරව සංස්කෘතීන් අතර ගැටීමෙන් තොරව සංස්කෘතික සමෝධානයක් ඇතිකර ගැනීමේ හැකියාව පවතින බවක් හඳුනාගත හැක. මේ ආකාරයේ සංස්කෘතික සමෝධානයකින් යුතුව ක්‍රියා කිරීම තුළ කාලීන වශයෙන් සමාජය තුළ ඇති වන්නා වු ජාතිවාදී ආදී විශාල සමාජ අපගාමී ක්‍රියාවන්ගෙන් තොර සමාජමය පරිසරයක් බිහිකිරීමේ හැකියාව මේ ඔස්සේ

අත්පත් කරගත හැකි වේ. අනෝමීයත්වයෙන් තොර යහපත් සමාජ වටපිටාවක් මෙරට සමාජ ක්‍රමය තුළ අවසාන වශයෙන් බිහිකර හැකි බව මෙමඟින් නිගමනය කර ගත හැකිය .

# 16. The Victimization Nature of Social Media Culture in Sri Lanka

**A.A.H.N. Amarathunga**

**N.G.A.S. Napawala**

**G.N.K. Madushanka**

## Introduction

Social media have transformed and influenced the personal life of every individual in the globe as an essential need which is a part of the living art of humans as a social being. Social media today has succeeded in influencing and invading the lives of all individuals, despite the age, gender, and social status from generation to generation with technological advancement. Media is recognized as an institute of socialization; in contemporary society it stands as a main influencer of individuals to socialize themselves by sharing and expressing themselves freely. The intervention of the internet has allowed individuals to even expand their boundaries beyond physical geological limitations[149]. Thus, automatically a culture has been formulated within this virtual platform to share and adopt a variety of cultures from all over the globe as an impact of globalization and technological advancement. This nature can even be determined as a complex way of socializing. There is an impressive growth in social media users in Sri Lanka. However, there are pros and cons in using social media as well. In fact, the positivity emitted through social media has turned into a devastating matter with the rise of criminal tendencies influencing the society by the culture the social media creates within its virtual environment. On this perspective, this article is determined to identify the victimization nature of individuals within Sri Lankan social media culture.

[149] Thuseethan, S., & Vasanthapriyan, S. (2015). Social Media as a New Trend in Sri Lankan Digital Journalism: A Surveillance. *Asian Social Science*, *11*(10). doi: 10.5539/ass.v11n10p86

**Social media culture**

Social media mainly functions as a form of communication. It transfers information in a very effective manner and functions as a platform for a broadcast channel or a sales and marketing tool. Instead of this factor social media is all about conversations, community, connecting with the audience and building relationships with communities around the globe[150]. In focusing on Sri Lankan growth of social media users, statistical data of digital 2021 (https://datareportal.com/reports/digital-2021-sri-lanka) have revealed that, in January 2021, there were 7.90 million social media users in Sri Lanka. Thus, 36.8% of the total population in Sri Lanka are social media users. The report shows that there is a 23% increase in social media users compared to 2020 from data of 2021 data. Among multiple social media platforms, the global stats website shows that in Sri Lanka there are 56.82% Facebook users and 17.9% YouTube users, 15.9% twitter users, 1.16% Instagram, users that represent the most commonly used social media platforms in Sri Lanka. These statistics can even identify the predictable growth of the younger cultural group in the future. Adaptation to social media use is growing rapidly in Sri Lanka more than ever, especially as an impact of social distancing due to Covid-19 pandemic crisis. It is estimated that on average an individual in Sri Lanka spends about 34 minutes a day on any social media[151].

In understanding the cultural nature of social media, online social networks allow people to share their own posts about their experiences that include hobbies, vacations, events, family life, personal data, their favorite foods, or sports etc. Further their own opinions of society, politics, religion and even a platform of accepting and questioning existing cultural values of their own or others which will be visible to their friends and public. In the book “the presentation of self in everyday life”, written by Goffman In 1956 have introduced a theory known as self- presentation theory, suggesting that people have the desire to control the impressions that other people form about them. Therefore, social media can be recognized as a reflection of preferred lifestyles of individual users and collectively forms the “culture” of a society unique to him or her. It is mainly dependent on shared preferences which are common to many by the members of a society. For example, in many user generated content creation in social media are publishing as storytelling, vlogs about lifestyles included with life routings

[150]Sekhara Rao, D., Sri Lakshmi, J., Sahyaja, C., & Dimple, G. (2018). A Study on Marketing Strategies using Social Media in Facebook, Youtube, Pinterest. *International Journal Of Engineering & Technology, 7*(2.20), 114. doi: 10.14419/ijet.v7i2.20.12186

[151] Weerasendera R (214, The impact of social media in Sri Lanka: issues and challenges in mental health

such as "what we eat, what we wear, or what we do," are important and popular topics in almost all social media platforms. On this basis social media is a process of "culture sharing" which means the exchanges or mutual exposures of preferred lifestyles via social ties between users from different cultural backgrounds[152]. For example, many users on Facebook have friends in other countries, who would post about their own local cuisines. The users will see these posts and photographs and may become interested in trying it[153]. Social media is not only allowing you to hear what people say about you, but also enables you to respond. This process is known as social influence.

According to Goffman[154], the Social actor in many areas of life will take on an already established role, with pre-existing front and props as well as the cÈtume he would wear in front of a specific audience. The actor's main goal is to keep coherent and adjust to the different settings offered to him. This is done mainly through interaction with other actors. To a certain extent, this imagery bridges structure and agency, enabling each while saying that structure and agency can limit each other. In brief, Goffman believes that when an individual comes in contact with other people, that individual will attempt to control or guide the impression that others might make of him by changing or fixing his or her setting, appearance, and manner.

**Victimization nature**

More than ever this vast expansion of culture that is formulating within social media is dynamic in its virtual nature in transferring information towards the society. For example, timely there are specific individuals, acts and any other trending that goes viral in social media. The nature of social media always stimulates users to discover new ways to differentiate themselves by communicating with each other freely and openly. Among the users in the younger generation have greatly been affected by the influences of social media. Many users today show a great addiction, a competition of perfectionism and influences from those who share their culture and even their negative ideological aspects once shared may influence the similar-minded individual to adopt[155]. Thus, naturally as a process of socialization, individuals are intentionally

[152] Cheng, E. (2015). Knowledge Sharing for Creating School Intellectual Capital. *Procedia - Social And Behavioral Sciences*, *191*, 1455-1459. doi: 10.1016/j.sbspro.2015.04.307
[153] Serafinelli, E. (2017). Analysis of Photo Sharing and Visual Social Relationships: Instagram as a case study. *Photographies*, *10*(1), 91-111. doi: 10.1080/17540763.2016.1258657
[154] Goffman E. (1956), The Presentation of Self in Everyday Life
[155] Wijekoon W.A.S (2017). Comparative analysis on social media and its positive and negative impact on Sri Lankan culture, International Journal of Research of Economics and Social Sciences

or unintentionally interested in detecting and comparing general lifestyles and preferences which are sometimes not specified by users. The virtual nature of social media users has removed from all hesitations and fear of exposing one's own identity as well. Social media developers are also in a unique competition on monetary basis to increase their viewers, followers etc. To expand their popularity as well[156]. As a result, new avenues to engage users are always determined. The flexibility it consists of could dangerously affect society. For example, many user's social media by forming fake accounts, sometimes even maintaining multiple fake accounts for many purposes. The anonymous nature of social media could be devastating when the vulnerable parties are not aware of the cultural nature of social media they are involved in.

In understanding this nature of social media, the individual is interacting with and trying to form and obtain information about the other individual. Which means that individuals are highly concerned about what the other individuals/people. It may only take seconds to spread a message on social media. What is questionable of social media is who shares the contents and are they responsible for the reliability of the sources. However, as a free platform that allows for anyone to comment and maintain their liberal opinions the hatred shared targeting an individual or a community could be threatful. The impact of such misinformation is undoubtedly a tragedy for the victim as a result many among the victims of social media are enabling society as the impacts outcomes from social media are spreading faster and virally. The damage caused to the victim could be unbreakable as the image of the wrongly accused victims are unchangeable. And that is why when there were several incidents of leaking nude photos and videos of people, and those victims tend to commit victimless crimes mainly suicide. This occurs mainly because they think they cannot face the society as the society has a bad impression toward them. In studying the case of a pornographic video which was widely shared on social media near the Pahanthudawa waterfall in Balangoda, a young couple was victimized even beyond national levels. According to the research, the true perpetrators of the crime were even created more than 50 identical pornographic recordings in a variety of attractive locations throughout the country. It was also alleged that such videos were created for the purpose of monetizing pornographic websites. The victims were greatly affected. It is a well-known fact that a couple was arrested by the police for accepting a misleading video using

[156] Wojdan, W., Wdowiak, K., Witas, A., Drogoń, J., & Brakowiecki, W. (2021). The impact of social media on the lifestyle of young people. *Polish Journal Of Public Health*, *130*(1), 8-13. doi: 10.2478/pjph-2020-0003

their identity. Thereby can determine that the victimization nature of individuals and communities in social media cannot be simplified.

Nevertheless, this victimization process can be seen in another theoretical perspective too. As social media has the power to splash any news, whether fake or real, in just a few seconds it can victimize a person more widely in a short time period. With this situation it opens up an easy path to 'label' someone with a particular incident. For example, a 17 year old schoolboy was arrested over the homicide of Seya Sadewmi in Kotadeniyawa. The police arrested the boy because his laptop had blue movies. Later the police announced that the boy was innocent and unrelated to the victimization of the deceased. However, until the police completed the investigations on the boy, all social media splashed the news by emphasizing that he has all the liabilities which means labelling that person as the criminal. The social media have spread the news by revealing his personal information and have already accused. The defamation and shame experienced by the boy was heavily damaged. It has created social barriers when coping with society. This pathetic condition of social media victims is common. This situation hence, emphasizes the irresponsible behavior of social media use. As a result of such victimization nature from social media, now a days there is a trend of suicide cases[157]. Such victimizations make it clear that this social media has its own unique cultural nature that goes beyond social values and norm systems which have been developed by the society through generational efforts. Due to this labelling, even though he was innocent he could not overcome the situation and prove his innocence. Accordingly, the labelling theory which provides a viewpoint that the behavior of human beings is influenced significantly by the way other members in society label them can illuminate this situation. Lifestyle theory is another significant theory that can elaborate the victimization process through social media. According to that, individuals' lifestyles can impact greatly toward their own victimization. As today's individuals post each and every incident that happens in their lives, it can open up a way to become victimized through social media.

In understanding, the victimization nature emits through social media mainly occurs due to violation of social media ethics and degrading of social values. Hence, the ethics in social media culture is quite controversial nowadays than ever. Social media operates on a currency of shares. The more we share, the popularity and value of the content increases and that is what

[157] Weerasendera R (214, The impact of social media in Sri Lanka: issues and challenges in mental health

we call going viral. There is no filtering of the content of violence, harassment and so on for other malicious behavior. In observing Easter Sunday bomb attack in 2019 in Sri Lanka, the government have banned social media and it could have prevented an ethnic conflict due to sharing of misinformation which forming an environment by sharing aggression towards Muslim community as a whole. However, Facebook and other platforms already have several measures in place to ban content that includes abusive language, hate speech and nudity. These aspects are not the only problematic areas of social content, however. Further, language nuances are not taken into consideration by international social media giants. Not being able to grasp these linguistic nuances or not investing in the right people to work as watchdogs within these leading social media organizations has been a massive failing[158]. In the midst of all the good that social media channels do, there is much to dialogue in terms of its failings. Further, in a time of crisis, with no proper measures in place by these organizations, it falls on the public and content creators within the country to operate with some ethical guidelines in place.

As a positive source through social media, it may allow individuals to embrace their lives freely and to discover new knowledge, character building. Timely, social media is always encouraged by technological advancement with the demand of its users. However, it is a crucial factor to take precautions to identify and minimize the potential victimization of consequences that may occur due to misuse of social media platforms. Further, there is a lack of attention towards the victim of a social media offence. The physical injuries can be healed but the psychological harm cannot be fixed easily. The victimization nature from cultural influences of social media is there by a complex matter the necessary authorities must pay attention to. What phenomenon of social media is referring to above cases is people are more intent to criticize. Thus, the cultural nature of social media is mainly reluctant to develop and promote criticism and it is also the base where the communities in social media are connected with. The negative aspects shared through these social media platforms intentionally and unintentionally may psychologically allow people to adapt towards such negativity. As a result, knowingly or unknowingly their intentions may turn to criticism of social activities in their surroundings.

Fortunately or unfortunately, we cannot pass the ball to the government directly by saying that they have the responsibility to make laws and regulations toward social media culture. Because every social media user has to take individual responsibility toward their victimizations. 'Privacy' means privacy that directly lays on people's desires. When sharing information

[158] Maneesha (2019), The ethics of social sharing, Sri Lanka Press Institute

online it is important for people to realize the permanence of what they type or post. Once information goes on the internet, through social networking etc. it is difficult, if not impossible to remove. In some instances, the information may even be captured via screenshots and used on blogs or news sites. Nevertheless, it is important that the Sri Lankan government should enhance laws and regulations toward the usage of social media and should have a continuous assessment on it. Because the victimization via social media can create a broad pathetic disaster to an individual's social and mental wellbeing, crimes such as cyber bullying, unhealthy blogs, blackmailing, sexual harassment, etc. Accordingly, policy makers can focus on developing a secure platform by recognizing above upcoming trends in the field of social media and then the young generation and most users will absorb the positive aspects of these media before they use it in negative aspects. Considering all these theoretical factors it is essential to have a proper ethical system or rules and regulations toward whatever that can create victims through these social media.

# 17. COVID 19 වසංගතයත් සමඟ වෙනස් වූ සංස්කෘතික පරිසරයෙහි අපරාධ වල නව්‍යතාවය

**අයි. ඩී. අයි. සෙව්වන්දි**

**වී. ජී. එම්. සෙව්වන්දි**

**ඒ. එම්. ඒ. ප්‍රසාදනී**

**''ඔබ කතා කරන්නේ බල්ලන් ගැනද (සතුන්) ගැනද, එසේ නම් ඔබට සංස්කෘතිය ගැන කතා කළ නොහැක. නමුත් ඔබ කතා කරන්නේ මිනිසුන් ගැනද, එසේ නම් ඔබට අනිවාර්යෙන්ම සංස්කෘතිය පිළිබඳව කතා කිරීමට සිදු වනු ඇත.''**

යනුවෙන් මානව සමාජය හා සංස්කෘතිය අතර පවත්නා අවියෝජනීය බැඳීම බර්නාර්ඩ් රොසන් බර්ග් සහ ලෙවිස් කොසර් විසින් රචිත "sociological theory" කෘතියේ පෙන්වා දෙනු ලබයි.

චීනයේ හුබෙයි පළාතේ අගනුවර වූ වූහාන් හිදී මුලින්ම හදුනාගත් කොරෝනා වයිරස් රෝගය 2019 වර්ෂයේ අග භාගයේ සිට ලොවපුරා ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් වර්තමානයේ (12.10.2021) පුද්ගල ජනජීවිතය හා බද්ධ වෙමින් සමාජගත වී ඇත. නොසිතූ විරූ ලෙස ත්‍රාසජනක චිත්‍රපටයක වැනි බිහිසුණු අත්දැකීම් ගොන්නක් මිනිස් ජීවිත වල ප්‍රායෝගික කිරීමට තරම් කොරෝනා වෛරසය සමත් වී තිබේ. වෛරසයේ ව්‍යාප්තියත් සමඟම ලොව පුරා සමාජයන් හා සංස්කෘතීන් සුපුරුදු ජීවන විලාසතාවන්ගෙන් වෙන් වී නවතම ආකාරයේ විලාසිතාවකට වෛරසයේ බලහත්කාරයෙන් හුරු වී ඇති ආකාරයක් හඳුනා ගැනීමට හැකිය.

වෛරසය සමාජගත වීමත් සමඟ සමාජය තුළට නව අංග ගලා ඒමක් සිදු වූ අතර මතු වූ අභියෝගකාරී තත්ත්වයට මුහුණ දෙමින් පුද්ගල ජන ජීවිතය පවත්වාගෙන යනු පිණිස,

- රට අගුළු දැමීම.
- සංචරණ සීමා පැනවීම.
- පාසල්, අධ්‍යාපන ආයතන, රැකියා ස්ථාන වසා දැමීම.
- අන්තර්ජාලය හරහා දරුවන්ට අධ්‍යාපනය ලබා දීම සහ නිවසේ සිට වැඩ ක්‍රම, හඳුන්වා දීම.
- පොතපත වෙනුවට තාක්ෂණික උපකරණ පුද්ගල ජීවිතයට සමීප කිරීම.
- රැකියා කප්පාදුව.
- සනීපාරක්ෂක ක්‍රමවේද කෙරේ දැඩි අවධානය දීම. (මාස්ක් භාවිතය, මුහුණු ආවරණ. විෂබීජ නාශක දියර භාවිතය, මීටරේ පරතරය)
- වියැකෙමින් පැවති හෙළ සිරිත් විරිත්,ආයුර්වේද ක්‍රම, චාරිත්‍රවාරිත්‍ර යළි කරළියට පැමිණීම හා නව පරපුර ඒ හා බැඳීම. (අතට අත දීම වෙනුවට ආයුබෝවන් කියා ආචාර කිරීම, කසාය)

- ඉලෙක්ට්‍රොනික සමාජය හෙවත් ගෝලීය සමාජය තුළ ජංගම දුරකථන, පරිගණක, අන්තර්ජාලය, සයිබර් අවකාශය තුළ පුද්ගල ජීවිත ගොඩ නැගීම.
- හුදකලා බවට, ආත්මාර්ථකාමීත්වයට මුල් තැන හිමි වීම.
- විවිධ ඇබ්බැහිතාවයන් වලට ගොදුරු වීම ( වීඩියෝ ක්‍රීඩා, මත්ද්‍රව්‍ය, සූදුව, අසභ්‍ය වීඩියෝ , චිත්‍රපට නැරඹීම , තාක්ෂණික ඇබ්බැහිය).

ආදී වශයෙන් අලුත් වූ සමාජ සංස්කෘතියක් තුළ පුද්ගල ජීවිතය වෙනස්ම වූ දිශානතියක් කරා ගමන් කරන්නට විය.

විල්බට් ඊ. මුරේ විසින් කාලය හා සමඟ මානව චර්යාවන් හා ඊට අනුබද්ධ සංස්කෘතීන් සැළකිය යුතු අයුරින් වෙනස් වීම ( Order And Change ; Essay In Comparative Sociology ) 'සමාජ වෙනස්වීම' වශයෙන් හඳුන්වා දී ඇත. මේ අනුව අපට COVID 19 වසංගතයත් සමඟ වෙනස් වූ සංස්කෘතික පරිසරයක් හඳුනා ගැනීමට හැකි වනවා සේම මේ නව සංස්කෘතිය නිසාවෙන්ම ඇති වූ අපරාධවල නව්‍යතාවයක් හඳුනා ගැනීමට හැකි වේ. එහිදී වසංගතයත් සමඟ වෙනස් වූ සංස්කෘතික පරිසරය මූලික සාධක තුනක් යටතේ හඳුනා ගැනීමට හැකිය. එනම්, සමාජීය සාදක, මානසික සාධක, ආර්ථික සාදක යනුවෙනි.

- **සමාජීය සාධක**

**සමාජ සම්බන්ධතා බිඳ වැටීම**

වසංගතය පැතිරීම වළක්වාලීම සඳහා සෞඛ්‍යාරක්ෂිත මූලික ක්‍රමවේදයක් වූයේ සමාජ දුරස්ථභාවය ඇති කිරීමයි. උපතින්ම සමාජීය සත්ත්වයෙකු වූ මිනිසාට මෙහි බලපෑම අයහපත් ප්‍රතිඵල ගෙන දුන් බව පෙනේ. පුද්ගලයින් එකිනෙකාට උපකාර කරගැනීමට බිය වන්නට, මැලි වන්නට වූ අතර අන්‍යෝන්‍ය සබඳතා වැඩි වශයෙන් දක්නට ලැබෙන ග්‍රාමීය ප්‍රදේශයන් වල පවා වෙනස් වූ සමාජ පරිසර සාධක මත එකිනෙකාට උපකාර කරගැනීමේ සංස්කෘතික පසුබිම වෙනස් වන්නට විය. එකිනෙකා කෙරෙහි අවිශ්වාස සහගතව බැලීමටත් මුල් අවස්ථාවේදී රෝග වැළඳුණු පුද්ගලයින් සමාජය තුළ කොන් කිරීමකට ලක් කිරීමත් දක්නට ලැබුණි. මේ හේතුවෙන් පුද්ගලයා සමාජය තුළ හුදකලා වන්නට විය. මෙම කොන්කිරීම් වලට බියෙන් පුද්ගලයින් රෝගය සඟවා ගෙන නිවාස තුළටම වී සිටීම නිසා කිසිඳු ප්‍රතිකාරයක් නොමැතිව නිවෙස් තුළම මිය යාමේ සිදුවීම් මුල්කාලීනව වාර්තා විය. මෙලෙස පුද්ගලයා විෂයෙහි පරාර්ථකාමීත්වය පසෙකලා ආත්මාර්ථකාමී හැඟීම් වර්ධනය වීම වසංගත තත්ත්වයෙන් ඇති වූ සමාජ විසංධානකාරීත්වයේ ප්‍රතිඵල අතර දක්නට ලැබුණි. එමිල් ඩුර්ක්හයිම්ට අනුව ඇති වූ සමාජ විසංවිධානකාරීත්වය තුළ ධර්මතා සහ අගනාකම් වලට වටිනාකමක් නොලැබීම නිසා අනෝමියත්වයක් ඉස්මතු වී අපරාධකාරී වාතාවරණයක් ඇති වීම හඳුනා ගැනීමට හැකිය.

සංචරණ සීමාවන් හේතුවෙන් පුද්ගලයා තාක්ෂණික උපකරණ මඟින් සමාජ සම්න්ධතාවක් ගොඩනගා ගැනීමට උත්සහ කරනු ලබයි. මෙලෙස ඇති කරගනු ලබන සමාජ සම්බන්ධතාවයන්ගේ ගුණාත්මක භාවය නිශ්චිත කිරීමට තාක්ෂණික උපකරණ වලට හැකියාවක් නොමැති බව මිනිසා අවබෝධකර ගත යුතුය. මන්ද කොරෝනා සමයට පෙර සිටම තාක්ෂණික උපකරණ මඟින් සමාජ සම්බන්ධතාවයන්

ඇතිකර ගැනීමේ අයහපත් ප්‍රතිඵල කොතෙකුත් අසන්නට දක්නට ලැබුණි. මෙහිදී පැන නගින ගැටළුව නම් වසංගතයත් සමඟ මෙම තත්ත්වය දෙගුණ තෙගුණ විය හැකි වීමයි.

**පවුල් සම්බන්ධතාවයන්ගේ තත්ත්වය**

ඇඳිරි නීතිය ක්‍රියාත්මක වූ මුල් කාලයේ දිගින් දිගටම රාජකාරීමය කටයුතු සහ වෙනත් කටයුතු නිසාවෙන් කාර්ය බහුල වූ මිනිසුන්ට දිගු නිවාඩුවක් ලැබුණු අතර බොහෝ කලකට පසු පවුල හා එක් වී කටයුතු කිරීමට ඉඩ ලැබුණි. ඇතැමුන් සෞඛ්‍ය තත්ත්වයන් නොසලකා විනෝද ගමන් වල පවා යෙදුණි. කොරෝනා පළමු රැල්ල තුළ පවුල් සම්බන්ධතාවයන්ගේ ධනාත්මක ආකල්ප දක්නට ලැබුණද එය දෙවැනි තෙවැනි රැලි හා ගැටෙන විට ක්‍රම ක්‍රමයෙන් වෙනස්වීම් වලට ලක් වූ ආකාරයක් දක්නට ලැබුණි. මුල් අවස්ථාවේදී මව, පියා සහ දරුවන් එකට එක් වී ප්‍රීතිමත් නිවාඩුවක් ගත කළද පසුව රාජකාරීමය කටයුතු සහ අධ්‍යාපන කටයුතු නිවසේ සිටම සිදු කිරීමට සිදු වීමත්, ඉන් ඇති වන ආතතිකාරී තත්ත්වයන් පවුල තුළින් මුදා හැරීමත් නිසා ගැටුම්කාරී වාතාවරණයන් ඇතිවීම සමාජීය විමසුම් වලදී දක්නට ලැබුණි. තව ද මාර්ගගත ක්‍රමවේදයන් ඔස්සේ සියලුම වැඩ කටයුතු සිදු කිරීම නිසා පවුල් සබඳතාවන්ට වඩා තාක්ෂණික සබඳතාවන්ට මුල් තැන දීමක් සිදු වී ඇත. මෙම තත්ත්වය මත බොහෝ විට තාක්ෂණික සබඳතාවය නොමැතිව පවුලේ සාමාජිකයන් පවුල තුළම හුදකලා වීමක් දක්නට ලැබේ. මෙමගින් පවුල් සහ අධ්‍යාපන සංස්ථා මඟින් සම්ප්‍රදායිකව සිදුකරනු ලැබූ මූලික සමාජානුයෝජනයට යම්තාක් දුරට බාධා පැමිණවීමක් සිදුවීම නිසා එහි අතුරුප්‍රතිඵල ලෙස පසුකාලීනව අපරාධකාරී වාතාවරණයන් ඉස්මතු වීම අනුමාන කළ හැකිය.

**සම්ප්‍රදායික අපරාධ වාර්තාවල වෙනස්කම් ඇතිවීම.**

දකුණු අප්‍රිකාවේ අගුලු දැමීමෙන් පසු මුල් සති කිහිපය තුළ මෑත ඉතිහාසයේ වෙනත් කිසිඳු කාලයකට වඩා අඩු මරණ සංඛ්‍යාවක් නගරවල වාර්තා වී තිබේ . මිනීමැරුම් අනුපාතය 72%කින්, දූෂණය 87%කින් සහ පහරදීම් 85%කින් වාහන කොල්ලකෑම සහ මංකොල්ලකෑම් පිළිවෙලින් 80% සහ 60% කින් පමණ අඩු වී ඇත. ඒ හා සමානව, පකිස්ථානයේ මිනීමැරුම් 2% න් අඩු වී ඇත. නමුත් ජාවාරම්, වාහන සොරකම්, නිවාස කොල්ලකෑම් සහ ජල සොරකම් ඇතුළුව වීදි අපරාධ බහුලව පැවතී ඇත. මෙයට යම් හේතුවක් වූයේ පොලිස් මුර සංචාරය කිරීම වැනි සාමාන්‍ය පොලිස් වැඩ වලින් ඉවත් වී අගුලු දැමීම බලාත්මක කිරීමයි. කරච්චි අගුලු දැමීම තුළින් ලාභ උපදවන, කළු අලෙවිකරණ සහ අත්‍යාවශ්‍ය භාණ්ඩ ගබඩා කිරීමේ අපරාධ වැඩි වී තිබේ[159]. මෙය යම්කිසි ආකාරයක පැවති අපරාධ සංස්කෘතියේ සාධනීය වෙනස්වීමක් ලෙස හඳුනාගත හැකි වේ.

"ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්තයේ දේපල අපරාධ සඳහා COVID-19 හි කෙටි කාලීන බලපෑමේ කලාපීය විචලනය ගවේෂණය කිරීම" මැයෙන් රචිත පර්යේෂණ පත්‍රිකාවට අනුව, දේපල හානි, නේවාසික සොරකම්, සාප්පු සොරකම්, මෝටර් රථ සොරකම්, සොරකම් සහ පහරදීම් වැනි පොදුවේ

[159] Crime and COVID – 19 lessons from Cape and Karachi https://www.theigc.org/blog/crime-and-covid-19-lessons-from-cape-town-and-karachi

පොලිසියේ වාර්තා වූ අපරාධ පුළුල් ලෙස පහත වැටී ඇති බව පෙන්වා දී තිබේ. සංචරණ සීමා පැනවීම හේතුවෙන් පුද්ගල ගමනාගමනට බාධා පැමිණවීම මෙයට හේතු වී ඇති බව ඔවුන් දක්වා තිබේ[160].

බෙන් ස්ටික්ල් සහ මාකස් ෆෙල්සන් විසින් "වසංගතයක අපරාධ අනුපාතය" මැයෙන් රචිත පර්යේෂණ පත්‍රිකාව මගින් පෙන්වා දී ඇත්තේ කෝවිඩ් වසංගතය හේතුවෙන් ලොව පුරා බොහෝ ප්‍රජාවන්හි අපරාධ අනුපාතය ප්‍රබල ලෙස පහත වැටී ඇති බවයි. සැන් ෆ්‍රැන්සිස්කෝහි අපරාධ 43%න්, ඔක්ලන්ඩ්හි අපරාධ 50% න්, ලොස් ඇන්ජලීස්හි සොරකම් 64% න්, චිකාගෝහි අවන්හල් වල සිදුවන අපරාධ සති පහක් තුළ 74% ක වෙනසකින් අඩු වීමක් දක්නට ලැබුණු අතර නගරය පුරා 35% ක අපරාධ අඩු වීමක් දක්නට ලැබුණු බව පවසා තිබේ. සංචරණ සීමා පැනවීම සහ රට අගුළු දැමීම හේතුවෙන් මෙම තත්ත්වය ඇති වී ඇති බව ඔවුන් වැඩිදුරටත් පවසයි[161].

අපරාධ සඳහා නිවසේ රැඳී සිටීමේ සීමාවන්හි ඇති බලපෑම පිළිබඳව අධ්‍යයනයක් සිදුකළ Amy E. Nivette ප්‍රමුඛ පර්යේෂණ කණ්ඩායම ඇමරිකාව, යුරෝපය, මැදපෙරදිග ආසියාවේ රටවල් 23 ක නගර 27ක දෛනික අපරාධ සංඛ්‍යාවන් එක්රැස් කොට සිදු කළ පර්යෙෂණයෙන් නිවසේ රැඳී සිටීම නිසා නාගරික අපරාධ වල යම් අඩුවක් හා සැළකිව යුතු වෙනස්කම් නිරීක්ෂණය කර ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානය ''ගෝලීය වසංගතයක් ''ලෙස නිවේදනය කොට මාර්තු 23 සිට අඟුලු දමා සතියක කාලයක් ගත වීමත් සමඟ වාර්තා වූ අපරාධ 41%කින් අඩු වී ඇත. සාප්පු සොරකම (-62%), සොරකම(-52%), ගෘහස්ථ හිංසනය(-45%), වාහන සොරකම්(-43%), පහරදීම(-36%) වශයෙන් අපරාධ වල නම්‍යතාවයෙහි විචලනයන් නිරීක්ෂණය කර ඇත[162].

**ළමා අපයෝජන සහ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ඉහළ යාම**

ශ්‍රී ලංකාවේ ඇඳිරි නීතිය පනවා තිබෙන කාලය තුළ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සහ ළමා අපයෝජන සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි ඉහළ ගොස් ඇති බව පොලිස් කාන්තා හා ළමා කාර්යාංශ වාර්තා පවසයි. මෙයට බලපාන ලද මූලික හේතු කාරණයක් ලෙස ඇඳිරි නීතිය පනවනු ලැබූ කාල සීමාවේ අපයෝජකයන් සහ වින්දිතයන් එකම නිවසක කොටු වීම හඳුනා ගැනීමට හැකි යැයි ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ එවකට සභාපති මහාචාර්ය මුදිත විදානපතිරණ මහතා පවසනු ලැබීය. 2020 මාර්තු 16 සිට අප්‍රේල් 7 දක්වා වූ සති 3 ක කාලය තුළ ළමා අපයෝජන සම්බන්ධයෙන් වාර්තා වී ඇති පැමිණිලි අතර හිංසනය පිළිබඳ අනුපාතය 10% සිට 40% දක්වා ඉහළ ගොස් තිබුණි. පුරුද්දක් මෙන්

---

160 L. Jason, A . morgan and piquero, 2021. Exploring region variability in the short – team impact of covid – 19 On property crime in Queensland, Australia.Crime Science.
https://crimesciencejournal.biomedcentral.com/articles/10.1186/s40163-020-00136-3

161 S.Ben and Felson, 2020. Crime Rates in Pandemic : the Largest Criminological Exeriment in History, *American Journal of criminal Justice.*
https://link.springer.com/article/10.1007/s12103-020-09546-0

162 Lusisa pedrosa A, Bitencourt L,et al.(2020) Emotional Behavioral , and Psychological impact of the COVOD-19 Pandemic
https://www.frontiersin.org/articles/10.3389/fpsyg.2020.577684/full

මෙම හිංසාකාරී ක්‍රියාවන්හි නියැලෙන පුද්ගලයින් නිසාවෙන් මෙකී අපරාධ දත්තයන්ගේ නැග්මක් සිදුවන බව හඳුනා ගත්ත ද සමාජීය සත්ත්වයෙකු වූ මිනිසා එකම ස්ථානයක, එකම භූමි ප්‍රමාණයක හිරවීම නිසා ඇති වන මානසික ආතතීන් තම සමීපතමයන් විෂයෙහි මුදා හැරීම ද මෙයට හේතු වන්නට ඇත.

මෙක්සිකෝවේ ජාතික වින්දිත සමීක්ෂණයට අනුව 2019 වර්ෂයේ සිදු කළ ජාතික වින්දිත සමීක්ෂණයේදී එරට තුළ සිදු වූ අපරාධ වලින් 11%ක් පමණ අදාළ අධිකාරියට වාර්තා වී ඇතත්, නඩු ගොනු වී ඇත්තේ වාර්තා වූ අපරාධ වලින් 8%ට පමණි[163]. එනම් බොහෝ දෙනා සමාජය තුළ මුල් බැසගෙන ඇති සංස්කෘතික මතවාද මත මෙවැනි අපරාධ බොහෝමයක් අපරාධ යුක්ති ක්‍රමය මත පිහිටා විසඳීමට කැමැත්තක් නොදක්වයි. කොරෝනා සමයේ වුවද වසංගත තත්ත්වය හමුවේ ජීවිත ආරක්ෂාව ගැන සිතමින් පුදගලයින් සෘජු ලෙසම අපරාධ යුක්ති ක්‍රමයේ පිහිට පැතීමට මැලි වීමක් දක්නට ලැබේ.

**සාම්ප්‍රදායික පාසල් අධ්‍යාපන ක්‍රමය දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදයක් ඔස්සේ සිදුවීම**

Covid-19 අවදානම යටතේ ලොව පුරා රටවල් 180ක පාසල් වසා දමන ලදි. එයින් බිලියන 1.57ක පාසල් දරුවන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් වූ අතර එය ලෝක ශිෂ්‍ය ජනගහනයෙන් 90% කි. මේ තත්ත්වය මත විකල්ප අධ්‍යාපන ක්‍රමවේදයන් ලෙස දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේද අනුගමනය කිරීමට ලෝකයේ රටවල් පියවර ගන්නා ලදි. මේ හරහා ළමුන් විශාල වශයෙන් මානසික ආතතියට ලක් වූ බව නොරහසකි. ඒ සඳහා ළමුන්ට අවශ්‍ය කරන තාක්ෂණික උපකරණ සහ අන්තර්ජාල පහසුකම් නොමැති වීම, වසංගත බිය, විවිධ පවුල් ප්‍රභේදයන් මත අධ්‍යාපනය සඳහා සුදුසු වාතාවරණයක් නොමැති වීම, තරගකාරී අධ්‍යාපන ක්‍රමය සහ ප්‍රියයන්ගෙන් වෙන්වී තනිව අධ්‍යාපනය ලැබීම හේතුවෙන් ළමුන්ගේ මානසික ආතතිය දෙගුණ තෙගුණ වූවා නිසැකය[164].

සැබැවින්ම මෙම තත්ත්වය මහත් සමාජ අසාධාරණයකි. කෙසේ හෝ පොතක් පැන්සලක් සොයා ගෙන පාසල් ගොස් අධ්‍යාපනය ලබා උගතෙකු වීමට වෙර දරණ ග්‍රාමීය සිසුවාට වසංගතය හමුවේ කෙසේ හෝ ස්මාර්ට් ජංගම දුරකථනයක් සොයා ගෙන අධ්‍යාපනය ලැබීමට සිදු වී ඇත. ජංගම දුරකථනයක් සොයා ගත්ත ද ඉන් අනතුරුව අන්තර්ජාල සබඳතාවයන් සොයා ගැනීමේ අර්බුදයට මුහුණ පෑමට සිදු වේ. එයද ස්ථිර හෝ ක්‍රියාශීලි සබඳතාවයක් නොවනවා විය හැකිය. එසේම වසංගත සමය පුරාවට කිසිඳු අධ්‍යාපන අවස්ථාවක් ලබා නොගත් දරුවන් පිළිබඳවද ජනමාධ්‍ය මෙන්ම සමාජ මාධ්‍ය හරහාද කොතෙකුත් අසන්නට දක්නට ලැබුණි. මෙලෙස වෙනස් වූ සංස්කෘතික පරිසරය නිසාවෙන් දිළිඳු මෙන්ම ග්‍රාමීය දරුවන්ගේ අධ්‍යාපන අවස්ථාවන්ට බාධා පැමිණෙන අතර ඉන් උගතුන්

---

[163] Patricio 'Estevez-soto, (2021), Crime and C0VID-19: Effect of changes in routine activities in Mexico CITY.https://crimesciencejournal.biomedcentral.com

[164] Y.Chunjiang,A.chen and Yashu,2020. College student’s stress and health in the COVID – 19 Pandemic: The role of academic workload,separation from school, and feaß of contagion. https://journals.plos.org/plosone/article?id=10.1371/journal.pone.0249414

බිහි වීමට බාධා පැමිණවීමක් සිදු වේ. මේ අනුව අඩු අධ්‍යාපනය සහ විරැකියාව යන සාධකයන් කාලයාගේ ඇවෑමෙන් ඉස්මතු වන කල්හි අපරාධකාරී වාතාවරණයන් ඉස්මතු වීම අහඹුවක් නොවේ.

මීට අමතරව දරුවන් තාක්ෂණික උපකරණ අනිසි භාවිතයේ යෙදවීම නිසා විවිධ අපරාධකරුවන්ගේ මෙන්ම ලිංගික විලෝපිකයන්ගේ ගොදුරු බවට පත් වීමත්, බාල අපරාධ වලට යොමු වීමත්, අපරාධකාරී චර්යාවන් වලට එළඹීමත් වෙනස් වූ පාරිසරික මෙන්ම සංස්කෘතික සාධක මත පවතින අවධානමක් ලෙස හඳුනා ගැනීමට හැකිය.

**පාරිසරික අපරාධයන් ඉස්මතු වීම.**

අපගේ අතීත මුතුන් මිත්තන් පාරිසරික සම්පත් පරිභෝජනයේදී ස්වාභාවික පරිසරය සුරැකෙන පරිදි එකී සම්පත් භාවිතයට හුරු වී සිටියහ. නමුත් කාර්මීකරණය, නාගරීකරණය වැනි වෙනස් වූ සමාජ තත්ත්වයන් හමුවේ මිනිසා සංවර්ධනය කරා දිව යෑමේදි පරිසරය පසෙකලා තිබුණි. නමුත් වසංගතය හමුවේ ස්වභාවධර්මය යම් අස්වැසිල්ලක් ලැබුවාක් මෙන් නවමු මුහුණුවරක් ගත් ආකාරයක් අපට පෙනිණි. මිනිසා විසින් ආක්‍රමණය කරන ලද සතුන්ගේ වාසසස්ථාන නැවත දැකබලා ගැනීමට ඔවුන් නැවත පැමිණීමක් ලොව පුරා අසන්නට දක්නට ලැබුණි. ජල දූෂණය අවම වන්නට විය. (උදාඃ වැනීසියේ ඇළ මාර්ග) ඉන්දියාවේ පංජාබ් ප්‍රානතයේ ඇතැම් ප්‍රදේශ වලට හිමාල කඳුවැටිය පියවි ඇසින් දැකබලා ගැනීමට හැකිවූයේ ඇඳිරි නීති සමයේ වායු දූෂණය අවම වූ නිසාවෙනි. කර්මාන්ත, ප්‍රවාහන හා සමාගම් වසා දැමීමෙන් වායු දූෂණය අවම වීම මෙන්ම සෞඛ්‍ය සම්පන්න පරිසරයක්ද නිර්මාණය වී තිබේ.

චීනයේ බර කර්මාන්ත (Heavy industries) වසා දැමීම හේතුවෙන් $N^2O$ සහ CO50%ට ආසන්න ප්‍රමාණයක් අඩු වූ බවට ගණන් බලා ඇත. විශේෂයෙන් ප්‍රවාහනය ම ඟින් නිකුත් කරන නයිට්‍රජන් ඩයොක්සයඩ් සාන්ද්‍රණය බොහෝ යුරෝපීය රටවල තියුණු ලෙස පහත වැටුණු ආකාරය පර්යේෂණාත්මක දත්ත මඟින් පෙන්වා දි තිබේ. මීට අමතරව වෛද්‍යමය අපද්‍රව්‍ය, විෂබීජ නාශක, අත්වැසුම්, මුඛ ආවරණ සහ මුහුණු ආවරණ පරිසරයට මුදා හැරීම වැනි සෘණාත්මක ප්‍රතිවිපාක ද පවතී [165].

- **මානසික සාධක**

කොවිඩ් වසංගත තත්ත්වය ද, ඉබෝලා, H1N1,SARS, අශ්වාරෝහක උණ ආදී වසංගත තත්ත්වයන් සේම මේ වන විට සමාජ, ආර්ථික, දේශපාලනික අර්බුධකාරී වාතාවරණයන් රැසක් හමුවේ සමාජයේ සැඟවුණු පැතිකඩක් නිරාවරණය කරමින් පුද්ගලයන් තුළ මානසික වශයෙන් අර්බුධකාරී තත්ත්වයන් රාශියක් ඉස්මතු කරමින් පවතී. කොරෝනා වෛරසය පැතිරී යාම පාලනය කරනු වස්, බොහෝ රටවල් අගුළු දැමීමටත්, පුද්ගල හැසිරීම් සීමා කිරීමටත් පියවර ගන්නා ලදි. මිනිසුන් නිවාස තුළටම

165 M.Gabriella,2020.COVID – 19 and Europe's environment : impacts of a global pandemic, EuopeanEnvironment Agency.
https://www.eea.europa.eu/publications/covid-19-and-europe-s/covid-19-and-europes-environment

කොටු වීම, වෘත්තීය ජීවිතයෙන් මිදී සමාජයෙන් දුරස්ව නිවසටම වී සිටීම, වෛරසය වැළඳේ යැයි බියට පත් වීම, ආදරණීයන්ගෙන් වෙන්වීම, නිදහස නැති වීම, අසරණ වීම වැනි හැඟීම් පුද්ගලයා තුළ සිය දිවි නසා ගැනීම, අපරාධ සඳහා පෙළඹීම වැනි තත්ත්වයන් උග්‍ර වීමට හේතුවක් විය. සමස්ථයක් වශයෙන් ගත් කළ මෙම තත්ත්වය යුරෝපය, උතුරු ඇමරිකාව, දකුණු ඇමරිකාව සහ ආසියානු කලාපයන් තුළ වැඩි වශයෙන් නිරීක්ෂණය වී ඇත[166].

හදිසියේ ඇති වූ මෙකී වෙනස පුද්ගලයාටද, ඒ හරහා සමස්ත සමාජ පර්යයායට ද දැඩි බලපෑමක් එල්ල කරන්නට විය. අලුත් දෙයකට හුරුවනවා තරම් පහසුවෙන් දීර්ඝ කාලයක් පුරාවට හුරු පුරුදු කොට ගෙන පැමිණි පුරුදු, සම්ප්‍රදායන් අත් හැරීම පහසු නොවේ. අගුළු දැමූ ජීවිතයක් ගත කිරීමට නියම වූ මිනිසාට මෙම තත්ත්වය මානසික අර්බුධ රැසක් නිර්මාණය කිරීමට හේතු විය. කොරෝනා වෛරසය හමුවේ මිනිසාට අත් විඳීමට සිදු වූ තත්ත්වය පුද්ගල මනසට ඇති කරන බලපෑම, මානසික සෞඛ්‍ය, මානසික රෝගාබාධ ආදිය නව සංස්කෘතිය තුළ පුද්ගල අපරාධකාරීත්වය කෙරෙහි බලපානු ලබන්නේද යන්න පිළිබඳව ලෝකයේ බොහෝ විද්වතුන්ගේ, මනෝ වෛද්‍යවරුන්ගේ හා මනෝ උපදේශකයින්ගේ  අවධානයට යොමු වී තිබේ.

චිත්තවේගී බලපෑම් දැක්වීමේ ප්‍රධාන අංග වන පෞරුෂ ලක්ෂණ, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, මාධ්‍ය, ආර්ථිකය හා රජයේ ප්‍රතිචාර ආදීය වසංගතය පිළිබඳ ගොඩ නැගූ චිත්‍රය පුද්ගල අපරාධකාරීත්වයට යොමු කිරීමට යම් අභිප්‍රේරණයක් සපයන ආකාරය විවිධ පර්යේෂණ තුළින් තහවුරු කොට ඇත[167]. සමාජ වෙනස් වීමත් සමඟ ගොඩ නැගුණු නව සංස්කෘතිය තුළ, චර්යාමය ගැටලු, තාක්ෂණික ඇබ්බැහි, ආහාර රටාවේ ගැටලු රාශියක් පැන නැගුණ අතර එය මානසික ආතතිය වැඩි වී මානසික සෞඛ්‍යය බිඳ වැටීමට හේතුවක් විය. ළමුන් හා වැඩිහිටියන් තාක්ෂණ දුර්ථයකට හසු වූ අතර නිද චර්යාවේ දැඩි වෙනස්කම් සිදු විය. ඇබ්බැහි රටාවන් ගත් කළ පුද්ගලයින් මානසික පීඩනය පිට කරන මුවාවෙන් වැඩි වශයෙන් මත් ද්‍රව්‍ය භාවිතයට යොමු වීමත්, පරිගණක  ක්‍රීඩා වලට ඇබ්බැහි වීමත් හඳුනා ගැනීමට හැකිය. දෛනික චර්යා රටාවෙහි ඇති වූ මෙම වෙනස්කම් පුද්ගලයන් පහසුවෙන් අපරාධයක ගොදුරක් බවට පත් වීමටත් අපරාධයකට යොමු වීමටත් ඇති ඉඩකඩ දෝලන මට්ටමක පවතී.

පුද්ගල මනෝභාවයන් අරක් ගෙන පවත්නා සාරධර්ම පද්ධති යම්යම් ආකාරයන්ගෙන් වෙනස්කම් වලට ලක් වූ අතර මෙම තත්ත්වය පිළිබඳව එමිල් ඩූර්කයිම් ධර්මතා විරහිත සමාජය හෙවත් අනෝමීය සමාජය තුළින් විග්‍රහ කරනු ලබයි. තවද කාල් මාක්ස්ගේ පරාරෝපණ සංකල්පය තුළින් විග්‍රහයට හසු කරනුයේ වර්තමානයේ උද්ගතව පවතින මෙවැනි සමාජ තත්ත්වයන් පිළිබඳව වේ. සාරධර්ම විරහිතභාවය මත ඇති වන නිස්සාරත්වය සම්බන්ධයෙන් අදහස් දක්වන ඒබ්‍රහම් මාස්ලෝ මනෝ ව්‍යාධීන් රැසක් පිළිබඳව අවධාරණය කරයි. ඔහුගේ එම විග්‍රහය වර්තමානයේ උද්ගතව පවත්නා

[166] Every-palmer S.Jenkins M, Gendall P, Hoek J, Beaglehole C, et al.(2020) Psychological distress, anxiety, family violence, sociality and wellbeing in new Zealand during the COVID-19 lockdown: A cross-sectorial study https://journals.plos.org/plosone/article?id=10.1371/journal.pone.0241658

[167] Lusisa pedrosa A, Bitencourt L,et al.(2020) Emotional Behavioral , and Psychological impact of the  COVOD-19 Pandemic
https://www.frontiersin.org/articles/10.3389/fpsyg.2020.577684/full

තත්ත්වය හා සැසඳු කළ සාරධර්ම තුළින් ගොඩ නැඟෙන මනෝභාවයන් අපරාධකාරී චර්යාවට ඇති නැඹුරුව කවරාකාරද? යන්න පිළිබඳ යම් අවබෝධයක් ලබාගත හැකි ය.

මෙවැනි වූ විසංවිධානකාරී තත්ත්වයන් සමාජය තුළ නිර්මාණයට හේතු භූත වන්නා වූ බොහෝ කරුණු ගොඩ නැගෙණුයේ පුද්ගල මනෝභාවයන් පදනම් කර ගත් චර්යයා රටාවන් අනුසාරයෙනි. සංස්කෘතික විසරණය මඟින් පුද්ගලයා අත්පත් කර ගන්නා දේ නිවැරදි පිරික්සුමකින් තොරව එලෙසින්ම පුද්ගලයා ආරෝපණය කර ගනී. ඒකී තත්ත්වය සාධාරණීකරණය කර ගැනීම පිණිස පාරිසරික සාධක, වසංගත තත්ත්වයන් ඊට ඇදා ගැනීම තුළින් පුද්ගල මනස අපරාධකාරී චර්යා සාධාරණීකරණය කරනු ඇත. ඒ අනුව පෙනී යන කරුණක් නම් වෙනස් වන සමාජ සංස්කෘතින් හමුවේ අපරාධකාරී මනෝභාවයන් වෙනස් කර ගන්නා ආකාරයයි. ඇතැම් විට එවැනි තත්ත්වයන් හමුවේ ඇතිවන මානසික රෝගාබාධ තත්ත්වයන්ද හේතු කාරක විය හැකිය.

කොරෝනා කාල සීමාව තුළ අනෙක් කාලයන්ට සාපේක්ෂව පුද්ගලයා දැඩි මානසික පීඩනයට ලක්වීම සඳහා හේතු සාධක වශයෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මනෝවිද්‍යා අධ්‍යයනාංශය විසින් සිදුකළ පර්යේෂණයකින් අනාවරණය කර ගත් කරුණු අතර,

- ජීවිතය පිළිබඳ අවිනිශ්චිත බියකින් පෙළීම.
- කොරෝනා වෛරසයේ ව්‍යාප්තිය නිසාවෙන් තමාට ද වෛරසය ආසාදනය වේ යැයි ඇති බිය.
- රැකියාව අහිමිවීම හෝ වේ යැයි ඇති බිය සහ ආර්ථික ගැටලු.
- කොරෝනා වෛරසය ආසාදනය වූ පුද්ගලයින් සමාජයෙන් කොන් වීම පිළිබඳ ඇති කර ගත් බිය.
- සමාජයෙන් දුරස් වීමට සිදු වීම නිසා සමාජය හා පවුල් සබඳතා දුරස් වීමත්, සමාජ සබඳතා බිඳ වැටීම නිසා ඇති වන මානසික බලපෑම.
- ඒකාකාරී ජීවිතයක් ගත කිරීමට සිදුවීම නිසාවෙන් ඇති වන මානසික බලපෑම.
- නිරන්තරයෙන්ම නිවස තුළ රැඳී සිටීම මත පවුලේ සාමාජිකයන් අතර ඇති වන නොරුස්සන සුළු ගතිය ආදියෙහි ප්‍රතිඵල ලෙස පවුල් තුළ ගැටලු ඇති වීම.
- ජීවිතය පිළිබඳව අනාගත අපේක්ෂාවන් බිඳ වැටීම නිසා ඇති වන ඉච්ඡාභංගත්වයන්

ආදි කරුණු පෙන්වා දී ඇත.

මෙවැනි තත්ත්වයන් තුළ මනස ක්‍රියාත්මක වන ආකාරය පුද්ගල අපරාධකාරී චර්යාවන් සිදු කිරීම කෙරෙහි බලපානු ඇත. පෞරුෂය වශයෙන් හඳුනා ගන්නා සමාජය තුළ කැපී පෙනෙනා ස්වරූපය මෙම කාල සීමාව තුළ වෙනත් ආකාර වලින් සොයා යන්නේ අපගාමී පෞරුෂයක ප්‍රතිඵලයක් වශයෙනි. පුද්ගල පෞරුෂය සකස් කරන්නේ සංස්කෘතිය තුළින් බව "Cultural Background of Personality '' කෘතියේ රැල්ෆ් ලින්ටන් (Ralph Linton) විසින් දක්වා ඇති අදහස මෙහිදී මතක් කිරීමට කැමැත්තෙමු. මේ අනුව වෙනස් වූ සංස්කෘතික පරිසර සාධක මත පුද්ගල පෞරුෂය වෙනස් වී අපගාමී ස්වරූපයකට අනුවර්ථනය වන ආකාරය හඳුනා ගැනීමට හැකිය.

- **ආර්ථික සාධක**

කොවිඩ් වසංගත තත්ත්වය ගෝලීය ආර්ථිකය 1930 දශකයේ ඇති වූ ලෝක ආර්ථික අවපාතයෙන් පසු දරුණුතම පසුබෑමට මුහුණ දෙමින් සිටින කාල පරිච්ඡේදයකි. ලොවම වෙලාගෙන ඇති කොවිඩ් වසංගතය ලොව සෑම රටකම පාහේ ආර්ථිකමය වශයෙන් සෘජු සහ වක්‍රාකාරයෙන් ප්‍රබල ලෙස බලපෑම් කර ඇත. වර්තමානය වන විට ලෝක ජනතාවට ඛේදජනක ඉරණමකට මුහුණ දීමට සිදු වී තිබේ. සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් ශ්‍රී ලංකාවට අපනයන, සංචාරක, කෘෂිකර්මාන්තය, රෙදිපිළි, ඇඟලුම්, තේ සහ විදේශ විනිමය යන ක්ෂේත්‍රයන්හිම තමන්ගේම වටිනාකමක් ඇත. නමුත් වෛරසයේ ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග එහි පැතිරීම මැඩපැවැත්වීමට උපකාරී වුවද එමඟින් දේශීය ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි සැළකිය යුතු සෘණාත්මක බලපෑමක් ඇති කර තිබේ. මහජනතාව සඳහා නිවාඩු ප්‍රකාශයට පත් කිරීම, ඇඳිරි නීතිය පැනවීම්, මහජන සේවා සීමිතව පවත්වාගෙන යාම සහ ගුවන් තොටුපොළ හා වරාය වසා දැමීම වැනි මගීන්ගේ ගමනාගමනය සීමා කිරීමට ගනු ලැබූ වෙනත් ක්‍රියාමාර්ග මඟින් සමස්ත ආර්ථික යාන්ත්‍රණයටම බලපෑම් එල්ල විය. කොවිඩ් වසංගතය හේතුවෙන් රටේ ආර්ථිකය තියුණු ලෙස පහත වැටුණු අතර ආර්ථික ඉපැයීම් ක්ෂේත්‍ර ද නරක අතට හැරුණි. එනම්, දළ දේශිය නිෂ්පාදිතය, රැකියා, උද්ධමනය, කොටස් වෙළඳපොළ, බාහිර අංශයේ ක්‍රියාකාරිත්වය සහ දරිද්‍රතාවයට එය බෙහෙවින් බලපායි [168].

වසංගතයේ බලපෑම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සහ දෛනික වැටුප් උපයන්නන් ඇතුළු අවිධිමත් අංශ කෙරෙහි ද වැඩි වශයෙන් බලපෑවේය. කොවිඩ් වසංගත තත්ත්වය තුළ රටවල් අතර සිදුවන වෙළඳ ගනුදෙනු බොහෝ සේ සීමා වී තිබේ. පිටරට වලින් ගෙන්වනු ලබන අමුද්‍රව්‍ය ද දැඩි ලෙස සීමා කර ඇත. අපනයනය කිරීමේ අරමුණින් මෙරට සිදු කරන බොහෝමයක් නිෂ්පාදන කටයුතුවලට අවශ්‍ය අමුද්‍රව්‍ය පිටරටින් ගෙන ආ යුතුය. නමුත් මෙම වසංගතය හමුවේ එම කටයුතු පසුබෑමකට ලක්ව පවතී. එහිදී නිෂ්පාදන හෝ සේවා සැපයීම අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය ද්‍රව්‍ය හිඟය , දේශීය හා ගෝලීය වශයෙන් තම නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම් පහත වැටීම, ණය ආපසු ගෙවීමේ දුෂ්කරතා හේතුවෙන් ශ්‍රී ලංකාවේ බොහෝ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් අභියෝගයට ලක්විය. මෙලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් අඩපණ වෙත්ම නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම්, නීති විරෝධී රථ වාහන අලෙවිය සහ ප්‍රමිතියෙන් තොර භාණ්ඩ අලෙවිය වැනි අපරාධ කෙරෙහි යොමුවීමේ ඉඩකඩ ඉහළය. දෛනික වැටුප් උපයන්නන් හට වසංගත තත්ත්වය හමුවේ විරැකියා තත්ත්වයකට මුහුණ දීමට සිදු විය. මෙවැනි විරැකියා තත්ත්වය සෘණාත්මක බලපෑමක් ඇති කරයි. එනම්, උවමනා සහ අවශ්‍යතා සපුරා ගැනීමට අපොහොසත් වීමයි. රැකියාවන්හි නියුක්ත පුද්ගලයින්ගෙන් අඩක් පමණ සේවා නියුක්ත කළ අතර සෙසු සේවකයින්ගේ වැටුප් සීමා කරන ලදී.

[168] Deshapriya, S. (2021). Economic Consequences And Impacts Due To The Outbreak Of Covid-19 https://papers.ssrn.com/sol3/papers.cfm?abstract_id=3911436

ඒ අනුව දෛනික වැටුප් උපයන්නන් සහ සේවා වියුක්ත පිරිස් වෙත ආර්ථිකමය වශයෙන් ප්‍රබල බලපෑමක් එල්ල විය[169].

අපනයන හා ආනයන සීමා කළද වෙළඳපොලෙහි පවතින භාණ්ඩ, අමුද්‍රව්‍ය අධික ලෙස මිල ඉහළ යන්නට විය. ඒ අනුව වෙළඳපොලෙහි පවතින අධික මිල ගණන් හා ඒවා ලබා ගත නොහැකි වීම, රැකියා කප්පාදුව මෙන්ම ණය බර වැඩි වීම හේතුවෙන් ප්‍රජාව තුළ දරිද්‍රතාවය ඉහළ යන්නට විය. එක්සත් ජාතීන්ගේ සංවිධානය දුප්පත්කම දකිනුයේ "අඩු ආහාර පරිභෝජනය සහ අඩු සෞඛ්‍ය තත්ත්වය හා අධ්‍යාපන මට්ටම සහ එයට ප්‍රවේශය නොමැතිකම හා අඩු නිවාස තත්ත්වයන් තුළින් පිළිඹිබු වන හිඟකමේ තත්ත්වය" ලෙසය. දරිද්‍රතාවය ආර්ථික බලපෑම මැනිය හැකි ප්‍රබල සාධකයකි. භාණ්ඩ වල මිල ගණන් ඉහළ ගිය ද ප්‍රජාවගේ ආදායම වැඩිවීමක් සිදු නොවූ හෙයින් ඇතැමුන්ගේ ආදායම ශුන්‍ය විය. මෙම තත්ත්වය ආදායමේ ක්‍රය ශක්තිය අඩු වීමට හේතු විය. එය දරිද්‍රතාවය ඉහළ යන්නට ප්‍රබල ලෙස බලපාන ලදි. කොවිඩ් වසංගතය ශ්‍රී ලංකාවේ කොටස් වෙළඳපොලට දැඩි ලෙස බලපා ඇති අතර අපනයන හා සංචාරක ව්‍යාපාරයේ දුර්වල ක්‍රියාකාරීත්වය හේතුවෙන් ලොව ප්‍රධාන මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල තියුණු ලෙස අවප්‍රමාණය වී ඇත. මෙකී තත්ත්වය මෙරට දරිද්‍රතාවය ඉහළ නැංවීමේ ගාමක බලවේගයක් විය. ශ්‍රම වෙළඳපොල ප්‍රතිඵලවල පිරිහීම ද දරිද්‍රතාවය ඉහළ නංවා ඇති ප්‍රධාන මාර්ගයකි. පුද්ගල ආදායම වසංගත තත්ත්වය හමුවේ පරිභෝජනයට ප්‍රමාණවත් නොවන හෙයින් ආයෝජන සඳහා ප්‍රමාණවත් මුදල් සහ සම්පත් නොමැති විය. එම තත්ත්වය අනාගත ආර්ථික පරිහානියට බෙහෙවින් බලපානු ලැබේ. එමගින් දරිද්‍රතාවය ඉහළ යත්ම පුද්ගලයාගේ ජීවන තත්ත්වය පහත වැටෙන අතර එහි ප්‍රතිවිපාකයක් ලෙස පුද්ගලයින් විවිධ අපරාධ සිදු කිරීමට නැඹුරු වේ [170].

කොවිඩ් තත්ත්වය සමඟ ප්‍රජාව ආදායම් බෙදීයාමේ විෂමතාවයන්ට මුහුණ දීමට සිදුවිය. ඇතමුන්ට කිසිඳු ආදායමක් නොමැති වූ අතර අත ඉතිරි මුදලින් භාණ්ඩ හා සේවා මිල දී ගැනීමට සිදු විය. රටෙහි පවතින භාණ්ඩ හිඟයත් සමඟ මිල ගණන් ඉහළ යාම නිසා ආදායම සීමිත පිරිසක් අතර ඒකරාශී විය. ඒ අතර ආදායම් නොලබන පිරිස සංවිධානාත්මක අපරාධ කල්ලිවලට සම්බන්ධ වීම, සොරකම් කිරීම් සහ මංකොල්ලකෑම් වැනි අපරාධ සිදු කිරීමට පෙළඹේ. ආනයන හා සංචරණ සීමා හේතුවෙන් භාණ්ඩ හිඟයක් පවතින අතර පැවති භාණ්ඩ ද තොග හා සිල්ලර ව්‍යවසායකයන් විසින් සඟවා කළුකඩ මිලකට අලෙවි කිරීමට පෙළඹුණි. (පවතින මිලට වඩා ඉතා ඉහළ මිලක්) මෙම තත්ත්වය හමුවේ ව්‍යවසායකයින් නීතිවිරෝධී ලෙස භාණ්ඩ ගබඩා කිරීම, අලෙවි කිරීම සහ ප්‍රමිතියෙන් තොර භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය ආදි අපගාමී චර්යා කෙරේ යොමු වේ.

---

169 Amarthunga.D,Fernando.N,Jayasinghe, N.(2020), The Covid-19 Outbreak In Sri Lanka: A Synoptic Analysis Focusing On Trends, Impacts, Risks And Science-Policy Interaction Processes https://www.ncbi.nlm.nih.gov/pmc/articles/PMC7836425/

170Akeel, I. (2021). Analyzing the Impact of Covid-19 on Sri Lanka Economy https://papers.ssrn.com/sol3/papers.cfm?abstract_id=3907819

පුද්ගලයාගේ ජීවන රටාව සංස්කෘතික අංගයකි. පුද්ගල ජීවන රටාව කෙරෙහි බලපාන තීරණාත්මක සාධකය වන්නේ ආර්ථිකයයි. ආර්ථිකය රටක පවතින තත්ත්වය අනුව වෙනස්කම් වලට ලක් වේ. වර්තමාන ලොවම මුහුණ දෙමින් සිටින කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ ආර්ථිකයට ප්‍රබල ආකාරයෙන් බලපෑම් එල්ල විය. ගෝලීය දරිද්‍රතාවය ඉහළ යා හැකි බව එක්සත් ජාතීන්ගේ අධ්‍යයනයෙන් ද තහවුරු වී ඇත. එනම්, දරිද්‍රතාවය ඉහළ යාම, රැකියා කප්පාදුව, ආදායම් බෙදීයාමේ විෂමතාවය, ආයෝජන පහත වැටීම සහ විදේශ විනිමය අවම වීම වශයෙනි. මෙම බලපෑම්හි ප්‍රතිඵලයක් වශයෙන් පුද්ගලයාගේ ජීවන රටාවන් වෙනස්කම් වලට භාජනය විය. ඒ ආකාරයට වසංගත තත්ත්වය හේතුවෙන් පුද්ගලයාට ඇති වන සෘණාත්මක ආර්ථික බලපෑමෙහි ප්‍රතිඵලයක් වශයෙන් අපගාමී චර්යා හෙවත් අපරාධ සිදු කිරීමට නැඹුරු වේ.

## දෙවන කොටස

# න්‍යායාත්මක විග්‍රහය

සංස්කෘතික අපරාධ විද්‍යාව යනු විවිධ විෂය පරාසයන් තුළ දෝලනය වනු ලබන විෂය ක්ෂේත්‍රයකි. එය සංකල්පීය හා න්‍යායාත්මක දැනුම ඔස්සේ පෝෂණය වනු ලබන අතර එමගින් අපරාධ, අපරාධකාරීත්වය, අපරාධ යුක්ති ක්‍රමය මෙන්ම අපරාධ පාලනය හා නිවාරණය යන විචල්‍යයන් පිළිබඳව සමාජ සංස්කෘතික මුහුණුවරකින් හැදෑරීමක් සිදු කරයි. න්‍යායාත්මක විග්‍රහය වන මෙම කොටස තුළින් විවිධ විෂය පථයන් යටතේ ගවේෂණය කරන ලද විවිධ න්‍යායන්, සංස්කෘතික අපරාධ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් විග්‍රහ කර ඇත. එම න්‍යායාත්මක විග්‍රහයන් සංස්කෘතික අපරාධ විද්‍යාවට ඈඳා ගනිමින් සංස්කෘතිය සහ අපරාධ අතර සහසම්බන්ධතාවය විග්‍රහ කිරීමට දැරූ උත්සාහයක ප්‍රතිඵලයක් වේ.

## 1. සාපේක්ෂ සම්බන්ධතා සංස්කෘතික න්‍යාය

1970 දශකයේ ඇමරිකානු මහද්වීපය හරහා ස්ත්‍රීවාදයේ සුළඟ හමා යාම පදනම් කොට ගෙන බිහිවූ මධ්‍යස්ථ මතවාදී ස්ත්‍රීවාදය තුළ බිහිවන මානව මනෝවිද්‍යාත්මක න්‍යායක් ලෙස සාපේක්ෂ සම්බන්ධතා සංස්කෘතික න්‍යාය පෙන්වාදිය හැක . මෙම න්‍යායේ සංවර්ධනය සඳහා **ජී බේකර් මිලර්, ජූඩි වී ජෝර්දන්, ජැනට් සරේ හා අයිරින් ස්ටිවර්ග්** යන මනෝ විද්‍යාඥවරියන්ගේ සහය ලැබීම සිදු වුහ. තවද මෙම න්‍යාය මනෝ ගතික න්‍යාය අනුසාරයෙන් නිර්මාණය වීම සිදු විය . මෙම න්‍යාය තුළින් පුද්ගලික ශක්තිය, මානව සෞඛ්‍යය හා අන්තර් සම්බන්ධතාවය මත සංස්කෘතිය යහපත් අයුරින් ගොඩනගා ගන්නේ කෙසේද යන්න මෙම න්‍යාය තුළින් අවධානය යොමු කරන ලදි .මහා සමාජය තුළ අධිපතිවාදී (පුරුෂාධිපත්‍ය, සුදු-කලු ආධිපත්‍ය) සංස්කෘතිය තුළ වින්දිතභාවයට පත්වන්නන්ගේ මානසික තත්වය මානසික සට්ටනය හඳුනාගෙන චිකිත්සක පිළියම් යෙදීම එම පුද්ගලයන්ට මනෝමය ප්‍රතිකාර වශයෙන් හෝ යම් ආකාරයේ මානසික සුවතාවයක් ලබා දීමට අවශ්‍ය න්‍යායාත්මක පසුබිමක් ගොඩනැඟීම සඳහා මෙම න්‍යාය ගොඩ නැඟුණි.

පවුල නැමැති සමාජ සංස්ථාව තුළ පුරුෂාධිපත්‍යයට පත්වීමෙන් කාන්තාව ලබන්නා වූ වින්දිතභාවය මිදි ස්වාධිපත්‍යයක් ගොඩ නැගිමට සඳහා අවශ්‍ය මානසික ශක්තිය මෙම න්‍යාය තුලින් ගොඩනැගිමට උත්සුක වන ලදි . එනම්, එහිදි සංස්කෘතිය තුල පවතින්නා වූ බලතල ධූරාවලිය හඳුනා ගෙන එනම් ධූරාවලිය වෙනස් කිරීමට හෝ මෙම ධූරාවලිය මුලින් උපුටා දමා සංස්කෘතික වශයෙන් නව ධූරාවලියක් නිර්මාණය කිරිම සඳහා මෙම න්‍යායාචාරීන් විසින් යහපත් පසුබිමක් ගෙන එන ලදි. මෙම න්‍යාය ඉදිරිපත් කළ න්‍යායාචාරින්ගේ අදහස වුයේ මනෝ විද්‍යාත්මක මතවාද පදනම් කොටගෙන පුද්ගල අන්‍යෝන්‍ය සම්බන්ධතාවයන් පවත්වාගෙන යන්නේ කෙසේද? එලෙස අන්‍යෝන්‍ය සම්බන්ධතා පැවැත්වීම තුළින් පවුලක් තුළ කාන්තාව වින්දිතභාවයට පත්වීම අවම කරගන්නේ කෙසේද? සමාජය තුළ කාන්තාවෝ වින්දිතභාවයට පත්වීමට ඉඩකඩ ඇති කාන්තාවන් විශාල පිරිසක් වින්දිතභාවයට පත්වීම මුලින් උපුටා දැමීම හා වින්දිතභාවය නිසා ඇතිවන සංස්කෘතික ගැටුම් නිර්මාණය, කළමණාකරණය කරන්නේ කෙසේද? යන්න මෙම න්‍යාය තුළින් සාකච්ඡා කරනු ලැබේ[171].

මෙම න්‍යායේ අපරාධ විද්‍යාත්මක පැතිකඩ පිළිබඳව අවධානය යොමු කිරිමේදී අන්තර් ආශ්‍රය පදනම් කොටගෙන නිත්‍යානුකුල ක්‍රියා, අපරාධකාරි ක්‍රියා හා වින්දිතභාවයට පත්වීම පිළිබඳව අවධානය යොමු කරන ලදි. එමෙන්ම මනෝවිද්‍යාත්මක පැතිකඩ තුළින් ද අන්තර් පුද්ගල සම්බන්ධතා කෙරෙහි අවධානයක් යොමු කරන ලදි. ස්ත්‍රීවාදී අදහස් වලින් ස්වයංපෝෂණය වු මෙම න්‍යාය තුළින් අපරාධ විද්‍යාවේ උප විෂය ක්ෂේත්‍රයක් වන ස්ත්‍රීවාදී අපරාධ විද්‍යාව පිළිබදව අවධානය යොමු කෙරේ. මෙම න්‍යාය තුළදී සමාජය තුළ ඇති වන මානසික පීඩනය ස්නායුක වශයෙන් ශරීරයට බලපාන ආකාරය පිළිබඳ ජීව විද්‍යාත්මක අධ්‍යයනය කෙරෙහිද අවධානය යොමු කර තිබේ. උපතේ සිට මරණය දක්වා

[171] J.Jordan. (2018, 1 22). *Relational-Cultural Theory*. Retrieved from Wholeperson: http://wholeperson.com/blog/what-is-relation-cultural-theory

මිනිස් මොළය ප්‍රතිග්‍රහණය කරන චිත්තවේගයන්හි ශාරීරික බලපෑම මෙහිදී අධ්‍යයනය කෙරේ. අපරාධ මනෝවිද්‍යාවට අනුව පුද්ගලයකු අපරාධකාරීත්වයට පෙළඹෙන්නා වූ හේතූන් අතර පවතින සමාජයෙන් එල්ල වන මානසික පීඩනය හා ඒ තුළ හට ගන්නා වූ මානසික ගැටුම යන සංකල්පය කෙරෙහි ද මෙම න්‍යාය තුළ අවධානය යොමු කර තිබේ. පුද්ගලයන් අතර පවතින්නා වූ සම්බන්ධතා යහපත් සම්බන්ධතාවක් බවට පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය කාරණා පහක් මෙම න්‍යාය තුළින් පෙන්වා දී තිබේ. ඒ අනුව, උදෙන්ගය හෙවත් සම්බන්ධතාවයේ ශක්තිය පිළිබඳ හැඟීමක්, සම්බන්ධතාවයේ වටිනාකම පිළිබඳ හැඟීම වැඩි වීම, සම්බන්ධතාවයේ විනිවිදභාවය, සම්බන්ධතාවයේ ඵලදායීතාවය හා වැඩි සම්බන්ධතාවයක් සඳහා ඇති ආශාව, තෘප්තිය[172] වශයෙන් පෙන්වා දිය හැක.

මෙම කාරණා ධනාත්මක චර්යා හා සෘණාත්මක අපගාමී චර්යා නිර්මාණයට ද විවිධ කෝණ වලින් බලපාන ආකාරය අපරාධ විද්‍යා න්‍යාය අනුසාරයෙන් අපට හඳුනා ගත හැකිය. මහා සංස්කෘතිය තුළ ඇති වන්නා වූ පීඩාකාරී අන්තර් පුද්ගල සබඳතා පිළිබඳ මෙම න්‍යාය තුළින් පුළුල් විග්‍රහයක් සිදු කරනු ලැබේ. සංස්කෘතික රාමුව තුළ පීඩාකාරී පීතෘමූලික තත්ත්වය මත කාන්තාව පත්වී ඇති අගාධය මෙම න්‍යායාචාරීන් පර්යේෂණාත්මකව හඳුනාගෙන ඊට පවුල් ව්‍යුහය වඩාත් සුහදායී සාමූහික සහජීවන සමාජ ව්‍යුහයක් බවට පත් කිරීම උදෙසා අදහස් ඉදිරිපත් කළහ. මෙම න්‍යායේ සංවර්ධනීය චරිතයක් වූ Mellissa McCauley විසින් සංස්කෘතිකමය වශයෙන් ඇති වන්නා වූ ගැටළු මඟ හරවා ගෙන සාර්ථක ගැටුම් කළමනාකරණයක් උදෙසා කාරණා කිහිපයක් ඉදිරිපත් කරයි ඒවා නම් ,

- චිත්තවේගී ප්‍රතිචාර දැක්වීමේ හැකියාව.
- අනෙකාගේ දෘෂ්ඨී කෝණයෙන් ගැටළුව දෙස බැලීමට ඇති හැකියාව.
- හැඟීම් පාලනය කිරීමේ හැකියාව
- ස්වයං හා අන්‍යෝන්‍ය දැනුවත් කිරීමට ඇති හැකියාව[173]

ශ්‍රී ලංකාව තුළ ද මෙම උපක්‍රම භාවිතා කරමින් සංස්කෘතික ගැටුමක් ඇති වීමට ඇති ඉඩ ප්‍රස්ථාව ඉවත් කළ අවස්ථා පවතී. උදාහරණයක් ලෙස 2019 අප්‍රේල් 21 පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් පසු ප්‍රබල කතෝලික හා මුස්ලිම් සංස්කෘතික සට්ටනයක් ඇති වීමට ඉඩ විවරව තිබුණි. නමුත් සමාජය විසින් සන්නිවේදන උපක්‍රම යොදාගනිමින් එවන් ගැටුමකට ඇති අවස්ථාව මුලිනුපුටා දැමීය. නමුත් එසේ නොවීමේ ප්‍රබල ඵල විපාක ද ශ්‍රී ලාංකිකයන් වන අප විඳ ඇත්තෙමු. 1915 සිංහල හා මුස්ලිම් කෝලාහලය, 1983 සිංහල හා දෙමළ කළු ජූලිය ඒ දූර්වල ගැටුම් කළමනාකරණයේ අමිහිරි මතකයන් වේ. මෙම න්‍යාය සංස්කෘතික අපරාධ විද්‍යාත්මකව බැලූ කල සංස්කෘතික වශයෙන් සමාජ පීඩනය හා සංස්කෘතික ගැටුම යන සට්ටනකාරී අවස්ථා මඟහරවා ගැනීම උදෙසා මාර්ගෝපදේශ සපයන උසස් මනෝවිද්‍යා න්‍යායයක් ලෙස හඳුනාගත හැකි වේ.

---

[172] J.V.Jorden. (2010). *Relational-Cultural Therapy.* New york: American phychological Association.

[173] Melissa McCauley. (2013, 3). *Relational-Cultural Theory : Fostering Healthy Coexistence Through aRelational Lens.* Retrieved from Beyond Intractability:
https://www.byondintractability.org/essay/relational-cultural-theory

## 2. ධර්මතා න්‍යාය (ප්‍රතිමානක න්‍යාය)

මෙම න්‍යාය පදනම් වී ඇත්තේ චිත්තවේග මතයි. මෙය Arlie Hochschild නම් සමාජ විද්‍යාඥවරිය විසින් ගොඩනගා ඇත. මෙය මනෝ විද්‍යාත්මක පදනමකින් ඉදිරිපත් කරන ලද න්‍යායක් ලෙස හඳුනාගත හැකිය. ඒ අනුව මෙම ප්‍රතිමානක න්‍යාය පදනම් වී ඇත්තේ චිත්තවේග මතයි. චිත්තවේග ඇති වීමේ දී සංස්කෘතික විශ්වාස බලපානු ලැබේ. ඒ අනුව චිත්තවේග කාන්තාවන් හා පුරුෂයන් තුළින් ජනිත වීමේදී ඒවායේ විවිධතාවන් ඇතිවන බව දැකගත හැකිය. එනම් කාන්තාව සහ පුරුෂයා අතර එකිනෙක වෙනස් වූ චිත්තවේග ඇති වේ. ඒ අනුව සංස්කෘතිය තුළ ප්‍රතිමානක අනුව දෙයාකාරයකට පුද්ගලයා තුළ චිත්තවේග පහළවන බව Arlie Hochschild නම් සමාජ විද්‍යාඥවරිය විසින් විග්‍රහ කොට මෙම ධර්මතා න්‍යාය හෙවත් ප්‍රතිමානක න්‍යාය ගොඩනගා ඇත. බොහෝ සමාජ සංස්කෘතින් දෙස බැලීමේ දී කාන්තාව ඛේදජනක ලෙස සිටීමත්, පුරුෂයා ආක්‍රමණශීලී ලෙස හැසිරීමත් දැකිය හැකි අතර, මෙය සිදු වන්නේ සංස්කෘතික ධර්මතා වලට අනුවයි. නිදසුනක් ලෙස අවමංගල්‍ය උත්සවයක් දෙස අවධානය යොමු කිරීමේ දී කාන්තාව විලාප තියමින් හඬා වැටුණද පුරුෂයා එසේ සිදු නොකරයි. ඒ අනුව මෙම ප්‍රතිමානක අනුව පුද්ගලයා චිත්තවේග පිට කරන ආකාරය වෙනස් වන බව පැහැදිලි වේ. මෙය ලොව සෑම සංස්කෘතියක් තුළ ම පාහේ දැකිය හැකි සංසිද්ධියක් ලෙස හඳුනාගත හැකිය. නිදසුනක් ලෙස ශ්‍රී ලාංකික සංස්කෘතිය දෙස අවධානය යොමු කිරීමේදී ශ්‍රී ලාංකික සමාජය තුළ කාන්තාවක් කොක් හඬලා සිනාසීම සංස්කෘතියට අනුරූප නොවන ක්‍රියාවක් ලෙස බැහැර කරයි. නමුත් පුරුෂයෙකුට මෙවැනි තත්ත්වයක් සමාජය තුළ දැකිය නොහැකිය. ඒ අනුව සරලවම සිංහල සංස්කෘතිය තුළ කාන්තාව ලඳ බොළඳ චරිතයක් ලෙසත්, පුරුෂයාට වීරත්වයක්, ආක්‍රමණශීලීත්වයක් ආරෝපණය කරමින් ද සමාජය තුළින් පුද්ගලයා සමාජානුයෝජනය සිදුකොට තිබේ. ඒ අනුව ඔවුන්ගේ චිත්තවේග පහළ වීමේ දී සහ ඒවා ප්‍රකාශ කිරීමේදී මෙම සාධක පැහැදිලි ලෙස බලපානු ලැබේ. සමස්ථයක් ලෙස මෙම ප්‍රතිමානක හෙවත් ධර්මතා න්‍යාය මඟින් විග්‍රහ කරන්නේ සරලවම සංස්කෘතික ධර්මතාවයන් චිත්තවේග සඳහා මූලික වන බවත්, මෙවැනි තත්ත්වයක් අපරාධකාරී චර්යාවන් ජනිත වීමට ඍජුවම හේතු සාධක විය හැකි බවත් ය.

ප්‍රතිමානක හෙවත් ධර්මතා න්‍යාය ප්‍රධාන වශයෙන් චිත්තවේග මත පදනම්ව පවතී. ධර්මතා න්‍යායට අනුව එක් එක් සංස්කෘතීන් තුළ ස්ත්‍රීන්ට සහ පුරුෂයන්ට වෙනස් චිත්තවේග හටගනී. සිතුවිලි හා හැඟීම් එකිනෙකා කෙරෙහි දැඩි බලපෑම් ඇති කරයි. චිත්තවේග හා අපරාධකාරී චර්යාවන් අතර ඍජු සම්බන්ධතාවක් ඇත[174].

ස්ත්‍රීන්ගේ සහ පුරුෂයන්ගේ හෝමෝන මත ද ඇතැම් විට චිත්තවේග වෙනස් විය හැක. ස්ත්‍රීන් බොළඳ ගති පැවතුම් වලින් යුක්ත වීම හා පුරුෂයන් ප්‍රචණ්ඩකාරී ස්වභාවයෙන් යුක්ත වීම සාමාන්‍ය සමාජයේ දැක ගත හැක. චිත්තවේග මත සිදුකරන සාපරාධී ක්‍රියා වෙනස් වේ. නිදසුන් ලෙස කාන්තාවන් -

[174]Emotional deviance: research agendas. T. D. Kemper (Ed.), Research agendas in the sociology of emotions (pp. 180–203).
ගෘහස්ථ හිංසනය -BBC News සිංහල) .2021). Retrieved 20 October 2021, from https://www.bbc.com/sinhala/topics/cvjp2jyj88wt
Thoits, P. A. (1990). Emotional deviance: research agendas.

මත්ද්‍රව්‍ය ජාවාරම, ගණිකා වෘත්තිය, පුරුෂයන් - ප්‍රචණ්ඩකාරී අපරාධ ( මනුෂ්‍ය ඝාතන) ආදි වශයෙන් පෙන්වා දිය හැක. කාන්තාවන්ට වඩා පුරුෂයන්ගේ ආක්‍රමණශීලී චිත්තවේග මත අපරාධ වලට යොමු වීමට වැඩි ඉඩකඩක් ඇත. නිදසුනක් ලෙස ලංකාවේ 2016 බන්ධනාගාර සංඛ්‍යාලේඛන වලට අනුව, සැකපිට අත්අඩංගුවේ සිටින ස්ත්‍රී සිරකරුවන් ගණන 5926, පුරුෂ සිරකරුවන් ගණන 88729 කි.

ධර්මතා න්‍යායට අනුව සංස්කෘතිමය වශයෙන් පුද්ගලයින් තුළ හටගන්නා වූ චිත්තවේග පුරුෂයින් සාපරාධී චර්යාවන් සඳහා යොමු කරයි. ස්ත්‍රියට හා පුරුෂයාට සංස්කෘතිය විසින් ආරෝපණය කර ඇති චිත්තවේගයන් අපරාධවල වින්දිතභාවයට ලක්වීම කෙරෙහි බලපාන බවද හඳුනා ගත හැකිය. පුරුෂ මූලික සංස්කෘතිය අගයන රටවල් තුළ කාන්තාවට අත්කර දී ඇත්තේ සමාජයේ දෙවන තලය වන අතර එකී සංස්කෘතිය තුළ ස්ත්‍රීයට පුරුෂයාට සාපේක්ෂව සම අයිතීන් හිමිකර දී නොමැත. මෙකී සාධක පදනම් කර ගනිමින් කාන්තාව විවිධාකාරයෙන් වින්දිතභාවයට ලක්වනු දැක ගත හැක. ගෘහස්ථ හිංසනය ඒ අතරින් සාකච්ඡාවට බඳුන් වන ප්‍රධානම මාතෘකාවකි. කුටුම්බය තුළ පුරුෂයා මූලික යන හැඟීම ඇති කිරීමේ ප්‍රතිඵලයක් ලෙස නූතනයේ පුරුෂයන් එකී සංස්කෘතියෙන් ආරෝපණය කර දී ඇති තත්ත්වය ඉක්මවා යමින් කාන්තාවන්ට නොයෙකුත් වදහිංසා පමුණුවන තත්ත්වයක් පැන නැඟී ඇත. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 2019 වසරේ සිදු කළ කාන්තා සුබසාධන සමීක්ෂණ වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගෙන් 35.3% ක් තම බිරිඳට පහර දීමට පුරුෂයන්ට හොඳ හේතුවක් තිබිය හැකි බවට එකඟ වී ඇති අතර, කාන්තාවන්ගෙන් 47.5% ක් පුරුෂයන් කාන්තාවන්ට වඩා උසස් යැයි පවසා ඇත. ආසියාතික රටක් වන චීනය යනු පවුල් සමගිය තවමත් වැදගත් සහ අගය කොට සලකනු ලබන ගැඹුරු සාම්ප්‍රදායික සමාජයක් ලෙස පැවතීම හේතු කොට ගෙන එරට තුළද ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇත. එරට සමාජ ක්‍රියාකාරීන් පවසන්නේ බොහෝ ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා තවමත් වාර්තා නොවී පවතින බවයි. මෙයට හේතුව සංස්කෘතිය මඟින් කාන්තාව මත පටවා ඇති චිත්තවේගයන් වේ. පුරුෂයන් අපරාධ වින්දිතභාවයට ලක්වීම කතා කිරීමේදී ඔවුන් තුළ සංස්කෘතියෙන් ආරෝපණය කර ඇති ඉහත දක්වන ලක්ෂණ හේතුවෙන් මනුෂ්‍ය ඝාතනයන්ට, පහරකෑම් වලට, සොරකම් වලට වැඩි වශයෙන් ගොදුරු බවට පත්වනු දැක ගත හැකිය. මෙම න්‍යාය මඟින් දක්වන ආකාරයෙන් කාන්තාව නිරතුරුවම සංස්කෘතිය මඟින් ආරෝපණය කර ඇති චිත්තවේග මත ඛේදජනක තත්ත්වයකට ගොදුරු වන බවත්, පුරුෂයාට දී ඇති චිත්තවේග මත ඔවුන් ද අපරාධ වින්දිතභාවයන්ට ලක්වන බව හඳුනාගත හැකිය.

## 3. ලෝරන්ස් කොල්බර්ග්ගේ සදාචාරාත්මක සංවර්ධනය පිළිබඳ න්‍යාය

ලෝරන්ස් කොල්බර්ග් (Lawrence Kohlberg 1927 – 1987) ඇමරිකානු මනෝ විද්‍යාඥයෙකි. මොහු තම ආචාර්ය උපාධිය ලබාගත් වර්ෂ 1958 දී, සදාචාරාත්මක සංවර්ධන න්‍යායේ අවධීන් ඉදිරිපත් කළේය. මේ සමයේ බොහෝ මනෝ විද්‍යාඥයින් සිතුවේ, සදාචාර සංවර්ධනය යනු, සාමාජීය වශයෙන් සම්ප්‍රේෂණය වන සම්මතයන් අභ්‍යන්තරීකරණයට වඩා වැඩි දෙයක් නොවන බවයි. ප්‍රධාන වශයෙන් එය දෙමාපියන්ගේ සිට ළමයින් දක්වා, ශක්තිමත් කිරීමේ හා දඬුවම් කිරීමේ ක්‍රම හරහා සම්ප්‍රේෂණය වන බව ඔවුන් පිළිගත්තා ලදී[175]. නමුත් එම මතයට පටහැනි ව, කොල්බර්ග් විසින් තර්ක කරන ලද්දේ, තර්කනය වැනි වෙනත් හැකියාවන් සේම, සදාචාරාත්මක චින්තනය ද තනිවම වර්ධනය වන බවයි. ඊට ළමයින්ගේ අභ්‍යන්තර චින්තන හා ප්‍රජානන ක්‍රියාවලිය සේම බොහෝ ළමයින් ඇති දැඩි කරන පිළිවෙල, ඔවුන් ලබන ඉගෙනුම් සහ අත්දැකීම් ද වැදගත් වන බව පෙන්වා දෙන ලදී. කොල්බර්ග් සදාචාර සංවර්ධනය නිර්වචනය කරන්නේ, “සාධාරණත්වය පිළිබඳ හැඟීමෙහි වර්ධනයක් ලෙසිනි”. මොහු තම න්‍යාය ඉදිරිපත් කිරීමට සරල පරීක්ෂණයක් තුළින්, විශාල නියැදියකින් ලබාගත් පිළිතුරු මත සදාචාර සංවර්ධනය පිළිබඳ අවධි කීපයක් පෙන්වාදෙන ලදී. එය ළමයින්ගේ සදාචාරාත්මක චින්තනය වර්ධනය කර ගැනීමේ ප්‍රධාන මට්ටම් තුනකින් හා අදියර හයකින් සමන්විත වේ[176].

**පූර්ව සාම්ප්‍රදායික මට්ටම (අවු 4-10 තෙක්)**

මෙම අවධියේ දී, සෑම ක්‍රියාවක්ම විනිශ්චය කරනු ලබන්නේ, එහි වඩාත්ම ඍජු ප්‍රතිවිපාක පදනම් කරගෙනය. මෙම මට්ටමේ සිටින ළමයින් තමන් ගැන පමණක් සැළකිලිමත් වේ. මෙහි අදියර ද්විත්වයකි. එහි පළමු අදියරය තුළ යම් ක්‍රියාවක් සුදුසුද, නැද්ද යන්න මැනීම සඳහා බාහිරව ලැබෙන ත්‍යාග සහ දඬුවම් භාවිතා කරයි. දෙවැනි අදියරයේ දී, ඊට පටහැනිව, පුද්ගලයාට ඉන් ඔබ්බට සිතා බලමින්, එක් එක් අවස්ථාවන් යටතේ ඇතිවිය හැකි යැයි ඔහු විශ්වාස කරන ප්‍රතිවිපාක කෙරෙහි අවධානය යොමු කරයි. මේ ආකාරයෙන් ඔහු ලෝකය සාපේක්ෂ ආකාරයකින් දකින අතර, නිරපේක්ෂ සදාචාරය විශ්වාස නොකරයි.

**සාම්ප්‍රදායික මට්ටම (අවු 10-13 තෙක්)**

සදාචාර සංවර්ධනය පිළිබඳ මෙම මට්ටමේ දී, ළමයින් එකිනෙකාගේ දෘෂ්ටිකෝණයන් සැලකිල්ලට ගනී. ඔවුන් පුද්ගල අවශ්‍යතා සඳහා සේවය කරන ආකාරය මත පදනම්ව ක්‍රියාවන් විනිශ්චය කරති. මෙම මට්ටම නව යොවුන් වියේ සහ වැඩිහිටියන් අතර වඩාත් සාමාන්‍ය වේ. යම් ක්‍රියාවක් සදාචාරාත්මකද? නැද්ද? යන්න, සමාජයේ අපේක්ෂාවන් හා චින්තන ක්‍රම මත පදනම් වී තිබේ ද?

175 Mcleod, S. (2013, October 24). *Kohlberg's Stages of Moral Development*. Simplypsychology.org; Simply Psychology. https://www.simplypsychology.org/kohlberg.html
176 Mcleod, S. (2013, October 24). *Kohlberg's Stages of Moral Development*. Simplypsychology.org; Simply Psychology. https://www.simplypsychology.org/kohlberg.html

යන්න, එහි සිටින අය විනිශ්චය කරති. මෙහි සඳහන් තෙවන අදියරයේ දී, පුද්ගලයා ක්‍රියාවක සදාචාරය විනිශ්චය කරන්නේ, එය සමාජයේ බහුතරයක් විසින් අනුමත කරන ලද දෙයක්ද? නැද්ද? යන්න මතයි. සිව්වන අදියරයේ දී, සමාජ සම්මතයන් පිළිගැනීම විධිමත් හා ක්‍රියාකාරී සමාජයක් ආරක්ෂා කිරීම හා සම්බන්ධ වේ. මෙම අදියරේදී බාහිර අනුමැතීන් එතරම් වැදගත් කොට නොසලකයි.

**පශ්චාත් සාම්ප්‍රදායික මට්ටම (අවු 13 සිට)**

මෙම මට්ටම, හොඳ පිරිමි ළමයා, හොඳ ගැහැණු ළමයා දිශානතිය ලෙස හැඳින්වේ. සදාචාර සංවර්ධනයේ අන්තර් පුද්ගල සම්බන්ධතාවයන් පිළිබඳව මෙම මට්ටමේ දී වැඩි අවධානයක් යොමු කරයි. මෙම මට්ටමේ සිටින්නන් එක් එක් පුද්ගලයා සමස්ථයක් ලෙස සමාජයෙන් වෙන්ව සිටින බව විශ්වාස කරන බැවින් වෙනත් කිසිවෙකු සමඟ ඔවුන්ගේ අදහස් හා ආචාරධර්ම බෙදා නොගනී. ඔවුන් බොහෝ විට ජීවත් වන්නේ ඔවුන්ගේ මූලධර්මයන්ට අනුව ය. මෙහි පස්වන අදියරයේ දී, පුද්ගලයා ලෝකය වටහා ගන්නේ, අදහස් සහ සාරධර්ම සමූහයක් ලෙසට ය. ඒවා බෙදා නොගත්ත ද ඒවාට ගරු කළ යුතු බැවින් සමාජ පිළිවෙළ පවත්වා ගැනීම සඳහා නීති අවශ්‍ය යැයි සැලකේ. ඊට පටහැනි, හයවන අදියරයේ දී, පුද්ගලයාට ඇති එකම වලංගු ආචාර ධර්මය වන්නේ, ඔහුගේම තාර්කික චින්තනය වන බැවින් නීති පැවතිය යුත්තේ, මෙම විශ්වීය සදාචාරාත්මක අවශ්‍යතාවයන් මත ක්‍රියා කිරීමට පුද්ගලයින් දිරිමත් කිරීමට පමණක් බව පිළිගනී[177].

මෙලෙස හඳුන්වනු ලැබූ සදාචාරාත්මක සංවර්ධන න්‍යාය සංස්කෘතික අපරාධ විද්‍යාත්මක දෘෂ්ටිකෝණය යටතේ විග්‍රහ කළ හැකිය. එහිලා සංස්කෘතික අපරාධ විද්‍යාව, අපරාධ විද්‍යාව යටතේ සාකච්ඡා කරනු ලබන එක් සුවිශේෂී උප විෂයකි. මෙකී විෂය, අපරාධ සම්බන්ධයෙන් සංස්කෘතිකමය දෘෂ්ටිකෝණයක් ඔස්සේ අධ්‍යයනය කිරීම සිදු කරයි. ඒ අනුව සංස්කෘතික අපරාධ විද්‍යාවේ කේන්ද්‍රය වන්නේ, සංස්කෘතිය නම් සාධකයයි. මෙකී සංස්කෘතිය අසීමිත වේ. ඒ අනුව, යම් සමාජයක ඇඳුම්, පැළඳුම්, සදාචාරය, සිරිත් විරිත්, විශ්වාස, පුදපූජා, ආර්ථිකය, දේශපාලන හා ආගමික චර්යාව යනාදී සියල්ලම සංස්කෘතියට අයත් වේ. ඒ අතුරින් සදාචාරය යනු , සංස්කෘතියක් යහපත් එනම් ධනාත්මකව වර්ධනය වීම සඳහා අත්‍යාවශ්‍ය වන සාධකයකි. මෙකී වර්ධනය දරුවෙකුගේ ප්‍රාථමික සමාජානුයෝජන ක්‍රියාවලියේ සිට කළ යුතු සහ අනාගත සමාජය යහපත් අයුරින් ගලා යෑම සඳහා මෙලෙස සදාචාරය මනාව වර්ධනය කිරීම වැදගත් වේ. ඒ අනුව සදාචාර සංවර්ධනයක් නොමැති පිරිහුණු සමාජයක, සංස්කෘතික හර පද්ධතීන් පිරිහෙනවා සේම, අපරාධකාරී ක්‍රියාවන් සඳහා වන නැම්යාවද ඉහළ අගයක් ගනු ඇත. නිදසුනක් ලෙස මුඩුක්කු සංස්කෘතිය තුළ සදාචාරාත්මක වශයෙන් ගොඩනැගුණු යහපත් සංස්කෘතික ලක්ෂණ දුලබ වන බැවින්, ඒ තුළ සංස්කෘතිය පිරිහීමත්, අපරාධකාරීත්වය වර්ධනය වීමත් සිදු වේ. එමඟින් සමාජයේ සෙසු පිරිස් ද වින්දිතභාවයට පත් වේ. ඒ අනුව යහපත් සදාචාරාත්මක

[177] Cherry, K. (2019). *Levels of developing morality in kohlberg's theories*. Verywell Mind. https://www.verywellmind.com/kohlbergs-theory-of-moral-development-2795071

සංවර්ධනයක් නොමැති තැන අපරාධ ඇති වීමත්, එතුළින් සෙසු පිරිස ද වින්දිතභාවයට පත් වන බව මනාව පැහැදිලි වේ. එමෙන්ම, සදාචාරය පිරිපුන් සමාජයක යහපත් සංස්කෘතියක් බිහිවනවා සේම, පුද්ගලයා අපරාධ සිදු කිරීම කෙරෙහි දක්වනු ලබන නැඹියාවද අවම වේ. ඒ අනුව, සදාචාරාත්මක සංවර්ධනයේ ස්වභාවය යම් සමාජයක අපරාධකාරීත්වය ඇතිවීම සඳහා බලපානු ලබන ප්‍රබල සාධකයක් ලෙස පෙන්වා දිය හැක. එහිලා, කුඩා කළ සිට සදාචාර සංවර්ධනය යහපත් අයුරින් සිදුවීම මත යහපත් සමාජ, සංස්කෘතික සන්දර්භයක් නිර්මාණය වන අතර, එවැනි සමාජයන් හි අපරාධ බිහි වීම ද අවම මට්ටමකට ගෙන එනු ඇත.

## 4. Conflict Theory of Culture.

Culture conflict theory is also known as cultural deviance theory. This theory was presented by Johan Thorsten Sellin. Thorsten Sellin was born inonctober 26, 1896, in Sweden. He is a sociologist, criminologist, and member of the Chicago School. Social Science Research Council appointed both Edwin Sutherland and Thorsten Sellin to form “a subcommittee on the delinquency of the Council's Committee on Personality and Culture”[178]. They both did this research in collaboration. Sellin wrote the final report regarding this culture conflict theory. According to this, cultural conflict and crime are created as a result of a conflict between cultural norms.

According to Seline, norms are key elements of a person's personality. So, their behavior also depends on their norms. Seline was of the opinion that variation in norms would cause conflict. For example, The LTTE conflict is a conflict between the Sri Lankan government and the LTTE. The LTTE wants to create an independent state in the north-eastern part of Sri Lanka. This creates a war. It can be considered as a conflict situation caused by one culture. According to Sellin, those conflicts can reduce through successful integration.

## Cultural Impact on Gender-Based Violence.

Gender is a concept that has emerged through the social aspects of sex and sexuality and it is prioritize the social role of humans. Therefore, can understand that gender is a fact that decide by society as well as culture. An Anthropologist as well as a Sociologist, Edwin S. Segal (2003) has clarified gender as “Gender is taken to refer to a culturally based complex of norms, values, and behaviors that a particular culture assigns to one biological sex or another”[179]. It emphasized that gender represents a set of cultural factors that transfer a culture on a biological basis and thus determine gender.

When analyzing the impact of culture on gender, it can be seen that both positive and negative effects of culture. Among those negative effects, ‘gender-based violence’ is more significant. Gender-based violence is also one of the paramount issues that can be recognized regarding gender. Gender-based violence is one of the gravest human rights violations. This can impact

---

[178] Sellin, T. (1938). Culture Conflic and Crime. *The University Of Chicago Press*, *44*(1). https://doi.org/https://doi.org/10.1086/217919

[179] Segal, S.S. (2003). *Cultural Constructions of Gender*. [Online]. Available from: https:// link.springer.com/referenceworkentry/10.1007%2F0-387-29907-6_1

both males and females as well as the LGBTQ community under modern circumstances. United Nations General Assembly (UNGA) has defined gender-based violence as, “violence that is directed against a person based on their gender or sex, including acts that inflict physical, mental or sexual harm or suffering, threats of such acts, coercion and other deprivations of liberty”. It implies that any physical, mental, or sexual suppression or harassment, or deprivation of liberty based on one’s sexuality or gender is gender-based violence.

In the discussion of gender-based violence and the cultural impact, it should be addressed on both men and women that identifiable, as well the LGBTQ community which can be identified as a third party of the gender should also be discussed. Therefore, pre-studies on gender-based violence and cultural impact have also focused on these gender types. (E.g., The World Health Organization (WHO) annually researches gender-based violence in all countries of the world and publishes country reports. Accordingly, the cultural impact of the violence based on each of these communities can be clarified as follows.

Many societies in the world today, are male-dominated societies and cultures. This situation is because the men have been assigned by the culture to feed the family, based on their physical strength. As previously mentioned, culture has made this transfer to men, and many cultures believe that men should always be earners and women and children should be dependent. In the reminiscence of ancient and modern cultures, it can be identified that certain cultures are matriarchal, but even within those cultures, it is difficult to identify the violence against men. For example, the Moscou culture of Tibet has a matriarchal culture and matrilineal society but the men are independent but have been the earner of their partners.

Although, there are limited evidences of violence against men on cultural grounds which are known as surgical forms, like male circumcision. And all these practices are still can be seen, especially in Islamic culture, as well as in African tribal cultures. Nevertheless, some studies have shown that men are more prone to violence due to the impact of culture. According to the WHO’s “Violence Prevention the Evidence” report (2009), “traditional beliefs that men have a right to control or discipline women through physical means makes women vulnerable to violence by intimate partners…”. Thus, it is clear that men are perpetrating violence against women under the impact of culture. From all these elements it is conspicuous that there isn’t violence against the men on cultural grounds or impacts and the violence against the other genders is perpetrated based on cultural impact on men.

In the study of gender-based violence and cultural impact, women are momentous, because they are the violence against women is the most pervasive human rights violation in the current world (Heise, L. Ellsberg, M. Gottmoeller, G., 2002). It is a well-rooted fact that the role of women should be to give birth to children, take care of them and do house duties[180]. Also, some cultures believe that women are there to fulfill men's sexual desires and facilitate them. For example, the Islamic culture and some African tribe cultures. The cultural impact of violence against women can be elaborated on in three aspects, "Sexual violence, Physical Violence, and Psychological Violence".

Under the physical violence against women, domestic violence is the embodiment. Due to the cultural beliefs that women should be dependent on men and cultural practices like patriarchy, women have to be subjected to various forms of physical abuse, which can be ended by death (UNCHR, 2010). According to United Nations, the Middle East and North Africa region have the highest rates of violence against women and that dominated completely dominating by the Islamic culture (who.int, 2020). Under the sexual violence against women, can be revealed that some cultures neglect women's sexual rights and still men dominating all the privileges of sexual desires (Riyani, I., 2014, cited in media.neliti.com). Also, some mutant traditions like, female circumcision, excision or clitoridectomy, and infibulation or pharaonic circumcision can be seen among African cultural groups as well as some Islamic cultures (OHCHR, 1995). In psychological violence, some traditional practices and beliefs can be revealed. For example, some beliefs of Hinduism discriminate the women as adulterated, some Hindu people still neglecting the birth of girls due to that. As well as, in Islamic culture and some African tribal cultures some rules that make women mentally distressed. According to United Nations (2020), women are also mentally distressed by the domestic violence and household duties which they have as a cultural legacy. Some cultures of India, follow some strict rules on marriages and those rules make them more inconvenient, and if it is not they have to be a victim of 'honor killings.

LGBTQ community is a group of people who are unable to identify as straight or cisgender[181]. This community have their own culture and, live as a separate community. Some people and cultures neglect these LGBTQ communities and unleashing violence on them. That can be happen as neglect, sexual exploitation, physical harassment or mental depression. In the study

[180] Thebaud, S., Kornich, S., Ruppanner, L., (2019). Good Housekeeping, Great Expectations*: Gender and Housework Norms*. [Online].Available from: https://journals.Sagepub.com/doi /full/10.1177/0049124119852395.
[181] Engage.youth.gov. (2021). *What does LGBT means?* [Online]. Available from: https:// engage.youth.gov/resources/what-does-lgbt-mean-know-basics.

of unleashing the violence on LGBTQ people, can be identified that many eastern cultures neglect and make them victimize. For example, 78 countries have banned the homosexuality and majority of it in Asia including Sri Lanka. Islamic culture is on a strict manner against the LGBTQ community. For example, homosexuality considering as a criminal offence[182]. China is the country that holds the largest LGBTQ population in the world, but they discriminated the LGBTQ people and it can be usually ended with imprisonment. A study all these factors indicate that gender-based violence is based on cultural impact.

**According to this theory in today's society.**

That theory can identify in present society. For an example, the Taliban conflict in Afghanistan. There are cultural norms and values in Afghan culture. The Taliban also have cultural norms that they apply to common Afghan culture through war. The clash of cultures can be pointed out as the reason for this war. There are many conflicts in the world such as the Syria conflict, the ISIS conflict. That can identify cultural conflict theory through this.

Not only that there have been conflicts based on religion such as the Pasku bomb attack. Further cultural conflict theorists explained, that when the cultural elements of the majority of the society are going to be applied to the minority, that minority creates various conflicts against it. According to this explanation, the end of this theory of cultural conflict is that subcultural theory is created.

[182] Riyani, I. (2014). *Research on Women Sexuality in Islam*. [Online]. Available from https://media.neliti.com/media/publications/243329-none-223054f2.pdf:

## 5. නවීකරණ න්‍යාය

නවීකරණ න්‍යාය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී මෙම න්‍යායේ ආරම්භක පුරෝගාමීන් අතරට ජර්මානු ජාතික සමාජ විද්‍යාඥයෙක් වන මැක්ස් වේබර් සහ හාවර්ඩ් සමාජ විද්‍යාඥයෙකු බවට වන ටැල්කොට් පාසන් හඳුනාගත හැකිය. මැක්ස් වේබර් විසින් මෙම නවීකරණ න්‍යාය සම්බන්ධයෙන් ආරම්භක පදනම දැමීම සිදුකළ අතර පසුව ටැල්කෝට් පාසන් විසින් මෙම න්‍යාය සංවර්ධනීය න්‍යායක් වශයෙන් හඳුන්වා දීමට උත්සුක වන්නට විය. ඒ අනුව මොහු විසින් 1930 දශකය පමණ වන විට මැක්ස් වේබර්ගේ කෘති ඉංග්‍රීසි භාෂාවට පරිවර්ථනය කරමින් මෙම න්‍යාය තවදුරටත් වර්ධනීය න්‍යායක් බවට පත් කිරීම සඳහා අඩිතාලම දමන ලදී. මෙම නවීකරණය සම්බන්ධ න්‍යාය 1950-1960 අතර කාලය තුළ දී ලෝකයේ ඉතාමත් ගැඹුරින් අධ්‍යයනය වන්නට වූ අතර 1970 දශකය පමණ වන විට මෙම නවීකරණ න්‍යාය සම්බන්ධයෙන් සමාජය තුළින් විවිධ ආකාරයේ විවේචනාත්මක අදහස් ඉදිරිපත් වීම ආරම්භ වන්නට විය. එනම් මේ අතර ඉදිරිපත් වූ ප්‍රධාන විවේචනාත්මක අදහස බවට පත් වූයේ මෙම නවීකරණ න්‍යාය යටතේ රටක පවතින්නා වූ සංස්කෘතීන් විනාශ මුඛය කරා ගමන් කිරීමට රුකුලක් වන බවටය. ඇන්ඩ්‍රේ ගුන්ඩර් ෆ්‍රැන්ක් 1929-2005 සහ ඉමානුවෙල් වොලර්ස්ටයින් 1930-2019 විසින් මෙලෙස මේ සම්බන්ධයෙන් විවේචනයන් ඉදිරිපත් කරන්නට විය[183].

නවීකරණ න්‍යායේ අන්තර්ගතය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී නවීකරණ න්‍යාය යනු සත්‍ය වශයෙන්ම සමාජයේ පවතින්නා වූ විවිධාකාර සමාජ විචල්‍යයන් සහ සමාජ ප්‍රගමනය යන කරුණු ආශ්‍රය කොටගෙන සමාජ පරිණාමය ක්‍රියාවලිය පැහැදිලි කිරීමට උත්සහ දරන න්‍යායක් වශයෙන් හඳුනාගත හැකි අතර නවීකරණය නැමැති සංකල්පය සම්බන්ධයෙන් විවිධාකාරයේ නිර්වචනයන් ඉදිරිපත්ව තිබෙන ආකාරය හඳුනා ගත හැකිය. නවීකරණය යනු පූර්ණ කොන්දේසි, සමකාලීන හා ප්‍රතිවිපාක අනුව ආර්ථික සංවර්ධනය හා සම්බන්ධ සමස්ත සමාජ ක්‍රියාවලියක් වශයෙන් විටෙක හඳුන්වනු ලබන්නේය[184]. නවීකරණ න්‍යායේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අවධානය යොමු කළහොත් සමාජයේ මුල්බැසගෙන සිටින්නා වූ සාම්ප්‍රදායිකත්වය සහ නවීණත්වය යන සමාජ සාධක ද්විත්වය අතර පවත්නා වූ පරතරය වෙනස් කරමින් සමාජය තුළ කාලාන්තරයක් තිස්සේ මුල්බැසගෙන සිටි සාම්ප්‍රදායිකත්වය වෙනුවට නවීනත්වය ආදේශ කිරීමට කටයුතු කිරීම මෙම නවීකරණය න්‍යාය යටතේ සිදුවන්නා වූ ක්‍රියාවලිය වශයෙන් අපට හඳුනා ගත හැකිය. මෙම නවීකරණයේ අවශ්‍යතාවය පහදන විචාරකයන් සඳහන් කරනුයේ සාම්ප්‍රදායිකත්වය තුළ මිනිසාට කාලන්තරයක් තිස්සේ මුල් බැසගෙන සිටිය නොහැකි බවත්, මිනිසාගේ වැඩ කටයුතු පහසු කර ගැනීමට සහ චින්තනමය දියුණුවක් ඇති කරගැනීමේ අවශ්‍යතාවය මත සාම්ප්‍රදායිකත්වය වෙනුවට නවීනත්වය ආදේශ කිරීමේ අවශ්‍යතාවය මත මෙම නවීකරණ න්‍යාය ඔස්සේ නවීකරණය සිදුකරන බවත් ය.

නවීකරණ න්‍යාය යටතේ අපට හඳුනා ගත හැකි සුවිශේෂී තත්ත්වයක් බවට පත්වන්නේ මෙම නවීකරණ න්‍යාය යටතේ ඇති අත්පත් කරගනු ලබන තත්වයන් නැවතත් සාම්ප්‍රදායිකත්වය කරා ගමන් නොකරන බව යන්නයි. එනම් යම්කිසි සාම්ප්‍රදායික තත්වයක් නවීකරණය ආදේශ කිරීම තුළ

---

[183] Science Direct. (2009). Modernization Theory. Retrieved 9th October 2021 from https://www.sciencedirect.com/topics/social-sciences/modernization-theory

[184] Barnstein. (2007). Modernization theory and sociological study of development. *The Journal of Development Studies.* https://doi.org/10.1080/00220387108421356

නවීනත්වයට පත් වූ පසුව පෙර පැවති සාම්ප්‍රදායික තත්වය ළඟා කරගත නොහැකි බවත් මේ තුළින් පිළිඹිබු වේ. අතීතයේ මිනිසුන් තම ආරක්ෂාව සඳහා අවි ආයුධ වශයෙන් භාවිතා කරන ලද්දේ දුනු ඊතල ආදියයි. නමුත් අතීතයේ පැවති එම සාම්ප්‍රදායික සමාජය නවීකරණයට ලක්වීමත් සමඟම මෙම දුනු ඊතල වෙනුවට මිනිසුන් අවි ආයුධ නිෂ්පාදනයට යොමු වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් මිනිසුන් දුනු ඊතල පසෙකලා ගිනි අවි භාවිතයට යොමු විය. එමෙන්ම වත්මන් සමාජය දෙස අවධානය යොමු කිරීමේදී මෙම ගිනි අවි භාවිතය තවදුරටත් නවීකරණය වීමේ ප්‍රතිඵලයක් ලෙස අද මානවයා තම බලය ආරක්ෂාව යන සාධක සඳහා ජීව විද්‍යාත්මක අවි භාවිතය දක්වා නවීකරණයේ ප්‍රතිඵලයක් වශයෙන් පත්ව ඇති බවක් දැකිය හැක්කේය[185]. ඉහත සඳහන් උදාහරණය ඔස්සේ මෙම නවීකරණය යටතේ මිනිසා පෞරාණිකත්වයේ සිට නූතනත්වයට ළඟා වී ඇති බවක් හඳුනා ගත හැකිය. ඒ අනුව මෙම සමාජ නවීකරණය සෑමවිටම ඉදිරියට ගමන් කරනවා විනා නැවතත් කිසිඳු මොහොතක පෞරාණිකත්වය කරා නැවතත් ගමන් කර නොමැති බවක් පසක් වන්නේය. මෙය මෙම නවීකරණ න්‍යායේ දැකිය හැකි සුවිශේෂී තත්ත්වයක් වශයෙන් අපට හඳුනා ගත හැකිය.

මෙම තත්ත්වය තුළ බොහෝමයක් සංවර්ධිත රාජ්‍යයන්ගේ පවතින්නා වූ ගුණාත්මක අංගයන් සහ සංස්කෘතික අංගයන් ඊට පහළ රාජ්‍යයන් විසින් නවීකරණයේ අතුරු ඵලයක් ලෙස තම සාම්ප්‍රදායික සමාජ ක්‍රමයට ආරෝපණය කරගැනීම සිදුකිරීම මෙම නවීකරණ න්‍යාය යටතේ දැකිය හැකි තත්ත්වයක් බවට පත්වන්නේය. මේ යටතේ බොහෝමයක් රාජ්‍යයන් නවීකරණයේ ඵලයක් ලෙස ආරෝපණය කරගනු ලබන සංස්කෘතිකාංගයන් කරණ කොටගෙන, පවතින සාම්ප්‍රදායික සමාජ පද්ධතියේ සමාජ පර්යාය බිඳවැටීම හේතුවෙන් සංස්කෘතිකමය වශයෙන් විවිධ විපර්යාසයන් සිදුවන පරිසරයක් නිර්මාණය වේ[186]. පෙර සඳහන් පරිදි මෙලෙස නවීකරණයේ ඵලයක් වශයෙන් ඇතිවන තත්ත්වයන් නැවත තිබූ තත්ත්වයට පරිවර්තනය කිරීමේ නොහැකියාව මත සමාජයේ පවත්නා සමාජ සංවිධානයන්, සමාජ ගනුදෙනු ආදිය විපර්යාසයන්ට භාජනය වීමේ ප්‍රතිඵලයක් ලෙස නිර්මිත නව සංස්කෘතික තත්ත්වය තුළ පුද්ගලයන් අපරාධ වින්දිතයන් බවට පත්වන ආකාරය පැහැදිලි වනු ලබයි. සමාජ නවීකරණ සිද්ධාන්තය පිළිබඳව හඳුනා ගැනීමේදී මූලික වශයෙන්ම සාම්ප්‍රදායිකත්වයෙන් නවීනත්වය ආදේශ කරමින් සමාජය නවීකරණය වීමේ ක්‍රියාවලියක් මූලික වශයෙන්ම හඳුනාගත හැකිය. ඒ අනුව මෙලෙස සිදු වූ නවීනත්වය පිළිබඳව හඳුනා ගැනීමේදී මූලික වශයෙන්ම පහත කරුණු ත්‍රිත්වය මූලික කරගනිමින් අධ්‍යයනය කිරීම වඩාත් ඵලදායික වේ. ඒ අනුව නවීනත්වය සමාජ සංස්ථා කෙරෙහි ඇති වූ බලපෑම, නවීකරණය මත පුද්ගලයාගේ සමාජ ගනුදෙනුවේ හැසිරීම හා සමාජ විසංවිධානකාරිත්වය කෙරෙහි නවීකරණයේ බලපෑම යනාදී වු කරුණු මත මෙකී සිද්ධාන්තය ව්‍යවහාරික ක්ෂේත්‍රයෙහි සිදු ව ඇති බලපෑම සම්බන්ධව අධ්‍යයනය කිරීම සිදු කිරීම වඩාත් පහසුය.

---

185 සමරකෝන්,එම්.(2018). *සමාජ වෙනස්වීම්.* කතෘ ප්‍රකාශණ.
186 Thompson, K. (2017). *Modernization theory.* Retrieved 10th October 2021 from https://revisesociology.com/modernization-theory/

ඒ අනුව නීල් ස්මෙල්සර් නම් සමාජ විද්‍යාඥයා දක්වන පරිදි මෙම අංශයන්හි ඇති වූ සාම්ප්‍රදායිකත්වය නවීකරණය වීම හඳුනා ගැනීම තුළ සමාජ නවීකරණ ක්‍රියාවලිය වඩාත් පහසුවෙන් හඳුනාගත හැකි බව දක්වනු ලබයි[187]. ඒ අනුව සමාජය තුළ ගොඩනැගී ඇති සමාජ සංස්ථාවන් වන පවුල, ආගම, ආර්ථිකය, දේශපාලනය සහ ආගම යනාදී වූ සමාජ සංස්ථාවන් මෙම නවීකරණ සිද්ධාන්තය තුළ සංකීර්ණත්වයට පත්ව තිබේ. අතීත සමාජය තුළ මෙම සමාජ සංස්ථාවන් තුළ තිබූ සාම්ප්‍රදායිකත්වය ඉක්මවා ගොස් ඒ වෙනුවට නවීනත්වය නිර්මාණය වී ඇති ආකාරය හඳුනාගත හැකිය. එහිදී අතීතයේ සුවිශේෂ කාර්යභාරයන්, ව්‍යුහයන් සහ අන්තර් සබැඳියාවන් මෙකී නවීනත්වය තුළ සංකීර්ණත්වයට පත් වෙමින් සමාජ සංස්ථාවන්හි ස්වරූපයන් විවිධාංගීකරණයට පත්ව ඇත. නිදසුනක් වශයෙන් අතීතයේදී පවුල තුළ විස්තෘත ස්වරූපයක් පෙන්නුම් කළ ද වර්තමානය තුළ පවතින ආර්ථික, සමාජ සහ දේශපාලනික යන සාධක මුල් ව න්‍යෂ්ටික පවුල් බවට වර්තමානයේ පවුල පත්ව ඇත. එසේම ආගම, වර්තමානය තුළ නවාංගයන් එක් වෙමින් විපර්යාසයන්ට පත්ව ඇති ආකාරය තවත් නිදසුනක් වශයෙන් පෙන්වා දිය හැකිය. මෙසේ සමාජ සංස්ථාවන් නවීකරණය මත සංකීර්ණත්වයට පත්වීම තුළ සංස්කෘතික වශයෙන් ඝට්ටනයක් නිර්මාණය වන අතර ඒ තුළ පුද්ගලයා අපගාමීත්වයට යොමුවනු ලබයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් අපරාධ වින්දිතයන් සමාජය තුළ ගොඩනැගීම සිදුවන බව සඳහන් කළ හැකිය. එහිදී ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, ළමා අපයෝජනය, අන්තවාදී ආගමික ත්‍රස්තවාදී කණ්ඩායම් ඇති වී අපරාධකාරීත්වයන් නිර්මාණය වීම හා, ඒ ඔස්සේ අපරාධ වින්දිතයින් නිර්මාණය වේ[188].

නවීකරණය මත ඇතිවනු ලබන පුද්ගලයාගේ සමාජ ගනුදෙනුවේ හැසිරීම පිළිබඳව අධ්‍යයනය කළහොත් සමාජ ගනුදෙනුව විවිධාංගීකරණයට ලක් කරමින් සංකීර්ණ කර ඇත්තේය. ඒ තුළ පුද්ගල අන්තර් සබඳතාවයන් දුරස්ථ බවට පත් කරමින් පුද්ගලයා සමාජය තුළ හුදකලා පුද්ගලයකු බවට පත් කොට ඇත. මෙහිදී පුද්ගලයා ස්වකීය අභිවෘද්ධිය සඳහා අයිතිවාසිකම්, වරප්‍රසාද, වගකීම් සහ යුතුකම් යනාදී වූ මතවාදයන් තුළ ගමන් කරන අතර ඒ තුළ සංස්කෘතිකමය වශයෙන් ඇති සාරධර්ම සහ හරපද්ධතීන් උල්ලංඝණය වීම තුළ සංස්කෘතිකමය ඝට්ටනයක් ඇති වන අතර ඒ මත පුද්ගලයා සමාජ විරෝධී ක්‍රියාවන්හි නියැලීම සිදුවනු ලබයි. මෙසේ ඇතිවීම සඳහා මූලික ලෙසම නවීකරණය මත පුද්ගලයා විවිධාංගීකරණයට ලක්වීම ඍජුව සහ වක්‍රව බලපා ඇත.

නිදසුනක් වශයෙන් වර්තමාන සමාජයේදී පිරමිඩ අපරාධ වලට පුද්ගලයා ගොදුරු වෙනු ලබන්නේ මෙම නවීකරණය මත පුද්ගලයා සමාජ ගනුදෙනුව හසුරුවන ආකාරය මත බව සඳහන් කළ හැකිය. සමාජ විසංවිධානකාරිත්වය කෙරෙහි නවීකරණයේ බලපෑම පිළිබඳව අවධානය යොමු කරනු ලැබුවහොත් සමාජය හා බැඳී පවතින සමාජ අයිතමයන් නිදසුන් ලෙස ටයිලර් දැක්වූ පරිදි දැනුම, විශ්වාසය, කලාව ආදිය සේම සංස්කෘතිය නව්‍යකරණයට පත්වීම සිදුව ඇත. ඒ තුළ සමාජ විසංවිධානකාරීත්වය සමාජය තුළ නිර්මිත වන්නේය. මෙය එමිල් ඩුර්කයිම් සහ රොබට් කේ. මර්ටන් දැක්වූ අනෝමියත්වය තුළින් මැනවින් නිරූපිත වනු ලබයි. ඒමත සමාජයේ ගුණාත්මක වටිනාකම් වෙනුවට සමාජයේ මූල්‍යමය වටිනාකම් ඇතිවීම තුළ සංස්කෘතිකමය වශයෙන් විසංවිධානකාරීත්වයක්

---

[187] සමරකෝන්,එම්.(2018). *සමාජ වෙනස්වීම්.* කතෘ ප්‍රකාශණ.

[188]Science Direct. (2009). Modernization Theory. Retrieved 9th October 2021 from https://www.sciencedirect.com/topics/social-sciences/modernization-theory

ඇති වේ. අන්තර් සබඳතාවයන් ව්‍යාජ සහ කෘත්‍රිම බවට පත්වන අතර ඒ තුළ අනෝමීය සමාජ ඇතිවී පුද්ගලයින් අපරාධ වලට යොමුවීම සහ ඒ මත අපරාධ වින්දිතයින් බවට පත්වීම සිදුවන බව සඳහන් කළ හැකිය. මෙසේ නවීකරණය තුළ ඇතිවන සමාජ විසංවිධානකාරීත්වය පදනම් කොටගෙන සංස්කෘතික විපරිවර්තනය අපරාධ සඳහා හේතු වෙනු ලබයි.

මෙලෙසින් දැක්වූ ඉහත ක්‍රමවේදයන් සමාජයේ නිර්මාණය සඳහා සාම්ප්‍රදායිකත්වය නවීනත්වයට ආදේශ වීම තුළ ඇතිවන නවීකරණත්වය මූලිකම අඩිතාලම වන්නේය. මෙම තත්ත්වය සඳහා පුද්ගලයාගේ තාර්කික චින්තනය සහ බුද්ධිමය පුනරාවර්තනය ඇති කාර්මික විප්ලවය හේතු සාධක වී ඇති අතර ඒ තුළ ඇති වූ සංකල්ප වන නාගරීකරණය, ගෝලීයකරණය, කාර්මීකරණය සහ තොරතුරු තාක්ෂණයේ දියුණුව බලපා ඇත. තවද වත්මන් සමාජය තුළ මාධ්‍ය තුළින් ගොඩනගන ලද ජනප්‍රිය සංස්කෘතිය පුද්ගලයා සහ සමාජය නවීකරණත්වයට පත් කිරීමේ නියමුවා බවට පත්ව ඇත. සමස්ථයක් වශයෙන් ගත්කළ සමාජය තුළ ඇති වූ මෙම නවීකරණත්වය පාදක කොටගනිමින් ඇතිවූ සංස්කෘතික ඝට්ටනය පුද්ගලයා අපරාධකරුවකු බවට පත් කිරීමත් සහ ප්‍රාථමික, ද්විතීයික සහ තෘතීක වින්දිතයින් ඇතිවීම සඳහාත් මෙම නවීකරණත්වය ඍජු සහ වක්‍ර ලෙස බලපා ඇති බව සඳහන් කළ හැකිය.

## 6. සමාජ ක්‍රියා න්‍යාය

සමාජ ක්‍රියා න්‍යාය ආරම්භ කළේ මැක්ස් වේබර් විසිනි. සමාජ විද්‍යාත්මක සිද්ධාන්ත වල ප්‍රධාන වර්ග දෙකක් තිබේ. එනම්,

- ව්‍යුහාත්මක හෝ සාර්ව සිද්ධාන්තය
- සමාජ ක්‍රියා යනුවෙනි.

වේබර්ගේ ධනාත්මක නොවන න්‍යායන් තුළ මූලික සංකල්පය මූලික වශයෙන් සකස් කළේ සමාජීය කලාපයේ හේතු සහ බලපෑම් කෙරෙහි මානව හැසිරීම් සම්බන්ධ වන්නේ කෙසේ ද යන්න නිරීක්ෂණය කිරීම සඳහාය. එසේම වේබර්ට අනුව ව්‍යුහාත්මක ක්‍රියාකාරීවාදී තනතුරුවලට වඩා සමාජ ක්‍රියාව පිළිබඳ න්‍යාය පිළිගන්නේ සහ උපකල්පනය කරන්නේ සමාජ සන්දර්භය අනුව මිනිසා සිය ක්‍රියාවන් වෙනස් කරන බවත් එය අනික් පුද්ගලයන්ට කෙසේ බලපායි ද යන්නත් ය. සමාජයේ ජීවත් වන පුද්ගලයන් සෑම අවස්ථාවකම යම්කිසි ක්‍රියාවක යෙදේ. එබැවින් මැක්ස් වේබර්ට අනුව සමාජ විද්‍යාව තුළදී සමාජ ක්‍රියාව හැදෑරීම ඉතා ම වැදගත් වේ. සමාජ ක්‍රියාවක ලක්ෂණ දෙකකි.

1. සෑම සමාජ ක්‍රියාවකම පුද්ගලයා විසින් එකී ක්‍රියාව ආරෝපණය කළ ආත්මීය අර්ථයක් දක්නට ලැබේ. එය ආත්මීය එළඹුමයි.
2. සමාජ ක්‍රියාවක නියැලෙන පුද්ගලයෙකු තම ක්‍රියාව නිසා අනෙක් අයගෙන් කුමන ආකාරයේ ප්‍රතිචාරයක් ඇති වේ දැයි සැලකිලිමත් වේ.

වේබර් විසින් සමාජ ක්‍රියා වර්ගීකරණයක් ඉදිරිපත් කර ඇත.

- උපයෝගී තාර්කික ක්‍රියාව
- සාරධර්ම තාර්කික ක්‍රියාව
- සාම්ප්‍රදායික ක්‍රියාව
- භාව ක්‍රියාව[189]

**උපයෝගී තාර්කික ක්‍රියාව**

කිසියම් අරමුණක් සාධනය කරගැනීමට පුද්ගලයා විසින් අනුගමනය කරනු ලබන තාර්කික ක්‍රියා පටිපාටිය උපයෝගී තාර්කික ක්‍රියාවයි. සමාජ සංස්කෘතිය, සිරිත් විරිත්, සාරධර්මයන්ට අනුකූල නොවන තමන්ටම ආවේණික වූ උපසංස්කෘතික පද්ධතියක් හරහා තම අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා මෙහිදී පුද්ගලයින් කටයුතු කරයි. වංචාවන්, කූට උපක්‍රම, බොරු මවාපෑම්, අල්ලස් හරහා පවත්නා වූ සංස්කෘතික පද්ධතියට එරෙහිව කටයුතු කරනු ලබයි. ඒ අනුව නීතිවිරෝධී හෝ නීත්‍යානුකූල නොවන ක්‍රියාවන් හරහා පුද්ගලයින් අරමුණු ඉටුකරගැනීමට කටයුතු කරනු ලබන අයුරු පිළිබඳව මෙම සංකල්පය හරහා දක්වයි.

[189] Norwood, Melanie.(2003). What is Social Action Theory. (online). Available from: https://study.com/academy/lesson/what-is-social-action-theory.html

**සාරධර්ම තාර්කික ක්‍රියාව**

අරමුණක් යම් පුද්ගලයෙකුගේ අවශ්‍යතාවයන් මත පමණක් තීරණය වනු ලබන අතර පරමාර්ථ මුළු මහත් සමාජ තත්ත්වයන් පදනම් කරගෙන ක්‍රියාත්මක වේ. නිදසුන් වශයෙන් කල්ලි අපචාරිත්වය ගතහොත් ඔවුන්ටම ආවේණික වූ උපසංස්කෘතියක් පවත්නා අතර ඒ හරහා ඔවුන්ගේ අරමුණු සාක්ෂාත් කරගැනීමට කටයුතු කරනු ලබයි.

**සම්ප්‍රදායික ක්‍රියා**

පරම්පරාවෙන් පරම්පරාවට පැවත එන සම්ප්‍රදායක් හේතුවෙන් එය ඉදිරියට පවත්වාගෙන යාමට සිදුකරනු ලබන ක්‍රියා සම්ප්‍රදායික ක්‍රියා වශයෙන් සැළකිය හැකිය. සම්ප්‍රදායික ක්‍රියා සංස්කෘතිය කෙරෙහි බලපාන ආකාරය විමසා බැලීමේදී සිංහල අවුරුදු චාරිත්‍ර නමැති සම්ප්‍රදායික ක්‍රියාව හේතුවෙන් ඥාති සම්බන්ධතා අලුත් වීම පමණක් නොව ජන ගී, ජන ක්‍රීඩා, පැරණි සංස්කෘතික අගනාකම් ආදිය නව පරපුර සමඟ හුවමාරු වේ. ඒ අනුව සම්ප්‍රදායික ක්‍රියා ජන සංස්කෘතිය කෙරෙහි බලපාන බව පැහැදිලිය. සම්ප්‍රදායික ක්‍රියා අපරාධ කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කිරීමේදී අලුත් අවුරුදු චාරිත්‍ර ඇසුරින්ම පැහැදිලි කරන විට පෙනී යන්නේ වර්තමානයෙහි අලුත් අවුරුදු චාරිත්‍ර හේතුවෙන් සූදු ක්‍රීඩාව, නීති විරෝධී මත්පැන් සම්බන්ධ අපරාධ, නිවැසියන් ඥාතීන්ගේ නිවාස වෙත නෑගම් ගිය අතරතුර ගෙවල් බිඳුම් වැනි අපරාධ කෙරෙහි අවස්ථාව සැලසෙන බවයි. ඒ අනුව සම්ප්‍රදායික ක්‍රියා අපරාධ කෙරෙහි බලපාන බව පැහැදිලිය.

**භාව ක්‍රියා**

මනසේ ඇතිවන ක්ෂණික ආවේගයකට දක්වන ප්‍රතිචාරයක් වශයෙන් භාව ක්‍රියා හැඳින්විය හැකිය. භාව ක්‍රියා සිදුකිරීමට පෙර සැලසුම් කිරීමක් සිදුනොවේ. බොහෝ විට භාව ක්‍රියාව සිදුකළ පසුව ඒ පිළිබඳව පසුතැවීමට හෝ ලැජ්ජාවට පත්වේ.

භාව ක්‍රියා සංස්කෘතිය හා සම්බන්ධ වන ආකාරය පිළිබඳව සලකා බැලීමේදී **"කුකුල් කේන්ති කාරයා" "හොස්ස ළඟින් මැස්සා යන්න බෑ"** ආදී ජන ව්‍යවහාර පවතින නිසා ජන සංස්කෘතිය සමඟ භාව ක්‍රියා බද්ධව පවතින බව පැහැදිලිය. එමෙන්ම වර්තමානයෙහි ටෙලිනාට්‍ය තුළ ක්ෂණික ආවේග මත දෙපාර්ශවයක් ගැටෙන දර්ශන නිරන්තරයෙන් ප්‍රදර්ශනය කිරීම හරහා නැරඹුම් වාර ඉහළ නංවා මුදල් ඉපැයීමට උත්සාහ කරන ආකාරය දැකගත හැකි බැවින් ජනප්‍රිය සංස්කෘතිය කෙරෙහිද භාව ක්‍රියා බලපාන බව කිවහැකිය. භාව ක්‍රියා හා අපරාධ අතර සම්බන්ධතාව විමසා බැලීමේදී ක්ෂණික කෝපය මත සිදුකරන මිනීමැරුම්, පහරදීම්, තුවාල සිදුකිරීම් භාව ක්‍රියා වශයෙන් සැලකිය හැකිය. නිදසුනක් වශයෙන් ස්වාමියා නිවසට පැමිණෙන විට ආගන්තුකයකු සමඟ බිරිඳ යහනේ සිටිනු දකින ස්වාමියා කෝපයට පත්ව ඔවුන්ව ඝාතනය කළේ නම් එය භාව ක්‍රියාවකි. ඒ අනුව භාව ක්‍රියා හා අපරාධ අතර පවතින සම්බන්ධතාවය පැහැදිලි වේ [190].

[190] Oyedokum, G, E. (2016). Management thoughts: The review of socil action theory. (online). Available from: https:www.researchgate.net/publication/3177995900

## 7. Scapegoat Theory

Scapegoat theory is a social psychological theory that relates to prejudice. The word 'scapegoat' has a very long history as it was originally derived with a really animal-goat. Scapegoating theory originates from the book of Leviticus. According to Jewish and Christian scriptures, ancient people used scapegoats to get rid of their sins. Accordingly, the scapegoat was sent into the wilderness for a demon called *Azazel*, with the purpose of placating that evil spirit, while a separate goat was slain as an offering to the god. By doing these specifications, they believed that they could get rid of what they did on past[191]. The book Leviticus declares that ancient people used to send a goat into the desert carrying the community's sins. Thus, it means having the sins of others away from the person who committed them. With the evolution and continues usage of this method by extension, a scapegoat has come to mean any group or an individual that innocently bears the blame of others. Thus, scapegoat theory refers to the meaning that when members of the dominant group are unable to archive socially prescribed goals, group members become frustrated and act aggressively toward minority groups or anybody with less power.

When consider about the social psychological combination of scapegoat theory, it highlights the different patterns of behaviors of people living in a particular society that emphasis, that scapegoating a social phenomenon counting by individuals or group of individuals in conjunction with how people living in a society perform tasks and those roles that are consistent with their behavior evoke emotions. On this scene there are number of ways scapegoating that explains according to scapegoat theory[192]. That includes, Role of ego, Creation of villain, Defense mechanism, Projection, Negative emotions, Low power. These factors help to make a scapegoat in the society. Scapegoat is functioning by individuals as a crucial factor in Ego defenses where uncomfortable feelings like irritation, rage, and shame are transferred or deflected onto another person or group who is more vulnerable. For example, scapegoating Muslim community as a whole for anything relating to terrorism. As in any social situation the appearance of a villain suggests the presence of a hero, even if the relationship between the two parties is fictitious. This form of scapegoating rise from the family itself as the first institute

---

[191] Enders S. ,Scapegoat Theory: Shifting Blame and Displacing Aggression

[192] Glick, p. (2002). Sacrificial lambs dressed in wolves' clothing: envious prejudice, ideology, and the scapegoating of Jews. In l. S. Newman & r. Eber (eds.), understanding genocide: the social psychology of the holocaust (pp. 113-142).

of socialization process. For example, a child could scapegoat his or her own sibling, which could eventually drive the practice among their colleagues and to continue even as an adult. Scapegoating can be observed as a self-defense mechanism as well. According to Freud, when a person displaces himself and blames or places a load on others, is a self-defense strategy. Rene Girard's anthropological theory which he calls scapegoat mechanism, explains just as desires tend to converge on the same object, violence tends to converge on the same victim. The violence of all against all gives way to the violence of all against one. Projecting one's own unwanted feelings or fears on another person may resulted by rejecting the scapegoaters actions. People with different behaviors can be found in the society where people with impulsive behaviors are prone to committing criminal acts. Thereby, individuals self-protect themselves from unlawful urges or concerns to scapegoater who presenting themselves with malicious behaviors. There is no argue on originating negative emotions against the other person when people are treated unfairly. Further, it is an occurrence with the effect of low power of the vulnerable social group. For instant, when members of the dominant group become frustrated with social issues and act aggressively toward minority groups or anybody with less power. For example, Sri Lankan context, the Sinhala, heterosexual, Buddhist people can be identified as a dominant group and their socially prescribed goals have strengthen with more prioritization that benefiting in become successful such as to get a proper job, to obtain a better education etc. Compared to the vulnerable groups or minority in the community. On this basis, Scapegoating is arising from the society with deep-rooted entities with the effects of socialization process. Thereby, anyone in the society can be a scapegoat who is the victim. On this basis a scapegoat can be an adult, a child, an employee of a company, a politician, or a political group, an ethnic or religious group or even a nation as a whole who becomes a victim.

In recognizing the applicability of scapegoating theory in the aspect of cultural criminology, can determine that it may arise from the family itself and may even convert to impel bursts of violence such as pogroms, lynching, and even genocide. For example, Adolf Hitler scapegoated on Jewish people as hosts of social ill. In contemporary society anti-Asian violence has been triggered by scapegoating the Asians as the one who responsible for COVID 19 pandemic crisis by most European nations. In studying these examples, it is evident that when people collectively scapegoat other people, it may sometimes expose their deep-rooted self-hatred or shame. Further, scapegoating nature is not only a behavior somewhat based on an unfair judgement and a victimization of a one particular group. It may also drag the vulnerable community to transform their individualized tensions into group conflicts which

in most often the minorities in the community. There hence on this point of view, scapegoat theory can observe that the root cause for many ethnic, religious, and other forms of conflicts raises against one and another is as a result of scapegoating by one social group against the other. For example, in 1983, 13 soldiers were died by an LTTE attack in Jaffna. The Sinhalese in southern area have responded this action as an act against Sinhalese and have scapegoated many Tamils in southern area by killing and mobbing their property. These victims of the event haven't even contributed to the original crime. This behavior of major society become one among many other reasons where the minority community who are Tamil civil civilians have victimized to rise against the major community of Sinhalese. This ethnic conflict in Sri Lanka have carried out nearly 30 years. According to palaver, a scapegoat victimization has defined, as such people view themselves the aggression against their enemies become limitless.

According to the figure below, can observe the presence of the victim of a crime. There is no victim without a crime and crime committed by a criminal. In scapegoat theory it explains and may measure how a community will scapegoating an individual or a community by ignoring the real perpetrator and accusing individuals who haven't contributed to the original harmful act. Thereby, the punisher of the scapegoat will be the community. The punishment will be social ignorance, and with this community may experience violation of human right most often. Easter Sunday bomb attack in Sri Lanka 2019 allowed to ignore the focus on real perpetrators and victims of the attack and started focus on islamophobia. For example, in Sri Lankan society the major community scapegoat on Muslim community in Sri Lanka as they are in attempts of invading Sri Lankan cultural heritage and obtaining the land, expanding their community numbers and attempting to interpret the terrorist activities as the act of Islamic community of the nation as a whole. These aspects against the Islamic community in Sri Lanka have risen with patriotism respect given and motive to preserve cultural values of Sinhalese.





*Figure:the nature of scapegoating*

In concluding the theory of scapegoat, scapegoating occurs when the true source of anger goes unpunished, and people shift their aggression elsewhere. Further, in studying this theory can determine the reasons behind a community to scapegoat the other community. Most often can identify and determine that the major community who scapegoat on other community is blinded by arguments with their own morality. All the thoughts and aspirations of a person living in a

society are shaped by the culture in which he or she is surrounded. On this sense can observe how norms and value system of a particular society contributes to sharpen once mental attitudes. The morality of a community is undoubtedly have influenced by a culture of a particular society which is encouraged by social anxieties of normlessness and moral relativism to a particular cultural value. As such direct and indirect influences by the major society with culture itself, may allow the community to accept what is right based on their own ideological conceptualization formulized a culture for pursuing their own social agenda. As a result of such behavior emits by the major society may allow to be failing in recognizing the obvious offenders of the act. People who are constantly powerless in society are greatly affected by this situation of becoming a scapegoat. The repressed scapegoat may raise against the major community with time, the solidarity of a particular society may break based on an unrelatable accusation of a community. This may allow the wrongdoer to flee or maintain its criminality and the real victim who have victimized from socially ignored wrongdoer may bears the cost of the crime solely and drag an unrelated party or scapegoat to a conflict against the scapegoating party which is the accused.

## 8. සාමය ඇති කිරීමේ න්‍යාය

යමක් බිහිවීමට එහි අවශ්‍යතාවයක් තිබිය යුතුය. න්‍යායක් යන්න ඇතිවීමෙහිලාද මෙම කරුණ සාධාරණ වේ. "න්‍යායක් යනු යමක් පැහැදිලි කිරීමේදී උපයෝගී කරගනු ලබන අදහස් සමූහයක එකතුවකි[193]. ඒ නිසාම සමාජ විද්‍යාත්මක න්‍යාය යනු මානව සමාජය විග්‍රහ කිරීමට උපකාරී වන්නාවූ අදහස් සමූහයන්ගේ එකතුවකි" (Haralamboos)[194]. අපරාධ විද්‍යා විෂය ක්ෂේත්‍රය තුළ මෙන්ම අනෙකුත් සෑම විෂය ක්ෂේත්‍රයක් තුළම ඒවාට අනුරූපව විවිධ න්‍යායාත්මක මතයන් විවිධාංගීකරණය වී ඇත. ඈත අතීත යුග වල පටන්ම එවැනි න්‍යාය සංකල්පයන් බිහිවූ අතර තත්කාලීනවද විවිධ න්‍යාය සංකල්පයන්, මතවාදයන් නිර්මාණය වෙමින් පවතී. ඒ අතුරින් මෑත කාලීනව බිහි වූ න්‍යාය සංකල්පයක් පිළිබඳව මෙම ලිපියෙන් සාරාංශ ගත කර ඇත.

මෙම න්‍යාය, වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ගම්‍ය වන පරිදිම ***සාමය ඇති කිරීම*** යන මතය මඟින් ගොඩනැගී ඇත." ප්‍රචණ්ඩත්වය විසින් ප්‍රචණ්ඩත්වය ඇති කරයි" යන සංකල්පය පදනම් කර ගනිමින් ආගමික හා දාර්ශනික ඉගැන්වීම් වලින් ද පෝෂණය වෙමින් මෙම න්‍යායාත්මක මතය ඉදිරිපත් වී ඇත[195]. මෙම න්‍යාය වෙනුවෙන් පෙනී සිටින්නන් තර්ක කරනුයේ අපරාධ යුක්ති ප්‍රතිපත්ති මඟින් සාපරාධී ප්‍රචණ්ඩත්වය මැඩපැවැත්වීමට වඩා රාජ්‍ය අනුමත ප්‍රචණ්ඩ ක්‍රියාවන් උත්පාදනය සිදු කරන බවයි. මෙය ගොඩනැගීමේ ප්‍රධාන අරමුණ බවට පත්ව ඇත්තේ සාමකාමී සමාජයක් ප්‍රවර්ධනය කිරීමයි .දඬුවම් ලැබීමෙන් අපරාධ සහ සමාජ ගැටළු වැළැක්වීමට වඩා මැදිහත් වීම, ගැටුම් නිරාකරණය වැනි මානවවාදී විසඳුම් සෙවීමට මෙමඟින් උත්සාහ කරයි [196].

සමාජ ගැටුම් න්‍යාය යටතේ එන සංකල්පයන් මූලික කර ගනිමින් මෙම සාමය ඇති කිරීමේ න්‍යාය වර්ධනය වී ඇති අතරම එම සංකල්පයන් පාදක කර ගනිමින් අපරාධ විද්‍යා උප විෂය ක්ෂේත්‍රයක් වන විවේචනාත්මක අපරාධ විද්‍යාවේ එක් අංශයක් ලෙස සාමය ඇති කිරීම පිළිබඳ අපරාධ විද්‍යාව "Peace Making Criminology" නමින් මෙම න්‍යාය 1990 දශකයේ මුල් භාගයේදී ජනප්‍රිය විය.

මෙහි ඓතිහාසික පරිණාමය පිළිබඳව අධ්‍යයනයේදී මහත්මා ගාන්ධිතුමා මාර්ටින් ලූතර් කිං, ඩෙස්මන් ටුටු යන සමාජ ක්‍රියාකාරීන්ගේ සංකල්පයන්ද පාදක වී ඇති බව තහවුරු වේ.

*"මගේ අදහස නම්, අවිහිංසාව යනු කිසිඳු හැඩයකින් හෝ ස්වරූපයකින් නිෂ්ක්‍රීය වීම නොවේ. මට තේරෙන පරිදි අවිහිංසාව යනු ලෝකයේ සක්‍රීයම බලවේගයයි".* **මහත්මා ගාන්ධි**

[193] කුමාර, ) .2014). සමාජ අධ්‍යයනයේදී න්‍යායික අවශ්‍යතාවය .Retrieved 31 September 2021, from http://pariwasasammuthiya.blogspot.com/2014/11/blog-post_33.html
[194] Haralambos, M. (1612). *Sociology Themes and Perspectives* (4th ed.). Collins Educational
[195] Peacemaking theory | sociology. (2021). Retrieved 30 September 2021, from https://www.britannica.com/topic/peacemaking-theory
[196] (2021). Retrieved 30 September 2021, from https://study.com/academy/lesson/what-is-peacemaking-definition-lesson.html

සාමය ඇති කිරීම පිළිබඳ අපරාධ විද්‍යාව, අප දන්නා දේ සැමවිටම සීමිතය. අපි සියලු දෙනාම අධ්‍යාත්මික ගමනක යෙදී සිටී. මනුෂ්‍ය ජීවිතය සංලක්ෂිත වන්නේ දුකෙනි. අපරාධ සහ අපරාධ හැසිරීම් පීඩාවේ එක් ප්‍රකාශනයක් පමණි යන සංකල්පයන් සංයෝජනය වීමෙන් ගොඩනැගී ඇත[197].

Pepinsky, Quinney, Wright Friedrichs, Wozniak Caulfield, Klenowski යන න්‍යායවාදීන් මෙහි පුරෝගාමීන් වේ. සාමය ඇති කිරීමේ අපරාධ විද්‍යාව පිළිබඳ ඉදිරි දර්ශනය ක්‍රමානුකූලව පෙපින්ස්කි සහ ක්විනි විසින් අපරාධ විද්‍යා ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදී. ක්විනි විසින් 1991 දී සාක්ෂි සාදන අපරාධය නම් දර්ශනවාදී අවබෝධයක් ලබා දෙන යෝජනා නවයක් හඳුන්වාදීම සමඟ මෙම ඉදිරි දර්ශනය අවබෝධ කර ගැනීමට අඩිතාලමක් දමයි. එමගින් ඔහු යුද්ධය වෙනුවට සාමය මඟින් පාලනය වන යුක්ති පද්ධතියක් පුද්ගල පරිවර්තන මඟින් සංලක්ෂිත කළ හැකි ආකාරය පිළිබඳ උපදෙස් ලබා දෙයි.

සංස්කෘතිය තුළ සමාජීය කරුණු මුල් කරගෙන අපරාධ ඇති වන ආකාරය සාමය ඇති කිරීමේ න්‍යාය යටතේ සාකච්ඡා කෙරේ. සංස්කෘතියක් යනු පරම්පරාවෙන් පරම්පරාවට ගෙන එන දෙයක් ලෙසත්, ජීවත් වන මිනිසුන් අතර ඇතිවන හා පැතිරෙන ක්‍රියා හා චර්යා පද්ධතියක් බවත් රැල්ෆ් ලින්ටන්ගේ අදහස විය. සාමය ඇති කිරීමේ න්‍යාය යටතේ සංස්කෘතිය පදනම් කරගත් අපරාධ ඇතිවීමේ අවස්ථාවන් අතර සංස්කෘතික ප්‍රචණ්ඩත්වය වැදගත්ය . 1971-1989 අතර කාලයේදී ලංකාවේ සංස්කෘතිය පදනම් කරගත් සාමය බිඳ වැටීම් හේතුවෙන් අපරාධ ඇති වූ අවස්ථාවන් බොහෝ වේ.

- 1971 අප්‍රේල් මස 05 වෙනිදා පොලිස් ස්ථාන වලට පහර දීමෙන් ආරම්භ කරන ලද ජනතා විමුක්ති පෙරමුණේ රාජ්‍ය විරෝධී කැරලිකාර තත්ත්වයන්

- 1977 දී දිවයින දෙකඩ කොට උතුරු නැගෙනහිර පළාත් යා කරමින් ද්‍රවිඩ ඊළාම් රාජ්‍යයක් ගොඩනැගීමේ අරමුණින් ද්‍රවිඩ ත්‍රස්තවාදීන් විසින් දියත් කල ව්‍යාපාරය[198]

1980 වන විට දිවයින තුළ සිදු වූ මෙම සංස්කෘතික විපර්යාසය තුළින් (1977න් පසු) විදේශ ආයෝජකයින් කුළු ගැන්වීමත්, මුදල මත පදනම් වූ ආර්ථිකය තීරණය වීමත්, කල්ලි අපචාරීත්වය (ත්‍රීවිල් කල්ලිය/ජාතීවාදී කල්ලිය/ධනුෂ්කගේ බයික් කල්ලි) ඇති වීමත්, වෙළෙඳපොළකරණය හා ගෝලීයකරණය යනාදී ප්‍රවණතාවයන් තුළින් අර්බුදකාරී තත්ත්වයක් නිර්මාණය වී සාමය බිඳ වැටෙන්නට විය. උප සංස්කෘතික කල්ලි බිහිවීම තුළින් නිර්මාණය වූ බිහිසුණුම අපරාධමය තත්ත්වය නම් නීති විරෝධී මත්ද්‍රව්‍ය භාවිතයට හුරු වීමයි. 1977 න් පසුව ඇති වූ මෙම සංස්කෘතික විපර්යාසය හේතුවෙන් සමාජ සිරිත් විරිත් සොදාපාළුවට ලක් වූ අතර න්‍යෂ්ටික පවුල් ක්‍රමය දිරිගන්වනු ලැබීය[199]. එහි අතුරු ප්‍රතිඵලය වුයේ ලිංගික ප්‍රචණ්ඩත්වය ඉහළ යාමයි.(කොටකෙතන ඝාතන රැල්ල)

[197] Peacemaking Criminology. (2021). Retrieved 30 September 2021, from https://www.oxfordbibliographies.com/view/document/obo-9780195396607/obo-9780195396607-0266.xml
[198] ඉද්දමල්ගොඩ. ටී, (1996), ශ්‍රී ලංකා පොලීසිය ප්‍රභවය හා ව්‍යාප්තිය, සර්වෝදය විශ්වලේඛා, රත්මලාන
[199] *UNDP in Sri Lanka*. (2021). Retrieved 30September 2021, from https://www.lk.undp.org

සංස්කෘතියේ වෙනස්වීම තුළින් සාමය බිඳ වැටී එය අපරාධයක් දක්වා වර්ධනය වීම මඟින් වින්දිතභාවයට පත්වන පාර්ශවයන් පිළිබඳ පහත පරිදි විස්තර කළ හැකිය. සංස්කෘතික ගැටුමක් හේතුවෙන් සමාජය තුළ සාමය නැති වීම සිදු වේ. ඒ හරහා පුද්ගලයන් තුළ ඇතිවන්නා වූ වින්දිතභාවය අමුතුවෙන් සාකච්ඡා කළ යුතු නොවන්නකි. සන්නද්ධ ගැටුම්, ඒ අතර ප්‍රබලත්වයක් උසුලයි.

තිස් අවුරුද්දකට මුහුණ දුන් ජාතියක් වශයෙන් එය අපට අමුතුවෙන් විස්තර කළ යුතු නොවන්නකි. සමාජ සංස්ථා අතරද සාමය විසිරී ගොස් ඇති සංස්ථාවක් වශයෙන් පවුල් සංස්ථාව හඳුන්වාදිය හැකිය[200]. පවතින ලද කොවිඩ් වසංගතය තුළින් අපරාධකරු හා වින්දිතයා එකම ස්ථානය තුළ කොටු වීම හරහා මෙම තත්ත්වය තවදුරටත් වර්ධනය වී ඇති බව කිව හැකිය. දත්ත සටහන් පිරික්සීමේදී 2020 අප්‍රේල් මාසයට පමණක් ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව පැමිණිලි 400 ක් ලැබී ඇති බව ළමා හා කාන්තා කාර්යාංශය දක්වා ඇත. අද වන විට මෙකී තත්ත්වයන් තුළින් වින්දිතභාවයට පත්වන පිරිස් අප්‍රමාණය.

කරුණු පිරික්සීමේදී පැහැදිලි වන්නේ ගැටුම් තුළින් සාමය සමාජය තුළ ගිලිහෙන බවයි. එම නිසාවෙන්ම ප්‍රධාන වශයෙන් ගැටුම් හඳුනාගෙන එයට මැදිහත්වීම් හරහා එය වළක්වා ගත හැකිවේ. ඒ අනුව සමාජය තුළ සාමය ස්ථාපිත කරගැනීම සඳහා මෙම ක්‍රමවේද හරහා ගැටුම් නිරාකරණය කර ගැනීමට හැකියාව උදා වේ. (සාකච්ඡා කිරීම, කේවල් කිරීම, සහමන්ත්‍රණය, මැදිහත්කරණය, සමථකරණය, බේරුම් කිරීම, උපදේශනය) වැනි ක්‍රමවේද භාවිත කළ හැකිය. ගැටුම් සාමකාමීව විසඳා ගැනීම හරහා ජීවිත හා දේපල හානි අවම කර ගැනීමට හැකියාව ජනිත කොට ගත හැකි වන අතර මීට අමතරව සාමය ස්ථාපිත රටක් ළඟා කරගැනීමේ හැකියාව උදා වේ.

[200] හේවාවසම්, කේ.එන්. (2018).සමාජ ප්‍රශ්න හා අපරාධ, කොළඹ10 ලසී/ස ඇස්,ගොඩගේ සහෝදරයෝ

## 9. ඓතිහාසික භෞතිකවාදී න්‍යාය

කාල් මාක්ස් සහ ෆෙඩ්රික් එංගල්ස් විසින් රචිත "ජර්මන් මතවාද" කෘතිය මඟින් ඓතිහාසික භෞතිකවාදී න්‍යාය සූත්‍රගත කළ අතර ෆ්‍රෙඩ්රික් එංගල්ස්ට අනුව ඓතිහාසික භෞතිකවාදය පිළිබඳ න්‍යාය මාක්ස් විසින් සොයා ගත්තකි. සමාජය ගතික ස්වභාවයක් ගන්නා අතර මාක්ස්ට අනුව සමාජය විකාශය වූ අවධි ලෙස ප්‍රාථමික කොමියුනිස්ට් අවධිය, වහල් අවධිය, වැඩවසම් අවධිය, ධනවාදී අවධිය, සමාජවාදී අවධිය හා අනාගත කොමියුනිස්ට් අවධිය දැක්විය හැකිය[201]. මෙහි සඳහන් ප්‍රාථමික කොමියුනිස්ට් යුගය හැරුණු විට මානව ඉතිහාසය තුළ ක්‍රමික නිෂ්පාදන ආකාර කිහිපයක් තිබෙන බව මාක්ස් පවසයි. එනම්, ආසියාතික නිෂ්පාදන යුගය, ආදි කාලීන නිෂ්පාදන යුගය, වැඩවසම් නිෂ්පාදන යුගය, නූතන ධනවාදී නිෂ්පාදන යුගයයි. මාක්ස්ට අනුව, ඉතිහාසය ආර්ථික පදනමක පිහිටා ද්‍රව්‍යවාදී ආකාරයට අවබෝධ කර ගත යුත්තක් වන බැවින් සමාජය විකසනය වීමේදී සමාජයේ මූලික පදනම ආර්ථිකය වේ. එකී ආර්ථික ව්‍යුහය නිෂ්පාදන සබඳතා වලින් සැකසී ඇත. මෙම සෑම යුගයකම පැවැත්ම හා විසරණය ප්‍රතිවිරුද්ධ පන්ති දෙකක ප්‍රතිවිරෝධතාවක් හා ගැටුම් නිසා හට ගන්නා බව මාක්ස්ගේ අදහසයි. ඒ අනුව මානව ඉතිහාසයේ පරිණාමය නිෂ්පාදන බලවේග හා නිෂ්පාදන සබඳතා වල වර්ධනය මත සිදු වේ. නිෂ්පාදන බලවේග යනු, ස්වාභාවික සම්පත්, විද්‍යාව හා තාක්ෂණය, ප්‍රාග්ධන උපකරණ, ශ්‍රම විභජනය යන දෑ වන අතර ආර්ථිකමය වශයෙන් සමාජය තුළ බලය බෙදී යාම නිෂ්පාදන සබඳතා ලෙස සැලකේ[202].

**උපරි ව්‍යුහය හා අධස්ථ ව්‍යුහය**

**සංස්කෘතිය, සාහිත්‍ය, කලාව, ආගම, අධ්‍යාපනය,නීතිය, දේශපාලනය**

**(උපරි ව්‍යුහය/මතු මහල)**

↑

**ආර්ථිකය**

**(අධස්ථ ව්‍යුහය / සමාජ යටි මහල)**

මාක්ස් මෙහිදී අධස්ථ ව්‍යුහය ලෙස ආර්ථිකය සළකන අතර උපරි ව්‍යුහය නොහොත් මතු මහල ලෙස සංස්කෘතිය, සදාචාරය, ආගම, අධ්‍යාපනය, නීතිය හා දේශපාලනය සළකයි. අධස්ථ ව්‍යුහයේ පවත්නා ආර්ථිකයෙහි යම් සෙලවීමක් ඇති වුවහොත් එය මතු මහල තුළ පවත්නා සෑම සාධකයක් කෙරෙහිම ප්‍රබල බලපෑමක් එල්ල කරයි[203]. ඒ අනුව මෙහිදී ආර්ථිකයේ යම් සෙලවීමක් ඇති වුවහොත් එය සංස්කෘතික පරිවර්තනයටද නිතැතින්ම තුඩු දෙයි. සමාජය ක්‍රමිකව පරිණාමය වීමේදී සමාජයේ

---

[201] Priya, R. (2014, December 1). Marx's Theory of Historical Materialism. Your Article Library. Retrieved from 10 th October2021 https://www.yourarticlelibrary.com/sociology/marxs-theory-of-historical-materialism/43766

[202] සමරකෝන්, එම්. (2008). සම්භාව්‍ය සමාජ විද්‍යාඥයෝ. තලවතුගොඩ; කතෘ ප්‍රකාශන.

[203] හේමන්ත කුමාර, එන්. වී. ජී. ඒ. (2013). සමාජ විද්‍යාව මූලික සංකල්ප, න්‍යාය හා ක්‍රමවේදය. කතෘ ප්‍රකාශන.

නිෂ්පාදන බලවේගවල නව වර්ධනය හා පවතින නිෂ්පාදන සබඳතා එකිනෙකට ගැටෙන අතර ඒ තුළින් සංස්කෘතියේ සිදුවන්නා වූ විපර්යාසයන් සමඟ එකිනෙකට වෙනස් ආර්ථික සංස්කෘතීන් දෙකක් මුණගැසීමෙන් සංස්කෘතික ඝට්ටනයක් උත්පාදනය වේ. ඒ ඉහළ ආර්ථික සංස්කෘතිය හා පහළ ආර්ථික සංස්කෘතියයි. මාක්ස් පෙන්වා දෙන ආකාරයට නිෂ්පාදන බලවේග වල නව වර්ධනයත් සමඟ මුසුවීමට හැකි වන්නේ ඉහළ ආර්ථික සංස්කෘතියකින් හෙබි සමාජීය වශයෙන් ධනවත් පැළැන්තියේ උදවියටයි. එසේම පහළ ආර්ථික සංස්කෘතියකින් හෙබි නිර්දන පන්තිකයන් හට (ආර්ථික මට්ටමින් අඩු පුද්ගලයන්ට) පවතින නිෂ්පාදන සම්බන්ධතා සමඟ හිඳීමට සිදුවේ. නමුත්, ඔවුන්ද නිෂ්පාදන බලවේගවල නව වර්ධනයත් සමඟ මුසු වෙමින් ඉහළ ආර්ථික සංස්කෘතියක් අත්පත් කර ගැනීමට රුචිය. නමුත් එකී තත්ත්වයට යාම උදෙසා පිරිසක් සාධනීය මාර්ග තෝරා ගත්තද, තවත් පිරිසක් ඒ සඳහා වංචනික මාර්ග තෝරා ගනී. එකී අයහපත් මාර්ගයන් තෝරාගෙන ඉහළ ආර්ථිකයක් අත්පත් කර ගැනීම උදෙසා කටයුතු කරන පිරිස් සමාජ පර්යාය බිඳ දමමින් සමාජයට, සංස්කෘතියට උචිත නොවන නීති විරෝධී දෑ සමාජය තුළ සිදු කරයි. එවිට සමාජයෙහි  අපරාධ වලින් යුක්ත පාරිසරික වටපිටාවක් උපස්ථම්භක වේ.

මෙවැනි අපරාධ සිදු කිරීමේදී ඔවුන් ඔවුන්ගේ ඉලක්ක වලට ගමන් කිරීම උදෙසා ඔවුන් හා පෑහෙන සිතුවිලි, අරමුණු වලින් යුත් පුද්ගලයින් සමඟ අන්තර් පුද්ගල සබඳතා ගොඩනගා ගනිමින් කටයුතු කරයි. පසුව ඒ තුළින් සමාජයේ පවත්නා මහා සංස්කෘතියට ප්‍රතිවිරුද්ධ උප සංස්කෘතික කණ්ඩායම් නිර්මාණය වේ. ලාංකේය සමාජය දෙස අවධානය යොමු කළහොත්, එවන් වූ අභිලාෂයන් ඇති උප සංස්කෘතික කණ්ඩායම් කිහිපයක් ඇසුරින් මාක්ස් පෙන්වා දුන් නව නිෂ්පාදන බලවේග වල නව වර්ධනය හා පවතින නිෂ්පාදන සබඳතා එකිනෙකට ගැටීම යන සාධකය හේතුකොට ගෙන සංස්කෘතික ඝට්ටනයක් ඇති වීමෙන් අපරාධ හා වින්දිතභාවය උත්පාදනය වන ආකාරය පිළිබඳ මෙලෙස කරුණු හුවා දැක්විය හැකිය. සංවර්ධනය වෙමින් පවතින තුන්වන ලෝකයේ රටවල, අඩු අධ්‍යාපනය හා අඩු ආර්ථිකය, නූගත්කම, යටිතල පහසුකම් වල මද බව, මුඩුක්කු උප සංස්කෘතීන් තුළ දැකිය හැකි මූලික ලක්ෂණයි. මාක්ස් පැවසූ නව නිෂ්පාදන බලවේගවල නව වර්ධනය හා පවතින නිෂ්පාදන සම්බන්ධතා එකිනෙකට ගැටීම යන අර්ථිකමයක සාධකය පදනම් කරගෙන ප්‍රධාන වශයෙන්ම මෙම උප සංස්කෘතිය තුළ ජීවත් වන්නාවූ පුද්ගලයන් මත්ද්‍රව්‍ය ජාවාරම් සිදු කිරීම, මංකොල්ලකෑම් හා සොරකම් කිරීම, වෘත්තිමය සූදුව, ප්‍රචණ්ඩ අපරාධ, දේපළවලට එරෙහි අපරාධ, සංවිධානාත්මක කල්ලි ආශ්‍රිත අපරාධ යනාදිය  කරා යොමු වී ඇත[204]. ජීවන විලාසිතාවකින් ඔබින ගණිකා උප සංස්කෘතිය ආශ්‍රිතව මත්වතුර භාවිතය මූලික වීම, ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය විසින් සිදු කිරීම, ස්ථර කිහිපයක් තිබීම දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයයි. ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වුණ තරුණියන් අඩු ආර්ථික මට්ටම හේතුකොට ගෙන නගරාශ්‍රිතව රැකියා අවස්ථා උදාවීමත් සමඟ පැමිණීම හේතුවෙන් මෙවැනි මාර්ගවලින් ඉහළ ආර්ථික සංස්කෘතියක් අත්පත් කර ගැනීම උදෙසා පෙළඹී ඇත. ගණිකා වෘත්තිය ආශ්‍රිතව ඒ තුළ නියැලෙන්නන් විසින් කුඩා දරුවන් නීති විරෝධී දෑ වෙනුවෙන් පොළඹවා ගැනීම, මනුෂ්‍ය ඝාතන හා මත්ද්‍රව්‍ය ජාවාරම් සිදු කිරීම, සහ වෙනත් අපරාධමය තත්ත්වයන් වලද නිරත වේ. තවද ගණිකා වෘත්තියේ නියැලෙන කාන්තාවන් විසින් ඔවුන් වෙත සේවය ලබා

[204] Belur, J., Parikh, P., Daruwalla, N., Joshi, R., & Fernandes, R. (2016). Perceptions of gender-based violence around public toilets in Mumbai slums. International Journal of Comparative and Applied Criminal Justice, 41(1-2), 63–78. https://doi.org/10.1080/01924036.2016.1240094

ගැනීමට පැමිණෙන පුරුෂයින් රවටා ඔවුන්ගේ මිල මුදල්, රන් ආභරණ, වටිනා බඩු බාහිරාදිය වංචනිකව සොරකම් කරයි. එමඟින් එම පුරුෂයින් ආර්ථික, මානසික වශයෙන් වින්දිතභාවයට පත් වේ. විකෘති ආශාවන් මනෝභාවයන් සහිත පුද්ගලයින්ගේ ඕනෑ එපාකම් හමුවේ සැමවිටම ගණිකාවන්ද සිය දහස් වාරයකින් වින්දිතභාවයට පත්වේ. කාල් මාක්ස් පෙන්වා දෙන ආකාරයට සමාජයේ පවත්නා ආර්ථික සාධකය වෙනස් වීම හේතුකොට ගෙන සමාජයේ පහළ පාන්තික පිරිස් ඉහළ ආර්ථික සංස්කෘතියක් අත්පත් කර ගැනීමට මෙවැනි අපරාධ කිරීමට යොමු වී ඇත. ඒ තුළින් ඔවුන්ගේ අපරාධ වලට ගොදුරු වන්නන් පමණක් නොව ඔවුන්ගේ පවුලේ උදවියද, සමස්ත සමාජයක්ද, වින්දිතභාවයට පත්වේ [205].

යාචක උප සංස්කෘතිය තුළද ඔවුන්ටම ආවේණික ජීවන රටාවක් භාෂා විලාසයන් පැවතීම, සංවිධානාත්මකව සිටීම, මනෝ මූලික අයිතීන් තිබීම වැනි ලක්ෂණ දැකගත හැකි අතර බොහෝ විට අඩු ආර්ථික මට්ටම හේතුවෙන් ඉහළ ආර්ථික සංස්කෘතියක් කරා ගමන් කිරීමට බොහෝ පිරිස් යාචක වෘත්තියේද නියැලෙයි. නමුත් මේ තුළින් විවිධ නීති විරෝධී දෑ සිදු කරමින් මුදල් ඉපැයීමට යොමුවී තිබීමද දැකිය හැකිය. අවුරුදු 18ට අඩු කුඩා දරුවන් නීති විරෝධී ලෙස යාචකයෝ බලහත්කාරයෙන් සේවයේ යෙදවීම, ළමා අපයෝජන, පහරදීම්, මනුෂ්‍ය ඝාතන, මංකොල්ලකෑම්, මත්ද්‍රව්‍ය ජාවාරම් වැනි අපරාධ ප්‍රමුඛත්වයක් උසුලයි[206]. ලාංකේය සමාජයේ ද, බොහෝ රටවලද රැකියා විරහිත තරුණ, තරුණියන් ද අඩු ආර්ථික මට්ටම මූලික කොටගෙන විවිධ අපගාමී චර්යාවන් උදෙසා නැඹුරුවීමේ ප්‍රවණතාවක් දැකිය හැකිය. මෙය හේතු කොට ගෙන ඔවුන්ටම ආවේණික උප සංස්කෘතියක් ගොඩ නැගී ඇත. රැකියා වියුක්ත මෙම තරුණයන් තුළ පවත්නා ප්‍රචණ්ඩත්වය හා ආවේගශීලීභාවය මිනීමැරුම්, සන්නද්ධ කොල්ලකෑම්, පැහැර ගැනීම් සහ ත්‍රස්තවාදය වැනි ප්‍රචණ්ඩ අපරාධ කරා යොමු වීමට සුවිශාල බලපෑමක් එල්ල කරයි[207]. මාක්ස් පෙන්වා දුන් සමාජයේ ක්‍රමික විකාශය, නව නිෂ්පාදන බලවේග වල වර්ධනය හා පවත්නා නිෂ්පාදන සබඳතා එකිනෙකට ගැටීම, වෙනස් ආර්ථික සංස්කෘතීන් මුණගැසීම, උප සංස්කෘතීන් ගොඩ නැඟීම, අපරාධ හා වින්දිතභාවය සමාජය තුළ උපස්ථම්භක වීම දන්වැලක පුරුක් මෙන් එකිනෙකට මනා ලෙස බැඳී ඇත.

---

[205] රත්නපාල, එන්. (2000). ශ්‍රී ලංකාවේ ගණිකාවෝ. කොළඹ 08; කතෘ ප්‍රකාශන.

[206]Cheng, C., Kumar, V., Advocate, C., Branch, M., & Advisor, I. (2012). Pattern of Exploitation and Organised Crime: Study on Homeless Beggars in Patna, Bihar. International Journal of Scientific and Research Publications, 2(11). http://www.ijsrp.org/research-paper-1112/ijsrp-p1167.pdf

[207] Ajaegbu" O' O' ^2021&' Rising Youth Unempoyment and Violent Crime iin Nigeria' American Journal of Social Issue and Humannities" 315-321 http://citeseerx.ist.psu.edu/viewdoc/summary?doi=10.1.1.684.5857

## 10. නව පරිණාමවාදී න්‍යාය

නව පරිණාමවාදී අදහස් ඉදිරිපත් වන්නේ 20 වන සියවස ආරම්භ වීමත් සමඟ වන අතර පසුකාලීනව එය බ්‍රිතාන්‍ය හා ඇමරිකානු ලෙස ප්‍රධාන ගුරුකුල 02කට බෙදුණි. නව බ්‍රිතාන්‍ය පරිණාමවාදය යටතේ ගෝර්ඩන් චයිල්ඩ් වැදගත් වන අතර ඔහු පුරාවිද්‍යාත්මක සාධක මත පදනම්ව ගෘහස්ථකරණය, නාගරීකරණය හා කාර්මීකරණය යන කාරණා ත්‍රිත්වය මුල් කරගෙන සමාජය මේ දක්වා පරිණාමය වූ බව දක්වයි. ඇමෙරිකානු නව පරිණාමවාදීන් අතර ජූලියන් එච්. ස්ටෙවර්ඩ් සහ ලෙස්ලි වයිට් වැදගත් වේ. ස්ටෙවර්ඩ්ට අනුව සංස්කෘතිය පරිණාමයට පත්වීමේ දී විවිධ හේතු සාධක බලපාන බව දක්වා ඇත. ලෙස්ලි වයිට් මානව සමාජය එක්තරා නොදියුණු අවධියක සිට ශිෂ්ටාචාර අවධිය දක්වා විකාශය වී ඇති බවත් සංස්කෘතිය මානවයාගේ පැවැත්ම සඳහා මානවයා විසින් ඇති කරගත් ක්‍රියාවලියක් බව දක්වා ඇත.

නව පරිණාමවාදි න්‍යායට අනුව සංස්කෘතිය පරිණාමය වීමත් සමඟ අපරාධ හා වින්දිතභාවය බිහි වීමත්, පරිණාමය වීමත් සිදුවිය. නව පරිණාමවාදී චින්තකයකු වූ ගෝල්ඩන් චයිල්ඩ් නව පරිණාමවාදි න්‍යායේ සංස්කෘතික පරිණාමය සඳහා චාල්ස් ඩාවින්ගේ ජීව විද්‍යාත්මක පරිණාමවාදී අදහස් තුළ එන ස්වභාවික තෝරා ගැනීම වෙනුවට සංස්කෘතික අනුවර්ථනය හා කැමැත්ත පිළිබඳව අදහස් දක්වයි. මේ අනුව වර්තමාන ලෝකය තුළ විවිධ ගෝත්‍රික සමාජ හා උප සංස්කෘතීන් මහා සමාජයට අනුවර්ථනයට කැමැත්තක් නොදක්වයි. මේ නිසාම එම සංස්කෘතික සාරධර්ම අපරාධ ලෙස ගොඩනැඟී ඇති බව ගම්‍යමාන වේ. අප්‍රිකානු හා මැදපෙරදිග රටවල කාන්තා ස්ත්‍රී ප්‍රජනන අංග ඡේදනය කිරීමේ චාරිත්‍ර එම සංස්කෘතීන් තුළින් ගොඩනැගුණු අපරාධකාරි චර්යාවන් වේ. එමෙන්ම ශ්‍රී ලංකාව තුළ ගොඩනැඟී ඇති පාතාල උප සංස්කෘතිය තුළ පුද්ගලයා තම අපේක්ෂාවන් ළඟා කර ගන්නේ කුලියට මිනී මැරීම, මත්ද්‍රව්‍ය ජාවාරම, කප්පම් ගැනීම වැනි අපරාධකාරි චර්යා මඟිනි.

ජුලියන්. එච්. ස්ටේවට අනුව මානව සමාජය පරිණාමය වීමට මානව සමාජය හා ඒ අවට පරිසරය තේමාකරගත යුතුබව දක්වයි. සංස්කෘතීන්ට අනුව මානව සමාජය විවිධාකාර වේ. ලෙස්ලි ලී වයිඩ් දක්වන්නේ සංස්කෘතීන්ට ආවේණික ලක්ෂණ පවතින බවයි. මෙකී සංස්කෘතික ලක්ෂණ තවත් සංස්කෘතියක් මගින් පිළිනොගන්නා විට අපරාධකාරීත්වය බිහිවීම සිදු වේ. හිට්ලර් විසින් වාර්ගිකත්වය පදනම් කරගෙන සිදුකළ යුදෙව් සංහාරය, රුවෙන්ඩාවේ 1994 දී සිදු වූ ටුට්සි ජාතීන්ගේ ඝාතනය, 1921 එක්සත් ජනපදයේ සිදු වූ කළු ජාතික සංහාරය නිදසුන් වේ. ජුලියන්. එච්. ස්ටේවට අනුව සංස්කෘතිය පරිණාමය වීමට බලපෑ තවත් සාධකයක් වන්නේ තාක්ෂණය යි. කාර්මික විප්ලවය මූලික කරගෙන දැඩි තාක්ෂණික පරිණාමයක් ලෙස කාර්මීකරණය හා නාගරීකරණය සිදු විය. මේ නිසා ග්‍රාමීය ජනයා නාගරික ප්‍රදේශ වලට සංක්‍රමණය වූ අතර නමුත් රැකියා හිඟය, නිවාස නොමැතිකම, ඉඩම් හිඟය මත ජනයාට නාගරික ප්‍රදේශ වලට නිවැරදි ලෙස අනුවර්ථනය වීමට නොහැකි විය. මේ නිසාම සොරකම් කිරීම, ගණිකා වෘත්තිය වැනි අපරාධකාරී චර්යාවන් තම ජීවන උපාය කර ගැනීමට මේ ජනයා නැඹුරු වූ අතර මේ නිසාම නගර තුළ විවිධ උප සංස්කෘතීන් බිහි විය. 1977 විවෘත ආර්ථිකය සමඟ ශ්‍රී ලංකාව ද තාක්ෂණික ලෝකයට විවර වීමත් සමඟ ශ්‍රී ලංකාව තුළ අපරාධකාරීත්වයන්

ශීඝ්‍රලෙස ඉහළ ගියහ. ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ (1948 - 2014) දත්තයන්ට අනුව 1977 වර්ෂයට සාපේක්ෂව 1978 වන විට ශ්‍රී ලංකාවේ අපරාධ 45.9%ක වේගයකින් වඩා වැඩි වී ඇත[208].

තාක්ෂණය පදනම් කරගත් පරිගණක අපරාධ වර්තමානයේ ලෝකය තුළ මෙන්ම ශ්‍රී ලංකාව තුළ ද බහුල ලෙස සිදු වේ. මේ අනුව සංස්කෘතික පරිණාමය මත මිනිසාට ඊට නිවැරදි අයුරින් අනුවර්තනය වීමට නොහැකි වීම මත අපරාධ බිහි වන බවයි.

නව පරිණාමවාදී න්‍යාය තුළින් සමාජ පරිවර්තනය පිළිබඳ අධ්‍යයනය සිදු කරන අතර, මෙහිදී සමාජ පරිවර්තනය හේතුවෙන් සංස්කෘතියේ පරිවර්තනයක් ද දැක ගත හැකි වේ. ගෘහස්ථකරණය, නාගරීකරණය, කාර්මීකරණය යන සමාජ වෙනස්වීම් තුළින් පුද්ගලයාද, සමාජය ද පරිණාමය විය. සංස්කෘතිය තුළද පැහැදිලි වෙනස්කම් සිදුවිය. ඒ තුළින් සමාජය තුළ සිදුවන අපරාධ ද වෙනසකට භාජනය වූ අතර අපරාධ වින්දිතයින් ද සමාජයෙන් සමාජයට වෙනස් විය. නව පරිණාමවාදී න්‍යායට අනුව මුල් කාලීනව වනචාරී දිවියක් ගත කළ පුද්ගලයා සතුන් දඩයම් කිරීම හා ගෝත්‍ර වශයෙන් ජීවත් වූ අතර ගෝත්‍රයන් අතර නායකත්වය හා කණ්ඩායම් වෙනුවෙන් ගැටුම් ඇති විය. එහිදී පරාජයට පත්වන කණ්ඩායම වින්දිතභාවයට පත්විය. වනචාරී යුගයෙන් පසුව ම්ලේච්ඡ යුගයකට සමාජය පරිවර්තනය විය. මෙම සමාජය තුළ පුද්ගලයා සමාජය තුළ විවිධ කණ්ඩායම් වශයෙන් ජීවත් වූ බවත් කණ්ඩායමේ නායකයා ප්‍රධානියා විය. නායකයා අභිබවා යාමේ දී එම පුද්ගලයින් කණ්ඩාමේ අනෙක් සමාජිකයන්ගේ ගොදුරු බවට පත් විය. මෙම සමාජය තුළ ස්ත්‍රීන් නොවැදගත් කොටසක් ලෙස සැලකූ අතර බොහෝ විට ස්ත්‍රීන් විවිධ චාරිත්‍ර හේතුකොට ගෙන වින්දිතභාවයට පත්විය. කාර්මීකරණය හේතුවෙන් සමාජය ශිෂ්ටාචාර යුගයකට පරිණාමය වු අතර මෙම සමාජය තුළ අපරාධ සුලභ වූ බවත් ඒ හේතුවෙන් සමාජයේ ජීවත්වන පුද්ගලයින් වැඩි වශයෙන් වින්දිතභාවයට පත් විය. සමාජ පරිණාමයත් සමඟ විවිධ මත දරන නායකයන් සමාජය තුළ බිහි වීමත්, ඔවුන්ගේ අත්තනෝමතික පාලන හේතුවෙන් සමාජය තුළ සමූල ඝාතන විශාල වශයෙන් සිදු වූ අතර, මේ හරහා සාමාන්‍ය ජනතාව විශාල වශයෙන් වින්දිතයන් බවට පත් විය. කාර්මීකරණය හා තාක්ෂණයේ දියුණුවත් සමඟ තාක්ෂණය භාවිතා කරමින් සිදු කරන අපරාධ බහුල වශයෙන් සිදුවූ අතර, පරිගණක අපරාධ, මූල්‍ය අපරාධ හේතුවෙන් බොහෝ පුද්ගලයින් වින්දිතභාවයට පත් විය. ශ්‍රී ලංකාව තුළ විවෘත ආර්ථික ප්‍රතිපත්තීන් ආරම්භ වූ අතර ඒ හරහා සමාජ, සංස්කෘතිය තුළ විශාල පරිවර්තනයක් සිදුවිය. මෙහිදී සංවිධානාත්මක අපරාධ කණ්ඩායම් වල මූලාරම්භය සිදු වූ අතර සමාජය තුළ අපරාධ රැල්ලක් නිර්මාණය විය. මේ හේතුවෙන් යම් යම් ඉලක්කගත කණ්ඩායම් ද වක්‍රාකාරයෙන් සමාජය ද වින්දිතභාවයට පත් විය. නාගරීකරණය සාධක හේතුවෙන් ස්ත්‍රී දූෂණ, බල අපරාධ සමාජය තුළ පෙරට වඩා වර්ධනය වන්නට විය[209]. මේ අනුව සමාජ පරිණාම අවධියේ ආරම්භයේ සිට අවසානය දක්වාම අපරාධ හා වින්දිතභාවය සංස්කෘතියේ කොටසක් ලෙස පරිණාමය වී ඇත.

---

[208] Ekanayake Samantha E.M.(2016).Structural Transformation of Society and Development of Criminality: A case Study from Sri Lanka. https://www.research.get

[209] Shadish,R.William.Evaluation Theory is Who We Are.American Evaluation Assocítion. https://www.sagepublications.com

## 11. මැක්ලූහන්ගේ සන්නිවේදන න්‍යාය

විසිවන සියවස මැද භාගයෙන් පසු ලෝක ජන මාධ්‍යවේදය, ජනසන්නිවේදනය, තාක්ෂණය හා තොරතුරු හුවමාරුව පූර්ණ වෙනස් වීමකට ලක්වන්නේ ලෝකය විශ්ව ගම්මානයක් බවට පත් කරමිනි. 1960 - 1970 කාලය තුළ කැනඩාවේ ඉංග්‍රීසි සාහිත්‍ය පිළිබඳ මහාචාර්යවරයෙකු වූ මාර්ෂල් මැක්ලූහන් බහු විශායික පදනමක් මත සිදු කරන ලද අධ්‍යයනයන් මත මැක්ලූහන්වාදී සන්නිවේදන න්‍යාය ලෝකයට ඉදිරිපත් කරන ලදි. විශේෂයෙන් ඔහු තොරතුරු ආර්චනවාදයට සහ ව්‍යාප්තියට තුඩුදුන් සමාජ, සංස්කෘතික තත්ත්වයන් පිළිබඳ සිදුකළ පුළුල් විග්‍රහයන් මේ තුළ අන්තර්ගතය. තොරතුරු සබඳතාවන්හි තාක්ෂණික මාධ්‍යයන් මඟින් මානව සමාජයේ, සංස්කෘතියේ, විඥානයේ වර්ධනයන් ඇති කරන බව ඔහු පෙන්වා දුන් අතර ඒ සඳහා සමාජ, සංස්කෘතිය හා මානව මනෝභාවය පිළිබඳ තාක්ෂණික නියතිවාදය ඔහු ඉදිරිපත් කරන ලදී[210]. මැක්ලූහන්ට අනුව මානව ශිෂ්ටාචාරයේ ඉතිහාසය යුග 3ක් ඔස්සේ සමකාලීන සමාජය දක්වා වර්ධනය වීය[211].

1. **ප්‍රාථමික ප්‍රාග් ලිඛිත සංස්කෘතික අවධිය** - ස්වභාවිකත්වය හා සාමූහිකත්වය පදනම් කරගත් සමාජ ක්‍රමයක් පැවති මෙම යුගයේ දී මිනිසා තොරතුරු සංජානනය කර ගන්නා ලද්දේ වාචිකත්වය පදනම්වය.

2. **ලිඛිත මුද්‍රිත සංස්කෘතික අවධිය** - පෞද්ගලිකත්වය, ජාතිවාදය මත ක්‍රියාත්මක වූ මෙම යුගයේ දී මිනිසා තොරතුරු හුවමාරුව ලිඛිත සංස්කෘතියක් දක්වා වර්ධනය කර ගන්නට විය.

3. **ශ්‍රව්‍ය දෘෂ්‍ය සංස්කෘතික අවධිය** - මෙම යුගයේ දී ලෝකය විශ්ව ගම්මානයක් බවට පත් වෙමින් සාමූහිකවාදී සමාජ, සංස්කෘතියක් මත ක්‍රියා කරන මිනිසා තොරතුරු හුවමාරුව විද්‍යුත් කාර්මික හා තාක්ෂණය මත සිදු කරනු ලබයි.

මැක්ලූහන් සිය න්‍යායික අදහස් ඉදිරිපත් කිරීම සඳහා ඔහු විසින් රචිත කෘති උපයෝගී කර ගන්නට විය. එම කෘති අතර 1951 වසරේදි රචිත The Mechanical bride, 1962 The Gutenberg galaxy, 1960 Global village, 1967 Medium is the message යන කෘති වඩාත් වැදගත් වේ[212].

මැක්ලූහන්ගේ සන්නිවේදනය පිළිබඳ න්‍යායික අදහස් වෙත අවධානය යොමු කිරීමේදී පැහැදිලි වන්නේ එම න්‍යායික අදහස් ගෝලීයකරණය හා සම්බන්ධ කරමින් සාකච්ඡා කර ඇති බවයි. එනම් "නව මාධ්‍ය සංස්කෘතිය තුළින් ලෝකය එකම ගම්මානයක් වන බවත් විද්‍යුත් සන්නිවේදනයේ ව්‍යාප්තියෙන් කාලය හා අවකාශය හැකිලී ගොස් සෑම අංශයකටම සාම්ප්‍රදායිකව හිමිව තිබූ අනන්‍යතාවයක් ගොඩ නැගෙන බවයි." ඔහු තම War And Peace In The Global Village යන කෘතිය හරහා ද දක්වනුයේ තාක්ෂණයත්, මාධ්‍යයේත් දියුණුවත් සමඟ ගෝලීය ගම්මානයේ අනාගතයේ යුද්ධය හා සාමය කෙසේ සිදුවේද යන්න පිළිබඳවය. මොහු මෙම න්‍යායේ විශ්ව ගම්මානය යන සංකල්පය භාවිත කරන ලද්දේ

---

210 McLuhan,E. 2008, Marshall McLuhan's Theory of Communication, Global Media Journal,Vol.1, p.25-43
211 වීරසිංහ, ටී. 2002, ජනමාධවේදය පි.5
212 Miani,M, McLuhan and the theory of communication

විද්‍යුත් මාධ්‍ය බොහෝදුරට එකිනෙකාගේ අත්දැකීම් සඳහා මිනිසුන් සම්බන්ධ කරගන්නා ආකාරය විස්තර කිරීමට මෙන්ම නව ආකාරයේ ආතතීන් හා ප්‍රචණ්ඩත්වයන් විස්තර කිරීමටය[213].

මැක්ලූහන්ගේ සන්නිවේදන න්‍යාය හා බැඳී පවතින තවත් ප්‍රධාන සංකල්පයක් වන්නේ Light Bulb Concept ය. ඔහු එතුළින් දක්වනුයේ ආලෝකමත් වූ බල්බයක් මඟින් අඳුරු සහිත ස්ථාන වෙත, නොපෙනෙන ස්ථාන මෙන්ම ළඟාවිය නොහැකි ස්ථානවලට ළඟාවීම සඳහා උපකාර කරන්නාක් මෙන් මාධ්‍ය හරහාද මිනිස්සුන්ට ළඟාවිය නොහැකි ස්ථාන වෙත, අන්තර් ක්‍රියා කළ නොහැකි පුද්ගලයන් වෙත හා පෙර නොතිබූ සමාජ අවකාශයන් වෙත ළඟාවීම සඳහා අවස්ථාව ලබා දෙන බවයි[214].

සමාජය තුළට නව මාධ්‍ය ප්‍රවණතාවන් ඇතුළු වන විට පැවති සංස්කෘතිය වෙනස් වීම, පැවති සංස්කෘතිකාංග සමාජය තුළින් ඉවත්ව යෑම, සමාජයේ තිබූ සංස්කෘතිකාංග මාධ්‍ය සංස්කෘතිය මඟින් උදුරා ගැනීම, සංස්කෘතික අංග නව මානයන් ඔස්සේ වර්ධනය වීම හා මෙම සියළු වෙනස්කම් හා බැඳුණු සමාජ හැසිරීම වෙනස් වීම හඳුනාගත හැකිය. මාධ්‍යයට පවත්නා සමාජ ක්‍රියාවලිය වේගවත් කිරීමට හෝ නවතා දැමීමට හැකි වන හෙයින්, මාධ්‍ය නව නිපැයුම් නිර්ණයකරණයේ දී සමාජ සාධක හා සංස්කෘතිය පිළිබඳ මනා දැනුවත්භාවයක් තිබිය යුතු බව මැක්ලූහන් දක්වයි. මාධ්‍ය සංස්කෘතියේ බලපෑම සමාජය තුළ ක්‍රියාත්මක වන විවිධ ආකාර ලෙස සංස්කෘතික කම්පනය, සංස්කෘතික ආක්‍රමණය, සංස්කෘතික හුවමාරුව, සංස්කෘතික ඒකාබද්ධතාවය යන්න හඳුනාගත හැකිය.

මේ ආකාරයට සංස්කෘතියේ වෙනස්කම් සිදුවන විට ඒ තුළ නව මාධ්‍ය සමඟ නව අපරාධ සංස්කෘතියක් ද නිර්මාණය වේ. නිදසුන් ලෙස අතීතයේ කලාපීය වශයෙන් පැවැති ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් අද වන විට ගෝලීය ත්‍රස්තවාදය බවට පරිවර්තනය වී තිබෙන්නේ නව සන්නිවේදන මාධ්‍ය වල දියුණුවත් සමඟිනි. එමෙන්ම අන්තවාදී ත්‍රස්තවාදයේ ප්‍රධාන ආදායම් මාර්ගය ලෙස මත්ද්‍රව්‍ය ජාවාරම සිදුවේ. මේ සඳහා දිය හැකි හොඳම නිදසුනක් වන්නේ ඇෆ්ගනිස්ථානයේ තලෙයිබාන් කණ්ඩායම ගෝලීය හෙරොයින් ජාවාරමේ ආධිපත්‍යය දැරීමයි. මීට අමතරව පරිගණක අපරාධ බහුල වීම, සන්නිවේදන තාක්ෂණය ආශ්‍රිත වෙනත් අපරාධ (පවුල් ආරවුල්, ස්ත්‍රී දූෂණ, ළමා අපයෝජන) ආදිය ද මාධ්‍ය සංස්කෘතියේ බලපෑමට ලක් වන තවත් අපරාධ වේ.

මේ අනුව මැක්ලූහන්ගේ සන්නිවේදන න්‍යාය යනු, තොරතුරු සමාජය, ඩිජිටල් තාක්ෂණය හා අපරාධ අතර ඇති සම්බන්ධය අවධාරණය කරන න්‍යායකි. එමෙන්ම මැක්ලූහන්ගේ න්‍යායික ක්‍රමවේදය සාහිත්‍යවේදය, සංස්කෘතිකවේදය , ජනමාධ්‍යවේදය විමර්ශනය සඳහා පමණක් නොව එය මුළු මහත් මානව සංහතියේ වර්ධනය පිළිබඳ පුළුල් ප්‍රවේශයක් සපයන්නේ ය[215].

---

213 Elissavet,G. Marshall Mcluhan,s 'global Village' and the Internet
214 Dixon, V.K. 2009, Understanding the Implications of a Global Village
215 වීරසිංහ, ටී. 2002, ජනමාධ්‍යවේදය පි.16-17

## 12. සංස්කෘතික පෞරුෂවාදී න්‍යාය

"පුද්ගලයා කණ්ඩායමක් ලෙස ජීවත් වීමට පටන් ගත් දා සිට පුද්ගලයා වටා සමාජය ගොඩනැගේ. ඒ සමාජය තුළින් ජීවත් වීම සඳහා අවශ්‍ය කරන විවිධ රටා ඉගෙන ගනී. එය පුද්ගලයාගෙන් සමාජයට ලැබෙන දායාදයකි. එම දායාදය සංස්කෘතිය යි" - **මාග්‍රට් මීඩ්**

මිනිසා සම්බන්ධව කතා කිරීමේදී සංස්කෘතිය අත්‍යවශ්‍ය අංගයක් වන්නා සේම එකී සංස්කෘතිය තුළින් පෝෂණය කරන පෞරුෂත්වය නැමති සාධකය, එකම කාසියක දෙමුහුණත යටතේලා අපට හඳුනාගත හැකිවේ. අනේකවිධ අංගෝපාංගයන්ගේ සංකලනයක් වන සංස්කෘතිය පුද්ගල චර්යාවන් හා පුද්ගල පෞරුෂත්වය ගොඩ නඟන ආකාරය සංස්කෘතික පෞරුෂවාදී න්‍යාය තුළින් විදහා දක්වනු ලබයි. සංස්කෘතික පෞරුෂවාදී න්‍යාය, සංස්කෘතික මානව විද්‍යාවේදී සමාජ මනෝ විද්‍යා සංකල්ප හා සායනික මනෝ විද්‍යා සංකල්ප සමඟ එකතු වී ගොඩ නඟන ලද න්‍යායකි. මෙය මනෝ විද්‍යාත්මක මානව විද්‍යාව ලෙස ද හඳුන්වයි.

මෙලෙස සංස්කෘතිය තුළින් ගොඩනැඟෙන පෞරුෂත්වය අපරාධ විද්‍යාත්මක දෘෂ්ටි කෝණයෙන් බැලූ කළ අපරාධකරුවන් බිහි වීමට හා වින්දිතභාවයට පත්වීම කෙරෙහි ඇති කරනු ලබන බලපෑම මෙම න්‍යායේ අන්තර්ගතය තුළින් අධ්‍යයනය කළ හැකිය. විසරණවාදී න්‍යායෙහි ආභාෂය ලබා ගනිමින් සිග්මන් ෆ්‍රොයිඩ්, එඩ්වර්ඩ් සැපියර්, එරික් එරික්සන්, රූත් බෙනඩික්, මාග්‍රට් මීඩ් සහ රැල්ෆ් ලින්ටන් එක්ව සංස්කෘතික පෞරුෂවාදී න්‍යාය ගොඩ නඟන ලදි. ඒ තුළ පුද්ගලයා හා සංස්කෘතිය අතර ඇති සබැඳියාව මෙන්ම පුද්ගලයා සංස්කෘතිය තුළින් තමා සතු කරගන්නා චර්යාත්මක ක්‍රියාවලිය පිළිබඳව මනෝවිද්‍යාත්මක අධ්‍යයනයක නිරත වේ.

සංස්කෘතික පෞරුෂවාදී න්‍යායේ පෝෂණය සඳහා ප්‍රබල ලෙස දායක වූ දෙපලක් ලෙස එඩ්වඩ් සැපියර් සහ රූත් බෙනඩික් හඳුනා ගැනීමට හැකිය. පෞරුෂය හැඩගස්වනු ලබන්නේ ජානමය හා පාරිසරික සාධක මඟිනි. පාරිසරික සාධක අතර සංස්කෘතිය සුවිශේෂී වේ. එඩ්වඩ් සැපියර් පෙන්වා දෙන්නේ පෞරුෂත්ව සංවර්ධනය අධ්‍යයනය කළ හැක්කේ සංස්කෘතිය අවබෝධ කර ගැනීමෙන් බවයි. ඒ අනුව සංස්කෘතිය හා පෞරුෂත්වය අතර මනා සම්බන්ධතාවයක් පවතී. පුද්ගල මනස සහ භාෂාව යන අවස්ථාවන් සම්බන්ධයෙන් සංස්කෘතියක් ගොඩනැඟෙන අතර එමඟින් පුද්ගල සම්බන්ධතා අධ්‍යයනය කළ හැකි බවද මොහු තවදුරටත් දක්වයි.

මානව විද්‍යාඥවරියක් වන රූත් බෙනඩික්ට (1887-1948) අනුව සංස්කෘතිය යනු මනුෂ්‍ය තෝරාගැනීම් නිසා ඇති වූ නිෂ්පාදනයක ප්‍රතිඵලයකි. ඒ අනුව සංස්කෘතියක පවතින විවිධ රටා හඳුනා ගැනීමට ඒ සමාජයේ ජීවත් වන පුද්ගලයින්ගේ පෞරුෂය පිළිබඳ අවධානය යොමු කළ යුතු බව පෙන්වා දෙයි. රූත් බෙනඩික් ප්‍රාථමික සමාජ තුනක් අධ්‍යයනය කරන ලදී. එනම්, උතුරු ඇමරිකාවේ ක්වාකිට්ල් දකුණු ඇමරිකාවේ සූනී සහ අප්‍රිකාවේ ඩෝගු යන සමාජයන් ත්‍රිත්වය යි.

ක්වාකිට්ල් සමාජයේ ජීවත් වූයේ ආත්මාර්ථකාමී ඉක්මනින්ම කිපෙන සහ ඉක්මන් තීරණ ගන්නා පිරිසකි. සූනි සමාජය සාමකාමී පිරිසකගෙන් යුක්ත වූ අතර බය සහ සැකය මූලික ගුණාංගයක් කර ගනමින් චෝගු සංස්කෘතික සමාජය හැඩ ගැසී තිබුණි. මෙම හරස් සංස්කෘතික අධ්‍යයනය තුළින්

එකිනෙකට වෙනස් සංස්කෘති පවතින බැව් හඳුනා ගත හැකිය. එපමණක් නොව එකී සංස්කෘතීන්ට ආවේණික වූ චර්යාවන්ගෙන් තම පෞරුෂය ගොඩනගා ගැනීම හේතුවෙන් සාමකාමී මෙන්ම අපගාමී පෞරුෂයන් ගොඩනැගෙන ආකාරය ද හඳුනා ගැනීමට හැකිය. තමා පිළිබඳ පමණක් සිතමින් දුර දිග නොබලා, ඉවසීමකින් තොරව වහා තීරණ ගන්නා පුද්ගලයාගේ ආවේගශීලී බව මෙන්ම ප්‍රචණ්ඩත්වය ඉහලයත්ම එහි ප්‍රතිඵලයක් ලෙස අපරාධ සිදු කිරීමට වැඩි නැඹුරුවක් දක්වයි. අප්‍රිකාවේ ඩෝශු සමාජයේ ජීවත් වන බිය සහ සැකය යන ගුණාංගයන්ගෙන් සමන්විත පුද්ගලයා විවිධ අපරාධවල ගොදුරක් බවට එනම්, අපරාධ වින්දිතයකු වීමට ඇති අවකාශය ඉතා ඉහලය. සාමකාමී පිරිසකගෙන් යුත් සුනී වැනි සමාජයන් තුළ අවම අපරාධ අගයක් ගැනීම හඳුනා ගත හැකිය[216].
ඒ අනුව මෙම න්‍යාය තම අදහස් වලින් පෝෂණය කරමින් සිග්මන් ෆ්‍රොයිඩ් තම මනෝ විශ්ලේෂණවාදී අදහස් හරහා මනෝ ලිංගික අවධි පදනම් කර ගත් විග්‍රහය හා සිතේ ආකාර පදනම් කර ගත් විග්‍රහය තුළින් පුද්ගලයා තුළ අපගාමී පෞරුෂ ගොඩ නැගෙන්නේ කෙසේද යන්න විග්‍රහ කර ඇත. මෙහිදී මූලික වශයෙන්ම සිතේ ආකාර පදනම් කරගත් විග්‍රහය තුළදී සංස්කෘතිය, සාරධර්ම, ආගම, දෙමව්පිය උපදෙස් පිළිපදිමින් හොඳ සහ නරක පිළිබඳව පුද්ගල සිත විනිශ්චයකින් පසුවන බව ෆ්‍රොයිඩ් පෙන්වා දෙනු ලැබීය.

සංස්කෘතික පෞරුෂවාදී න්‍යායේ මාග්‍රඩ් මීඩ්ගේ (1901-1978) අදහස් ප්‍රධාන ස්ථානයක් ගනී. ඇය විසින් පුද්ගල පෞරුෂය හා සංස්කෘතිය අතර සම්බන්ධතාවය මනාව විග්‍රහ කර තිබේ. ප්‍රාථමික සමාජානුයෝජනය පිළිබඳ වැඩි අවධානයක් යොමු කළ මීඩ් කුඩා දරුවෙකු මවගේ ආභාෂය ලබන ආකාරය, ගුරුවරුන්ගේ ආභාෂය ලබන ආකාරය, අනෙකුත් සමාජ සම්බන්ධීකාරකයින් සම්බන්ධ වන අයුරු ගැන විශේෂ අවධානය යොමු කරයි. කුඩා අවධියේ දී මව විසින් ආදරයෙන් සෙනෙහසින් රැකබලා ගන්නා දරුවන් වැඩිවියට පත්වූවිට සාමකාමී දරුවන් වන බවත් අකාරුණික ලෙස සලකමින් නිතර දඬුවමට භාජනය වන දරුවන් වැඩිහිටි වියේදී ආක්‍රමණශීලී ක්‍රියාවන්ට පෙළඹෙන බවත් මාග්‍රඩ් මීඩ් විසින් නිව්ගිනියාවේ වාසය කළ මුණ්ඩුගුමාර් හා ඇරපේෂ් ගෝත්‍රිකයන් පිළිබඳ කරනු ලැබූ විද්‍යාත්මක අධ්‍යයනයෙන් සනාථ කළාය. පරීක්ෂණයට අනුව එකම වනාන්තරයක් තුළ සමාන භූගෝලීය පිහිටීමක් ඇති පරිසරයක සිටින නමුදු වෙනස් සංස්කෘතීන් සමාජානුයෝජනය වීම මත එකිනෙකට වෙනස් පෞරුෂ ලක්ෂණ පෙන්වීමක් දක්නට ලැබුණි. මෙලෙස එක් එක් සංස්කෘතීන්ට අනුව දරුවකු සමාජානුයෝජනය වන ආකාරය සහ පෞරුෂය ගොඩනැගෙන ආකාරය අනුව ආක්‍රමණශීලී සහ අපරාධකාරී පෞරුෂත්වයන්ට අනුරූප වන ආකාරය හඳුනා ගැනීමට හැකිය[217].

රැල්ෆ් ලින්ටන් ද සංස්කෘතික පෞරුෂවාදී න්‍යාය තුළ ප්‍රබල පුද්ගලයෙකි. ''පෞරුෂය සකස් වීමේ දී සංස්කෘතික පසුබිමක් වේ". එක් පරම්පරාවක් විසින් උරුම කරගත් ඇබ්බැහි කර ගත් සංස්කෘතික චර්යා හා සම්ප්‍රදායන් ඊළඟ පරම්පරාවට උරුම වන්නේ බාල පරම්පරාව මඟිනි. මේ අනුව සංස්කෘතිය

[216] Guddemi.P.V,2005,The good ,the bad, and the inverted: Rhetorical Strategies in the portrayal of Cultures in Ruth Benedicts Patterns of Culture and Margaret Mead Sex and Temperament in three Primitive societies. http://lir.byuh.edu/index.php/pacific/article/view/2186

[217] Department of Anthropology, The university of Alabama. http://anthropology.ua.edu/theory/culture-andpersonality

මත පදනම් වූ පුද්ගල පෞරුෂයන් පරම්පරාගත උරුමයක් ලෙස සම්ප්‍රේෂණය වීම මොහු විසින් පෙන්වා දෙනු ලැබීය.

මේ අනුව සංස්කෘතික පෞරුෂවාදී න්‍යාය තුළින් පුද්ගල පෞරුෂත්වය ගොඩනැගීම, සංස්කෘතිය තීරණාත්මක සාධකයක් වන බව දක්වනු ලබයි. එහිදී යම්කිසි සමාජයක යහපත් සංස්කෘතියක් පවතින්නේ ද යහපත් පෞරුෂයක් නිර්මාණය අතර අයහපත් සංස්කෘතියක් පවතින්නේ නම් අයහපත් පෞරුෂයක් නිර්මාණය වෙනු ලබයි. යහපත් පෞරුෂයක් නිර්මාණය කරන සමාජය සංවිධානාත්මක වන අතර අපගාමී චර්යා කෙරෙහි යොමුවීමේ ඉඩකඩ අවමය. නමුත් අයහපත් දුබල පෞරුෂයක් නිර්මාණය වෙත්ම එවැනි පුද්ගලයින් විවිධ අපගාමී චර්යා කෙරෙහි යොමුවීමේ අවකාශය ඉහළය. මේ අනුව සංස්කාතික පෞරුෂවාදී න්‍යාය මඟින් පුද්ගල පෞරුෂය සහ සංස්කෘතිය, අපරාධ කෙරෙහි කුමන ආකාරයේ බලපෑමක් සිදු කරන්නේ ද යන්න ගම්‍යමාන වේ.

# සංස්කෘතික අපරාධ විද්‍යාව

**ප්‍රකාශනය**


අපරාධවිද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය